

විස්තරාර්ථ සහිත

# සාරස්වත ප්‍රක්‍රියා ව්‍යාඛ්‍යානය.



විස්තරාර්ථ සහිත

# සාරස්වත ප්‍රක්‍රියා ව්‍යාඛ්‍යානය.

කෘදන්තාත්මක

## උපරිම භාගය.

---

කොළඹ මාළිගාකන්දේ
විද්‍යෝදය මහා විද්‍යාලයෙහි උපාචාර්ය
**පණ්ඩිත හෑගොඩ ධම්මින්ද ස්ථවිරයන්**
වහන්සේ විසින්
**සම්පාදිත සි.**

---

විද්‍යෝදය මහා විද්‍යාලයාධීශ්වර පණ්ඩිතාචාර්ය
**ගරුතර බද්දෙගම ශ්‍රී ප්‍රියරතනාභිධාන**
**නායක මාහිමියන් වහන්සේ විසින්**
**අනුග්‍රාහීත සි.**

---

කොළඹ ප්‍රසිද්ධ වෙළඳ මහතෙකු වූ
**එච්. ජී. පී. අප්පුහාමි**
විසින්
කළුතර විද්‍යාතිලක මුද්‍රණාලයෙහි මුද්‍රිතයි.

2485.
1942.

# ප්‍රස්තාවනා.

## සංස්කෘත භාෂාව.

**ගීර්වාණ වාණී, දෛවී භාෂා** යනාදි අපර නම්වලින් ද ප්‍රචලිත වූ සංස්කෘත භාෂාව වනාහි අතිශය චමත්කාර ජනක සුව්‍යක්ත භාෂාවෙකි. මූල ප්‍රාකෘතයෙන් සංස්කරණය කරගන්නා ලද බැවින් මීට "සංස්කෘත භාෂා" යන නාමය ද, "දෙවියන්ගේ භාෂාව" යන අර්ථයෙන් "ගීර්වාණ වාණී" යනාදි නාමයෝ ද ව්‍යවහෘත වෙත්. ප්‍රාචීන භාෂාවන් අතුරෙන් අතිශයින් වර්ධනය වූ මේ භාෂාව මනුෂ්‍යයන්ගේ චිත්තාකර්ෂණය කරණ ප්‍රෞඪත්වයෙන් ද අනූන ය. සංස්කෘත භාෂාවෙන් ලියන ලද ග්‍රන්ථයෝ අසංඛ්‍යයහ. ලොව පවත්නා සියලු ම විෂයයන් පිළිබඳ ව මේ භාෂාවෙන් ලියන ලද පොත් පත් බොහෝ ය. වෙනත් නොයෙක් ප්‍රාචීන භාෂාවන්ගේ සම්භවයට හා අභිවර්ධනයට ද හෙතු වූ මේ සංස්කෘත භාෂාව ව්‍යාකරණ රීති විශාල සංඛ්‍යාවකින් පරිපාලිත වෙයි.

**සම්භවය.**

දූරාතීතයෙහි භාරත මධ්‍යදෙශයෙහි නිවාස ග්‍රහණය කළ ඉන්දු ආර්‍ය්‍යයන්ගේ කථා ව්‍යවහාරයෙහි පැවති භාෂාව මූල ප්‍රාකෘතය ලෙස සලකනු ලැබේ. මාගධ ශාබ්දිකයන් විසින් "සා මාගධී මූලභාසා" යනාදීන් කියන ලද මූලභාෂාව ඒ මූල ප්‍රාකෘතයේ ද ප්‍රභවය විය යුතු යි. * අනුක්‍රමයෙන් දියුණු වන්නට වූ යථොක්ත ආර්‍ය්‍යයෝ දෙව පූජාදිය සඳහා ස්වකීය වාග්ව්‍යවහාරොපගත භාෂාවෙන් ම වෙද මන්ත්‍ර නිෂ්පාදනය කළහ. මෙසේ කලින් කල බොහෝ ආර්‍ය්‍යයන් විසින් නිෂ්පාදිත වූ වෙදමන්ත්‍ර සංග්‍රහ කිරීමෙන් කල් යාමේ දී i ඍච්, ii යජුස්, iii සාමන්, iv අථර්වන් යන චතුර්වේදය ම සම්පාදිත විය. ඉන් කලකට පසු "බ්‍රාහ්මණ" ග්‍රන්ථ ද, තවත් කලකට පසු "ආරණ්‍යක" ග්‍රන්ථ ද, ඉනුත් පසු "උපනිෂත්" ග්‍රන්ථ ද තත්තත් කාලීනයන් විසින් නිපදවන ලදහ. වෙදයන්ගේ කෙළවර පහළ වූ හෙයින් මේ බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් යන කොටස් තුණ ම "වෙදාන්ත" ය යි කියනු ලැබේ. මෙසේ පූර්වොක්ත මූල ප්‍රාකෘතයෙන් ම වෙද- වෙදාන්තයන් සම්පාදිත වූ පසු භාෂාවෙහි විශෙෂ සංස්කරණයක් ඇති විය.

---

* පූර්වාපර දෙශීය ඇතැම් පඬිවරු මීට වෙනස් මත ද පහළ කෙරෙත්.

මේ කාලය වන විට යථොක්ත ආය්‍යීයන්ගේ භාෂාව බොහෝ දුරට වර්ධනය වූ හෙයින් ක්‍රිස්තුදයයෙන් පෙර පස්වන ශතවර්‍ෂයේ දී පමණ මහර්ෂි යාස්ක විසින් නිරුක්ත ද, සිවුවන ශතවර්‍ෂයෙහි පාණිනීන් විසින් ව්‍යාකරණ ද, කාත්‍යායන මුනිහු විසින් වාත්තික ද, දෙවන ශතවර්‍ෂයේ දී පතඤ්ජලි මුනිහු විසින් "මහා භාෂ්‍ය" නම් පාණිනීය විවෘතිය ද ලියන ලදී. මෙසේ සර්‍වාඞ්ග සම්පූර්ණ වූ 'ත්‍රිමුනිව්‍යාකරණ' සඞ්ඛ්‍යාත පාණිනීය ව්‍යාකරණයෙන් සංස්කරණය වූ යථොක්ත භාෂා තොමෝ එතැන් පටන් "සංස්කෘත" යන නාමයෙන් ප්‍රකට වූවා ය. මේ හැර පූර්‍වොක්ත මූල ප්‍රාකෘතයෙන් බෙදී ගිය ප්‍රාකෘත විශෙෂයෝ ද අනන්තයහ. පාණිනීන්ගේ සංස්කරණයට පෙර පැවති භාෂාව වෙද – වෙදාන්තයන්ට ම සීමා වූවා ව්‍යාකරණ රීතීන්ට යටත් නො වන ග්‍රන්ථාරූඪ (=මෘත) භාෂාවක් ව "වෛදික සංස්කෘත" යන නාමයෙන් අද දක්වාත් ඒ තත්ත්වයෙහි ම පවතී.

වෙද මන්ත්‍ර ඡන්දොනිබද්ධ හෙයින් "ඡන්දස්" යනු ද ඊට නමෙකි. සංස්කරණය වූ භාෂා තොමෝ ලොකයා අතර ව්‍යවහාර ප්‍රාප්ත වූ හෙයින් "ලෞකික සංස්කෘත" යන නාමයෙන් ප්‍රචලිත වූවා රාමායණ– මහාභාරතාදි නා නා විෂයයන් පිළිබඳ ග්‍රන්ථ රචනා කිරීම් ආදියෙන් ඉන්දියාවේ හා නොයෙක් ප්‍රදෙශයන්හි වහා පැතිර ගියා ය. පාණිනීන් හැර ඉන්ද්‍ර– චන්ද්‍රාදි මහාවෛයාකරණයන් විසින් තවත් බොහෝ ව්‍යාකරණ ග්‍රන්ථයෝ සම්පාදනය කරණ ලදහ.

."ඉන්ද්‍රශචන්ද්‍රඃ කාශකෘත්ස්නාපිශලී ශාකටායනඃ,
පාණින්‍යමරජෛනෙන්ද්‍රා ඉත්‍යෂ්ටෞ ශාබ්දිකා මතාඃ."

යන්නෙන් මහාශාබ්දිකයෝ අට දෙනෙක් දැක්වෙති. සාරස්වත ව්‍යාකරණය වූ කලී මින් බොහෝ මෑත භාගයෙහි පහළ වූවකි. සියලු ම සංස්කෘත ව්‍යාකරණයන් අතර පාණිනීය ව්‍යාකරණය ම සාම්‍රාජ්‍යග උසුලයි. එහෙයින් ම "පාණිනීයය නො දන්නෝ සංස්කෘතය නො දනිති" යි ද කියත්. මෙසේ මූල පටන් ජීව භාෂාවක් වූ සංස්කෘත භාෂාව ව්‍යාකරණරීති බාහුල්‍යය හෙතු කොට ගෙණ මෑත භාගයෙහි මෘතභාෂා සඞ්ඛ්‍යාවට වැටුනු බව පෙණේ. එහෙත් දැනුදු මේ ඉන්දු ආය්‍යී භාෂාව ඇතැම් ශිෂ්ට බ්‍රාහමණයන් අතර කථා ව්‍යවහාරයෙහි ද පවත්නා බව සමහර විචාරකයෝ කියති.

# ලඞකාවේ
# සංස්කෘත සාහිත්‍ය වංශය.

---

පෙර කී ලෙස ඉන්දියාවේ ආරබ්ධ වූ සංස්කෘත භාෂාව වහා පැතිර ගිය රටවලින් ලඞකාව ද එකකි. සංස්කෘත විද්‍යාවෙදීන් ගෙන් ශ්‍රී ලඞකා භූතලය කවදත් සිස් නො වී ය. සිංහලයෝ ස්වකීය ජාතික භාෂාව වශයෙන් සිංහල භාෂාවත්, ආගමික භාෂාව වශයෙන් පාලි භාෂාවත්, ශාස්ත්‍රීය භාෂාව වශයෙන් සංස්කෘත භාෂාවත් පරිශීලනය කරන්නට පුරුදු වූහ. එහෙයින් පාලි–සිංහල භාෂාවන්ගේ අභිවර්ධනයට ද සංස්කෘත භාෂාව අතිශයොපකාරී විය. "ජානකීහරණ" ආදි මහාකාව්‍ය ග්‍රන්ථ ද, "බාලාවබොධන" ආදි සුබොධ ව්‍යාකරණ ග්‍රන්ථ ද, "දෛවඥ කාම ධෙනු" ආදි ප්‍රශස්ත ජ්‍යොතිෂ ග්‍රන්ථ ද, "සාරාර්ථ සංග්‍රහ" ආදි ශ්‍රෙෂ්ඨ වෛද්‍යක ග්‍රන්ථ ද නිපදවීමට තරම් සමර්ථ වූ සංස්කෘත සාහිත්‍ය විශාරදයෝ මෙහි විසූහ. එහෙයින් ලඞකාවේ සංස්කෘත සාහිත්‍යවංශය පිළිබඳ දිඞ්මාත්‍රයක් මෙහි දක්වනු ලැබේ.

**i ආදිම කාලය.** සංස්කෘත සාහිත්‍යය කවර කලෙක පටන් ලඞකාවේ ව්‍යවහාරප්‍රාප්ත වී දැයි තව ම අවිනිශ්චිත ය. විජයාව තරණයෙන් පෙර පටන් ම මෙහි සංස්කෘත භාෂාව ව්‍යවහෘත වූ බව සිතිය හැකි නමුත් ඊට සැහෙන සාක්ෂ්‍යයෙක් අප ඉදිරිපිට නැත. අතිපුරාණ කාලයෙහි ලඞකාධිපති ව විසුවේ ය යි සලකන රාවණ රජු විසින් "අර්ක ප්‍රකාශ" නම් සංස්කෘත වෛද්‍යක ග්‍රන්ථය කරණ ලද්දේය යි කියන නමුත් එය කෙතෙක් දුරට විශ්වාස කට යුතු දැයි කීමට අපි අදහස් නො කරමු. එහෙත් එය ද එනමින් විසූ ලාංකිකයෙකුගේ ම කෘතියක් බව නිසැක ය.

විජයාවතරණයෙන් මෑත භාගයෙහි ලක්දිව සංස්කෘත සාහිත්‍යවංශය ගැණ අපේ ඉතිහාසයෙන් ද කරුණු දැක්විය හැකි ය. පණ්ඩුකාභය කුමරුට උසස් අධ්‍යාපනයක් දීම සඳහා පණ්ඩුල නම් බමුණකු වෙත යැවූ බව ප්‍රකට ය. එසේ ම දෙවනපෑතිස් නරේන්ද්‍රගේ ද්විතීය අභිෂෙකය ද වෛද ශාස්ත්‍රානුකූල ව සිදු කළ බව සිතිය හැකි ය. මේ කාලයෙහි ලඞකාවේ බ්‍රහමාගම ද පැවති බවත්, බමුණන් මෙහි වාසය කළ බවත් පැහැදිලි ය. විජය රජුට පසු ව අවුරුද්දක් ලක්දිව ආණ්ඩු කළ උපතිස්ස ද

බමුණෙකැයි සලකනු ලැබේ. මේ ආදි කරුණුවලින් පෙණෙන්නේ විජය කුමරුගේ පැමිණීමෙන් පසු බුද්ධාගම පිහිටීම දක්වා ලඞ්කාවේ සංස්කෘත සාහිත්‍යය උසස් තත්ත්වයෙක පැවතුන බව යි.

**ii අනුරාධපුර කාලය.** බුද්ධාගම උදා වීමෙන් පාලි භාෂාව මෙහි පැතිරෙන්නට පටන් ගත් කල්හි ලාඞ්කිකයන් තුළ සංස්කෘත භාෂාව කෙරෙහි පැවති සැලකිල්ල ආගම භක්තිය හෙතු කොට ගෙණ බොහෝ සේ ම පාලි භාෂාව දෙසට යොමු විය. එපමණක් නො ව බුද්ධාගමට විරුද්ධ වූ වෛතුල්‍ය ධර්මය සංස්කෘත භාෂාමය වූ හෙයින් සංස්කෘත භාෂාව කෙරෙහි ද බෞද්ධයන්ගේ මහත් නො රිස්සුමක් ඇති විය. එය කෙතරම් බල පැවැත්වී ද යත්? සංස්කෘත භාෂාවෙන් ලියන ලද කුමක් වුව ද පරීක්ෂා නො කොට ම "වෛතුල්‍ය වාදය"යි වනසා දැමීමට එකල බොහෝ බෞද්ධයෝ යුහුසුලු වූහ. මේ අපරීක්ෂ්‍ය කාරිත්ව හේතුවෙන් ලක්දිව පැවති **අශ්වඝොෂ, ආර්‍ය්‍යශූර, වසුබන්ධු, නාගාර්ජුන, ධර්මකීර්ති** ආදි බෞද්ධ මහාපඬිවරයන් විසින් ලියන ලද "බුද්ධචරිත, වජ්‍රසූචි, ශාරීපුත්‍රප්‍රකරණ, සූත්‍රාලඞ්කාර, පද්‍යචූඩාමණි, සෞන්දරනන්ද, ජාතකමාලා, අභිධර්මකොෂ, න්‍යායබින්දු, සම්බන්ධපරීක්ෂා" යනාදි වැදගත් සංස්කෘත බෞද්ධ ග්‍රන්ථයන් ද බොහෝ විට විනාශ කර දැමූ බව සිතිය යුතු වේ. අනුරාධපුර රාජ්‍ය සමයයේ අවසානය ලං වන තුරු ම සංස්කෘත භාෂාවේ මේ දුර්දිශාව පැවති බව කල්පනා කරණු ලැබේ. මේ කාලයෙහි ග්‍රන්ථකර්තෘවරු ද සංස්කෘත ව්‍යාකරණ ක්‍රම අනුගමනය නො කළහ යි සැලකිය හැකි ය. එහෙයින් ම එකල පාලි පොත් ලියූ අර්ථකථාචාර්‍ය්‍යයන් වහන්සේලා **පච්චත්ත - උපයොග - නිස්සක්ක - සාමි - භුම්ම** යනාදි සකු වියරණයන්හි නො පැණෙන විශෙෂ විභක්ති සංඥාවන් ස්වකීය අටුවාවන්හි යෙදූ බව පෙණේ.

තතු මෙසේ වුවත් මේ කාලයේ දී ද සියල්ලෝ ම සංස්කෘත භාෂාව අත් නො හළහ. ඊට ගරු කරන්නෝ ද ස්වල්ප වශයෙන් වූහ. අභයගිරි පාර්ශ්වයෙහි වූවෝ සංස්කෘත භාෂාව පරිශීලනය කළහ. "අභයගිරියෙහි භික්ෂූහු වෛතුල්‍යවාදීහු ය" යන ප්‍රසිද්ධියට එය ද එක් හේතුවෙකි. ඒ හැර මෙසමයෙහි ශ්‍රෙෂ්ඨ වෛද්‍යවරයෙකු වූ **බුද්ධදාස** රජතුමන් විසින් "සාරාර්ථ සංග්‍රහ" නමැති සංස්කෘත වෙද පොත ද, **කුමාරදාස** රජු විසින් "ජානකීහරණ" නමැති චමත්කාර ජනක සංස්කෘත කාව්‍යය ද කරණ ලදහ. ඉන් මෑත භාගයෙහි මහා වෛයාකරණයෙකු වූ **කාත්‍යායන** හිමිපානන් විසින් "කාතන්ත්‍ර" නම් සංස්කෘත ව්‍යාකරණය

අනුගමනය කරමින් "කච්චායන" නමැති විශිෂ්ට පාලි ව්‍යාකරණය* රචනා කරණ ලදී. තවත් යම් යම් උගතුන් විසින් කරණ ලද සංස්කෘත පොත් අභාවප්‍රාප්ත වූ බව ද සිතිය හැකි ය. මෙසේ හෙයින් අනුරාධපුර සමයෙහි ද ලංකාවේ සංස්කෘත සාහිත්‍ය විශාරදයන් විසූ බව කියන්නට ඉඩ තිබේ. එහෙත් එසමයෙහි සංස්කෘත භාෂාවේ උද්දීප්තිය හා ව්‍යාප්තිය මඳක් අඩු වූ බව නම් නිසැක ය.

**iii පොළොන්නරු කාලය.**

අනුරාධපුර කාලයේ අවසාන භාගයේ පටන් නැවතත් දියුණු වන්නට පටන් ගත් සංස්කෘත සාහිත්‍යය පොළොන්නරු කාලයෙහි උසස් ම තත්ත්වයට නැංගේ ය. ලක්දිව සංස්කෘත සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ද පොළොන්නරු සමය මැයි. ඒ කාලයේ ග්‍රන්ථ කර්තෘවරු ද සංස්කෘත රචනා රීති – ව්‍යාකරණ රීති අනුගමනය කළහ. පාලි පොතට කරණ සන්න – ගැටපදවල පවා ව්‍යාකරණ සංස්කෘත ව්‍යාකරණයෙන් දක්වන්නට පටන් ගත්හ. "මේඝදූත" ආදි සංස්කෘත දූතකාව්‍ය අනුගමනයෙන් සිංහල **සන්දේශ** පොත් ද රචනා කරන්නට ආරම්භ කළහ. † "කාව්‍යාදර්ශ" ආදි අලංකාර ශාස්ත්‍රීය සංස්කෘත ග්‍රන්ථ අනු ව සිංහල භාෂාවට ද "සියබස් ලකර" ආදි අලංකාර පොත් සැපයූහ. සිංහල භාෂාවෙන් ලියන පොත්වල ද සංස්කෘත වචන බෙහෙවින් යොදන්නට පුරුදු කළහ. **පරාක්‍රමබාහු, භුවනෛකබාහු, කීර්ති, චිත්‍රා, වෛජයන්ත** යනාදි වශයෙන් පුද්ගල නාම – ස්ථාන නාම ආදිය ද සංස්කෘත වචනවලින් ම සපයා ගත්හ. බාලයන්ට අකුරු කරවන සිංහල වර්ණමාලාවෙහි (=හෝඩියෙහි) පවා **"ස්වස්ති සිද්ධම්"** යි සංස්කෘත ශීර්ෂ පාඨයක් ඇතුළත් කළහ. සමහර ශිලාලිපි ද හුදු සකු බසින් ම ලියවූහ. කොටින් කියතොත් මෙකල බහුතර පක්ෂය විසින් ඉංග්ලිෂි භාෂාව යම් උසස් තත්ත්වයෙක ලා සලකනු ලැබේ ද, එකල සංස්කෘත භාෂාව ද ඒ තත්ත්වයෙහි ම පැවති බව කිය හැකි ය. මේ දිවයින ද සංස්කෘත භාෂා විෂයෙහි පරතෙර පත් ප්‍රාඥයන්ගෙන් බබලන්නට වන. **දිඹුලාගල මහාකාශ්‍යප** සංඝරාජයන් වහන්සේ විසින් ලියන ලද "බාලාවබෝධන" නම් සංක්ෂිප්ත සංස්කෘත ව්‍යාකරණය හා ශ්‍රීමත් **ධර්මකීර්ති** මාහිමි පානන් විසින් විරචිත "රූපාවතාර" නම් ප්‍රශස්ත සංස්කෘත ව්‍යාකරණය ද, **මෞද්ගල්‍යා**

---

* කාලය අනිශ්චිත යි.

† එසමයෙහි සිංහල ගීයෙන් රචිත "මයුර සදෙස" අභාවප්‍රාප්ත ය. මෙකල ප්‍රසිද්ධ ව තිබෙන "මයූර සන්දේශය" මෑත දී රචිත වූවකි.

මහා ස්වාමීන්ද්‍රයන් විසින් "චාන්ද්‍ර ව්‍යාකරණය" අනුගමනය කරමින් ලියන ලද "මොග්ගල්ලායන" නම් වැදගත් පාලි ව්‍යාකරණය ද, අනුරුද්ධ හිමිපානන් විසින් විරචිත වූ "අනුරුද්ධ ශතක" නම් සංස්කෘත පද්‍යප්‍රබන්ධය ද, අන්‍යතර පඬිවරයන්ගේ කෘති වූ "බුද්ධගද්‍යය" * නම් සුව්‍යක්ත ගද්‍යප්‍රබන්ධය හා "නාමාෂ්ට ශතකය" * නමින් ප්‍රසිද්ධ නමස්කාර පද්‍ය පද්ධතිය ද එකල සිංහලයන්ගේ සංස්කෘත ඥානපාටවය විදහා පාති. මෙසේ පොළොන්නරු සමයෙහි ලඞ්කාවේ සංස්කෘත සාහිත්‍යය අතිශය උද්දීප්ත ව බැබලුනේ ය.

**iv දඹදෙණි කාලය.**

ඉන් පසු දඹදෙණි කාලයෙහි ද ඒ උද්දීප්ත භාවය එසේ ම පැවතුනේ ය. එසමයෙහි ශ්‍රීමත් අනවමදර්ශී සඞ්ඝරාජ මහා ස්වාමීන්ද්‍රයන් විසින් විරචිත "දෛවඥ කාමධේනු" නම් ජ්‍යොතිශ් ශාස්ත්‍රීය සංස්කෘත ග්‍රන්ථය ඊට වැදගත් සාක්ෂ්‍යයෙකි. එපමණක් නො ව මෙසමයෙහි සංස්කෘත ඡන්දෝලඞ්කාර අනු ව පාලි භාෂාවට ද "වුත්තෝදය, සුබෝධාලඞ්කාර" ආදි ඡන්දෝලඞ්කාර ග්‍රන්ථ සැපයූහ. "සමන්තකූට වණ්ණනා, හත්ථවනගල්ල විහාරවංස" ආදි පාලි පොත් ද, සංස්කෘත වර්ණනා රීති- රචනා රීති අනු ව ම නිපදවූහ. සිංහල ග්‍රන්ථ කර්තෘවරු ද සංස්කෘත රීති අනුගමනය කළහ. **කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත** පරාක්‍රමබාහු නරේන්ද්‍රයන්ගේ කෘතියක් වූ **කව්සිළුමිණ** "පද්‍යචූඩාමණි" නමැති බෞද්ධ සංස්කෘත කාව්‍යය අනුගමනයෙන් රචිත ය යි කල්පනා කරනු ලැබේ. එතුමන්ගේ සංස්කෘත ඥානය "විශුද්ධිමාර්ග" සන්නයෙන් ද ප්‍රකට වෙයි. ආචාර්ය ගුරුළුගෝමීන්ගේ "ධර්මප්‍රදීපිකාව" ද එසමයෙහි සංස්කෘත භාෂාව කෙරෙහි පැවති සැලකිල්ල පිළිබිඹු කෙරෙයි.

**vii ජයවර්ධන පුර කාලය.**

ඉන් පසු v ගම්පල සහ vi කුරුණෑගල රාජ්‍ය කාලයන්හි විශේෂ උද්දීප්තියක් නො පෙනෙන නමුත් ජයවර්ධනපුර (=කෝට්ටේ) රාජ්‍ය සමයෙහි සංස්කෘත සාහිත්‍යය ඉතා දියුණු තත්ත්වයෙක පැවති බව කිය හැකි ය. එකල නිෂ්පාදිත "වෘත්තමාලාඛ්‍යා, භක්තිශතක" ආදි සංස්කෘත ග්‍රන්ථ කුඩා වුව ද ඔවුන්ගේ රචනා විලාසය අතිශය චමත්කාර ජනක ය. එසේ ම එකල මෙහි විසූ සංස්කෘත සාහිත්‍ය විශාරදයන්ගේ සංඛ්‍යාව ඉතා විශාල විය. **තොටගමුවේ ශ්‍රී රාහුල** සඞ්ඝරාජ මහා ස්වාමීන්ද්‍රයන්ගේ සංස්කෘත ප්‍රඥාපාටවය විදහා දක්වන්නට සංස්කෘත භාෂාමය-

---

* කර්තෘ - කාල අනිශ්චිත යි.

විශේෂ කෘතියක් නැතත් උන්වහන්සේගේ "පඤ්චිකාප්‍රදීපය" ම ප්‍රමාණවත් ය. කෑරගල වනරත්න, වීදාගම මෛත්‍රෙය ආදි මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ද සංස්කෘත විෂයෙහි අද්විතීය පඬිවරයෝ වූහ.

**viii වර්තමාන කාලය**

මෙසේ ලක්දිව උසස් ලෙස බැබළුන සංස්කෘත සාහිත්‍යය කෝට්ටේ රාජ්‍ය කාලයෙන් පසු පරසතුරු උවදුරු කරණ කොට ගෙණ අවශේෂ ධර්මශාස්ත්‍ර ද සමග අනුක්‍රමයෙන් පිරිහෙන්නට පටන් ගෙණ මහනුවර රාජ්‍යකාලයේ අවසාන භාගය වන විට සම්පූර්ණයෙන් ම පිරිහීමට පත් විය. මුළු ලංකාව ම ධර්මශාස්ත්‍රාලෝකයෙන් අඳුරු ව පැවති එසමයෙහි සංස්කෘත උගතෙකු සොයා ගැණීම පවා දුෂ්කර විය. ඉක්බිති වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේගේ ශ්‍රද්ධා පූර්වක දෘඪතර උත්සාහයෙන් නැවත ද ලක්දිව්හි ධර්මශාස්ත්‍රාලෝකය පැතිරීමේ ආරම්භය ඇති විය. තදීය ශාස්ත්‍ර පරම්පරාවෙන් උද්ගත වූ පණ්ඩිතාග්‍රගණ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල, රත්මලානේ ශ්‍රී ධර්මාරාම ආදි මාහිමිවරුන්ගේ අනල්පෝත්සාහය හේතු කොට ගෙණ ලංකාවේ සංස්කෘත සාහිත්‍යලතාව නැවත ද ලියලන්නට වන. එසේ වැඩෙන්නට වූ සංස්කෘත ශාස්ත්‍රාලෝකය මෙකල තරමක බැබළීමකින් යුක්ත ව පවත්නා බව පෙණේ. කොළඹ ප්‍රාචීන භාෂෝපකාර සමාගම ද ඊට බලවත් ප්‍රතිෂ්ඨාවක් වූ බව කිය යුතු ම ය. දෙඩන්දුවේ ශ්‍රී ශීලස්කන්ධ නායක ස්ථවිර පාදයන් වහන්සේ විසින් විරචිත "සද්ධර්ම මකරන්ද, භක්තිශතක ටීකා, අනුරුද්ධශතක ටීකා" යන තුණ ද, ජේ. එස්. රාජසුන්දර වෙද ආරච්චි මහතා විසින් විරචිත "වෛද්‍යෝත්තංස" නම් වෙද පොත ද, කහවේ ශ්‍රී සුමංගල රත්නසාරාභිධාන නායක මාහිමියන් වහන්සේ විසින් කරණ ලද "සංස්කෘත ප්‍රවේශ" නම් පද්‍යමය සංස්කෘත ව්‍යාකරණය ද මේ නව ශාස්ත්‍රෝදයයෙහි ලක්දිව නිපදවූ සංස්කෘත ග්‍රන්ථයෝ ය.

## ව්‍යාකරණ පරිශීලනය.

---

ලක්දිව සංස්කෘත ව්‍යාකරණාධ්‍යාපනයෙහි "කාතන්ත්‍ර-චාන්ද්‍ර" යන ව්‍යාකරණයන් වැඩි වශයෙන් පරිශීලිත වූ බව සැලකිය හැකි සි. මෙහි දී නිපදවන ලද පාලි ව්‍යාකරණයන් ඒ අනු ව සම්පාදිත වීම ඊට වැදගත් සාක්ෂ්‍යයෙකි. අතිරේක වශයෙන් වෙනත් ව්‍යාකරණයන් ද හදාළ බව කිය යුතු යි. ශ්‍රී රාහුල මාහිමියන් එකල:

ප්‍රචලිත ව පැවති සියලු ම සංස්කෘත ව්‍යාකරණයන් හදාළ බවට පඤ්චිකාප්‍රදීපය ම සාක්ෂ්‍ය දෙයි. කාතන්ත්‍ර- චාන්ද්‍ර දෙකිහුදු චාන්ද්‍ර කර්තෘ "සඳගෝමි" යි සිංහලයන් විසින් ගෞරවයෙන් සඳහන් කරණ බෞද්ධයෙකු වූ බැවින් චාන්ද්‍ර ව්‍යාකරණය ම බොහෝ සෙයින් පරිශීලිත වී ය යි සිතන්නට ඉඩ තිබේ. 12 වන ශත වර්ෂයෙන් පසු මහාකාශ්‍යප මාහිමියන්ගේ "බාලාව බෝධනය"ද බෙහෙවින් හදාළ බව නිසැක ය. "බාලාවතාර" නම් සංක්ෂිප්ත පාලි ව්‍යාකරණය ඒ අනු ව රචනා කිරීම ඊට වැදගත් සාධකයෙකි. එහෙත් වර්තමාන සංස්කෘත සාහිත්‍යාදයේ ආදිම භාගයෙහි පටන් "මුග්ධබෝධ, මධ්‍ය සිද්ධාන්තකෞමුදී, ලඝු සිද්ධාන්තකෞමුදී" යන ව්‍යාකරණයන් බොහෝ සෙයින් හදාර වන්නට පටන් ගත්හ. ඉන් පසු සාරස්වත ව්‍යාකරණයට අත තැබූහ. මෙසේ ලක්දිව **සාරස්වත ව්‍යාකරණය** පරිශීලනය කරන්නට පටන් ගන්නා ලද්දේ මින් අවුරුදු සැටකින් හෝ සැත්තෑවකින් පමණ මෑත භාගයෙහි ය යි කිය හැකි ය. මෙකල නම් ලඞ්කාවේ සියලු ම පිරිවෙන්වල සංස්කෘත ව්‍යාකරණාධ්‍යාපනයෙහි සාරස්වත ව්‍යාකරණය ම පළමු කොට පරිශීලනය කරවන බව පෙණේ.

## සාරස්වත ව්‍යාකරණය.

---

මේ වනාහි සවල්ප කාලයකින් සංස්කෘත ව්‍යාකරණයෙහි ප්‍රමාණවත් අවබෝධයක් ඇති කරවන සේ සම්පාදිත වූ සුබෝධ සංක්ෂිප්ත ව්‍යාකරණයෙකි. සරස්වතිය විසින් දෙන ලදැයි කියන සූත්‍රයන්ට වෘත්ති - උදාහරණ ගැළපීමෙන් රචිත හෙයින් "සාරස්වත" ය යි කියනු ලැබේ. මෙය සම්පාදනයෙහි ප්‍රධාන අදහස සංස්කෘත ව්‍යාකරණයෙහි සංක්ෂිප්ත භාවය විය යුතු යි. මහර්ෂි පාණිනීන්ගේ ව්‍යාකරණය සූත්‍ර 4000 කින් යුත් ඉතා විශාල එකකි. එහෙයින් එහි භූයස්ත්වය සැලකූ පශ්චාත්කාලිකයෝ සූත්‍ර 1400 කින් යුත් "කාතන්ත්‍ර ව්‍යාකරණය" කළහ. එහිදු භූයස්ත්වය සැලකීමෙන් මේ "සාරස්වත ව්‍යාකරණය" සම්පාදිත ය. මෙහි සූත්‍ර 700 කි.* පාණිනීයයෙහි මෙන් ඉත්සංඥ වර්ණයන්ගේ බහුලත්වයක් ද මෙහි නැත. ප්‍රත්‍යාහාර ක්‍රමය ද ඊට වෙනස් වූ පහසු

---

* සූත්‍රපාඨයෙහි 775 ක් පෙණේ. එහි වූ ඇතැම් සූත්‍ර මෑත දී ඇතුළත් වූ අපපාඨ බව ද සිතිය හැකි ය.

"සූත්‍ර සප්තශතං යස්‍යෛ-ප්‍රදදෞ සාක්ෂාත් සරස්වතී,
අනුභූතිස්වරූපාය-තස්මෛ ශ්‍රී ගුරවෙ නමඃ."

යනු තච්ඡිෂ්‍යෝක්තියකි.

ක්‍රමයෙකි. සංඥාවෝ ද සුබෝධයහ. මෙහි සූත්‍ර ද බොහෝ සෙයින් පරිභාෂාවන්ගේ උපකාරයක් නැති ව ම අවබෝධ කළ හැකි ය. මෙසේ මෙය ඉතා සංක්ෂිප්ත වූ ද, උද්ග්‍රහණධාරණදියෙහි සුකර වූ ද ව්‍යාකරණයක් බැවින් උතුරු ඉන්දියාවේ නොයෙක් ප්‍රදෙශයන්හි වහා පැතිර ගියේ ය. **ගුජරාට්, නාගපුර්, උදයපුර්, දිල්ලි, බෙන්ගාල්** යනාදි ප්‍රදෙශයන්හි මෙය බොහෝ සෙයින් පරිභාවිත වූ බව ඒ පළාත්වල උගතුන් විසින් මීට ටීකා - විවෘතීන් ලිවීමෙන් සලකා ගත හැකි ය. මේ ව්‍යාකරණය ප්‍රචාරය කර හැරීම පිණිස ඉන්දියාවේ රජ කළ මුස්ලිම් රජවරුන්ගේ සාහාය්‍යය බෙහෙවින් ලැබුනු බව ඉතිහාසඥයෝ ප්‍රකාශ කෙරෙත්. "**ලොකාච්ඡෙෂස්‍ය සිද්ධිඃ**" යනාදි අවසාන සූත්‍රය අනු ව බාහිර ව්‍යාකරණයන්ගෙන් ගන්නා ලද නොයෙක් වාර්ත්තික පාඨවලින් ද පරිපොෂිත වූ මේ ව්‍යාකරණය "ප්‍රථම වෘත්ති, ද්විතීය වෘත්ති, තෘතීය වෘත්ති" ය යි කාණ්ඩ ත්‍රයයකින් පරිමිත ය. "ප්‍රක්‍රියා" නාමයෙන් පරිච්ඡෙද යන්ගේ පිරිසිදීම ඇති මෙය දැනුදු බිහාර්, බාරාණසී ආදි ප්‍රදෙශයන්හි පරිශීලනය කරණ බව අසන්නට ලැබේ. මීට වඩා කෙටි වූ අන්‍ය ව්‍යාකරණයක් තව ම සම්පාදනය නො වී ය. යුරෝපීයයන් විසින් ලියන ලද ප්‍රථම සංස්කෘත ව්‍යාකරණය වූ "විල්කින්ගේ සංස්කෘත ව්‍යාකරණය"(=Wilkin's Sanskrit Gremmer) නමැති පොත ලිවීමට උපදෙශකාණ්ඩයෙන් තෝරා ගන්නා ලද්දේ මේ සාරස්වත ව්‍යාකරණය ම ය.

**කාලය.** මෙහි රචනා කාලය නිශ්චය වශයෙන් නො කිය හැකි වුවත් 13 වෙනි ශතවර්ෂයෙන් පූර්වයෙහි කරණ ලද පොත්වල සාරස්වතය ගැණ කිසිවක් සඳහන් නො වන බැවින් ද, සියලු ම සාරස්වත ටීකා - විවෘතීන් 13 වෙනි ශතවර්ෂයෙන් පසු ව ලියන ලද බැවින් ද 13 වෙනි ශතවර්ෂයේ අවසාන භාගයෙහි දී මෙය විරචිත ය යි සාමාන්‍යයෙන් කල්පනා කළ හැකි ය.

**කර්තෘ.** මෙහි කර්තෘ තෙමේ "ශ්‍රීමත් පරමහංස පරිව්‍රාජකාචාර්ය" යන උපාධි ඇති අනුභූති ස්වරූපාචාර්ය නම් සන්‍යාසි යෙකි. ඒ බව ග්‍රන්ථාවසානයෙහි පැණෙන,

"ස්වරූපානෙනා'නුභූත්‍යාදිඃ - ශබ්දෙ'භූද්‍යත්‍ර සාර්ථකඃ,
ස මස්කරී ශුභාඤ්චක්‍රෙ - ප්‍රක්‍රියාං චතුරෙචිතාම්."

යන ස්වීය නිබන්ධයෙන් හා "ඉති ශ්‍රීමත් පරමහංස පරිව්‍රාජකාචාර්‍යානුභූතිස්වරූපාචාර්‍ය විරචිතායාම්" යනාදි සමාප්තිපාඨයෙන් ද

හැගේ. එහෙත් ක්ෂේමේන්ද්‍ර, අමෘතභාරතී ආදි ඇතැම් ටීකාකාරයෝ "ඉති ශ්‍රී නරේන්ද්‍රාචාර්ය්‍ය සාරස්වතෙ" යනාදී වශයෙන් **"නරේන්ද්‍රාචාර්ය්‍ය"** ය යි සඳහන් කළහ. මේ අනුභූති ස්වරූපාචාර්යයන් තත්කාලීන පඬිවරයන් අතර අති උච්චස්ථානයක වැජඹුනු ශබ්දශාස්ත්‍ර පාරගත මහා ප්‍රාඥයෙකු බව නිසැක ය. එබැවින් එතුමන්ට ගෞරව වශයෙන් "නරේන්ද්‍රාචාර්ය්‍ය" ය යි ද ව්‍යවහාර කළ බව සිතිය හැකි ය. "අනුභූති ස්වරූප" යනු ද එතුමාගේ පාණ්ඩිත්‍යය අනු ව පසු ව ව්‍යවහාරප්‍රාප්ත වූ ගෞරවෝපාධියක් බවත්, **නරේන්ද්‍ර** යනු ම එතුමාගේ නියම නාමය විය හැකි බවත් ඇතැම් විචාරකයෝ කල්පනා කරත්. සාරස්වතීය සූත්‍රපාඨය නරේන්ද්‍රාචාර්යයන් විසින් රචිත බව ද, අනුභූති ස්වරූපාචාර්යයන් විසින් ඊට වෘත්ත්‍යුදාහරණ ලියා වාර්ත්තික පාඨ ඇතුළත් කොට සකස් කළ බව ද තවත් මතාන්තරයෙකි. මෙහි බොහෝ වාර්ත්තික පාඨයන් ඇතුළත් ව තිබීම අනුභූති ස්වරූපාචාර්යයන් සූත්‍රකාරයන් නො වන බවට වැදගත් සාක්ෂ්‍යයක් බවත්, හෙතෙමේ ම සූත්‍රකර්තෘ වූයේ නම් ඒ සියල්ල ද වාර්ත්තිකපාඨ මෙන් නො ව සූත්‍ර ලෙස ම ඇතුළත් කළ හැකි ව තුබුන බවත් ඔහු කියති. එහෙත් මේ ව්‍යාකරණයෙහි සංක්ෂිප්ත භාවය දක්වා ආධුනිකයන් උත්සාහවත් කරණු පිණිස ප්‍රධානාඞ්ග සඳහා පමණක් සම්පාදිත වූ සූත්‍ර 700 කින් පරිමිත කළ බව ද, එහි අවසාන සූත්‍රානුගත ව නොයෙක් වාර්ත්තික පාඨවලින් ඌනස්ථාන සම්පූර්ණ කළ බව ද තත්ප්‍රතිපක්ෂ මතය යි.

**පුරාවෘත්තය.**

මේ ව්‍යාකරණය කිරීමට "පුංක්ෂු" යන පදය හෙතු වී ය යි කියත්. ඒ පිළිබඳ කථා ප්‍රවෘත්තිය ඇතැම් ටීකාකාරයෝ මෙසේ දක්වති. "එක් දවසක් අනුභූතිස්වරූපාචාර්ය තෙමේ පණ්ඩිත සභාවක කථාවක් පවත්වමින් "පුංක්ෂු" ය යි පදයක් උච්චාරණය කෙළේ ය. එවකට පැවති පාණිනීයාදි ව්‍යාකරණවලින් එය නිපදවිය නො හැකි බැවින් සදෝස් වචනයකැයි එහි වූ සෙසු පඬිවරු සරදම් කරන්නට වන්හ හෙතෙමේ ද ස්වකීය වචනයෙහි නිදෝස් බව ම කියා සිටියේ ය. එසේ නම් සාධකයක් දැක්විය යුතු ය යි කී හෙයින් 'හෙට දක්වන්නෙමි' යි කියා ගෙට ගොස් සරස්විය පුදා සැතපුනේ ය. එදින මධ්‍යම රාත්‍රියෙහි **සරස්වතී** තොමෝ ප්‍රත්‍යක්ෂ රූපයෙන් ඔහු ඉදිරියෙහි පෙණී සිට කැමති වරයක් ගණුව යි කීවා ය. අනුභූතිස්වරූප ද අපූර්ව (=පෙර නුවූ) ව්‍යාකරණයක් ඉල්ලූ බැවින් ඕ තොමෝ සූත්‍ර 700 ක් කියා අතුරුදහන් වූවා ය. "පුංක්ෂු" යන පදය නිපදවීමට සමර්ථ වූ **"අසමහගෙව පුංසඃ**

ඛක් සෞ" යන සූත්‍රය ද ඒ සූත්‍ර පඨනීයට ඇතුළත් වූ බැවින් ප්‍රමුදිත වූ අනුභූතිස්වරූප තෙමේ ඒ සරස්වතීදත්ත සූත්‍රපාඨය පිළිගෙණ පසු දින යථොක්ත පණ්ඩිත සභාවට ඉදිරිපත් කෙළේ ය. ඔහු ද එය සතුටින් පිළිගත්හ." යනු යි. මෙසේ මේ සූත්‍ර පඨනීය සරස්වතීදත්ත ය යි ද, වෘත්ත්‍යුදාහරණ ලියා සකස් කිරීම තමා විසින් කරණ ලදැයි ද අනුභූතිස්වරූපාචාර්‍ය්‍යයෝ ම කීහ. ඒ බව "සාරස්වතීමෘජුංකුර්වේ - ප්‍රක්‍රියාං නාතිවිස්තරාම්" යන ග්‍රන්ථාරම්භයෙන් ද, "ස මස්කරී ශුභාං චක්‍රෙ - ප්‍රක්‍රියාං චතුරෝචිතාම්" යන කර්තෘ සඳගීතයෙන් ද වැටහේ. එහෙත් සත්‍යය නම් තමන්ගේ ම ප්‍රයොගය තමන්ගේ ම සූත්‍රයකින් නිදෙස් කළ නො හැකි බැවින් සරස්විය මත ආරොපණය කොට හුදු දෙවභක්තියෙන් පිළිගන්නට සැලැස්වීමෙන් ග්‍රන්ථ ගෞරවය රැක ගණු පිණිස එසේ කී බව ය. එබැවින් අනුභූතිස්වරූපාචාර්‍ය්‍යවරයන් විසින් ම සූත්‍ර පඨනීය ද රචනා කොට ඉන් පසු ස්වීය ශිෂ්‍යයන්ට පහසුවෙන් සකු වියරණ උගන්වනු පිණිස ඊට වෘත්ත්‍යුදාහරණ ද ලියා සකස් කළ බව මධ්‍යස්ථ විචාරකයන්ගේ පිළිගැණීම යි. සරස්වතීදත්ත ය යි කියන ලද සූත්‍ර පඨනීය "අෂ්ටාධ්‍යායී සූත්‍රපාඨ" යන නමින් ප්‍රසිද්ධ ය. "නාතිවිස්තර සාරස්වතී ප්‍රක්‍රියා" ය යි කියන ලද්දේත් එය ම ය.

## ටීකා සහ තත්කර්තෘහු.

---

මේ ව්‍යාකරණයට ලියන ලද ටීකා ඉතා බොහෝ යි. ඒ ටීකාවෝ උත්තර භාරතයෙහි නොයෙක් ප්‍රදෙශවල පඬිවරයන් විසින් ලියන ලදහ. සමහරු මූළු සාරස්වත ව්‍යාකරණයට ද, සමහරු සූත්‍ර පඨනීයට ද ටීකා ලියූහ. ඉන් බොහෝ ගණනක් දැන් ඉතා සුලභ වන නමුත් ඇතැම් ටීකා නාමශෙෂ බවට පත් වී තිබේ.

### 1. පුඤ්ජරාජ.

පළමුවෙන් ම සාරස්වතයට ටීකාවක් ලියූ පඬිවරයා නම් මෙතෙමේ යි. මලබාර් දෙශයේ "මාල්වා" නුවර වැසියෙකු වූ මොහුගේ ග්‍රන්ථ රචනා කාලය ක්‍රි: ව: 1469–1500 අතර ය යි සලකනු ලැබේ. **ශිශුප්‍රබොධ,** ධ්වනිප්‍රදීප යන ග්‍රන්ථයන්හි ද කර්තෘ වූ මෙතුමාගේ සාරස්වත ටීකාවට විශෙෂ නාමයක් ඇති බවක් නො පෙණේ.

## 2. චන්ද්‍රකීර්ති.

ජෛන භක්තිකයෙකු වූ මෙතුමා විසින් ලියන ලද සාරස්වත-ටීකාව ලඞ්කාවේ අතිශයින් ප්‍රචලිත ය. එය **සුබොධිකා, දීපිකා**-යන නම්වලින් හඳුන්වනු ලැබේ. රචනා කාලය සොළොස් වන ශතවර්ෂය යි. පදසිද්ධි දැක්වීම මෙහි ප්‍රධාන ප්‍රතිපත්තිය විය. පොත්හි ඇතැම් දුර්බොධස්ථාන ගැණ කිසි කථාවක් නැත-ටීකාකරු නො මග ගිය තැන් ද වෙයි.

## 3. අමෘතභාරතී.

දහසවන ශතවර්ෂයේ මධ්‍යභාගයේ දී මොහු විසින් **සුබොධිකා** යන නමින් සාරස්වතයට ටීකාවක් ලියන ලදී. "පුරුෂොත්තම" නම් ස්ථානයේ දී ලියන ලදූයි සඳහන් වේ. අමෘතභාරතීහු ස්වකීය කෘතිය මෙසේ දක්වත්:-

"**ශතානන්දෙරන්ද්‍රාඞ්ගජ**ප්‍රභාෂිතං- යච්ච වෛමලසරස්වතීරිතම්,
තන්මයාත්‍ර ලිඛිතං තථාධිකං-කිඤ්චිදෙව කලිතං ස්වයා ධියා" යි.

## 4. ක්ෂෙමෙන්ද්‍ර.

මොහු විසින් ද දහහත් වන ශතවර්ෂයේ දී සාරස්වතයට ටීකාවක් ලියන ලදී. එහිදු විශෙෂ නමක් ගැණ සඳහන් නො වේ. "ඉති ශ්‍රී **නරෙන්ද්‍රාචාර්‍ය්‍යසාරස්වතෙ** ක්ෂෙමෙන්ද්‍රකෘතං ටිප්පනං-සමාප්තම්" යනු ක්ෂෙමෙන්ද්‍රයන්ගේ ග්‍රන්ථාවසාන පාඨය යි.

## 5. රාමභට්ට.

ආන්ධ්‍ර ජාතියෙකු වූ මොහු විසින් ලියන ලද ටීකාව-**විද්වත්ප්‍රබොධිනී, රාමභට්ටී** යන නම්වලින් ප්‍රසිද්ධ ය-ඓතිහාසික සිද්ධීන් දැක්වීම ද ඔහුගේ ප්‍රධාන අදහසක් විය. දහහත් වන ශතවර්ෂයේ ජීවත් වූ මොහු මහාකවි **කාලිදාසයන්ගේ** කාව්‍ය තුණකට ද ටීකා ලියූහ.

## 6. මාධව.

සොළොස් වන ශතවර්ෂයේ විසුවේ ය යි සලකන මොහු විසින් කළ ටීකාවේ විශෙෂ නාමය සිද්ධාන්ත **රත්නාවලී** යනු යි.

## 7. වාසුදෙව භට්ට.

මොහු විසින් ලියන ලද ටීකාව **සාරස්වත ප්‍රසාද** හෙවත් **ප්‍රසාද** ටීකා යන නමින් ප්‍රසිද්ධ ය.

### 8. මෙඝරත්න.

මොහු විසින් **සාරස්වත දීපිකා** යන නමින් ටීකාවක් ලියන ලදී.

### 9. මණ්ඩන. 10. ධනෙශ්වර.

මෙනම් පඬිවරයන් දෙදෙන විසින් ද ටීකා දෙකක් ලියූ බව පෙණේ.

### 11. ජගන්නාථ.

මොහුගේ සාරස්වත ටීකාව **සාරදීපිකා** යන නමින් ප්‍රසිද්ධ ය. (මේ 7–8–9–10–11 යන ටීකා පසෙහි ම රචනා කාලය සොළොස් වන ශතවර්ෂය යි කල්පනා කරණු ලැබේ.)

### 12. කාශිනාථ.

**සාරස්වත භාෂ්‍ය** යන නමින් මෙතුමා විසින් ද ටීකාවක් ලියන ලදී.

### 13. සහජකීර්ති. 14. භට්ටගොපාල.

ජෛන භක්තිකයෙක් වූ සහජකීර්ති ද, භට්ටගොපාල නම් ආචාර්‍ය්‍ය තෙමේ ද තවත් ටීකා දෙකක් ලියූහ.

### 15. හංස විජයගණි.

මෙනම් පඬිවරයා විසින් ද ශබ්දාර්ථ චන්ද්‍රිකා යන නමින් සාරස්වතයට ටීකාවක් ලියන ලදී. (මේ 12-13-14-15 යන සතර දහසත් වන ශතවර්ෂයෙහි කරණ ලද බව කියත්.)

### 16. ශ්‍රී හරලාල සමෘතිරත්න.

මොහුගේ ටීකාව **බාලසරලා** යන නමින් ප්‍රසිද්ධ ය. මෙය ඉතා මෑත දී කරණ ලද්දකි. ශක වර්ෂ 1845 දී නිමවන ලදැයි ග්‍රන්ථ වශ්‍යානයෙහි කියා තිබේ. මේ ටීකාකරු සාරස්වතය ශුද්ධ කරන්නට ගොස් බොහෝ සෙයින් සිද්ධාන්ත චන්ද්‍රිකාවට අනු ව සකස් කළ බව පෙණේ. එයින් සාරස්වත ව්‍යාකරණය බොහෝ දුරට වෙනස් විය. මෙය ග්‍රන්ථ ශොධකයෙකුගෙන් බලාපොරොත්තු නො විය යුත්තකි. ඒ හැර මේ ටීකාව ද එතරම් ප්‍රශස්තය යි අපට නො වැටහේ.

මේ ටීකා සොළස මූළ සාරස්වත ව්‍යාකරණයට ලියන ලද ටීකාවෝ යි.

### 17. තර්කතිලක භට්ට.

මෙනම් ආචාර්‍ය්‍යවරයෙකු විසින් දහසත් වන ශතවර්ෂයේ දී සාරස්වත සූත්‍රවලට පමණක් විවෘතියක් ලියා තිබේ.

### 18. ජිනෙන්ද්‍ර.

මොහු විසින් ද ඒ ශතවර්ෂයෙහි ම සිද්ධාන්ත රත්න යන නමින් සාරස්වත සූත්‍රයන්ට ටීකාවක් ලියන ලදී.

### 19. රඝුනාථ.

සිද්ධාන්ත කෞමුදී කර්තෘ වූ භට්ටෝජිදීක්ෂිතයන්ගේ ශිෂ්‍යයෙකු වූ රඝුනාථයෝ ලඝුභාෂ්‍යය කළහ. එද දහහත් වන ශතවර්ෂයට අයත් ය. පතඤ්ජලිහුගේ "මහාභාෂ්‍යය" අනුගමනයෙන් මෙය ලියූ බව සැලකිය හැකි ය. රඝුනාථයන් ඉතා සූක්ෂම බුද්ධිමතෙකු බව මේ ටීකාවෙන් ම ඔප්පු වේ. තාර්කික භාෂාවෙන් සාරස්වත සූත්‍රයන් පිළිබඳ ව කරණ ලද විවෙචනය අතිශයචමත්කාර ජනක ය. සාරස්වතය පරිශීලනය කරන්නන්ට මෙය ඉතා ප්‍රයොජනවත් ටීකාවෙකි.

### 20. රාමාශ්‍රම.

දහහත් වන ශතවර්ෂයේ දී මොහු විසින් ලියන ලද සිද්ධාන්ත චන්ද්‍රිකාව ද ලක්දිව බෙහෙවින් ව්‍යාප්ත ව පවතී. මෙය හුදු සාරස්වත ටීකාවක් ම නො ව සාරස්වත සූත්‍රයන්ට වෘත්ත්‍යුදාහරණ ගැළපීමෙන් රචිත වූ ව්‍යාකරණාන්තරයෙකි. අන්‍ය ව්‍යාකරණවලින් ගත් වාර්ත්තිකයන්ගෙන් ඌනස්ථාන සම්පූර්ණ කොරෙමින් ලියන ලද මේ ප්‍රශස්ත ව්‍යාකරණය සාරස්වතය හදරන්නන්ට ද බලවත් පිහිටෙකි. සදානන්ද නම් පඬිවරයකු විසින් මුළු පොතට ම කරණ ලද සුබොධිනී ටීකාව ද, ලොකෙශකර නම් උගතකු විසින් දුර්බොධ ස්ථානවලට පමණක් ලියන ලද තත්ත්වදීපිකා ටීකාව ද එහි වටිනාකම තවත් දියුණු කෙරෙත්. එහෙයින් සාරස්වත ව්‍යාකරණය හදාරණ සියල්ලන් විසින් ම මේ සිද්ධාන්ත චන්ද්‍රිකාව පරිශීලනය කට යුතු බව අපගේ අදහස යි.

## උපග්‍රන්ථ හා තත්කර්තෘහු.

### 1. හර්ෂකීර්ති.

ටීකාකර්තෘවරයකු වූ චන්ද්‍රකීර්ත්තිගේ ශිෂ්‍යයෙකු වන හර්ෂකීර්ත්ති විසින් සාරස්වත ධාතුපාඨයක් සම්පාදනය කළ බවත්, එය තරඞ්ගිණී යන නමින් ප්‍රසිද්ධ ව පැවති බවත් දැන ගන්නට තිබේ.

### 2. ඥානකීර්ති.

මෙනම් පඬිවරයෙකු විසින් සාරස්වත ව්‍යාකරණය පිළිබඳ වාපද සාධනයක් ලියන ලදී.

## 3. කල්‍යාණ සරස්වතී.

මෙතුමන් විසින් රචිත සාරස්වතීය උපග්‍රන්ථය **ලඝු සාරස්වත** යන නමින් ප්‍රසිද්ධ ය.

මෙතරම් පරිවාර ග්‍රන්ථ සමූහයක් පහළ වීමෙන් ම මේ සාරස්වත ව්‍යාකරණය අතීතයෙහි කොපමණ ව්‍යාප්ත ව පැවැත්තේ දැයි සිතා ගත හැකි ය.

### සාරාර්ථ චන්ද්‍රිකා
### නම් වූ
# සාරස්වත ප්‍රක්‍රියාර්ථ ව්‍යාඛ්‍යානය

---

**ප්‍රථම කාණ්ඩ ත්‍රයය.**

පූර්වෝක්ත පරිද්දෙන් ලංකාවේ පිරිවෙන්වල සාරස්වත ව්‍යාකරණය පරිශීලනය කරන්නට පටන් ගත් කල්හි ඊට සිංහලාර්ථ ව්‍යාඛ්‍යානයක් නො තිබීම ආධුනිකයන්ට මහත් පාඩුවක් විය. එහෙයින් සංස්කෘතාභිලාෂී සිංහල ශිෂ්‍යයන් අතට පළමු කොට ම පමුණු වන නුපුරුදු භාෂාවකින් රචිත සාරස්වත ව්‍යාකරණයට පැහැදිලි සිංහල සන්නයක් තිබීම ඔවුන්ගේ බුද්ධිප්‍රබෝධයට හෙතු වන බව සලකා වදාළ දිවංගත විද්‍යෝදය පරිවෙණාධිපති **කහවේ ශ්‍රී සුමඞ්ගල රත්න සාරාභිධාන** කොළඹ නවකෝරළයේ ප්‍රධාන නායක මාහිමියානන් වහන්සේ විසින් ප්‍රථම වෘත්තියට කාණ්ඩ දෙකකින් ද, ද්විතීය වෘත්තියේ භ්වාදි ගණය තෙක් කාණ්ඩයකින් දැයි මෙසේ කාණ්ඩ තුණකින් යුක්ත වූ "සාරාර්ථ චන්ද්‍රිකා" යන නමින් ප්‍රශස්ත ව්‍යාඛ්‍යානයක් සම්පාදනය කරණ ලදී. විද්‍යෝදය පිරිවෙණට නවජීවනයක් ගෙණ දෙමින් ලංකාවේ ශාසනවර්ධනයට හා ශබ්දශාස්ත්‍රවර්ධනයට ද අනල්ප සේවයක් සිදු කොට වදාළ උන්වහන්සේගේ එම විස්තරාර්ථ සහිත සාරස්වත ව්‍යාඛ්‍යානය සංස්කෘතාභිලාෂී ආධුනිකයන්ට පහළ වූ කල්පවෘක්ෂයක් බඳු විය.

**චතුර්ථ භාගය.**

මූල් කාණ්ඩ තුණ සම්පාදිත වීමෙන් ටික කලකට පසු අර්ධයකට ස්වල්පයක් ඌන වූ අවශිෂ්ට භාගයට ද ව්‍යාඛ්‍යානයක් සපයනු මැනවැයි සංස්කෘත ශබ්දශාස්ත්‍රාභිලාෂී බොහෝ දෙනෙකුන් විසින් කරණ ලද ආරාධනය පිළිගත් වර්තමාන විද්‍යෝදය පරිවෙණාධිපති **අස්මදාචාර්ය බද්දේගම ශ්‍රී ප්‍රියරත්නාභිධාන** ප්‍රධාන නායක මාහිමියානන් වහන්සේ විසින් අදාදි ගණයේ පටන් ද්විතීය වෘත්තියේ

අවසානය තෙක් මූල් පොත ද ශුද්ධ කොට සවිස්තර ව්‍යාඛ්‍යානයක් සපයන ලදී. ව්‍යාකරණ සූත්‍රයන්ට සානුවෘත්තික පදාර්ථ දක්වීම එහි ඇති විශෙෂ ලක්ෂණයෙකි. ඊට අපගේ ද උත්සාහය යොමු කරන්නට ලැබීම මදිය බලවත් ප්‍රීතිය පිණිස වෙයි. ශබ්දශාස්ත්‍ර විෂයෙහි බැසගත් තීක්ෂ්ණ බුද්ධිපාටවයක් ඇති උන්වහන්සේගේ එම ව්‍යාඛ්‍යානය ද නවීනයන්ගේ මෙන් ම ප්‍රවීණයන්ගේ ද බුද්ධි වර්ධනයට හෙතු වන හෙයින් පණ්ඩිත ලෝකයාගේ අකාලඩක ගෞරවාදරයට භාජන වූ බව ප්‍රසිද්ධ ම ය.

## අපගේ ව්‍යාඛ්‍යානය.

චතුර්ථ කාණ්ඩය සම්පාදනය කිරීම සඳහා වූ අපගේ උද්යොගයෙහි ප්‍රමුදිත වූ පූජ්‍යෝක්ත අසමද්ගුරුදෙවයන් වහන්සේ විසින් ලඞකාවේ ප්‍රාචීන භාෂොපකාර සමාගමේ පණ්ඩිතොපාධිය පිණිස සාරස්වත කෘදන්තය පිළිබඳ ව විවෘතියක් සපයන ලෙස කරණ ලද නියොගයෙන් උත්සාහවත් වූ අපි, යථොක්ත සමිතියට යවන ලද සැලැස්ම ද තදීය කාරක සභාව විසින් සමානච්ඡන්දයෙන් පිළිගන්නා ලද බැවින් සාරස්වත ව්‍යාකරණයේ අවසාන භාගය වූ තෘතීය වෘත්තියට හෙවත් කෘදන්ත ප්‍රක්‍රියාවට විස්තරාර්ථ සහිත මේ ව්‍යාඛ්‍යානය සම්පාදනය කොළෙමු. චතුර්ථ භාගයෙහි මෙන් සූත්‍රයන්ට සානුවෘත්තික පදාර්ථ දක්වීම හැර සෙසු සියලු ලක්ෂණ වලින් මේ කොටස ද මූල් කාණ්ඩවලට අනුගත වූ බව සැලකිය යුතු යි.

**අවසාන භාගය.**

මෙහි වූ ඇතැම් වචන ශබ්දකොෂවල පවා අවිද්‍යමාන බැවින් මෙබඳු කෘතියක ඇති දුෂ්කරත්වය තත්ත්වඥයෝ දනිත්. තව ද, නොයෙක් ප්‍රදෙශයන්හි මුද්‍රිත වීමෙන් හා ග්‍රන්ථ ශොධකයන්ගේ අනවධානත්වයෙන් ද සාරස්වත ව්‍යාකරණය අනෙක දොෂ දූෂිට ව පවත්නා බව ප්‍රකට සත්‍යයෙකි. සාරස්වතයේ සෙසු කොටස්වලටත් වඩා කෘදන්ත කාණ්ඩය පිළිබඳ ව එම අභාග්‍ය තත්ත්වය බෙහෙවින් බල පවත්වන බව පෙණේ. අර්ථය හා නො ගැළපෙන ඇතැම් විග්‍රහ වාක්‍ය ද වෙයි. මෙසේ හෙයින් අර්ථ ලිවීමටත් වඩා මේ කොටසෙහි මුල් පොත ශුද්ධ කර ගැණීම අපට ආයාසකර වූ බව කිය යුතු මැයි. එසේ වුව ද හැකි තාක් සාරස්වත ටීකා සහ වෙනත් ව්‍යාකරණයන් ද සපයා ගෙණ යථා ශක්තීන් පොත ද ශුද්ධ කොට සියලු දුර්බොධස්ථාන පැහැදිලි කරමින් හා සුබොධස්ථාන සංක්ෂිප්ත කරමින් ද, දුෂ්කර පදසිද්ධි දක්වමින් ද විස්තරාර්ථ සහිත අපේ මේ ව්‍යාඛ්‍යානය සම්පාදනය කළ බව සතුටින් පවසම්හ. ඖණාදික නාමයන් සංඥා වාචක

බැවින් ඔවුන්ගේ ප්‍රසිද්ධාර්ථ ද දක්වන ලදී. මින් කලකට පෙර ආරබ්ධ **සාරස්වත ප්‍රක්‍රියාර්ථ** ව්‍යාඛ්‍යානය මෙසේ පරිසමාප්ත වීම සංස්කෘත ශබ්දශාස්ත්‍රාභිලාෂී ලාංකිකයන්ගේ මනඃප්‍රීණනය පිණිස වේ ය යි අපි විශ්වාස කරමු.

## උපග්‍රන්ථය.

ව්‍යාකරණයට ලිඞ්ගානුශාසනයක් ආවශ්‍යක බැවින් සාරස්වතීය සමාස- තද්ධිත - කෘදන්තයන් පිළිබඳ ව අප විසින් සම්පාදිත ලිඞ්ගානුශාසනයක් හා ධාතුසර්ථ ඉද්වණ්යන්ගේ සඞ්ග්‍රහයක් ද මෙහි උපග්‍රන්ථය වශයෙන් එකතු කෙළෙමු. එය ශබ්දයන්ගේ ලිඞ්ග විභාගය හා ධාතුන්ගේ විශෙෂ ලක්‍ෂණ දැන ගැණීමට උපකාර වෙනවා ඇත. ඒ හැර මෙය පරිශීලනය කරන්නවුන්ගේ පහසුව සඳහා අකාරාදි ක්‍රමයෙන් මුළු පොතට ම පිළියෙළ කරණ ලද **සූත්‍ර සූචි, ධාතු සූචි, ගණ සූචි, අනුක්‍රමණිකා** යනාදිය ද පොත අගට එකතු කෙළෙමු. සංස්කෘත ව්‍යාකරණය හදාරන්නවුන් විසින් අවශ්‍යයෙන් දත යුතු දීර්ඝ විස්තරයක් හා ලඞ්කාවේ සංස්කෘත සාහිත්‍යවංශය පිළිබඳ සංක්‍ෂිප්ත විස්තරයක් ද යනාදි ප්‍රයෝජනවත් කරුණු රාශියකින් ප්‍රස්තාවනාව ද සකස් කෙළෙමු. මෙසේ මේ අවසාන භාගය සම්පූර්ණ සාරස්වත ව්‍යාකරණයට ම ප්‍රයෝජනවත් වන ලෙස සම්පාදනය කිරීමෙන් මේ වැදගත් ශාස්ත්‍රීය කෘතිය නිමවන්නෙකුගෙන් ඉටු විය යුතු හැම යුතුකමක් ම අපගෙන් ඉටු වූ බව සතුටින් මෙහි සඳහන් කරමු.

## ආශ්‍රිත ග්‍රන්ථ.

සාරස්වත ප්‍රක්‍රියා ව්‍යාඛ්‍යානය සම්පාදනය කිරීමෙහි දි ආශ්‍රිත ග්‍රන්ථ ඉතා බොහෝ යි. ඔවුනතුරෙන් ව්‍යාකරණ ග්‍රන්ථ පිළිබඳ ව පමණක් මෙහි කෙටි හැඳින්වීමක් කරණු ලැබේ.

### 1. කාතන්ත්‍රය.

ක්‍රිස්තු ජන්මයෙන් දෙවෙනි ශතවර්ෂයේ දී පමණ ශර්වවර්මන් නම් පඬිවරයෙකු විසින් කරණ ලද ව්‍යාකරණයෙකි. කුමාර ව්‍යාකරණය, කලාප ව්‍යාකරණය කියා ද මිට තවත් නම් දෙකෙකි. ("කු ඊෂත්තන්ත්‍රං = කාතන්ත්‍රම්" යි) කුඩා ප්‍රකරණයක් බැවින් **I කාතන්ත්‍රය** යි ද, කඳ කුමරුන් විසින් දෙන ලද හෙයින් හෝ බාලයන්ගේ ප්‍රයෝජනය පිණිස රචිත බැවින් **ii කුමාර ව්‍යාකරණය** යි ද, මොනර පිල් කලබෙහි පළමු කොට ලියූ බැවින් **iii කලාප ව්‍යාකරණය** යි ද කියනු ලැබේ. **'කෞමාරාස්තවසානෙ'ප්‍යනුස්වාරම්වජනති'** යි සාරස්වත සන්ධිප්‍රක්‍රියායෙහි දක්වන ලද්දේ මේ ව්‍යාකරණය යි. එහි "කෞමාරාඃ" යන්නට "කුමාර ව්‍යාකරණය හදාරන්නෝ" ය යි අර්ථ ගත යුතු යි.

## 2. චාන්ද්‍ර ව්‍යාකරණය.

බෞද්ධයෙකැයි අවිවාදයෙන් පිළිගැණෙන චන්ද්‍රගොමින්ගේ මේ ව්‍යාකරණය පාණිනීය සූත්‍ර සකස් කිරීමෙන් කරණ ලද්දකි. එතුමන් විසින් ම රචිත කොටස් ද වෙයි. මෙහි සූත්‍ර 3100 කි. ඇතැම් චාන්ද්‍ර සූත්‍ර කාශිකාවට ද ගත් බව පෙණේ. ඉන්දියාවේ බෞද්ධ ශිෂ්ටාචාරය බල පැවැත්වූ කාලයෙහි මේ ව්‍යාකරණය අතිශයින් ව්‍යාපත ව පැවති බව සිතිය හැකි ය. සවන ශතවර්ෂයෙහි විසුවේ ය යි සලකන මේ චන්ද්‍රගොමිහුගේ තවත් කෘතීහු නම් **ශිෂ්‍යලේඛ, ලෝකානන්ද** යනාදි නාට්‍ය ග්‍රන්ථයෝ යි.

## 3. බාලාවබෝධනය.

චාන්ද්‍ර ව්‍යාකරණයේ සංක්ෂිප්තයෙකි. සිද්ධාන්ත කෞමුදියෙන් ලඝු කෞමුදිය සකස් කළාක් මෙන් චාන්ද්‍ර ව්‍යාකරණයෙන් මේ බාලාවබෝධනය සකස් කළ බව පෙණේ. 12 වන ශත වර්ෂයේ අවසාන භාගයෙහි ලඞ්කාවේ සඞ්ඝරජ පදවිය දැරූ දිඹුලාගල **මහාකාශ්‍යප** මහාස්වාමීන්ද්‍රයන්ගේ කෘතියකි. මේ ව්‍යාකරණය පහළ වීමෙන් මෙහි චාන්ද්‍ර පරිශීලනය බොහෝ සෙයින් අභාවයට ගියේ ය.

## 4. ශාකටායනය.

**ශාකටායන** විසින් රචිත ව්‍යාකරණය යි. මොහු යාස්කගේ නිරුක්තයෙහි හා පාණිනීගේ අෂ්ටාධ්‍යායී සූත්‍රපාඨයෙහි සඳහන් වන ශාකටායන නො ව මෑත භාගයෙහි එනමින් සිටි වෙන කෙනෙකුන් බව පස්වන ශතවර්ෂයේ විසූ **ජෛනේන්ද්‍රගේ** ව්‍යාකරණයෙන් කරුණු ගෙණ තිබීමෙන් ඔප්පු වේ. මෙහි රචනා කාලය නවවන ශතවර්ෂය යි විශ්වාස කෙරෙත්. වෛදික ප්‍රක්‍රියාව හා ස්වර ප්‍රක්‍රියාව අත් හැර ඇතැම් සූත්‍ර කෙටි කොට පාණිනීය සූත්‍රවලින් ම මේ ව්‍යාකරණය සකස් කරණ ලදී. අධ්‍යාය 4 කි. සූත්‍ර 3226 කි.

## 5. සිද්ධාන්ත කෞමුදී.

පාණිනීය ව්‍යාකරණයට කළ වෘත්ති විශෙෂයෙකි. 17 වන ශතවර්ෂයෙහි ජීවත් වූයේ ය යි සලකන **භට්ටෝජිදීක්ෂිත** පඬිතුමා මෙහි කර්තෘ ය. පාණිනීයය හදාරන්නවුන් විසින් මෙය ගෞරවයෙන් සමාදෘත ය. පෙර විසූ වියරණ කරුවන් බොහෝ දෙනෙකුන්ගේ නම් ද මෙහි සඳහන් වේ. ග්‍රන්ථකර්තෘ විසින් ම සම්පාදිත-

වූ i ප්‍රෞඪ මනොරමා, ii බාල මනොරමා යන ටීකා දෙක ද, ඥානෙන්ද්‍ර සරස්වතී විසින් ලියන ලද iii තත්ත්වබොධිනී ටීකාව ද යනාදි ටීකා රාශියකින් සමලඞ්කෘත ය.

### 6. මධ්‍ය සිද්ධාන්ත කෞමුදී.

සිද්ධාන්ත කෞමුදිය සංක්ෂිප්ත කොට සංග්‍රහ කරණ ලද්දකි. මෙහි කර්තෘ වරදරාජ තෙමේ යි. මීට රාමශර්මන් නමැත්තෙකු විසින් කරණ ලද ටීකාවක් ද වෙයි.

### 7. ලඝු සිද්ධාන්ත කෞමුදී.

මෙය ද වරදරාජ විසින් කරණ ලද සිද්ධාන්ත කෞමුදියේ අති සංක්ෂිප්තයකි. ජයකෘෂ්ණ විසින් මීට ටීකාවක් සපයන ලදී. සාරසිද්ධාන්ත කෞමුදී යන නමින් සිද්ධාන්ත කෞමුදියට මේ වරදරජ විසින් ම සම්පාදිත වූ තවත් සංග්‍රහයක් වෙයි.

### 8. කාශිකා.

පාණිනීය අෂ්ටාධ්‍යායී සූත්‍රපාඨයට කරණ ලද ඉතා පැහැදිලි සවිස්තර විවෘතියකි. සූත්‍රයන්ට අනුවෘත්ති හා උදාහරණ ද දක්වා තිබේ. මුල් අධ්‍යාය පස ජයාදිත්‍ය විසින් ද, සෙසු අධ්‍යාය තුණ වාමන විසින් ද කළ බව සඳහන් වේ. එහෙත් මේ නම් දෙක ම එක්කෙනෙකුන්ගේ·ය යි සමහරු කියති. රචනා කාලය හත්වන ශතවර්ෂය යි සලකන්නට ඉඩ තිබේ. බෞද්ධ පඬිවරයෙකු වූ ශ්‍රීමත් ජිනෙන්ද්‍රබුද්ධි විසින් මීට කාශිකාවිවරණ පඤ්චිකා හෙවත් කාශිකා න්‍යාස යන නමින් ටිප්පනියක් ලියන ලදී. පදමඤ්ජරී නම් තවත් ටිප්පනියක් වෙයි. එය හරදත්තගේ කෘතියකි.

### 9. රූපාවතාරය.

පාණිනීය ව්‍යාකරණයට ලියන ලද සංක්ෂිප්ත වෘත්ති විශෙෂයකි. කච්චායනයට බාලාවතාරයත් මොග්ගල්ලායනයට පදසාධනයත් යම්බඳු ද, පාණිනීයයට රූපාවතාරයත් එබඳු ය. මෙහි කර්තෘ ශ්‍රීමත් ධර්මකීර්ති මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ යි. කෘෂ්ණදීක්ෂිත නැමැත්තෙක් මෙහි කර්තෘ ය යන මතාන්තරය ප්‍රතිෂ්ඨා රහිත ය. රචනා කාලය 12 වන ශතවර්ෂයේ අවසාන භාගය විය යුතු යි. නාලන්ද විශ්වවිද්‍යාලයේ ආචාර්ය වරයකු වූ ද, i ප්‍රමාණ වාර්ත්තික, ii ප්‍රමාණ විනිශ්චය, iii න්‍යාය බින්දු, iv හෙතු බින්දු, v සම්බන්ධ පරීක්ෂා, vi වාද න්‍යාය, vii සන්තානාන්තර සිද්ධි යන න්‍යාය ශාස්ත්‍රීය ප්‍රශස්ත ග්‍රන්ථ සතක් නිපදවූ ද, බෞද්ධ මහාතාර්කික ශ්‍රීමත් ධර්මකීර්ති පාදයන්ගේ කෘතියකැයි ඇතැමුන් කල්පනා කරතත්

කාශිකාවෙන් පසු ව මෙය රචිත බව පිළිගත යුතු ය. පාණිනීය ව්‍යාකරණ නමැති මහසයුරු තරණයට තරණියක් වැනි මේ "රූපාවතාරය" සංස්කෘත ශබ්දශාස්ත්‍රාභිලාෂීන් විසින් ආදරයෙන් පරිශීලනය කළ යුත්තකි.

### 10. මුග්ධබොධය.

සංක්ෂිප්ත සංස්කෘත ව්‍යාකරණයෙකි. මෙහි සංඥා ද සාරස්වතයෙහි මෙන් සුබොධ ය. සූත්‍ර 1184 කි. ව්‍යාකරණ ක්‍රම ද ඉතා පැහැදිලි ය. ශ්‍රීමත් **වොපදෙවයන්** විසින් මෙය විරචිත ය. "කවිකල්පද්‍රුම, හරිලීලා විවරණ" ආදි එතුමාගේ තවත් කෘතීහු වෙත්. මහාරාෂ්ට්‍ර දෙශයෙහි **දෙවගිරි** නුවර රජ කළ **යාදව** නරපතිහුගේ රාජ්‍යොදය සමයෙහි මෙය ලියන ලදී. **දුර්ගාදාස, රාම, ගඞ්ගාධර, තර්කවාගීශ** ආදීන් විසින් මුග්ධබොධයට කරණ ලද ටීකා බොහෝ ගණනකි.

### 11. ධාතුරූපාදර්ශය.

මෑත භාගයෙහි භාරතීය පණ්ඩිතයන්ගේ මුදුන් මල්කඩක් ව වැජඹුනු ශ්‍රීමත් **තාරානාථ තර්කවාචස්පති භට්ටාචාර්යයන්** විසින් විරචිත යි. **ශබ්දස්තොම මහානිධි** නම් වූ ප්‍රශස්ත සංස්කෘත ශබ්දකොෂයෙහි ද සම්පාදකයාතන් වූ එතුමන්ගේ කෘතීන් ගැණ යමක් කීම අනවශ්‍ය ය. ප්‍රසිද්ධ ධාතූන්ගේ සියලු ලකාර යන්හි ප්‍රථම පුරුෂෛක වචන රූප ද, ණ්‍යන්තරූප හා කෘදන්ත රූප ද දක්වමින් මෙය සම්පාදිත ය. උපසර්ග පූර්වකත්වයෙන් ලැබෙන ධාතූන්ගේ වෙනස් වීම් ද පැහැදිලි කරණ ලදී.

මේ හැර 12 **සිද්ධාන්ත චන්ද්‍රිකාව** හා i **සුබොධිනී**, ii **තත්ත්වදීපිකා** යන තච්ටීකා දෙක ද, **13 චන්ද්‍රකීර්ති, 14 මාධව, 15 බාලසරලා, 16 ලඝුභාෂ්‍ය** යනාදි සාරස්වත ටීකා ද මේ ව්‍යාඛ්‍යානය සම්පාදනය කිරීමෙහි ලා බෙහෙවින් උපකාර වූහ.

## ඉෂ්ටාශංසනය,

---

මෙහි මූල් කාණ්ඩ තුණ හා තවත් ශාස්ත්‍රීය ග්‍රන්ථ රාශියක් සම්පාදනය කිරීමෙන් ලඞ්කාවේ වර්තමාන ශාස්ත්‍රාභ්‍යුන්නතියට විශිෂ්ට සේවයක් සිදු කොට වදාළා වූ ද, මෙබඳු ශ්‍රෙෂ්ඨ කෘත්‍යකට පවා අත තැබීමට නිර්භීය වන සේ අපට ධර්මශාස්ත්‍රය දී වදාළා වූ ද සවගීත විද්‍යොදය පරිවෙණාධිපති අසමද්ධර්මාචාර්යොත්තම **කහවෙ ශ්‍රී සුමඞ්ගල රත්නසාරාභිධාන** ප්‍රධාන නායක මාහිමියානන්

වහන්සේගේත්; ලඞකාවේ ජාතිකාගමික හා ශාස්ත්‍රීය කාර්‍ය්‍ය භාරයෙහි තත්පර වෙමින් ම මෙහි චතුර්ථ කාණ්ඩය සම්පාදනය කොට වදාළා වූ ද, අපගේ හැම අභිවෘද්ධියක ම පුරොගාමී ව ක්‍රියා කෙරෙමින් ධර්මශාස්ත්‍රාධ්‍යාපනයෙන් අප පැණැස පුබුදුවා ය්‍යාවකාශ වශයෙන් මෙය ද ශුද්ධ කොට ග්‍රන්‍ථ ගෞරවය සලසා වදළා වූ ද, මාගේ ආචාර්‍ය්‍යොත්තම බද්දෙගම ශ්‍රී ප්‍රියරත්නාභිධාන ප්‍රධාන නායක මාහිමියානන් වහන්සේගේත් ශ්‍රී චරණ පද්මයන්හි මෙය 'ගෞරවාදර නමස්කෘති පූජිත පුෂ්පොපහාරයක් වේවා' යනු මදීය ඉෂ්ටාශංසනය යි.

## උපකාරානුස්මෘති.

---

එතද්ග්‍රන්‍ථ සම්පාදනයෙහි ලා පූර්‍වොක්ත වර්‍තමාන විද්‍යොදය පරිවෙණාධිපති අසමදෘචාර්‍ය්‍ය ගරුතර නායක මාහිමියානන් වහන්සේගෙන් සර්‍වප්‍රකාරයෙන් ම ලැබුනු අනුග්‍රහය හා අනුබලය ප්‍රාතඃස්මරණීය ය. එසේ ම අප විසින් යවන ලද සැලැස්ම සමාන ච්ඡන්දයෙන් පිළිගැණීමෙන් මීට අනුබල දීම ගැණ කොළඹ ප්‍රාචීන භාෂොපකාර සමාගමේ කාරක මණ්ඩලයට ද අපි කෘතඥ වම්හ. ඒ හැර විද්‍යොදය පිරිවෙණේ ආචාර්‍ය්‍ය ධුරයක් දරණ මතසමානාචාර්‍ය්‍ය කොල්ලබුරේ පවරකිත්ති සථවිරයන් හා විද්‍යොදය පිරිවෙණේ ශිෂ්‍ය වූ කළුතර ඤාණින්ද, හෙව්විමුල්ලේ ධම්මාරාම යන භික්ෂු දෙනම ද මෙහි මුද්‍රණාවස්ථායෙහි ශොධ්‍යපත්‍ර කියවා දීම් ආදියෙන් අපට උපකාර කළ බව ආදරයෙන් සඳහන් කරම්හ.

ලඞකාවේ පුරාවිද්‍යා කොමසාරිස් ධුරය දරණ එස්. පරණවිතාන මහතා හා විශ්වවිද්‍යාලයෙහි කාපිකාචාර්‍ය්‍ය ධුරීණ එච්. විජේසේකර, සී. ඊ. ගොඩකුඹුර යන මහතුන් දෙපොළ ද මෙහි ප්‍රස්තාවනාවේ සඳහන් ඇතැම් කරුණු සපයා ගැණීමට අපට සහාය වූ බව කෘතඥතා පූර්‍වක ව සිහිපත් කරමු.

මුද්‍රණ ද්‍රව්‍යයන් ඉතා දුර්ලභ ව පවත්නා මෙසමයෙහි පවා මෙය මුද්‍රණද්වාරයෙන් ප්‍රචාරය කළ කොළඹ ප්‍රසිද්ධ වෙළඳ මහතෙකු වූ ද, මදීය ජ්‍යෙෂ්ඨ භ්‍රාතෘවරයෙකු වූ ද, මරදානේ කැම්බල් ප්ලේස්හි එච්. ජී. පී. අප්පුහාමිට අපි ආශීර්‍වාද කරමින් මෙහි මුද්‍රණය ශීඝ්‍ර ලෙස හා සැලකිල්ලෙනුත් කර දුන් දකුණු කළුතර "විද්‍යාතිලක" මුද්‍රණාලයාධිපති කේ. ජේ. පීරිස් මහතාට හා තදීය සෙවක පිරිසට ද සතුති කරමු.

# සාමාන්‍ය නිවේදනය.

මෙහි මුද්‍රණය හැකි තාක් පිරිසිදු ලෙස ම කරන්නට උත්සාහ දැරීමු. 256 පිටේ "වුණදි සමෘද්‍ධෞ,— ඉදිත් වූ ණොපදෙශ 'ණද්' ධාතුව" යනු "නුනදී සමෘද්‍ධෞ,— ඉදිත් වූ 'නද්' ධාතුව කියා ද, 260 පිටේ 34 පෙලේ වරහන් තුළ වූ "නිපූණි" යනු 'නිස්' පූර්ව කියා ද, 342 පිටේ ප්‍රථම පෙළ වූ "දධාතෙර්ජිඃ" යනු දධාතෙර්හිඃ කියා ද ශුද්ධ විය යුතු යි. තවත් කීප පලක අකුරු කීපයක් වැරදී වැටී තිබෙන නමුත් අර්ථාවබොධයට ඒ බාධක නො වේ. 64 වන සූත්‍රයේ පටන් සූත්‍රාඞ්ක ද එකකින් අඩු වී තිබෙන බව සැලකිය යුතු යි.

මෙහි සියලු කට යුතු ඉතා යුහුසුලු ව කරණ ලද්දේ ය. එහෙයින් මුද්‍රණයෙන් හෝ අපගේ අනවධානත්‍වයෙන් වූ තවත් සදෙෂස්ථාන වෙතොත් සුධීහු කරුණාවෙන් අප වෙත දන්වත්වා. ඒ සියල්ල ද්විතීය මුද්‍රණයෙහි දී සංස්කරණය කරන්නට බලාපොරොත්තු වෙමු.

ශාස්ත්‍රාභිවෘද්ධිකාමී,

හැගොඩ ධම්මින්ද.

2485/1942 පෙබරවාරි මස 15 වෙනි රිවි දින

කොලඹ විද්‍යෝදය පිරිවෙණේ දී ය.

සාරස්වත

# කෘදන්ත ප්‍රක්‍රියා ව්‍යාඛ්‍යා.

"නමස්තස්මෛ භගවතේ'ර්හතෙ සම්‍යක් සම්බුද්ධාය."

1. නිජජනෛර්විධිනා නිඛිලාපදෙ
ඣටිති යො විනිවර්තයති ස්මෘතඃ,
ජලධිජාපරිරම්භණලාලසො
නරහරිඃ කුරුතාං ජගතාං ශිවම්.

---

සර්වාර්ථසිද්ධං සර්වඥං- ප්‍රණම්‍යාභීෂ්ටසිද්ධයෙ,
කෘදන්තප්‍රක්‍රියාව්‍යාඛ්‍යාං- විතනොමි ස්වභාෂයා.

ඉක්බිති ශ්‍රීමත් අනුභූතිස්වරූපාචාර්‍ය්‍යවරයෝ ආපද්බාහුල්‍ය භීතියෙන් තන්නිවෘත්තිය සඳහා ද, පරම්පරාපරිප්‍රාප්ත ශිෂ්ටාචාර පරිපාලනය පිණිස ද ප්‍රතම්ධ්‍යමඞ්ගලාචරණය කරණු කැමැත්තෝ "නිජජනෛඃ" යනාදිය කියත්.

1. යඃ, යමෙක් තෙමේ; නිජජනෛඃ, ස්වකීය ජනයන් විසින්; විධිනා, විධි වූ පරිද්දෙන්; ස්මෘතඃ, සිහි කරණ ලද්දේ; ඣටිති, වහා; නිඛිලාපදඃ, සියලු විපත්; විනිවර්තයති, වළක්වා ද; ජලධිජා පරිරම්භණලාලසඃ, සිරිකාන්ත වැළඳ ගැන්මෙහි අතිශයින් ලොල් වූ; (සඃ) නරහරිඃ, (ඒ) නෘසිංහ තෙමේ හෙවත් ශ්‍රී කෘෂ්ණ තෙමේ; ජගතාම්, ලෝවැස්සන්ගේ; ශිවම්, යහපත; කුරුතාම්, කෙරේවා.

මෙයින් තෘතීයවෘත්තිහුගේ ආරම්භයෙහි ද ස්වාභීෂ්ටදෙවතානුස්මරණය කළහ. ද්විතීයවෘත්ත්‍යාරම්භයෙහි කළ නමස්කාරයෙන් මෙන් ම මෙයිනුදු ග්‍රන්ථකර්තෘහු වෛෂ්ණවයෙකු බව නිසැක කෙරෙත්. "විෂ්ණු සියල්ල මැවී ය" යනු වෛෂ්ණවයන්ගේ පිළිගැනීම යි. ඒ බව මෙහි ම ආදෙශ විශෙෂප්‍රක්‍රියාවෙහි පැණෙන "යස්ත්වං විශ්වස්‍ය ජනකස් තස්මෛ තෙ විෂ්ණවෙ නමඃ" යනාදි නිදර්ශනයන්ගෙන් ද ඔප්පු වේ. එහෙයින් ම "නිජජනෛඃ" (= තමන්ගෙන් හටගත් ජනයන් විසිනැ) යි කීහ. විෂ්ණු සිහි කළ කෙණෙහි සියලු උවදුරු පහ වෙති යි ඔහු සලකති. ඣටිති යනු

**a. අථ කෘදන්ත ප්‍රක්‍රියා නිරූප්‍යතෙ:-**

**1. කෘත් කර්තරි ච.** (කෘත් 1-1. කර්තරි 7-1. ච, නි:)

**b. ධාතොර්වක්ෂ්‍යමාණාඃ ප්‍රත්‍යයාඃ කෘත්සංඥකාඃ. තෙ ච කර්තරි ච භවන්ති. චකාරාද් භාවකර්මණොරපි.**

**c. ස්වතන්ත්‍රඃ කර්තා.**

---

ශීඝ්‍රාර්ථයෙහි අව්‍යයෙකි. **ජලධිජා** නම් ශ්‍රී දෙවිය යි. දෙවියන් කිරි මුහුද මථනය කළ අවස්ථා යෙහි ඉන් පහළ වූ ය යනු තදීය හැඟීම හෙයින් එනම් වූවා ය. හෝ විෂ්ණුහුගේ භාර්‍ය්‍යාව ය. **නරහරි** නම් විෂ්ණු ය. හේ නරසිංහාවතාරයක් දැරූ බැවින් එනම් වී යයි සිතති.

මෙසේ ඉෂ්ටදෙවතානුස්මරණය කොට ඉක්බිති කෘදන්ත ප්‍රක්‍රියාව දක්වනුවෝ **"අථ කෘදන්තප්‍රක්‍රියා නිරූප්‍යතෙ"** යනාදිය කිය.

a. අථ, ඉක්බිති හෙවත් ආඛ්‍යාතප්‍රක්‍රියාවට අනතුරු ව; කෘදන්තප්‍රක්‍රියා, කෘදන්ත ප්‍රකරණය; නිරූප්‍යතෙ, දක්වනු ලැබේ. (**"කෘත්සංඥකාඃ ප්‍රත්‍යයා අන්තෙ යෙෂාං තෙ කෘදන්තාඃ"** යනු නිරුක්ති හෙයින් "කෘත්" සංඥක ප්‍රත්‍යයෝ යම් කෙනෙකුන්ගේ අන්තයෙහි වෙද්ද, ඔහු "කෘදන්ත" නම් වෙත්. ධාතූන් කෙරෙන් ප්‍රත්‍යය යෙදීමෙන් සිද්ධ වූ ශබ්ද රූපයෝ යි. ඔවුන්ගේ සාධනොපාය මෙහි ප්‍රකාශ කරණු ලැබේ.)

1. සංඥාවිධි සූත්‍ර යි. **"ධාතොඃ"** යන සූත්‍රය අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන් වක්ෂ්‍යමාණ ප්‍රත්‍යය; කෘත්, "කෘත්" නම් වේ. කර්තරි ච, (හේ) කර්තෘකාරකයෙහි ද වේ.

b. ධාතොඃ, ධාතුහු කෙරෙන්; වක්ෂ්‍යමාණාඃ ප්‍රත්‍යයාඃ, කියනු ලබන ප්‍රත්‍යයෝ; කෘත්සංඥකාඃ, "කෘත්" සංඥා ඇත්තෝ වෙත්; තෙ ච, ඔහු ද; කර්තරි ච, කර්තෘකාරකයෙහිත්; භවන්ති වෙත්; චකාරාත්, චශබ්ද ග්‍රහණයෙන්; භාවකර්මණොඃ අපි, භාව- කර්ම දෙක්හි ද වෙත්. (මේ තෘතීයවෘත්තියෙහි කියනු ලබන ප්‍රත්‍යයන් අවිශෙෂයෙන් "කෘත්" නම් වන බවත්, ඔවුන් බොහෝ සෙයින් කර්තෘකාරකයෙහි ම වන බවත්, විශෙෂ විධානයන්හි පමණක් භාව- කර්ම දෙක්හි ද වන බවත් මෙයින් දර්ශිත යි.)

c. ස්වතන්ත්‍රඃ, ස්වප්‍රධාන වූයේ; කර්තා, කර්තෘ නම්.

**a. ක්‍රියායාං ස්වාතන්ත්‍ර්‍යෙණ විවක්ෂිතො'ර්ථඃ කර්තා ස්‍යාත්. ශුද්ධො ධාත්වර්ථො භාවඃ. "කර්තුරීප්සිතතමං. කර්ම" "තථායුක්තඤ්චානීප්සිතම්" විෂං භුඞ්ක්තෙ දෙවදත්තඃ, අන්නං භුඞ්ක්තෙ දෙවදත්තඃ.**

## 2. තෘවුණෞ. (තෘවුණෞ 1-2.)

**b. ධාතොස්තෘවුණෞ ප්‍රත්‍යයෞ භවතඃ. ඩුපචෂ් පාකෙ, "පච් තෘ" ඉති ස්ථිතෙ:- "චොඃ කුඃ" "පක්තෘ" ඉති ස්ථිතෙ:-**

---

a. ක්‍රියායාම්, ක්‍රියායෙහි ලා; ස්වාතන්ත්‍ර්‍යෙණ, ස්වප්‍රධාන භාවයෙන්; විවක්ෂිතඃ, කියන්නට අභිමත වූ; අර්ථඃ, අර්ථය තෙමේ; **කර්තා ස්‍යාත්**, කර්තෘ නම් වන්නේ ය. (ක්‍රියා සිද්ධියට ආවශ්‍යක වූ සෙසු කාරකයන් ඒ ඒ ව්‍යාපාරයන්හි මෙහෙයවමින් තෙමේ ම ක්‍රියාව කරන්නේ "කර්තෘ" නම් වෙයි.) ශුද්ධඃ, පිරිසිදු වූ; ධාත්වර්ථඃ, ධාත්වර්ථය තෙමේ; භාවඃ, "භාව" නම්. (මෙහි කෘදන්තභාවය අභිප්‍රෙත ය. ඒ වනාහි සිද්ධරූප ධාත්වර්ථ මාත්‍රය යි. **"කෘදභිහිතො භාවො ද්‍රව්‍යවත් ප්‍රකාශතෙ"** යි ද්‍රව්‍යයක් මෙනැයි භාෂ්‍යකාරයන් කී හෙයින් කෘදන්ත භාවය තෙමේ ද්‍රව්‍යධර්ම වූ ලිඞ්ග- සඞ්ඛ්‍යා- කාරකාදිය භජනය කෙරේ. එබැවින් පාකඃ- පාකෞ- පාකාඃ යනාදි වශයෙන් සියලු වචනයන්හි ද, පාකඃ- පාකම් - පාකෙන යනාදි වශයෙන් සියලු විභක්තීන්හි ද වර නැගේ.)

"කර්තුරීප්සිතතමං කර්ම" යන්නෙන් ඊප්සිතය කර්මසංඥ වේ. "තථායුක්තඤ්චානීප්සිතම්" යන්නෙන් අනීප්සිතය ද කර්මසංඥ වේ. (මේ පාණිනීය සූත්‍රයන්ගේ අර්ථ කාරකප්‍රක්‍රියායෙහි දක්වන ලදී.) දෙවදත්තඃ, දෙව්දත් තෙමේ; විෂං භුඞ්ක්තෙ, විෂ අනුභව කෙරේ. මෙහි "විෂම්" යනු අනීප්සිත කර්ම යි. දෙවදත්තඃ, දෙව්දත් තෙමේ; අන්නං භුඞ්ක්තෙ, බත් අනුභව කෙරේ. මෙහි "අන්නම්" යනු ඊප්සිත කර්ම යි.

2. තෘ- වුණ් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **"ධාතොඃ"** යන සූත්‍රය ද, "කෘත් කර්තරි ච" යි කර්තරි යනු ද අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; කර්තරි, කර්තෘකාරකයෙහි; තෘවුණෞ, තෘ- වුණ් යන ප්‍රත්‍යය දෙදෙන වෙත්.

b. ධාතොඃ, ධාතුහු කෙරෙන්; තෘවුණෞ ප්‍රත්‍යයෞ, තෘ- වුණ් යන ප්‍රත්‍යය දෙදෙන; භවතඃ, වෙත්. ඩුපචෂ් පාකෙ, ඩු- අෂ් අනුබන්ධ "පච්" ධාතුව පිසීමෙහි වේ. (ඔහු කෙරෙන් මේ සූත්‍රයෙන් තෘ ප්‍රත්‍යය වේ. ඉන්පසු) පච් තෘ ඉති, "පච් + තෘ" කියා;

**"කෘත්තද්ධිතසමාසාශ්ච ප්‍රාතිපදිකසංඥා ඉති කෙචිත්" ඉති නාමත්වම්. නාමසංඥායාං ස්‍යාදිර්විභක්තිර්භවති. "ස්තුරාර්" "සෙරා" පචතීති= පක්තා, පක්තාරෞ, පක්තාරඃ. පක්තාරම්, පුංලිඞ්ගෙ= පක්තා. "නෘණ ඊප්" * ස්ත්‍රියාම්= පක්ත්‍රී. නපුංසකෙ =පක්තෘ, පක්තෘණී, පක්තෲණි ඉත්‍යාදි.**

**a. ඩුකෘඤ් කරණෙ, කරෙතීති = කර්තා. හෘඤ් හරණෙ, හරතීති= හර්තා. මෘඞ් ප්‍රාණත්‍යාගෙ, ම්‍රියතෙ ඉති= මර්තා. ඩුභෘඤ් ධාරණපොෂණයොඃ, බිභර්තීති= භර්තා.**

---

සපිතෙ, සිටි කල්හි; "චොඃ කුඃ" යන සූත්‍රයෙන් චකාරයට කකාරය වේ. (එවිට) පක්තෘ ඉති, "පක්තෘ" කියා; සපිතෙ, සිටි කල්හි; කෘත්තද්ධිත— කෙචිත් ඉති "කෘත්තද්ධිතසමාසාශ්ච ප්‍රාතිපදික සංඥා ඉති කෙචිත්" යයි පෙර කී හෙයින්; නාමත්වම්, නාම බව වේ. නාමසංඥායාම්, නාම සංඥා වූ කල්හි; ස්‍යාදිඃ විභක්තිඃ භවති, ස්‍යාදි විභක්ති වේ. "ස්තුරාර්" යන සූත්‍රයෙන් ඍකාරයට "ආර්" ආදෙශ වේ. "සෙරා" යන සූත්‍රයෙන් "සි" විභක්තියට ආකාරයෙක් වේ. (හේ "ඕත්" හෙයින් "ඕති ටෙඃ" යි ටිසංඥයට ලොප් කොට "ස්වරහීනම්—" යනාදීන් තකාරය පර වර්ණය කරා පමුණුවනු ලැබේ.) පචති ඉති, පිසා නු යි; පක්තා, "පක්තෘ" නම් වේ. පක්තා, පක්තාරෞ, පක්තාරඃ යනු ප්‍රථමා එක- ද්වි- බහු වචන යි. පක්තාරම් යනු ද්විතීයා එක වචන යි. (සෙසු විභක්තීන්හි ද මෙසේ වර නැගිය යුතු.) පුංලිඞ්ගෙ, පුංලිඞ්ගයෙහි; පක්තා, ප්‍රථමෛක වචනයෙහි පක්තා යනු වේ. "නෘණ ඊප්" යන සූත්‍රයෙන් "ඊප්" ප්‍රත්‍යය වේ. ස්ත්‍රියාම්, ස්ත්‍රීලිඞ්ගයෙහි; පක්ත්‍රී, ප්‍රථමෛක වචනයෙහි "පක්ත්‍රී" යනු වේ. නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහි; පක්තෘ, පක්තෘණී, පක්තෲණි යනු ප්‍රථමා එක- ද්වි- බහු වචන යි. ඉත්‍යාදි යනාදිය යි.

a. ඩුකෘඤ් කරණෙ, ඩු- ඤ් අනුබන්ධ "කෘ" ධාතුව කිරීමෙහි වේ. කරෙතීති, කෙරේ නු යි, කර්තා, "කර්තෘ" නම්. හෘඤ් හරණෙ, ඤනුබන්ධ "හෘ" ධාතුව හැරීමෙහි වේ. හරතීති, හරී නු යි; හර්තා, "හර්තෘ" නම් වේ. මෘඞ් ප්‍රාණත්‍යාගෙ, ඞනුබන්ධ "මෘ" ධාතුව පණ හැරීමෙහි වේ. ම්‍රියතෙ ඉති, මැරේ නු යි; මර්තා, "මර්තෘ" නම් වේ. ඩුභෘඤ් ධාරණපොෂණයොඃ, ඩුකාර- ඤකාර ඉත්කොට ඇති භෘ ධාතුව දැරීම ය- පොෂණ ය යන අර්ථ දෙක්හි වේ. බිභර්තීති, දරා නු යි නොහොත් පොෂණය කෙරේ නු යි; භර්තා, "භර්තෘ" නම් වේ. (මේ සියල්ල "පක්තෘ" ශබ්දය මෙනි.)

---

* "ශ්වීවිරිතඃ" යි පොත්හි පෙනේ. එහෙත් "පක්තෘ" ශබ්දය ඍකාරානුබන්ධ නො ව ඍකාරාන්ත බැවින් ඒ සඳෙසී.

## 3. කෘතඃ. (කෘතඃ 6- 1.)

**a. සෙට් ධාතොඃ පරස්‍ය කෘත්ප්‍රත්‍යයස්‍ය වසාදෙරිඩා ගමො භවති. කෘත ඉදං සූත්‍රං සෙට්ධාතුවිෂයම්.**

**b. "ස්වෘසූතිසූයතිධූඤ්රධාදිනාමිඩ් වා වක්තව්‍යඃ."* ෂූඞ් ප්‍රාණිප්‍රසවෙ, සූතෙ වා සූයතෙ 'සෞ= සොතා- සවිතා. ස්වෘ ශබ්දෙ, "ගුණඃ" වා ඉට්. ස්වරතිති= ස්වරිතා- ස්වර්තා. ඡ්වූඤ්**

---

3. ඉඩාගම විධි සූත්‍ර යි. "සිසතාසීස්‍යපාමිට්" යි ඉට් යනු ද, "රුදදෙශවතුණ්ඝං භවසාදෙඃ" යි වසාදෙඃ යනු ද අනුවෘත්ත යි.

වසාදෙඃ, වස ප්‍රත්‍යාහාර වර්ණයක් ආදි කොට ඇති; කෘතඃ, කෘත් සංඥ ප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට්, ඉඩාගමය වේ.

a. සෙට් ධාතොඃ, සෙට් (=ඉට් සහිත) ධාතුහු කෙරෙන්; පරස්‍ය, පර වූ; වසාදෙඃ, වසප්‍රත්‍යාහාර වර්ණයක් ආදි කොට ඇති; කෘත්ප්‍රත්‍යයස්‍ය, කෘත්සංඥ ප්‍රත්‍යය සම්බන්ධ ව; ඉඩාගමඃ භවති, ඉට් ආගමය වේ. (මෙයින් හකාර- යකාර දෙක හැර සෙසු ව්‍යඤ්ජනාදි කෘත් ප්‍රත්‍යයන් සම්බන්ධ ව ඉඩාගමය විහිත යි.) කෘතඃ ඉදං සූත්‍රම්, "කෘතඃ" යන මේ සූත්‍රය; සෙට් ධාතුවිෂයම්, සෙට් වූ ධාතුන් විෂය කොට ඇත්තේ ය. (අනිට් කාරිකායෙහි "අනිට්" යයි නො හඳුරණ ලද ධාතුන් කෙරෙන් පර වූම වසාදි කෘත්ප්‍රත්‍යයන් සම්බන්ධ ව මේ සූත්‍රයෙන් ඉඩාගමය වෙයි යූ සේ යි. එහෙයින් කෘත් සංඥ ප්‍රත්‍යය වස ප්‍රත්‍යාහාරාදි වුව ද ධාතුව "අනිට්" නම් ඉඩාගමය නො වේ.)

b. ස්වෘසූතිසූයතිධූඤ්රධාදීනාම්, "ස්වෘ" ධාතු ය- අදාදිගණික "ෂූ" ධාතු ය- දිවාදි ගණික "ෂූ" ධාතු ය- "ධූ" ධාතු ය- "රධ" ආදි ධාතු ය යන මොවුන්ගේ (කෘත් ප්‍රත්‍යය සම්බන්ධ ව); ඉට්, ඉඩාගමය; වා වක්තව්‍යඃ, විකල්පයෙන් වේ යයි කිය යුතු යි.

ෂූඞ් ප්‍රාණිප්‍රසවෙ, ඞනුබන්ධ "ෂූ" ධාතුව ප්‍රාණියෙකු ගැබින් මිදීම් අර්ථයෙහි වේ. සූතෙ, ප්‍රසව කෙරේ නු යි; අසෞ, මේ තෙමේ; සොතා, (අනිට් පක්ෂයෙහි) "සොතෘ" නම් වේ. සූයතෙ වා, "සූයතෙ අසෞ" කියා දිවාදිගණික "ෂූ" ධාතුවෙන් හෝ විග්‍රහය වේ. (ගණ භෙදයෙන් ධාතුද්වයක් වුව ද කෘදන්ත රූපයෝ සමාන වෙති.) සවිතා, (සෙට් පක්ෂයෙහි) "සවිතෘ" නම් වේ. ස්වෘ ශබ්දෙ, "ස්වෘ" ධාතුව ශබ්ද කිරීමෙහි වේ. "ගුණඃ" යන සූත්‍රයෙන් ගුණ වේ.

---

* ඡ්වාදි පරස්මෛපදි ප්‍රක්‍රියායෙහි ද, ස්වාදි උභයපදි ප්‍රක්‍රියායෙහි ද මේ එපණේ.

ස්තුතෞ, ස්තෞතිති=ස්තෝතා. එධ වෘද්ධෞ, එධතෙ 'සෞ= එධිතා. යු මිශ්‍රණෙ, යෞතිති= යවිතා. රු ශබ්දෙ, රෞතිති= රවිතා. ණු ස්තුතෞ, නෞතිති= නවිතා. භූ සත්තායාම්, භවතිති= භවිතා. ගුපූ රක්ෂණෙ, "ඌදිතො වා" ගොපායතිති= ගොපිතා- ගොපායිතා- ගොප්තා. ෂිධූ ශාස්ත්‍ර මාඞ්ගල්‍යෙ ච, සෙධිතා- සෙද්ධා.

8. "ඉෂුසහලුභරිෂරුෂාමනපි තස්‍යේඩ් වා භවති" ඉෂු ඉච්ඡායාම්, ඉච්ඡතිති= එෂිතා- එෂ්ටා. ලුභ් විමොහනෙ, ලුභ් ගාර්ද්ධ්‍යෙ, ලුභ්‍යතිති= ලොභිතා. ඉඩභාවපක්ෂෙ:- "තථොර්ධඃ" "ඣබෙ ජබාඃ" ලුභ්‍යතිති= ලොබ්ධා. රිෂ් බන්ධනෙ, රෙෂතිති

---

වා ඉට්, විකල්පයෙන් ඉඩාගමය වේ. ස්වරති ඉති, ශබ්ද කෙරෙයි යන අර්ථයෙහි; ස්වරිතා, (සෙට් පක්ෂයෙහි "ස්වරිතෘ" නම් වේ. ස්වර්තා, (අනිට් පක්ෂයෙහි) "ස්වර්තෘ" නම් වේ. ෂ්ටුඤ් ස්තුතෞ, ඤදනුබන්ධ ෂොපදෙශ "ස්තු" ධාතුව ස්තුති කිරීමෙහි වේ. ස්තෞති ඉති, ස්තුති කෙරේ නු යි; ස්තෝතා, "ස්තෝතෘ" නම්. එධ වෘද්ධෞ, අකාරානුබන්ධ "එධ්" ධාතුව වැඩීමෙහි වේ. එධතෙ, වැඩේ නු යි; අසෞ, මේ තෙමේ; එධිතා, "එධිතෘ" නම්. යු මිශ්‍රණෙ, "යු" ධාතුව මිශ්‍ර කිරීමෙහි වේ. යෞති ඉති, මිශ්‍ර කෙරේ නු යි; යවිතා, "යවිතෘ" නම්. රු ශබ්දෙ, "රු" ධාතුව ශබ්දාර්ථයෙහි වේ. රෞති ඉති, හඬා නු යි; රවිතා, "රවිතෘ" නම්. ණු ස්තුතෞ, ණොපදෙශ "නු" ධාතුව ස්තුති කිරීමෙහි වේ. නෞති ඉති, ස්තුති කෙරේ නු යි; නවිතා, "නවිතෘ" නම්. භූ සත්තායාම්, "භූ" ධාතුව වීම් අර්ථයෙහි වේ. භවතිති= භවිතා, වේ නු යි; "භවිතෘ" නම් වේ. ගුපූ රක්ෂණෙ, ඌකාරානුබන්ධ "ගුප්" ධාතුව රැකීමෙහි වේ. "ඌදිතො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ඉඩාගම වේ. ගොපායති ඉති, රකී නු යි; ගොපිතා, (සෙට් පක්ෂයෙහි) "ගොපිතෘ" නම් වේ. ගොපායිතා, ("ආයඃ" යි ආය ප්‍රත්‍යය වූ පක්ෂයෙහි) "ගොපායිතෘ" නම්. (මෙහි ඉඩාගමය නිත්‍ය යි.) ගොප්තා, (අනිට් පක්ෂයෙහි) "ගොප්තෘ" නම්. ෂිධූ, ෂොපදෙශ- ඌකාරානුබන්ධ "ෂිධ්" ධාතුව; ශාස්ත්‍ර, ශාස්ත්‍රාර්ථයෙහි ද; මාඞ්ගල්‍යෙ ච, මඞ්ගල භාවයෙහි ද වේ. සෙධිතා, (සෙධති= අනුශාසනය කෙරෙයි නොහොත් වැඩෙයි යන වාක්‍යයෙහි සෙට් පක්ෂයෙහි) "සෙධිතෘ" නම් වේ. සෙද්ධා, (අනිට් පක්ෂයෙහි) "සෙද්ධෘ" නම් වේ. (මෙහි "තථොර්ධඃ" යි තෘ ප්‍රත්‍යය පිළිබඳ තකාරයට ධකාර වේ. "ඣබෙ ජබාඃ" යි ධාත්වන්ත ධකාරයට දකාරය වේ.)

චා රිෂ්‍යතීති= රෙෂිතා- රෙෂ්ටා. රුෂ ක්‍රොධෙ, රොෂතීති= රොෂිතා- රොෂ්ටා. ෂහ මෂීණෙ, "ආදෙඃ ෂණඃ ස්නඃ" "හො ඪඃ "තථොර්ධඃ" "ෂ්ටුභිඃ ෂ්ටුඃ" "ඪි ඪො ලොපඃ-" "සහිවහො රොදවණ්ස්‍ය" සහතෙ 'සෞ= සොඪා. වහ ප්‍රාපණෙ, වහතීති= වොඪා.

---

a. අනපි, අනබ් විෂයෙහි; ඉෂුසහලුභරිෂරුෂාම්, ඉෂ්- සහ්- ලුභ්- රිෂ්- රුෂ් යන ධාතූන්ගේ; තස්‍ය, තකාරය සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ඉට් භවති, ඉඩාගමය වේ. (යථොක්ත ධාතූන් කෙරෙන් පර වූ ලබාදි සතර තොර කොට ඇති තකාරාදි ප්‍රත්‍ය යන් සම්බන්ධ ව විකල්පයෙන් ඉඩාගමය වෙයි, කී නියා යි.) ඉෂු ඉච්ඡායාම්, උකාරානුබන්ධ "ඉෂ්" ධාතුව කැමැති වීමෙහි වේ. ඉච්ඡති ඉති, කැමැති වේ නු යි; එෂිතා, (සෙට් පක්ෂයෙහි) "එෂිතෘ" නම්. එෂ්ටා, (අනිට් පක්ෂයෙහි) "එෂ්ටෘ" නම්. (මෙහි "ෂ්ටුභිඃ ෂ්ටුඃ" යි ටුත්වය වේ.) ලුභ් විමොහනෙ, "ලුභ්" ධාතුව මූළා වීමෙහි වේ. ලුභ් ගාර්ධෙ, ලුභ් ධාතුව ගිජු බැව්හි ද වේ. ලුභ්‍යතීති= ලොභිතා, මූළා වේ නු යි නොහොත් ගිජු වේ නු යි (සෙට් පක්ෂයෙහි "ලොභිතෘ" නම් වේ. ඉට් අභාවපක්ෂෙ, ඉඩාගමය නො වන පක්ෂයෙහි; "තථොර්ධඃ" යන සූත්‍රයෙන් ප්‍රත්‍යය තකාරයට ධකාරය වේ "ඝබෙ ජබාඃ" යන සූත්‍රයෙන් ධාත්වන්ත භකාරයට බකාරය වේ. ලුභ්‍යතීති= ලොබ්ධා' ලුභ්‍යති යන වාක්‍යයෙහි "ලොබ්ධෘ" නම් ද වේ. රිෂ් බන්ධනෙ, "රිෂ්" ධාතුව බැඳීමෙහි වේ. රෙෂති ඉති, බඳී නු යි; රෙෂිතා, (සෙට් පක්ෂයෙහි) "රෙෂිතෘ" නම් වේ. රිෂ්‍යතීති වා, රිෂ්‍යති කියා දිවාදිගණ වශයෙන් හෝ වාක්‍යග වේ. රෙෂ්ටා, (අනිට් පක්ෂයෙහි) "රෙෂ්ටෘ" නම්. රුෂ ක්‍රොධෙ, අකාරානුබන්ධ "රුෂ්" ධාතුව කිපීමෙහි වේ. රොෂති ඉති, ක්‍රොධ කෙරේ නු යි; රොෂිතා- රොෂ්ටා, (සෙට් පක්ෂ යෙහි) "රොෂිතෘ" නම් ද- (අනිට් පක්ෂයෙහි) "රොෂ්ටෘ" නම් ද වේ.

ෂහ මර්ෂණෙ, ෂොපදෙශ "ෂහ්" ධාතුව ඉවසීමෙහි වේ. "ආදෙඃ ෂණඃ ස්නඃ" යන සූත්‍රයෙන් ෂකාරයට සකාරය වේ. "හො ඪඃ" යන් තෙන් හකාරයට ඪකාරය වේ. "තථොර්ධඃ" යන්තෙන් ප්‍රත්‍යය තකාරයට ධකාරය වේ. "ෂ්ටුභිඃ ෂ්ටුඃ" යන්තෙන් ඒ ධකාරයට ඪකාරය වේ. "ඪි ඪො ලොපො දීඝශ්ච" යන සූත්‍රයෙන් පූර්ව ඪකාර යට ලොප් වේ. සකාරයස්ථ අකාරයට දීඝී ද වේ. (=සාඪෘ) "සහිවහොරොදවර්ණස්‍ය" යන සූත්‍රයෙන් ආකාරයට ඔකාරය වේ. සහතෙ, ඉවසා නු යි; අසෞ, මේ තෙමේ; සොඪා, "සොඪෘ" නම් වේ. වහ ප්‍රාපණෙ, "වහ්" ධාතුව පැමිණවීමෙහි වේ. වහති ඉති, පමුණුවා නු යි; වොඪා, "වොඪෘ" නම් වේ.

## 4. යුවෝරනාකෞ. (යුවොඃ 6-1. අනාකෞ 1-2.)

**a. යු වු ඉත්‍යෙතයොරන අක ඉත්‍යෙතාවාදෙශෞ භවතඃ යථාසඞ්ඛ්‍යෙන.**

**b. ණිත්ත්වාද් වෘද්ධිඃ. "අත උපධායාඃ." පචති වා පාචයතීති= පාචකඃ පාචකෞ පාචකාඃ. දෙව ශබ්දවත්. පඨති වා පාඨයතීති= පාඨකඃ. එවං යාචතෙ වා යාචයතීති= යාචකඃ. භවති වා භාවයතීති= භාවකඃ. ලුනාති වා ලාවයතීති= ලාවකඃ. පුනාති වා පාවයතීති= පාවකඃ. ශ්‍රු ශ්‍රවණෙ, ශෘණොති වා ශ්‍රාවයතීති= ශ්‍රාවකඃ. යු මිශ්‍රණෙ, "ඛෞ ආච්" යෞති වා**

---

4. අන- අක ආදෙශ විධි සූත්‍ර යි. යුවොඃ, යු- වු දෙකට; අනාකෞ, අන- අක යන ආදෙශ දෙදෙන වෙත්.

a. යුවු ඉති එතයොඃ, යු-වු යන මේ දෙකට; යථාසඞ්ඛ්‍යෙන, පිළිවෙළින්; අන අක ඉති එතෞ ආදෙශෞ, අන- අක යන මේ ආදෙශ දෙදෙන; භවතඃ, වෙත්. (පාණිනීය සූත්‍රයත් මෙසේ මැයි.)

b. ණිත්ත්වාත්, (වුණ් ප්‍රත්‍යය) ණකාරය ඉත් කොට ඇති බැවින්; වෘද්ධිඃ, ධාතුහට වෘද්ධි වේ. "අත උපධායාඃ" යනු වෘද්ධි විධායක සූත්‍රය යි. පචති වා, පිසයි හෝ; පාචයති ඉති, පිසවා නු යි; පාචකඃ, "පාචක" නම්. පාචකඃ, පාචකෞ, පාචකාඃ යනු ප්‍රථමා එක- ද්වි- බහු වචන යි. ("ඩුපචෂ් පාකෙ" ධාතු යි. "වුණ්" ප්‍රත්‍යය හා ඊට "අක" ආදෙශ යි. ණ්‍යන්ත වූ ද- නුවූ ද ධාතුන් කෙරෙන් "වුණ්" ප්‍රත්‍යය ව එක සේ පද සිද්ධ වේ. "පචති වා පාචයතීති" යනාදි විග්‍රහ වාක්‍යවලින් ඒ බැව් පැණේ. එහෙයින් "පාචක" ශබ්දයෙන් පිසන්නා ද-පිසවන්නා ද වාච්‍ය වෙති. සෙස්ස ද මෙසේ යි ) දෙව ශබ්දවත්, "දෙව" ශබ්දය මෙනි. පඨති වා, හදාරයි හෝ; පාඨයතීති, හදාරවා නු යි; පාඨකඃ, "පාඨක" නම්. ("පඨ ව්‍යක්තායාං වාචි" ධාතු යි) එවම්, මෙසේ ම; යාචතෙ වා, ඉල්ලා නු යි හෝ; යාචයතීති, ඉල්ලවා නු යි; යාචකඃ, "යාචක" නම්. ("යාචෘ යාච්ඤායාම්" ධාතු යි.) භවති වා, වෙයි හෝ; භාවයතීති, වඩා නු යි; භාවකඃ, "භාවක" නම්. ("භූ සත්තායාම්" ධාතු යි.) ලුනාති වා, සිඳියි හෝ; ලාවයතීති, සිඳුවා නු යි; ලාවකඃ, "ලාවක" නම්. ("ලූඤ් ඡේදනෙ" ධාතු යි.) පුනාති වා, පවිත්‍ර කෙරෙයි හෝ; පාවයතීති, පවිත්‍ර කරවා නු යි; පාවකඃ, "පාවක" නම්. ("පූඤ් පවනෙ" ධාතු යි.) ශ්‍රු ශ්‍රවණෙ, "ශ්‍රු" ධාතුව ශ්‍රවණාර්ථයෙහි වේ; ශෘණොති වා, අසයි හෝ; ශ්‍රාවයතීති, අස්වා නු යි; ශ්‍රාවකඃ, "ශ්‍රාවක" නම්. යු මිශ්‍රණෙ, "යු" ධාතුව මිශ්‍රණාර්ථ

**යාවයතීති= යාවකඃ. හන් හිංසායාම්, හනතීති= * වධකඃ. "හතො ඝත්." හනති වා ඝාතයතීති= ඝාතකඃ. ජායතෙ වා ජනයතීති= ජනකඃ. "ජනිවධ්‍යානී වෘද්ධිඃ" ඝටතෙ වා ඝටයතීති= ඝටකඃ. "මිතාං හ්‍රස්වඃ." ඩුදාඤ් දානෙ, දදාති වා දත්තෙ 'සෞ'= දායකඃ. "ආතො යුක්." දෛප් ශොධනෙ, "සන්ධ්‍යක්ෂරාණාමා" දායතීති= දායකඃ.**

**a. "ණප්වුණ්සයුටො හිත්වා දරිද්‍රාතෙරනප්‍යාලොපො ලුඞි වා වක්තව්‍යඃ. +" දරිද්‍රා දුර්ගතෞ, දරිද්‍රාති වා දරිද්‍රායතීති=**

---

යෙහි වේ; "ඖෟ ආව්" යන සූත්‍රයෙන් (වෘද්ධියෙන් ලැබෙන) ඖකාරයට "ආව්" ආදෙශ වේ. යෞති වා, මිශ්‍ර කෙරෙයි හෝ; යාවයතීති, මිශ්‍ර කරවා නු යි; යාවකඃ, "යාවක" නම්. හන් හිංසායාම්, "හන්" ධාතුව පෙළීමෙහි වේ. හනතීති, පෙළා නු යි; වධකඃ, "වධක" නම්. ("ජනිවධ්‍යා නී වෘද්ධිඃ" යි වධාදෙශයට වෘද්ධි ප්‍රතිෂෙධය වේ.) "හතො ඝත්" යන සූත්‍රයෙන් "හන්" ධාතුහට "ඝත්" ආදෙශ වේ. හනති වා, නසයි හෝ; ඝාතයතීති, නස්වා නු යි; ඝාතකඃ, "ඝාතක" නම්. ජායතෙ වා, උපදියි හෝ; ජනයතීති, උපදවා නු යි; ජනකඃ, "ජනක" නම්. "ජනිවධ්‍යා නී වෘද්ධිඃ" යන සූත්‍රයෙන් වෘද්ධි ප්‍රතිෂෙධය වේ. ("ජනී ප්‍රාදුර්භාවෙ" ධාතු යි.) ඝටතෙ වා, වෑයම් කෙරේ හෝ; ඝටයතීති, වෑයම් කරවා නු යි; ඝටකඃ, "ඝටක" නම්. ("ඝට චෙෂ්ටායාම්" ධාතු යි.) "මිතාං හ්‍රස්වඃ" යන සූත්‍රයෙන් (වෘද්ධියෙන් වූ ආකාරයට) හ්‍රස්ව වේ. ඩුදාඤ් දානෙ, ඩුඤනුබන්ධ 'දා' ධාතුව දීම් අර්ථයෙහි වේ. දදාති වා දත්තෙ, අනුන්ගේ ප්‍රයෝජනය පිණිස දෙයි හෝ තමන්ගේ ප්‍රයෝජනය පිණිස දේ නු යි; අසෞ, මේ තෙමේ; දායකඃ, "දායක" නම්. "ආතො යුක්" යන සූත්‍රයෙන් යුගාගම වේ. දෛප් ශොධනෙ, ප් අනුබන්ධ "දෛ" ධාතුව පිරිසිදු කිරීමෙහි වේ. "සන්ධ්‍යක්ෂරාණාමා" යන සූත්‍රයෙන් ඓකාරයට ආකාරය වේ. දායතීති, පිරිසිදු කෙරේ නු යි; දායකඃ, "දායක" නම්.

a. ණප්වුණ්සයුටඃ, ණප්- වුණ්- ස- යුට් යන ප්‍රත්‍යයන්; හිත්වා, හැර; අනපි, අනබ් විෂයෙහි; දරිද්‍රාතෙඃ, "දරිද්‍රා" ධාතුහුගේ; ආලොපඃ, ආකාර ලොපය වේ. ලුඞි, ලුඞ් ලකාරයෙහි; වා, විකල්පයෙන් වේ යයි; වක්තව්‍යඃ, කිය යුතු යි. දරිද්‍රා දුර්ගතෞ, "දරිද්‍රා" ධාතුව දුර්ගතිබැව්හි වේ. දරිද්‍රාති වා, දුප්පත් වෙයි හෝ; දරිද්‍රායතීති, දුප්පත්

---

* වධ හිංසායාම්, වධතීති- පොත්හි.

\+ වුණ්සයුටඃ- පොත්හි. මේ පාඨය අදාදි පරස්මෛපදි ප්‍රක්‍රියායෙහි ද දක්වන ලදි.

**දරිද්‍රායකඃ. දරිද්‍රිතා. "නෘතිඛනිරඤ්ජිභ්‍යො වුච්කතව්‍යඃ." නෘතී ගාත්‍ර වික්ෂෙපෙ, "උපධායා ලඝොඃ" "රාද්‍යූපො ද්විඃ" නෘත්‍යතීති= නර්තකඃ. "නදෘදෙඃ" නර්තකී. ඛනකඃ, ඛනකී. "රඤ්ජෙර්නලොපො වා" රඤ්ජකඃ- රජකඃ, රජකී. යුවොරනාකෞ ඉති තද්ධිතයුප්‍රත්‍යයස්‍ය නෙති වක්තව්‍යම්. තෙන ඌර්ණායුඃ.**

## 5. නාම්‍යුපධාත් කඃ. (නාම්‍යුපධාත් 5-1. කඃ 1-1.)

**a. නාම්‍යුපධාද්ධාතොඃ කඃ ප්‍රත්‍යයො භවති. කකාරෙ ගුණාභාවාර්ථඃ. ක්ෂිප් ප්‍රෙරණෙ, ක්ෂිපතීති= ක්ෂිපඃ. ජිදිර්**

---

කෙරේ නු සි; දරිද්‍රායකඃ, "දරිද්‍රායක" නම්. දරිද්‍රිතා, (තෘප්‍රත්‍යය වූ කල්හි) "දරිද්‍රිතෘ" නම් වේ. නෘතිඛනිරඤ්ජිභ්‍යඃ, නෘත්- ඛන්- රන්ජ් ධාතූන් කෙරෙන්; වුඃ වක්තව්‍යඃ, වු ප්‍රත්‍යය කිය යුතු යි. (ණිත් නො වන හෙයින් වෘද්ධි නො වීම මෙහි වෙනස යි.) නෘතී ගාත්‍ර වික්ෂෙපෙ, ඊකාරානුබන්ධ "නෘත්" ධාතුව අවයව විසුරුවීමෙහි වේ. "උපධායා ලඝොඃ" යන සූත්‍රයෙන් ගුණ වේ. "රාද්‍යූපො ද්විඃ" යන සූත්‍රයෙන් (ගුණයෙන් ලැබුනු රකාරයෙන් පර තකාරයට) ද්විත්ව වේ. නෘත්‍යතීති, නටා නු යි; නර්තකඃ, "නර්තක" නම්. "නදෘදෙඃ" යන සූත්‍රයෙන් "ඊප්" ප්‍රත්‍යය වේ. නර්තකී, ස්ත්‍රීලිඞ්ග ප්‍රථමෛක වචනයෙහි "නර්තකී" යනු වේ. ඛනකඃ, (ඛනතීති= කනී නු යි) "ඛනක" නම්. ඛනකී, ස්ත්‍රීලිඞ්ගයෙහි ඊප් ප්‍රත්‍යය වූ කල්හි "ඛනකී" යනු වේ. රඤ්ජෙඃ, "රන්ජ්" ධාතූහුගේ; නලොපඃ, නකාරලොපය; වා, විකල්පයෙන් වේ. රඤ්ජකඃ; (රජති රඤ්ජයතීති වා =ඇලෙයි හෝ අලවා නු යි) නකාරය ලොප් නුවූ පක්ෂයෙහි "රඤ්ජක" නම් වේ. රජකඃ, නකාරලොප පක්ෂයෙහි "රජක" නම්. රජකී, ස්ත්‍රීලිඞ්ගයෙහි "රජකී" යනු වේ. යුවොරනාකෞ ඉති, "යුවොරනාකෞ" යන්නෙන් වන "අන" ආදෙශය; තද්ධිත යුප්‍රත්‍යයස්‍ය, තද්ධිතයෙහි "යු" ප්‍රත්‍යයට; න ඉති, නො වේ ය යි; වක්තව්‍යම්, කිය යුතු යි; තෙන, එහෙයින්; ඌර්ණායුඃ, ඌර්ණා ශබ්ද යෙන් පර ව යුප්‍රත්‍යය කළ කල්හි; "ඌර්ණායු" නම් වේ.

5. ක ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. "ධාතොඃ" යන සූත්‍රය ද, "කෘත්කර්තරි ච" යි කර්තරි යනු ද අනුවෘත්ත යි. නාම්‍යුපධාත්, නාමින් ස්වරයක් උපධා කොට ඇති; ධාතොඃ, ධාතූහු කෙරෙන්; කර්තරි, කර්තෘ කාරකයෙහි; කඃ, කප්‍රත්‍යය වේ.

a. නාම්‍යුපධාත් ධාතොඃ, නාමින් ස්වරයක් උපධා කොට ඇති ධාතූහු කෙරෙන්; කඃ ප්‍රත්‍යයඃ භවති, කප්‍රත්‍යය වේ. කකාරඃ,

**ද්වෛධීකරණෙ, ඡින්දතීති= ඡිදඃ. භිදිර් විදාරණෙ, භින්දතීති= භිදඃ. දුහ ප්‍රපූරණෙ, ද්‍රවද්‍රව්‍යවිභාගානුකූලො ව්‍යාපාරඃ ප්‍රපූරණම්. කාමාන් දොග්ධි සා= කාමදුඝා. "දුහඃ කෙ වා ඝො වාච්‍යඃ." තෙන කාමදුහා. දුහඃ– දුඝඃ. තුද් ව්‍යථනෙ, තුදතීති= තුදඃ. විද් ඥානෙ, වෙත්තීති= විදඃ. ද්විෂ් අප්‍රීතෞ, ද්වෙෂ්ටීති= ද්විෂඃ. ෂුර ඓශ්වර්‍ය්‍යදීප්ත්‍යොඃ, සුරතීති= සුරඃ. ශුභ් ශොභාර්‍ථාම්, ශොභතෙ තත්= ශුභං, කල්‍යාණම්.**

**a. ජානාතෙශ්ච.**

---

කකාරය; ගුණ + අභාවාර්‍ථඃ, ගුණ නො වීම ප්‍රයෝජන කොට ඇත්තේ යි; ක්‍ෂිප් ප්‍රේරණෙ, "ක්‍ෂිප්" ධාතුව ප්‍රේරණාර්‍ථයෙහි වේ. ක්‍ෂිපතීති= ක්‍ෂිපඃ, මෙහෙයා නු යි "ක්‍ෂිප" නම් වේ. ඡිදිර් ද්වෛධී කරණෙ, "ඡිද්" ධාතුව දෙකඩ කිරීම් අර්‍ථයෙහි වේ. ඡින්දතීති= ඡිදඃ, සිඳී නු යි "ඡිද" නමි. භිදිර් විදාරණෙ, "භිද්" ධාතුව දෙපලු කිරීම් අර්‍ථයෙහි වේ. භින්දතීති= භිදඃ, බිඳි නු යි "භිද" නමි. දුහ ප්‍රපූරණෙ, "දුහ්" ධාතුව ප්‍රපූරණාර්‍ථයෙහි වේ. ද්‍රවද්‍රව්‍යවිභාගානුකූලඃ, ද්‍රව ද්‍රව්‍යයන් බෙදීමට සුදුසු වූ; ව්‍යාපාරඃ, ව්‍යාපාරය; ප්‍රපූරණම්, ප්‍රපූරණ නමි. කාමාන්, කාමයන්; දොග්ධි, දෙවී නු යි; සා, ඕ තොමෝ; කාමදුඝා, "කාමදුඝා" නමු. කෙ, කප්‍රත්‍යය පර කල්හි; දුහඃ, දුහ් ධාතුහුගේ හකාරයට; වා, විකල්පයෙන්; ඝඃ වාච්‍යඃ, ඝකාරාදෙශය කිය යුතු යි. තෙන, එහෙයින්. කාමදුහා, ඝකාරාදෙශය නුවූ පක්‍ෂයෙහි "කාමදුහා" කියා ද වේ; දුහඃ– දුඝඃ, පුංලිඞ්ගයෙහි "දුහ" කියා ද– "දුඝ" කියා ද වේ. තුද් ව්‍යථනෙ, "තුද්" ධාතුව පීඩනාර්‍ථයෙහි වේ. තුදතීති= තුදඃ, පෙළා නු යි "තුද" නමි. විද් ඥානෙ, "විද්" ධාතුව දැනීම් අර්‍ථයෙහි වේ. වෙත්තීති= විදඃ, දනී නු යි "විද" නමි. ද්විෂ් අප්‍රීතෞ, "ද්විෂ්" ධාතුව අප්‍රීතියෙහි වේ. ද්වෙෂ්ටීති= ද්විෂඃ, ක්‍රෝධ කෙරේ නු යි "ද්විෂ" නමි ෂුර ඓශ්වර්‍ය්‍යදීප්ත්‍යොඃ, "ෂුර්" ධාතුව ඓශ්වර්‍ය්‍ය– දීප්ති යන අර්‍ථ ද්වයෙහි වේ. සුරතීති= සුරඃ, අධිපති වෙයි නොහොත් බබලා නු යි "සුර" නමි. ශුභ් ශොභාර්‍ථාම්, "ශුභ්" ධාතුව ශොභනාර්‍ථයෙහි වේ. ශොභතෙ, හොබී නු යි; තත්, එය; ශුභම්, "ශුභ" නමි. කල්‍යාණම්, යහපත යි.

a. ජානාතෙඃ ච, "ඥා අවබොධනෙ" යන ධාතුහු කෙරෙන් ද; කප්‍රත්‍යය වේ.

a. ජානාතෙර්ධාතොරපි කඃ ප්‍රත්‍යයො භවති. ජානාතෙශ්චෙති චකාරාත් කෲගෲධෘදෘප්‍රීබ්‍රෑවාමපි කඃ ප්‍රත්‍යයො භවති. කෲ වික්ෂෙපෙ, "ඎත ඉර්"* කිරතීති= කිරඃ. ධෘඤ් ධාරණෙ, ධරතීති= ධ්‍රඃ. ප්‍රීඤ් තර්පණෙ, ප්‍රීණාති වා ප්‍රීණීතෙ'සෞ= ප්‍රියඃ. "නු ධාතොඃ." ගෲ නිගරණෙ, ගිරතීති= ගිරඃ. "ගිරතෙ රස්‍ය වා ලඃ ස්වරෙ වාච්‍යඃ."

b. ගිලෙ පරෙ 'ගිලස්‍ය.

c. ගිලශබ්දං විහාය පූර්වස්‍ය මුම් වක්තව්‍යඃ. තිමිං ගිලතීති= තිමිඞ්ගිලඃ. අගිලස්‍යෙති කිම්? ගිලගිලඃ. බ්‍රෑඤ් ව්‍යක්තායාං වාචි,

---

a. ජානාතෙඃ ධාතොඃ අපි, "ඥ" ධාතුහු කෙරෙන් ද; කඃ ප්‍රත්‍යයඃ භවති, කප්‍රත්‍යය වේ. ("ජානාතීති= ඥඃ" යනු උදාහරණ යි.) ජානාතෙශ්ච ඉති, "ජානාතෙශ්ච" යන්නෙහි; චකාරාත්, චකාර ග්‍රහණයෙන්; කෲගෲධෘදෘප්‍රීබ්‍රෑවාම් අපි, කෲ- ගෲ- ධෘ- දෘ- ප්‍රී- බ්‍රෑ යන ධාතූන් පිළිබඳ ව ද; කඃ ප්‍රත්‍යයඃ භවති, ක ප්‍රත්‍යය වේ. කෲ වික්ෂෙපෙ, "කෲ" ධාතුව වික්ෂෙපාර්ථයෙහි වේ. "ඎත ඉර්" යන සූත්‍රයෙන් ඎකාරයට "ඉර්" ආදෙශ වේ. කිරතීති= කිරඃ, විසුරුවා නු යි "කිර" නම්. ධෘඤ් ධාරණෙ, "ධෘ" ධාතුව ධාරණාර්ථයෙහි වේ. ධරතීති- ධ්‍රඃ, දරා නු යි "ධ්‍ර" නම්. ("ඍ රම්" යි ඍකාරයට රකාරය වේ.) ප්‍රීඤ් තර්පණෙ, "ප්‍රී" ධාතුව තර්පණාර්ථයෙහි වේ. ප්‍රීණාති, තර්පණය කෙරේ නු යි; අසෞ, මෙතෙමේ; ප්‍රියඃ, "ප්‍රිය" නම්. ප්‍රීණීතෙ වා, "ප්‍රීණීතෙ'සෞ" කියා ආත්මනෙපද වශයෙන් හෝ වාක්‍යය වේ. "නු ධාතොඃ" යන සූත්‍රයෙන් ඊකාරයට "ඉය්" ආදෙශ වේ. ගෲ නිගරණෙ, "ගෲ" ධාතුව ගිලීමෙහි වේ. ගිරතීති= ගිරඃ, ගිලී නු යි "ගිර" නම්. ස්වරෙ, ස්වරයා පර කල්හි; ගිරතෙඃ, ගෲ ධාතුහුගේ; රස්‍ය, රකාරයට; වා, විකල්පයෙන්; ලඃ වාච්‍යඃ, ලකාරය කිය යුතු යි.

b. ගිලෙ පරෙ, ගිල ශබ්දය පර කල්හි, අගිලස්‍ය, ගිල ශබ්දය තොර කොට ඇත්තහු සම්බන්ධ ව මුමාගම වේ.

c. ගිලශබ්දං විහාය, ගිල ශබ්දය හැර; පූර්වස්‍ය, පූර්ව ශබ්දය සම්බන්ධ ව; මුම් වක්තව්‍යඃ, "මුම්" ආගමය කිය යුතු යි. (ගිල ශබ්දයට පෙරටු ව සිටි ගිල ශබ්දය හැර අනික් ශබ්දයන් සම්බන්ධ ව මුමාගම වෙයි කී නියා යි.) තිමිං ගිලතීති, තිමි නම් මත්ස්‍යයා

---

* මේ සූත්‍රය "ඍත ඉර්" යි බොහෝ තැන්හි පෙණේ. එහෙත් එය සැදෑස් බවට මෙතැන්හි දක්වෙන "ධ්‍රු" යන්න ද නිදර්ශන යි. ඒ නිදෙස් නම් "ධ්‍ර" යි නො ව "ධිර" යි විය යුතු.

"නුධාතොඃ" බ්‍රවීතීති= බ්‍රැවඃ. අපි ශබ්දාත් කත්රි ග්‍රහෙරපි කඃ ප්‍රත්‍යයො භවති. ගෘහ්ණාතීති= ගෘහම්. තාත්ස්ථ්‍යාත් ගෘහ්ණන්ති තෙ= ගෘහා දරාඃ.

## 6. පචිනන්දිග්‍රහාදෙරයුණිනි.

( පචිනන්දිග්‍රහාදෙඃ 5-1. අයුණිනි 1-1.)

**a. පචාදෙර්නන්ද්‍යාදෙර්ග්‍රහාදෙශ්ච අ- යු- ණිනි ඉත්‍යෙතෙ ප්‍රත්‍යයා භවන්ති යථා සඞ්ඛ්‍යෙන. පචතීති= පචඃ. වකතීති= වචඃ. වෙදතීති= වෙදඃ. වපතීති= වපඃ.**

---

ගිලී නු සි, තිමිඞ්ගිලඃ, "තිමිඞ්ගිල" නම්. (මත්ස්‍ය විශෙෂයෙකි. "නාශ්වොපදනෙන ඞසෙ" යි මකාරයට අනුස්වාර ව "යමා යපෙ'ස්ය" යි වර්ගාන්තාදෙශ වේ.) අගිලස්‍ය ඉති, "අගිලස්‍ය" යනු; කිම්, කිම? ගිලගිලඃ, "ගිලගිල" යන තන්හි පූර්ව වූ ගිල ශබ්දය සම්බන්ධ ව මූමාගම නො වනු පිණිස යි. බ්‍රැඤ් ව්‍යක්තායාං වාචි, "බ්‍රැ" ධාතුව ව්‍යක්ත වචනාර්ථයෙහි වේ. "නු ධාතොඃ" යන සූත්‍රයෙන් ඌකාරයට "උව්" ආදෙශ වේ. බ්‍රවීතීති, කියා නු සි; බ්‍රැවඃ, "බ්‍රැව" නම්. අපි ශබ්දාත්, ("බ්‍රැවාමපි" යි කී තැන්හි) අපි ශබ්දයෙන්; ග්‍රහෙඃ අපි, "ග්‍රහ්" ධාතුහු කෙරෙන් ද, කත්රි, කර්තෘකාරකයෙහි; කඃ ප්‍රත්‍යයඃ භවති, කප්‍රත්‍යය වේ. ගෘහ්ණාති ඉති, (සම්පත් ආදිය) ගණී නු සි; ගෘහම්, "ගෘහ" නම්. තාත්ස්ථ්‍යාත්, තත්‍රස්ථ භාවයෙන්; ගෘහ්ණන්ති, ගණිත් නු සි; තෙ, ඔහු; ගෘහාඃ, "ගෘහ" නම් වෙත්. දරාඃ, භාර්‍යාවෝ සි.

6. අ-යු- ණිනි ප්‍රත්‍යයවිධි සූත්‍ර සි, "ධාතොඃ- කත්රි" යි අනුවෘත්ත සි. පචිනන්දිග්‍රහාදෙඃ ධාතොඃ, පචාදිය- නන්ද්‍යාදිය- ග්‍රහාදිය යන ධාතුහු කෙරෙන්; කත්රි, කර්තෘ කාරකයෙහි; අයුණිනි, අ-යු-ණිනි යන ප්‍රත්‍යයෝ වෙත්.

a. පචාදෙඃ, පචාදිහු කෙරෙන් ද; නන්ද්‍යාදෙඃ, නන්ද්‍යාදිහු කෙරෙන් ද; ග්‍රහාදෙඃ ච, ග්‍රහාදිහු කෙරෙන් ද; යථාසඞ්ඛ්‍යන, පිළිවෙළින්; අයුණිනි ඉති එතෙ ප්‍රත්‍යයාඃ, අ- යු- ණිනි යන මේ ප්‍රත්‍යයෝ; භවන්ති, වෙත්. (**"ද්වන්ද්වාතෙන ශ්‍රැයමාණඃ ශබ්දඃ ප්‍රත්‍යෙකමභිසම්බද්ධ්‍යතෙ"** සි කී හෙයින් "පචිනන්දිග්‍රහාදෙඃ" යන මෙහි ආදි ශබ්දය පචාදිය- නන්ද්‍යාදිය- ග්‍රහාදිය යි වෙන වෙන ම සම්බන්ධ කට යුතු සි. "යථාසඞ්ඛ්‍යන" සි කී හෙයින් පචාදිහු කෙරෙන් "අ" ප්‍රත්‍යය ද; නන්ද්‍යාදිහු කෙරෙන් "යු" ප්‍රත්‍යය ද; ග්‍රහාදිහු කෙරෙන් "ණිනි" ප්‍රත්‍යය ද වේ. සූත්‍රයෙහි "අයුණිනි" යනු සමාහාර ද්වන්ද්ව හෙයින් ප්‍රථමා එක වචන සි. ඉක්බිති පචාදියට

a. "චරිචලිපතිහනිවදිනාං වා ද්විත්වං පූර්ව්‍යාගාගමශ්ච අප්‍රත්‍යයෙ පරෙ." හසාදිශෙෂාභාවඃ. චර ගතිභක්ෂණයොඃ, චරතිති= චරාචරඃ- චරඃ. චල චලනෙ, චලතිති= චලාචලඃ- චලඃ. පත්‍ඍ පතනෙ, පතතිති= පතාපතඃ- පතඃ. වදතිති= වදාවදඃ- වදඃ. "හනෙතඝ්නශ්ච" හනතිති= ඝනාඝනඃ- හනඃ. චකාරාද් ධ්වන ශබ්දෙ, ධ්වනතිති= ධ්වනාධ්වනඃ- ධ්වනඃ. ඉත්‍යාදි.

---

උදාහරණ දක්වයි.) පචතීති= පචඃ, පිසා නු යි "පච" නම්. වකතීති= චචඃ, කියා නු යි "වච" නම්. වෙත්තීති= වෙදඃ, දනී නු යි "වෙද" නම්. වපතීති= වපඃ, වපුරා නු යි "වප" නම්.

a. අප්‍රත්‍යයෙ පරෙ, අප්‍රත්‍යය පර කල්හි; චරිචලිපතිහනිවදීනාං, චර්- චල්- පත්- හන්- වද් යන ධාතූන්ට; වා, විකල්ප යෙන්; ද්විත්වම්, ද්විත්ව වේ. පූර්ව්‍යස්‍ය, පූර්වරූපය සම්බන්ධ ව; ආගාගමඃ ච, "ආක්" ආගම ද වේ. ( සම්පූර්ණ ධාතුවට ද්විත්ව වේ. රූප ද්වය අතර ආකාරයෙක් ආගම වේ.) හසාදිශෙෂ අභාවඃ, "පූර්ව්‍යස්‍ය හසාදිඃ ශෙෂඃ" යි හසාදිශෙෂභාවය නො වේ. චර ගති භක්ෂණයොඃ, "චර්" ධාතුව ගමනාර්ථ- භක්ෂණාර්ථ දෙක්හි වේ චරතීති, හැසිරේ නු යි නොහොත් කා නු යි; චරාචරඃ, ද්විත්ව හා ආගාගම වූ පක්ෂයෙහි "චරාචර" නාම්. (චර් + අ= ප්‍රත්‍යය වීමෙනි. චර් + චර් + අ= ද්විරුක්ත වීමෙනි. චර් + ආ + චර් + අ= ආක් ආගමයෙනි. චරාචර= පර නයන යෙනි. චරාචරඃ= සිවිහක්තිය ච ඊට විසර්ගය වීමෙනි. සෙස්ස ද මේ නයින් දත යුතු.) චරඃ, වෛකල්පික ද්විත්වාදිය නුවූ පක්ෂයෙහි "චර" යනු වේ. චල චලනෙ, "චල්" ධාතුව කම්පනාර්ථයෙහි වේ. චලතීති, සැලේ නු යි; චලාචලඃ- චලඃ, ද්විත්වාදිය වූ පක්ෂයෙහි "චලාචල" යනු ද- විකල්ප පක්ෂයෙහි "චල" යනු ද වේ. පත්‍ඍ පතනෙ, "පත්" ධාතුව වැටීම් අර්ථයෙහි වේ. පතතීති, වැටේ නු යි; පතාපතඃ= පතඃ, ද්විත්වාදිය වූ පක්ෂයෙහි "පතාපත" යනු ද- විකල්ප පක්ෂයෙහි "පත" යනු ද වේ. වදතීති කියා නු යි; වදාවදඃ-වදඃ, "වදාවද" යනු ද-"වද" යනු ද වේ.("වද ව්‍යක්තායාං වාචි" ධාතු යි.) හනෙතඃ, "හන් ධාතුහට;ඝනඃ ච, "ඝන" යනාදෙශ ද වේ. (ච ශබ්ද යෙන් ද්විත්ව හා ආගාගම ද වේ.) හනතීති, නසා නු යි; ඝනාඝනඃ, "ඝනාඝන" නම්. හනඃ, විකල්ප පක්ෂයෙහි "හන" නම්. චකාරාත්, ("චරිචලි-" යනාදි පාඨයෙහි) ච ශබ්ද බලයෙන් (අන්‍ය ධාතූන්ට ද ද්විත්වාදිය වේ.) ධ්වන ශබ්දෙ, ධ්වන ධාතුව ශබ්දාර්ථයෙහි වේ. ධ්වනතීති, ශබ්ද කෙරේ නු යි; ධ්වනාධ්වනඃ- ධ්වනඃ, ද්විත්වාදිය වූ කල්හි "ධ්වනාධ්වන" යනු ද- විකල්ප පක්ෂයෙහි "ධ්වන" යනු ද වේ. ඉත්‍යාදි, යනාදිය යි.

**෧. ණද් අව්‍යක්ත ශබ්දෙ, නදතීති= නදඃ. ප්ලුඞ් ගතෞ, පලවතෙ 'සෞ= ප්ලවඃ. චරතෙ'සෞ=චරඃ. ක්‍ෂමූෂ් සහනෙ, ක්‍ෂම තෙ'සෞ= ක්‍ෂමඃ. පචාදිෂු දෙවට් නදට් ඉති ටකාරානුබන්ධෞ දීප්. දීව්‍යතීති= දෙවී. ෂිවු තන්තුසන්තානෙ, සීව්‍යතීති= සෙවඃ. ෂෙවෘ සෙවනෙ, සෙවතෙ 'සෞ= සෙවඃ. ව්‍රණ ක්‍ෂතෙ, ව්‍රණ රුජි, ව්‍රණ ශබ්දෙ. ව්‍රණතීති= ව්‍රණඃ. අන ප්‍රාණනෙ, ප්‍රාණිතීති= ප්‍රාණඃ. දෘශිර් ප්‍රෙක්‍ෂණෙ, පශ්‍යතීති= දශීඃ. සෘපෘ ගතෞ, සර්පතීති= සර්පඃ. හෘඤ් හරණෙ, හරතෙ වා හරතීති= හරඃ.**

---

෧. ණද් අව්‍යක්ත ශබ්දෙ, ණොපදෙශ "ණද්" ධාතුව අව්‍යක්ත ශබ්දාර්ථයෙහි වේ. නදතීති නදඃ, හඬා නු යි "නද" නම්. ප්ලුඞ් ගතෞ, "ප්ලු" ධාතුව ගමනාර්ථයෙහි වේ. පලවතෙ, පනී නු යි; අසෞ, මෙතෙමේ; පලවඃ, "පලව" නම්. (ගුණ හා අවාදෙශ යි.) චරතෙ, හැසිරේ නු යි; අසෞ, මෙතෙමේ; චරඃ, "චර" නම්. ක්‍ෂමූෂ් සහනෙ, "ක්‍ෂම්" ධාතුව ඉවසීම් අර්ථයෙහි වේ. ක්‍ෂමතෙ, ඉවසා නු යි; අසෞ, මෙතෙමේ; ක්‍ෂමඃ, "ක්‍ෂම" නම්. පචාදිෂු, පචාදියෙහි; දෙවට් නදට් ඉති, දෙවට්- නදට් යන ධාතු දෙක වේ. ටකාරානු බන්ධෞ නු ත්, ටකාරය අනුබන්ධ කොට ඇති බැවින්; ඊප්. (සත්‍රී ලිඞ්ගයෙහි "ෂ්ට්ව්‍රිතඃ" යි) ඊප් ප්‍රත්‍යය වේ. (ප්‍රත්‍යය ටකාරානුබන්ධ නුවුව ද ඒ ධාතූහු ටකාරානුබන්ධයහ.) දීව්‍යතීති, ක්‍රීඩා කෙරේ නු යි; දෙවී, "දෙවී" නමු. ෂිවු තන්තු සන්තානෙ, උකාරානුබන්ධ ෂොපදෙශ "ෂිව්" ධාතුව නූල් පතුරුවා ලීමෙහි වේ. සීව්‍යතීති, මසා නු යි; සෙවඃ, "සෙව" නම්. ෂෙවෘ සෙවනෙ, ඍකාරානුබන්ධ ෂොපදෙශ "ෂෙව්" ධාතුව සෙවනය කිරීමෙහි වේ. සෙවතෙ, සෙවනය කෙරේ නු යි; අසෞ, මෙතෙමේ; සෙවඃ, "සෙව" නම්. (ධාතු දෙක්හි ම රූප සමාන ය.) ව්‍රණ ක්‍ෂතෙ, "ව්‍රණ" ධාතුව තුවාල වීමෙහි ද; ව්‍රණ රුජි, "ව්‍රණ ධාතුව" රිදීමෙහි ද; ව්‍රණ ශබ්දෙ, "ව්‍රණ" ධාතුව ශබ්ද කිරීමෙහි ද වේ. ව්‍රණතීති, තුවාල වෙයි- රිදෙයි නොහොත් ශබ්ද කෙරේ නු යි; ව්‍රණඃ, "ව්‍රණ" නම්. (ධාතු ත්‍රයෙහි ම රූප සමාන ය.) අන ප්‍රාණනෙ, "අන්" ධාතුව ජීවත් වීම් අර්ථයෙහි වේ. ප්‍රාණිතීති= ප්‍රාණඃ, ජීවත් වෙ නු යි "ප්‍රාණ" නම්. දෘශිර් ප්‍රෙක්‍ෂණෙ, "දෘශ්" ධාතුව බැලීම් අර්ථයෙහි වේ. පශ්‍යතීති= දශීඃ, බලා නු යි "දශී" නම්. සෘපෘ ගතෞ, "සෘප්" ධාතුව ගමනාර්ථයෙහි වේ. සර්පතීති= සර්පඃ, ඇදේ නු යි 'සර්ප" නම්. හෘඤ් හරණෙ, "හෘ" ධාතුව දුරීමෙහි නොහොත් පොෂණය කිරීමෙහි වේ. හරතෙ ඉති, දරයි නොහොත් පොෂණය කෙරේ නු යි; හරඃ, "හර" නම්. හරති වා "හරති" කියා පරස්මෛපද වශයෙන් ගෝ විග්‍රහය වේ.

**ඩුභෘඤ් ධාරණ පොෂණයොඃ, බිභර්ති වා බිභෘතෙ 'සෞ=භරඃ. සහතෙ 'සෞ= සහඃ. පචාදිරාකෘතිගණඃ. පචාදෙර ප්‍රත්‍යයො නිරුපපදශෙස්‍යව ඥතව්‍යඃ. ඉති පචාදිඃ.**

**a. අථ නන්ද්‍යාදිර්නිරූප්‍යතෙ. ටුණදි සමෘද්ධෞ, "ඉදිතො නුම්" නන්දති වා නන්දයතීති=නන්දනඃ. නන්දතීති= නන්දකඃ. රමු ක්‍රීඩායාම්, රමතෙ'සෞ=රමණඃ. වාම- ක්‍රම සංභක්ෂේ, වාමතීති= වාමනඃ. ක්‍රාමතීති= ක්‍රමණඃ. වාසෘ ශබ්දෙ, වාසයතීති=වාසනඃ. "මිතාං හ්‍රස්වඃ." මදී හර්ෂේ, මාද්‍යති වා මදයතීති= මදනඃ.**

---

"ඩුභෘඤ් ධාරණපොෂණයොඃ, බිභර්ති වා බිභෘතෙ 'සෞ= භරඃ" යනු සමානාර්ථ වූ ජුහොත්‍යාදි ගණික "භෘ" ධාතුවෙන් ද මෙසේ ම සිද්ධ වන බව දැක්වීමට කීහ. සහතෙ, ඉවසා නු යි; අසෞ, මෙතෙමේ; සහඃ, "සහ" නම්. ("ෂහ මර්ෂණෙ" ධාතු යි.) පචාදිඃ, පචාදිය; ආකෘතිගණඃ, ආකාරයෙන් ගත යුතු ගණය යි. (සිද්ධ වූ ශබ්දයක් හුගේ ආකාරය අනු ව ආදෙශ ප්‍රත්‍යයාදිය කිරීමෙන් නිපදවනු ලබන ශබ්ද සමූහය ආකෘතිගණ යයි කියනු ලැබේ. මේ "පච" ශබ්දාදිය ද එබඳු ය.) පචාදෙඃ, පචාදිය පිළිබඳ; අප්‍රත්‍යයඃ, අප්‍රත්‍යය; නිරුපපදස්‍ය එව, උපපද රහිත වූවහු සම්බන්ධ ව ම (වේ ය යි;) ඥතව්‍යඃ, දත යුතු යි. (පචාදිහු කෙරෙන් වන අප්‍රත්‍යය උපපද රහිත ධාතූන් කෙරෙන් ම වෙයි කී නියා යි.) පචාදිඃ, පචාදිය; ඉති, මෙසේ යි.

a. අථ, පචාදියට අනතුරු ව; නන්ද්‍යාදිඃ, නන්ද්‍යාදිය; නිරූප්‍යතෙ, දක්වනු ලැබේ. (මෙහි යු ප්‍රත්‍යය ව ඊට "යුවොරනාකෞ" සි "අන" ආදෙශ වේ.) ටුණදි සමෘද්ධෞ, ටුයන්න ඉත් කොට ඇති ඉදිත් වූ ණොපදෙශ "ණද්" ධාතුව සමෘද්ධ්‍යර්ථයෙහි වේ. "ඉදිතො නුම්" යන සූත්‍රයෙන් "නුම්" ආගම වේ. නන්දති වා, සතුටු වෙයි හෝ; නන්දයතීති, සතුටු කෙරේ නු යි; නන්දනඃ, "නන්දන" නම්. නන්දතීති= නන්දකඃ, සතුටු වෙයි යන අර්ථයෙහි "වුණ්" ප්‍රත්‍යය වීමෙන් "නන්දක" යනු වේ. රමු ක්‍රීඩායාම්, "රම්" ධාතුව ක්‍රීඩාර්ථයෙහි වේ. රමතෙ අසෞ= රමණඃ, රමණය කොරේ නු යි මෙතෙමේ; "රමණ" නම්. ("අචකුප්වනානරෙ'පි" සි ණත්වය වේ.) වාම- ක්‍රම සංභක්ෂේ, "වාම්- ක්‍රම්" ධාතු ද්වය සන්තොෂාර්ථයෙහි වේ. වාමතීති=වාමනඃ, සතුටු කොරේ නු යි ''වාමන නම්. ක්‍රාමතීති= ක්‍රමණඃ, යථොක්ත අර්ථයෙහි ම "ක්‍රමණ" නම්. වාසෘ ශබ්දෙ, ඍත් වූ "වාස්" ධාතුව ශබ්දාර්ථයෙහි වේ. වාසයතීති=වාසනඃ, ශබ්ද කොරෙයි යන අර්ථයෙහි "වාසන" නම්. "මිතාං හ්‍රස්වඃ" යන් නෙන් (වක්ෂ්‍යමාණ ධාතුහට) හ්‍රස්ව වේ. මදී හර්ෂේ, ඊදිත් වූ "මද්"

දුෂ වෛකෘත්‍යෙ, “දුෂෙර්ණෙ කෘති ච දීර්ඝො වක්තව්‍යඃ.” දූෂයතීති= දූෂණඃ. රාධ්- සාධ් සංසිද්ධෞ, රාධ්‍යතීති වා රාධයතීති= රාධනඃ, සාධනඃ. වෘධු වෘද්ධෞ, වර්ධයතීති= වර්ධනඃ. රු ශබ්දෙ:-

a. රොර්යුණ්.

b. රු ශබ්ද ඉත්‍යෙතස්මාද්ධාතොර්යුණ් ප්‍රත්‍යයො භවති. රෞති වා රාවයතීති= රාවණඃ. “රු ශබ්දාද් යුරපි වක්තව්‍යඃ” තෙන රවණඃ. “සෘකාරාන්තාච්ච යුණ් ප්‍රත්‍යයො භවති.” කරොතීති වා කාරයතීති= කාරණඃ- කාරකඃ. ශුභ ශොභනෙ රොචනෙ ච, ශොභයතීති= ශොභනඃ. රුච දීප්තෞ, රොචයතීති= රොචනඃ. විශිෂයතීති= විශිෂණඃ. ණශ් අදර්ශනෙ, චිත්තං විනාශයතීති= චිත්තවිනාශනඃ. ශුධ්‍යතෙ ඉති= ශොධනඃ. එතෙ ඤ්‍යන්තාඃ.

---

ධාතුව සතුටෙහි වේ. මාද්‍යතීති වා, සතුටු වෙයි හෝ, මදයතීති, සතුටු කෙරේ නු යි; මදනඃ, “මදන” නමි. දුෂ වෛකෘත්‍යෙ, අකාරානුබන්ධ “දුෂ්” ධාතුව විකෘතභාවයෙහි වේ. ණෙ, ණිප්‍රත්‍යය පර කල්හි ද; කෘති ච, කෘත්සංඥ ප්‍රත්‍යය පර කල්හි ද; දුෂෙඃ, “දුෂ්” ධාතුහට; දීර්ඝඃ වක්තව්‍යඃ, දීර්ඝය කිය යුතු යි. දූෂයතීති= දූෂණඃ, කිලිටි කෙරේ නු යි “දූෂණ” නමි. රාධ්- සාධ් සංසිද්ධෞ, “රාධ්- සාධ්” ධාතු ද්වය සංසිද්ධ්‍යර්ථයෙහි වේ. රාධ්‍යතීති වා, සිද්ධ වෙයි හෝ; රාධයතීති, සිද්ධ කෙරේ නු යි; රාධනඃ, “රාධන” නමි. සාධනඃ, “සාධ්‍යති වා සාධයතීති” (=නිපදියි හෝ නිපදවයි) යන වාක්‍යයෙහි “සාධන” නමි. වෘධු වෘද්ධෞ, “වෘධ්” ධාතුව වැඩීමෙහි වේ. වර්ධයතීති= වර්ධනඃ, වඩා නු යි වර්ධන” නමි. රු ශබ්දෙ “රු” ධාතුව ශබ්දාර්ථයෙහි වේ.

a. රොඃ, “රු” ධාතුහු කෙරෙන්; යුණ්, යුණ් ප්‍රත්‍යය වේ.

b. රු ශබ්දෙ ඉති එතස්මාත් ධාතොඃ, “රු ශබ්දෙ” යන මේ ධාතුහු කෙරෙන්; යුණ් ප්‍රත්‍යයඃ භවති, “යුණ්” ප්‍රත්‍යය වේ. රෞති වා, හඬා නු යි හෝ; රාවයතීති, හඬවා නු යි; රාවණඃ, “රාවණ” නමි. රු ශබ්දාත්, “රු” ශබ්දයා (=රු ධාතුහු) කෙරෙන්; යුඃ අපි, යු ප්‍රත්‍යය ද; වක්තව්‍යඃ, කිය යුතු යි. තෙන, එහෙයින්; රවණඃ, “රවණ” කියා ද වේ. (ණිත් නො වන හෙයින් වෘද්ධි නො වීම වෙනස යි ) සෘකාරාන්තාත් ච, සෘකාරාන්ත ධාතුහු කෙරෙන් ද; යුණ් ප්‍රත්‍යයඃ භවති, යුණ් ප්‍රත්‍යය වේ. කරොති ඉති වා, කෙරේ නු යි හෝ; කාරයති ඉති, කරවා නු යි; කාරණඃ, “කාරණ” නමි.

a. සහතෝ'සෞ= සහනඃ. තපතීති= තපනඃ. ජ්වල දීප්තෞ, ජ්වලතීති= ජ්වලනඃ. ශම - දම උපශමෙ, ශාම්‍යතීති= ශමනඃ, දම්‍යතීති= දමනඃ. ජල්පතීති= ජල්පනඃ. තෘප් ප්‍රීණනෙ, තෘප්‍යතීති= තර්පණඃ. දෘප් සන්දෂෙ, දෘප්‍යතීති= දර්පණඃ. ක්‍රන්ද ආක්‍රන්දනෙ, ක්‍රුදි ආහ්වානෙ රෝදනෙ ච, සම්පූර්වඃ, සංක්‍රන්දයතීති= සංක්‍රන්දනඃ. කෘෂ් නිෂ්කෂෙ, කෘෂ් ආමර්ෂණෙ, සඞ්කර්ෂතීති= සඞ්කර්ෂණඃ. අදි- මදි අර්දනෙ, අදි ගතෞ යාචනෙ ච, ජනාන් අර්දයතීති= ජනාර්දනඃ. මර්දයතීති= මර්දනඃ. කෘෂ සඞ්කර්ෂණෙ,

---

කාරකඃ, (වුණ් ප්‍රත්‍යය වීමෙන්) "කාරක" කියා ද වේ. ("ඩුකෘඤ් කරණෙ" ධාතු යි.) ශුභ ශොභනෙ රොචනෙ ච, "ශුභ්" ධාතුව හෙබීමෙහි ද- බැබලීමෙහි ද වේ. ශොභයතීති= ශොභනඃ, හොබවා නු යි "ශොභන" නම්. රුච දීප්තෞ, "රුච්" ධාතුව බැබලීමෙහි වේ. රොචයතීති= රොචනඃ, බබලවා නු යි "රොචන" නම්. විභීෂයතීති= විභීෂණඃ, විශෙෂයෙන් බියපත් කරවා නු යි "විභීෂණ" නම්. (විපූර්ව ණ්‍යන්ත "ඤිභී භයෙ" ධාතු යි.) ණශ් අදර්ශනෙ, ණොපදෙශ "නශ්" ධාතුව නො දැකීමෙහි වේ. චිත්තං විනාශයතීති= චිත්ත විනාශනඃ, සිත වනසා නු යි "චිත්තවිනාශන" නම්. යුධ්‍යතෙ ඉති= යොධනඃ, පහර දේ නු යි "යොධන" නම්. එතෙ, මොහු; ණ්‍යන්තාඃ, ණ්‍යන්තයෝ යි. (මේ "ශොභන" ශබ්දයේ පටන් "චිත්තවිනාශන" ශබ්දය තෙක් වූවෝ ණිප්‍රත්‍යයාන්ත ධාතූන් කෙරෙන් යුප්‍රත්‍යය වීමෙන් සිද්ධ නාමයෝ'ය යි කී නියා යි.)

a. සහතෙ අසෞ= සහනඃ, ඉවසා නු යි මෙතෙමේ "සහන" නම්. ("ෂහ මර්ෂණෙ" ධාතු යි.) තපතීති= තපනඃ, තවා නු යි "තපන" නම්. ("තප දාහෙ" ධාතු යි.) ජ්වල දීප්තෞ, "ජ්වල්" ධාතුව දීප්ත්‍යර්ථයෙහි වේ. ජ්වලතීති= ජ්වලනඃ, බබලා නු යි "ජ්වලන" නම්. ශම- දම උපශමෙ, "ශම්- දම්" ධාතු දෙක සන්සිඳීමෙහි වේ. ශාම්‍යතීති= ශමනඃ, සන්සිඳේ නු යි "ශමන" නම්. දම්‍යතීති= දමනඃ, හික්මේ නු යි "දමන" නම්. ජල්පතීති= ජල්පනඃ, කථා කෙරේ නු යි "ජල්පන" නම්. ("ජල්ප ව්‍යක්තායාං වාචි" ධාතු යි.) තෘප් ප්‍රීණනෙ, "තෘප්" ධාතුව පිණා යාමෙහි වේ. තෘප්‍යතීති=තර්පණඃ, තෘප්ත වේ නු යි "තර්පණ" නම්. දෘප් සන්දෂෙ, "දෘප්" ධාතුව ගර්වයෙහි වේ. දෘප්‍යතීති= දර්පණඃ, ගර්විත වේ නු යි "දර්පණ" නම්. ක්‍රන්ද ආක්‍රන්දනෙ, "ක්‍රන්ද්" ධාතුව හැඬීමෙහි ද, ක්‍රුදි ආහ්වානෙ රොදනෙ ච, "ක්‍රුද්" ධාතුව කැඳවීමෙහි ද හැඬීමෙහි ද වේ. සංපූර්වඃ, "සම්" උපසර්ගය පූර්ව කොට ඇත්තේ ය. සඞ්ක්‍රන්දති වා, හඬා නු යි හෝ; සඞ්ක්‍රන්දයතීති, හඬවා නු යි; සඞ්ක්‍රන්දනඃ, "සඞ්ක්‍රන්දන" නම්. ("ක්‍රුද්"

සඞ්කර්ෂතීති= සඞ්කර්ෂණඃ, පුනාතීති= පවනඃ. පවතෙ 'සෞ= පවනඃ. ක්‍ෂුද ක්‍ෂරණෙ, ක්‍ෂුද නිවාරණෙ, සූදි හිංසායාම්, මධුං සූදයතීති= මධුසූදනඃ. ලූනාතීති= ලවණඃ. අත්‍ර ණත්‍වං නිපාත්‍යතෙ. ශත්‍රූන් දම්‍යතීති වා දමයතීති= ශත්‍රුදමනඃ. ඉති නන්ද්‍යාදිඃ.

a. අථ ග්‍රහාදිර්නිරූප්‍යතෙ. ග්‍රහ උපාදනෙ, "ඉනාං ශෞ සෞ" "ගසෙපඃ සෙලොපඃ." ණිනිප්‍රත්‍යයාන්තාඃ සර්වෙ දණ්ඩිවත්. ගෘහ්ණාතීති=ග්‍රාහී, උත්සාහී. ආස් උපවෙශනෙ, උදාසෙ'සෞ=

---

ධාතුව ද ඉදිත් බැවින් "ඉදිතො නුම්" සි නුමාගම වීමෙන් ධාතු දෙක්හි ම රූප සමාන ය.) කෘෂ් නිෂ්කාෂෙ, "කෘෂ්" ධාතුව සෑමෙහි වේ. කෘෂ් ආමර්ෂණෙ, "කෘෂ්" ධාතුව ඇදීමෙහි ද වේ. සඞ්කර්ෂතීති= සඞ්කර්ෂණඃ, මොනවට අදි නු සි නොහොත් සා නු සි "සඞ්කර්ෂණ" නම්. අර්ද- මර්ද අර්දනෙ, "අර්ද්- මර්ද්" ධාතු දෙක පෙළීමෙහි ද; අර්ද ගතෞ යාචනෙ ච, "අර්ද්" ධාතුව ගමනෙහි ද, යැදීමෙහි ද වේ. ජනාන් අර්දයතීති, ජනයන් පෙළා නු සි; ජනාර්දනඃ, "ජනාර්දන" නම්. (එනම් විෂ්ණු සි. "ජනං ජනනමර්දයති" කියා හෝ "ජනෛරර්ද්‍යතෙ යාච්‍යතෙ ස්වාභීෂ්ටම සෞ" කියා හෝ ගත හොත් යොග්‍ය ය සි හැගේ.) මර්දයතීති= මර්දනඃ, මඩී නු සි "මර්දන" නම් කෘෂ සඞ්කර්ෂණෙ, "කෘෂ්" ධාතුව කැසීමෙහි වේ. සඞ්කර්ෂතීති= සඞ්කර්ෂණඃ, මොනවට කසා නු සි "සඞ්කර්ෂණ" නම්. පුනාතීති= පවනඃ, පවිත්‍ර කෙරේ නු සි "පවන" නම්. (ක්‍ර්‍යාදි ගණික "පූඤ් පවනෙ" ධාතු සි.) "පවතෙ 'සෞ= පවනඃ" යනු භ්වාදි ගණික "පූ" ධාතුවෙන් ද එසේ ම සිද්ධ වන බව දක්වීමට නිදර්ශිත ය. (සමානාර්ථ සි.) ක්‍ෂුද ක්‍ෂරණෙ, චුරාදි ගණික ෂොපදෙශ "ක්‍ෂුද්" ධාතුව වැගිරීමෙහි ද, ක්‍ෂුද නිවාරණෙ, භ්වාදි ගණික "ක්‍ෂුද්" ධාතුව වැළැක්වීමෙහි ද; සූදි හිංසායාම්, "සූද්" ධාතුව හිංසා කිරීමෙහි ද වේ. මධුං සූදයතීති, "මධු" නම් අසුරයා වළක්වා නු සි; මධුසූදනඃ, "මධුසූදන" නම්. (ධාතු ත්‍රයයෙන් ම එක සේ සිද්ධ ය.) ලූනාතීති= ලවණඃ, සිඳී නු සි "ලවණ" නම්. ("ලූඤ් ඡෙදනෙ" ධාතු සි.) අත්‍ර, මෙහි; ණත්‍වම්, ණකාර බව; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ. ("ෂ්‍රූනෝ ණො 'නතෙන" සි හෝ "අවකුජවනාන්තරෙ'පි" සි ණත්‍වය වීමට නිමිති නැති හෙයිනි.) ශත්‍රූන්, සතුරන්; දම්‍යතීති වා, දමනය කෙරෙයි හෝ; දමයතීති, දමනය කරවා නු සි; ශත්‍රුදමනඃ, "ශත්‍රුදමන" නම්. නන්ද්‍යාදිඃ, නන්ද්‍යාදිය; ඉති, මෙසේ සි.

a. අථ, ඉක්බිති; ග්‍රහාදිඃ, ග්‍රහාදිය; නිරූප්‍යතෙ, දක්වනු ලැබේ. (මෙහි "ණිනි" ප්‍රත්‍යය සි. එහි "ඉන්" පමණක් ශෙෂ වේ. ණිත් හෙයින් ධාතුහට වෘද්ධි වේ.) ග්‍රහ උපාදනෙ, "ග්‍රහ්" ධාතුව

**උදාසී. දාසෘ දානෙ, උත්පූර්වඃ, උද්දාසී. භාසෘ දීප්තෞ, උද්භාසතෙ 'සෞ= උද්භාසී. "ආතො යුක්" ඡො ඡෙදනෙ, ඡ්‍යතිති= ඡායී. තිෂ්ඨතිති= ස්ථායී. මන්ත්‍රි ගුප්තභාෂණෙ, මන්ත්‍රි අවධාරණෙ, මන්ත්‍රයතිති= මන්ත්‍රී. මෘද මර්දනෙ, මර්දි ආමර්දනෙ, මෘදු ආර්ජවෙ, සම්මර්දීති වා සම්මර්දයතිති= සම්මර්දී. නිස්‍රවතිති= නිස්‍රාවී. නිශෘණොතිති= නිශ්‍රාවී. රක්ෂ පාලනෙ, නිරක්ෂතිති= නිරක්ෂී. වස් නිවාසෙ, නිවසතිති= නිවාසී. ඩුවප් බීජසන්තානෙ, නිවපතිති= නිවාපී. ශො තනූකරණෙ, නිශ්‍යතිති= නිශායී.**

---

ගැණීමෙහි වේ. "ඉන්නාං ශෙෂෙ සෞ" යන්නෙන් ඉකාරයට දීර්ඝ වේ. "හසෙපඃ සෙර්ලොපඃ" යන්නෙන් සිප්‍රත්‍යයට ලොප් වේ. ("නාම්නො නො ලොපශධෞ" යි නකාරයට ලොපශ් වේ.) සර්වේ ණිනි ප්‍රත්‍යයාන්තාඃ, සියලු ණිනි ප්‍රත්‍යයාන්ත ශබ්දයෝ; දණ්ඩිවත්, "දණ්ඩින්" ශබ්දය මෙනි. ගෘහ්ණාතීති= ග්‍රාහී, ගණී නු යි "ග්‍රාහින්" නම්. උත්සාහී, "උත්සහතෙ" (=උත්සාහ කෙරෙයි) යන වාක්‍යයෙහි "උත්සාහින්" නම් වේ. (උත් පූර්ව "ෂහ මර්ෂණෙ" ධාතු යි.) ආස් උපවෙශනෙ, "ආස්" ධාතුව හිඳීමෙහි වේ. උදාසෙත, උදාසීත වේ නු යි; අසෞ, මේතෙමේ; උදාසී, "උදාසින්" නම්. දාසෘ දානෙ, "දාස්" ධාතුව දීමෙහි වේ. උත්පූර්වඃ, "උද්" උපසර්ගය පූර්ව කොට ඇත්තේ ය. උද්දාසී, "උද්දාසති" (=උසස් ව දෙයි) යන වාක්‍යයෙහි "උද්දාසින්" නම්. භාසෘ දීප්තෞ, "භාස්" ධාතුව බැබලීමෙහි වේ. උද්භාසතෙ අසෞ, උසස් ව බබලා නු යි මෙතෙමේ; උද්භාසී, "උද්භාසින්" නම්.

"ආතො යුක්" යන සූත්‍රයෙන්(වක්ෂ්‍යමාණ ධාතු සම්බන්ධ ව)යුගාගම වේ. ඡො ඡෙදනෙ, "ඡො" ධාතුව සිඳීමෙහි වේ. ("සන්ධ්‍යක්ෂරාණාමා" යි ඔකාරයට ආකාරය වේ.)ඡ්‍යතීති, සිඳී නු යි; ඡායී, "ඡායින්" නම්. තිෂ්ඨතීති= ස්ථායී, සිටී නු යි "ස්ථායින්" නම්. ("ෂ්ඨා ගතිනිවෘත්තෞ" ධාතු යි.) මන්ත්‍රි ගුප්තභාෂණෙ, "මන්ත්‍ර්" ධාතුව රහස් කථායෙහි ද; මන්ත්‍රි අවධාරණෙ, "මන්ත්‍ර්" ධාතුව වෙන් කිරීමෙහි ද වේ. (ඉකාරානුබන්ධ හෙයින් "ඉදිතො නුම්" යි නුමාගම වේ.) මන්ත්‍රයතීති= මන්ත්‍රී, මන්ත්‍රණය කෙරේ නු යි "මන්ත්‍රින්" නම්. මෘද මර්දනෙ, "මෘද්" ධාතුව මැඩීමෙහි ද; මර්දි ආමර්දනෙ, "මර්ද්" ධාතුව මිරිකීමෙහි ද; මෘදු ආර්ජවෙ, "මෘද්" ධාතුව ඍජු බැව්හි ද වේ. සම්මර්දීති වා, මොනවට මඩියි හෝ; සම්මර්දයතීති, මඩවා නු යි; සම්මර්දී, "සම්මර්දින්" නම්. නිස්‍රවතීති, නිශ්ශෙෂයෙන් පෙළා නු යි; නිස්‍රාවී, "නිස්‍රාවින්" නම්. (නිපූර්ව "ස්‍රු ගතිවෘද්ධිහිංසාසු" ධාතු යි.) නිශෘණොතීති= නිශ්‍රාවී, නිශ්ශෙෂයෙන් අසා නු යි "නිශ්‍රාවින්" නම්. (නිපූර්ව "ශ්‍රු ශ්‍රවණෙ" ධාතු යි.) රක්ෂ පාලනෙ, "රක්ෂ්" ධාතුව පාලනයෙහි වේ. නිරක්ෂතීති= නිරක්ෂී, නිශ්ශෙෂයෙන් රකී නු යි "නිරක්ෂින්" නම්.

**ඎ. "නඤ්පුබ්බෙහි කාහාණීයාචාවදිහෙ ණිනිශ්ච." න කරොති වා න කුරුතෙ 'සෞ= අකාරී.* "ඉනාං ශෞ සෞ." න හරතීත්‍යහාරී. ණීඤ් ප්‍රාපණෙ, න නයතීත්‍යනායී. න යාචතෙ 'සෞ= අයාචී. න වදතීත්‍යවාදී. රාධ හිංසායාම්, ණිනිශ්චෙති චකාරාදපාවපරිවිභ්‍යො ණිනිඃ. අපරාධ්‍යතීත්‍යපරාධී. රුධිරාවරණෙ, අවරුණද්ධීත්‍යවරොධී. පරිභවතීති= පරිභාවී. විපූර්වඃ, විචරතීති= විචාරී. විශෙෂෙණ රෞතීති= විරාවී. ඉති ග්‍රහාදයඃ.**

---

වස් නිවාසෙ, "වස්" ධාතුව විසීමෙහි වේ. නිවසතීති= නිවාසී, නිවසා නු යි "නිවාසින්" නම්. ඩුවප් බීජසන්තානෙ, ඩු ඉත් "වප්" ධාතුව බිජු වැපිරීමෙහි වේ. නිවපතීති= නිවාපී, වපුරා නු යි "නිවාපින්" නම්. ශො තනූ කරණෙ, "ශො" ධාතුව තුනී කිරීමෙහි වේ. නිශ්‍යතීති= නිශායී, තුනී කෙරේ නු යි "නිශායින්" නම්. ("සන්ධ්‍යක්ෂරාණාමා" යි ආකාර ව "ආතො යුක්" යි යුගාගම වේ.)

ඎ. නඤ්පූර්වේභ්‍යඃ, "නඤ්" නිපාතය පූර්ව කොට ඇති; කෘහෘණීයාචෘවදිභ්‍යඃ ච, කෘ- හෘ- ණී යාච්- වද් යන ධාතූන් කෙරෙන් ද; ණිනිඃ, ණිනි ප්‍රත්‍යය වේ. න කරොති, නො කෙරේ නු යි; අසෞ, මෙතෙමේ; අකාරී, "අකාරින්" නම්. න කුරුතෙ වා, "න කුරුතෙ" කියා ආත්මනෙපදයෙන් හෝ විග්‍රහය වේ. ("නා" යන සූත්‍රයෙන් නකාරයට අකාරය වේ.) "ඉනාං ශෞ සෞ" යන්නෙන් දීඝ වේ. න හරතීති= අහාරී, නො හරී නු යි "අහාරින්" නම්. ණීඤ් ප්‍රාපණෙ, ණොපදෙශ "ණී" ධාතුව පැමිණවීමෙහි වේ. න නයතීති= අනායී, නො පමුණුවා නු යි "අනායින්" නම්. න යාචතෙ, නො යදී නු යි; අසෞ, මෙතෙමේ; අයාචී, "අයාචින්" නම්. න වදතීති= අවාදී, නො කියා නු යි "අවාදින්" නම්. රාධ හිංසායාම්, "රාධ" ධාතුව, හිංසාර්ථයෙහි වේ. ණිනිශ්චෙති, "ණිනිශ්ච" යන මෙහි; චකාරාත්, චකාර ග්‍රහණයෙන්; අපාවපරිවිභ්‍යඃ, අප- අව- පරි- වි යන උපසර්ගයන් කෙරෙන් (පර වූ ධාතූන් කෙරෙන්) ද; ණිනිඃ, ණිනි ප්‍රත්‍යය වේ. අපරාධ්‍යතීති= අපරාධී, පෙළා නු යි "අපරාධින්" නම්. රුධිර් ආවරණෙ, "රුධ" ධාතුව ඇවිරීමෙහි වේ. අවරුණද්ධි ඉති, වළක්වා නු යි; අවරොධී, "අවරොධින්" නම්. පරිභවතීති= පරිභාවී, පිරිහෙලා නු යි "පරිභාවින්" නම්. වි පූර්වඃ, වි පූර්ව ("චර්" ධාතුව) වේ. විචරතීති= විචාරී, විමසා නු යි "විචාරින්" නම්. විශෙෂෙණ රෞතීති= විරාවී, වෙසෙසින් හඬා නු යි "විරාවින්" නම්. (විපූර්ව "රු ශබ්දෙ" ධාතු යි.) ග්‍රහාදයඃ, ග්‍රහාදිය; ඉති, මෙසේ යි. (මෙතෙක් පචිනන්දිග්‍රහාදෙරයුණිනි යන සූත්‍රයට නිදර්ශන දක්වූහ. මෙහි පචාදි ගණයෝ ධාතු පාඨයන්හි නො දක්වෙති. එහෙයින් ඔහු

---

* කරොති වා කුරුතෙ'සෞ= කාරී- පොත්හි.

**a. අථ දෘශාදිර්නිරූප්‍යතෙ:-**

**7. දෘශාදෙඃ ශඃ.** (දෘශාදෙඃ 5-1. ශඃ 1-1.)

**b. දෘශ් හන් ධෙට් ධ්මා ඝ්‍රා පා දෘ ධා විද් එභ්‍යඃ ශප්‍රත්‍යයො භවති. ශකාරඃ ශිති චතුර්වත්කාර්‍ය්‍යාර්ථඃ.**

**8. ශිති චතුර්වත්.** (ශිති 7-1. චතුර්වත්-හි:)

**c. ශිති ප්‍රත්‍යයෙ පරෙ තිබාදිෂු පරෙෂු යත් කාර්‍ය්‍යමුක්තං තද් භවති.**

---

ප්‍රත්‍යයවත් වීමෙන් සිද්ධ වූ නාමගණ වශයෙන් හැඳින ගත යුත්තෝ ය. එහෙත්, පච- වච- වප- වද- චල- පත- නද- භෂ ප්ලු- චර- සෘප- ක්‍ෂප- මිෂ- ව්‍රණ- ක්ලිද- ක්නස- හන- පට- භූ- හෘ- ගෘෘ- තෘෘ- ගාහ- දිව- ද්‍රු- නී- ජ්වල- ස්‍රු යන ධාතු (28) පචාදිය සි ද, නන්දි- මදි- දූෂි- සාධි- වර්ධි- ශොභි- රොචි- සහි- තපි- දමි- ජල්පි- රමි- දර්පි- චක්‍ෂ- ක්‍රන්දි- කර්ෂි- හර්ෂි- අර්දි- යු- සූදි- භීෂි- ලූ- නාශි යන ධාතු (23) නන්ද්‍යාදිය සි ද, ග්‍රහ- ස්ථා- පා- සහ- භාස- මන්ත්‍ර- නර්දී- රක්‍ෂ- ශ්‍රෘ- වප- ශී- යාච- හෘ- ව්‍රජ- වද- වස- කෘ- නී- භූ- රුධ- රුධ යන ධාතු (21) ග්‍රහාදිය සි ද, මුග්ධබොධ ටීකායෙහි දක්වූහ.)

a. අථ, ඉක්බිති; දෘශාදිඃ, දෘශාදිය; නිරූප්‍යතෙ, දක්වනු ලැබේ.:-

7. ශ ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. පෙර සේ "**ධාතොඃ- කර්තරි**" යනු අනුවෘත්ත යි. දෘශාදෙඃ ධාතොඃ, දෘශාදි ධාතූහු කෙරෙන්; කර්තරි, කර්තෘ කාරකයෙහි; ශඃ, ශ ප්‍රත්‍යය වේ.

b. දෘශ්- පෙ- විද් එභ්‍යඃ, දෘශ්- හන්- ධෙට්- ධ්මා- ඝ්‍රා- පා- දෘ- ධා- විද් යන මේ ධාතූන් කෙරෙන් පර ව; ශප්‍රත්‍යයඃ භවති, ශ ප්‍රත්‍යය වේ. ශකාරඃ, ශකාරය; ශිති චතුර්වත් කාර්‍ය්‍යාර්ථඃ, "ශිති චතුර්වත්" යන සූත්‍රයෙහි කාර්‍ය්‍යය ප්‍රයෝජන කොට ඇත්තේ ය. (අකාරය පමණක් ශෙෂ වේ.)

8. අතිදෙශ සූත්‍ර යි. ශිති, ශකාරය ඉත් කොට ඇති ප්‍රත්‍යය පර කල්හි; චතුර්වත්, ලඩාදි සතර පර කල්හි මෙන් කාර්‍ය්‍යය වේ.

c. ශිති ප්‍රත්‍යයෙ පරෙ, ශිත් වූ ප්‍රත්‍යය පර කල්හි; තිබාදිෂු පරෙෂු, "තිප්" ආදිය පර කල්හි; යත් කාර්‍ය්‍යම් උක්තම්, යම් කාර්‍ය්‍යයෙක් කියන ලද නම්; තත්, එය; භවති, වේ. (ලඩාදි සතරෙහි මෙන් පශ්‍යාදි ආදෙශ ය- විකරණ ය යනාදිය වෙයි කී නියා යි.)

**ඞ. "දෘශාදෙඃ පශ්‍යාදිඃ" අප්, "අදෙ" පශ්‍යතීති= පශ්‍යඃ, උත්පූර්වඃ, උත් ඌර්ධ්වං පශ්‍යතීති= උත්පශ්‍යඃ. හන් හිංසා ගත්‍යොඃ, අප්,* අදාදිභ්‍යාදපො ලුක්. "අපිත්තාදිර්ඞිත්" "ගමාං ඛවරෙ" "හනො ස් තෙ" ගාං හන්තීති= ගොඝ්නඃ. පාපඝ්නඃ. ධෙට් පානෙ, අප්, "අදෙ" ධයතීති= ධයඃ. ධ්මා, ධමාදෙශඃ, ධමතීති= ධමඃ, උද්ධමතීති= උද්ධමඃ. ඝ්‍රා, ජිඝ්‍රාදෙශඃ, ජිඝ්‍රතීති= ජිඝ්‍රඃ. පා පානෙ, පිබාදෙශඃ, පිබතීති= පිබඃ. අප්,* "හ්වාදෙර්ද්විශ්ච" "දාදෙඃ" ඉත්‍යාකාරලොපඃ. දදාති වා දත්තෙ'සෞ=දදඃ. දධාති වා ධත්තෙ'සෞ=දධඃ. "බ්‍රුවාදෙර්බ්‍රුම්" "තුදාදෙරඃ" විද් ලාභෙ, ගාං වින්දතීති= ගොවින්දඃ.**

---

ඞ. "දෘශාදෙඃ පශ්‍යාදිඃ" යන සූත්‍රයෙන් "පශ්‍ය" ආදි ආදෙශයෝ වෙත්. අප්, ("අප් කතීරි" යි) අප් විකරණය වේ. "අදෙ" යන සූත්‍රයෙන් විකරණ අකාරයට ලොප් වේ. පශ්‍යතීති= පශ්‍යඃ, දකී නු යි "පශ්‍ය" නම්. උත්පූර්වඃ, "උද්" උපසර්ගය පූර්ව කොට ඇත්තේ ය. උත්, "උත්" යි සේ යි; ඌර්ධ්වං පශ්‍යතීති, උඩ බලා නු යි; උත්පශ්‍යඃ, "'උත්පශ්‍ය" නම්. හන් හිංසාගත්‍යොඃ, "හන්" ධාතුව හිංසාර්ථ- ගමනාර්ථ දෙක්හි වේ. අප්, අප් විකරණය වේ. අදාදිභ්‍යාත්, අදාදිය බැවින්; අපඃ, අප් විකරණයට; ලුක්, ("අදාදෙර්ලුක්" යි) ලුක් වේ. "අපිත්තාදිර්ඞිත්" යන සූත්‍රයෙන් ශප්‍රත්‍යය "ඞිත්" සංඥ වේ. "ගමාං ඛවරෙ" යන්නෙන් උපධාලොපය වේ. "හනො ස් තෙ" යන්නෙන් හකාරයට ඝකාරය වේ. ගාං හන්තීති= ගොඝ්නඃ, ගවයා නසා නු යි "ගොඝ්න" නම්. පාපඝ්නඃ, 'පාපං හන්ති' (=පව නසයි) යන වාක්‍යයෙහි "පාපඝ්න" නම්. ධෙට් පානෙ, "ධෙ" ධාතුව බීමෙහි වේ. අප්, අප් විකරණය වේ. "අදෙ" යි අකාරයට ලොප් වේ. ධයතීති= ධයඃ, බෝ නු යි "ධය" නම්. ධ්මා, 'ධ්මා' ධාතු යි. ධමාදෙශඃ, ඊට ("දෘශාදෙඃ පශ්‍යාදිඃ" යි) ධමාදෙශ වේ. ධමතීති= ධමඃ, පිඹී නු යි "ධම" නම්. උද්ධමතීති= උද්ධමඃ, උඩට පිඹී නු යි "උද්ධම" නම්. ඝ්‍රා, 'ඝ්‍රා' ධාතු යි; ජිඝ්‍රාදෙශඃ, "ජිඝ්‍ර" ආදෙශ වේ. ජිඝ්‍රතීති= ජිඝ්‍රඃ, ආඝ්‍රාණය කෙරේ නු යි "ජිඝ්‍ර" නම්. පා පානෙ, "පා" ධාතුව බීමෙහි වේ. පිබාදෙශඃ, "පිබ" ආදෙශ වේ. පිබතීති= පිබඃ, බෝ නු යි "පිබ" නම්. අප්, (වක්ෂ්‍යමාණ "දා-ධා" ධාතුන් කෙරෙන්) අප් විකරණය වේ. "හ්වාදෙර්ද්විශ්ච"

---

* "අදෙ" පොත්හි. "අදාදෙර්ලුක්" "හ්වාදෙර්ද්විශ්ච" යන සූත්‍රවලින් ම අප් විකරණය ලුක්,වන හෙයින් ඒ නිරර්ථක ය.

## 9. ජ්වලාදෙර්ණඃ. (ජ්වලාදෙඃ 5- 1. ණඃ 1- 1.)

**වෘ. ජ්වලාදෙර්ගණාත් ණඃ ප්‍රත්‍යයො භවති. ජ්වලාදෙර්ණො වෙති කෙචිත්. පක්ෂෙ පචාදිත්වාදඃ. ජ්වල දීප්තෞ, ජ්වාලඃ- ජ්වලඃ. තපතීති= තාපඃ- තපඃ. පඨි ගතෞ, චුරාදිඃ, ඉදිත්, පාණ්ඨයතීති වා පණ්ඨතීති= පාණ්ඨඃ- පණ්ඨඃ. අත්‍ර වෘද්ධ්‍යනන්තරං.**

---

යන සූත්‍රයෙන් ධාතුව ද්විරුක්ත වේ. අබ් විකරණයට ලුක් ද වේ. දෘදෙඃ ඉති, “දෘදෙඃ” යන සූත්‍රයෙන්; ආකාරලොපඃ, ආකාරයට ලොප් වේ. දදෘති, දේ නු යි; අසෞ, මේ තෙමේ, දදඃ, “දද” නම්. දදාති වා, “දදාති” කියා ආත්මනෙපදයෙන් හෝ වාක්‍යය වේ. දධාති, දරා නු යි; අසෞ, මෙතෙමේ, දධඃ, “දධ” නම්. ධත්තෙ වා, ‘ධත්තෙ’ කියා හෝ වාක්‍යය වේ. “මුචාදෙර්මුම්” යන්නෙන් (වක්‍ෂ්‍යමාණ ධාතුව සම්බන්ධ ව) මුමාගම වේ. “තුදාදෙරඃ” යන්නෙන් “අ” විකරණය වේ. විදෘ ලාභෙ, “විද්” ධාතුව ලාභයෙහි වේ. (මුමාගමය ලාභාර්ථ “විද්” ධාතුහු සම්බන්ධ ව මැයි.) ගාං වින්දතීති, පෘථිවිය ලබා නු යි; ගොවින්දඃ, “ගොවින්ද” නම්.

9. ණ ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. අනුවෘත්ත පෙර සේ යි. ජ්වලාදෙඃ ධාතොඃ, ජ්වලාදි ධාතුහු කෙරෙන්; කර්තරි, කර්තෘකාරකයෙහි; ණඃ, ණ ප්‍රත්‍යය වේ.

වෘ. ජ්වලාදෙඃ ගණාත්, ජ්වලාදි ධාතුගණයා කෙරෙන්; ණඃ ප්‍රත්‍යයඃ භවති, ණ ප්‍රත්‍යය වේ. ජ්වලාදෙඃ ණඃ, ජ්වලාදීහු කෙරෙන් වන ණ ප්‍රත්‍යය; වා ඉති, විකල්පයෙන් වේ ය යි; කෙචිත්, සමහරු කියත්. පක්ෂෙ, (එහෙයින් ණ ප්‍රත්‍යය නො වන) පක්ෂයෙහි; පචාදිත්වාත්, පචාදිය බැවින්; අඃ, (“පචිනන්දිග්‍රහාදෙරයුණිනි” යි) අ ප්‍රත්‍යය වේ. ජ්වල දීප්තෞ, “ජ්වල්” ධාතුව බැබලීමෙහි වේ. ජ්වාලඃ- ජ්වලඃ, ‘ජ්වලති’ (=බබලයි) යන වාක්‍යයෙහි ණප්‍රත්‍යය වූ පක්ෂයෙහි “ජ්වාල” යනු ද- අ ප්‍රත්‍යය වූ පක්ෂයෙහි “ජ්වල” යනු ද වේ. (ණප්‍රත්‍යයේ ණකාරය වෘද්ධිය පිණිස යි. එහෙයින් “අත උපධායාඃ” යි වෘද්ධි විය.) තපතීති, තැවේ නු යි; තාපඃ- තපඃ, ණප්‍රත්‍යය වීමෙන් “තාප” යනු ද- අප්‍රත්‍යය වීමෙන් “තප” යනු ද වේ. පඨි ගතෞ, “පඨ්” ධාතුව ගමනෙහි වේ. චුරාදිඃ, එය චුරාදි ගණයට අයත් ය. ඉදිත්, ඉකාරය ඉත් කොට ඇත්තේ ය. පාණ්ඨයතීති, යේ නු යි; පාණ්ඨඃ- පණ්ඨඃ, “පාණ්ඨ” නම් ද- විකල්පයෙන් “පණ්ඨ” නම් ද වේ. පණ්ඨතීති වා, ‘පණ්ඨති’ කියා භ්වාදි ගණ වශයෙන් හෝ වාක්‍යය වේ. අත්‍ර, මෙහි; වෘද්ධි අනන්තරම්, වෘද්ධියට අනතුරු ව;

**නුමාගමඃ, ජවලාදිගණපාඨසාමර්ථ්‍යාත්. පතෟ ගත්‍යෛශ්වර්‍ය්‍යයොඃ, පතතීති= පාතඃ– පතඃ. ඛච පවනෙ, ඛචතීති= ඛාචඃ– ඛචඃ. පඨ ගත්‍යාම්, පඨතීති= පාඨඃ– පඨඃ. මඨ ගාහෙ, මඨතීති= මාඨඃ– මඨඃ. සහතෙ ‘සෞ= සාහඃ– සහඃ. ඉති ජවලාදිඃ. අථා‘ණ්:–.**

## 10. කාර්‍ය්‍යෙ‘ණ්. (කාශේ 7-1. අණ 1-1.)

**a. ධාතොඃ කර්‍මණි ප්‍රයුජ්‍යමානෙ අණ් ප්‍රත්‍යයො භවති. කුම්භකාරඃ.**

---

නුමාගමඃ, “ඉදිතො නුම්” යි නුමාගම වේ. ජවලාදිගණ පාඨ සාමර්ථ්‍යාත්, ජවලාදි ගණයෙහි ලා හැදෑරීමේ ශක්තියෙනි. පතෟ ගත්‍යෛශ්වර්‍ය්‍යයොඃ, “පත් ධාතුව” ගමන ය– අධිපති බව ය යන අර්‍ථ දෙක්හි වේ. පතතීති= පාතඃ– පතඃ, වැටේ නු යි “පාත” නම් ද– “පත” නම් ද වේ. ඛච පවනෙ, “ඛච්” ධාතුව පැසීමෙහි හෙවත් කැකෑරීමෙහි වේ. ඛචතීති= ඛාචඃ– ඛ්වචඃ, කැකෑරේ නු යි; “ඛ්වාච” නම් ද– “ඛ්වච” නම් ද වේ. පඨ ගත්‍යාම්, “පඨ්” ධාතුව ගමන්හි වේ. පඨතීති= පාඨඃ– පඨඃ, ගමන් කෙරේ නු යි “පාඨ” නම් ද– “පඨ” නම් වේ. මඨ ගාහෙ “මඨ්” ධාතුව ඇලලීමෙහි වේ. මඨතීති= මාඨඃ– මඨඃ, ඇලලේ නු යි “මාඨ” නම් ද– “මඨ” නම් ද වේ. සහතෙ= අසෞ, ඉවසා නු යි මෙතෙමේ; සාහඃ– සහඃ, “සාහ” නම් ද– “සහ” නම් ද වේ. ජවලාදිඃ, ජවලාදිය; ඉති, මෙසේ යි. අථ, ඉක්බිති; අණ්, “අණ්” ප්‍රත්‍යය කියනු ලැබේ.

10. අණ් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. අනුවෘත්ත පෙර සේ යි. කාශේ, කර්‍මයක් උපපද ව ඇති කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; කර්‍තරි, කර්‍තෘකාරකයෙහි; අණ්, “අණ්” ප්‍රත්‍යය වේ.

a. කර්‍මණි, කර්‍මයක්; ප්‍රයුජ්‍යමානෙ, යොදනු ලබන කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; අණ් ප්‍රත්‍යයඃ භවති, “අණ්” ප්‍රත්‍යය වේ. කුම්භකාරඃ, “කුම්භං කරොති” (=කළය කෙරෙයි) යන වාක්‍ය යෙහි “කුම්භකාර” නම්. (අණ් ප්‍රත්‍යයෙහි ද ණකාරය වෘද්ධිය පිණිස යි. අණ් ප්‍රත්‍යය වීමෙන් “කාර” ශබ්දය නිපන් කල්හි “නාම්නාඛව කෘතා සමාසඃ” යි කුම්භ ශබ්දය හා සමාස වේ. ඛප්‍රත්‍යයාදිය වූ කල්හි ද එසේ යි.)

## 11. නාම්නි ච. (නාම්නි 7-1. ච-ඝි:)

**a. නාමන්‍යුපපදෙ ධාතොර්ඩඃ. ද්වාභ්‍යාං පිබතීති= ද්විපඃ. ද්වෙඃ වාරෙඃ ජායතෙ 'සෞ= ද්විජඃ. ශෘහෙර්දූරෙඃ සහ තිෂ්ඨතීති= ශෘහස්ථඃ. ගිරිශඃ. ශිඩි ස්වප්නෙ. පාදෛඃ පිබතීති= පාදපඃ. ද්‍රු ගතෞ, ශුචං ද්‍රවතීති= ශුද්‍රඃ.**

---

11. ඩ ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. "ආතො ඩඃ" යි ඩඃ යනු ද, **ධාතොඃ** යන සූත්‍රය ද, **කර්තරි** යනු ද අනුවෘත්ත යි. නාම්නි ච, නාමයක් උපපද ව ඇති කල්හි ද; ධාතොඃ, ධාතුහු කෙරෙන්; කර්තරි, කර්තෘ කාරකයෙහි; ඩඃ, "ඩ" ප්‍රත්‍යය වේ.

a. නාම්නි උපපදෙ, නාමයක් උපපද ව ඇති කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; ඩඃ, ඩ ප්‍රත්‍යය වේ.

("කාශේ 'ණ්" යන සූත්‍රයෙන් කර්මයක් හෙවත් ද්විතීයාන්තයක් ම උපපද ව ඇති කල්හි අණ් ප්‍රත්‍යය විහිත ය. මේ සූත්‍රයෙන් කවර විභක්ත්‍යන්ත වූ හෝ නාමමාත්‍රයක් උපපද ව ඇති කල්හි ඩ ප්‍රත්‍යය වේ. මෙහි ඩකාරය "ඩිති ටෙඃ" යි ටිසංඥ ලොපය පිණිස යි. අකාරය ශෙෂ වේ. **සූත්‍රපාඨයෙහි** මේ සූත්‍රයට පෙරටු ව **"ආතො ඩඃ"** යන සූත්‍රය වෙයි. ඊට "කාශේ'ණ්" යි "කාශේ" යනු අනුවෘත්ත කොට "කර්මයක් උපපද ව ඇති කල්හි ආකාරාන්ත ධාතුහු කෙරෙන් ඩප්‍රත්‍යය වේ" ය යි හඳුරණු ලැබේ. **"ගාං දදාතීති= ගොදඃ. ධනං දදාතීති= ධනදඃ."** යනාදිය ඊට උදාහරණ යි එහෙත් ඒ සූත්‍රය පොතට ඇතුළත් නො කළ බව පෙණේ. ඒ සූත්‍රයෙන් සිද්ධ කළ නාමයන් මේ සූත්‍රයෙන් ද සිද්ධ කිරීමට බාධාවක් නැති හෙයින් එසේ ඇතුළත් නො කළහ යි සිතිය හැකි ය. **චන්ද්‍රකීර්ති ටීකා** සහිත පොත්හි නම් ඇතුළත් ව තිබේ.)

ද්වාභ්‍යාං පිබති ඉති, (මුව ය- සොඬ ය යන) දෙකින් බෝ නු යි; ද්විපඃ, "ද්විප" නම්. ද්වෞ වාරෞ, දෙවරක්; ජායතෙ, උපදී නු යි; අසෞ, මෙතෙමේ; ද්විජඃ, "ද්විජ" නම්. (මවුකුසින් වරක් ද සංස්කාරයෙන් වරක් ද උපදින හෙයින් බ්‍රාහ්මණයෝ ද, මවු කුසින් හා අණ්ඩයෙන් උපදින හෙයින් අණ්ඩජයෝ ද, ඇඳි දෙකෝ උපදනා හෙයින් දන්තයෝ ද "ද්විජ" නම් වෙති.) ගෘහෙ, "ගෘහෙඃ" යි සේ යි; දූරෙඃ, භාර්‍යාවන් හා; තිෂ්ඨතීති, සිටී නු යි; ගෘහස්ථඃ, "ගෘහස්ථ" නම්. ගිරිශඃ, "ගිරෞ ශෙතෙ" (=පර්වතයෙහි හො වී) යන වාක්‍යයෙහි "ගිරිශ" නම්. ශීඞ් ස්වප්නෙ, ශයනාර්ථයෙහි වූ "ශී" ධාතු යි කාශිකා- සිද්ධාන්තකෞමුදී ආදියෙහි "ගිරෞ ඩශ්ඡන්දසි"

## 12. ශුචඃ ශූ ද්‍රෙ (ශුචඃ 6-1. ශූ 1-1. ද්‍රෙ 7-1.)

**a. ශුචඃ ශූරාදෙසො භවති ද්‍රෙ පරෙ.**

## 13. උරසඃ සලොපශ්ච.*
(උරසඃ 6-1. සලොපඃ 1-1. ච-නි:)

**b. උරසඃ සකාරස්ස ලොපො භවති ඩප්‍රත්‍යයාන්තෙ ගමෞ, මුමාගමශ්ච වා. උරසා ගච්ඡතීත්‍යුරගඃ- උරඞ්ගඃ, සර්පඃ.**

---

සි කියන ලද හෙයින් ගිරි ශබ්දොපපද 'ශී' ධාතුවෙන් පර ව ඩප්‍රත්‍යය වනුයේ වෛදයෙහි පමණෙකි. "ගිරිශමුපචචාර ප්‍රත්‍යහං සා සුකෙශී" යනාදියෙහි පෙණෙන "ගිරිශ" යන්න "ගිරිරස්‍යාස්තීති= ගිරිශඃ" යන වාක්‍යයෙහි "ලොමාදිභ්‍යඃ ශඃ" යන සූත්‍රයෙන් ගිරි ශබ්ද යෙන් පර ව ශප්‍රත්‍යය වීමෙන් නිපන් බව ද සුබොධිනී ටිකා ආදි යෙහි කීහ.) පාදෛඃ, පා (=මුල්) වලින්; පිබති ඉති, බෝ නු සි; පාදපඃ, "පාදප" නම්. ද්‍රු ගතෞ, "ද්‍රු" ධාතුව ගමනාර්ථයෙහි වේ. ශුචං ද්‍රවති ඉති, ශොකයට පැමිණේ නු සි; ශූද්‍රඃ, "ශූද්‍ර" නම්.

12. "ශූ" ආදෙශවිධි සූත්‍ර සි. ද්‍රෙ, "ද්‍ර" යන්න පර කල්හි; ශුචඃ, "ශුච්" ශබ්දයට; ශූ, ශූ යනාදෙශය වේ.

a. ද්‍රෙ පරෙ, ද්‍ර යන්න පර කල්හි; ශුචඃ, ශුච් ශබ්දයට; ශූඃ ආදෙශඃ භවති; ශූ යනාදෙශය වේ. ("ශූද්‍ර" ශබ්දයාගේ නිෂ්පත්තිය සඳහා මෙය කීහ.)

13. සකාරලොප හා මුමාගම විධි සූත්‍ර සි. "මුචාදෙර්මුම්" සි මුම් යනු ද, "විදෙ -පෙ- නවකො වා" සි වා යනු ද අනුවෘත්ත සි. උරසඃ, උරස් ශබ්දයාගේ; සලොපඃ, සකාරයට ලොප් වේ. වා, විකල්පයෙන්; මුම් ච, මුමාගම ද වේ.

b. ඩප්‍රත්‍යයාන්තෙ, ඩප්‍රත්‍යය අන්ත කොට ඇති; ගමෞ, ගම් ධාතුව පර කල්හි; උරසඃ, උරස් ශබ්දයාගේ; සකාරස්‍ය, සකාරයට; ලොපඃ භවති, ලොප් වේ. වා, විකල්පයෙන්; මුමාගමඃ ච, මුම් ආගම ද වේ. උරසා ගච්ඡතීති, ලයින් යේ නු සි; උරගඃ, (සකාර ලොපයෙන්) "උරග" නම් ද; උරඞ්ගඃ, (මුමාගම ද වීමෙන්) "උරඞ්ග" නම් ද වේ. සර්පඃ, සර්ප තෙමේ සි. (මුමාගම වූ කල්හි "නශ්චාපදාන්තෙ ඣලෙ" සි මකාරයට අනුස්වාර ව "යමා යපෙ 'ස්ස" සි වර්ගාන්තාදෙශ වේ.)

---

* උරසඃ සලොපො මුම් වා- පොත්හි.

**a. විහායසො විහඞ්ච.**

**b. විහායස් ශබ්දස්‍ය විහාදෙශො භවති, චකාරාන්මුම් වා ඛානෙන ගමෞ. විහායසි ආකාශෙ* ගච්ඡතීති = විහගඃ- විහඞ්ගඃ.**

**c. භුජස්‍ය ච මුම් වා ඛප්‍රත්‍යයානෙන ගමෞ. භුජෝ වක්‍රාචෙ, භුජං වක්‍රං ගච්ඡතීති= භුජගඃ- භුජඞ්ගඃ. විහායසො විහශ්චෙති චකාරාත් තරසස්තුරාදෙශඃ. මුම් චෙති අනුවර්තනීයම්. තරසස්තුරාදෙශඃ තුරස්‍ය මුම් වා ඛානෙන ගමෞ. තරසා වෙගෙන ගච්ඡතීති= තුරගඃ- තුරඞ්ගඃ.**

---

a. විහායසඃ, විහායස් ශබ්දයට; විහඃ ච, "විහ" යනාදෙශ ද (මුමාගම ද) වේ.

b. ඛානෙන ගමෞ, ඛප්‍රත්‍යයාන්ත වූ ගම් ධාතුව පර කල්හි; විහායස් ශබ්දස්‍ය, විහායස් ශබ්දයට; විහාදෙශඃ භවති, "විහ" ආදෙශ වේ. චකාරාත්, චශබ්දයෙන්; වා, විකල්පයෙන්; මුම්, "මුම්" ආගම වේ. විහායසි, 'විහායසි' යි සේ යි; ආකාශෙ, අහසෙහි; ගච්ඡති ඉති, යේ නු යි; විහගඃ, "විහග" නම් ද; විහඞ්ගඃ, (මුමාගම පක්ෂයෙහි) "විහඞ්ග" නම් ද වේ.

c. ඛප්‍රත්‍යයානෙන ගමෞ, ඛප්‍රත්‍යය අන්ත කොට ඇති ගම් ධාතුව පර කල්හි; භුජස්‍ය ච, "භුජ" ශබ්දය සම්බන්ධ ව ද; වා, විකල්පයෙන්; මුම්, මුමාගම වේ. භුජඃ, භුජ ශබ්දය; වක්‍රාචේ, වක් ය යන අර්ථයෙහි පවතී. භුජම්, 'භුජම්' යි සේ යි. වක්‍රං ගච්ඡති ඉති, වක් ව යේ නු යි; භුජගඃ- භුජඞ්ගඃ, "භුජග" නම් ද- "භුජඞ්ග" නම් ද වේ. (සර්පයා යි.) විහායසො විහශ්ච ඉති, "විහායසො විහශ්ච" යන මෙහි; චකාරාත්, චකාරයෙන්; තරසඃ, "තරස්" ශබ්දයට; තුරාදෙශඃ, "තුර" යනාදෙශ වේ. මුම් වා ඉති, "මුම් වා" යනු; අනුවර්තනීයම්, අනුවර්තනය කට යුතු යි. (එකල්හි,) ඛානෙන ගමෞ, ඛප්‍රත්‍යයාන්ත වූ ගම් ධාතුව පර කල්හි; තරසඃ, තරස් ශබ්දයට; තුරාදෙශඃ, තුර යනාදෙශ වේ. තුරස්‍ය, (ඒ) "තුර" ආදෙශය සම්බන්ධ ව; වා, විකල්ප යෙන්; මුම්, මුමාගම වේ. (ය යි අර්ථ ගත යුතු.) තරසා, 'තරසා, යි සේ යි; වෙගෙන ගච්ඡති ඉති, වේගයෙන් යේ නු යි; තුරගඃ- තුරඞ්ගඃ, "තුරග" නම් ද- "තුරඞ්ග" නම් ද වේ. (අශ්වයා යි.)

---

* විහායසා ආකාශෙන- සුබොධිනී.

## 14. අවො. (අවො 1-2.)

**a. නාමිනි කාමෙ ච උපපදෙ සති අවො ප්‍රත්‍යයෞ භවතඃ. අසම් හරතිති= අසම්හරඃ, ශවා. කවචං හරතිති= කවච හරඃ, කුමාරඃ. ධෘඤ් ධාරණෙ, ධනුර්ධරතිති= ධනුර්ධරඃ, ක්‍ෂත්‍රි යො වා රාජා.**

**b. චර ගතෞ, කුරූෂු දෙශෙෂු චරතිති= කුරුචරඃ. ට ඊබර්ථඃ, "ෂ්විද්‍රිතඃ" සඤ්ඥ වෙත් කුරුචරී. මහිචරී, සෙනාචරී, භික්‍ෂාචරී, දික්‍ෂාචරී, අප්‍රත්‍යයඃ සර්වධාතුසාධාරණඃ, ටප්‍රත්‍යයසතු**

---

14. අ - ට ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **ධාතොඃ** යන සූත්‍රය ද, "නාම්නි ච" යි **නාම්නි** යනු ද, "කාමෙ'ණ්" යි **කාමෙ** යනු ද, "කෘත් කර්තරි ච" යි **කර්තරි** යනු ද අනුවෘත්ත යි.

නාම්නි, නාමමාත්‍රයක් හෝ; කාමෙ, කර්මයක් උපපද ව ඇති කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; කර්තරි, කර්තෘකාරකයෙහි; අටෞ, අ- ට යන ප්‍රත්‍යයෝ දෙදෙන වෙත්.

a. නාම්නි, නාමයක් ද, කාමෙ ච, කර්මයක් ද; උපපදෙ සති, උපපද ව ඇති කල්හි; අවො ප්‍රත්‍යයෞ භවතඃ, "අ- ට" යන ප්‍රත්‍යය දෙදෙන වෙත්. (මේ සූත්‍රයට "නාම්නි"- "කාමෙෂු" යන දෙකින් "නාම්නි" යන්න පමණක් අනුවෘත්ත කළත් අර්ථයට ප්‍රමාණ වතුදු කර්මයක් උපපද වූ කල්හි "කාමෙ'ණ්" යන සූත්‍රයෙන් අණ් ප්‍රත්‍යය ම වන හෙයින් එය වළක්වනු පිණිස "කාමෙෂු" යනු ද අනුවෘත්ත කළහ. "පචිතන්දිග්‍රහාදෙරයුණිනි" යි විහිත අප්‍රත්‍යය නිරුපපද ධාතුන් කෙරෙන් ද, මේ අප්‍රත්‍යය සොපපද ධාතුන් කෙරෙන් ද වේ. මේ ඔවුන්ගේ අන්‍යොන්‍ය වෙනස යි.) අසම් හරතීති, ඇට හැර ගණී නු යි; අසම්හරඃ, "අසම්හර" නම්. ශවා, ශුනක තෙමේ යි. කවචම්, සන්නාහය; හරතීති, ගෙණ යේ නු යි; කවචහරඃ, "කවචහර" නම්. කුමාරඃ, කුමාර තෙමේ යි. ධෘඤ් ධාරණෙ, "ධෘ" ධාතුව දරීමෙහි වේ. ධනුඃ ධරතීති, දුන්න දරා නු යි; ධනුර්ධරඃ, "ධනුර්ධර" නම්. ක්‍ෂත්‍රියඃ, රාජවංශික තෙමේ යි. රාජා වා, රජ තෙමේ හෝ යි.

b. (ඉක්බිති ට ප්‍රත්‍යයට උදහරණ දක්වනු ලැබේ.) චර ගතෞ, "චර්" ධාතුව ගමනාර්ථයෙහි වේ කුරූෂු දෙශෙෂු චරති ඉති, "කුරු" නම් දෙශයන්හි හැසිරේ නු යි; කුරුචරඃ, "කුරුචර" නම්. ටඃ, (ප්‍රත්‍යයස්ථ) ටකාරය; ඊබර්ථඃ, "ඊප්" ප්‍රත්‍යය වීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. (එහෙයින්) "ෂ්විද්‍රිතඃ" යන සූත්‍රයෙන්

චරාදෙරෙව භවති. ශොකං කරොතීති= ශොකකරී, කන්‍යා. යශඃ කරොතීති= යශස්කරී, විද්‍යා. සෘ ගතෞ' පුරඃ සරතීති= පුරස්සරඃ. අග්‍රෙ සරතීති= අග්‍රෙසරඃ.

a. පාර්ශ්වෙ * ශෙතෙ 'සෞ= පාර්ශ්වශයඃ. තථෛව පෘෂ්ඨෙ † ශෙතෙ 'සෞ= පෘෂ්ඨශයඃ. උදරශයඃ. උත්තානා දිෂු කර්තෘෂු, උත්තානඃ ශෙතෙ 'සෞ= උත්තානශයඃ. සතමෙබ

---

ඊප් ප්‍රත්‍යය වේ. සත්‍රී වෙත්, ඉදින් සත්‍රියක් නම්; කුරුචරී, "කුරුචරී" නමු. (නදී ශබ්දය මෙති.) මහීචරී "මහ්‍යාං චරති" (=පොළොවෙහි හැසිරෙයි) යන වාක්‍යයෙහි සිද්ධ ටප්‍රත්‍යයාන්ත මහීචර ශබ්දයෙන් පර ව සත්‍රීත්වයෙහි ඊප් ප්‍රත්‍යය වීමෙන් "මහීචරී" යනු වේ. සේනාචරී, (එසේ ම) "සේනායාං චරති" (=සේනාවෙහි හැසිරෙයි) යන වාක්‍යයෙහි සිද්ධ සේනාචර ශබ්දයෙන් ඊප් ප්‍රත්‍යය ව "සේනාචරී" කියා ද, භික්ෂාචරී "භික්ෂායාං චරති" (=භික්ෂාවෙහි හැසිරෙයි) යන වාක්‍යයෙහි සිද්ධ භික්ෂාචර ශබ්දයෙන් 'ඊප්' ව "භික්ෂාචරී" කියා ද, දීක්ෂාචරී, "දීක්ෂායාං චරති" (=උපවාසාදි ව්‍රතයෙහි හැසිරෙයි) යන වාක්‍යයෙහි සිද්ධ දීක්ෂාචර ශබ්දයෙන් 'ඊප්' ව "දීක්ෂාචරී" කියා ද වේ. අප්‍රත්‍යයඃ, අප්‍රත්‍යය; සර්වධාතු සාධාරණඃ, සියලු ධාතුන්ට සාධාරණ ය, හෙවත් සියලු ධාතුන් කෙරෙන් ම වේ. ටප්‍රත්‍යයඃ තු, ටප්‍රත්‍යය වනාහි; චරාදෙඃ එව, චරාදීහු කෙරෙන් (පමණක්) ම; භවති, වේ. ශොකං කරොති ඉති, ශොක කෙරේ නු යි; ශොකකරී, "ශොකකරී" නමු. කන්‍යා, කන්‍යා තොමෝ යි. යශඃ කරොති ඉති, කීර්තිය කෙරේ නු යි; යශස්කරී, "යශස්කරී" නමු. විද්‍යා, විද්‍යාව යි. සෘ ගතෞ, "සෘ" ධාතුව ගමන්හි වේ. පුරඃ සරතීති, ඉදිරියෙහි හැසිරේ නු යි; පුරඃසරඃ "පුරස්සර" නම්. අග්‍රෙ සරතීති, ඉදිරියෙහි හැසිරේ නු යි; අග්‍රෙසරඃ, "අග්‍රෙසර" නම්. ("අග්‍රෙ" යන්නෙහි එදන්තත්වය නිපාතනය කරණු ලැබේ.)

a. (මෙතැන් සිට නැවතත් අප්‍රත්‍යයට උදාහරණ දක්වයි.) පාර්ශ්වෙ ශෙතෙ, පසෙක හොවී නු යි; අසෞ, මෙතෙමේ; පාර්ශ්වශයඃ, "පාර්ශ්වශය" නම්. තථෛව, එසේ ම; පෘෂ්ඨෙ ශෙතෙ, පිටෙහි හොවී නු යි; අසෞ, මෙතෙමේ; පෘෂ්ඨශයඃ, "පෘෂ්ඨශය" නම්. උදරශයඃ, "උදරෙ ශෙතෙ" (=බඩෙහි හොවී) යන වාක්‍යයෙහි "උදරශය" නම්. උත්තානාදිෂු, උත්තානාදී වූ; කර්තෘෂු, කර්තෘන් ඇති කල්හි ද (අප්‍රත්‍යය වේ.) උත්තානඃ

---

* පාර්ශ්වාභ්‍යාම් } පුළුබාධිනී.
† පෘෂ්ඨෙන

**රමතෙ 'සෙ'= ස්තම්බෙරමඃ, හස්තී. ජප- ජල්ප ව්‍යක්තායාං වාචි, කර්ණෙජපඃ. ග්‍රහ උපාදානෙ, ශක්තිං ගෘහ්ණාතීති= ශක්තිග්‍රහඃ. ලාඞ්ගලග්‍රහඃ, පෘෂ්ඨිග්‍රහඃ, අඞ්කුශග්‍රහඃ, තොමර ග්‍රහඃ, ඝටීග්‍රහඃ, ධනුර්ග්‍රහඃ, සූත්‍රග්‍රහඃ, පුෂ්පග්‍රහඃ, ඵලග්‍රහඃ, කාමග්‍රහඃ, මධුරග්‍රහඃ. ශංපූර්වඃ කෘඤ්, ශං සුඛං වා කල්‍යාණං කරොතීති= ශඞ්කරඃ. ශංවදඃ. භාරවහඃ. අත්‍ර කර්මණි අණපි වක්තව්‍යඃ. භාරවාහඃ, ශෛවතවාහඃ, ඉත්‍යාදි.**

---

ශෙතෙ, උඩුකුරු වූයේ හොවී නු යි; අසෞ, මෙතෙමේ; උත්තානශයඃ, "උත්තානශය" නම්. ස්තම්බෙ රමතෙ, ලැහැබෙහි ඇලේ නු යි; අසෞ, මෙතෙමේ; ස්තම්බෙරමඃ, "ස්තම්බෙරම" නම්. හස්තී, ඇත් තෙමේ යි. ("ස්තම්බෙ" යන්නෙහි විභක්තියට ලොප් නො වී ය.) ජප- ජල්ප ව්‍යක්තායාං වාචි, "ජප්- ජල්ප්" ධාතු ද්වය ව්‍යක්ත වචනාර්ථයෙහි වේ. කර්ණෙජපඃ, "කර්ණෙ ජපති" (=කණෙහි හෙවත් කණ සමීපයෙහි කියයි) යන වාක්‍යයෙහි "කර්ණෙජප" නම්. (මෙහි ද උපපද විබත්තට ලොප් නො වේ.) ග්‍රහ උපාදානෙ, "ග්‍රහ්" ධාතුව ගැණිමෙහි වේ. ශක්තිම්, අඩයටිය; ගෘහ්ණාතීති, ගණී නු යි; ශක්තිග්‍රහඃ, "ශක්තිග්‍රහ" නම්. ලාඞ්ගලග්‍රහඃ, 'ලාඞ්ගලං ගෘහ්ණාති' (=නගුල ගණියි) යන වාක්‍යයෙහි "ලාඞ්ගලග්‍රහ" නම්. පෘෂ්ඨිග්‍රහඃ, 'පෘෂ්ඨිං ගෘහ්ණාති' (=පිට ගණී) යන වාක්‍යයෙහි "පෘෂ්ඨිග්‍රහ" නම්. අඞ්කුශග්‍රහඃ, 'අඞ්කුශං ගෘහ්ණාති' (=අකුස්ස ගණියි) යන වාක්‍යයෙහි "අඞ්කුශග්‍රහ" නම්. තොමරග්‍රහඃ, 'තොමරං ගෘහ්ණාති, (=තෝමරය ගණී) යන වාක්‍යයෙහි "තොමරග්‍රහ" නම්. ඝටීග්‍රහඃ, 'ඝටීං ගෘහ්ණාති' (=කළය ගණියි) යන වාක්‍යයෙහි "ඝටීග්‍රහ" නම්. ධනුර්ග්‍රහඃ, 'ධනුර්ගෘහ්ණාති' (=දුන්න ගණී) යන වාක්‍යයෙහි "ධනුර්ග්‍රහ" නම්. (මෙසේ ම,) සූත්‍රග්‍රහඃ, 'සූත්‍රං ගෘහ්ණාති' (=හුය ගණී) යන වාක්‍යයෙහි "සූත්‍රග්‍රහ" යනු ද, පුෂ්පග්‍රහඃ, 'පුෂ්පං ගෘහ්ණාති' (=මල් ගණී) යන වාක්‍යයෙහි "පුෂ්ප ග්‍රහ" යනු ද, ඵලග්‍රහඃ, 'ඵලං ගෘහ්ණාති' (පල ගණී) යන වාක්‍යයෙහි "ඵලග්‍රහ" යනු ද, කාමග්‍රහඃ 'කාමං ගෘහ්ණාති' (=කාමය ගණී) යන වාක්‍යයෙහි "කාමග්‍රහ" යනු ද, මධුරග්‍රහඃ, 'මධුරං ගෘහ්ණාති, (=මිහිරි දෑ ගණියි) යන වාක්‍යයෙහි "මධුරග්‍රහ" යනු ද වේ. ශංපූර්වඃ කෘඤ්, "ශම්" යන්න පූර්ව කොට ඇති "කෘ" ධාතුව වේ. ශම්, "ශම්" සි සේ සි; සුඛං වා, සැපය හෝ; කල්‍යාණම්, යහපත; කරොති ඉති, කෙරේ නු යි; ශඞ්කරඃ, "ශඞ්කර" නම්. ශංවදඃ, 'ශං සුඛං වා කල්‍යාණං වදති' (=සැපය හෝ යහපත කියයි) යන වාක්‍යයෙහි "ශංවද" නම්. භාරවහඃ, 'භාරං වහති' (=බර උසුලයි) යන වාක්‍යයෙහි "භාරවහ" නම්. අත්‍ර, මෙහි; කර්මණි, කර්මයක් උපපද ව ඇති

## 15. ඉඛඛි. (ඉඛඛි 1-3=1-1.)

**a. ධාතොර්නාම්නි කාම්‍යෙ ච සති ඉ- ඛ-ඛි එතෙ ප්‍රත්‍යයා· භවන්ති. ඛකාරඃ ඛිති පදස්‍යෙති සූත්‍රස්‍ය විශෙෂණාර්ථඃ.**

## 16. ඛිති පදස්‍ය. (ඛිති 7-1. පදස්‍ය 6-1.)

**b. ඛිති ප්‍රත්‍යයෙ පරෙ පූර්වපදස්‍යාව්‍යයවර්ජිතස්‍ය මුමා· ගමො භවති. තෙන දෙෂාමන්‍යමහඃ. ආත්මානං දෙෂා· මන්‍යතෙ= තද්දෙෂාමන්‍යම්, අහඃ.**

---

කල්හි; අණ් අපි, ("කාම්‍යෙ'ණ්" යි වන) අණ් ප්‍රත්‍යය ද; වක්තව්‍යඃ,- කිය යුතු යි. භාරවාහඃ, (එකල්හි) "භාරවාහ" යනු වේ. ශ්වෙතවාහඃ,- 'ශ්වෙතං වහති' (=සුදු උසුලයි) යන වාක්‍යයෙහි "ශ්වෙතවාහ" යනු වේ. ඉත්‍යාදි, මේ ආදිය යි.

15. ඉ- ඛ- ඛි ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. පූර්වෝක්ත සූත්‍රවලින් **නාම්නි- කාම්‍යෙ- කර්තරි-ධාතොඃ** යනු අනුවෘත්ත යි. නාම්නි,. නාමයක් හෝ; කාම්‍යෙ, කාමියක් උපපද ව ඇති කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; කර්තරි, කර්තෘ කාරකයෙහි; ඉඛඛි, ඉ- ඛ- ඛි යන ප්‍රත්‍යයෝ වෙත්.

a. නාම්නි, නාමයක් ද; කාම්‍යෙ ච, කාමියක් ද; සති, ඇති· කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; ඉඛඛි එතෙ ප්‍රත්‍යයාඃ, ඉ- ඛ- ඛි· යන මේ ප්‍රත්‍යයෝ; භවන්ති, වෙත්. ඛකාරඃ, ඛකාරය; ඛිති පදස්‍ය· ඉති සූත්‍රස්‍ය, "ඛිති පදස්‍ය" යන සූත්‍රයාගේ; විශෙෂණාර්ථඃ, වෙසෙසා· කිම ප්‍රයෝජන කොට ඇත්තේ ය.

16. මුමාගම විධි සූත්‍ර යි. "මුවාදෙර්මුම්" යි මුම් යනු අනු· වෘත්ත යි. ඛිති, ඛිත් වූ ප්‍රත්‍යය පර කල්හි; පදස්‍ය, පූර්ව පදය සම්බන්ධ ව; මුම්, මුමාගම වේ.

b. ඛිති ප්‍රත්‍යයෙ පරෙ, ඛ යන්න ඉත් කොට ඇති ප්‍රත්‍යය පර කල්හි; අව්‍යය වර්ජිතස්‍ය, අව්‍යයන් විසින් තොර කරණ ලද;· හෙවත් අව්‍යය නුවූ; පූර්වපදස්‍ය, පූර්වපදය සම්බන්ධ ව; මුමාගමඃ භවති, මුම් ආගම වේ. තෙන එහෙයින්; (="අව්‍යය වර්ජිතස්‍ය" යි කී හෙයින්;) "දෙෂාමන්‍යම්= අහඃ" යන තැන්හි මුමාගමය· නො වේ. ආත්මානම්, තමා; දෙෂා මන්‍යතෙ, රාත්‍රිය යි සිතා නු යි, තත්, එය; දෙෂාමන්‍යම්, "දෙෂාමන්‍ය" නම්. අහඃ, දවාල යි. (මතු දක්වනු ලබන "එජාං ඛශ්" යන සූත්‍රයෙන් 'දෙෂා' යන්න· උපපද කොට ඇති 'මන්' ධාතුවෙන් පර ව ඛශ් ප්‍රත්‍යය වීමෙන් "දෙෂාමන්‍ය" යි සිද්ධ යි. ප්‍රත්‍යය ශිත් බැවින් යවිකරණය ද විය. ඛිත් වුවත් "දෙෂා" යන්න අව්‍යයක් බැවින් මුමාගම නො වී ය.)

**2. ශකෘත්ස්තම්බාත් කෘඤඃ ඵලෙ-රජෝමලාද් ග්‍රහො හෘඤඃ, දෘතිනාථාද් දෙවවාතා- දාපඃ කර්ත්‍රි වාච්‍ය ඉඃ.**

**a. වත්සව්‍රීහ්‍යොරෙව. ඩුකෘඤ් කරණෙ, ශකෘත් කරොතිති= ශකෘත්කරිඃ, වත්සඃ. ස්තම්බං කරොතිති= ස්තම්බකරිඃ, ව්‍රීහිඃ. ඵලෙ ගෘහ්ණාතිති= ඵලෙග්‍රහිඃ, වා ඵලානි ගෘහ්ණාතිති= ඵලෙග්‍රහිඃ, වෘක්ෂඃ. ඵලස්‍යෙදන්තත්වං නිපාතනාත්. රජො ගෘහ්ණාතිති= රජෝග්‍රහිඃ. මලග්‍රහිඃ. දෘතිං හරතිති= දෘතිහරිඃ. නාථහරිඃ. ආපෘ ව්‍යාප්තෞ, දෙවාන් ආප්නොතිති= දෙවාපිඃ. වාතම් ආප්නොතිති= වාතාපිඃ.**

---

2. ශකෘත්ස්තම්බාත්, 'ශකෘත් - ස්තම්බ' යන මෙයින් පර වූ; කෘඤඃ, "කෘ" ධාතුහු කෙරෙන් ද; ඵලෙරජෝමලාත්, 'ඵලෙ- රජස්- මල' යන මෙයින් පර වූ; ග්‍රහඃ, "ග්‍රහ්" ධාතුහු කෙරෙන් ද; දෘතිනාථාත්, 'දෘති- නාථ' යන මෙයින් පර වූ; හෘඤඃ, "හෘ" ධාතුහු කෙරෙන් ද; දෙවවාතාත්, 'දෙව- වාත' යන දෙකින් පර වූ; ආපඃ, "ආප්" ධාතුහු කෙරෙන් ද; කර්තරි, කර්තෘ කාරකයෙහි; ඉඃ වාච්‍යඃ, ඉ ප්‍රත්‍යය කිය යුතු යි. (මේ ශ්ලෝකයෙන් "ඉඛඛ්" යන්නෙන් විහිත "ඉ" ප්‍රත්‍යයට ස්ථාන දක්වූහ.)

a. වත්සව්‍රීහ්‍යොඃ එව, වත්ස- ව්‍රීහි අර්ථ දෙක්හි ම (ශකෘත්-ස්තම්බොපපද 'කෘ' ධාතුවෙන් පර ව ඉ ප්‍රත්‍යය) වේ. "ඩුකෘඤ් කරණෙ" යන ධාතුව වේ. ශකෘත් කරොති ඉති, මල පහ කෙරේ නු යි; ශකෘත්කරිඃ, "ශකෘත්කරි" නම්. වත්සඃ, වසු තෙමේ යි. ස්තම්බං කරොති ඉති, ලැහැබක් කෙරේ නු යි; ස්තම්බකරිඃ, "ස්තම්බකරි" නම්. ව්‍රීහිඃ, වී යි. ඵලෙ ගෘහ්ණාතීති, පල ගණී නු යි; ඵලෙග්‍රහිඃ, "ඵලෙග්‍රහි" නම්. වා, නොහොත්; "ඵලානි ගෘහ්ණාතීති= ඵලෙග්‍රහිඃ" කියා හෝ වාක්‍යය වේ. වෘක්ෂඃ; රුක යැ. ඵලස්‍ය, 'ඵල' ශබ්දයාගේ; එදන්තත්වම්, එකාරාන්ත භාවය; නිපාතනාත්, නිපාතනයෙනි. රජඃ ගෘහ්ණාති ඉති, රජස් ගණී නු යි; රජෝග්‍රහිඃ, "රජෝග්‍රහි" නම් වේ. (ස්‍රොර්විසර්ගඃ" යි රජස් ශබ්දයේ සකාරයට විසර්ගය ව "හබෙ" යි ඊට උකාර ව "උ ඔ" යි සන්ධි විය.) මලග්‍රහිඃ, 'මලං ගෘහ්ණාති' (=මල ගණියි) යන වාක්‍යයෙහි "මලග්‍රහි" නම්. දෘතිං හරතීති, චර්මපාත්‍රය ගෙණ යේ නු යි; දෘතිහරිඃ, "දෘතිහරි" නම්. ශුනකයා යි. නාථහරිඃ, 'නාථං හරති '(=ස්වාමියා හෝ නාස් ලනුව ගෙණ යයි) යන වාක්‍යයෙහි "නාථහරි" නම්. සිව්පාවා යි. ආපෘ ව්‍යාප්තෞ, "ආප්" ධාතුව පැතුරුම්හි වේ. දෙවාන් ආප්නොතීති=

**3. කාරීෂකූලසර්වාභ්‍රාත්- කෂඃ ප්‍රියවශාද් වදඃ,**
**ඍතිමෙඝභයාත් කෘඤඃ- ක්‍ෂෙමභද්‍රප්‍රියාත්තු වා.***

**a කෂ නිෂ්කෂෙ, කාරීෂං කෂතීති= කාරීෂඞ්කෂඃ. කාරීෂං ශුෂ්කගොමයමිත්‍යමරඃ. කූලං කෂතීති= කූලංකෂඃ. සර්වං කෂතීති= සර්වඞ්කෂඃ. අභ්‍රං කෂතීති= අභ්‍රඞ්කෂඃ. ඛකාරෙ මුමාගමාර්ථඃ. වද ව්‍යක්තායාං වාචි, ප්‍රියං වදතීති= ප්‍රියංවදඃ. වශංවදඃ. ඍතිං කරොතීති= ඍතිඞ්කරඃ. මෙඝඞ්කරඃ. භයඞ්කරඃ.**

---

දෙවාපිඃ, දෙවියන් පැතිර ගණී නු යි "දෙවාපි" නම්. වාතම් ආප්නොතීති= වාතාපිඃ, වාතය පැතිර ගණී නු යි "වාතාපි" නම්. (මේ ඉප්‍රත්‍යයට උදාහරණ යි.)

3. කාරීෂකූලසර්වාභ්‍රාත්, 'කාරීෂ- කූල- සර්ව- අභ්‍ර' යන මෙයින් පර වූ; කෂඃ, 'කෂ්' ධාතුහු කෙරෙන් ද; ප්‍රියවශාත්, 'ප්‍රිය- වශ' යන මෙයින් පර වූ; වදඃ, 'වද්' ධාතුහු කෙරෙන් ද; ඍතිමෙඝභයාත්, 'ඍති-මෙඝ-භය' යන මෙයින් පර වූ; කෘඤඃ, 'කෘ' ධාතුහු කෙරෙන් ද; (ඛ ප්‍රත්‍යය වේ.) ක්‍ෂෙමභද්‍රප්‍රියාත් තු, 'ක්‍ෂෙම- භද්‍ර- ප්‍රිය' යන මෙයින් පර වූ 'කෘ' ධාතුහු කෙරෙන් වනාහි; වා, විකල්පයෙන් (ඛ ප්‍රත්‍යය වේ. මෙයින් "ඛ" ප්‍රත්‍යයට ස්ථාන දක්වූහ. ඛප්‍රත්‍යය වූ පසු "ඛිති පදස්‍ය" යි මුමාගම ව "නශ්චාපදාන්තෙ ඣසෙ" යි අනුස්වාර ව "යමා යපෙ'ස්‍ය" යි වර්ගාන්තාදෙශ වේ.)

a. කෂ නිෂකාෂේ, "කෂ්" ධාතුව පිරිසිඳීමෙහි වේ. කාරීෂං කෂතීති= කාරීෂඞ්කෂඃ. වියලි ගොම පෙළයි (=විසුරුවයි) යන අර්ථයෙහි "කාරීෂඞ්කෂ" නම්. (සුළඟ යි.) කාරීෂං ශුෂ්කගොමයම් ඉති අමරඃ, කාරීෂ නම් වියලි ගොමය යනු අමරකොෂ යි. කූලං කෂතීති= කූලඞ්කෂඃ, ඉවුර පෙළයි යන අර්ථයෙහි "කූලඞ්කෂ" නම්. (මුහුද යි.) සර්වං කෂතීති= සර්වඞ්කෂඃ, සියල්ල පෙළයි යන අර්ථයෙහි "සර්වඞ්කෂ" නම්. (දුර්ජනයා යි.) අභ්‍රං කෂතීති= අභ්‍රඞ්කෂඃ, මෙඝය පෙළයි යන අර්ථයෙහි "අභ්‍රඞ්කෂ" නම්. (වාතය යි.) ඛකාරඃ, (ප්‍රත්‍යයස්ථ) ඛකාරය; මුමාගමාර්ථඃ, "ඛිති පදස්‍ය" යි 'මුම්' ආගමය ප්‍රයෝජන කොට ඇත්තෝ ය. වද ව්‍යක්තායාං වාචි, "වද්" ධාතුව ව්‍යක්ත වචනයෙහි වේ. ප්‍රියං වදතීති= ප්‍රියංවදඃ, ප්‍රිය තෙපුල් බෙණෙයි යන අර්ථයෙහි "ප්‍රියංවද" නම්. වශංවදඃ, 'වශං වදති' (=මිහිරි තෙපුල් බෙණෙයි)යන වාක්‍යයෙහි "වශංවද" නම්. † ඍතිං කරොතීති= ඍතිංකරඃ, නින්දා කෙරෙයි යන අර්ථයෙහි "ඍතිඞ්කර" නම්. මෙඝඞ්කරඃ, 'මෙඝං කරොති' (=මෙඝය කෙරෙයි) යන වාක්‍ය

---

* ක්‍ෂෙමප්‍රියමද්‍රාත් කෘඤා- මුග්ධබොධ.

† "ස්පර්ධායාමපි නින්දායා- මශුභෙ ගමනෙ ක්‍රියාම්,
කාලුෂ්‍යාවර්ත්මනොශ්චෛව- ඍතිරිත්‍යභිධීයතෙ."

විකල්ප පක්ෂෙ කාශේ අණ්. ක්ෂෙමං කරොතීති= ක්ෂෙමඞ්කරඃ- ක්ෂෙමකාරඃ. භද්‍රං කරොතීති= භද්‍රඞ්කරඃ- භද්‍රකාරඃ.* ප්‍රියං කරොතීති= ප්‍රියඞ්කරඃ- ප්‍රියකාරඃ.

4. ආශිතාච්ච භුවො භාවෙ- කාරණෙ ච තුරග් භුජාත්,
විහායසඃ සුතොරොභ්‍යාං- හෘදයාච්ච ජනාත් ප්ලවාත්,

5. ගච්ඡතෙඃ ප්‍රත්‍යයඃ ඛඃ ස්‍යාද්- හෘඤො ඛාතොස්තු ඛිර්භවෙත්.
ආත්මන්කුක්ෂ්‍යුදරෙභ්‍යඃ ස්‍යු- ස්තථා වාචංයමාදයඃ.

---

යෙහි "මෙඝඞ්කර" නම්. භයඞ්කරඃ, 'භයං කරොති' (=බිය කෙරෙයි) යන වාක්‍යයෙහි "භයඞ්කර" නම්. විකල්ප පක්ෂෙ, විකල්ප පක්ෂ යෙහි; (="ක්ෂෙමභද්‍රප්‍රියාන්තු වා" යි කී හෙයින් ඛප්‍රත්‍යය නො වන පක්ෂයෙහි;) කාශේ අණ්, කර්මය උපපද ව ඇති කල්හි "කාශේ'ණ්" යි අණ් ප්‍රත්‍යය වේ. ක්ෂෙමං කරොතීති, යහපත හෝ මිදීම කෙරෙයි යන අර්ථයෙහි; ක්ෂෙමඞ්කරඃ- ක්ෂෙමකාරඃ, ඛ ප්‍රත්‍යය වීමෙන් "ක්ෂෙමඞ්කර" යනු ද- අණ් ප්‍රත්‍යය වීමෙන් "ක්ෂෙමකාර" යනු ද වේ. භද්‍රං කරොතීති, යහපත කෙරෙයි යන අර්ථයෙහි; භද්‍රඞ්කරඃ- භද්‍රකාරඃ, "භද්‍රඞ්කර" යනු ද- "භද්‍රකාර" යනු ද වේ. ප්‍රියං කරොතීති, ප්‍රිය කෙරෙයි යන අර්ථයෙහි; ප්‍රියඞ්කරඃ- ප්‍රිය කාරඃ, "ප්‍රියංකර" යනු ද- "ප්‍රියකාර" යනු ද වේ.

4-5. ආශිතාත්, ආශිත ශබ්දයෙන් පර වූ; භුවඃ, 'භූ' ධාතුහු කෙරෙන්; භාවෙ, භාව කාරකයෙහි ද; කරණෙ ච, කරණ කාරකයෙහි ද; (එසේ ම) තුරාත්, තුර ආදෙශයෙන් ද; භුජාත්, භුජ ශබ්දයෙන් ද; විහායසඃ, විහායස් ශබ්දයෙන් ද; සුතොරොභ්‍යාම්, සුත- උරස් ශබ්ද දෙකින් ද; හෘදයාත්, හෘදය ශබ්දයෙන් ද; ජනාත්, ජන ශබ්දයෙන් ද; ප්ලවාත්, ප්ලව ශබ්දයෙන් ද පර වූ; ගච්ඡතෙඃ ච, 'ගම්' ධාතුහු කෙරෙන් ද; ඛඃ ප්‍රත්‍යයඃ ස්‍යාත්, ඛ ප්‍රත්‍යය වන්නේ ය. ආත්මන්කුක්ෂ්‍යුදරෙභ්‍යඃ, ආත්මන්- කුක්ෂි- උදර ශබ්දයන් කෙරෙන් පර වූ; හෘඤඃ ධාතොඃ තු, 'හෘ' ධාතුහු කෙරෙන් වනාහි; ඛිඃ භවෙත්, ඛි ප්‍රත්‍යය වන්නේ ය. තථා, එසේ ම; වාචංයමාදයඃ, 'වාචංයම' ශබ්දාදීහු ද; ස්‍යුඃ, වන්නාහ. (මේ ශ්ලොක දෙකින් ඛප්‍රත්‍යයට හා ඛිප්‍රත්‍යයට ස්ථාන දක්වා 'වාචංයම' ශබ්ද දිය නිපාතනය වන බව ද කීහ. මෙහි කී 'තුර' ආදෙශය නම් "විහායසො විහශ්ච" යන්නෙහි චශබ්ද බලයෙන් තරස් ශබ්දයට වන තුර ආදෙශය යි.)

---

* මද්‍රඞ්කරඃ= මද්‍රකාරඃ- මූ: බො:

**a.** ආශිතෙන භූයතෙ ඉති= ආශිතම්භවම්. භාවෙ නපුංසකතා වාච්‍යා. ආශිතො භවත්‍යනෙනෙති= ආශිතම්භවඃ, ඔදනඃ. තරසා ගච්ඡතීති=* තුරඞ්ගමඃ. භුජඞ්ගමඃ, විහඞ්ගමඃ, සුතඞ්ගමඃ, උරඞ්ගමඃ, හෘදයඞ්ගමඃ, ජනඞ්ගමඃ, ප්ලවෙන ගච්ඡතීති= ප්ලවඞ්ගමඃ.

**b.** ඩුභෘඤ් ධාරණපොෂණයොඃ, ආත්මානං බිභර්තීති= ආත්මම්භරිඃ. කුක්ෂිම්භරිඃ. උදරම්භරිඃ. ලුප්තවිභක්තිකත්ව පදාන්තත්වං විඥෙයම්.

---

a. ආශිතෙන, වලඳවන ලද්දහු විසින්; භූයතෙ ඉති, වීම ය යන අර්‍ථයෙහි; ආශිතම්භවම්, "ආශිතම්භව" නම්. භාවෙ, භාවයෙහි, නපුංසකතා, නපුංසකලිඞ්ග බව; වාච්‍යා, කිය යුතු යි. අනෙන, මේ කාරණ කොට ගෙණ; ආශිතඃ භවති ඉති, වලඳවන ලද්දේ වෙයි යන අර්‍ථයෙහි; ආශිතම්භවඃ, "ආශිතම්භව" නම්. ඔදනඃ, බත යි. (යම් පමණ භොජනයකින් ආගන්තුකාදීහු වලඳවනු ලැබෙද්ද, ඒ භොජනය "ආශිතම්භව" ය යි කියනු ලැබේ.) තරසා ගච්ඡතීති= තුරඞ්ගමඃ. වේගයෙන් යේ නු යි "තුරඞ්ගම" නම්. (තරස් ශබ්දයට "තුර" ආදෙශ යි.) භුජඞ්ගමඃ, 'භුජං වක්‍රං ගච්ඡති' (=වක් ව යෙයි) යන වාක්‍යයෙහි "භුජඞ්ගම" නම්. විහඞ්ගමඃ, 'විහායසි ආකාශෙ ගච්ඡති' (=අහසෙහි යෙයි) යන වාක්‍යයෙහි "විහඞ්ගම" නම්. ("විහායසො විහශ්ච" යි විහායස් ශබ්දයට "විහ" ආදෙශ යි.) සුතඞ්ගමඃ, 'සුතං ගච්ඡති' (=පුතා කරා යෙයි) යන වාක්‍යයෙහි "සුතඞ්ගම" නම්. උරඞ්ගමඃ, උරසා ගච්ඡති (=ලෙන් යයි) යන වාක්‍යයෙහි "උරඞ්ගම" නම්. ("උරසඃ සලොපශ්ච" යි උරස් ශබ්දයේ සකාරයට ලොප් ද විය.) හෘදයඞ්ගමඃ, 'හෘදයං ගච්ඡති' (=ළයට යෙයි) යන වාක්‍යයෙහි "හෘදයඞ්ගම" නම්. ජනඞ්ගමඃ, 'ජනං ගච්ඡති' (=ජනයා කරා යෙයි) යන වාක්‍යයෙහි "ජනඞ්ගම" නම්. (සැඬොල් තෙමේ යි.) පලවෙන ගච්ඡතීති= පලවඞ්ගමඃ, පැනීමෙන් යයි යන අර්‍ථයෙහි "පලවඞ්ගම" නම්. (මෙතෙක් ඛ ප්‍රත්‍යයට උදාහරණ දක්වූහ.)

b. "ඩුභෘඤ් ධාරණපොෂණයොඃ" යන ධාතු යි. ආත්මානං බිභර්තීති= ආත්මම්භරිඃ, තමන් පොෂණය කෙරෙයි යන අර්‍ථයෙහි "ආත්මම්භරි" නම්. (මුමාගම වූ පසු "සංයොගාන්තස්‍ය ලොපඃ" යි ආත්මන් ශබ්දයාගේ නකාරයට ලොප් වේ ය යි සුබොධිනියෙහි කීහ. එහෙත් "නාම්නො නො ලොපශධෞ" යන්නෙන් නකාරයට

---

* තුරං ගච්ඡතීති- පොත්හි.

4. අතඃ පරං වාචංයමාත් කථයති. වාචංයමාදයො නිපාත්‍යාඃ. වාචං යච්ඡතීති= වාචංයමඃ. අත්‍ර අකාරෙ නිපාත්‍යතෙ. දෘ විදාරණෙ, පුරං දාරයතීති= පුරන්දරඃ. තප සන්තාපෙ, ද්විෂං තාපයතීති= ද්විෂන්තපඃ. පරන්තපඃ. සර්වං සහතෙ 'සෙ= සර්වංසහඃ. විශ්වං බිභර්තීති= විශ්වම්භරඃ. භගං දාරයතීති= භගන්දරඃ. තෘ ප්ලවනතරණයොඃ, රථං * තරතීති= රථන්තරඃ.

ලොපය් වූ පසු මූමාගම වීම මෙහි යුක්තිය යි. මුග්ධබොධ පිකා ආදිය බලනු.) කුක්ෂිම්භරිඃ, 'කුක්ෂිං බිභර්ති' (=බඩ පොෂණය කෙරෙයි) යන වාක්‍යයෙහි "කුක්ෂිම්භරි" නම්. උදරම්භරිඃ, 'උදරං බිභර්ති, යන වාක්‍යයෙහි "උදරම්භරි" නම්. (මේ ඛිප්‍රත්‍යයට නිදර්ශන යි.) ලුප්තවිභක්තෙඃ ච, ලුප්තවිභක්ති (=ලොප් කළ විබත් ඇත්ත) හුගේ ද; පදාන්තත්වම්, පදාන්ත බව; විධෙයම් දත යුතු යි.

("ආත්මානං බිභර්ති" යන තැන්හි විභක්ති ලොපය වූ පසු ආත්මන් යන්නෙහි නකාරය පදාන්ත වශයෙන් සලකා "නාම්නො නො ලොපශධෞ" යන්නෙන් ලොපය් කරණු සඳහා මෙය කියන ලදී. එසේ ම 'වශංවදඃ– වාචංයමඃ' යනාදියෙහි ද මූමාගමය පිළිබඳ මකාරයට "නශ්චාපදාන්තෙ ඣලෙ" යි අනුස්වාරය නො කට හැකි බැවින් ලුප්තවිභක්තික උපපදයෙහි පදාන්ත භාවය සලකා "මො 'නුස්වාරඃ" යි අනුස්වාරය කරණු ලැබේ.)

4, අතඃ පරම්, මින් පසු; වාචංයමාත්, වාචංයම ශබ්දදිය; කථයති, කියයි. (බහුවචනය ආදෘථ යි.) වාචංයමාදයඃ, වාචංයමාදීහු; නිපාත්‍යාඃ, නිපාතනය කට යුත්තාහ. වාචං යච්ඡතීති= වාචංයමඃ, වචනය වළක්වා නු යි "වාචංයම" නම්. (මෞනව්‍රත ඇත්තේ යි. ගොළු බැවි ආදියෙන් කථා නො කරන්නේ "වාචංයම" නො වේ. එහි "කර්මණ්‍යණ්" යි අණ් ප්‍රත්‍යය වීමෙන් "වාචං යච්ඡතීති= වාග්‍යාමඃ" යි වේ.) අත්‍ර, මෙහි; අකාරඃ, ("වාච්" ශබ්දාන්ත) අකාරය; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ. දෘ විදාරණෙ, 'දෘ' ධාතුව පැළීමෙහි වේ. පුරං දාරයතීති= පුරන්දරඃ, නගරය බිඳුවයි යන අර්ථයෙහි "පුරන්දර" නම්. ("පුර්" ශබ්දයාගේ අන්තයට ද නිපාතනයෙන් අකාරයෙක් වේ. පුර් ශබ්දපපද 'දෘ භයෙ– දෘඞ් ආදරෙ' යන ධාතු වලින් ද මෙසේ සිද්ධ කට හැකි නමුත් එසේ ගැණීම සම්ප්‍රදාය විරුද්ධ ය.) තප සන්තාපෙ, "තප්" ධාතුව තැවීමෙහි වේ. ද්විෂං තාපයතීති= ද්විෂන්තපඃ, සතුරා තවයි යන අර්ථයෙහි "ද්විෂන්තප"

* 'රථෙන්තා' යනු නම් මැනවි.

**වෘඤ් වරණෙ, පතිං වෘණොති වා වෘණුතෙ සා= පතිංවරා. ජි ජයෙ, ධනං ජයතීති= ධනඤ්ජයඃ. ධෘඤ් ධාරණෙ, වසූනි වා වසු ධරති වා ධරතෙ 'සෞ= වසුන්ධරා. ශත්‍රූං සහතෙ 'සෞ= ශත්‍රුංසහඃ. අරිං දම්‍යතීති= අරින්දමඃ. ශත්‍රුන්තපඃ. එතෙ වාචංයමාදයඃ.**

## 17. **එජාං ඛශ්.** (එජාම් 6-3. ඛශ් 1-1.)

---

නම්. (මෙහි ද "ද්විෂ්" ශබ්දාන්තයෙහි අකාරය නිපාතනයෙන් වේ. "ද්විෂත්" ශබ්දෝපපද 'තප්' ධාතුවෙන් පර ව ඛප්‍රත්‍යය ව මුමාගම වූ පසු "සංයොගාන්තස්‍ය ලොපඃ" යි තකාර ලොපයෙන් "ද්විෂන්තප" ශබ්දය නිෂ්පන්න ය යි සුබොධිනියෙහි කීහ. **ද්විෂන්තං තාපයති** යනු එහි වාක්‍යය යි.) පරන්තපඃ, 'පරං තාපයති' (=සතුරු තවයි) යන වාක්‍යයෙහි "පරන්තප" නම්. සර්වං සහතෙ, සියල්ල ඉවසා නු යි; අසෞ, මෙතෙමේ; සර්වංසහඃ, "සර්වංසහ" නම්. විශ්වං බිභර්තීති= විශ්වම්භරඃ, සියල්ල උසුලයි යන අර්ථයෙහි "විශ්වම්භර" නම්. භගං දරයතීති= භගන්දරඃ, භගය බිඳියි යන අර්ථයෙහි "භගන්දර" නම්. (එනම් රෝගය යි. භග නම් මල- මූත්‍ර දෙමගට අතර පෙදෙස යි.) තෘ ප්ලවනතරණයොඃ, "තෘ" ධාතුව පැනීම- එතෙර වීම යන අර්ථ දෙක්හි වේ. රථං තරතීති= රථන්තරඃ, රිය- එතෙර කෙරෙයි යන අර්ථයෙහි "රථන්තර" නම්. වෘඤ් වරණෙ, "වෘ" ධාතුව වරණාර්ථයෙහි වේ. පතිං වෘණොති, ස්වාමියෙකු කැමති වේ නු යි; සා, ඕ තොමෝ; පතිංවරා, "පතිංවරා" නමු. වෘණුතෙ වා, "පතිං වෘණුතෙ" කියා ආත්මනෙපදයෙන් හෝ වාක්‍යය වේ. ("ආඛ්‍යාතඃ සත්‍රියාම්" යි ආප් ප්‍රත්‍යය වේ.) ජි ජයෙ, "ජි" ධාතුව දිනීමෙහි වේ. ධනං ජයතීති= ධනඤ්ජයඃ, ධනය දිනයි යන අර්ථයෙහි "ධනඤ්ජය" නම්. ධෘඤ් ධාරණෙ, "ධෘ" ධාතුව දැරීමෙහි වේ. වසූනි වා, වස්තූන් හෝ; වසු, වස්තුව; ධරති, දරයි යන අර්ථයෙහි; අසෞ, මෝතොමෝ; වසුන්ධරා, "වසුන්ධරා" නමු. ධරතෙ වා, "වසූනි වා වසු ධරතෙ" කියා ආත්මනෙපද වශයෙන් හෝ වාක්‍යය වේ. ශත්‍රූං සහතෙ, සතුරු ඉවසයි යන අර්ථයෙහි; අසෞ, මෙතෙමේ; ශත්‍රුංසහඃ, "ශත්‍රුංසහ" නම්. අරිං දම්‍යතීති= අරින්දමඃ, සතුරු දමනය කෙරෙයි යන අර්ථයෙහි "අරින්දම" නම්. ශත්‍රුන්තපඃ, 'ශත්‍රුං තාපයති' (=සතුරු තවයි) යන වාක්‍යයෙහි "ශත්‍රුන්තප" නම්. එතෙ, මොහු; වාචංයමාදයඃ, වාචංයමාදි ශබ්දයෝ ය. (ඛ ප්‍රත්‍යය වීමෙන් හා නිපාතනයෙන් සිද්ධයහ.)

**a.** **එජෘ කම්පනෙ ඉත්‍යාදීනාං ඛශ් ප්‍රත්‍යයො භවති. ඛකාරෙ මුමාගමාර්ථඃ. ශකාරඃ “ශිති චතුර්ථීත්” කාර්‍ය්‍යාර්ථඃ. “ධාතොඃ ප්‍රේරණෙ” ඉති ණිප්‍රත්‍යයඃ. ජනාන් එජයතීති= ජනමෙජයඃ.**

**6.** **ණ්‍යන්තෛජෙර්මන්‍යතෙර්මූර්ධ- කූලාස්‍යපුෂ්පතො ධයෙඃ, නාඩීමුෂ්ටිශුනීපාණි- කරස්තනාත්සනාසිකාත්.**

**b.** **මනු අවබොධනෙ, “දිවාදෙර්‍යඃ” ආත්මානං පණ්ඩිතං මන්‍යතෙ ස පණ්ඩිතම්මන්‍යඃ. ධෙට් පානෙ, මූර්ධං ධයතීති=**

---

17\. ඛශ් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **කර්ත්තරි- නාම්නි- කාර්‍ය්‍යෙ** යනු ද, වි: ව: වි: වශයෙන් **ධාතූනාම්** යනු ද අනුවෘත්ත යි. නාම්නි, නාමයක් හෝ; කාර්‍ය්‍යෙ, කර්මයක් උපපද ව ඇති කල්හි; එජාං ධාතූනාං, 'එජ්' ආදි ධාතූන් සම්බන්ධ ව, කර්ත්තරි, කර්තෘ කාරකයෙහි; ඛශ්, ඛශ් ප්‍රත්‍යය වේ. (මෙහි “එජාම්” යන බහුවචනය ආද්‍යර්ථ යි.)

a. එජෘ කම්පනෙ ඉත්‍යාදීනාම්, “එජෘ කම්පනෙ” යනාදි ධාතූන් සම්බන්ධ ව; ඛශ් ප්‍රත්‍යයඃ භවති, ඛශ් ප්‍රත්‍යය වේ. ඛකාරඃ, ඛකාරය; මුමාගමාර්ථඃ, මුමාගමය ප්‍රයෝජන කොට ඇත්තේ ය. ශකාරඃ, ශකාරය; ශිති චතුර්ථීත් කාර්‍ය්‍යාර්ථඃ, “ශිති චතුර්ථීත්” යන සූත්‍රයෙහි කාර්‍ය්‍යය ප්‍රයෝජන කොට ඇත්තේ ය. ධාතොඃ ප්‍රේරණෙ ඉති, “ධාතොඃ ප්‍රේරණෙ” යන සූත්‍රයෙන්; ණිප්‍රත්‍යයඃ, ණි ප්‍රත්‍යය වේ. ජනාන් එජයතීති= ජනමෙජයඃ, ජනයන් කම්පිත කෙරෙයි යන අර්ථයෙහි “ජනමෙජය” නමි.

6\. ණ්‍යන්ත එජෙඃ, ණි ප්‍රත්‍යයාන්ත වූ 'එජ්' ධාතුහු කෙරෙන් ද; මන්‍යතෙඃ, 'මන්' ධාතුහු කෙරෙන් ද; මූර්ධකූලාස්‍යපුෂ්පතඃ, මූර්ධ- කූල- ආස්‍ය- පුෂ්ප යන ශබ්දයන්ගෙන් පර වූ ද; සනාසිකාත්, නාසිකා ශබ්දය සහිත වූ; නාඩී— ස්තනාත්, 'නාඩී- මුෂ්ටි- ශුනී- පාණි- කර- ස්තන' යන මෙයින් පර වූ ද; ධයෙඃ, 'ධෙ' ධාතුහු කෙරෙන් ද; (ඛශ් ප්‍රත්‍යය වේ.) (ණ්‍යන්ත 'එජ්- මන්' මූර්ධාද්‍යුපපද 'ධෙ' යන ධාතු ත්‍රයයෙන් පර ව ඛශ් ප්‍රත්‍යය වන බව මෙයින් කීහ. ඉක්බිති උදාහරණ දක්වත්.)

b. මනු අවබොධනෙ, 'මන්' ධාතුව අවබොධ කිරීමෙහි ය. “දිවාදෙර්‍යඃ” යන සූත්‍රයෙන් යවිකරණය වේ. (“අදෙ” යි යකාරස්ථ අකාරයට ලොප් වේ.) ආත්මානං පණ්ඩිතං මන්‍යතෙ, තමා පණ්ඩිතයෙකු කොට සිතා නු යි; සඃ, හෙතෙමේ; පණ්ඩිතම්මන්‍යඃ,

**මුඤ්ජන්ධයඃ, කූලන්ධයඃ, ආස්‍යන්ධයඃ, පුෂ්පන්ධයඃ. ධ්මාධෙටොඃ සතුල්‍යොපපදත්වං ඥෙයම්. ධ්මා ශබ්දාග්නි සංයොගයොඃ, නාඩීං ධයතීති= නාඩින්ධයඃ- නාඩින්ධමඃ. ඛශන්තෙ පූර්ව පදස්‍ය හ්‍රස්වො වාච්‍යඃ. මුෂ්ටින්ධයඃ- මුෂ්ටින්ධමඃ. ශුනින්ධයඃ- ශුනින්ධමඃ. පාණින්ධයඃ-පාණින්ධමඃ. ඛාරන්ධයඃ- ඛාරන්ධමඃ. ස්තනන්ධයඃ- ස්තනන්ධමඃ. නාසිකාං ධයතීති= නාසිකන්ධයඃ-නාසිකන්ධමඃ.**

---

"පණ්ඩිතම්මන්‍ය" නම්. ධෙට් පානෙ, ටනුබන්ධ "ධෙ" ධාතුව බීමෙහි ය. මුඤ්ජං ධයතීති= මුඤ්ජන්ධයඃ, මුදු තණ බොයි (=ලොවියි) යන අර්ථයෙහි "මුඤ්ජන්ධය" නම්. ("එ අය්" යි එකාරයට 'අය්' ආදෙශ වේ.) කූලන්ධයඃ, 'කූලං ධයති' (=ඉවුර ලොවියි) යන වාක්‍යයෙහි "කූලන්ධය" නම්. ආස්‍යන්ධයඃ, 'ආස්‍යං ධයති' (=මුව බොයි) යන වාක්‍යයෙහි "ආස්‍යන්ධය" නම්. පුෂ්පන්ධයඃ, 'පුෂ්පං ධයති' (=මල් පැනි බොයි) යන වාක්‍යයෙහි "පුෂ්පන්ධය" නම්, ධ්මාධෙටොඃ, ධ්මා- ධෙට් යන ධාතු දෙදෙනාගේ; තුල්‍යොපපදත්වම්, සමාන උප පද ඇති බව; ඥෙයම්, දත යුතු යි. (එහෙයින් 'ධෙට්' ධාතුවට කී උපපද කොරෙන් ම 'ධ්මා' ධාතුව ද යෙදී ඉන් පර ව ඛශ් ප්‍රත්‍යය වේ.) ධ්මා ශබ්දාග්නි සංයොගයොඃ, "ධ්මා" ධාතුව ශබ්ද සංයොග- අග්නි සංයොග දෙක්හි වේ. නාඩීං ධයතීති= නාඩින්ධයඃ, නළ බොයි (=නළයෙන් දිය ආදිය බොයි) යන අර්ථයෙහි "නාඩින්ධය" නම්. නාඩින්ධමඃ, 'නාඩීං ධමති' (=නළ හෙවත් වස් දඬු පිඹියි) යන වාක්‍යයෙහි "නාඩින්ධම" නම්. ("දෘශාදෙඃ පශ්‍යාදිඃ" යි ධ්මා ධාතුහට "ධම" ආදෙශ වේ.)

ඛශන්තෙ, ඛශ් ප්‍රත්‍යයාන්තයා පර කල්හි; පූර්ව පදස්‍ය, පූර්ව පද යට; හ්‍රස්වඃ වාච්‍යඃ, හ්‍රස්වය කිය යුතු යි. (නාඩී- ශුනී- යනාදි දීර්ඝ ස්වරාන්ත පූර්ව පදයන්ට හ්‍රස්ව වන බව මෙයින් දැක්වූහ. "**ඛශන්තෙ පූර්වපදස්‍යානව්‍යයස්‍ය හ්‍රස්වඃ**" යි **සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි** කී හෙයින් පූර්ව පද වූ අව්‍යයන්ට මේ හ්‍රස්වය නො වේ. **දිවාමන්‍යා= රාත්‍රිඃ, දොෂාමන්‍යම්=** අහඃ යනාදිය ඊට උදාහරණ යි.) මුෂ්ටින්ධයඃ, 'මුෂ්ටිං ධයති' (=මිට බොයි) යන වාක්‍යයෙහි "මුෂ්ටින්ධය" නම්. මුෂ්ටින්ධමඃ, 'මුෂ්ටිං ධමති' (=මිට පිඹියි) යන වාක්‍යයෙහි "මුෂ්ටින්ධම" නම්. ශුනින්ධයඃ, 'ශුනීං ධයති' (=බැල්ලගෙන් කිරි බොයි) යන වාක්‍යයෙහි "ශුනින්ධය" නම්. ශුනින්ධමඃ, 'ශුනීං ධමති' (=ශුනීස්තනය පිඹියි) යන වාක්‍යයෙහි "ශුනින්ධම" නම්. පාණින්ධයඃ, 'පාණිං ධයති' (=අල්ල බොයි) යන වාක්‍යයෙහි "පාණින්ධය" නම්. පාණින්ධමඃ, 'පාණිං ධමති' (=අල්ල පිඹියි) යන වාක්‍යයෙහි "පාණින්ධම" නම්. 'ඛාරං ධයති' යන වාක්‍යයෙහි "ඛාරන්ධය" නම් ද- 'ඛාරං ධමති' යන වාක්‍යයෙහි "ඛාරන්ධම" නම් ද වේ (එම අර්ථ යි.)

7. ධ්මාඛාරීවාතඝටීභ්‍යො- රුජවහෙභ්‍ය තු කූලතඃ,
අරුර්විධුතිලාත්තුදඃ ස්‍යා- දසූර්‍යොග්‍රාද් * දෘශිස්තපිඃ.

8. ලලාටතො වහාභ්‍රාල්ලිහ්- මිතමානනඛාත් පචිඃ,
වාතාදජිරිරයාම්මද්- ජහාතිඃ ශර්ධතස්තථා.

a. ඛාරිං ධමතීති= ඛාරින්ධමඃ. වාතන්ධමඃ, ඝටින්ධමඃ. රුජො භඞ්ගෙ, වහ ප්‍රාපණෙ, උත්පූර්වඃ. කූලමුද්‍රුජතීති= කූල මුද්‍රුජඃ. කූලමුද්වහතීති= කූලමුද්වහඃ. අරුඃ මර්මස්ථානම්. අරුස්තුදතීති= අරුන්තුදඃ. විධුන්තුදඃ. තිලන්තුදඃ. දෘශිර්

---

ස්තනන්ධයඃ, 'ස්තනං ධයති' (=තනය බොයි) යන වාක්‍යයෙහි "ස්තනන්ධය" නමි. ස්තනන්ධමඃ, 'ස්තනං ධමති' (=තනය පිඹියි) යන වාක්‍යයෙහි "ස්තනන්ධම" නමි. නාසිකාං ධයතීති= නාසිකන්ධයඃ, නැහැය බොයි යන අර්ථයෙහි "නාසිකන්ධය" නමි. නාසිකන්ධමඃ, 'නාසිකාං ධමති' (=නැහැය පිඹියි) යන වාක්‍යයෙහි "නාසිකන්ධම" නමි. (පෙර සේ හ්‍රස්ව විය.)

7–8. ඛාරීවාතඝටීතඃ, ඛාරී- වාත- ඝටී ශබ්දයන් කෙරෙන් පර ව; ධ්මා, ධ්මා ධාතුව ද; කූලතඃ, කූල ශබ්දයා කෙරෙන් පර ව; රුජවහෙභ්‍ය තු, රුජ්- වහ ධාතු දෙක ද; අරුර්විධුතිලාත්, අරුස්- විධු- තිල යන මෙයින් පර ව; තුද්, තුද් ධාතුව ද; අසූර්‍යෝග්‍රාත්, අසූර්‍ය- උග්‍ර යන මෙයින් පර ව; දෘශිඃ, දෘශ් ධාතුව ද; ලලාටතඃ, ලලාට ශබ්දයෙන් පර ව; තපිඃ, තප් ධාතුව ද; වහාභ්‍රාත්, වහ- අභ්‍ර යන මෙයින් පර ව; ලිහ්, ලිහ් ධාතුව ද; මිතමානනඛාත්, මිත- මාන- නඛ යන මෙයින් පර ව; පචිඃ, පච් ධාතුව ද; වාතාත්, වාත ශබ්දයෙන් පර ව; අජිඃ, අජ් ධාතුව ද; ඉරයාඃ, ඉරා ශබ්දයෙන් පර ව; මද්, මද් ධාතුව ද; තථා, එසේ ම; ශර්ධතඃ, ශර්ධ ශබ්දයෙන් පර ව; ජහාතිඃ, හා ධාතුව ද; ස්‍යාත්, වන්නේ ය. (මේ ශ්ලොක ද්වයයෙන් ද ඛශ් ප්‍රත්‍යයට ස්ථාන දක්වූහ. යථොක්ත උපපදයන් කෙරෙන් පර වූ ඒ ඒ ධාතූන් කෙරෙන් ඛශ් ප්‍රත්‍යය වන බව එයින් උගන්වත්. ඉක්බිති උදාහරණ දක්වත්.)

a. ඛාරිං ධමතීති= ඛාරින්ධමඃ, කිරිය පිඹියි යන අර්ථයෙහි "ඛාරින්ධම" නමි. (හ්‍රස්වය පෙර කී පරිදි යි.) වාතන්ධමඃ, වාතං ධමති (=වාතය පිඹියි) යන වාක්‍යයෙහි "වාතන්ධම" නමි. ඝටින්ධමඃ,

---

* අසූර්‍යොග්‍රාද්දෘශිස්තපිඃ- පොත්හි.

**ප්‍රෙක්‍ෂණෙ, න සූය්‍යීං පශ්‍යන්තීති= අසූය්‍යීම්පශ්‍යාඃ, රාජදාරාඃ. උග්‍රම්පශ්‍යඃ. ලලාටන්තපඃ. ලිහ ආස්වාදනෙ, වහං ලෙඪීති= වහංලිහඃ. අභ්‍රංලිහඃ. මිතං පචතීති= මිතම්පචඃ. ප්‍රස්ථම්පචඃ, මානම්පචඃ. * නඛම්පචඃ. අජ ගතෞ ක්‍ෂෙපණෙ ච, වාතමජතීති= වාතමජඃ. මදි හර්ෂග්ලපනයොඃ, ඉරයා මාද්‍යතීති= ඉරම්මදඃ. ඔහාක් ත්‍යාගෙ, ශර්ධං ජහතීති= ශර්ධඤ්ජහාඃ, මාෂාඃ. ඉති ඛශ් ප්‍රත්‍යයඃ.**

---

'ඝටීං ධමති' (=කළය පිඹියි) යන වාක්‍යයෙහි "ඝටින්ධම" නමි. (ධමා ධාතුවට 'ධම' ආදෙශ යි.) රුජො භඞ්ගෙ, ඔකාර ඉත් කොට ඇති "රුජ්" ධාතුව බිඳීමෙහි වේ; වහ ප්‍රාපණෙ, "වහ්" ධාතුව පැමිණීමෙහි වේ. උත්පූර්‍වඃ, 'උද්' උපසර්‍ගය පෙරටු කොට ඇත්තේ ය. කූලමුද්‍රුජතීති= කූලමුද්‍රුජඃ, ඉවුර බිඳියි යන අර්‍ථයෙහි "කූලමුද්‍රුජ" නමි. කූලමුද්වහතීති= කූලමුද්වහඃ, ඉවුර උසුලයි (=ඉවුර බිඳ ගෙණ යෙයි) යන අර්‍ථයෙහි "කූලමුද්වහ" නමි. අරුඃ මර්‍මස්ථා නම්, "අරුස්" නම් මරු තැන යි. (දුබල පහරකින් පවා ජීවිත හානිය කළ හැකි ස්ථාන "මර්‍මස්ථාන" නමි.) අරුඃ තුදතීති= අරුන්තුදඃ, මරු තැන් පෙළයි යන අර්‍ථයෙහි "අරුන්තුද" නමි. (මුමාගම වූ පසු "සංයොගාන්තස්‍ය ලොපඃ" යි සකාරයට ලොප් වේ.) විධුන්තුදඃ, 'විධුං තුදති' (=සඳ පෙළයි) යන වාක්‍යයෙහි "විධුන්තුද" නමි. තිලන්තුදඃ, 'තිලං තුදති' (=තල පෙළයි) යන වාක්‍යයෙහි "තිලන්තුද" නමි. දෘශිර් ප්‍රෙක්‍ෂණෙ, ඉරනුබන්ධ "දෘශ්" ධාතුව දැකීමෙහි වේ. න සූය්‍යීං පශ්‍යන්තීති, හිරු නො දකිත් නු යි; අසූය්‍යීම්පශ්‍යාඃ, "අසූය්‍යීම්පශ්‍ය" නම් වෙත්. රාජදාරාඃ, රාජභාය්‍යීාවෝ යි. (නඤ් නිපාතනයෙන් සූය්‍යී ශබ්දය අනපෙක්‍ෂිත වුව ද අයුක්තාර්‍ථ වශයෙන් සමාසය විය.) උග්‍රම්පශ්‍යඃ, 'උග්‍රං පශ්‍යති' (=රෞද්‍ර ලෙස හෝ තියුණු ලෙස බලයි) යන වාක්‍යයෙහි "උග්‍රම්පශ්‍ය" නමි. ලලාටන්තපඃ, 'ලලාටං තපති' (=නළල තවයි) යන වාක්‍යයෙහි "ලලාටන්තප" නමි. ලිහ ආස්වාදනෙ, "ලිහ්" ධාතුව රස විඳ ගැන්මෙහි වේ. වහං ලෙඪීති= වහංලිහඃ, ගොණුගේ කද හෝ අසු ලොවී නු යි "වහංලිහ" නමි. අභ්‍රංලිහඃ, 'අභ්‍රං ලෙඪි' (=වලාකුළ හෝ අහස ලොවියි) යන වාක්‍යයෙහි "අභ්‍රංලිහ" නමි. මිතං පචතීති= මිතම්පචඃ, ප්‍රමාණවත් කොට පිසා නු යි "මිතම්පච" නමි. ප්‍රස්ථම්පචඃ, 'ප්‍රස්ථං පචති' (=නැළියක් පිසයි) යන වාක්‍යයෙහි "ප්‍රස්ථම්පච" නමි. මානම්පචඃ, 'මානං පචති' (=ප්‍රමාණයක් පිසයි) යන වාක්‍යයෙහි "මානම්පච" නමි. නඛම්පචඃ, 'නඛං

---

* පානම්පචඃ- පොත්හි.

## 18. ඛ්‍යුට් කරණෙ. (ඛ්‍යුට් 1-1. කරණෙ 7-1.)

**a. ධාතොඃ කරණෙ'ථෙ ඛ්‍යුට් ප්‍රත්‍යයො භවති.**

**b. "අභූතතද්භාවෙ ආඪ්‍යසුභගස්ථූලපලිතනග්නාන්ධ ප්‍රියෙෂු කෘඤඃ ඛ්‍යුට් වාච්‍යඃ." අනාඪ්‍යඃ ආඪ්‍යඃ ක්‍රියතෙ 'නෙ නෙති= ආඪ්‍යඞ්කරණං,* දූතම්. සුභගඞ්කරණම්. ස්ථූලඞ්කරණම්, දධි. පලිතඞ්කරණම්, ශිතවසනුසෙවනම්. අනග්නඃ**

---

පචති' (=තිය පමණ පිසයි) යන වාක්‍යයෙහි "තබම්පච" නම්. අජ ගතෞ ක්ෂෙපණෙ ච, "අජ්" ධාතුව ගමනෙහි ද. ප්‍රේරණයෙහි ද වේ. වාතම් අජතීති= වාතමජඃ, වාතය අනුව යේ නු යි "වාතමජ" නම්. (මුව වෙසෙසකි) මදී ගර්පලචනයොඃ, ඊකාරානුබන්ධ "මද්" ධාතුව ගර්ව ය - පැනීම ය යන අර් දෙක්හි වේ. ඉරයා මාද්‍යතීති, ජලයෙන් ගර්විත වේ නු යි හෝ පැන නගී නු යි; ඉරම්මදඃ, "ඉරම්මද" නම්. (වඩබාග්නිය හෝ හෙනගින්න යි.) ඔහාක් ත්‍යාගෙ, ඔ– ක් අනුබන්ධ "හා" ධාතුව හැරීමෙහි වේ. ශර්ධං ජහතීති, අපාන වාතය හරිත් නු යි; ශර්ධඤ්ජහාඃ, "ශර්ධඤ්ජහ" නම් වෙත්. මාෂාඃ, මෑ ය. (මෑ වැළඳූ කල්හි ආපාන වාතය නික්මේ ලු.) ඉති ඛශ් ප්‍රත්‍යයඃ, ඛශ් ප්‍රත්‍යය මෙසේ යි.

18. ඛ්‍යුට් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **ධාතොඃ** යනු අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; කරණෙ, කරණ කාරකයෙහි; ඛ්‍යුට්, ඛ්‍යුට් ප්‍රත්‍යය වේ.

a. ධාතොඃ, ධාතුහු කෙරෙන්; කරණෙ අථෙ, කරණාර්ථයෙහි; ඛ්‍යුට් ප්‍රත්‍යයඃ භවති, ඛ්‍යුට් ප්‍රත්‍යය වේ. (මෙහි ද ඛකාරය මුමාගම ය පිණිස යි. ටකාරය "ෂ්ට්ට්‍රිතඃ" යි ඊප් ප්‍රත්‍යය කිරීම පිණිස යි. සෙසු යු යන්නට "යුවොරනාකෞ" යි 'අන' ආදෙශ වේ. "අචකුප් වන්තරෙ'පි" යි ණත්වය ද වේ.

b. අභූතද්භාවෙ, අභූත තද්භාවයක් ගම්‍යමාන කල්හි; ආඪ්‍ය— ප්‍රියෙෂු, ආඪ්‍ය– සුභග– ස්ථූල– පලිත– නග්න– අන්ධ– ප්‍රිය යන ශබ්දයන් උපපද ව ඇති කල්හි; කෘඤඃ, කෘ ධාතුහු කෙරෙන්; ඛ්‍යුට් වාච්‍යඃ, ඛ්‍යුට් ප්‍රත්‍යය කිය යුතු යි. (මෙයින් ඛ්‍යුට් ප්‍රත්‍යයට ස්ථාන දක්වූහ. යමෙක් ප්‍රථමයෙන් යම් ස්වභාවයකින් නො සිටියේ නම් පසු ව ඒ ස්වභාවයට පැමිණීම **"අභූත තද්භාව"** නම්. අනෙන, මේ කරණ කොට ගෙණ; අනාඪ්‍යඃ, ආඪ්‍ය නුවූවෙක්;

---

* අනාඪ්‍යමාඪ්‍යං කරොත්‍යනෙනාඪ්‍යඞ්කරණම්-- සිද්ධාන්ත චන්ද්‍රිකා.

**නග්නඃ ක්‍රියතෙ 'නෙනෙති= නග්නඞ්කරණං, ද්‍යූතම්. අන්‍ධඞ්කරණං, කිම්? සූය්‍යාවලොකනමසඞ්ඛාත්. අප්‍රියඃ ප්‍රියඃ ක්‍රියතෙ 'නෙනෙති= පියඞ්කරණං, මෛත්‍ර්‍යම්.**

**a. දුර්‍ව්‍යාහනො අණ් වක්තව්‍යඃ තකාරස්‍ය ච ටඃ. ඝඤ්දෙශො වක්තව්‍යඃ. "උ වම්" දූරෑ ආහනතීති= දූර්‍ව්‍යාඝාටඃ.**

---

ආඪ්‍යඃ ක්‍රියතෙ ඉති, ආඪ්‍යයෙක් කරණු ලැබේ නු යි; ආඪ්‍යඞ්කරණම්, "ආඪ්‍යඞ්කරණ" නම්. ද්‍යූතම්, දූ කෙළිය යි. සුභගඞ්කරණම්, 'අසුභගඃ සුභගඃ ක්‍රියතෙ 'නෙන' (=ප්‍රිය නුවූවෙක් මෙයින් ප්‍රිය කරණු ලැබේ) යන වාක්‍යයෙහි "සුභගඞ්කරණ" නම්. ස්ථූලඞ්කරණම්, 'අස්ථූලඃ ස්ථූලඃ ක්‍රියතෙ 'නෙන' (=තර නුවූවෙක් මෙයින් තර කරණු ලැබේ) යන වාක්‍යයෙහි "ස්ථූලඞ්කරණ" නම්. දධි, දී ය. පලිතඞ්කරණම්, 'අපලිතඃ පලිතඃ ක්‍රියතෙ 'නෙන' (=නො පැසුනෙක් මෙයින් පැසුනෙක් කරණු ලැබේ) යන වාක්‍යයෙහි "පලිතඞ්කරණ" නම්. ශීතවස්තුසෙවනම්, සිහිල් දෑ සෙවුම යි. අනග්නඃ නග්නඃ ක්‍රියතෙ අනෙන ඉති, නග්න නුවූවෙක් මෙයින් නග්නයෙක් කරණු ලැබේ නු යි; නග්නඞ්කරණම්, "නග්නඞ්කරණ" නම්. ද්‍යූතම්, දූ කෙළිය යි. (එක ම දූ කෙළිය ඇතැමෙකු දිනා ධනවත් වන බැවින් ආඪ්‍යඞ්කරණ ය යි ද, ඇතැමෙකු පැරදී ඇඳි වත පවා විකුණන බැවින් නග්නඞ්කරණ ය යි ද කියනු ලැබේ.) අන්‍ධඞ්කරණම්, 'අනන්‍ධො 'න්‍ධඃ ක්‍රියතෙ 'නෙන' (=අන්‍ධ නුවූවෙක් මෙයින් අන්‍ධයෙක් කරණු ලැබේ) යන වාක්‍යයෙහි "අන්‍ධඞ්කරණ" නම්. කිම්, කුමක් ද යත්?' අසඞ්ඛාත්, නිතර; සූය්‍යාවලොකනම්, හිරු බැලීම යි. අනෙන, මේ කාරණ කොට ගෙණ; අප්‍රියඃ, ප්‍රිය නුවූවෙක්; ප්‍රියඃ ක්‍රියතෙ ඉති, ප්‍රියයෙක් කරණු ලැබේ නු යි; ප්‍රියඞ්කරණම්, "ප්‍රියඞ්කරණ" නම්. මෛත්‍ර්‍යම්, මිතුරු බව යි. (මේ ඛ්‍යුට් ප්‍රත්‍යයට උදාහරණ යි.)

a. දූරෑ ආහනඃ, දූරෑ ශබ්දොපපද ආ පූර්‍ව 'හන්, ධාතුනු කෙරෙන්; අණ් වක්තව්‍යඃ, අණ් ප්‍රත්‍යය කිය යුතු යි. තකාරස්‍ය, අන්ත්‍ය තකාරයට; ටඃ ච, ටකාරාදෙශ ද වේ. ඝඤ්දෙශඃ, ("හනො ඝත්" යි හන් ධාතුහට) 'ඝත්' ආදෙශය ද; වක්තව්‍යඃ, කිය යුතු යි. (ටකාරය වනුයේ මේ 'ඝත්' ආදෙශයේ තකාරයට ය. ටකාරාදෙශය සඳහා ම මේ දූර්‍ව්‍යාහනඃ- යනාදිය කීහ. නො එසේ වුව "කාශ්‍යේ 'ණ්" යි අණ් ප්‍රත්‍යය කළ හැක්ක. සංඥවක් ගම්‍යමාන කල්හි ම මෙසේ වන බව සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි පෙණේ.) "උ වම්" යන

**a.** **"වාරෞ වා." වාරු ආහන්තීති= වාර්ඝාටඃ- වාර්ඝාතඃ.**

**b.** **"කර්මණි සම්පූර්වාච්ච." වර්ණාන් සංහන්තීති= වර්ණසංඝාටඃ. * වර්ණසංඝාතඃ.**

**c. ජායාපත්‍යොෂ්ටක්. +**

**d.** **ජායාපත්‍යොරුපපදයොර්හන්තෙෂ්ටක් ප්‍රත්‍යයො භවති ලක්ෂණවති කර්තරි. ජායාං හන්තීති= ජායාඝ්නඃ, නා. පතිං හන්තීති= පතිඝ්නී, ස්ත්‍රී.**

---

සූත්‍රයෙන් දරු ශබ්දයේ උකාරයට වකාරය වේ. දරු ආහන්තීති= දර්ඝාටඃ, ලීයට කොටයි යන අර්ථයෙහි "දර්ඝාට" නමි. (එනම් කොච්චෝරුවා † යි. ප්‍රත්‍යය ණිත් බැවින් "අත උපධායාඃ" සි වෘද්ධි වේ.)

a. වාරෞ, වාරු ශබ්දය උපපද ව ඇති කල්හි (ආ පූර්ව 'හන්' ධාතුවෙන් පර ව අණ් ප්‍රත්‍යය ද;) වා, විකල්පයෙන් (ඝත් ආදේශයේ තකාරයට ටකාරය ද වේ.) වාරු ආහන්තීති, මොනවට කොටා නු යි; වාර්ඝාටඃ- වාර්ඝාතඃ, ටකාරාදෙශ පක්ෂයෙහි "වාර්ඝාට" නම් ද-. විකල්ප පක්ෂයෙහි "වාර්ඝාත" නම් ද වේ.

b. කර්මණි, කර්මයක් උපපද ව ඇති කල්හි; සම්පූර්වාත් ච, 'සම්' උපසර්ගය පූර්ව කොට ඇති 'හන්' ධාතුහු කෙරෙන් ද (අණ් ප්‍රත්‍යය හා විකල්පයෙන් තකාරයට ටකාරාදෙශය ද වේ.) වර්ණාන් සංහන්තීති, වර්ණයන් මොනවට ගළපා නු යි; වර්ණසංඝාටඃ- වර්ණසඞ්ඝාතඃ, ටකාරාදෙශ පක්ෂයෙහි "වර්ණසඞ්ඝාට" නම් ද- විකල්ප පක්ෂයෙහි "වර්ණසඞ්ඝාත" නම් ද වේ.

c. ජායාපත්‍යොඃ, ජායා- පති ශබ්ද දෙක උපපද ව ඇති කල්හි; (හන් ධාතුවෙන් පර ව;) ටක්, ටක් ප්‍රත්‍යය වේ.

d. ජායාපත්‍යොඃ, ජායා- පති ශබ්ද දෙක; උපපදයොඃ, උපපද ව ඇති කල්හි; ලක්ෂණවති කර්තරි, ලක්ෂණ සහිත කර්තෘ

---

* "වර්ණසංඝාටඃ" යනු පොත්හි නො පෙණේ. එහෙත් ටකාරාදෙශය විකල්පයෙන් වන හෙයින් එය ද අවශ්‍යයෙන් ඇතුළත් විය යුතු ය. සිද්ධාන්ත චන්ද්‍රිකාව බලනු.

+ "ලක්ෂණෙ ජායාපත්‍යොෂ්ටක්"- යනු පාණිනීය සූත්‍ර යි.

† කොච්චෝරු යනු "කාච්චොකාරා" යන්නෙන් ගත්තා යි.

**a. "අමනුෂ්‍යකර්තෘකෙ ච. * ජායාඝ්නඃ, තිලකාලකඃ, කපාලෙ භ්‍රමරඃ. පතිඝ්නී, පාණිරේඛා.**

**b. පාණිඝතාඩඝෞ ශිල්පිනි නිපාත්‍යතෙ, + රාජඝ උපසඞ්ඛ්‍යානම්.**

---

වාච්‍ය කල්හි; හනෙතඃ, හන් ධාතුහු කෙරෙන්; ටක් ප්‍රත්‍යයඃ භවති, ටක් ප්‍රත්‍යය වේ. (මෙහි ටකාරය ස්ත්‍රීත්වයෙහි 'ඊප්' ප්‍රත්‍යය කරණු පිණිස යි. කකාරය ඉත් කොට ඇති බැවින් "ගමාං සවරෙ" යි හන් ධාතුහුගේ උපධාසංඥ අකාරයට ලොප් වේ. ඉදින් නැසීම හඟවන හස්තරේඛාදි ලකුණක් කර්තෘ කෙරෙහි ඇත් නම් මේ ටක් ප්‍රත්‍යය වන බව **ලක්ෂණවති කර්තරි** යන්නෙන් දක්වයි.) ජායාං හන්තීති= ජායාඝ්නඃ, භාර්‍ය්‍යාව නසා තු යි "ජායාඝ්න" නම්. නා, (භාර්‍ය්‍යාවගේ මරණය හඟවන හස්තරේඛාදි සලකුණක් ඇති) මිනිස් තෙමේ යි. (උපධා සංඥයට ලොප් වූ පසු "හනො ඝෙන" යි හකාරයට ඝකාර වේ.) පතිං හන්තීති= පතිඝ්නී, ස්වාමියා නසා තු යි "පතිඝ්නී" නමු. ස්ත්‍රී, (සැමියාගේ මරණය හඟවන හස්තරේඛාදියක් ඇති) ස්ත්‍රිය යි. ("ෂ්ටිත්‍රිතඃ" යි ඊප් ප්‍රත්‍යය වේ.)

a. අමනුෂ්‍යකර්තෘකෙ ච, මිනිස් නුවූ කර්තෘ ඇති කල්හි ද; (ජායා– පති ශබ්දයන් කෙරෙන් පර හන් ධාතුහු කෙරෙන් ටක් ප්‍රත්‍යය වේ.) ජායාඝ්නඃ, **ජායාං හන්ති** යන වාක්‍යයෙහි "ජායාඝ්න" යනු වේ. **තිලකාලකඃ**, (භාර්‍ය්‍යාවගේ මරණය හඟවන) තල කැලල යි. කපාලෙ භ්‍රමරඃ, හිස් කබලෙහි පිහිටි භ්‍රමර ලක්ෂණයකි.† පතිඝ්නී, **පතිං හන්ති** යන වාක්‍යයෙහි "පතිඝ්නී" යනු වේ. පාණි රේඛා, (සැමියා මැරෙණ බව හඟවන) හස්තරේඛාව යි.

b. පාණිඝතාඩඝෞ, පාණිඝ– තාඩඝ ශබ්ද දෙක; ශිල්පිනි, ශිල්පීත්වයෙහි; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ. (පාණි– තාඩ ශබ්දොපපද හන් ධාතුවෙන් පර ව නිපාතනයෙන් ටක් ප්‍රත්‍යය කොට ටිසංඥ ලොපයෙන් හා හකාරයට ඝකාරාදෙශයෙන් පාණිඝ– තාඩඝ ශබ්ද ද්වය නිපදවිය යුතු යි. **පාණිං හන්ති**= අත පෙළයි යන වාක්‍යයෙහි "පාණිඝ" නම් ද, **තාඩං හන්ති**= එනම්

---

* පාණිනීය 3– 2– 53.

\+ "පාණිඝතාඩඝෞ ශිල්පිනි" පාණිනීය 3– 2– 55.

† යමෙකුගේ හිස් කබලෙහි මීමැසි සටහනින් යුත් තලකැලලක් වේ නම් එය ඔහුගේ බිරිඳ නැසෙන බවට ලකුණකැයි මෙයින් හැඟේ.

## 19. භජාං විණ්. (භජාම් 6-3. විණ. 1-1.)

**a. භජසහවහාං කත්ථරි විණ් ප්‍රත්‍යයො භවති. ණකාරො වෘද්ධ්‍යර්ථඃ.**

## 20. වෙඃ. (වෙඃ 6-1.)

**b. වෙර්ලොපො භවති. භජ සෙවායාම්, අර්ධං භජතීති= අඩ්ඪභාක්. "චොඃ කුඃ" සුඛභාක්, දුඃඛභාක්. සහ මර්ෂණෙ, "හො ඪඃ" "වාවසානෙ" "සහාදෙඃ සාදිඃ" ඉති සූත්‍රෙණ ඛරායාසත්‍රාදෙශඃ. ඛරං ශත්‍රූණාං වෙගං සහතෙ 'සෞ= තුරාෂාඩ්.**

---

වාද්‍යය පෙළයි යන වාක්‍යයෙහි "තාඩඝ" නම් ද වේ. **පාණිඝ** නම් බෙර ආදිය වයන ශිල්පියා යි. **තාඩඝ** නම් කයිතාලම් ආදිය ගසන ශිල්පියා යි. ශිල්පි වාචක නො වන තැන්හි **පාණිඝාත- තාඩඝාත** ය යි "කාඉේ'ණ්" යන්නෙන් අණ් ප්‍රත්‍යය වීමෙන් සිද්ධ යි. ක්‍රියාවන්හි දක්‍ෂකම ශිල්පය යි. ඒ ඇත්තේ ශිල්පි ය. **'ක්‍රියාසු කෞශල්‍යං ශිල්පං, තදස්‍යාස්තීති= ශිල්පී'** යනු සුබොධිනි- තත්ත්වදීපිකා **විකා** යි.) රජසඃ උපසඞ්ඛ්‍යානම්, "රජස" ශබ්දය ද ඊළඟ තබා ගණන් ගණු ලැබේ. (පාණිඝ- තාඩඝ ශබ්දයන් මෙන් ම රජස ශබ්දය ද රජන් ශබ්දෝපපද හන් ධාතුවෙන් පර ව ටක් ප්‍රත්‍යය කිරීමෙන් නිපාතනයෙන් සිද්ධ කට යුතු ය යනු භාව යි. **රජාංහනති**= රජු නසයි යන වාක්‍යයෙහි "රජඝ" නම්.)

19. විණ් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **නාම්නි- කත්ථරි** යනු අනුවෘත්ත යි. නාම්නි, නාමයක් උපපද ව ඇති කල්හි; භජාම්, 'භජ්' ආදි ධාතූන් සම්බන්ධ ව; කත්ථරි, කර්තෘ කාරකයෙහි; විණ්, විණ් ප්‍රත්‍යය වේ. (බහු වචනය ආද්‍යර්ථ යි.)

a. භජසහවහාම්, භජ්- සහ්- වහ් යන ධාතූන් සම්බන්ධ ව; කත්ථරි, කර්තෘ කාරකයෙහි; විණ් ප්‍රත්‍යයඃ භවති, විණ් ප්‍රත්‍යය වේ. **ණකාරඃ**, ණකාරය; වෘද්ධි අර්ථඃ, වෘද්ධිය ප්‍රයෝජන කොට ඇත්තේ ය.

20. ලොපවිධි සූත්‍ර යි. "ඕ ඍෟ ලොපො දීඝීශච" යි **ලොපඃ** යනු අනුවෘත්ත යි. වෙඃ, වි යන්නට; ලොපඃ, ලොප් වේ.

b. වෙඃ, වි යන්නට; ලොපඃ භවති, ලොප් වේ. භජ සෙවායාම්, "භජ්" ධාතුව සෙවනයෙහි වේ. අර්ධං භජතීති= අඩ්ඪභාක්, අඩක් බෙජේ නු යි "අර්ධභාජ්" නම්. "චොඃ කුඃ" යන සූත්‍රයෙන්

**“සහෙඃ෴ඃ සාඩ්” තුරාසාහෞ, තුරාසාහඃ. වහ ප්‍රාපණෙ, භාරං වහතීති= භාරවාට්- භාරවාඩ්, භාරවාහෞ, භාරවාහඃ. භාර වාහම්, භාරවාහෞ, “වාහො වෞ-” භාරෞහඃ. භාරෞහා, භාරවාඩ්භ්‍යාම්, භාරවාඩ්භිඃ. ඉත්‍යාදි.**

**a. ප්‍රාවෘජතෙර්ව්‍ණ්. තත්ත්වං ප්‍රාවෘජතීති= තත්ත්වප්‍රාට්. * අම්බූනි වහතීති= අම්බුවාට්. ශසාදෞ තු අම්බූහඃ.**

---

ජකාරයට ගකාරය වේ. (“වාවසානෙ” යි ගකාරයට විකල්පයෙන් කකාරය වේ. “හසෙපඃ සෙර්ලොපඃ” යි සිප්‍රත්‍යයට ලොප් වේ. අඩිභාක්- අඩිභාග්, අඩිභාජෞ, අඩිභාජඃ යනාදි වශයෙන් වර නැගේ.) සුඛභාක්, ‘සුඛං භජති’ (=සැප බෙජේ) යන වාක්‍යයෙහි “සුඛභාජ්” නම්. දුඃඛභාක්, ‘දුඃඛං භජති’ (=දුක් බෙජේ) යන වාක්‍ය යෙහි “දුඃඛභාජ්” නම්. (‘අඩිභාජ්’ ශබ්දය මෙන් වරනැගේ.) සහ මර්ෂණෙ, “සහ්” ධාතුව ඉවසීමෙහි වේ. “හො ඪඃ” යන්නෙන් හකා රයට ඪකාර වේ. “වාවසානෙ” යන්නෙන් ඊට ඩකාර- ටකාර වේ. සහාදෙඃ— ඉති, “සහාදෙඃ සාදිඃ” යන සූත්‍රයෙන්; තුරායාඃ, ‘තුරා’ ශබ්දයට; තුරාදෙශඃ, ‘තුරා’ ආදෙශ වේ. තුරාම්, ‘තුරා’ ය යි සේ යි; ශත්‍රූණාං වෙගම්, සතුරන්ගේ වෙගය; සහතෙ, ඉවසා නු යි; අසෞ, මෙතෙමේ; තුරාෂාඩ්, “තුරාසාහ්” නම්. “සහෙඃ ෂඃ සාඩ්” යන සූත්‍රයෙන් සකාරයට ෂකාර වේ. (මෙය “වාවසානෙ” යි වන කාර්‍ය යට ප්‍රථමයෙන් කළ යුතු. තුරාෂාඩ්- තුරාෂාට් යනු ප්‍රථමා එක වචන යි.) තුරාසාහෞ, තුරාසාහඃ යනු ද්වි- බහු වචන යි. වහ ප්‍රාපණෙ, “වහ්” ධාතුව පැමිණීමෙහි වේ. භාරං වහතීති= භාරවාට්, බර උසුලා නු යි “භාරවාහ්” නම්. භාරවාට්- භාරවාඩ්, භාරවාහෞ, භාරවාහඃ යනු ප්‍රථමා විභක්ති යි. භාරවාහම්, භාරවාහෞ, යනු ද්විතීයා එක- ද්වි වචන යි. “වාහො වෞ ශසාදෞ ස්වරෙ” යන සූත්‍රයෙන් වාකාරයට ඖකාරය වේ. භාරෞහඃ යනු බහු වචන යි. භාරෞහා, භාරවාඩ්භ්‍යාම්, භාරවාඩ්භිඃ යනු තෘතීයා විභක්ති යි. ඉත්‍යාදි, මේ ආදිය යි.

a. ප්‍රාවෘජතෙඃ, “ප්‍රච්ඡ ඥීප්සායාම්” යන ධාතුහු කෙරෙන් ද; ව්‍ණ්, ව්‍ණ් ප්‍රත්‍යය වේ. තත්ත්වං ප්‍රාවෘජතීති, තත්ත්වය විචාරයි යන අර්ථයෙහි; තත්ත්වප්‍රාට්, “තත්ත්වප්‍රාඡ්” නම්. (“ඡශෂරාජාදෙඃ ෂඃ” යි ඡකාරයට ෂකාර ව “ෂො ඩඃ” ඊට ඩකාර ව “වාවසානෙ” යි

---

* මේ “තත්ත්වප්‍රාට්” යන්න ක්විප්‍රත්‍යයාධිකාරයෙහි සාධිත හෙයින් මෙතැනට නුවමනාය යි ද එය මෙතැන්හි හැඳූරීම නුමයකැයි ද චන්ද්‍රකීර්ති ටීකාකාරයෝ කියති.

a.* අනඤ්ඤාරාදුත්තරස්ස වාහෝ වාකාරස්ස ඌ:† ස්‍යාත් ශසාදෞ ස්වරේ පරේ. ශාලිවාට් -ශාල්‍යූහඃ.

b. ශමෙරපි විණ් වක්තව්‍යඃ. "මො නො ධාතොඃ" ශම දම උපශමනෙ, ප්‍රකර්ෂේණ ශාම්‍යතීති= ප්‍රශාන්, ප්‍රශාමෞ, ප්‍රශාමඃ.

## 21. අභූතතද්භාවෙ කෘභ්වස්තියොගෙ නාම්නශ්ච්විඃ.

(අභූතතද්භාවෙ 7-1 කෘභ්වස්තියොගෙ 7-1. නාම්නඃ 5-1. ච්විඃ 1-1.)

විකල්පයෙන් ටකාර ව "තත්ත්වප්‍රාට්- තත්ත්වප්‍රාඩ්, තත්ත්වප්‍රාජෞ, තත්ත්වප්‍රාජඃ" යනාදි වශයෙන් වර නැගේ.) අම්බූනි වහතීති, දිය උසුලා නු යි; අම්බුවාට්, "අම්බුවාහ්" නම්.('හාරවාහ්' ශබ්දය මෙනි.) ශසාදෞතු, ශස් ආදි විභක්ති පර කල්හි වනාහි; අම්බූහඃ, අම්බූහඃ- අම්බූහා- අම්බූහෙ යනාදි වශයෙන් වේ. (ඉක්බිති එහි සිද්ධිය දක්වයි.)

a. ශසාදෞ ස්වරේ පරේ, ශස් ආදි කොට ඇති විභක්ති ස්වරයා පර කල්හි; අනකාරාත් උත්තරස්‍ය, අකාරය තොර කොට ඇති (=අකාර නො වන) ස්වරයා කෙරෙන් පර වූ; වාහඃ, වාහ් ශබ්දයාගේ; වාකාරස්‍ය, වා යන්නට; ඌඃ ස්‍යාත්, ඌකාරය වන්නේ ය. ("අම්බු + ඌහඃ" සවර්ණ දීර්ඝත්වයෙන් "අම්බූහඃ" යනු වේ. අම්බූහා යනාදිය ද මෙසේ යි.) ශාලිවාට්, 'ශාලිං වහති' (=හැල් උසුලයි) යන වාක්‍යයෙහි "ශාලිවාහ්" නම්. ශාල්‍යූහඃ යනු ද්විතියා බහු වචන යි. ("අම්බුවාහ්" ශබ්දය මෙනි.)

b. ශමේඃ අපි, ශම් ධාතුහු කෙරෙන් ද; විණ් වක්තව්‍යඃ, විණ් ප්‍රත්‍යය කිය යුතු යි. "මො නො ධාතොඃ" යන සූත්‍රෙන් මකාරයට නකාර වේ. ශම දම උපශමනෙ, "ශම්- දම්" ධාතු දෙක සන්සිඳී මෙහි වේ. ප්‍රකර්ෂේණ ශාම්‍යති ඉති, ප්‍රකර්ෂයෙන් සන්සිඳේ නු යි; ප්‍රශාන්, "ප්‍රශාම්" නම්. ප්‍රශාන්, ප්‍රශාමෞ, ප්‍රශාමඃ යනු ප්‍රථමා විභක්ති යි.

---

* පොත්හි "අත ඌඃ" යි සූත්‍රයක් යොදා එහි වෘත්තිය ලෙස මේ පාඨය ගෙණ තිබේ. එහෙත් එබඳු සූත්‍රයක් සූත්‍රපාඨයෙහි හෝ සිද්ධාන්ත චන්ද්‍රිකාදියෙහි නො පෙණේ. එහෙයින් මේ කියන කාර්‍ය්‍යය "ලොකාච්ඡෙෂස්‍ය සිද්ධිඃ" යන්නෙන් වේ ය යි දත යුතු යි.

† ඌඃ ස්‍යාත්- පොත්හි. ඌකාරය කිරීමෙන් "අම්බූහඃ" යනාදිය සිද්ධ වන නමුත් "ශාල්‍යූහඃ" යනාදිය සිද්ධ නො වේ.

**a. අභූතතද්භාවෙ'ර්ථෙ කෘ භූ අස් ඉත්‍යෙතෙෂු නාම්නශ්ච්විඃ ප්‍රත්‍යයො භවති. සම්පද්‍යකර්තරීති වක්තව්‍යම්. තෙන අගෘහෙ ගෘහෙ භවතීති = ගෘහෙභවති. චකාරශ්ච්වෞ දීර්ඝ ඉති විශෙෂණාර්ථඃ. වා චකාරඃ ප්‍රත්‍යයභෙදඥාපනාර්ථඃ. "වෙඃ."**

## 22. ච්වෞ දීර්ඝඃ.* (ච්වෞ 7-1. දීර්ඝඃ 1-1.)

---

21. ච්වි ප්‍රත්‍යගවිධි සූත්‍ර යි. අභූතතද්භාවෙ, අභූතතද්භාවාර්ථයෙහි; කෘභ්වස්තියොගෙ, 'කෘ- භූ- අස්' ධාතූන්ගේ යෙදීමක් ඇති කල්හි; නාම්නඃ, නාමයා කෙරෙන්; ච්විඃ, ච්වි ප්‍රත්‍යය වේ.

a. අභූතතද්භාවෙ අර්ථෙ, අභූත තද්භාවාර්ථයෙහි; කෘ භූ අස් ඉති, කෘ- භූ- අස් යන; එතෙෂු, මේ ධාතූන් පර ව ප්‍රයොග කරණු ලබන කල්හි; නාම්නඃ, නාමයා කෙරෙන්; ච්විඃ ප්‍රත්‍යයඃ භවති, ච්වි ප්‍රත්‍යය වේ. සම්පද්‍යකර්තරි ඉති, සැපයෙන පදාර්ථයේ කර්තෘ වාච්‍ය කල්හි ය යි; වක්තව්‍යම්, කිය යුතු යි. තෙන, එහෙයින්; අගෘහෙ ගෘහෙ භවතීති= ගෘහෙභවති, නො ගෙයි වූවෙක් ගෙයි වෙයි යන අර්ථයෙහි ච්වි ප්‍රත්‍යය වීමෙන් "ගෘහීභවති" යි නො ව "ගෘහෙ භවති" කියා ම වේ. (සම්පද්‍යකර්තෘත්වයක් නැති හෙයිනි. අශුක්ලඃ ශුක්ලඃ සම්පද්‍යතෙ= සුදු නුවූවක් සුදු වූයේ සම්පන්න වෙයි; තං කරොති ශුක්ලීකරොති=එය කෙරෙයි යන අර්ථයෙහි "ශුක්ලීකරොති" යනු වේ. මෙහි සම්පද්‍යමාන වූයේ ශුක්ලභාවය යි. එබැවින් ඒ ශුක්ල ශබ්දයා කෙරෙන් ච්වි ප්‍රත්‍යය වේ. "අගෘහෙ ගෘහෙ භවති" යන තන්හි ගෘහය සම්පද්‍යමාන පදාර්ථයේ කර්තෘ නො වේ. ඊට ආධාරය යි. එබැවින් ගෘහ ශබ්දයා කෙරෙන් ච්වි ප්‍රත්‍යය නො වේ.) චකාරඃ, ච්වි ප්‍රත්‍යයෙහි චකාරය; ච්වෞ දීර්ඝඃ ඉති, "ච්වෞ දීර්ඝඃ" යන සූත්‍රයෙහි; විශෙෂණාර්ථඃ, වෙසෙසීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. වා, නොහොත්; චකාරඃ, චකාරය; ප්‍රත්‍යය භෙද ඥාපනාර්ථඃ, ප්‍රත්‍යයන්ගේ වෙනස හැඟවීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. (ව්ණ්- ච්වි- ක්විප් ප්‍රත්‍යයන්ගේ ඉත් අකුරු හැරුණු විට එක ම රූපය බැවින් මේ ච්වි ප්‍රත්‍යයේ චයන්න සෙසු ප්‍රත්‍යයන්ගෙන් වෙන් කොට හැඳින ගැණීම පිණිස ය යි කී තියා යි.) "වෙඃ" යන සූත්‍රෙන් වි යන්නට ලොප් වේ. (මේ ච්වි ප්‍රත්‍යය වන්නේ කෘ- භූ- අස් ධාතූන්ට පෙරටු ව සිටි නාමයෙන් පරව ය. ඒ ධාතූන් කෙරෙන් වනාහි වක්තෘවිවක්‍ෂා පරිදි ආඛ්‍යාත හෝ කෘදන්ත ප්‍රත්‍යයෙක් වෙයි.)

---

* ච්වෞ දීර්ඝ ඊ චාස්‍ය - පොත්හි.

**a. ච්වෙ‍ෟ ප්‍රත්‍යයෙ පරෙ අකාරස්‍ය ඊකාරාදෙශො භවති, අන්ත්‍යස්‍ය ස්වරස්‍ය දීඝො භවත්‍යව්‍යයවර්ජිතස්‍ය.**

**b. අමිථුනං මිථුනං සම්පද්‍යමානං තථා කරණම් ඉති= මිථුනීකරණම්, පාණිග්‍රහණම්. ච්ව්‍යන්තත්වාදව්‍යයම්. "අව්‍යයාද් විභත්තෙර්ලුක්." අසහායඃ සහායඃ සම්පද්‍යමානස්තථා ස්‍යාදිති= සහායීස්‍යාත්. අකෘෂ්ණඃ කෘෂ්ණඃ යථා සම්පද්‍යමානස්තථා**

---

22. දීඝී හා ඊකාරාදෙශ විධි සූත්‍ර යි. "නාම්නො ය ඊ වාස්‍ය" යි **ඊ චාස්‍ය** යනු අනුවෘත්ත යි. ච්වෞ, ච්වි ප්‍රත්‍යය පර කල්හි; දීඝඃ, (පූර්වයට) දීඝී වේ. **අස්‍ය**, අකාරයට; ඊ ච, ඊකාරාදෙශ ද වේ.

a. ච්වෞ ප්‍රත්‍යයෙ පරෙ, ච්වි ප්‍රත්‍යය පර කල්හි; අව්‍යය වර්ජිතස්‍ය, අව්‍යයන් තොර කොට ඇත්තහුගේ; අකාරස්‍ය, අකාර යට; ඊකාරාදෙශඃ භවති, ඊකාරාදෙශ වේ. අන්ත්‍යස්‍ය ස්වරස්‍ය, අතික් ස්වරයට; දීඝඃ භවති, දීඝී වේ. (ච්වි ප්‍රත්‍යයෙන් පෙරටු ව සිටි නාමයාගේ අන්ත්‍යස්වරය දීඝී වේ. අකාරය නම් ඊකාරය වේ. අව්‍යයක් නම් ඒ කාර්‍ය්‍ය දෙක ම නො වේ.)

b. අමිථුනම්, මිථුන නුවූවෙක්; මිථුනං සම්පද්‍යමානම්, මිථුන වන්නේ නම්; තථා කරණම් ඉති, එසේ කිරීම නු යි. මිථුනී කරණම්, ('කෘ' ධාතුයොගයෙහි) "මිථුනීකරණ" නම්. පාණිග්‍රහණම්, විවාහය යි. ච්ව්‍යන්තත්වාත්, ච්වි ප්‍රත්‍යයාන්ත බැවින්; අව්‍යයම්, ("ක්ත්වාද්‍යන්තඤ්ච" යන සූත්‍රයෙන්) අව්‍යය සංඥ වේ. "අව්‍යයාද් විභක්තෙර්ලුක්" යන්නෙන් විභක්තීන්ට ලොප් වේ. (එහෙයින් සියලු තැන්හි "මිථුනී" යි සිටී.) අසහායඃ, සහාය නුවූවෙක්; සහායඃ සම්පද්‍යමානඃ, සහාය වන්නේ නම්; තථා ස්‍යාත් ඉති, එසේ වන්නේ නු යි; සහායීස්‍යාත්, ('අස්' ධාතුයොගයෙහි) "සහා යීස්‍යාත්" යනු වේ. ('අස්' ධාතු යොගයෙහි විධිලිඞ් ක්‍රියා විෂයෙහි ම විනා ලඞාදි අන්‍යක්‍රියා විෂයෙහි අභූතතද්භාව ප්‍රාප්තිය නො වේ. එහෙයින් "සහායී අස්ති" යනාදි වශයෙන් නො ලැබේ. අසෙතර් ලිඞන්ත ශෛෂ්‍යව ප්‍රයොගෙ'භූතතද්භාවප්‍රතීතිඃ ශබ්දශක්ති ස්ව භාවාත් යනු මුග්ධබොධ ටීකා යි.) අකෘෂ්ණඃ, කලු නුවූවෙක්; යථා කෘෂ්ණඃ සම්පද්‍යමානඃ, යම් සේ කලු වන්නේ නම්; තථා කරෙතීති, එසේ කෙරේ නු යි; කෘෂ්ණීකරෝති, ('කෘ' ධාතුයොගයෙහි) "කෘෂ්ණී කරොති" යනු වේ. හෙතුකෘතම්, 'අහෙතුඃ හෙතුඃ යථා සම්පද්‍යමානඃ තථා කෘතම්' (=හෙතු නුවූවෙක් යම් සේ හෙතු වන්නේ නම් එසේ කරණ ලද්දේ) යන වාක්‍යයෙහි "හෙතුකෘත" නම්. ("අශුචිඃ ශුචිඃ

කාරෙතීති= සාක්ෂීකාරෙති. හෙතුකෘතම්. අව්‍යයස්‍ය න දීර්ඝත්වම්. අස්වස්ති ස්වස්ති යථා සම්පද්‍යමානස්තථා ස්‍යාදිති= ස්වස්තිස්‍යාත්. සම්පද්‍යතීරි කිම්? අගෘහෙ ගෘහෙ භවතීති= ගෘහෙභවති. "අලුක් ක්වචිත්" ඉති විභක්තෙරලුක්.

**a. ච්වෞ සලොපශ්ච.**

**b. මනස් මහස් රජස් ඉත්‍යාදීනාං සකාරස්‍ය ලොපො භවති ච්වෞ ප්‍රත්‍යයෙ පරෙ.**

**c. ද්වෞ නඤෞ ප්‍රකෘත්‍යර්ථමනුසරතඃ, උත්සුකං මනො යස්‍යාසෞ= උන්මනාඃ, න උන්මනාඃ= අනුන්මනාඃ, අනුන්මනාඃ උන්මනාඃ සම්පද්‍යමානස්තථා භාව ඉති= උන්මනීභාවඃ.**

---

තථාසම්පද්‍යමානස්තථා භවතීති=ශුචීභවති"යනු 'භූ' ධාතුයොගයෙහි ච්වි ප්‍රත්‍යයට උදාහරණ යි. මෙහි අමිථුනං මිථුනං ක්‍රියතෙ ඉති= මිථුනීකරණම් යනාදි වශයෙන් කොටි වාක්‍ය නො දක්වා සම්පද්‍යතීඃත්වය ප්‍රකට කරණු පිණිස දීර්ඝ වාක්‍ය දක්වන ලදී.) අව්‍යයස්‍ය, අව්‍යයට; න දීර්ඝත්වම්, දීර්ඝ බව නො වේ. අස්වස්ති, යහපත් නුවූවෙක්; යථා ස්වස්ති සම්පද්‍යමානඃ, යම් සේ යහපත් වන්නේ නම්; තථා ස්‍යාත් ඉති, එසේ වන්නේ ය යන අර්ථයෙහි; ස්වස්තිස්‍යාත්, (අව්‍යය බැවින් පූර්වයට දීර්ඝ නො වීමෙන්) "ස්වස්ති ස්‍යාත්" යනු ම වේ. සම්පද්‍යතීරි කිම්. "සම්පද්‍යතීරි" යනු කිම? "අගෘහෙ ගෘහෙ භවතීති= ගෘහෙභවති" යනාදි තැන්හි ච්වි ප්‍රත්‍යය නො වන පිණිස යි. (එහි) අලුක් ක්වචිත් ඉති, "අලුක් ක්වචිත්" යන සූත්‍රයෙන්; විභක්තෙඃ, විභක්තිහට; අලුක්, ලුක් නො වේ.

a. ච්වෞ, ච්වි ප්‍රත්‍යය පර කල්හි; සලොපඃ ච, (සකාරාන්ත ශබ්දයන්ගේ) සකාර ලොපය ද වේ.

b. ච්වෞ ප්‍රත්‍යයෙ පරෙ, ච්වි ප්‍රත්‍යය පර කල්හි; මනස් මහස් රජස් ඉති, මනස්- මහස්- රජස් යන; ආදීනාම්, මේ ආදි ශබ්දයන්ගේ; සකාරස්‍ය, සකාරයට; ලොපඃ භවති, ලොප් වේ. (ආදි ශබ්දයෙන් අරුස්- චෙතස්- රහස්- චක්ෂුස් යනාදීහු ගණු ලැබෙත්.)

c. ද්වෞ නඤෞ, 'නඤ්' නිපාත දෙදෙන; ප්‍රකෘත්‍යර්ථම් අනුසරතඃ, ප්‍රකෘත්‍යර්ථය අනු ව යෙත්. ('නඤ්' නිපාත දෙකක් යෙදුනු කල්හි ඒ දෙක ප්‍රකෘතියේ අර්ථය ම ගෙණ දෙයි යනු භාව යි. මතු දක්වෙන "අනමනාඃ" යනාදි තැන්හි ය.)උත්සුකම්, උත්සාහවත් වූ;

**a. විගතං මනො යස්සාසෞ=විමනාඃ, න විමනාඃ= අවිමනාඃ, අවිමනාඃ විමනාඃ සම්පද්‍යමානස්තථා භාව ඉති= විමනීභාවඃ.**

**b. න විද්‍යතෙ මනො යස්‍යාසෞ= අමනාඃ, න අමනාඃ= අන මනාඃ, අනමනාඃ අමනාඃ සම්පද්‍යමානස්තථා භාව ඉති= අමනී භාවඃ. තථා සුමනීභාවඃ, සුචෙතීභාවඃ, මහීකරොති අරූකරොති, චක්‍ෂූකරොති.**

---

මනඃ, සිත; යස්‍ය, යමෙකුගේ ද; අසෞ, මෙතෙමේ; උන්මනාඃ, "උන්මනස්" නම්. න උන්මනාඃ, උන්මනස් නුවූයේ; අනුන්මනාඃ, "අනුන්මනස්" නම්. අනුන්මනාඃ, උන්මනස් නුවූයේ; උන්මනා, සම්පද්‍යමානඃ, උන්මනස් වන්නේ නම්; තථා භාවඃ ඉති, එසේ වීම නු සි; උන්මනීභාවඃ, "උන්මනීභාව" නම්.

a. විගතං මනඃ, පහ වූ සිත; යස්‍ය, යමෙකුගේ ද; අසෞ, මෙතෙමේ; විමනාඃ, "විමනස්" නම්. න විමනාඃ, විමනස් නුවූයේ; අවිමනාඃ, "අවිමනස්" නම් අවිමනාඃ, විමනස් නුවූයේ; විමනාඃ සම්පද්‍යමානඃ, විමනස් වන්නේ නම්; තථා භාවඃ ඉති, එසේ වීම නු සි; විමනීභාවඃ, "විමනීභාව" නම්.

b. මනඃ, සිත; යස්‍ය, යමෙකුට; න විද්‍යතෙ, විද්‍යමාන නොවේ ද; අසෞ, මෙතෙමේ; අමනාඃ, "අමනස්" නම්. න අමනාඃ, අමනස් නුවූයේ; අනමනාඃ, "අනමනස්" නම්. අනමනාඃ, අමනස් නුවූයේ, අමනාඃ සම්පද්‍යමානඃ, අමනස් වන්නේ නම්; තථා භාවඃ ඉති, එසේ වීම නු සි; අමනීභාවඃ, "අමනීභාව" නම්.

තථා, එසේ ම; සුමනීභාවඃ, 'සුෂ්ඨු මනො යස්‍යාසෞ= සුමනාඃ, න සුමනාඃ= අසුමනාඃ, අසුමනාඃ සුමනාඃ සම්පද්‍යමානස්තථා භාවඃ' යන වාක්‍යයෙහි "සුමනීභාව" නම්. සුචෙතීභාවඃ, 'සුෂ්ඨු චෙතො යස්‍යාසෞ= සුචෙතාඃ, න සුචෙතාඃ= අසුචෙතාඃ, අසුචෙතාඃ සුචෙතාඃ සම්පද්‍යමානස්තථා භාවඃ' යන වාක්‍යයෙහි "සුචෙතීභාව" නම්. මහීකරොති, 'න මහඃ= අමහඃ, අමහඃ මහඃ සම්පද්‍යමානස්තථා කරොති' යන වාක්‍යයෙහි "මහීකරොති" යනු වේ. අරූකරොති, 'න අරුඃ= අනරුඃ, අනරුරරුඃ සම්පද්‍යමානස්තථා කරොති' යන වාක්‍යයෙහි "අරූකරොති" යනු වේ. චක්‍ෂූකරොති, 'න චක්‍ෂුඃ= අචක්‍ෂුඃ, අචක්‍ෂු ශ්චක්‍ෂුඃ සම්පද්‍යමානස්තථා කරොති' යන වාක්‍ය යෙහි "චක්‍ෂූකරොති" යනු වේ. (සකාරය ලොප් වූ පසු "ච්වෞ දීර්ඝඃ" යි අකාරයට ඊකාර ද, උකාරයට දීර්ඝ ද වූහ.)

**a. ඛාච් ක්වචිද් වක්තව්‍යඃ.**

**b. අභූතතද්භාවේ'ථෙ ක්වචිත් ඛාච් ප්‍රත්‍යයො භවති. අදුඃඛං දුඃඛං සම්පද්‍යතෙ තත් කරෝතීති= දුඃඛාකරෝති. තථා භද්‍රාකරෝති.**

## 23. ආතො මනින්ක්වනිබ්වනිපඃ.

(ආතඃ 5-1. මනිප්- වනිපඃ 1-3.)

**c. ප්‍රාදෞ නාම්නි ච ප්‍රයුජ්‍යමානෙ ආකාරාන්තාද්ධාතෝර් මනිප්- ක්වනිප්- වනිප් ඉත්‍යෙතෙ ප්‍රත්‍යයා භවන්ති.**

---

a. ක්වචිත්, කිසි තැනෙක්හි; ඛාච් වක්තව්‍යඃ, (අභූතතද්භාවාර්ථයෙහි නාමයා කෙරෙන් පර ව) ඛාච් ප්‍රත්‍යය කිය යුතු යි. (ඛකාර- චකාර දෙක ඉත් ය.)

b. අභූතතද්භාවෙ අර්ථෙ, අභූත තද්භාවාර්ථයෙහි; ක්වචිත්, සමහර තැනෙක; ඛාච් ප්‍රත්‍යයඃ භවති, ඛාච් ප්‍රත්‍යය වේ. අදුඃඛං දුඃඛං සම්පද්‍යතෙ, නුදුක දුක් වන්නේ ද; තත් කරෝති ඉති, එය කෙරේ නු යි. දුඃඛාකරෝති, "දුඃඛාකරෝති" යනු වේ. තථා, එසේ ම, භද්‍රාකරෝති, 'අභද්‍රං භද්‍රං සම්පද්‍යතෙ තත් කරෝති' (=අයහපත යහපත් වන්නේ ද එය කෙරෙයි) යන වාක්‍යයෙහි "භද්‍රාකරෝති" යනු වේ. (ප්‍රත්‍යය ඛිත් බැවින් "ඛිති ටෙඃ" යි විසංඥලොපය වේ.)

23. ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "නාම්නි ච" යි නාම්නි යනු ද, "කෘත් කර්තරි" යි කර්තරි යනු ද, ධාතොඃ යන සූත්‍රය ද අනුවෘත්ත යි. නාම්නි, නාමයක් උපපද ව ඇති කල්හි; ආතඃ ධාතොඃ, ආකාරාන්ත ධාතුහු කෙරෙන්; කර්තරි, කර්තෘ කාරකයෙහි; මනිප් ක්වනිප්වනිපඃ, මනිප්- ක්වනිප්- වනිප් යන ප්‍රත්‍යයෝ වෙත්.

c. ප්‍රාදෞ, ප්‍රාදිය හෝ; නාම්නි ච, නාමයක් හෝ; ප්‍රයුජ්‍යමානෙ, යොදනු ලබන කල්හි; ආකාරාන්තාත් ධාතොඃ, ආකාරාන්ත ධාතුහු කෙරෙන්; මනිප් ක්වනිප් වනිප් ඉති, මනිප්- ක්වනිප්- වනිප් යන; එතෙ ප්‍රත්‍යයාඃ, මේ ප්‍රත්‍යයෝ; භවන්ති, වෙත්.

(උපසර්ගයක් හෝ නාමයක් උපපද ව ඇති කල්හි ආකාරාන්ත ධාතුන් කෙරෙන් යථොක්ත ප්‍රත්‍යය ත්‍රයය වන බව මෙයින් කීහ. එහෙත් ආකාරාන්ත නො වන ධාතුන් කෙරෙන් ද වන බව මතු දක්වේ. උපසර්ග ද නාම සංඛ්‍යාවෙහි ම ලා ගැණෙන හෙයින් සූත්‍රයට "ප්‍රාදෞ" යන්නක් අනුවෘත්ත කිරීම නුවමනා ය. මෙහි-

**a. සුෂ්ඨු දදාතීති= සුදමා, රාජන් ශබ්දවද්‍රූපම්. "ධසෙ චපා ඛසානාම්" අශ්වෙ තිෂ්ඨතීති= අශ්වත්ථාමා.**

## 24. ස්ථාමී. (ස්ථාම 6- 3. ඊ 1- 1.)

**b. ඉශ්ච ඊශ්ච= ඊ. දසොමාස්ථාං හ්‍රස්ව ඉකාරො භවති, ධාගෛහාක්පිබතීනාං දීර්ඝ ඊකාරො භවති තකාරාදෞ කිති හසෙ පරෙ, න ක්‍යපි, ක්විපි වා.**

---

'මන්- වන්- වන්' යන මොහු පමණක් ප්‍රත්‍යය ස්වරූපයෙන් ලැබෙත්. සෙස්ස ඉත් ය. එහි ක යන්න ගුණප්‍රතිෂෙධය පිණිස ය. ඉ යන්න උච්චාරණය පිණිස ය. ප යන්න මතු දක්වෙන "හ්‍රස්වස්‍ය පිති කෘති තුක්" යි වන තුගාගමය පිණිස ය.)

a. සුෂ්ඨු දදාතීති, මනා කොට දේ නු යි; සුදමා, "සුදමන්" නම්. රූපම්, ශබ්ද රූපය; රාජන් ශබ්දවත්, 'රාජන්' ශබ්දය මෙනි. (මේ මනිප්- ක්වනිප්- වනිප් ප්‍රත්‍යයාන්තයෝ රාජන් ශබ්දය මෙන් වර නැගෙත්.) "ධසෙ චපා ඛසානාම්" යන සූත්‍රයෙන් මතු දක් වෙන උදාහරණයෙහි සකාරයට තකාරය වේ. ("නිපාතනාත්සස්‍ය තඃ" යි සකාරයට තකාරය නිපාතනයෙන් වේ ය යි සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි කීහ.) අශ්වෙ තිෂ්ඨතීති, අසුපිට සිටී නු යි; අශ්වත්ථාමා, "අශ්වත්ථාමන්" නම්. (මේ මනිප් ප්‍රත්‍යයට උදාහරණ යි.)

24. ඉවර්ණාදෙශ විධි සූත්‍ර යි. "යජාං- පෙ- කිති" යි කිති යනු ද, "ගුරොර්හසාත්" යි වි: වි: වශයෙන් හසෙ යනු ද, "ස්වරාන්තෙනා වා" යි වා යනු ද අනුවෘත්ත යි. කිති, කිත් වූ (=ක යන්න ඉත් කොට ඇති;) හසෙ, හස ප්‍රත්‍යාහාරය පර කල්හි; ස්ථාම්, "ෂ්ඨා ගතිනිවෘත්තෞ" යනාදි ධාතූන්ගේ අන්තයට; වා, ව්‍යවස්ථා වශයෙන්; ඊ, ඉ- ඊ ආදෙශ වේ. (බහු වචනය ආර්ෂ යි. ෂෂ්ඨී නිර්දිෂ්ට බැවින් අන්තයට වේ. මේ සූත්‍රය "ස්ථාම් + ඉ + ඊ" යි ත්‍රිපද කොට ද චන්ද්‍රකීර්ති ටීකාවෙහි දක්වූහ.)

b. ඉඃ ච, ඉකාරය ද; ඊඃ ච, ඊකාරය ද; ඊ, "ඊ" නම්. තකාරාදෞ, තකාරය ආදි කොට ඇති; කිති හසෙ පරෙ, කිත් වූ හස ප්‍රත්‍යාහාරය පර කල්හි; දසොමාස්ථාම්, ද- සො- මා- ස්ථා යන ධාතූන් (ගේ අන්තය) ට; හ්‍රස්වඃ ඉකාරඃ භවති, හ්‍රස්ව ඉකාරය වේ. ධාගෛහාක්පිබතීනාම්, ධා- ගෛ- හා- පා යන ධාතූන් (ගේ අන්තය) ට; දීර්ඝඃ ඊකාරඃ භවති, දීර්ඝ ඊකාරය වේ. ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි; න, නො වේ. ක්විපි, ක්විප් ප්‍රත්‍යය පර කල්හි; වා, විකල්පයෙන් වේ.

**8. ක්වනිප් ප්‍රත්‍යයඃ. සුෂ්ඨු පිබතීති= සුපීවා. භූරි දදාතීති= භූරිදීවා. ඝෘතං පිබතීති= ඝෘතපීවා. ධනදීවා, මලසීවා, මාගීසපීවා, ධනධීවා, සුගීවා, දෙෂහීවා.**

---

(මෙහි 'මා' යන්නෙන් (1) මා මානෙ, (2) මාඞ් මානෙ, (3) මෙඞ් ප්‍රණිදානෙ යන ධාතුත්‍රයය ම ගැණේ. එසේ ම 'ධා' යන්නෙන් (1) ධෙට් පානෙ, (2) ඩුධාඤ් ධාරණපොෂණයොඃ යන ධාතු දෙක ම ගැණේ. මේ සූත්‍රයට අනුවෘත්ත වන 'වා' ශබ්දය ව්‍යවස්ථාවාචක ය. එහෙයින් දෙ†– සො– මා– ස්ථා ධාතූන්ගේ අන්තයට ඉකාරය ම වේ. ධා– ගෛ– හා– පා ධාතූන්ගේ අන්තයට ඊකාරය ම වේ. ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි ඉ– ඊ දෙක ම නො වේ. ක්විප් ප්‍රත්‍යය පර කල්හි ඊකාරාදෙශය පමණක් විකල්පයෙන් වේ. සූත්‍රවෘත්තියෙන් මේ බැව් පැහැදිලි කළහ. තකාරය ද හසප්‍රත්‍යාහාරයට අයත් හෙයින් එහි වූ "තකාරාදෞ" යන්න නිරර්ථකය සිතැගේ. සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි "ස්ථාමි" යි ඉකාරාදෙශය ද, "අපිද්දධාගෛහාක්පිබතිනාමීඃ" යි ඊකාරාදෙශය දැයි මෙසේ සූත්‍ර දෙකකින් මේ ඉවර්ණාදෙශය දක්වූහ.)

8. ක්වනිප් ප්‍රත්‍යයඃ, ක්වනිප් ප්‍රත්‍යය දක්වනු ලැබේ. සුෂ්ඨු පිබතීති, මොනවට බෝ නු යි; සුපීවා, "සුපීවන්" නම්. භූරි දදාතීති, බොහෝ නොහොත් රන් දේ නු යි; භූරිදීවා, "භූරිදීවන්"+ නම්. ඝෘතං පිබතීති, ගිතෙල් බෝ නු යි; ඝෘතපීවා, "ඝෘතපීවන්" නම්. ධනදීවා, 'ධනං දදාති' (=ධනය දෙයි) යන වාක්‍යයෙහි "ධනදීවන්" නම්. මලසීවා, මලං ස්‍යති' (=මල නිමවයි) යන වාක්‍යයෙහි "මලසීවන්" නම්. මාගීසපීවා, 'මාගේ තිෂ්ඨති' (=මග සිටී) යන වාක්‍යයෙහි "මාගීසපීවන්" නම්. ධනධීවා, 'ධනං දධාති' (=ධනය දරයි) යන වාක්‍යයෙහි "ධනධීවන්" නම්. සුගීවා, 'සුෂ්ඨු ගායති' (=මොනවට ගයයි) යන වාක්‍යයෙහි "සුගීවන්" නම්. දෙෂහීවා, 'දෙෂං ජහාති' (=දෙස් හරියි) යන වාක්‍යයෙහි "දෙෂහීවන්" නම්.

---

† සිද්ධාන්ත චන්ද්‍රිකා සුබොධිනී ටීකාවෙහි 'දා' රූප ධාතූන්ගෙන් "දෙ'ව ඛණ්ඩනෙ" යන ධාතුහුගේ අන්තයට පමණක් ඉකාරය වේ ය යි කීහ. එසේ ම (1) දෙ'වඛණ්ඩනෙ, (2) දෙඞ් පාලනෙ, (3) දාණ් දානෙ, (4) ඩුදාඤ් දානෙ යන ධාතු චතුෂ්කයට ම ඊකාරය වේ ය යි කීහ. එහෙයින් "දෙ'වඛණ්ඩනෙ" යන ධාතුවට ඉ–ඊ දෙක ම වන බව පෙණේ.

\+ මු: බොධ- දාවන් & සි: චන්ද්‍රිකා- දීවන්.

a. මනිප්* ක්වචිදනෙ‍්‍යභ්‍යො'පි දිශ්‍යතෙ. සුෂ්ඨු කරොතීති= සුකාමී. සුෂ්ඨු ශෘණොතීති= සුශමී. අන ප්‍රාණනෙ, අත්‍ර ක්විප්. ප්‍රාණිතීති= ප්‍රාණ්, ප්‍රාණෞ, ප්‍රාණඃ. හෙ ප්‍රාණ්.

b. අනඃ.

c. පදනෙන වර්තමානස්‍යාපි අනො නස්‍ය ණත්වං ස්‍යාත්. අධෞ ඉති විශෙෂණානනලොපො න ශඞ්කනීයඃ.

## 25. හ්‍රස්වස්‍ය පිති කෘති තුක්.

(හ්‍රස්වස්‍ය 6- 1. පිති 7- 1. කෘති 7-1. තුක්. 1- 1.)

---

a. මනිප්, මනිප් ප්‍රත්‍යය; ක්වචිත්, කිසි තැනෙක්හි; අනෙ‍්‍යභ්‍යඃ අපි, අනික් (=ආකාරාන්ත නො වන) ධාතූන් කෙරෙන් ද; දිශ්‍යතෙ, දක්නා ලැබේ. සුෂ්ඨු කරොති ඉති, මොනවට කෙරේ නු යි; සුකාමී, "සුකමීන්" නම්. සුෂ්ඨු ශෘණොතීති, මොනවට පෙළා නු යි; සුශමී, "සුශමීන්" නම්. ("ශෘෘ හිංසායාම්" ධාතු යි. මනිප් ප්‍රත්‍යය කිත් නො වන හෙයින් ධාතුහට ගුණ වේ.) අන ප්‍රාණනෙ, "අන්" ධාතුව ජීවත් වීමෙහි ය. අත්‍ර, මෙහි; ක්විප්, "ක්විප්" යන සූත්‍රයෙන් ක්විප් ප්‍රත්‍යය වේ. ප්‍රාණිතීති= ප්‍රාණ්, ජීවත් වේ නු යි "ප්‍රාණ්" නම්. (ක්- ප් දෙක ඉත් හෙයින් ද, 'වි' යන්න "වෙඃ" යන සූත්‍රයෙන් ලොප් වන හෙයින් ද ක්විප් ප්‍රත්‍යයාගේ කිසිවක් ශෙෂ නො වේ.) ප්‍රාණ්, ප්‍රාණෞ, ප්‍රාණඃ යනු ප්‍රථමා විභක්ති යි. හෙ ප්‍රාණ් යනු සම්බොධන එක වචන යි.

b. අනඃ, පදාන්තයෙහි වූ ද 'අන්' ධාතුහුගේ නකාරයට ණකාරය වේ.

c. පදනෙන වර්තමානස්‍ය අපි, පදවසානයෙහි පවත්නා වූ ද; අනඃ, 'අන්' ධාතුහුගේ; නස්‍ය දන්ත්‍ය නකාරයට; ණත්වම්, මූර්ධන්‍ය ණකාර බව; ස්‍යාත්, වන්නේ ය. ("අචකුප්වනන්තරෙ'පි" යි පදාන්ත නකාරයට ණත්වය නො වන හෙයින් මේ කීහ.) අධෞ ඉති විශෙෂණාත්, "අධෞ"යි වෙසෙසා කීමෙන්; නලොපඃ, නකාර ලොපය; න ශඞ්කනීයඃ, සැක නො කට යුත්තේ ය. ("නාම්නො නො ලොපශධෞ" යි නකාර ලොපය නො වෙයි යූ සේ යි. ධාතුවකට අයත් නකාරයට ඒ සුතුරෙන් කිසි තැනෙකත් ලොප් නො වේ.)

25. තුගාගම විධි සූත්‍ර යි. පිති කෘති, පිත් වූ කෘත් ප්‍රත්‍යය පර කල්හි; හ්‍රස්වස්‍ය, හ්‍රස්වය සම්බන්ධ ව; තුක්, තුගාගම වේ.

---

* ක්වනිප්- පොත්හි.

**a. හ්‍රස්වස්‍ය පිති කෘති පරෙ තුගාගමො භවති. ඉණ් ගතෞ, ප්‍රාතරෙතීති= ප්‍රාතරිත්වා.**

**b. "වනිපි ඤමස්‍යාත්වං වාච්‍යම්." ජනී ප්‍රාදුර්භාවෙ, විජායතෙ 'සෞ= විජාවා. කෙවලෙභ්‍යො'පි වනිප්. ඔණෘ අපනයනෙ, ඔණතීති= අවාවා, අවාවානෞ.**

**c. "ඊපි * වනො නස්‍ය රො වාච්‍යඃ" "ත්‍රණ ඊප්" ඔණති සා= අවාවරී. පාරං පශ්‍යතීති= පාරදෘශ්වා. පාරං පශ්‍යතීති සා= පාරදෘශ්වරී.**

---

a. පිති කෘති පරෙ, ප යන්න ඉත් කොට ඇති කෘත් ප්‍රත්‍යය පර කල්හි; හ්‍රස්වස්‍ය, හ්‍රස්වය සම්බන්ධ ව; තුගාගමඃ භවති, තුක් ආගම වේ. (මෙහි උකාරය උච්චාරණය පිණිස ය. කකාරය ස්ථාන නියමය පිණිස ය. එහෙයින් ධාතුස්ථ හ්‍රස්ව ස්වරයෙන් පර ව "ත්" යන්නක් ආගම වේ.) ඉණ් ගතෞ, "ඉණ්" ධාතුව ගමනාර්ථයෙහි වේ. ප්‍රාතඃ එති ඉති, උදෑසන එයි යන අර්ථයෙහි; ප්‍රාතරිත්වා, "ප්‍රාත රිත්වන්" නම්. (මෙහි ක්වනිප් ප්‍රත්‍යය යි. එය ආකාරාන්ත නො වන ධාතූන් කෙරෙනුදු වන බව මේ "ප්‍රාතරිත්වන්- පාරදෘශ්වන්- සුත්වන්" යනාදි උදාහරණයන්ගෙන් පෙණේ. එසේ ම නිපාතොප පද ධාතූන් කෙරෙන් ද ඒ ප්‍රත්‍යයන් වන බව "ප්‍රාතරිත්වන්" යනාදියෙන් හැඟේ.)

b. වනිපි, වනිප් ප්‍රත්‍යය පර කල්හි; ඤමස්‍ය, ඤම ප්‍රත්‍යාහාර වර්ණයට; ආත්වම්, ආකාර බව; වාච්‍යම්, කිය යුතු යි. (ඤම ප්‍රත්‍යාහාර වර්ණාන්ත ධාතූන් කෙරෙන් වනිප් ප්‍රත්‍යය වූ කල්හි ඒ ඤම ප්‍රත්‍යා හාර වර්ණයට ආකාරාදෙශ වේ. වනිප් ප්‍රත්‍යය ද ආකාරාන්ත නො වන ධාතූන් කෙරෙන් වන බවට මෙය ම සාධක යි.) ජනී ප්‍රාදුර් භාවෙ, "ජන්" ධාතුව පහළ වීමෙහි වේ. විජායතෙ, උපදී නු යි; අසෞ, මෙතෙමේ; විජාවා, "විජාවන්" නම්. කෙවලෙභ්‍යඃ අපි, හුදෙකලා (=උපපද රහිත) ධාතූන් කෙරෙන් ද; වනිප්, වනිප් ප්‍රත්‍යය වේ. ඔණෘ අපනයනෙ, "ඔණ්" ධාතුව පහ කිරීමෙහි ය. ඔණතීති, පහ කෙරේ නු යි; අවාවා, "අවාවන්" නම්. අවාවා. අවාවානෞ යනු ප්‍රථමා එක- ද්වි වචන යි. (ඔණ් + වන්, ණකාරයට ආකාර ව= ඔ + ආ + වන්, "ඔ අව්"= අව් + ආ + වන්, "ස්වරහීනං පරෙණ"= අවාවන්.)

c. ඊපි, ඊප් ප්‍රත්‍යය පර කල්හි; වනඃ, 'වන්' යන්නහුගේ; නස්‍ය, නකාරයට; රඃ වාච්‍යඃ, රකාරාදෙශය කිය යුතු යි. "ත්‍රණ

---

* 'ඊපි' යනු සූත්‍රයක් මෙන් ද, 'වනො නස්‍ය රො වාච්‍යඃ' යනු තද්වෘත්තිය මෙන් ද ඇතැම් පොත්හි මුද්‍රිත ය. ඒ සදෙසි.

**a. කෙවලෙභ්‍යො'පි ක්වනිප්. ෂුඤ් අභිෂවෙ, ෂූඞ් ප්‍රාණිගර්භවිමොචනෙ, සුනොතීති= සුත්වා. තුක්. ධෙට් පානෙ, ධයතීති= ධීවා. ගෛ ශබ්දෙ, ගායතීති= ගීවා. ජහාතීති= හිවා. පීවා.**

## 26. ක්විප්. (ක්විප 1-1.)

**b. උපපදෙ සති අසති ච සර්වධාතුභ්‍යඃ ක්විප් ප්‍රත්‍යයො භවති. ක්විපඃ සර්වාපහාරිත්වාල්ලොපඃ. සාපාවිනෞ, "වෙඃ" "හ්‍රස්වස්‍ය පිති කෘති තුක්."**

---

ඊප්" යන සූත්‍රයෙන් ස්ත්‍ර්‍යර්ථයෙහි ඊප් ප්‍රත්‍යය වේ. ඕණති, පහ කෙරෙයි යන අර්ථයෙහි; සා, ඕ තොමෝ; අවාවරී, "අවාවරී" නමු. (අවාවන් + ඊ= අවාවර් + ඊ= අවාවරී.) පාරං පශ්‍යතීති, පර තෙර දකී නු යි; පාරදෘශ්වා, (හෙතෙමේ) "පාරදෘශ්වන්" නම්. පාරං පශ්‍යතීති, පර තෙර දකී නු යි; සා, ඕතොමෝ; පාරදෘශ්වරී "පාරදෘශ්වරී" නමු.

a කෙවලෙභ්‍යඃ අපි, හුදෙකලා ධාතූන් කෙරෙන් ද; ක්වනිප්, ක්වනිප් ප්‍රත්‍යය වේ. ෂුඤ් අභිෂවෙ, ෂොපදෙශ "ෂු" ධාතුව නෑමෙහි වේ. ෂූඞ් ප්‍රාණිගර්භවිමොචනෙ, * "ෂූ" ධාතුව ප්‍රාණියකු ගැබින් මිදීමෙහි වේ. සුනොතීති, ස්නානය කෙරේ නු යි; සුත්වා, "සුත්වන්" නම්. තුක්, තුගාගම වේ. "ආදෙඃ ෂ්ණඃ ස්නඃ" යි ෂකාරයට සකාර වේ.) ධෙට් පානෙ, "ධෙ" ධාතුව බීමෙහි වේ. ධයතීති, බෝ නු යි; ධීවා, "ධීවන්" නම්. ගෛ ශබ්දෙ, "ගෛ" ධාතුව ශබ්දාර්ථයෙහි වේ. ගායතීති, ගයා නු යි; ගීවා, "ගීවන්" නම්. ජහාතීති, හරී නු යි; හිවා, "හිවන්" නම්. ("ඔහාක් ත්‍යාගෙ" ධාතු යි.) පීවා, 'පිබති' (=බොයි) යන වාක්‍යයෙහි "පීවන්" නම්. ("පා පානෙ" ධාතු යි.)

26. ක්විප් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **"ධාතොඃ"** යන සූත්‍රය අනුවෘත්ත යි. ධාතොඃ, (සියලු) ධාතූහු කෙරෙන්; ක්විප, ක්විප් ප්‍රත්‍යය වේ.

b. උපපදෙ, උපපදයක්; සති, ඇති කල්හි ද; අසති ච, නැති කල්හි ද; සර්වධාතුභ්‍යඃ, සියලු ධාතූන් කෙරෙන්; ක්විප් ප්‍රත්‍යයඃ භවති, ක්විප් ප්‍රත්‍යය වේ. (අන්‍ය ප්‍රත්‍යයෝ අර්ථානුසාරයෙන් ඒ ඒ ධාතූන් කෙරෙන් යථා යොග්‍යත්වයෙන් කරණු ලැබෙත්. ක්විප් ප්‍රත්‍යය එසේ නො ව සියලු ධාතූන් කෙරෙන් යොදනු ලැබේ.)

---

* මිට උදහරණ නො පෑණේ.

**a.** කර්ම කරෝතීති= කර්මකෘත්. අග්නිං චිනෝතීති= අග්නිචිත්. දේවාන් ස්තෞතීති= දේවස්තුත්. සෝමං පිබතීති= සෝමපාඃ. සර්වං පශ්‍යතීති= සර්වදෘක්. "දිශාම්" ඉති කුත්වම්. දිශ අතිසර්ජනෙ, දිශතීති= දික්.

**b.** "ක්විපි * වචිප්‍රච්ඡ්‍යායතස්තු කටප්‍රූජුශ්‍රීණාං දීර්ඝඃ සම්ප්‍රසාරණාභාවශ්ච වක්තව්‍යඃ." වක්ත්‍යනයා සා= වාක්, වා උච්‍යතෙ අනයා සා= වාක්. ප්‍රච්ඡ ඥීප්සායාම්, තත්ත්වජුඦ්ඃ. තත්ත්වං පෘච්ඡතීති= තත්ත්වප්‍රාට්. "ඡශෂරාජාදෙඃ ෂඃ."

---

සර්වාපහාරිත්වාත්, සියල්ල පැහැර ගන්නා සුලු බැවින්; ක්විපඃ, ක්විප් ප්‍රත්‍යයාගේ; ලොපඃ, ලොපය වේ. කපෞ ඉතෞ, ක- ප දෙක ඉත් ය. "වෙඃ" යන සූත්‍රයෙන් 'වි' යන්නට ලොප් වේ. (පිත් බැවින්) "හ්‍රස්වස්‍ය පිති කෘති තුක්" යි තුගාගම වේ. (කිත් බැවින් ගුණ නො වේ.)

a. කර්ම කරෙතීති, කම් කොරේ නු යි; කර්මකෘත්, "කර්මකෘත්" නම්. අග්නිං චිනොතීති, ගිනි රැස් කොරේ නු යි; අග්නිචිත්, "අග්නිචිත්" නම්. දෙවාන් ස්තෞතීති, දෙවියන්ට ස්තුති කොරේ නු යි; දෙවස්තුත්, "දෙවස්තුත්" නම්. සොමං පිබතීති, සොම රසය බෝ නු යි; සොමපාඃ, "සොමපා" නම්. ('ක්විපි වා' යි කී හෙයින් "ස්ථාම්" යන සූත්‍රයෙන් මෙහි ඊකාරාදෙශය නො වේ.) සර්වං පශ්‍යතීති, සියල්ල දකී නු යි; සර්වදෘක්, "සර්වදෘශ්" නම්. දිශාම් ඉති, "දිශාම්" යන සූත්‍රයෙන්; කුත්වම්, (විභක්ත්‍යන්ත වූ කල්හි) කවර්ගී බව වේ. දිශ අතිසර්ජනෙ, "දිශ්" ධාතුව දීමෙහි ය. දිශතීති, දේ නු යි; දික්, "දිශ්" නම්.

b. ක්විපි, ක්විප් ප්‍රත්‍යය පර කල්හි; වචිප්‍රච්ඡ්‍යායතස්තුකටප්‍රූජුශ්‍රීණාම්= වචි, වච් ධාතු ය; ප්‍රච්ඡි, ප්‍රච්ඡ් ධාතු ය; ආයතස්තු, ආයත ශබ්දොපපද ෂ්ටු ධාතු ය; කටප්‍රූ, කට ශබ්දොපපද ප්‍රු ධාතු ය; ජු, ජු ධාතු ය; ශ්‍රීණාම්, ශ්‍රි ධාතු ය යන මොවුන්ට; දීර්ඝඃ, දීර්ඝ ද; සම්ප්‍රසාරණ අභාවඃ ච, සම්ප්‍රසාරණ නො වීම ද; වක්තව්‍යඃ, කිය යුතු යි. (ක්විප් ප්‍රත්‍යය පර කල්හි යථොක්ත ධාතූන්ගේ ස්වරයට දීර්ඝ වේ. සම්ප්‍රසාරණ නො වේ යනු භාවය යි.)

---

* ක්විප්- පොත්හි.

a. "ඡ්වොඃ ශඌ වාවෙ‍්‍යෟ කිති ඞිති ඣලෙ පරෙ 'නුනාසිකෙ ක්වෞ ච." * තෙන තත්ත්වප්‍රාශෞ, තත්ත්වප්‍රාශඃ. ෂ්ටුඤ් ස්තුතෞ, ආයතං ස්තෞතීති= ආයතස්තූඃ. ප්‍රුඞ් ගතෞ. කටං ප්‍රවතෙ 'සෞ= කටප්‍රූඃ. ජු ගතෞ, ජවතෙ 'සෞ= ජූඃ. සුෂ්ඨු ශ්‍රයතීති= සුශ්‍රීඃ, වා සුෂ්ඨු ශ්‍රීණීත්‍යාශසෞ= සුශ්‍රීඃ. ශ්‍රයන්තෙ ජනා යාමිති= ශ්‍රීඃ.

---

අනයා, මැය කරණ කොට ගෙණ, වක්ති, කියයි යන අර්ථයෙහි; සා, ඕතොමෝ; වාක්, "වාච්" නමු. වා, නොහොත්; අනයා, මැය කරණ කොට ගෙණ; උච්‍යතෙ, කියනු ලැබේ නු යි; සා, ඕතොමෝ; වාක්, "වාච්" නමු. (මෙහි ක්විප් ප්‍රත්‍යය කරණාර්ථයෙහි ය.) ප්‍රච්ඡ ඥීප්සායාම්, "ප්‍රඡ්" ධාතුව දැනගණු කැමැති බැව්හි වේ. තත්ත්වපූර්‍වා, 'තත්ත්ව' ශබ්දය පෙරටු කොට ඇත්තේ ය. තත්ත්වං පෘච්ඡතීති, තතු විචාරා නු යි; තත්ත්වප්‍රාට්, "තත්ත්වප්‍රාඡ්" නම්. "ඡශෂරාජාදෙඃ ෂඃ" යන සූත්‍රයෙන් ඡකාරයට ෂකාර වේ. ("ෂො ඩඃ"= තත්ත්වප්‍රාඩ්, "වාවසානෙ"= තත්ත්වප්‍රාට්.)

a කිති ඞිති ඣලෙ, කිත්- ඞිත් වූ ඣල ප්‍රත්‍යාහාරය ද; අනුනාසිකෙ, අනුනාසික වර්ණය ද; ක්වෞ ච, ක්විප් ප්‍රත්‍යය ද; පරෙ, පර කල්හි; ඡ්වොඃ, ඡකාර- වකාර දෙකට; ශඌ, ශකාර- ඌකාර දෙක; වාවෙ‍්‍යෟ, කිය යුතු යි. (කිත්- ඞිත් සංඥ වූ ඣල ප්‍රත්‍යාහාර වර්ණයන් ද; ඤම ප්‍රත්‍යාහාර වර්ණයන් ද, ක්විප් ප්‍රත්‍යය ද පර කල්හි ඡකාරයට ශකාරයත්- වකාරයට ඌකාරයත් ආදෙශ වන බව මෙයින් කීහ.) තෙන, එහෙයින්; තත්ත්වප්‍රාශෞ- තත්ත්වප්‍රාශඃ යනු ප්‍රථමා- ද්වි- බහු වචන යි. (ශකාරාදෙශ නුවූ කල්හි "තත්ත්වප්‍රාඡෞ- තත්ත්වප්‍රාඡඃ" කියා වේ. "ඡශෂරාජාදෙඃ ෂඃ" යි ශකාරයට ද ෂකාරාදෙශ වන හෙයින් ප්‍රථමෙක වචනයෙහි වෙනසෙක් නො වේ.)

(අක්ෂෛර්දීව්‍යතීති= අක්ෂද්‍යූඃ යනු වකාරයට ඌකාරාදෙශ වීමට උදාහරණ යි. "අක්ෂ + දිව් + ක්විප්" යි සිටි කල්හි ඌකාරාදෙශයෙන් හා ක්විප් ප්‍රත්‍යය ලොපයෙන්= අක්ෂ + දි + ඌ, "ඉ යං ස්වරෙ" යි යකාරාදෙශයෙන්= අක්ෂ + ද් + ය් + ඌ, පර නයන යෙන්= අක්ෂද්‍යූ, යි විභක්ති කොට ඊට විසර්ගාදෙශ කිරීමෙන් "අක්ෂද්‍යූඃ" යි සිද්ධ යි.)

---

* ඡ්වොඃ ශ්ශූඩනුනාසිකෙ ච- පාණිනීය 6-9. 19.

**a. "නහි වෘති ව්‍යධි වෘෂි රුචි සහි තනිෂු ක්විබන්තෙෂු පූර්වපදස්‍යොපසර්ගස්‍යානෙන දීර්ඝො වාච්‍යඃ." ණහ් බන්ධනෙ, "ආදෙඃ ෂ්ණඃ ස්නඃ" "නහො ධඃ" උප සමීපෙ නහ්‍යතීති= උපානත්. නිතරාං වර්තතෙ 'සෞ= නීවෘත්. ව්‍යධ තාඩනෙ, "ග්‍රහාං ඞිති ච" මර්මාණි විධ්‍යතීති= මර්මාවිත්. වෘෂ වෘෂෙටෞ, ප්‍රකර්ෂේණ වර්ෂතීති ප්‍රාවෘට්. රුචි දීප්තෞ. නිතරාං රොචතෙ 'සෞ= නීරුක්.**

---

ෂ්ටුඤ් ස්තුතෞ, ෂොපදෙශ "ෂ්ටු" ධාතුව පැසසීමෙහි වේ. ආයතං ස්තෞතීති, දිඝී සේ ස්තුති කෙරේ නු යි; ආයතස්තූඃ, "ආයතස්තූ" නම්. ප්‍රුඞ් ගතෞ, "ප්‍රු" ධාතුව ගමනාර්ථයෙහි වේ. කටං ප්‍රවතෙ, සොහොනට යේ නු යි; අසෞ, මෙතෙමේ; කටප්‍රූඃ, "කටප්‍රූ" නම්. ජු ගතෞ, "ජු" ධාතුව ගමනාර්ථයෙහි වේ. ජවතෙ, දුවයි යන අර්ථයෙහි; ජූඃ, "ජූ" නම්. සුෂ්ඨු ශ්‍රයතීති, මොනවට සෙවනය කෙරෙයි යන අර්ථයෙහි; සුශ්‍රීඃ, "සුශ්‍රී" නම්. ("ශ්‍රිඤ් සෙවායාම්" ධාතු යි.) වා, නොහොත්; සුෂ්ඨු ශ්‍රීඃ, ශොභන ශ්‍රිය; යස්‍ය, යමෙකුගේ ද; අසෞ, මෙතෙමේ; සුශ්‍රීඃ, "සුශ්‍රී" නම්. ජනාඃ, ජනයෝ; යාම්, යමක; ශ්‍රයන්ත, සෙවනය කෙරෙද්ද; (ඕ ජනාමෝ;) ශ්‍රීඃ, "ශ්‍රී" නමු. (සු පූර්ව 'ශ්‍රි' ධාතුවෙන් පර ව ක්විප් ප්‍රත්‍යය කිරීමෙන් ද, කෙවල 'ශ්‍රි' ධාතුවෙන් පර ව ක්විප් ප්‍රත්‍යය කොට සු උපසර්ගය හා බහුව්‍රීහි සමාස කිරීමෙන් ද 'සුශ්‍රී' ශබ්දය නිපදනා බව මෙයින් දක්වූහ.)

b. ක්විබන්තෙෂු, ක්විප් ප්‍රත්‍යයාන්ත වූ; නහි වෘති ව්‍යධි වෘෂි රුචි සහි තනිෂු, නහ්- වෘත්- ව්‍යධ්- වෘෂ්- රුච්- සහ්- තන් යන ධාතූන් පර කල්හි; පූර්ව පදස්‍ය, පූර්ව පදයාගේ ද; උපසර්ගස්‍ය, උපසර්ගයාගේ ද; අනෙන, කෙළවර; දීර්ඝඃ වාච්‍යඃ, දීර්ඝය කිය යුතු යි. (යථොක්ත ධාතූන් කෙරෙන් ක්විප් ප්‍රත්‍යය වූ කල්හි පූර්ව වූ උපසර්ගයන්ගේ හා නාමයන්ගේ අන්ත්‍යස්වරය දීර්ඝ වෙයි යනු භාව යි.) ණහ් බන්ධනෙ, "නහ්" ධාතුව බැඳීමෙහි වේ. "ආදෙඃ ෂ්ණඃ ස්නඃ" යන්නෙන් ණකාරයට නකාර වේ. "නහො ධඃ" යන්නෙන් හකාරයට ධකාර වේ. "උප" යි සේ යි; සමීපෙ, ළඟ; නහ්‍යතීති, බඳී නු යි; උපානත්, "උපානහ්" නමු. ("වාවසානෙ" යි ධකාරයට තකාර- දකාර දෙක ම වන හෙයින් ප්‍රථමෛක වචනයෙහි "උපානත්- උපානද්" යි රූප අවයෙකි.) නිතරාම්, අත්‍යර්ථයෙන්; වර්තතෙ, පවතී නු යි; අසෞ, මෙතෙමේ හෝ මෝතොමෝ; නීවෘත්, "නීවෘත්" නම් වේ. ව්‍යධ තාඩනෙ, "ව්‍යධ්" ධාතුව තැළීමෙහි වේ. "ග්‍රහාං ඞිති ච" යන සූත්‍රයෙන් සම්ප්‍රසාරණ වේ. මර්මාණි

**a, "ගමි යමි නමි හන් තනාදීනං ක්විපි ඤමස්‍ය ලොපො වාච්‍යඃ ක්‍යපි වා." තුක්, පරිතඃ තනොතීති= පරිතත්. කටං චිකිෂීතීති= කටචිකීඃ. චිකිෂීතෙඃ ක්විප්. "යතඃ" ඉත්‍යකාර ලොපඃ. "ෂෙෂාම්" ඉති ෂස්‍ය රෙඵඃ. "රි ලොපො දීර්ඝශ්ච" ඉති මධ්‍යම රෙඵස්‍ය ලොපඃ, න තු සංයොගාන්තස්‍ය ලොපඃ, රසෙ පදාන්තෙ චෙති වකාරාත්. "රතසස්‍ය" "ස්‍යොර්විසර්ගඃ" කට චිකීෂ්, කටචිකීඃ.**

---

විධ්‍යතීති, මරු තැන් තලයි යන අර්ථයෙහි; මර්මාවිත්, "මර්මාවිධ්" නම්. වෘෂ වෘෂෙටෟ, "වෘෂ්" ධාතුව වර්ෂණාර්ථයෙහි වේ; ප්‍රකර්ෂේණ වර්ෂතීති, අතිශයින් වසී නු යි; ප්‍රාවෘට්, "ප්‍රවෘෂ්" නමු. රුච් දීප්තෞ, "රුච්" ධාතුව බැබලීමෙහි වේ. නිතරං රොචතෙ, අත්‍යර්ථයෙන් බබලයි යන අර්ථයෙහි; නීරුක්, "නීරුච්" නම්. ("චොඃ කුඃ" යි චකාරයට කකාර විය.)

a. ක්විපි, ක්විප් ප්‍රත්‍යය පර කල්හි; ගමියමිනමිහන් තනාදීනාම්, ගම්– යම්– නම්– හන්– තන් යනාදි ධාතුන්ගේ; ඤමස්‍ය, ඤම ප්‍රත්‍යාහාර වර්ණයට; ලොපඃ වාච්‍යඃ, ලොපය කිය යුතු යි. ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි; වා, විකල්පයෙන් ලොපය කිය යුතු යි. (මෙයින් යථොක්ත ධාතුන්ගේ අන්ත්‍යයට ලොප් වේ.) තුක්, "හ්‍රස්වස්‍ය පිති කෘති තුක්" යි තුගාගම වේ. පරිතඃ තනොතීති, හාත්පසින් පතුරුවා නු යි; පරිතත්, "පරිතත්" නම්. (පරි පූර්ව "තනු විස්තාරෙ" ධාතු යි. "නහි වෘති ව්‍යධි–" යනාදීන් උප සර්ගාන්තයට දීර්ඝ විය. i අධ්වගං ගච්ඡතීති= අධ්වගත්. ii සංයච්ඡතීති= සංයත්. iii සුෂ්ඨු නමතීති= සුනත්. iv සංහන්තීති= සංහත් යනු i ගම්, ii යම්, iii නම්, iv හන් ධාතුන්ට උදාහරණ යි.)

කටං චිකීෂීතීති, කලාල කරණු කැමති වේ නු යි; කටචිකීඃ, "කටචිකීර්ෂ්" නම්. චිකීෂීතෙඃ, (සප්‍රත්‍යයාන්ත කෘ=) "චිකීෂී" ධාතුහු කෙරෙන්; ක්විප්, ක්විප් ප්‍රත්‍යය වේ. යතඃ ඉති, "යතඃ" යන සූත්‍රයෙන්; අකාරලොපඃ, ෂකාරස්ථ අකාරයට ලොප් වේ. ෂෙෂාම් ඉති, "ෂෙෂාම්" යන සූත්‍රයෙන්; ෂස්‍ය රෙඵඃ, ෂකාරයට රෙඵය වේ. (එකල්හි "කටචිකීර්ර් + ස්" යි සිටී.) රි– ඉති, "රි ලොපො දීර්ඝශ්ච" යන සූත්‍රයෙන්; මධ්‍යම රෙඵස්‍ය, මැද්දෙහි වූ රෙඵයට; ලොපඃ, ලොප් වේ. සංයොගාන්තස්‍ය, සංයොගාන්තයට, න තු ලොපඃ, ලොප් නො වේ. රසෙ පදාන්තෙ ච ඉති, "රසෙ පදාන්තෙ ච" යන තැන්හි; වකාරාත්, වකාර බලයෙනි. "රතසස්‍ය"

**a. වහ ප්‍රාපණෙ, "යජාං යවරාණාම්-" අනො වහතීති= අනඩ්වාන්. "ක්විබන්තෙ වහ්‍යනසො ඩාන්තාදෙශො වාච්‍යඃ." අනඩ්වාහෞ, අනඩ්වාහඃ. රාජෘ දීපෙතෞ, "මො රාජි සමඃ ක්වෞ" සම්‍යග් රාජතෙ 'සෞ= සම්‍රාට්.**

**b. ධ්‍යෛ චින්තායාම්, "ධ්‍යායතෙඃ ක්විපි සම්ප්‍රසාරණං * වක්තව්‍යම්." සුෂ්ඨු ධ්‍යායතීති= සුධීඃ.**

---

යන්නෙන් රේඵයෙන් පර සකාරයට ලොප් වේ. (ෂකාරයට ලොප් නො වේ.) "ඛ්‍යොර්විසර්ගඃ" යන්නෙන් රකාරයට විසර්ගය වේ. (එකල්හි ප්‍රථමෛක වචනයෙහි කාටචිකීඃ යනු වේ.) කාටචිකීෂෞ-කාටචිකීෂඃ යනු ද්වි- බහු වචන යි.

a. වහ ප්‍රාපණෙ, "වහ්" ධාතුව පැමිණීමෙහි වේ. "යජාං යවරාණාං ය්වෘතඃ සම්ප්‍රසාරණං කිති" යන සූත්‍රයෙන් වකාරයට සම්පසාරණ වේ. අනඃ වහතීති, ගැල උසුලා නු යි; අනඩ්වාන්, "අනඩුහ්" නම්. ක්විබන්තෙ, ක්විප් ප්‍රත්‍යයාන්ත වූ; වහි, වහ් ධාතුව පර කල්හි; අනසඃ, අනස් ශබ්දයට; ඩාන්තාදෙශඃ, ඩකාරාන්තාදෙශය (='අනස්' ශබ්දයාගේ අන්තයට ඩකාරාදෙශය;) වාච්‍යඃ, කිය යුතු යි. ("අනස් + වහ්" යි සිටි කල්හි සම්ප්‍රසාරණයෙන්= අනස් + උහ්, ඩකාරාදෙශයෙන්= අනඩ් + උහ්, පර නයනයෙන්= අනඩුහ් යි වේ.) අනඩ්වාහෞ, අනඩ්වාහඃ යනු ප්‍රථමා ද්වි- බහු වචන යි. (පදසිද්ධි නාම කාණ්ඩයෙන් දත යුතු.) රාජෘ දීප්තෞ, "රාජ්" ධාතුව බැබලීමෙහි වේ. "මො රාජි සමඃ ක්වෞ" යන සූත්‍රයෙන් 'සම්' උපසර්ගයේ මකාරයට මකාරය ම වේ. ("මො 'නුස්වාරඃ" යි අනුස්වාරය නො වෙයි යූ සේ යි.) සම්‍යක් රාජතෙ, මොනවට බබලා නු යි; අසෞ, මෙතෙමේ; සම්‍රාට්, "සම්‍රාජ්" නම්.

b. ධ්‍යෛ චින්තායාම්, "ධ්‍යෛ" ධාතුව සිතීමෙහි වේ. ක්විපි, ක්විප් ප්‍රත්‍යය පර කල්හි; ධ්‍යායතෙඃ, ධ්‍යෛ ධාතුහට; සම්ප්‍රසාරණම්, සම්ප්‍රසාරණය; වක්තව්‍යම්, කිය යුතු යි. සුෂ්ඨු ධ්‍යායතීති, මනා කොට සිතා නු යි; සුධීඃ, "සුධී" නම්.

---

* දීර්ඝතා ච වක්තව්‍යා- පොත්හි. සම්ප්‍රසාරණ වීමේ දී හ්‍රස්වයට හ්‍රස්වයත්, දීර්ඝයට දීර්ඝයත් වන හෙයින් ධ්‍යෛ ධාතුහුගේ යෛකාරයට ඊකාරය ම වේ. එබැවින් නැවත දීර්ඝ කිරීම නිරපේක්ෂ ය.

**a. "ද්‍යුතිගමිජුහොතීනාං ක්විපි ක්වචිද් ද්විත්වං වාච්‍යම්." හසාදිශෙෂාභාවඃ. "ද්‍යුතතෙඃ ක්වචිත් පූර්වස්‍ය ක්විපි සම්ප්‍රසාරණං වාච්‍යම්." ද්‍යුතතෙ'සෞ=දිද්‍යුත්. ගච්ඡති උත්පත්ති ස්ථිතිලයාන් ප්‍රාප්නොතීති= ජගත්. "ජුහොතෙර්දීර්ඝශ්ච." ජුහොත්‍යනයා සා= ජුහූඃ.**

## 27. දෘශෙෂ්ටක්සකෞ චොපමානෙ කර්මෙ.

(දෘශෙඃ 5- 1. ටක්සකෞ 1-2. ච- නි: උපමානෙ 7- 1. කර්මෙ 7- 1.)

**b. දෘශෙර්ධාතොඃ සර්වාදෞ * ටක්සකෞ ප්‍රත්‍යයෞ භවත උපමානෙ කර්මෙ සති. චකාරාත් ක්විබ් වක්තව්‍යඃ.**

---

a. ක්විපි, ක්විප් ප්‍රත්‍යය පර කල්හි; ද්‍යුතිගමිජුහොතීනාම්, ද්‍යුත්- ගම්- හු යන ධාතූන්ට; ක්වචිත්, සමහර තැනෙක්හි; ද්විත්වං වාච්‍යම්, ද්විත්වය කිය යුතු යි. හසාදිශෙෂ අභාවඃ, "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි හසාදිශෙෂත්වය නො වේ. ක්විපි, ක්විප් ප්‍රත්‍යය පර කල්හි; ද්‍යුතතෙඃ, ද්‍යුත් ධාතුහුගේ; පූර්වස්‍ය, පූර්ව රූපයට; ක්වචිත්, සමහර තැනෙක; සම්ප්‍රසාරණං වාච්‍යම්, සම්ප්‍රසාරණය කිය යුතු යි. ද්‍යුතතෙ, බබලා නු යි; අසෞ, මෙතෙමේ; දිද්‍යුත්, "දිද්‍යුත්" නම්. (පූර්ව රූපයෙහි යකාරයට සම්ප්‍රසාරණ ඉකාරය විය.) 'ගච්ඡති' යි සේ යි; උත්පත්ති ස්ථිති ලයාන්, ඉපැදීම ය- පැවැත්ම ය- විනාශ ය යන අවස්ථාවන්ට; ප්‍රාප්නොතීති, පැමිණේ නු යි; ජගත්, "ජගත්" නම්. ("කුහොශ්චුඃ" යි පූර්ව ගකාරයට ජකාරය විය.) ජුහොතෙඃ, 'හු' ධාතුහට; දීර්ඝඃ ච, දීර්ඝ ද වේ. අනයා, මැය කරණ කොට ගෙණ; ජුහොති, හොම කෙරේ නු යි; සා, ඕතොමෝ; ජුහූඃ, "ජුහූ" නම්. ("කුහොශ්චුඃ" යි පූර්ව හකාරයට ඣකාර ද ඊට ජකාර ද විය. මෙහි ක්විප් ප්‍රත්‍යය කරණාර්ථයෙහි ය.)

27. ප්‍රත්‍යය විධි සූත්‍ර යි. ධාතොඃ යන සූත්‍රය අනුවෘත්ත යි. උපමානෙ කර්මෙ, උපමානවාචක කර්මයක් උපපද ව ඇති කල්හි; දෘශෙඃ ධාතොඃ, දෘශ් ධාතුහු කෙරෙන්; ටක්සකෞ ච, ටක්- සක් යන ප්‍රත්‍යයෝ දෙදෙන ද වෙත්.

b. සර්වාදෞ, සර්වනාම වූ; උපමානෙ කර්මෙ සති, උපමාන වාචක කර්මයක් පූර්ව පද ව ඇති කල්හි; දෘශෙඃ ධාතොඃ, දෘශ් ධාතුහු කෙරෙන්, ටක්සකෞ ප්‍රත්‍යයෞ භවතඃ, ටක්- සක් යන ප්‍රත්‍යයෝ

---

* සර්වාදිෂු- පොත්හි.

## 28. ආ සර්වාදෙඃ. (ආ 1-1. සර්වාදෙඃ 6-1.)

**a. එතෙෂු ප්‍රත්‍යයෙෂු පරේෂු සර්වාදෙඃ පූර්වස්‍ය ටෙරාත්වං භවති.**

**b. දෘශිර් ප්‍රෙක්ෂණෙ, අන්‍ය ඉව දෘශ්‍යතෙ 'සෞ'= අන්‍යාදෘශඃ. "ඡශෂරාජාදෙඃ ෂඃ" "ෂඪෝඃ කඃ සෙ" "ක්විලාත්-" අන්‍යාදෘක්ෂඃ- අන්‍යාදෘක්. ස ඉව දෘශ්‍යතෙ 'සෞ'= තාදෘශඃ- තාදෘක්ෂඃ- තාදෘක්. ය ඉව දෘශ්‍යතෙ'සෞ'= යාදෘශඃ- යාදෘක්ෂඃ- යාදෘක්. එෂ ඉව දෘශ්‍යතෙ 'සෞ'= එතාදෘශඃ- එතාදෘක්ෂඃ- එතාදෘක්.**

---

දෙදෙන වෙත්. චකාරයත්, ච ශබ්දයෙන්; ක්විප් වක්තව්‍යඃ, ක්විප් ප්‍රත්‍යය ද කිය යුතු යි. (කර්මයට උපමාන වූ සර්වනාම ශබ්දයක් උපපද ව ඇති කල්හි දෘශ් ධාතුවෙන් පර ව ටක්- සක්- ක්විප් යන ප්‍රත්‍යය ත්‍රයය ම වන බව මෙයින් කීහ. ටකාරය "ෂ්ට්ත්‍රිතඃ" යි ඊප් ප්‍රත්‍යය කිරීම පිණිස ය. කකාරය ගුණප්‍රතිෂේධය පිණිස ය.)

28. ආකාරාදෙශ විධි සූත්‍ර යි. පූර්ව සූත්‍රවලින් විභක්ති විපර්‍යාස වශයෙන් **දෘශෞ- ටක්සකෝඃ- ක්විපි** යනු ද, සිංහාවලෝකනගති වශයෙන් "ඞිති ටෙඃ" යි **ටෙඃ** යනු ද අනුවෘත්ත යි. දෘශෞ, දෘශ් ධාතුව පර කල්හි; ටක්සකෝඃ, ටක්- සක් දෙක ද; ක්විපි, ක්විප් ප්‍රත්‍යය ද (ඉන් පර ව) ඇති කල්හි; සර්වාදෙඃ, සර්වනාමයාගේ; ටෙඃ, ටිසංඥයට; ආ, ආකාරාදෙශ වේ. *

a. එතෙෂු ප්‍රත්‍යයෙෂු පරේෂු, මේ ටගාදි ප්‍රත්‍යයන් පර කල්හි; පූර්වස්‍ය සර්වාදෙඃ, පූර්ව වූ සර්වනාමයාගේ; ටෙඃ, ටිසංඥයට; ආත්වං භවති, ආකාර බව වේ.

b. දෘශිර් ප්‍රෙක්ෂණෙ, "දෘශ්" ධාතුව දැකීමෙහි වේ. අන්‍යඃ ඉව, අනිකකු මෙන්; දෘශ්‍යතෙ, දක්නා ලැබේ නු යි; අන්‍යාදෘශඃ, "අන්‍යාදෘශ" නම්. (ටක් ප්‍රත්‍යය යි.) "ඡශෂරාජාදෙඃ ෂඃ" යන සූත්‍රයෙන් ශකාරයට ෂකාර වේ. "ෂඪෝඃ කඃ සෙ" යන්නෙන් ෂකාරයට කකාර වේ. "ක්විලාත් ෂඃ සඃ කෘතස්‍ය" යන්නෙන් ප්‍රත්‍යය සකාරයට ෂකාර වේ. අන්‍යාදෘක්ෂඃ, "අන්‍යාදෘක්ෂ" යනු වේ. (සක් ප්‍රත්‍යය වීමෙනි.) අන්‍යාදෘක්, ක්විප් ප්‍රත්‍යය වීමෙන් "අන්‍යාදෘශ්" යනු වේ. සඃ ඉව දෘශ්‍යතෙ, ඔහු මෙන් දක්නා ලැබේ නු යි; තාදෘශඃ-

---

* "ටෙඃ" යන අනුවෘත්තය නැතත් සර්වනාමයාගේ අන්තයට ආකාරාදෙශ කිරීමෙන් ද පදසිද්ධිය කට හැකි යි.

## 29. කිමිදමඃ කීශ්ඊශෞ.

(කිමිදමඃ 6- 1. කීශ්ඊශෞ 1- 2.)

**a. කිම් ශබ්දස්‍ය ඉදම් ශබ්දස්‍ය ච කිශ්- ඊශ් ඉත්‍යෙතා වාදෙශෞ භවතඃ ටගාදිෂු ප්‍රත්‍යයෙෂු පරෙෂු. ශකාරඃ සර්වාදෙශාර්ථඃ.**

**b. කඃ ඉව දෘශ්‍යතෙ 'සෞ= කීදෘශඃ- කීදෘක්ෂඃ- කීදෘක්. අයමිව දෘශ්‍යතෙ 'සෞ= ඊදෘශඃ- ඊදෘක්ෂඃ-ඊදෘක්. ඊදෘශී, වාති.**

---

තාදෘක්ෂඃ- තාදෘක්, "තාදෘශ- තාදෘක්ෂ- තාදෘශ්" යනු වේ. (පිළිවෙළින් ටක්- සක්- ක්විප් ප්‍රත්‍යයන්ට උදාහරණ යි. මතු ද එසේ යි.) යඃ ඉව දෘශ්‍යතෙ, යමෙකු මෙන් දක්නා ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; යාදෘශඃ- යාදෘක්ෂඃ- යාදෘක්, "යාදෘශ- යාදෘක්ෂ- යාදෘශ්" නම් වේ. එෂඃ ඉව දෘශ්‍යතෙ, මොහු මෙන් දක්නා ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; එතාදෘශඃ- එතාදෘක්ෂඃ- එතාදෘක්, "එතාදෘශ- එතාදෘක්ෂ- එතාදෘශ්" නම් වේ.

29. ආදෙශවිධි සූත්‍ර යි. "ක්විප්- දෘශෙෂ්ටක්සකෞ වොපමානෙ ත්‍යාදෞ" යන සූත්‍ර දෙකින් වි: වි: වශයෙන් ක්විපි- දෘශෞ- ටක් සකොඃ යනු අනුවෘත්ත යි. දෘශෞ, දෘශ් ධාතුව පර කල්හි; ක්විපි, ක්විප් ප්‍රත්‍යය ද; ටක්සකොඃ, ටක්- සක් ප්‍රත්‍යය දෙක ද (ඉන් පර ව) ඇති කල්හි, කිමිදමඃ, කිම්- ඉදම් ශබ්ද දෙකට; කිශ්ඊශෞ, 'කීශ්- ඊශ්' ආදෙශ දෙක වේ.

a. ටගාදිෂු ප්‍රත්‍යයෙෂු පරෙෂු, 'ටක්' ආදි ප්‍රත්‍යයන් පර කල්හි; කිම් ශබ්දස්‍ය, කිම් ශබ්දයට ද; ඉදම් ශබ්දස්‍ය ච, ඉදම් ශබ්දයට ද; කිශ් ඊශ් ඉති, කිශ්- ඊශ් යන; එතෞ ආදෙශෞ; මේ ආදෙශ දෙදෙන; භවතඃ, වෙත්. ශකාරඃ, ආදෙශස්ථ ශකාරය; සර්වාදෙශාර්ථඃ, ("ගුරුඃ ශිෂ්‍යම සර්වස්‍ය වක්තව්‍යඃ" යි කී හෙයින් ආදෙශිහුගේ) මුළුල්ලට වීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. (මෙහි "පරෙෂු" යි කිව ද අව්‍යවධානත්වයෙක් නැත. සිද්ධාන්ත චන්ද්‍රිකා සූත්‍රය "කිමිදමඃ කිශ්" යනු යි. එයින් කී- ඊශ් යන ආදෙශ ද්වයය විහිත ය.)

b. කඃ ඉව දෘශ්‍යතෙ, කවරෙකු මෙන් දක්නා ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; කීදෘශඃ- කීදෘක්ෂඃ- කීදෘක්, "කීදෘශ- කීදෘක්ෂ- කීදෘශ්" නම් වේ. අයම් ඉව දෘශ්‍යතෙ, මොහු මෙන් දක්නා ලැබේ

**a. සර්වාදිත්වාට්ටෙරාත්වම්.** [1] **භවානිව දෘශ්‍යතෙ 'සෞ= භවාදෘශඃ- භවාදෘක්ෂඃ- භවාදෘක්. "සහාදෙඃ සාදිඃ."** [2] **සමාන ඉව දෘශ්‍යතෙ'සෞ= සදෘශඃ- සදෘක්ෂඃ- සදෘක්.**

## 30. අදසෝ'මූ. [3] (අදසඃ 6-1. අමූ 1- 1.)

**b. අදස් ශබ්දස්‍ය ටගාදිෂු සත්සු අමූ ආදෙශො භවති.** [4] **අසාවිව දෘශ්‍යතෙ 'සෞ= අමූදෘශඃ- අමූදෘක්ෂඃ- අමූදෘක්= ශ්.**

---

නු යි; ඊදෘශඃ- ඊදෘක්ෂඃ- ඊදෘක්, "ඊදෘශ- ඊදෘක්ෂ- ඊදෘශ්" නම් වේ. ඊදෘශී, ස්ත්‍රීලිඞ්ගයෙහි ඊප් ප්‍රත්‍යය වූ කල්හි "ඊදෘශී" යනු වේ. වාතී, වාතී තොමෝ යි.

a. සර්වාදිත්වාත්, (භවත් ශබ්දය) සර්වනාම බැවින්; ටෙඃ, ටිසංඥයට; ආත්වම්, ("ආ සර්වාදෙඃ" යි) ආකාර බව වේ. භවාන් ඉව දෘශ්‍යතෙ, භවත්හු මෙන් දක්නා ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; භවාදෘශඃ- භවාදෘක්ෂඃ- භවාදෘක්, "භවාදෘශ- භවාදෘක්ෂ- භවාදෘශ්" නම් වේ. "සහාදෙඃ සාදිඃ" යන සූත්‍රයෙන් සමාන ශබ්දයට 'ස' ආදෙශ වේ. සමානඃ ඉව දෘශ්‍යතෙ, සමානයකු මෙන් දක්නා ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; සදෘශඃ- සදෘක්ෂඃ- සදෘක්, "සදෘශ- සදෘක්ෂ- සදෘශ්" නම් වේ. (සර්වාදි නො වන හෙයින් "ආ සර්වාදෙඃ" යි ආකාර නො වේ.)

30. අමූ ආදෙශවිධි සූත්‍ර යි. පූර්ව සූත්‍රයට මෙන් **දෘශෞ- ක්විපි- ටක්සකොඃ** යනු අනුවෘත්ත යි. දෘශෞ, දෘශ් ධාතුව පර කල්හි; ක්විපි, ක්විප් ප්‍රත්‍යය ද; ටක්සකොඃ, ටක්- සක් ප්‍රත්‍යය දෙක ද (ඉන් පර ව) ඇති කල්හි; අදසඃ, අදස් ශබ්දයට; අමූ, අමූ යනාදෙශ වේ.

b. ටගාදිෂු සත්සු, ටක් ආදි ප්‍රත්‍යයන් ඇති කල්හි; අදස් ශබ්දස්‍ය, අදස් ශබ්දයට; අමූ ආදෙශඃ භවති, 'අමූ' ආදෙශය වේ. අසෞ ඉව දෘශ්‍යතෙ, අසවලා මෙන් දක්නා ලැබේ නු යි; අසෞ,

---

1. "භවදාදිෂු දෘශෙෂ්ටක්සාරාදයඃ පූර්වස්‍ය ටෙර්දීර්ඝතා ච වක්තව්‍යා" යි පොත්හි පෙණේ. "දෘශෙෂ්ටක්සකෞ-" යි ටගාදිය ද, "ආ සර්වාදෙඃ" යි ආකාරය ද වන හෙයින් ඒ ඃනිරර්ථක ය.

2. "වකාරාන්ත එතෙෂු ප්‍රත්‍යයෙෂු පරෙෂු සමාන ශබ්දස්‍ය සො වාච්‍යඃ" යි පොත්හි එයි. එහෙත් "සහාදෙඃ සාදිඃ" යි 'සමාන' ශබ්දයට සකාරය වන හෙයින් එය ද නිරර්ථක ය.

3. අදසො'මූ ආදෙශඃ- පොත්හි.

4. කිතිපරෙ- පොත්හි.

a. "ප්‍රත්‍යයොත්තරපදයොඃ පරතො යුෂ්මදස්මදොරෙකත්වෙ ත්වද්- මද් ඉත්‍යෙතාවාදෙශෞ භවතඃ."

b. ත්වමිව දෘශ්‍යතෙ 'සෞ= ත්වාදෘශඃ- ත්වාදෘක්ෂඃ- ත්වාදෘක්= ග්. අහමිව දෘශ්‍යතෙ 'සෞ= මාදෘශඃ-මාදෘක්ෂඃ- මාදෘක්= ග්. යූයමිව දෘශ්‍යතෙ 'සෞ= යුෂ්මාදෘශඃ- යුෂ්මාදෘක්ෂඃ- යුෂ්මාදෘක්. වයමිව දෘශ්‍යතෙ 'සෞ= අස්මාදෘශඃ- අස්මාදෘක්ෂඃ- අස්මාදෘක්. ටකාරානුබන්ධත්වාදීප්. තාදෘශී, යාදෘශී, එතාදෘශී, ත්වාදෘශී, මාදෘශී, අන්‍යාදෘශී, යුෂ්මාදෘශී, අස්මාදෘශී, භවාදෘශී ඉත්‍යාදි.

---

මෙතෙමේ; අමූදෘශඃ- අමූදෘක්ෂඃ- අමූදෘක්= ග්, "අමූදෘශ- අමූදෘක්ෂ- අමූදෘශ්" යනු වේ. (මෙහි "අමූදෘක්=ග්" යන්නෙන් අමූදෘශ් ශබ්ද ප්‍රථමෛකවචනයෙහි "අමූදෘක්- අමූදෘග්" යි රූප දෙකක් ලැබෙන බව දක්වයි. මෙබඳු අන් තැන්හි ද මෙසේ දත යුතු. මීට පෙර කියන ලද අන්‍යාදෘශ් ආදි ක්විබන්ත ශබ්දයන්ගේ ද මෙසේ ම රූප ද්වය බැගින් ලැබේ.)

a. ප්‍රත්‍යය උත්තරපදයොඃ, ප්‍රත්‍යය ය- උත්තරපදය යන දෙක; පරතඃ, පර කල්හි; යුෂ්මදස්මදොඃ, යුෂ්මද්- අස්මද් ශබ්ද දෙකට; එකත්වෙ, එක වචනයෙහි; ත්වද් මද් ඉති, ත්වද්- මද් යන; එතෞ ආදෙශෞ, මේ ආදෙශ දෙදෙන; භවතඃ, වෙත්. (මෙයින් "ත්වනම දෙකත්වෙ" යන සූත්‍රය සිහිපත් කෙරෙයි. ත්වද්- මද් ආදෙශ වූ පසු "ආ සර්වාදෙඃ" යි ටිසංඥසට ආකාරාදෙශ වේ.)

b. ත්වම් ඉව දෘශ්‍යතෙ, තා මෙන් දක්නා ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; ත්වාදෘශඃ- ත්වාදෘක්ෂඃ- ත්වාදෘක්=ග්, "ත්වාදෘශ- ත්වාදෘක්ෂ- ත්වාදෘශ්" නම් වේ. අහම් ඉව දෘශ්‍යතෙ, මා මෙන් දක්නා ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; මාදෘශඃ- මාදෘක්ෂඃ- මාදෘක්=ග්, "මාදෘශ- මාදෘක්ෂ- මාදෘශ් නම් වේ. යූයම් ඉව දෘශ්‍යතෙ, තොප මෙන් දක්නා ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; යුෂ්මාදෘශඃ- යුෂ්මාදෘක්ෂඃ- යුෂ්මාදෘක්, "යුෂ්මාදෘශ- යුෂ්මාදෘක්ෂ - යුෂ්මාදෘශ්" නම් වේ. වයම් ඉව දෘශ්‍යතෙ, අප මෙන් දක්නා ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; අස්මාදෘශඃ- අස්මාදෘක්ෂඃ- අස්මාදෘක්, "අස්මාදෘශ- අස්මාදෘක්ෂ- අස්මාදෘශ්" නම් වේ. ටකාරානුබන්ධත්වාත්, ටක්ප්‍රත්‍යය ටකාරය

## 31. ණිනිරතීතෙ. (ණිනිඃ 1-1. අතීතෙ 7-1.)

**a. ධාතොරතීතෙ කාලෙ ශීලෙ'ථෙ ච ණිනි ප්‍රත්‍යයො භවති.**

**b. කරණෙ උපපදෙ යජෙර්ණිනිර්වාච්‍යඃ. "ඉතාං ශෞ සෞ." අග්නිෂ්ටොමෙන ඉයාජ ඉති, වා අග්නිෂ්ටොමෙන අයාක්ෂීත් ඉති= අග්නිෂ්ටොමයාජී, වා අග්නිෂ්ටොමං යෂ්ටුං ශීලං යස්‍ය සඃ= අග්නිෂ්ටොමයාජී. අශ්‍රාද්ධං භුඞ්ක්තෙ ඉත්‍යෙවං ශීලඃ= අශ්‍රාද්ධභොජී. අසිං භුඞ්ක්තෙ ඉත්‍යෙවංශීලඃ =අසිභොජී. සුඛභොජී. උෂ්ණං භුඞ්ක්තෙ ඉත්‍යෙවංශීලඃ වා භුක්තවාන් ඉති= උෂ්ණභොජී.**

---

අනුබන්ධ කොට ඇති බැවින්; ඊප්, ස්ත්‍ර්‍යර්ථයෙහි "ෂ්ටිද්‍රිතඃ" යි ඊප් ප්‍රත්‍යය වේ. තාදෘශී -පෙ- භවාදෘශී යනු පිළිවෙළින් තාදෘශ- යාදෘශ- එතාදෘශ- ත්වාදෘශ- මාදෘශ- අන්‍යාදෘශ- යුෂ්මාදෘශ- අස්මාදෘශ- භවාදෘශ ශබ්දයන් කෙරෙන් ඊප් ප්‍රත්‍යය වීමෙන් සිද්ධ වූ ස්ත්‍රීලිඞ්ග ප්‍රථමෛක වචන රූපයෝ යි. ඉත්‍යාදි, යනාදිය යි.

31. ණිනි ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. පෙර කී සේ ධාතොඃ- නාම්නි- කර්තරි යනු ද, "ශීලෙ තෘන්" යි සිංහාවලොකිත ගතියෙන් ශීලෙ යනු ද අනුවෘත්ත යි. නාම්නි, නාමයක් උපපද ව ඇති කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; අතීතෙ, අතීත කාලයෙහි ද; ශීලෙ, ශීලාර්ථයෙහි ද; කර්තරි, කර්තෘකාරකයෙහි; ණිනිඃ, ණිනි ප්‍රත්‍යය වේ.

a. ධාතොඃ, ධාතුහු කෙරෙන්; අතීතෙ කාලෙ, අතීත කාලයෙහි ද; ශීලෙ අර්ථෙ ච, ශීලාර්ථයෙහි ද; ණිනි ප්‍රත්‍යයඃ භවති, ණිනි ප්‍රත්‍යය වේ. (ණකාරය වෘද්ධිය පිණිස යි. අන්ත්‍ය ඉකාරය උච්චාරණය පිණිස යි. ශීලාර්ථප්‍රක්‍රියාවක් මතු දක්වෙයි. එහෙත් මේ ප්‍රත්‍යයන්ගේ ද ශීලාර්ථය මෙහි ම කීහ.)

b. කරණෙ උපපදෙ, කරණයක් උපපද ව ඇති කල්හි; යජෙඃ, යජ් ධාතුහු කෙරෙන්; ණිනිඃ වාච්‍යඃ, ණිනි ප්‍රත්‍යය කිය යුතු යි. "ඉතාං ශෞ සෞ" යන්නෙන් ඉකාරයට දීර්ඝ වේ. අග්නිෂ්ටොමෙන, අග්නිෂ්ටොමයෙන්; ඉයාජ ඉති, යාග කෙළේ වූ නු යි; වා, නොහොත්; අග්නිෂ්ටොමෙන අයාක්ෂීත් ඉති, අග්නිෂ්ටොමයෙන් යාග කෙළේ නු යි; අග්නිෂ්ටොමයාජී, "අග්නිෂ්ටොම-

**a. "හනො ඝත්." හනෙතර්නිඤ්ඤ්‍යාං ණීනිවාච්‍යඃ. පිතරං ජඝාන වා අවධීත් ඉත්‍යෙවංශීලඃ= පිතෘඝාතී. දණ්ඩින් ශබ්ද වද්‍රෑපං ඥෙයම්.**

---

යාජීන්" නම්. (කරණොපපද * "යජ්" ධාතුවෙන් පර ව අතීතාර්ථයෙහි 'ණීනි' ප්‍රත්‍යය යි. "අත උපධායාඃ" යි වෘද්ධි යි. **"සොත්‍රෙණ සමාප්‍යමානො යො යාගඃ සො'ග්නිෂ්ටොමඃ"** යි කී හෙයින් **අග්නිෂ්ටොම** නම් සතුතියකින් නිමවනු ලබන යාගය යි.) වා, නොහොත්; අග්නිෂ්ටොමං යෂ්ටුම්, අග්නිෂ්ටොම යාගය කරන්නට; ශීලම්, සවභාවය වූයේ; යස්‍ය, යමෙකුගේ ද; **සඃ**, හෙතෙමේ; අග්නිෂ්ටොමයාජී, "අග්නිෂ්ටොමයාජීන්" නම්. (තාච්ඡීල්‍යයෙහි 'ණීනි' ප්‍රත්‍යය යි.) අශ්‍රාද්ධං භුඞ්කෙත ඉති, මතක බත් නුබුදියි යන; එවංශීලඃ, මෙබඳු සවභාවය ඇත්තේ; අශ්‍රාද්ධභොජී, "අශ්‍රාද්ධභොජීන්" නම්. (මෙහි භොජනක්‍රියාව සමග යෙදෙන ප්‍රතිෂෙධවාචක ශබ්දය 'ශ්‍රාද්ධ' ශබ්දය සමග යෙදුනේ අයුක්තාර්ථ සමාස වශයෙනි.) අඩිං භුඞ්කෙත ඉති, අඩක් බුදියි යන; එවංශීලඃ, මෙබඳු සවභාවය ඇත්තේ; අඩිභොජී, "අඩිභොජීන්" නම්. සුඛභොජී, 'සුඛං භුඞ්කෙත ඉත්‍යෙවංශීලඃ' (=සැප අනුභව කොරෙයි යන මෙබඳු සවභාවය ඇත්තේ) යන වාක්‍යයෙහි "සුඛභොජීන්" නම්. උෂ්ණං භුඞ්කෙත ඉති, උණුසුම් බොජුන අනුභව කොරෙයි යන; එවංශීලඃ, මෙබඳු සවභාවය ඇත්තේ; වා, නොහොත්; භුක්තවාන් ඉති, අනුභව කොළේ නු යි; උෂ්ණභොජී, "උෂ්ණභොජීන්" නම්.

(මේ සියල්ල අතීතාර්ථ- ශිලාර්ථ දෙකට සාධාරණ යි. අශ්‍රාද්ධං **භොක්තුං ශිලං යස්‍ය සඃ** යනාදි වශයෙන් ද ශීලාර්ථයෙහි වාක්‍ය ගත හැකි ය. අශ්‍රාද්ධං **භුක්තවාන්** යනාදි වශයෙන් අතීතාර්ථයෙහි වාක්‍ය ගත යුතු.)

a. "හනො ඝත්" යන්නෙන් හන් ධාතුහට 'ඝත්' ආදෙශ වේ. හනෙතඃ, හන් ධාතුහු කෙරෙන්; නිඤ්ඤ්‍යාම්, නිඤ්ඤ්‍යර්ථයෙහි; ණීනිඃ වාච්‍යඃ, ණීනි ප්‍රත්‍යය කිය යුතු යි. පිතරං ජඝාන, පියා නැසුයේ ලු; වා, නොහොත්; අවධීත් ඉති, නැසුයේ ය යන;

---

* ඉයාජ හෝ අයාක්ෂීත් යන ක්‍රියාවට කර්මය වන්නේත් අග්නිෂ්ටොමය මැයි. එහෙයින් "අග්නිෂ්ටොමෙන" යන්නෙහි කරණත්වය කෙසේ ලැබේ ද යත්? එලොත්පාදනයෙහි කරණත්වය ලැබෙන බැවිනි. තත්වදීපිකාව බලනු.

**a. කර්තර්යුපමානෙ ණිනිර්වාච්‍යඃ. අභ්‍ර ඉව පතතීති= අභ්‍රපාතී. මත්ත ඉව කරෝතීති= මත්තකාරී. හංස ඉව ගච්ඡතීති= හංසගාමී. ස්ත්‍රී චෙත්= හංසගාමිනී, ඊප්.**

## 32. ක්විප්ක්වනිබ්ඩාඃ. (ක්විජ්ක්වනිබ්ඩාඃ।1- 3.)

**b. ධාතෝරතීතෙ කාලෙ ශීල'ර්ථෙ ච ක්විප්- ක්වනිප්- ඩ ඉත්‍යෙතෙ ප්‍රත්‍යයා භවන්ති.**

---

එවංශීලඃ, මෙබඳු ස්වභාවය ඇත්තේ; පිතෘඝාතී, "පිතෘඝාතින්" නම්. (පිතෘඝාතකය නිඤුවක් බව ප්‍රකට ය.) රූපම්, ශබ්ද රූපය; දණ්ඩින් ශබ්දවත්, දණ්ඩින් ශබ්දය මෙන්; ඥෙයම්, දත යුතු යි. (සියලු ණිනි ප්‍රත්‍යයාන්ත ශබ්ද 'දණ්ඩින්' ශබ්දය මෙනි.)

a. කර්තරි උපමානෙ, උපමාන වූ කර්තෘවාචක ශබ්දයක් උපපද ව ඇති කල්හි; ණිනිඃ වාච්‍යඃ, ණිනි ප්‍රත්‍යය කිය යුතු යි. අභ්‍රඃ ඉව පතතීති, මෙඝයක් මෙන් වැටේ නු යි; අභ්‍රපාතී, "අභ්‍රපාතින්" නම්. මත්තඃ ඉව කරෝතීති, මත් වූවකු මෙන් කෙරේ නු යි; මත්තකාරී, "මත්තකාරින්" නම්. හංසඃ ඉව ගච්ඡතීති, හංසයකු මෙන් යේ නු යි; හංසගාමී; "හංසගාමින්" නම්. ස්ත්‍රී චෙත්, ඉදින් ස්ත්‍රියක් නම්; හංසගාමිනී, "හංසගාමිනී" නමු. ඊප්, "නුණ ඊප්" යි සූත්‍රාර්ථයෙහි ඊප් ප්‍රත්‍යය වේ.

32. ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. පූර්ව සූත්‍රවලින් ධාතෝඃ- කර්තරි- නාම්නි- ශීලෙ- අතීතෙ යනු අනුවෘත්ත යි. නාම්නි, නාමයක් උපපද ව ඇති කල්හි; ධාතෝඃ, ධාතුහු කෙරෙන්; අතීතෙ, අතීත කාලයෙහි ද; ශීලෙ, ශීලාර්ථයෙහි ද; කර්තරි, කර්තෘකාරකයෙහි; ක්විප් ක්වනිප්ඩාඃ, ක්විප්-ක්වනිප්- ඩ යන ප්‍රත්‍යයෝ වෙත්.

b. ධාතෝඃ, ධාතුහු කෙරෙන්; අතීතෙ කාලෙ, අතීත කාලයෙහි ද; ශීලෙ අර්ථෙ ච, ශීලාර්ථයෙහි ද; ක්විප් ක්වනිප් ඩඃ ඉති, ක්විප්- ක්වනිප්- ඩ යන; එතෙ ප්‍රත්‍යයාඃ, මේ ප්‍රත්‍යයෝ; භවන්ති, වෙත්. (මෙසින් ක්විප්- ක්වනිප් ප්‍රත්‍යය ද්වයය පෙර ද විහිත ය. එහි වර්තමානාර්ථයෙහි ද, මෙහි අතීතාර්ථයෙහි ද වන හෙයින් පුනරුක්ත නො වේ. ඩප්‍රත්‍යයෙහි 'ඩ්' යන්න ඉත් බැවින් "ඩිති ටෙඃ" යි විසංඥ ලොපය වේ.)

ඞ. ක්විප් :- වෘත්‍ර බ්‍රහ්ම භ්‍රූණ එතත්පුබ්බකාදෙව හන්තෙඃ ක්විප් ස්‍යාත් අතිතෙ කාලෙ එව. වෘත්‍රං හතවානිති= වෘත්‍රහා. බ්‍රහ්මහා, භ්‍රූණහා. අන්‍යත්‍ර ශත්‍රුඝාතිත්‍යත්‍ර ණිනිඃ. ශත්‍රුං හන්තීත්‍යෙවංශීලඃ= ශත්‍රුඝාතී. සුෂ්ඨු කරෙති සමාසෞ= සුකෘත්. කර්මකෘත්, පාපකෘත්, පුණ්‍යකෘත්, ශාස්ත්‍රකෘත්, සෝමං සුනොති සමාසෞ= සෝමසුත්. අග්නිං චිනොති සමාසෞ= අග්නිචිත්. ඉත්‍යෙතෙ ක්විබන්තාඃ.

---

ඞ. ක්විප්, ක්විප් ප්‍රත්‍යය කියනු ලැබේ. වෘත්‍ර බ්‍රහ්ම භ්‍රූණ එතත් පූර්වකාත් එව, වෘත්‍ර- බ්‍රහ්මන්- භ්‍රූණ යන මොවුන් පූර්ව කොට ඇත්තා වූ ම; හන්තෙඃ, හන් ධාතුහු කෙරෙන්; අතීතෙ කාලෙ එව, අතීත කාලයෙහි ම; ක්විප් ස්‍යාත්, ක්විප් ප්‍රත්‍යය වන්නේ ය. (මෙයින් 'හන්' ධාතුහු කෙරෙන් අතීතාර්ථයෙහි වන ක්විප් ප්‍රත්‍යයට ස්ථාන කිහ.) වෘත්‍රං හතවාන් ඉති, වෘත්‍ර නම් අසුරයා නැසුයේ නු යි; වෘත්‍රහා, "වෘත්‍රහන්" නමි. බ්‍රහ්මහා, 'බ්‍රාහ්මණං හතවාන්' (=බමුණා නැසූයේ) යන වාක්‍යයෙහි "බ්‍රහ්මහන්" නමි. භ්‍රූණහා, 'භ්‍රූණං හතවාන්' (=ගැබ නැසූයේ) යන වාක්‍යයෙහි "භ්‍රූණහන්" නමි. අන්‍යත්‍ර, අන් තැන්හි; (හෙවත් යථොක්ත ශබ්දත්‍රය හැර අනිකක් උපපද ව ඇති කල්හි 'හන්' ධාතුහු කෙරෙන් අතීතාර්ථයෙහි ක්විප් ප්‍රත්‍යය නො වේ. එහෙයින්;) ශත්‍රුඝාතී ඉති අත්‍ර, "ශත්‍රුඝාතී" යන මෙහි; ණිනිඃ, "ණිනිරතීතෙ" යි ණිනි ප්‍රත්‍යය වේ. ශත්‍රුං හන්ති ඉති, සතුරා නසයි යන; එවංශීලඃ, මෙබඳු ස්වභාවය ඇත්තේ; ශත්‍රුඝාතී, "ශත්‍රුඝාතින්" නමි. ("හතො ඝත්" යි හන් ධාතුහට 'ඝත්' ආදෙශ යි.)

සුෂ්ඨු කරෙති සම, මොනවට කෙළේ නු යි; අසෞ, මෙතෙමේ; සුකෘත්, සුකෘත් නමි. කර්මකෘත්, 'කර්ම කරෙති සම' (=කම් කෙළේ) යන වාක්‍යයෙහි "කර්මකෘත්" නමි. පාපකෘත්, 'පාපං කරෙති සම' (=පව් කෙළේ) යන වාක්‍යයෙහි "පාපකෘත්" නමි. පුණ්‍යකෘත්, 'පුණ්‍යං කරෙති සම' (=පින් කෙළේ) යන වාක්‍යයෙහි "පුණ්‍යකෘත්" නමි. ශාස්ත්‍රකෘත්, 'ශාස්ත්‍රං කරෙති සම' (=ශාස්ත්‍ර කෙළේ) යන වාක්‍යයෙහි "ශාස්ත්‍රකෘත්" නමි. ('කෘ' ධාතුවෙන් පර ව ක්විප් ප්‍රත්‍යය හා තුඟාගම යි.) සෝමං සුනොති සම, සෝම රස මිරිකි නු යි; අසෞ, මෙතෙමේ; සෝමසුත්, "සෝමසුත්" නමි. ("සු" ධාතු යි.) අග්නිං චිනොති සම, ගිනි රැස් කෙළේ නු යි; අග්නිචිත්, "අග්නිචිත්" නමි. ඉති එතෙ ක්විබන්තාඃ. යන මොහු ක්විප් ප්‍රත්‍යයාන්ත යෝ යි.

a. ක්වනිප්:- යුධි සම්ප්‍රහාරෙ, රාජානං යුධ්‍යතෙ ස්මාසෞ= රාජයුධ්වා. රාජානං කාරෙතීත්‍යෙවංශීලඃ= රාජකෘත්වා. සහ යුධ්‍යතෙ ස්මාසෞ= සහයුධ්වා. සහකෘත්වා. ෂුඤ් අභිෂවෙ,* ක්වනිප්, තුක්, කිත්ත්වාද් ගුණාභාවඃ. සුනොති ස්මාසෞ වා සුතවාන් ඉති= සුත්වා. සුත්වා. යජති ස්මාසෞ= යජ්වා. පාර මද්‍රාක්ෂීත් ඉති= පාරදෘශ්වා. ඉත්‍යෙතෙ ක්වනිබන්තාඃ.

b. ජනී ප්‍රාදුර්භාවෙ.

c. සප්තම්‍යාං ජනෙර්ඩඃ.

---

a. ක්වනිප්, ක්වනිප් ප්‍රත්‍යය දක්වනු ලැබේ. යුධි සම්ප්‍රහාරෙ, "යුධ්" ධාතුව මොනවට පහර දීම් අර්ථයෙහි වේ. රාජානං යුධ්‍යතෙ ස්ම, රජුට පහර දුනී යන අර්ථයෙහි; රාජයුධ්වා, "රාජයුධ්වන්" නම්. රාජානං කාරෙති ඉති, රජු කෙරෙයි යන; එවංශීලඃ, මෙබඳු ස්වභාවය ඇත්තේ; රාජකෘත්වා, "රාජකෘත්වන්" නම්. සහ යුධ්‍යතෙ ස්ම, සමග පහර දුනී යන අර්ථයෙහි; සහයුධ්වා, "සහයුධ්වන්" නම්. සහකෘත්වා, 'සහ කාරෙති ස්ම, සහ කාරෙතීත්‍යෙවංශීලො වා' (=සමග කෙළේ හෝ සමග කෙරෙයි යන මෙබඳු ස්වභාවය ඇත්තේ) යන වාක්‍යයෙහි "සහකෘත්වන්" නම්. ෂුඤ් අභිෂවෙ, "ෂු" ධාතුව අභිෂවයෙහි වේ. (81 පිට බලනු.) ක්වනිප්, ක්වනිප් ප්‍රත්‍යය වේ. තුක්, තුගාගම වේ. කිත්ත්වාත්, කිත් බැවින්; ගුණ අභාවඃ, ගුණ නො වීම වේ. සුනොති ස්ම ඉති, අභිෂවය කෙළේ නු යි; සුත්වා, "සුත්වන්" නම්. සුතවාන් වා, "සුතවාන් ඉති සුත්වා" කියා කෘදන්ත වශයෙන් හෝ විග්‍රහය වේ. සුත්වා, 'සෞති ස්ම සුතවාන් වා' (=සුතී කෙළේ) යන වාක්‍යයෙහි "සුත්වන්" නම්. යජති ස්ම, යාග කෙළේ නු යි; අසෞ, මෙතෙමේ; යජ්වා, "යජ්වන්" නම්. පාරම් අද්‍රාක්ෂීත් ඉති, පර තෙර දිටී නු යි; පාරදෘශ්වා, "පාර දෘශ්වන්" නම්. ඉති එතෙ, යන මොහු; ක්වනිබන්තාඃ, ක්වනිප් ප්‍රත්‍යයාන්තයෝ යි.

b. (ඉක්බිති ඩ ප්‍රත්‍යය දක්වයි.) ජනී ප්‍රාදුර්භාවෙ, 'ජන්' ධාතුව පහළ වීම් අර්ථයෙහි වේ.

c. සප්තම්‍යාම්, සප්තමී විභක්ත්‍යන්තයක් උපපද ව ඇති කල්හි; ජනෙඃ, ජන් ධාතුහු කෙරෙන්; ඩඃ, ඩ ප්‍රත්‍යය වේ.

---

* ෂුඤ් ප්‍රාණිප්‍රසවෙ- පොත්හි.

ඞ. සප්තම්‍යාං ජනෙර්ධාතොර්ඩඃ ප්‍රත්‍යයො භවති අතීතෙ කාලෙ. සරසි ජායතෙ සම තත්= සරසිජං, පදුමම්. "අලුක් ක්වචිත්" සරසි ජාතං= සරොජම්. සංස්කාරජඃ, අජඃ, ද්විජඃ. පරිතඃ ඛාතා ඉති= පරිඛා. ප්‍රකෘෂ්ණ ජායතෙ සෙති= ප්‍රජා. සබ්බං ගතවාන් ඉති= සබ්බගඃ, වා සබ්බං ගච්ඡති සමාසෞ= සබ්බගඃ. ගෛ ශබ්දෙ, සාම ගීතවාන් ගායති සමාසෞ= සාමගඃ. ඉති ඩප්‍රත්‍යයාන්තාඃ.

## ඉති කෘදන්ත ප්‍රක්‍රියා.

---

ඞ. සප්තම්‍යාම්, සප්තම්‍යන්තයක් උපපද ව ඇති කල්හි; ජනෙඃ ධාතොඃ, ජන් ධාතුහු කෙරෙන්; අතීතෙ කාලෙ, අතීත කාලයෙහි; ඩඃ ප්‍රත්‍යයඃ භවති, ඩ ප්‍රත්‍යය වේ. සරසි ජායතෙ සම, විලෙහි හටගත්තේ නු යි; තත්, එය; සරසිජම්, "සරසිජ" නම්. පද්මම්, පියුම යි. "අලුක් ක්වචිත්" යන්නෙන් (කිසි තැනෙක්හි විබත් ලොප් නො වන හෙයින් මෙහි) ලොප් නො වී ය. සරසි ජාතම්= සරොජම්, විලෙහි හටගත්තේ නු යි "සරොජ" නම්. (මෙහි විබත් ලොප් විය. "සරස් + ජ" යි සිටි කල්හි; "ස්‍රොර්විසර්ගඃ" යි සකාරයට විසර්ග ව "හබෙ" යි උකාර ව "උ ඔ" යි සන්ධි විය.) සංස්කාරජඃ, 'සංස්කාරාජ්ජාතඃ' (=සංස්කාරයෙන් උපන්නේ) යන වාක්‍යයෙහි "සංස්කාරජ" නම්. අජඃ, 'න ජාතඃ' (=නූපන්නේ) යන වාක්‍යයෙහි "අජ" නම්. ("නා" යි නකාරයට අකාරාදෙශ යි.) ද්විජඃ, 'ද්වාභ්‍යාං ජාතඃ' (=ජන්ම- සංස්කාර දෙකින් උපන්නේ) යන වාක්‍යයෙහි "ද්විජ" නම්.

පරිතඃ ඛාතා ඉති, හාත්පසින් කනින ලදු නු යි; පරිඛා, "පරිඛා" නමූ. ප්‍රකෘෂ්ණ ජායතෙ සම ඉති, ප්‍රකෘෂ්ටියෙන් උපන්නී නු යි; ප්‍රජා, "ප්‍රජා" නමූ. (මේ දෙතැන්හි "ආබතඃ ස්ත්‍රියාම්" යි ආප් ප්‍රත්‍යය යි.) සර්වං ගතවාන් ඉති= සර්වගඃ, සියල්ලට ගියේ නු යි "සර්වග" නම්. වා, නොහොත්; "සර්වං ගච්ඡති සමාසෞ= සර්වගඃ" කියා ආඛ්‍යාත වශයෙන් විග්‍රහය වේ. ගෛ ශබ්දෙ, 'ගෛ' ධාතුව ශබ්දාර්ථයෙහි වේ. සාම ගීතවාන්, සාමවේදය ගැයී නු යි; අසෞ, මෙතෙමේ; සාමගඃ, "සාමග" නම්. ගායති සම, "සාම ගායති සම" කියා හෝ විග්‍රහය වේ. ඩප්‍රත්‍යයාන්තාඃ, ඩප්‍රත්‍යයාන්තයෝ; ඉති, මෙසේ යි.

කෘදන්ත ප්‍රක්‍රියා, කෘත් සංඥ ප්‍රත්‍යයන් අන්ත කොට ඇති ශබ්දයන්ගේ ප්‍රකරණය; ඉති, මෙසේ යි.

## කෘදන්තප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාව සමාප්ත යි.

### a. අථ නිෂ්ඨාධිකාර ප්‍රක්‍රියා:-

## 33. ක්තක්තවතූ. (කතකතවතු 1-2.)

**b. ධාතොරතීතෙ කාලෙ ක්තක්තවතූ ප්‍රත්‍යයෞ භවතඃ. භාවකර්මණොඃ ක්තඃ, ක්තවතුඃ කර්තර්‍යෙව. උකාරිතෞ, උර්නුමර්ථඃ.**

**c. ස්නා ශෞචෙ, ස්නායතෙ ස්ම තත් = ස්නාතං ත්වයා. ආගම්‍යතෙ ස්ම තත් = ආගතම්. සුප්‍යතෙ ස්ම තත් = සුප්තං දෙවදත්තෙන. භාවස්‍යෛකත්වාදෙකවචනම්, නපුංසකත්වඤ්ච. භාවෙ නපුංසකතා.**

---

a. අථ, ඉක්බිති; නිෂ්ඨාධිකාර ප්‍රක්‍රියා, නිෂ්ඨා සංඥ ප්‍රත්‍යයන් සම්බන්ධ ප්‍රක්‍රියාව දක්වනු ලැබේ.

33. නිෂ්ඨා ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. **ධාතොඃ** යනු ද, "**ණීති රතීතෙ**" යි **අතීතෙ** යනු ද අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; අතීතෙ, අතීත කාලයෙහි; ක්තක්තවතූ, ක්ත- ක්තවතු යන ප්‍රත්‍යයෝ වෙත්.

b. ධාතොඃ, ධාතුහු කෙරෙන්; අතීතෙ කාලෙ, අතීත කාල යෙහි; ක්තක්තවතූ ප්‍රත්‍යයෞ, ක්ත- ක්තවතු යන ප්‍රත්‍යය දෙදෙන; භවතඃ, වෙත්. භාවකර්මණොඃ, භාව- කර්ම දෙක්හි; ක්තඃ, ක්ත ප්‍රත්‍යය වේ. ක්තවතුඃ, ක්තවතු ප්‍රත්‍යය; කර්තරි එව, කර්තෘ කාරක යෙහි ම ය. උකෞ ඉතෞ, උකාර- කකාර දෙක ඉත් ය. උඃ, (ක්තවතු ප්‍රත්‍යයයෙහි) උකාරය; නුමර්ථඃ, "ව්‍රිතො නුම්" යි නුමාගම ය ප්‍රයෝජන කොට ඇත්තේ ය. (කකාරය ගුණප්‍රතිෂෙධය පිණි ස යි. **නිෂ්ඨා** යනු මොවුන්ට **පාණිනීය** සංඥ යි.)

c, ස්නා ශෞචෙ, "ස්නා" ධාතුව පවිත්‍ර බැව්හි (=නෑමෙහි) වේ. ස්නායතෙ ස්ම, නෑම වී නු යි; තත්, එය; ස්නාතම්, "ස්නාත" නම්. ත්වයා, තා විසිනි. ආගම්‍යතෙ ස්ම, ඊම වී නු යි; තත්, එය; ආගතම්, "ආගත" නම්. සුප්‍යතෙ ස්ම, සිටීම වී නු යි; තත්, එය; සුප්තම්, "සුප්ත" නම්. දෙවදත්තෙන, දෙව්දත් විසිනි. (භාවයෙහි ක්ත ප්‍රත්‍යයට උදාහරණ යි.) භාවස්‍ය, භාවය නමා; එකත්වාත්, එකක් බැවින්; එකවචනම්, එකවචනය ද; නපුංසකත්වං ච, නපුංසක ලිඞ්ග බව ද වේ. භාවෙ, භාවයෙහි; නපුංසකතා, නපුංසක

**9. අන්තඃ ප්‍රාන්තෙ ‘න්තිකෙ නාශෙ- ස්වරූපෙ ච මනොහරෙ,**
**ධාත්වර්ථඃ කෙවලඃ ශුද්ධො- භාව ඉත්‍යභිධීයතෙ.**

**ක. ක්‍රියතෙ ස්මාසෞ= කෘතඃ, කටස්තෙන. ස කටං කෘතවාන්. කරොති ස්මාසෞ= කෘතවාන්. කෘෂ්ණඃ සර්වං කෘතවාන්. “ව්‍රිතො නුම්” ඉති නුමාගමඃ.**

---

ලිඞ්ග බව වේ. (මේ කී එකත්වය ආඛ්‍යාත භාවයට විනා කෘදන්ත භාවයට නිත්‍ය නො වේ. **‘කෘදභිහිතො භාවො ද්‍රව්‍යවත් ප්‍රකාශතෙ’** යි භාෂ්‍යකාරයන් කී පරිදි කෘදන්ත භාවය ද්‍රව්‍යයක් මෙන් ද්‍රව්‍යධර්ම වූ ලිඞ්ග සංඛ්‍යාදිය භජනය කරණ හෙයින් ද්විවචන- බහු වචන ද විය හැකි බැවිනි.)

9. අන්තඃ, අන්ත ශබ්දය; ප්‍රාන්තෙ, කෙළවර ය යන අර්ථයෙහි ද; අන්තිකෙ, සමීපාර්ථයෙහි ද; නාශෙ, විනාශාර්ථයෙහි ද; ස්වරූපෙ, ස්වභාවාර්ථයෙහි ද; මනොහරෙ ච, මනරම් ය යන අර්ථයෙහි ද පවතියි. කෙවලඃ, හුදකලා වූ; ශුද්ධඃ, පිරිසිදු වූ (=කර්ම කර්ත්‍රාදිය හා මිශ්‍ර නුවූ;) ධාත්වර්ථඃ, ධාතුහුගේ අර්ථමාත්‍රය; භාවඃ ඉති, භාවය යි; අභිධීයතෙ, කියනු ලැබේ. (මෙහි පූර්වාර්ධයෙන් මෙතැනට වැඩක් නැත ද අපරාර්ධයෙහි ප්‍රයෝජනය සලකා ශ්ලොකය සම්පූර්ණයෙන් දක්වන ලදී. ආඛ්‍යාත- කෘදන්ත දෙක්හි ම හුදු ධාත්වර්ථ මාත්‍රය භාවය යි උගන්වන හෙයින් සාධ්‍යරූප ධාත්වර්ථ මාත්‍රය ආඛ්‍යාත භාවය යි ද, සිද්ධරූප ධාත්වර්ථ මාත්‍රය කෘදන්ත භාවය යි ද දත යුතු යි.)

ක. ක්‍රියතෙ ස්ම, කරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; කෘතඃ, “කෘත” නම්. තෙන, ඔහු විසින්; කටඃ, කළාල තෙමේ යි. (කර්ම කාරකයෙහි ක්ත ප්‍රත්‍යයට උදාහරණ යි.) සඃ, හෙතෙමේ; කටම්, කළාල; කෘතවාන්, කෙළේ ය. කරොති ස්ම, කෙළේ නු යි; අසෞ, මෙතෙමේ; කෘතවාන්, “කෘතවත්” නම්. කෘෂ්ණඃ, කෘෂ්ණ තෙමේ; සර්වම්, සියල්ල; කෘතවාන්, කෙළේ ය. ව්‍රිතො නුම් ඉති, “ව්‍රිතො නුම්” යන සූත්‍රයෙන්; නුමාගමඃ, ‘නුම්’ ආගම වේ. (“අත්ව සොඃ සෞ” යි දීර්ඝ ද, “හසෙපඃ සෙර්ලොපඃ” යි සිලොපය ද, “සංයොගාන්තස්‍ය ලොපඃ” යි තකාර ලොපය ද වේ. යුෂ්මදර්ථක භවත් ශබ්දය මෙනි. ක්තවතු ප්‍රත්‍යයට උදාහරණ යි.)

## 34. ගත්‍යර්ථාදකර්මකාච්ච කර්ත්‍රිඃ ක්තඃ.

(ගත්‍යර්ථාත් 5-1. අකර්මකාත්- 5-1. ච- නි: කර්ත්‍රි 7-1. ක්තඃ 1-1.)

**a. ගත්‍යර්ථාදකර්මකාච්ච කර්ත්‍රි ක්තඃ ප්‍රත්‍යයො භවති, චාද් භාවකර්මණොරපි. "ලොපස්ත්වනුදාත්ත තනාම්." ගච්ඡති සම ඉති= ගතඃ. "ස්ථාමී" තිෂ්ඨති සම ඉති= ස්ථිතඃ. "ක්‍රාතඃ" අටති සම ඉති=අටිතඃ, ශම- දම උපශමෙ.**

**b. ඤදමාන්තස්‍ය ක්ඞිති ඣසෙ දීර්ඝඃ.**

**c. ඤදමාන්තස්‍ය ධාතොර්දීර්ඝො භවති ක්ඞිති ඣසෙ පරෙ ක්විපි වා. ශාම්‍යති සම ඉති= ශාන්තඃ. දාම්‍යති සම ඉති= දාන්තඃ. වුවම් උද්ගිරණෙ, වමති සම ඉති= වාන්තඃ.**

---

34. ක්ත ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ගත්‍යර්ථාත්, ගමනාර්ථ ධාතුහු කෙරෙන් ද; අකර්මකාත් ච, අකර්මක ධාතුහු කෙරෙන් ද; කර්ත්‍රි, කර්තෘකාරකයෙහි; ක්තඃ, ක්ත ප්‍රත්‍යය වේ.

a. ගත්‍යර්ථාත්, ගමනාර්ථ ධාතුහු කෙරෙන් ද; අකර්මකාත් ච, අකර්මක ධාතුහු කෙරෙන් ද; කර්ත්‍රි, කර්තෘකාරකයෙහි; ක්තඃ ප්‍රත්‍යයඃ භවති, ක්ත ප්‍රත්‍යය වේ. චාත්, චශබ්දයෙන්; භාවකර්මණොඃ අපි, භාව- කර්ම දෙක්හි ද ක්ත ප්‍රත්‍යය වේ. "ලොපස්ත්වනුදාත්ත තනාම්" යන්නෙන් ධාත්වන්තයට ලොප් වේ. ගච්ඡති සම ඉති, ගියේ නු යි; ගතඃ, "ගත" නම්. "ස්ථාමී" යන්නෙන් ආකාරයට ඉකාරය වේ. තිෂ්ඨති සම ඉති, සිටියේ නු යි; ස්ථිතඃ, "ස්ථිත" නම්. "ක්‍රාතඃ" යන්නෙන් ඉඩාගම වේ. අටති සම ඉති, ගියේ නු යි; අටිතඃ, "අටිත" නම්. ("අට ගතෞ" ධාතු යි.) ශම- දම උපශමෙ, "ශම්- දම්" ධාතු දෙක සන්සිඳීමෙහි වේ.

b. ක්ඞිති ඣසෙ, කිත් වූ ද- ඞිත් වූ ද ඣස ප්‍රත්‍යාහාරය පර කල්හි; ඤදමාන්තස්‍ය, ඤදම ප්‍රත්‍යාහාර වර්ණාන්ත ධාතුහට; දීර්ඝඃ, දීර්ඝ වේ.

c. ක්ඞිති ඣසෙ පරෙ, කිත්- ඞිත් වූ ඣස ප්‍රත්‍යාහාර වර්ණය පර කල්හි; ඤදමාන්තස්‍ය ධාතොඃ, ඤදම ප්‍රත්‍යාහාර වර්ණයන් අන්ත කොට ඇති ධාතුහට; දීර්ඝඃ භවති, දීර්ඝ වේ. ක්විපි, ක්විප් ප්‍රත්‍යය පර කල්හි; වා, විකල්පයෙන් දීර්ඝ වේ. ශාම්‍යති සම ඉති,

a. යස්‍ය ක්වචිද් විකල්පෙනෙට් තස්‍ය නිෂ්ඨායාං නෙඩ් වාච්‍යඃ, "අධිශීඞ්ස්ථාසාං කර්ම". ශ්ලිෂ් ශීඞ් ස්ථා ආස් ශ්‍රි වස් ජන රුහ ජීර්‍ය්‍යතීනාං සොපසර්ගත්වෙන සකර්මකාණාමපි කර්තරි ක්තො වාච්‍යඃ.

b. රමාමාශ්ලිෂ්‍යති ස්මෙති= ආශ්ලිෂ්ටඃ, කඃ? හරිඃ. හරි රමාමාශ්ලිෂ්ටඃ. ශෙෂමධිශිශ්‍යෙ ඉති= අධිශයිතඃ, කො විෂ්ණුඃ. ශෙෂමධිශයිතො විෂ්ණුඃ. වෛකුණ්ඨමධිතස්ථාවිත්‍යධිෂ්ඨිතඃ, වෛකුණ්ඨමධිෂ්ඨිතඃ. උපාසාඤ්චක්‍රෙ ඉති= උපාසිතඃ, භක්තො හරිම්.

---

සන්සිඳුනේ නු යි; ශාන්තඃ, "ශාන්ත"* නම්. දම්‍යති ස්ම ඉති= දාන්තඃ, දැමුනේ නු යි "දාන්ත" නම්. ටුවම් උද්ගිරණෙ, "වම්" ධාතුව වැමැරීමෙහි වේ. වමති ස්ම ඉති= වාන්තඃ, වමනය කෙළේ නු යි "වාන්ත" නම්. ("නශ්චාපදාන්තස්‍ය ඣලි" යි මකාරයට අනුස්වාර ව "යමා යපෙ 'ස්‍ය'" යි වර්ගාන්තාදෙශ වේ.)

a. යස්‍ය, යම් ධාතුවක්හුගේ ප්‍රත්‍යය සම්බන්ධ ව; ක්වචිත්, කිසි තැනෙක්හි; විකල්පෙන, විකල්පයෙන්; ඉට්, ඉඩාගම වේ ද; තස්‍ය, ඒ ධාතුහුගේ; නිෂ්ඨායාම්, නිෂ්ඨා සංඥ ප්‍රත්‍යය පර කල්හි; න ඉට් වාච්‍යඃ, ඉඩාගම නො වේ ය යි කිය යුතු යි. (වෙට් ධාතුන්ගේ නිෂ්ඨා විෂයෙහි ඉඩාගම නො වන බව මෙයින් කීහ. "ගුපූ රක්ෂණෙ= ගුප්තඃ- ගුප්තවාන්" යනු ඊට උදාහරණ යි.)

"අධිශීඞ්ස්ථාසාං කර්ම" යන සූත්‍රයෙන් ආධාරය කර්ම සංඥ වේ. සොපසර්ගත්වෙන, උපසර්ග සහිත භාවයෙන්; සකර්මකාණාම් අපි, සකර්මක වූ ද; ශ්ලිෂ්— ජීර්‍ය්‍යතීනාම්, ශ්ලිෂ් ආලිඞ්ගනෙ- ශීඞ් ස්වප්නෙ- ෂ්ඨා ගතිනිවෘත්තෞ- ආස් උපවෙශනෙ- ශ්‍රිඤ්- සෙවායාම්- වස නිවාසෙ- ජනී ප්‍රාදුර්භාවෙ- රුහ බීජජන්මනි ප්‍රාදුර්භාවෙ ච- ජෘෂ්ඉර් වයොහානෞ යන ධාතුන් සම්බන්ධ ව; කර්තරි, කර්තෘ කාරකයෙහි; ක්තඃ වාච්‍යඃ, ක්ත ප්‍රත්‍යය කිය යුතු යි. (මෙහි 'ශ්ලිෂ්- ශ්‍රි' යන සකර්මක ධාතූන් කෙරෙන් ද; සෙසු අකර්මක ධාතූන් සොපසර්ගත්වයෙන් සකර්මක වූවත් ඔවුන් කෙරෙන් ද කර්තෘ කාරකයෙහි ක්ත ප්‍රත්‍යය වේ.)

b. රමාම්, සීතාව; ආශ්ලිෂ්‍යති ස්ම ඉති, වැළඳ ගත්තේ නු යි; ආශ්ලිෂ්ටඃ, "ආශ්ලිෂ්ට" නම්. කඃ, කවරෙක් ද? හරිඃ, විෂ්ණු තෙමේ යි. හරිඃ, විෂ්ණු තෙමේ; රමාම්, සීතාව; ආශ්ලිෂ්ටඃ, වැළඳ

---

* "ශාන්ත- දාන්ත- වාන්ත" යන තන්හි දීර්ඝත්වය ඉඩාගමයට බාධක විය. ධාතු. හම සෙට් ය.

භක්තො හරිමුපාසිතඃ ආශ්‍රයති සම ඉති= ආශ්‍රිතඃ. එකාදශීමුපොවාස ඉති= උපොෂිතඃ, වා හරිදිනමුපොවාස ඉති= උපොෂිතඃ.

a. වසික්‍ෂුධොරිට්. *

b. ආභ්‍යාං නිත්‍යමිට් ස්‍යාත්. "සසාදෙඃ ෂඃ" රාමමනුජඥෙ ඉති= අනුජානො 'ව්‍යූතඃ. තමනුජාතඃ. වෘෂමාරූරොහ ඉති= ආරූඪඃ, ශිවඃ. ජෘෂ් වයොහානෞ, "සෘතා ඉර්" "ය්වොර් වි හසෙ" ජගත් අනුජජාර ඉති= අනුජිර්ණො 'ව්‍යූතඃ. ජගදනුජිර්ණො වාසුදෙවඃ.

---

ගත්තේ ය. (මෙයින් කතෘ කාරකයෙහි සිද්ධ ආශ්ලිෂට ශබ්දය වාක්‍යයෙහි යෙදෙන අයුරු දැක්වූහ. මතු උදාහරණවාක්‍ය ද එසේ යි.) ශෙෂම් අධිශිශ්‍යෙ ඉති, අනන්ත නාගරාජයා අධිශයනය කෙළේ (=අනන්තයා පිට සැතපුනේ) නු යි; අධිශයිතඃ, "අධිශයිත" නම්. කඃ, කවරෙක් ද? විෂ්ණුඃ, විෂ්ණු තෙමේ යි. විෂ්ණුඃ, විෂ්ණු තෙමේ; ශෙෂම් අනන්තයා; අධිශයිතඃ, අධිශයනය කෙළේ ය. සවර්ගම්, අධිතෂ්ඨෞ ඉති, සවර්ගයෙහි සිටියේ නු යි; අධිෂ්ඨිතඃ, "අධිෂ්ඨිත" නම්. සවර්ගම් අධිෂ්ඨිතඃ, සවර්ගයෙහි සිටියේ ය. උපාසාඤ්චක්‍රෙ ඉති, එළඹුනේ නු යි; උපාසිතඃ, "උපාසිත" නම්. භක්තඃ, භක්තිමත් තෙමේ; හරිම්, විෂ්ණුහු කරා යි. භක්තඃ, භක්තිමත් තෙමේ; හරිම්, විෂ්ණුහු වෙත; උපාසිතඃ, එළඹුනේ ය. ආශ්‍රයති සම ඉති, ඇසුරු කෙළේ නු යි; ආශ්‍රිතඃ, "ආශ්‍රිත" නම්. එකාදශීම්, එකොළොස්වක; උපොවාස ඉති, උපවාසය කෙළේ නු යි; උපොෂිතඃ, "උපොෂිත" නම්. වා, නොහොත්; හරිදිනම්, හරිදිනයෙහි; උපොවාස ඉති, උපවාස කෙළේ නු යි; උපොෂිතඃ, "උපොෂිත" නම්. (එකොළොස්වක හා දෙළොස්වක්හි ප්‍රථම පාදයත් හරිදින ය යි කියනු ලැබේ. අනනාමාශ්‍රිත්‍ය තිෂ්ඨන්ති පාපානි හරිවාසරෙ යනු පුරාණොක්ති හෙයින් එදින උපවාසක්‍රිරිම වෛදිකයන්ගේ සිරිතැයි හැඟේ.)

a. වසික්‍ෂුධොඃ, 'වස්- ක්‍ෂුධ්' ධාතු දෙදෙනාගේ (ප්‍රත්‍යය සම්බන්ධ ව;) ඉට්, ඉඩාගම වේ.

b. ආභ්‍යාම්, මෙ දෙකින් පර ව; නිත්‍යම්, නිත්‍යයෙන්; ඉට් ස්‍යාත්, ඉඩාගම වන්නේ ය. ("වස නිවාසෙ- ක්‍ෂුධ බුභුක්‍ෂායාම්" යන ධාතු දෙකින් පර වූ ක්ත්වා-, ක්ත- ක්තවතු යන ප්‍රත්‍යයන් සම්බන්ධ ව නිත්‍යයෙන් ඉඩාගම වන බව මෙයින්

---

* වසතික්‍ෂුධොරිට්- පාණිනිය 7-2. 52.

## 35. රඃ. (රඃ 5- 1.)

**a, රේඵාදුත්තරස්‍ය ක්තස්‍ය නෝ භවති. ණත්වම්. පක්ෂෙ තෙන රමාශ්ලිෂ්ටා හරිණා ඉත්‍යාදි ඥෙයම්.**

## 36. ක්තෝ වා.* (ක්තඃ 1-1. වා- නි:).

---

දක්වයි.) "ඝසාදෙඃ ෂඃ" යන්නෙන් සකාරයට ෂකාර වේ. (සම්ප්‍රසාරණය ද වූ කල්හි "උපොෂිත යනු වේ.) රාමම් අනුජජ්ඤෙ ඉති, රාමයා අනු ව උපන්නේ නු යි; අනුජාතඃ, "අනුජාත" නම්. අච්‍යුතඃ, විෂ්ණු තෙමේ යි. තම් අනුජාතඃ, ඔහු අනු ව උපන්නේ ය. වෘෂම් ආරුරොහ ඉති, ගොණු පිටට නැංගේ නු යි; ආරූඪඃ, "ආරූඪ" නම්. ශිවඃ, ඊශ්වර තෙමේ යි. (ආරුහ් + ත, "හො ඪඃ" යි ඪකාර වීමෙන්= ආරුඪ් + ත, "තථොර්ධඃ" යි ධකාර වීමෙන්= ආරුඪ් + ධ, ටුත්වයෙන්= ආරුඪ් + ඪ, "ඪි ඪො ලොපො දීඝශ්ච" යි ඪකාර ලොප හා දීඝී වීමෙන් ආරූඪ යි වේ.) ජෘෂ් වයොහානෞ, "ජෘෂ" ධාතුව වයස පිරිහීමෙහි වේ. "ඍෘත ඉර්" යන්නෙන් 'ඉර්' ආදෙශ වේ. "ය්වොර්ච් හසෙ" යන්නෙන් දීඝී වේ. ජගත් අනුජජාර ඉති, ලොකය අනු ව දිරුයේ නු යි; අනුජීර්ණඃ, "අනුජීර්ණ" නම්. අච්‍යුතඃ, විෂ්ණු තෙමේ යි. වාසුදෙවඃ, විෂ්ණු තෙමේ; ජගත් අනුජීර්ණඃ, ලොකය අනු ව දිරුයේ ය. (ඉක්බිති පදසිද්ධිය දක්වයි.)

35. නකාරාදෙශ විධි සූත්‍ර යි. "දස්තස්‍ය නො දශ්ච" යි නස්‍ය- නඃ යනු ද, "යජාං- පෙ- කිති" යි විඃ විඃ වශයෙන් කිතඃ යනු ද, "ස්වරාතෙතා වා" යි වා යනු ද අනුවෘත්ත යි. රඃ, රකාරයා කෙරෙන් පර වූ; කිතඃ, කිත් වූ; තස්‍ය, තකාරයට; වා, ව්‍යවස්ථා වශයෙන්; නඃ, නකාරාදෙශ වේ.

a. රේඵාත් උත්තරස්‍ය, රේඵයා කෙරෙන් පර වූ; ක්තස්‍ය, ක්ත ප්‍රත්‍යයට, නඃ භවති, නකාරාදෙශ වේ. (මෙයින් ක්ත- ක්තවතු ප්‍රත්‍යයන්ගේ තකාරයට නකාර වේ. අනුවෘත්ත වන වා ශබ්දය ව්‍යවස්ථා වාචක බැවින් පූර්තඃ යනාදියෙහි නකාර නො වේ.) ණත්වම්, "ෂ්‍රුනෞ ණො 'නනෙත" යි ණකාර බව වේ. (එකල්හි "අනුජීර්ණ" යි වේ. සන්ධි- ආඛ්‍යාත ප්‍රක්‍රියා දෙකෙහි ද සූත්‍ර දෙකක් කී හෙයින් "රඃ" යි වෙන් වෙන් වූ සූත්‍ර තුනෙකි.) පක්ෂෙ, පක්ෂයෙහි; "තෙන හරිණා රමා ආශ්ලිෂ්ටා" යි කර්ම කාරකයෙහි

---

* ක්තො වා සෙට්- පොත්හි.

**a. උකාරෝපධාන්මෘෂශ්ච පරඃ සෙට් ක්තඃ ප්‍රත්‍යයඃ කිද් වා භවති.**

**b. දිද්‍යුතෙ තත් ද්‍යුත්‍යතෙ සම වා= ද්‍යුතිතම්- ද්‍යොතිතම්. * ප්‍රකර්ෂේණ දිද්‍යුතෙ ප්‍රකර්ෂේණ ද්‍යුතිං ප්‍රාප්තඃ වා ප්‍රද්‍යොතතෙ සමාසෞ= ප්‍රද්‍යුතිතඃ- ප්‍රද්‍යොතිතඃ. † මෘෂ ක්ෂාන්තෞ, සම්පූර්වඃ. සම්‍යක් මමෘෂෙ තත්= සම්මෘෂිතම්- සමර්ෂිතම්. උදයං ප්‍රාප්තඃ**

---

ක්ත ප්‍රත්‍යය වේ. තෙන හරිණා, ඒ විෂ්ණුහු විසින්; රමා, සීතා තොමෝ; ආශ්ලිෂ්ටා, වැළඳ ගන්නා ලද්දී. ඉත්‍යාදි, මේ ආදිය; ඥෙයම්, දත යුතු යි.

36. කිත්ත්ව විකල්පවිධි සූත්‍ර යි. "ණාදිඃ කිත්" යි කිත් යනු ද, "ක්ත්වා සෙට්" යි සෙට් යනු ද අනුවෘත්ත යි. සෙට්, ඉඩාගම සහිත වූ; ක්තඃ, ක්ත ප්‍රත්‍යය; වා, ව්‍යවස්ථා වශයෙන්; කිත්, කිත් වේ.

a. උකාරොපධාත්, උකාරය උපධා කොට ඇති ධාතුහු කෙරෙන් ද; මෘෂඃ ච, මෘෂ් ධාතුහු කෙරෙන් ද; පරඃ, පර වූ; සෙට් ක්තඃ ප්‍රත්‍යයඃ, ඉඩාගම සහිත ක්ත ප්‍රත්‍යය තෙමේ; වා, විකල්ප යෙන්; කිත් භවති, කිත් වේ. (උකාරොපධ ධාතූන් කෙරෙන් හා 'මෘෂ්' ධාතුවෙන් පර වූ සෙට් ක්ත ප්‍රත්‍යය විකල්පයෙන් කිත් වෙයි යනු 'වා' ශබ්දෝක්ත ව්‍යවස්ථා යි. ඒ අර්ථය ගෙණ සූත්‍ර වෘත්ති යෙහි **උකාරොපධාන්මෘෂශ්ච** යි ව්‍යාඛ්‍යාන කළහ. ක්ත ප්‍රත්‍යයෙහි ඇති කිත්ත්වය මේ සූත්‍රයෙන් විකල්ප කෙරෙයි. කිත් නො වන පක්ෂයෙහි ධාතුහට ගුණ වේ.)

b. දිද්‍යුතෙ, අතීතයෙහි බැබලීම නු යි; තත්, එය; ද්‍යුතිතම්- ද්‍යොතිතම්, කිත්ත්ව පක්ෂයෙහි ගුණ නො වීමෙන් "ද්‍යුතිත" නම් ද- කිත් නුවූ පක්ෂයෙහි ගුණ වීමෙන් "ද්‍යොතිත" නම් ද වේ. ද්‍යුත්‍යතෙ සම වා, "ද්‍යුත්‍යතෙ සම" කියා හෝ විග්‍රහය වේ. (භාවයෙහි ක්ත ප්‍රත්‍යය යි. "දිද්‍යුතෙ" යනු ලිට් ය.) ප්‍රකර්ෂේණ ද්‍යුතිං ප්‍රාප්තඃ වා, අතිශයින් බැබලීමට පැමිණියේ නු යි හෝ; අසෞ, මෙතෙමේ; ප්‍රද්‍යුතිතඃ- ප්‍රද්‍යොතිතඃ, කිත්ත්ව පක්ෂයෙහි "ප්‍රද්‍යුතිත" නම් ද- කිත් නො වන පක්ෂයෙහි "ප්‍රද්‍යොතිත" නම් ද වේ. ප්‍රද්‍යොතතෙ

---

* දිද්‍යුතෙ තත්= ද්‍යුතිතම්, ද්‍යොතතෙ සම තත්= ද්‍යොතිතම්- පොත්හි. අද්‍යොති ඉති= ද්‍යුතිතම්- ද්‍යොතිතම්, තෙන- සුබොධිනී.

† ප්‍රකර්ෂේණ දිද්‍යුතෙ සමාසෞ= ප්‍රද්‍යුතිතඃ. ප්‍රකර්ෂේණ ද්‍යුතං ප්‍රාප්තඃ වා ප්‍රද්‍යොතතෙ සමාසෞ= ප්‍රද්‍යොතිතඃ- පොත්හි.

**උද්‍යතෙ සමාසෞ= උදිතඃ. රෝදනං ප්‍රාප්තඃ= රෝදිතඃ, වා රෝදිති සමාසෞ= රෝදිතඃ- රුදිතඃ. මුෂ්‍යතෙ සමාසෞ= මොෂිතඃ- මුෂිතඃ. "ග්‍රහාං ඞිති ච" ගෘහ්‍යතෙ සමාසෞ= ගෘහීතඃ. නුද්‍යතෙ සම ඉති= නොදිතඃ- නුදිතඃ. උකාරොපධාදිති කිම්? විදිතඃ.***

**a. ශීඞ් ස්විදි මිදි ක්ෂ්විදි ධෘෂු පූඞඃ ක්ෂෙමාෂෙ †**

---

සම වා, "ප්‍රද්‍යෝතනෙ සම" කියා හෝ විග්‍රහය වේ. මෘෂ ක්ෂාන්තෞ, "මෘෂ්" ධාතුව ඉවසීමෙහි වේ. සම්පූර්වඃ, 'සම්' උපසර්ගය පූර්ව කොට ඇත්තේ වේ. සම්‍යක්, මනාකොට; මමෘෂෙ, අතීතයෙහි ඉවසීම නු යි; සමමෘෂිතම්- සමමර්ෂිතම්, කිත්ත්ව පක්ෂයෙහි "සමමෘෂිත" නම් ද- විකල්ප පක්ෂයෙහි "සමමර්ෂිත" නම් ද වේ. උදයං ප්‍රාප්තඃ, උදයට පැමිණියේ නු යි; උද්‍යතෙ සම, උදා වී නු යි හෝ; අසෞ, මෙතෙමේ; උදිතඃ, "උදිත" නම්. රෝදනං ප්‍රාප්තඃ, හැඬීමට පැමිණියේ; රෝදිතඃ, "රෝදිත" නම්. වා, නොහොත්; රෝදිති සම, හැඬී නු යි; අසෞ, මෙතෙමේ; රෝදිතඃ- රුදිතඃ, කිත්ත්ව නො වන පක්ෂයෙහි "රෝදිත" නම් ද- කිත්ත්ව පක්ෂයෙහි "රුදිත" නම් ද වේ. මූෂ්‍යතෙ සම, සොරකම් කරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; මොෂිතඃ- මූෂිතඃ, පෙර සේ ම "මොෂිත" නම් ද- "මූෂිත" නම් ද වේ. ('මූෂ ස්තෙයෙ' ධාතු යි.) "ග්‍රහාං ඞිති ච" යන සූත්‍රයෙන් සම්ප්‍රසාරණ වේ. ගෘහ්‍යතෙ සම, ගන්නා ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ගෘහීතඃ, "ගෘහීත" නම්. ("කෘතඃ" යි ඉඩාගම ච "ඊටො ග්‍රහාම්" යි ඊකාර වේ.) නුද්‍යතෙ සම ඉති, මෙහෙයන ලද්දේ නු යි; නොදිතඃ- නුදිතඃ, "නොදිත" නම් ද- "නුදිත" නම් ද වේ. උකාරොපධාත් ඉති කිම්, "උකාරොපධාත්" යනු කිම? විදිතඃ, "විදිතඃ" යන තැන්හි කිත් විකල්පත්වය නො වනු පිණිස යි. ("විද්" ධාතුව උකාරොපධ නො වන හෙයින් "වෙදිතඃ" යි නො වේ. එහෙත් චන්ද්‍රකීර්ති ටීකාවෙහි ද "වෙදිතඃ- විදිතඃ" යි පෙණේ.)

a. ක්ෂෙමාෂෛ, නිෂ්ඨායෙහි වූ; ශීඞ්— පූඞඃ, ශී- ස්විද්- මිද්- ක්ෂ්විද්- ධෘෂ්- පූ යන ධාතූන් කෙරෙන් පර වූ (සෙට් ක්ත- ක්තවතු ප්‍රත්‍යය ද්වයය කිත් නො වේ.)

---

* වෙදිතඃ- විදිතඃ, පොත්හි.

† මෙහි "ක්ෂෙමාෂෙ" යනු නිරර්ථකය යි හැඟේ. "ක්ෂමාෂෙ" කියා වුව හොත් 'ධාර්ෂ්ට්‍යය කිරීමට ශක්ති ඇත්තේ ය යන අර්ථයෙහි' ය යි ගත හැකි ය. එහෙත් ටීකාවන්හි කිසිවක් නො කී හෙයින් එසේ ම තිබෙන්නට හැරිමු. පාණිනීය සූත්‍රය "නිෂ්ඨා ශීඞ් ස්විදි මිදි ක්ෂ්විදි ධෘෂඃ" යනු යි.

a. එභ්‍යඃ පරෞ සෙටෞ කතකතවතූ ප්‍රත්‍යයෞ කිතෞ න භවතඃ.

b. පූඩො වා කතඃ සෙට් *

c. පූඩඃ පරස්‍ය කතප්‍රත්‍යයස්‍යෙඩ් වා භවති. පූඞ් ශොධනෙ, පුපුවෙ 'සෞ= පවිතඃ- පූතඃ. ශීශ්‍යො 'සෞ= ශයිතඃ.

## 37. කිතඃ. (කිතඃ 6- 1.)

---

a. එභ්‍යඃ පරෞ, මේ ධාතූන් ඉකාරෙන් පර වූ; සෙටෞ, ඉට් සහිත වූ; කතකතවතූ ප්‍රත්‍යයෞ, කත- කතවතු ප්‍රත්‍යයයෝ දෙදෙන; කිතෞ න භවතඃ, කිත් නො වෙත්. (මෙයින් කිත් බව ප්‍රතිෂිද්ධ යි.)

b. පූඩඃ, පූඞ් ධාතුහු කෙරෙන් පර වූ; කතඃ, කත ප්‍රත්‍යය තෙමේ; වා, විකල්පයෙන්; සෙට්, ඉට් සහිත වේ.

c. පූඩඃ පරස්‍ය, පූඞ් ධාතුවෙන් පර වූ; කතප්‍රත්‍යයස්‍ය, කත ප්‍රත්‍යය සම්බන්ධ ව; වා ඉඩ් භවති, විකල්පයෙන් ඉඩාගම වේ. පූඞ් ශොධනෙ, "පූ" ධාතුව පවිත්‍ර කිරීමෙහි වේ. පුපුවෙ, පවිත්‍ර කරණ ලද්දේ තු යි; අසෞ, මෙතෙමේ; පවිතඃ- පූතඃ, ඉට් පක්‍ෂයෙහි "පවිත" නම් ද- විකල්ප පක්‍ෂයෙහි "පූත" නම් ද වේ. (මේ සඳහා සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි 'පූඩො වා කිතඃක්තස්‍යෙට්' යි කී හෙයින් කතවතු ප්‍රත්‍යය සම්බන්ධ ව ද මෙයින් ම ඉට් විකල්පත්වය වේ. පවිතවාන්- පූතවාන් යනු උදාහරණ යි.) ශිශ්‍යෙ, සැතපී තු යි; අසෞ, මෙතෙමේ; ශයිතඃ, "ශයිත" නමි. (කත ප්‍රත්‍යය කිත් නො වන හෙයින් ගුණ විය.)

37. ඉට් ප්‍රතිෂෙධවිධි සූත්‍ර යි. "සිසතාසීස්‍යපාම්ට්" යි ඉට් යනු ද, "රුදූදෙශවතුණ්ාං භ්වසාදෙඃ" යි වසාදෙඃ යනු ද, "වූඃ සෙ" යි වූඃ යනු ද, "නෛකස්වරාදනුදාත්තාත්" යි න යනු ද, ධාතොඃ යන සූත්‍රය ද අනුවෘත්ත යි.

වූඃ ධාතොඃ, උවර්ණාන්ත- ඍවර්ණාන්ත ධාතුහු කෙරෙන් පර වූ; වසාදෙඃ, වස ප්‍රත්‍යාහාර වර්ණයක් ආදි කොට ඇති; කිතඃ, කිත් වූ ප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට් න, ඉඩාගම නො වේ.

---

* පූඩශච. පා: 7- 2- 52.

**a, උවර්ණාන්තාත් සෘවර්ණාන්තාත් ශ්විශ්‍රියශ්ච ධාතොඃ පරස්‍ය කිත්ප්‍රත්‍යයස්‍ය වසාදෙඃ ඉට් න භවති.**

**b. බහුලෙත්‍යසෞ වා භවති ස්ම ඉති= භූතඃ. ණු ස්තුතෞ, නූයතෙ * ඉති= නුතඃ. වෘඤ් වරණෙ, වව්‍රෙ * ඉති= වෘතඃ. ටුඕශ්වි ඉර් ගතිවෘද්ධ්‍යොඃ, ශිශ්වායෙති= ශ්විතඃ. ශ්‍රියතෙ ස්ම ඉති= ශ්‍රිතඃ. "ශ්වයතෙඃ සම්ප්‍රසාරණස්‍ය දීඝඃ" අශිශ්වියදිති= ශූනඃ.†**

---

a. උවර්ණාන්තාත්, උවර්ණාන්ත ධාතුවෙන් ද; සෘවර්ණාන්තාත්, සෘවර්ණාන්ත ධාතුවෙන් ද; ශ්විශ්‍රියඃ ධාතොඃ ච, 'ශ්වි- ශ්‍රි' ධාතු දෙකෙන් ද, පරස්‍ය, පර වූ; වසාදෙඃ, වස ප්‍රත්‍යාහාර වර්ණයක් ආදි කොට ඇති; කිත් ප්‍රත්‍යයස්‍ය, කකාර ඉත් කොට ඇති ප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට් න භවති, ඉඩාගම නො වේ. (**නෛකාක්ෂර දන්‍යුදන්තාත්** යන සූත්‍රය "න" යි විභාග කිරීමෙන් 'ශ්වි- ශ්‍රි' ධාතු දෙකින් පරව ද ඉඩාගම නො වන හෙයින් එය ද මේ සූත්‍ර වෘත්ති යට ගෙණ '**ශ්විශ්‍රියශ්ච**' යි කීහ. "කෘතඃ" යි විහිත ඉඩාගමය මෙයින් ප්‍රතිෂිද්ධ ය.)

b. බහුව ඉති, වී නු යි; අසෞ, මෙතෙමේ; භූතඃ, "භූත" නම්. භවති ස්ම ඉති වා, "භවති ස්ම" කියා හෝ විග්‍රහය වේ. ණු ස්තුතෞ, "ණු" ධාතුව ස්තුති කිරීමෙහි වේ. නූයතෙ ස්ම ඉති, ස්තුති කරණ ලද්දේ නු යි; නුතඃ, "නූත" නම්. වෘඤ් වරණෙ, "වෘ" ධාතුව රිස්සීමෙහි වේ. වව්‍රෙ ඉති, රැස්සත ලද්දේ නු යි; වෘතඃ, "වෘත" නම්. ටුඕශ්විඉර් ගතිවෘද්ධ්‍යොඃ, "ශ්වි" ධාතුව ගමන ය- වැඩීම ය (=ඉදිමීම ය) යන අර්ථ දෙක්හි වේ. ශිශ්වාය ඉති, ගියේ නු යි; ශ්විතඃ, "ශ්විත" නම්. ශ්‍රියතෙ ස්ම ඉති, ඇසුරු කෙළේ නු යි; ශ්‍රිතඃ, "ශ්‍රිත" නම්. ශ්වයතෙඃ, 'ශ්වි' ධාතුහුගේ; සම්ප්‍රසාරණස්‍ය, සම්ප්‍රසාරණයට; දීඝඃ, දීඝ වේ. ("යජාං -පෙ- කිති" යි 'ශ්වි' ධාතුහට සම්ප්‍රසාරණ උකාරය වූ පසු මෙයින් දීඝ වේ.) අශිශ්වියත් ඉති, වැඩුනේ (=ඉදිමුනේ) නු යි; ශූනඃ, "ශූන" නම්. (ධාතුව ඕකාරෙත් බැවින් "ල්වාද්‍යෝදිතශ්ච" යි තකාරයට නකාරය වේ.)

---

* නූයති- වවාර, පොත්හි. කර්තෘ කාරකයෙහි නො වන හෙයින් ඒ සදෙසි.

† ශූතඃ- පොත්හි. "ල්වාද්‍යෝදිතශ්ච" යි තකාරයට නකාර වන හෙයින් ඒ සදෙසි.

## 38. ආදීදිතඃ. (ආදීදිතඃ 5- 1.)

**a, ආදිත ඊදිතශ්ච පරස්‍ය ක්තස්‍යෙඩ් න භවති.**

## 39 ඤීතාං ක්තො * වර්තමානෙ 'පි.

(ඤීතාම් 6- 3. ක්තඃ 1- 1. වර්තමානෙ 7- 1. අපි- නිඃ)

**b. ඤීතාං ධාතූනාං මතිබුද්ධිපූජාර්ථානාඤ්ච වර්තමානෙ 'පි ක්තඃ ප්‍රත්‍යයො භවති. අපි ශබ්දාත් භාවකර්මණොරපි.**

---

38. ඉට් ප්‍රතිෂෙධවිධි සූත්‍ර යි. පෙර කී සේ **ධාතොඃ- ඉට්- න** යනු ද, **කිතඃ** යන සූත්‍රය ද අනුවෘත්ත යි. ආදීදිතඃ, ආකාර- ඊකාර ඉත් කොට ඇති; ධාතොඃ, ධාතුවෙන් පර වූ; කිතඃ, කිත් (=කකාරානුබන්ධ) ප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට් න, ඉඩාගම් නො වේ. **(ආච්ච ඊච්ච= ආදීතෞ, ආදීතෞ ඉතෞ යස්‍ය සඃ= ආදීදිත්, තස්මාත්=ආදීදිතඃ.)**

a. ආදිතඃ, ආකාරය ඉත් කොට ඇති ධාතුවෙන් ද; ඊදිතඃ ච, ඊකාරය ඉත් කොට ඇති ධාතුවෙන් ද; පරස්‍ය, පර වූ; ක්තස්‍ය, ක්තප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට් න භවති, ඉඩාගම නො වේ. (මෙහි "ක්තස්‍ය" යි කී නමුත් සූත්‍රයට "කිතඃ" යි අනුවෘත්ත වන හෙයින් **ක්ත- ක්තවතු** ප්‍රත්‍යය දෙක ම පිළිබඳ ව ඉඩාගමය වළකී. මේ සූත්‍රයෙනුදු **'ධාතොඃ'** යි විහිත කාර්‍ය්‍යය ප්‍රතිෂිද්ධ ය. **ඤිමිදා ස්නෙහෙ= මින්නම්, මදී හර්ෂේ= මත්තඃ** යනු උදාහරණ යි.)

39. ක්ත ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ඤීතාම්, ඤි යන්න ඉත් කොට **ඇති ධාතූන් සම්බන්ධ ව;** වර්තමානෙ අපි, වර්තමාන කාලයෙහි ද; **ක්තඃ,** ක්ත ප්‍රත්‍යය වේ. (ඤිරිත් යෙෂාං තෙ= ඤීතඃ, තෙෂාම්= ඤීතාම්.)

b. ඤීතාම්, ඤි යන්න ඉත් කොට ඇත්තා වූ ද; මතිබුද්ධි පූජාර්ථානාං ච, ඉච්ඡා ය- ඥාන ය- පූජා ය යන අර්ථ ඇත්තාවූ ද; ධාතූනාම්, ධාතූන් **සම්බන්ධ** ව; වර්තමානෙ අපි, වර්තමාන කාලයෙහි ද; **ක්ත ප්‍රත්‍යයඃ** භවති, ක්ත ප්‍රත්‍යය වේ. අපි ශබ්දාත්, (සූත්‍රයෙහි වූ) 'අපි' ශබ්ද බලයෙන්; භාවකර්මණොඃ අපි, භාව- කර්ම දෙක්හි ද **ක්ත ප්‍රත්‍යය** වේ.

---

* තක් වර්තමානෙ'පි-පොත්හි.

## 40. දඃතස්ස නො දශ්ච.

(දඃ 5- 1. තස්ස 6-1. නඃ 1-1. ච- නි:)

**a. දකාරදුත්තරස්ස කිතස්සතස්ස නත්වං භවති. චකාරාද් දකාරස්ස නකාරෙ භවති.**

**b. ඤිමිද ස්නෙහෙ, ආදිතඃ කම්මණි නිෂ්ඨා කත්තරි ච වාච්‍යා. මිද්‍යතෙ තත්= මින්නං, මින්නමන්නං තෛලෙන වර්තතෙ.**

---

(මෙයින් වර්තමාන කාලාර්ථයෙහි කර්තෘ- කර්ම- භාව තුනෙහි ම ක්ත ප්‍රත්‍යය විහිත ය. පොත්හි 'තක්'යි මුද්‍රිත නමුත් පාණිනීයයෙහි ''ඤීතඃ ක්තඃ'' යි විහිත බැවින් ද, ''ක්තස්‍ය ච වර්තමානෙ'' යන්නට නුසුදුසු හෙයින් ද සූත්‍රපාඨයෙහි එන සේ සකස් කළ බව දත යුතු යි. ලක්ෂණ වශයෙන් 'තක්- ක්ත' දෙක්හි වෙනසෙක් නැත. සූත්‍ර වෘත්තියෙහි වූ මතිබුද්ධිපූජාර්ථානාම් යනු මතිබුද්ධිපූජාර්ථෙභ්‍යශ්ච යන පාණිනීය සූත්‍රානුසාරයෙන් යොදන ලද්දකි. එහි ''මතිබුද්ධි'' යි පෘථග්ග්‍රහණය හෙයින් 'මති' ශබ්දයෙන් ඉච්ඡාර්ථ ධාතු ගණු ලැබේ.)

40. නකාරාදෙශ විධි සූත්‍ර යි. ''යජාං -පෙ- කිති'' යි වි: වි: වශයෙන් කිතඃ යනු අනුවෘත්ත යි. දඃ, දකාරයෙන් පර වූ, කිතඃ, කිත් වූ; තස්ස, තකාරයට; නඃ, නකාරය වේ. දඃ ච, දකාරයට ද; (නඃ, නකාරය වේ.)

a. දකාරාත් උත්තරස්ස, දකාරයා කෙරෙන් පර වූ; කිතඃ තස්ස, කයන්න ඉත් කොට ඇති තකාරයට; නත්වං භවති, නකාර බව වේ. චකාරාත්, චශබ්ද බලයෙන්; දකාරස්ස, දකාරයට ද; නකාරඃ භවති, නකාරය වේ. (දකාරාන්ත ධාතූන් කෙරෙන් පර ක්ත- ක්තවතු ප්‍රත්‍යයන්ගේ තකාරයට හා ධාත්වන්ත දකාරයට ද නකාරාදෙශ වන බව මෙයින් කිහ.)

b. ඤිමිද ස්නෙහෙ, ඤි- ආ අනුබන්ධ ''මිද්'' ධාතුව සිනිඳු කිරීමෙහි වේ. ආදිතඃ, ආකාරය ඉත් කොට ඇති ධාතුහු කෙරෙන්; කර්මණි, කර්ම කාරකයෙහි ද; කර්තරි ච, කර්තෘ කාරකයෙහි ද; නිෂ්ඨා, නිෂ්ඨා ප්‍රත්‍යය; වාච්‍යා, කිය යුතු යි. මිද්‍යතෙ, සිනිඳු කරණු ලැබෙනු යි; මින්නම්, ''මින්න'' නම්. (කර්ම කාරකයෙහි යි.) තෛලෙන තෙලින්; මින්නං, සිනිඳු කරණ ලද; අන්නම්, ආහාරය; වර්තතෙ, පවතී.

**a.** "භාවෙ කර්තරි චාදිතඃ ක්තස්‍යෙඩ් වා වාච්‍යඃ." "මිදෙර්ගුණඃ" * මෙද්‍යතෙ 'සෞ= මෙදිතඃ, මිද්‍යතෙ තත්= මෙදිතම්.

**b.** හ්ලාද ආහ්ලාදනෙ, නිෂ්ඨායාං හ්‍රස්වො වාච්‍යඃ, හ්ලාද්‍යතෙ 'සෞ= හ්ලන්නඃ. ඤිෂ්විද ගාත්‍රප්‍රක්ෂරණෙ හ්ලාදනෙ ච, ආයාසෙන ප්‍රස්විද්‍යතීති[1] = ප්‍රස්වින්නඃ- ප්‍රස්වෙදිතඃ, ප්‍රස්වෙදිතම්, තෙන. ඤික්ෂ්විද සඤ්චූර්ණනෙ, ක්ෂ්වෙදතෙ[2] 'සෞ= ක්ෂ්විණ්ණඃ, ක්ෂ්විද්‍යතෙ තත්= ක්ෂ්වෙදිතං, තෙන. ඤිධෘෂා ප්‍රාගල්භ්‍යෙ, ස්වාදිෂු, ධෘෂ්ණොතීති= ධර්ෂිතඃ- ධෘෂ්ටඃ. මන්‍යතෙ 'සෞ= මතඃ. බුධ අවගමනෙ, බුධ්‍යත ඉති[3] = බුද්ධඃ. පූජ අර්චායාම්, පූජ්‍යත[4] ඉති= පූජිතඃ, සඃ.

---

a. ආදිතඃ, ආකාරෙත් ධාතුහු කෙරෙන් පර ව; භාවෙ භාවයෙහි ද; කර්තරි ච, කර්තෘ කාරකයෙහි ද වූ; ක්තස්‍ය, ක්ත ප්‍රත්‍යය සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ඉට් වාච්‍යඃ, ඉඩාගමය කිය යුතු යි. (මෙයින් ක්ත- ක්තවතු ප්‍රත්‍යය ද්වයය ම සම්බන්ධ ව විකල්පයෙන් ඉඩාගම වේ.) මිදෙඃ, මිද් ධාතුහට; ගුණඃ, ගුණ වේ. මෙද්‍යතෙ, සිනිදු කෙරේ නු යි; අසෞ, මෙතෙමේ; මෙදිතඃ, "මෙදිත" නමි. (=කර්තෘකාරකයෙහි යි.) මිද්‍යතෙ, සිනිදු කිරීම නු යි; තත්, එය; මෙදිතම්, "මෙදිත" නමි. (=භාවයෙහි යි.) .

b. හ්ලාද ආහ්ලාදනෙ, "හ්ලාද්" ධාතුව සතුටු කිරීමෙහි වේ. නිෂ්ඨායාම්, නිෂ්ඨාප්‍රත්‍යය පර කල්හි; හ්‍රස්වඃ වාච්‍යඃ, හ්‍රස්වය කිය යුතු යි. හ්ලාදතෙ, සතුටු කෙරේ නු යි; අසෞ, මෙතෙමේ; හ්ලන්නඃ, "හ්ලන්න" නමි. ඤිෂ්විද ගාත්‍රප්‍රක්ෂරණෙ හ්ලාදනෙ ච, "ෂ්විද්" ධාතුව ඇඟින් ඩහදිය වැගිරීමෙහි ද- සතුටු කිරීමෙහි ද වේ. ආයාසෙන, මහන්සියෙන්; ප්‍රස්විද්‍යතීති, වැගිරේ නු යි නොහොත් සතුටු කෙරේනු යි; ප්‍රස්වින්නඃ, "ප්‍රස්වින්න" නමි. ප්‍රස්වෙදිතඃ, ඉඩාගම වූ පක්ෂයෙහි "ප්‍රස්වෙදිත" නමි. ප්‍රස්වෙදිතම්, භාවයෙහි "ප්‍රස්වෙදිත" යනු වේ. තෙන, ඔහු විසින්; ප්‍රස්වෙදිතම්, ඩහදිය වැගිරීම යි නොහොත් සතුටු කිරීම යි. ඤි ක්ෂ්විද සඤ්චූර්ණනෙ, "ක්ෂ්විද්" ධාතුව මොනවට සුණු කිරීමෙහි වේ. ක්ෂ්වෙදතෙ, සුණු කෙරේ නු යි; අසෞ, මෙතෙමේ; ක්ෂ්විණ්ණඃ, "ක්ෂ්විණ්ණ" නමි. ක්ෂ්විද්‍යතෙ, සුණු කිරීම නු යි; තත්, එය; ක්ෂ්වෙදිතම්, "ක්ෂ්වෙදිත" නමි. තෙන, ඔහු විසිනි. ඤි ධෘෂා ප්‍රාගල්භ්‍යෙ, "ධෘෂ්" ධාතුව බුහුටි බැව්හි වේ. ස්වාදිෂු, ස්වාදි ධාතු විෂයෙහි ය.

---

* පාණිනීය 7-3-82.

1. ප්‍රස්විද්‍යතෙ'සෞ. 2. ක්ෂ්විද්‍යතෙ. 3. බුධ්‍යතීති. 4. පූජතීති. ඉපොත්හි.

**෮. ඤීතාං ක්තො වර්තමානෙ'පි ඉත්‍යපි ශබ්දාත් ඥාර්චේච්ඡාර්ථ ශීලාදෙඃ ක්තඃ. ඥා අවබොධනෙ, අර්ච පූජායාම්, ඉෂු ඉච්ඡායාම්, ශීල සමාධෞ, එතෙෂාං ක්තො භවති. ඥාතඃ, අර්චිතඃ, ඉෂ්‍යතෙ 'සෞ= එෂිතඃ, ශීල්‍යතෙ'සෞ= ශීලිතඃ.**

---

ධෘෂ්ණොති ඉති, බුහුටි වේ නු යි; ධර්ෂිතඃ, "ධර්ෂිත" නම්. ධෘෂ්ටඃ, අතිටි පක්ෂයෙහි "ධෘෂ්ට" නම්. මන්‍යතෙ, ඉෂ්‍යමාණ වේ නු යි; මතඃ, "මත" නම්. බුධ අවගමනෙ, 'බුධ' ධාතුව අවබොධ කිරීමෙහි වේ. බුධ්‍යතෙ ඉති, අවබොධ කෙරේ නු යි; බුද්ධඃ, "බුද්ධ" නම්. පූජ අර්චායාම්, 'පූජ' ධාතුව පිදීමෙහි වේ. පූජ්‍යතෙ ඉති, පුදනු ලැබේ නු යි; පූජිතඃ, "පූජිත" නම්. සඃ, හෙතෙමේ යි.

෮. ඤීතාං ක්තො වර්තමානෙ'පි ඉති, "ඤීතාං ක්තො වර්තමානෙ'පි" යන සූත්‍රයෙහි; අපි ශබ්දාත්, 'අපි' ශබ්දයෙන්; ඥාර්චේච්ඡාර්ථ ශීලාදෙඃ, ඥා- අර්ච- ඉච්ඡාර්ථ- ශිල යනාදිහු කෙරෙන් ද; ක්තඃ, ක්ත ප්‍රත්‍යය වේ. (ඉක්බිති ඒ ධාතූන් අර්ථ සහිත ව දක්වත්.) ඥා අවබොධනෙ, 'ඥා' ධාතුව අවබොධ කිරීමෙහි වේ. අර්ච පූජායාම්, 'අර්ච' ධාතුව පිදීමෙහි වේ. ඉෂු ඉච්ඡායාම්, 'ඉෂු' ධාතුව ඉච්ඡාර්ථයෙහි වේ. ශීල සමාධෞ, 'ශීල' ධාතුව සමාධ්‍යර්ථයෙහි වේ; එතෙෂාම්, මොවුන් සම්බන්ධ ව; ක්තඃ භවති, (වර්තමානාර්ථයෙහි) ක්ත ප්‍රත්‍යය වේ.

("ඤීතාං ක්තො වර්තමානෙ'පි" යන සූත්‍රයාගේ වෘත්තියෙහි වූ "මතිබුද්ධිපූජාර්ථානාම්" යන්න මෙයින් පැහැදිලි කළහ. "මති බුද්ධි පූජාර්ථෙභ්‍යශ්ච" යන පාණිනීය සූත්‍රයෙන් විහිත කාර්‍ය්‍ය ද අපි ශබ්ද බලයෙන් මේ සූත්‍රයට ම ඇතුළත් කොට ඒ බැව් ප්‍රකට වනු පිණිස සූත්‍රවෘත්තියට ද "මතිබුද්ධිපූජාර්ථානාම්" යි එකතු කරණ ලදැයි මෙයින් හැඟේ. එපමණක් නො ව සූත්‍ර වෘත්තියට අනතුරු ව දක්වූ "අපි ශබ්දාත් භාවකර්මණොරපි" යන්නෙන් අපි ශබ්ද බලයෙන් ම භාව- කර්ම දෙකෙහිත් ක්ත ප්‍රත්‍යය වන්නේ ය යි කී බව මෙහි දී සිහි කළ යුතු යි.)

ඥාතඃ, 'ඥායතෙ' (=දන්නා ලැබේ) යන වාක්‍යයෙහි "ඥාත" නම්. අර්චිතඃ, 'අර්ච්‍යතෙ' (=පුදනු ලැබේ) යන වාක්‍යයෙහි "අර්චිත" නම්. ඉෂ්‍යතෙ, කැමති වනු ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; එෂිතඃ, "එෂිත" නම්. ශීල්‍යතෙ, පුරුදු කරණු ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; ශීලිතඃ, "ශීලිත" නම්.

**a. ක්තස්‍ය ච වර්තමානෙ. ***

**b. වර්තමානාර්ථස්‍ය ක්තස්‍ය යොගෙ ෂෂ්ඨී ස්‍යාත්, යෙන රාඥං පූජිතඃ. පූජ් පූජනෙ. අන්‍යත්‍ර කාර්යෙ ක්තඃ සාමාන්‍යඃ. දස්තස්‍ය නො දශෙවති චකාරාන්මදෙර්නෙති වාච්‍යම්. යෙන මාද්‍යතීති= මත්තඃ, මදී හර්ෂෙ.**

## 41. අදෙ ජග්ධුඃ. (අදඃ 6-1. ජග්ධුඃ 1-1.)

**c. අදෙ ජග්ධුරාදෙශො භවති නිෂ්ඨායාං කිති තකාරෙ පරෙ ක්‍යපි ච. උකාර උච්චාරණාර්ථඃ.**

---

a. වර්තමානෙ, වර්තමානාර්ථයෙහි වූ;. ක්තස්‍ය ච, ක්ත ප්‍රත්‍යයාගේ යොගයෙහි ද (කර්ත්‍රර්ථයෙහි ෂෂ්ඨී විභක්තිය වේ.)

b. වර්තමානාර්ථස්‍ය, වර්තමානාර්ථ වූ; ක්තස්‍ය යොගෙ, ක්ත ප්‍රත්‍යයාගේ යොගය ඇති කල්හි; ෂෂ්ඨී ස්‍යාත්, ෂෂ්ඨී විභක්තිය වේ. යෙන රාඥං පූජිතඃ, එහෙයින් "රාඥං පූජිතඃ" (=රජුන් විසින් පුදනු ලැබේ) යන තැන්හි "රාඥම්" යි කර්ත්‍රර්ථයෙහි ෂෂ්ඨී විභක්තිය විය. "පූජ පූජනෙ" යනු ධාතු යි. අන්‍යත්‍ර, සෙසු තැන්හි; කාර්යෙ, කර්මකාරකයෙහි වූ; ක්තඃ, ක්ත ප්‍රත්‍යය; සාමාන්‍යඃ, සාමාන්‍ය ය. (විශෙෂයක් නැත. කර්මකාරක ක්තප්‍රත්‍යයාගේ යොගය ඇති කල්හි කර්ත්‍රර්ථයෙහි තෘතීයාව ම වෙයි යූ සේ යි.) දස්තස්‍ය නො දශව ඉති, "දස්තස්‍ය නො දශව" යන සූත්‍රයෙහි; චකාරාත්, චශබ්ද ග්‍රහණයෙන්; මදෙඃ, මද් ධාතුවෙන් පර වූ (තකාරයට;) න ඉති, (නකාරය) නො වේ ය යි; වාච්‍යම්, කිය යුතු. යෙන, එහෙයින්; මාද්‍යතීති, මත් වෙයි යන අර්ථයෙහි; මත්තඃ, "මත්ත" යනු වේ. (තකාරයට නකාරය ව "මත්න" යි නො වේ.) "මදී හර්ෂෙ" යනු ධාතු යි.

41. ජග්ධු ආදෙශවිධි සූත්‍ර යි. අදඃ, අද් ධාතුහට; ජග්ධුඃ, ජග්ධු යනාදෙශ වේ.

c. නිෂ්ඨායාම්, නිෂ්ඨා සංඥ වූ; කිති තකාරෙ, කිත් වූ තකාර ය ද; ක්‍යපි ච, ක්‍යප් ප්‍රත්‍යය ද; පරෙ, පර කල්හි; අදඃ, 'අද්' ධාතු හට; ජග්ධුඃ ආදෙශඃ භවති, 'ජග්ධු' යනාදෙශය වේ. උකාරඃ, උකාරය; උච්චාරණාර්ථඃ, උසුරුවීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. (එහෙයින් ආදෙශය "ජග්ධ්" යනු යි.)

---

* පාණිනීය, 2-3-67.

**a. ක්තක්තවතූ නිෂ්ඨා.** *

**b. එතෞ ප්‍රත්‍යයෞ නිෂ්ඨාසංඥෞ ස්තඃ. "තථොර්ධඃ" "ඣබෙ ජබාඃ." අද් භක්ෂණෙ, අද්‍යතෙ ස්ම තත්= ජග්ධම්, කිම්? අන්නම්. "රඃ" කෲ විදාරණෙ, කෲ හිංසායාම්, කෲ වික්ෂෙපෙ. "ඎත ඉර්" ය්වොර්වි හසෙ" විකීර්‍ය්‍යතෙ 'ස්මාසෞ= විකීර්ණඃ. ජෲෂ් වයොහානෞ, ෂකාරඃ ෂිද්ගිදමඞ් ඉත්‍යස්‍ය විශෙෂණාර්ථඃ. ජීර්‍ය්‍යතෙ ස්ම තත්= ජීර්ණම්, කිම්? ශරීරම්. ගීර්‍ය්‍යතෙ ස්ම තත්= ගීර්ණම්. පූරී පූරණෙ, පූර්‍ය්‍යතෙ ස්මාසෞ= පූර්ණඃ. "රඃ" ඉති සූත්‍රං න පිපර්ති. "පොරුර්" පිපර්ති ස්ම ඉති= පූර්තිඃ.**

---

a, ක්තක්තවතූ, ක්ත- ක්තවතු යන ප්‍රත්‍යයෝ දෙදෙන; නිෂ්ඨා, "නිෂ්ඨා" නම් වෙත්.

b. **එතෞ** ප්‍රත්‍යයෞ, මේ ක්ත- ක්තවතු ප්‍රත්‍යයෝ දෙදෙන; **නිෂ්ඨාසංඥෞ**, නිෂ්ඨා සංඥ ඇත්තාහු; ස්තඃ, වෙත්. "තථොර්ධඃ" යන සූත්‍රයෙන් ප්‍රත්‍යයස්ථ තකාරයට ධකාරය වේ. "ඣබෙ ජබාඃ" යන්නෙන් ආදෙශයාගේ ඝකාරයට ගකාරය වේ. අද් භක්ෂණෙ, "අද්" ධාතුව කෑමෙහි වේ. අද්‍යතෙ ස්ම, කන ලද්දේ නු යි; තත්, එය; ජග්ධම්, "ජග්ධ" නමි. කිම්, කුමක් ද යත්? අන්නම්, ආහාරය යි. (මේ 'අන්න' ශබ්දය ද අද් ධාතුවෙන් පර ව ක්ත ප්‍රත්‍යය ව "දස්තස්‍ය තො දශච" යි තකාරයට හා දකාරයට නකාර වීමෙන් සිද්ධ යි. "අනිත්‍යතෙනෙති= අන්නම්" යි "අන ප්‍රාණනෙ" යන ධාතුවෙන් ද එය නිපදවිය හැකි ය.) "රඃ" යන සූත්‍රයෙන් රකාරයෙන් පර තකාරයට නකාරය වේ. කෲ විදාරණෙ, "කෲ" ධාතුව පැලිමෙහි ද; කෲ හිංසායාම්, (ක්‍ර්‍යාදි) "කෲ" ධාතුව පෙළීමෙහි ද; කෲ වික්ෂෙපෙ, (තුදාදි) "කෲ" ධාතුව විසුරුවීමෙහි ද වේ. "ඎත ඉර්" යන සූත්‍රයෙන් ඎකාරයට 'ඉර්' ආදෙශ වේ. "ය්වොර්වි හසෙ" යන්නෙන් ඉකාරයට දීර්ඝ වේ. විකීර්‍ය්‍යතෙ ස්ම, පැලුනේ, පෙළුනේ හෝ විසුරුණේ නු යි; අසෞ, මෙතෙමේ; විකීර්ණඃ, "විකීර්ණ" නමි. (යථොක්ත ධාතු ත්‍රයයෙන් ම එක සේ සිද්ධ ය.) ජෲෂ් වයොහානෞ, "ජෲ" ධාතුව වයස් පිරිහීමෙහි වේ. ෂකාරඃ, අනුබන්ධ ෂකාරය; ෂිද්භිදමඞ් ඉත්‍යස්‍ය, මතු දැක්වෙන "ෂිද්භිදමඞ්" යන සූත්‍රයාගේ; විශෙෂණාර්ථඃ, වෙසෙසීම ප්‍රයෝජන කොට ඇත්තේ ය,

---

* පාණිනීය 1- 1- 26.

## 42. ල්වාද්‍යෝදිතශ්ච.* (ල්වාද්‍යෝදිතඃ 5- 1. ව- භි:)

### a. ල්වාදෙරෝදිතශ්ච ධාතෝඃ කිතස්තො නො භවති.

---

හෙවත් "ජරා" යනාදි වශයෙන් ඒ සූත්‍රයෙන් සත්‍යර්ථයෙහි අඞ ප්‍රත්‍යය වීම පිණිස ය. ජීර්‍යතෙ සම, දිරූයේ නු යි; තත්, එය; ජීර්ණම්, "ජීර්ණ' නම්. කිම්, කුමක් ද යත්? ශරීරම්, සිරුර යි. ගීර්‍යතෙ සම, ගිලින ලද්දේ හෝ ස්තුති කරණ ලද්දේ නු යි; තත්, එය; ගීර්ණම්, "ගීර්ණ" නම්. ("ගෳ නිගරණෙ" හෝ "ගෳ ශබ්දෙ" ධාතු යි.) පූරී පූරණෙ,ඊකාරානුබන්ධ "පූර්" ධාතුව පිරීමෙහි ය. පූර්‍යතෙ සම, පිරුණේ නු යි; අසෞ, මෙතෙමේ; පූර්ණඃ, "පූර්ණ" නම්. රඃ ඉති සූත්‍රම්, "රඃ" යන සූත්‍රය; පිපර්තෙඃ න, පෳ ධාතුව සම්බන්ධ ව නො වේ. හෙවත් "රඃ" යන සූත්‍රයෙන් විහිත කාර්‍යය "පෳ පාලනපූරණයොඃ" යන ධාතුව සම්බන්ධ ව නො වේ. "පොරුර්" යන්නෙන් ඎකාරයට 'උර්' ආදෙශ වේ. පිපර්ති සම ඉති, පිරී නු යි; පූර්තඃ, "පූර්ත" නම්. (මෙහි තකාරයට නකාරය වීමෙන් "පූර්ණ" යි නො වේ.)

42. නකාරාදෙශවිධි සූත්‍ර යි. "යජාං -පෙ- කිති" යි වි: වි: වශයෙන් **කිතඃ** යනු ද, "දස්තස්‍ය නො දශ්ච" යි **තස්‍ය- නඃ** යනු ද අනුවෘත්ත යි. ල්වාද්‍යෝදිතඃ ච, ල්වාදිය හා ඔදිත් ධාතූහු කෙරෙන් ද පර වූ; කිතඃ, කිත් වූ; තස්‍ය, තකාරයට; නඃ, නකාරය වේ.

a. ල්වාදෙඃ, ලූ ආදි වූ ද; ඔදිතඃ ච, ඔදිත් වූ ද; ධාතොඃ, ධාතූහු කෙරෙන් පර වූ; කිතඃ, කයන්ත ඉත් කොට ඇති; තඃ, තකාරයට; නඃ භවති, නකාරය වේ.

(මෙයින් ල්වාදියෙන් හා ඔදිත් ධාතූන් කෙරෙන් ද පර වූ නිෂ්ඨා ප්‍රත්‍යයන්ගේ තකාරයට නකාරය වේ. මෙහි **ල්වාදිය** නම් ක්‍ර්‍යාදි ගණයට අයත් 'ලූ' ධාතුව ආදි කොට ඇති ධාතූන් එක්විස්සෙකි. එනම්:- (1) ලූඤ්, (2) ස්තෳඤ්, (3) කෳඤ්, (4) වෳඤ්, (5) ධූඤ්, (6) ශෳඤ්, (7) දෘ, (8) පෳ, (9) භෳ, (10) මෳ, (11) දෳ, (12) ජෳ, (13) නෳ, (14) කෳ, (15) ඎ, (16) ගෳ, (17) ජ්‍යා, (18) රී, (19) ලී, (20) ව්‍රී, (21) ප්ලී යන මොහු යි. ඔදිත් ධාතු දෙකොටසකි. එනම්:- (i) ස්වරූපයෙන් ඔකාරය ඉත්

---

* ල්වාද්‍යෝදිතඃ- පොත්හි. "ල්වාදිභ්‍යඃ, 8- 2- 44. ඔදිතශ්ච, 8- 2 45" යන පාණිනීය සූත්‍ර දෙක එකයොග කිරීමෙන් මෙය හදල බව පෙණේ.

**a. ලූඤ් ඡේදනෙ, ලූයතෙ සමාසෞ= ලූනඃ. ජ්‍යා වයෝහානෞ, "ග්‍රහාං ඞිති ච" ජීනාති සමාසෞ= ජීනඃ.**

**b. භුජෝ කෞටිල්‍යෙ, "චොඃ කුඃ" භුජ්‍යතෙ සමාසෞ= භුග්නඃ. ඔහාක් ත්‍යාගෙ, "ඝ්‍රාමි" හියතෙ සමාසෞ= හීනඃ.**

**c. ෂූඞ් දූඞ් ඩීඞ් ධීඞ් රීඞ් මීඞ් දීඞ් ලීඞ් ව්‍රීඞ් එතෙ නව ඔදිතඃ. ෂූඞ් ප්‍රාණිප්‍රසවෙ, සූයතෙ සමාසෞ= සූනඃ. දූඞ් පරිතාප්‍යාගෙ, දූඞ් දුඃඛෙ, දූයතෙ සමාසෞ= දූනඃ. ඩීඞ් විහායසා ගතෞ, ඩීඞ් ඉඩහාවඃ, ඩීයතෙ සමාසෞ= ඩීනඃ. ධීඞ් ධාරණෙ, ධීඞ් සාමර්ථ්‍යෙ, ධීයතෙ සමාසෞ= ධිනඃ. රීඞ් ක්ෂරණෙ, රීඞ්**

---

කොට ඇති ධාතු ය, (ii) ඔදිත් සංඥ හෙවත් ධාතුපාඨයන්හි "ඔදිත්" ය යි හඳුරණ ලද ධාතු ය කියා යි. එහි ඔලස්ජී, ඔහාක්, ඔප්‍යායී, ඔවිජී, ටුඔශ්විඉර්, භුජෝ යනාදිය ස්වරූපයෙන් ඔකාරය ඉත් කොට ඇති ධාතුහු ය. පොත්හි ද මතු දක්වෙන දිවාදි ගණයට අයත් (1) ෂූඞ්, (2) දූඞ්, (3) ඩීඞ්, (4) ධීඞ්, (5) රීඞ්, (6) මීඞ්, (7) දීඞ්, (8) ලීඞ්, (9) ව්‍රීඞ් යන නවය ඔදිත් සංඥ ධාතුහු ය.)

a. ලූඤ් ඡේදනෙ, "ලූ" ධාතුව සිඳීම් අර්ථයෙහි ය. ලූයතෙ සම, සිඳින ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ලූනඃ, "ලූන" නම්. ජ්‍යා වයොහානෞ, "ජ්‍යා" ධාතුව වයස් පිරිහීමෙහි ය. "ග්‍රහාං ඞිති ච" යන් සූත්‍රයෙන් සම්ප්‍රසාරණ වේ. ජීනාති සම, වයස් ගත වී නු යි; අසෞ, මෙතෙමේ; ජීනඃ, "ජීන" නම්. (මේ ල්වාදියට නිදර්ශන යි.)

b. භුජෝ කෞටිල්‍යෙ, "භුජ්" ධාතුව කුටිලභාවයෙහි ය. "චොඃ කුඃ" යන සූත්‍රයෙන් ජකාරයට ගකාරය වේ. භුජ්‍යතෙ සම, කුටිල කරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; භුග්නඃ, "භුග්න" නම්. ඔහාක් ත්‍යාගෙ, "හා" ධාතුව පරිත්‍යාගයෙහි ය. "ඝ්‍රාමි". යන සූත්‍රයෙන් ආකාරයට ඊකාරය වේ. හීයතෙ සම, දුරු කරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; හීනඃ, "හීන" නම්. (මේ ස්වරූපයෙන් ඔකාරය ඉත් කොට ඇති ධාතූන්ට උදාහරණ යි.)

c. ෂූඞ්— ව්‍රීඞ් එතෙ නව, ෂූඞ්- දූඞ්- ඩීඞ්- ධීඞ්- රීඞ්- මීඞ්- දීඞ්- ලීඞ්- ව්‍රීඞ් යන මේ නවය; ඔදිතඃ, ඔදිත් ධාතුහු ය. (සියල්ල ම ඞකාරය ඉත් කොට ඇති දිවාදි ආත්මනෙපදීහු ය. එහෙයින් කාතීඃ- කමී- භාවයන්හි වාක්‍යභෙදයෙක් නො වේ. ඉක්බිති ඔවුන් කෙරෙන් පර තකාරයට නකාරය වන බවට නිදර්ශන; දක්වත්.)

**ස්‍රුවණෙ, රීයතෙ සමාසෞ= රීණඃ. මීඞ් ප්‍රාණවියොගෙ, මීඞ් හිංසායාම්, මීයතෙ සමාසෞ= මීනඃ. දීඞ් ක්‍ෂයෙ, දීයතෙ සමාසෞ= දීනඃ. ලීඞ් ආශ්ලෙෂණෙ, ලීඞ් විලපනෙ, ලීයතෙ සමාසෞ= ලීනඃ. ව්‍රීඞ් වරණෙ, ව්‍රීයතෙ සමාසෞ= ව්‍රීණඃ. එතෙ ඔදිතඃ.**

**a. ඔප්‍යායී වෘද්ධෞ.**

## 43. ප්‍යායඃ පී. (ප්‍යායඃ 6- 1. පී 1- 1.)

---

ෂූඞ් ප්‍රාණිප්‍රසවෙ, ෂොපදෙශ "ෂූ" ධාතුව ප්‍රාණිගැබ් විමොචනයෙහි වේ. සූයතෙ සම, උපදවනු ලැබී නු යි; අසෞ, මෙතෙමේ; සූනඃ, "සූන" නම්. දූඞ් පරිත්‍යාගෙ, "දූ" ධාතුව දුරු කිරීමෙහි ද; දූඞ් දුඃඛෙ, "දූ" ධාතුව දුකෙහි ද වේ. දූයතෙ සම, දුරු කරණ ලද්දේ හෝ දුඃඛිත වී නු යි; අසෞ, මෙතෙමේ; දූනඃ, "දූන" නම්. ඩීඞ් විහායසා ගතෞ, "ඩී" ධාතුව අහසින් යෑමෙහි වේ. ඩීඞඃ, ඩීඞ් ධාතුව සම්බන්ධ ව; ඉට් අභාවඃ, (සෙට් වුව ද) ඉඩාගමය නො වේ. ඩීයතෙ සම, අහසින් ගියේ නු යි; අසෞ, මෙතෙමේ; ඩීනඃ, "ඩීන" නම්. ධීඞ් ධාරණෙ, "ධී" ධාතුව දැරීමෙහි ද; ධීඞ් සාමර්ථ්‍යෙ, "ධී" ධාතුව සමත් බැව්හි ද වේ. ධීයතෙ සම, දරණු ලැබී නු යි හෝ සමත් වී නු යි; අසෞ, මෙතෙමේ; ධීනඃ, "ධීන" නම්. රීඞ් ක්‍ෂරණෙ, "රී" ධාතුව ගිලිහීමෙහි ද; රීඞ් ස්‍රවණෙ, "රී" ධාතුව වැගිරීමෙහි ද වේ. (ක්‍ෂරණ- ස්‍රවණ දෙක ම සමානාර්ථ යි.) රීයතෙ සම, වැගිරී නු යි; අසෞ, මෙතෙමේ; රීණඃ, "රීණ" නම්. මීඞ් ප්‍රාණවියොගෙ, "මී" ධාතුව පණින් වෙන් වීමෙහි ද; මීඞ් හිංසායාම්, "මී" ධාතුව පෙළීමෙහි ද වේ. මීයතෙ සම, ප්‍රාණයෙන් වෙන් වූයේ හෝ පෙළන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; මීනඃ, "මීන" නම්. දීඞ් ක්‍ෂයෙ, "දී" ධාතුව පිරිහීමෙහි වේ. දීයතෙ සම, පිරිහී නු යි; අසෞ, මෙතෙමේ; දීනඃ, "දීන" නම්. ලීඞ් ආශ්ලෙෂණෙ, "ලී" ධාතුව වැළඳ ගැනීමෙහි ද; ලීඞ් විලපනෙ, "ලී" ධාතුව වැලපීමෙහි ද වේ. ලීයතෙ සම, වැළඳ ගත්තේ හෝ වැලපී නු යි; අසෞ, මෙතෙමේ; ලීනඃ, "ලීන" නම්. ව්‍රීඞ් වරණෙ, "ව්‍රී" ධාතුව රිස්සීමෙහි වේ. ව්‍රීයතෙ සම, රිස්සී නු යි; අසෞ, මෙතෙමේ; ව්‍රීණඃ, "ව්‍රීණ" නම්. එතෙ, මොහු; ඔදිතඃ, 'ඔදිත්' සංඥ ධාතුහු ය.

a. ඔප්‍යායී වෘද්ධෞ, ඔ- ඊ අනුබන්ධ "ප්‍යාය්" ධාතුව වැඩීමෙහි වේ.

**a. ප්‍යායඃ පී ආදෙශො භවති නිෂ්ඨායාම්. ප්‍යායතෙ සමාසෞ= පීනඃ.**

**b. ක්ෂි ක්ෂයෙ, ක්ෂියො නිෂ්ඨායාං කර්තරි දීර්ඝො වාච්‍යඃ. දීර්ඝාදෙව ක්ෂියො නිෂ්ඨායාස්තස්‍ය නො වාච්‍යඃ. ක්ෂීයතෙ සමාසෞ= ක්ෂීණඃ- ක්ෂීණවාන්. භාවකර්මණොස්තු ක්ෂීයතෙ සම තත්= ක්ෂිතම්, තෙන ක්ෂිතඃ කාමො මයා වා කර්ණඃ.**

**c. යරලවසංයොගාදෙරාදන්තාන්නිෂ්ඨාතස්‍ය නො වාච්‍යඃ. ද්‍රා ස්වප්නෙ, ද්‍රායතෙ සමාසෞ= ද්‍රාණඃ. ග්ලෛ- ම්ලෛ හර්ෂක්ෂයෙ, ග්ලායතෙ සමාසෞ= ග්ලානඃ, ම්ලානඃ. හි ගතෞ, හීයතෙ සමාසෞ= හිනඃ, ත්‍රෛඞ් පාලනෙ.**

---

43. පී ආදෙශවිධි සූත්‍ර යි. ප්‍යායඃ, 'ප්‍යාය්' ධාතුහට; පී, පී යනාදෙශ වේ.

a. නිෂ්ඨායාම්, නිෂ්ඨාප්‍රත්‍යය පර කල්හි; ප්‍යායඃ, ප්‍යාය් ධාතුහට; පී ආදෙශඃ භවති, 'පී' යනාදෙශ වේ. ප්‍යායතෙ සම, වැඩුනේ නු යි; අසෞ, මෙතෙමේ; පීනඃ, "පීන" නම්.

b. ක්ෂි ක්ෂයෙ, "ක්ෂි" ධාතුව ක්ෂය වීමෙහි ය. කර්තරි, කර්තෘ කාරකයෙහි වූ, නිෂ්ඨායාම්, නිෂ්ඨා ප්‍රත්‍යය පර කල්හි; ක්ෂියඃ, ක්ෂි ධාතුහට; දීර්ඝඃ වාච්‍යඃ, දීර්ඝය කිය යුතු යි. දීර්ඝාත් එව, දීර්ඝ වූ ම; ක්ෂියඃ, ක්ෂි ධාතුවෙන් පර වූ; නිෂ්ඨායාඃ, නිෂ්ඨාසංඥ වූ; තස්‍ය, තකාරයට; නඃ වාච්‍යඃ, නකාරාදෙශය කිය යුතු යි. ක්ෂීයතෙ සම, ක්ෂය වී නු යි; අසෞ, මෙතෙමේ; ක්ෂීණඃ, "ක්ෂීණ" නම්. ක්ෂීණවාන්, කතවතු ප්‍රත්‍යය වීමෙන් "ක්ෂීණවත්" නම් වේ. භාවකර්මණොඃ තු, භාව- කර්ම දෙක්හි වනාහි; (උදාහරණ දක්වනු ලැබේ.) ක්ෂීයතෙ සම, (අතීතයෙහි) ක්ෂය වීම නු යි; තත්, එය; ක්ෂිතම්, "ක්ෂිත" නම්; (භාවයෙහි ය.) තෙන, ඔහු විසින්; කාමඃ, කාමය; ක්ෂිතඃ, ක්ෂය කරණ ලද්දේ ය. මයා වා, මා විසින් හෝ; කර්ණඃ, කර්ණ තෙමේ; (ක්ෂිතඃ, ක්ෂය කරණ ලද්දේ ය. කර්මකාරකයෙහි ය.)

c. යරලව සංයොගාදෙඃ, ය- ර- ල- ව යන වර්ණයන්ගේ සංයොගයක් ආදි කොට ඇති; ආදන්තාත්, ආකාරාන්ත ධාතුහු කෙරෙන් පර වූ; නිෂ්ඨා තස්‍ය, නිෂ්ඨා සංඥ තකාරයට; නඃ වාච්‍යඃ, නකාරාදෙශය කිය යුතු යි. ද්‍රා ස්වපෙන, "ද්‍රා" ධාතුව නිදීමෙහි වේ. ද්‍රායතෙ සම, සැතපී නු යි; අසෞ, මෙතෙමේ; ද්‍රාණඃ, "ද්‍රාණ" නම්. ග්ලෛ ම්ලෛ හර්ෂක්ෂයෙ, "ග්ලෛ- ම්ලෛ" ධාතු දෙක සතුට

## 44. ත්‍රාණාද්‍යා නිපාත්‍යන්තෙ වා.*

(ත්‍රාණාද්‍යාඃ 1-3. නිපාත්‍යන්තෙ- අා: වා- නි:)

**a. ත්‍රාණාදීනාං නත්වං වා නිපාත්‍යතෙ. ත්‍රායතෙ ස්මා සෞ= ත්‍රාණඃ- ත්‍රාතඃ.**

**b. ඝ්‍රා ගන්ධොපාදනෙ, ජිඝ්‍රති ස්මාසෞ= ඝ්‍රාණඃ- ඝ්‍රාතඃ. හ්‍රී ලජ්ජායාම්, හ්‍රීයතෙ ස්මාසෞ= හ්‍රීණඃ- හ්‍රීතඃ. නුද් ප්‍රෙරණෙ, නුද්‍යතෙ ස්මාසෞ= නුන්නඃ- නුත්තඃ. විදිර් විචාරණෙ, විද්‍යතෙ ස්මාසෞ= වින්නඃ- වින්තඃ.**

---

පිරිහීමෙහි වේ. ග්ලායතෙ ස්ම, ගිලන් වී නු යි; අසෞ, මෙතෙමේ; ග්ලානඃ, "ග්ලාන" නම්. ම්ලානඃ, 'ම්ලායතෙ ස්ම' (=මැලවී) යන වාක්‍යයෙහි "ම්ලාන" නම්. හි ගතෞ, "හි" ධාතුව ගමන්හි වේ. හීයතෙ ස්ම, ගියේ නු යි; අසෞ, මෙතෙමේ; හිතඃ, "හිත" නම්. ත්‍රෛඞ් පාලනෙ, "ත්‍රෛ" ධාතුව පාලනය කිරීමෙහි වේ.

44. නිපාතනවිධි සූත්‍ර යි. ත්‍රාණාද්‍යාඃ, ත්‍රාණ යනාදීහු; වා, විකල්පයෙන්; නිපාත්‍යන්තෙ, නිපාතනය කරණු ලැබෙත්.

a. ත්‍රාණාදීනාම්, 'ත්‍රාණ' යනාදීන්ගේ; නත්වම්, නකාර බව, වා, විකල්පයෙන්; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ. (මෙහි ත්‍රාණාදියට ගැණෙන නුද- විද- උන්දී යන ධාතු ත්‍රයෙන් පර තකාරයට "දස්තස්‍ය නො දශව" යන්නෙන් ද, ත්‍රෛ- ඝ්‍රා යන ධාතු දෙකින් පර තකාරයට "යරලවසංයොගාදෙරුදන්තාංනාති ෂ්ඨාන්තස්‍ය නො වාච්‍යඃ" යන්නෙන් ද නත්වය නිත්‍යයෙන් වන හෙයිනුත්, හ්‍රී- වා යන ධාතු දෙකින් පර තකාරයට පෙර කී සූත්‍ර වලින් නත්වය නො වන හෙයිනුත් ඔවුන් කෙරෙන් පර තකාරයට නත්වය විකල්පයෙන් නිපාතනය කළ යුතු බව මෙයින් සූචිත යි.) ත්‍රායතෙ ස්ම, රක්නා ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ත්‍රාණඃ, "ත්‍රාණ" නම් ද; ත්‍රාතඃ, විකල්ප පක්ෂයෙහි "ත්‍රාත" නම් ද වේ.

b. ඝ්‍රා ගන්ධොපාදනෙ, "ඝ්‍රා" ධාතුව ගන්ධාඝ්‍රාණයෙහි වේ. ජිඝ්‍රති ස්ම, ආඝ්‍රාණය කෙළේ නු යි; අසෞ, මෙතෙමේ; ඝ්‍රාණඃ- ඝ්‍රාතඃ, නකාරාදෙශයෙන් "ඝ්‍රාණ" නම් ද, විකල්පයෙන් "ඝ්‍රාත" නම් ද වේ. හ්‍රී ලජ්ජායාම්, "හ්‍රී" ධාතුව ලජ්ජාවෙයෙහි ය. හ්‍රීයතෙ ස්ම,

---

* ත්‍රාණාද්‍යා වා- පොත්හි. "අත්‍රභවත්තත්‍රභවවජ්බිදෙග පූජ්‍යාපෙ" යනාදී සූත්‍රවලට ද "නිපාත්‍යන්තෙ" කියා අනුවෘත්ත වන්නේ මේ සූත්‍රයෙහි.

**10. වෙත්ති රූපං විද ඤාතෙ- විනෙත්ත විදිර් විචාරණෙ,**
**විද්‍යතෙ විද සත්තායාම්- විදෟ ලාභෙ ච වින්දති.**

**a. උන්දී ක්ලෙදෙ, උද්‍යතෙ සමාසෞ= උන්නඃ- උත්තඃ. වා ගතිගන්ධනයොඃ, නිර්වාති සම වා නිර්වායතෙ සමාසෞ= නිර්වාණඃ-**

---

ලජ්ජිත වී නු යි; හ්‍රීණඃ- හ්‍රීතඃ, "හ්‍රීණ" නම් ද, "හ්‍රීත" නම් ද වේ. නුද් ප්‍රේරණෙ, "නුද්" ධාතුව මෙහෙයීමෙහි ය. නුද්‍යතෙ සම, මෙහෙයන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; නුන්නඃ- නුත්තඃ, "නුන්න" නම් ද, "නුත්ත" නම් ද වේ. විදිර් විචාරණෙ, "විද්" ධාතුව විචාරණය කිරීමෙහි ය. විද්‍යතෙ සම, විචාරණය කරණ ලද්දේ නු යි; වින්නඃ- විත්තඃ, "වින්න" නම් ද, "විත්ත" නම් ද වේ.

(මෙහි රෞධාදික "විද්" ධාතුව පමණක් ගත යුතු යි. සෙසු 'විද්' ධාතුහු ත්‍රාණාදියට නො ගැණෙත්.

**"වෙත්තෙහසතු විදිතො නිෂ්ඨා- විද්‍යතෙර්විත්ත ඉෂ්‍යතෙ,**
**විනෙත්තර්වින්නශ්ච විත්තශ්ච- භොගෙ විත්තශ්ච වින්දතෙඃ."**

යන භාෂ්‍යොක්තියෙන් ඒ බැව් පෙණේ. අදාදි විද් ධාතුවෙන් 'විදිත' කියා ද, දිවාදි විද් ධාතුවෙන් 'වින්න' කියා ද, රුධාදි විද් ධාතුවෙන් 'විත්ත'' කියා සහ 'වින්න' කියා ද, තුදාදි විද් ධාතුවෙන් 'විත්ත' කියා ද ක්ත ප්‍රත්‍යයාන්ත රූප ලැබෙන බව එයින් දක්වයි.)

10. වෙත්ති රූපං විද ඤාතෙ, "වෙත්ති" යන ආඛ්‍යාත රූපය (අදාදි=) විද ඤාතෙ" යන ධාතුහුගේ ද; විනෙත්ත විදිර් විචාරණෙ, "විනෙත්ත" යන රූපය (රුධාදි=) "විදිර් විචාරණෙ" යන ධාතුහුගේ ද; විද්‍යතෙ විද සත්තායාම්, "විද්‍යතෙ" යන රූපය (දිවාදි=) "විද සත්තායාම්" යන ධාතුහුගේ ද; වින්දති විදෟ ලාභෙ ච, "වින්දති" යන රූපය (තුදාදි=) "විදෟ ලාභෙ" යන ධාතුහුගේ ද ලට් ප්‍රථම පුරුෂ එක වචන යි. (එක ම "විද්" ධාතුව ධාතුගණ වශයෙන් වෙනස් ව වර නැගෙන අයුරු මෙයින් පෙණේ. චුරාදි ගණයට අයත් "විද්" ධාතුවෙක් ද වෙයි. එය "වෙදයති" යනාදි වශයෙන් වර නැගේ.)

a. උන්දී ක්ලෙදෙ, "උන්ද්" ධාතුව තෙත් වීමෙහි වේ. උද්‍යතෙ සම, තෙත් වූයේ නු යි; අසෞ, මෙතෙමේ; උන්නඃ- උත්තඃ, නකාරාදෙශ පක්ෂයෙහි "උන්න" නම් ද, විකල්ප පක්ෂයෙහි "උත්ත"

නිර්වාතඃ. විද් සත්තායාම්, විද්‍යතෙ සමාසෞ= විත්තඃ. * එතෙ ත්‍රාණාද්‍යා ඥෙයාඃ.

ෂ. සම් පරි උප එභ්‍යඃ පරස්‍ය කරොතෙර්ධාතොර්භූෂණෙ’ර්ථෙ ශොභනෙ’ර්ථෙ ච වාච්‍යෙ සති සුඩාගමො† භවති. ටිත්වාදාද්‍යෞ. සංස්ක්‍රියතෙ සමාසෞ= සංස්කෘතඃ. පරිෂ්ක්‍රියතෙ සමාසෞ= පරිෂ්කෘතඃ. උපස්ක්‍රියතෙ සමාසෞ= උපස්කෘතඃ.

---

නම් ද වේ. වා ගතිගන්ධනයොඃ, “වා” ධාතුව ගමන ය- සූචන ය යන අර්ථ දෙක්හි වේ. නිර්වාති සම වා, නිවී නු යි හෝ; නිර්වායතෙ සම, නිවන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; නිර්වාණඃ- නිර්වාතඃ, “නිර්වාණ” නම් ද- “නිර්වාත” නම් ද වේ. එතෙ, මොහු; ත්‍රාණාද්‍යාඃ, ත්‍රාණාදීහු ය යි; ඥෙයාඃ, දත යුත්තාහ. (ත්‍රාණාද්‍යා නිපාත්‍යන්තෙ වා යන්නෙන් මොවුන්ගේ නිෂ්ඨා ප්‍රත්‍යයස්ථ තකාරයට විකල්ප යෙන් නත්වය නිපාතනය කරණු ලැබේ.) විද් සත්තායාම්, ‘විද්’ ධාතුව වීමෙහි වේ. විද්‍යතෙ සම, වී නු යි; අසෞ, මෙතෙමේ; වින්නඃ, “වින්න” නම්. (“දස්තස්‍ය නො දශච” යි නිත්‍යයෙන් තකාරයට නත්වය වේ.)

ෂ. සම්පරිඋප එභ්‍යඃ පරස්‍ය, සම්- පරි- උප යන මේ උපසර්ගයන් කෙරෙන් පර වූ; කරොතෙඃ ධාතොඃ, “කෘ” ධාතුව සම්බන්ධ ව; භූෂණෙ අර්ථෙ, භූෂණාර්ථයක් ද; ශොභනෙ අර්ථෙ ච, ශොභනාර්ථයක් ද; වාච්‍යෙ සති, වාච්‍ය කල්හි; සුඩාගමඃ භවති, සුට් ආගම වේ. ටිත්වාත්, ටයන්න ඉත් කොට ඇති බැවින්; ආද්‍යෞ, (ධාතුහුගේ) ආදියෙහි වේ. සංස්ක්‍රියතෙ සම, සකස් කරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; සංස්කෘතඃ, “සංස්කෘත” නම්. පරිෂ්ක්‍රියතෙ සම, සකස් (=පිරිසිදු) කරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; පරිෂ්කෘතඃ, “පරිෂ්කෘත” නම්. උපස්ක්‍රියතෙ සම, සරසන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; උපස්කෘතඃ, “උපස්කෘත” නම්. (පිළිවෙළින් සුඩාගමයට උදාහරණ යි.)

---

* පොත්හි “වින්නඃ- විත්තඃ” යි ත්‍රාණාදියට ම ඇතුළත් වන සේ මුද්‍රිත ව තිබේ. එහෙත් සත්තාර්ථ “විද්” ධාතුව ත්‍රාණාදියට නො ගැණෙන බව පෙණේ. සුබොධිනී ආදිය බලනු.

† සුට් ප්‍රත්‍යයො භවති- පොත්හි.

a. යදා සංඛ්‍යාතින්, තදා සඞ්ඛ්‍යතෙ සමාසෙ= සඞ්ඛාතො. පරික්‍රියතෙ සමාසෙ= පරිඝාතො, උපඝාතො. භාවෙ ඝඤ්, සංස්ක්‍රියතෙ 'සෙ= සංඝාරො. අලඞ්ක්‍රියතෙ 'සෙ= අලඞ්කාරො. විද ඥානෙ, විද්‍යතෙ සමාසෙ= විදිතො.

## 45. දෙ දත්ති. (දඃ 6-1. දජ් 1-1. ති 7-1.)

b දා ඉත්‍යස්‍ය දජ් හවති* කිති තාදෞ පරෙ. දියතෙ සමාසෙ= දත්තො. දදාති සම ඉති= දත්තවාන්. "ව්‍රිතො නුම්."

---

a. යදා, යම් කාලෙක්හි; සංසකෘතිඃ, සංසකරණාර්ථයක්; න, නැද්ද; තදා, එකල්හි; සඞ්ක්‍රියතෙ සම, මොනවට කරණ ලද්දේ ය යන අර්ථයෙහි; අසෞ, මෙතෙමේ; සඞකෘතඃ, "සඞකෘත" නම්. පරික්‍රියතෙ සම, හැම ලෙසින් කරණ ලද ය යන අර්ථයෙහි; අසෞ, මෙතෙමේ; පරිකෘතඃ, "පරිකෘත" නම්. උපකෘතඃ, "උපක්‍රියතෙ සම" (=උපකාර කරණ ලද්දේ ය) යන වාක්‍යයෙහි "උපකෘත" නම්. භාවෙ, භාවයෙහි; ඝඤ්, ඝඤ් ප්‍රත්‍යය වේ. (මතු උණාදි ප්‍රක්‍රියාවෙහි දක්වෙන "ඝඤ් භාවෙ" යන සූත්‍රයෙන් එය කරණු ලැබේ. එහි ඝකාර- ඤකාර දෙක ඉත් ය. ඝකාරය "චජොඃ කගෞ ඝිති" යන්නෙන් චකාර- ජකාර දෙකට කකාර- ගකාර කිරීමට ය. ඤකාරය වෘද්ධි වීමට ය.) සංස්ක්‍රියතෙ, සකස් කිරීම නු යි; අසෞ, මෙතෙමේ; සංසකාරඃ, "සංසකාර" නම්. අලඞ්ක්‍රියතෙ, සැරසීම නු යි; අසෞ, මෙතෙමේ; අලඞකාරඃ, "අලඞකාර" නම්. විද ඥානෙ, "විද්" ධාතුව දැනීමෙහි වේ. විද්‍යතෙ සම, දන්නා ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; විදිතඃ, "විදිත" නම්.

45. දජ් ආදෙශවිධි සූත්‍ර යි. "යජාං -පෙ- කිති" යි කිති යනු අනුවෘත්ත යි. කිති, කිත් වූ; ති, තකාරය පර කල්හි; දඃ, 'දා' ධාතු හට; දජ්, දජ් යනාදෙශ වේ.

b. කිති, කකාරය ඉත් කොට ඇති; තාදෞ පරෙ, තකාරාදි ප්‍රත්‍යය පර කල්හි; දා ඉති අස්‍ය, දා යන මේ ධාතුහට; දජ් හවති, 'දජ්' යන ආදෙශය වේ.

(ක්ත- ක්තවතු ප්‍රත්‍යයන් පර කල්හි "ඩුදාඤ් දානෙ, දාණ් දානෙ, දො අවඛණ්ඩනෙ, දෙඞ් පාලනෙ" යන දා රූප ධාතු චතුෂ්කයට ම මේ සූත්‍රයෙන් "දජ්" ආදෙශය වේ. "දෙ දද් ඝොඃ" යනු පාණිනීය සූත්‍ර හෙයින් "දාප් ලවනෙ, දෛප් ශොධනෙ" යන පිත් වූ

---

* දද් හවති- පොත්හි.

## 46. ස්වරාන්තො වා. (සවරත් 5-1. තः 1-1. වා- නිः)

ඝ ස්වරාදුත්තරස්‍ය දා ඉත්‍යස්‍ය වා තො භවති කිති තාදෞ පරෙ. ප්‍රකර්ෂේණ දීයතෙ ස්මාසෞ= ප්‍රත්තः- ප්‍රදත්තः. අවදීයතෙ ස්මාසෞ= අවත්තः- අවදත්තः.

---

දා රූප ධාතු දෙකට මේ ආදෙශය නො වේ. එහෙයින් එයින් "අවදාතම්" යනාදි වශයෙන් වේ. එසේ ම මේ ආදෙශය ද ථකා රාන්ත කොට ම ගත යුතු යි. නො එසේ වුව සඳෙස් වේ. කියන ලද මැයි:-

"තාගෙන දෙශො දීර්ඝත්වං ස්‍යාද්
දගෙන දෙශො නිශ්ඨා නත්වම්,
ධාගෙන දෙශො ධත්වප්‍රාප්ති
ථාගෙන 'දෙශසන්සමාප්ථානතම්."

මේ ආදෙශය "දත්" යි තකාරාන්ත වූ කල්හි දෙෂය නම් "විදත්තම්" යනාදි උදාහරණයන්හි මතු දැක්වෙන "තාම්‍යන්තාප සගීස්‍ය දීර්ඝො භවති" යන්නෙන් දීර්ඝ වීම යි. "දද්" යි දකාරාන්ත වූ කල්හි දෙෂය නම් "දස්තස්‍ය තො දශව" යන්නෙන් නිෂ්ඨා තකාර යට නකාරය වීම යි. "දධ" යි ධකාරාන්ත වූ කල්හි දෙෂය නම් "තථොර්ධः" යන්නෙන් තකාරයට ධකාරය වීම යි. "දථ්" යි ථකාරාන්ත වූ කල්හි නිර්දෙෂ ය. එහෙයින් මේ ආදෙශ රූපය ථකාරාන්ත ම වේ ය යි ඒ ශ්ලොකයෙන් උගන්වයි. පසු ව "ඛසෙ චපා ඣසානාම්" යන සූත්‍රයෙන් ථකාරයට තකාරය වේ. සූත්‍රයෙහි වූ "දත්ති" යනු ද "දථ් + ති" යි සිටි කල්හි "ඛසෙ චපාः" යනාදි සූත්‍රයෙන් ම සිද්ධ ය. එහෙත් තකාරාන්ත කොට ගැණීමෙහි නිදෙස් බවකුදු සාශිකා කාරයෝ දැක්වූහ.)

දීයතෙ ස්ම, දෙන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; දත්තः, "දත්ත" නම්. දදාති ස්ම ඉති, දුන්නේ නු යි; දත්තවාන්, "දත්තවත්" නම්. "ව්‍රිතො නුම්" යන සූත්‍රයෙන් ('දත්තවාන්' යන මෙහි) නුමාගම විය.

46. තකාරාදෙශවිධි සූත්‍ර යි. "යජාං -පෙ- කිති" යි කිති යනු ද, "දෙ දත්ති" යි දः- ති යනු ද අනුවෘත්ත යි. කිති, කිත් වූ; ති, තකාරය පර කල්හි; ස්වරාත්, ස්වරයා කෙරෙන් පර වූ; දः, දා ධාතුහට; වා, විකල්පයෙන්; තः, තකාරය වේ.

ඝ. කිති, කයන්ත ඉත් කොට ඇති; තාදෞ පරෙ, තකාරාදි ප්‍රත්‍යය පර කල්හි; ස්වරාත් උත්තරස්‍ය, ස්වරයා කෙරෙන් පර වූ; දා ඉති අස්‍ය, දා යන මොහුට; වා, විකල්පයෙන්; තः භවති, තකාරා

a. "නාම්‍යන්තොපසර්ගස්‍ය දීර්ඝො භවති, දදාතෙ ස්තො වාච්‍යඃ,, නිතරාං දීයතෙ සම තත් = නීත්තම් – නිදත්තම්.* පර්‍ය්‍යාසමන්තාද්භාවෙන දීයතෙ සම තත් = පරීත්තම් –පරිදත්තම්.†

---

දෙශ වේ. ("අච උපසර්ගාත්තඃ" යනු පාණිනීය සූත්‍ර යි. එහෙයින් මෙහි "ස්වරාත්" යි සාමාන්‍යයෙන් කිව ද "ස්වරාන්ත උපසර්ගයා කෙරෙන්" ය යි අර්ථ ගත යුතු යි. එබැවින් "දෙවදත්ත" යනාදියෙහි තකාරාදෙශය නො වේ. ස්වරාන්ත උපසර්ගයන් කෙරෙන් පර පිත් නුවූ දාරූප ධාතූන්ට විකල්පයෙන් "ත්" ආදෙශය මේ සූත්‍රයෙන් විහිත ය. විකල්ප පක්ෂයෙහි පූර්ව සූත්‍රයෙන් "දත්" ආදෙශ වේ.) ප්‍රකර්ෂේණ දීයතෙ සම, උසස් ලෙස දෙන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ප්‍රත්තඃ- ප්‍රදත්තඃ, තකාරාදෙශ පක්ෂයෙහි "ප්‍රත්ත" නම් ද, විකල්ප පක්ෂයෙහි "ප්‍රදත්ත" නම් ද වේ. අවදීයතෙ සම, කඩන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; අවත්තඃ- අවදත්තඃ, "අවත්ත" නම් ද- "අවදත්ත" නම් ද වේ. ("දෙ අව ඛණ්ඩනෙ" ධාතු යි.)

b. නාම්‍යන්තොපසර්ගස්‍ය, නාමින් ස්වරාන්ත වූ උපසර්ගයට; දීර්ඝඃ භවති, දීර්ඝ වේ. දදාතෙඃ, 'දා' ධාතුහට; තඃ වාච්‍යඃ, තකාර දෙශය කිය යුතු යි. (මේ තකාරාදෙශය "ස්වරාත්තො වා" යන සූත්‍ර යෙන් ම ය. එයින් තකාරාදෙශ වූ කල්හි ම දීර්ඝය වේ. "නාම්‍යන්තොපසර්ගස්‍ය දීර්ඝො දාදෙශෙ තකාරෙ" යන සිද්ධාන්ත චන්ද්‍රිකා සූත්‍රයෙන් ඒ බැව් පැහැදිලි වේ. පාණිනීයාදියෙහි ද එසේ ය.

"අවදත්තං විදත්තඤ්ච- ප්‍රදත්තඤ්චාදි කර්මණි,
සුදත්තමනුදත්තඤ්ච - නිදත්තමිති වෙෂ්‍යතෙ."

යන ශ්ලොකයෙන් තකාරාදෙශ නො වන පක්ෂයෙහි දීර්ඝ නො වන බවට නිදර්ශන දක්වූහ.) නිතරාං දීයතෙ සම, අතිශයින් දෙන ලද්දේ හෝ අතීතයෙහි දීම නු යි; තත්, එය; නීත්තම්- නිදත්තම්, තකාරාදෙශ පක්ෂයෙහි දීර්ඝ ව "නීත්ත" කියා ද- විකල්ප පක්ෂයෙහි

---

* නිදත්තම්. †පරිදත්තම්. පොත්හි.

**a. දධාතෙර්හිඃ. ***

**b.** **දධාතෙර්හිර්නිෂ්ඨායාං වාච්‍යඃ. ධියතෙ ස්මාසෞ= හිතඃ. දධාති ස්මාසෞ= හිතවාන්.**

**c. ජහාතෙශ්ච කිති.**

**d.** **ජහාතෙර්ධාතොඃ කිති ප්‍රත්‍යයෙ පරෙ හිරාදෙශඃ ස්‍යාත්. තෙන පූර්වං හිත්වා, හීයතෙ ස්මාසෞ= හිතඃ. අහාසීදිති=හිතවාන්.**

**e.** **ධ්‍යාඛ්‍යාපෲමූර්ඡිමදාං ක්තස්‍ය නත්වාභාවො වාච්‍යඃ. ධ්‍යෛ චින්තායාම්, ධ්‍යායතෙ ස්මාසෞ=ධ්‍යාතඃ. ඛ්‍යා ප්‍රකථනෙ, ඛ්‍යායතෙ ස්මාසෞ= ඛ්‍යාතඃ. පෲ පාලනෙ, පූර්‍යතෙ ස්මාසෞ= පූර්තඃ. "පොරුද්" "ය්වොර්ච් හසෙ" මූර්ඡා මොහසමුච්ඡ්‍රායයොඃ.**

---

දීර්ඝ නො ව "තිදත්ත" කියා ද වේ. පරි, 'පරි' යි සේ යි; ආසමන්තාත් භාවෙන, භාත්පසින්; දීයතෙ ස්ම, දෙන ලද්දේ හෝ අතීතයෙහි දීම නු යි; තත්, එය; පරීත්තම්- පරිදත්තම්, (පූර්ව උදාහරණයෙහි මෙන්) "පරීත්ත" කියා ද- "පරිදත්ත" කියා ද වේ.

a. දධාතෙඃ, ධා ධාතුහට; හිඃ, 'හි' යනාදෙශ වේ.

b. නිෂ්ඨායාම්, නිෂ්ඨා ප්‍රත්‍යය පර කල්හි; දධාතෙඃ, ධා ධාතුහට; හිඃ, වාච්‍යඃ, 'හි' යනාදෙශය කිය යුතු යි. ධියතෙ ස්ම, දරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; හිතඃ, "හිත" නම්. දධාති ස්ම, දැරුවේ නු යි; අසෞ, මෙතෙමේ; හිතවාන්, "හිතවත්" නම්.

c. කිති, කිත් වූ ප්‍රත්‍යය පර කල්හි; ජහාතෙඃ ච, 'හා' ධාතුහට ද "හි" යනාදෙශ වේ.

d. කිති ප්‍රත්‍යයෙ පරෙ, කයන්න ඉත් කොට ඇති ප්‍රත්‍යය පර කල්හි; ජහාතෙඃ ධාතොඃ, හා ධාතුහට; හිඃ ආදෙශඃ ස්‍යාත්, 'හි' ආදෙශය වන්නේ ය. තෙන, එහෙයින්, "පූර්වං හිත්වා" (=පූර්වය හැර) යන මෙහි 'ක්ත්වා' ප්‍රත්‍යය පර නිමිත්තෙන් 'හා' ධාතුහට 'හි' ආදෙශ ව "හිත්වා" යනු වේ. හීයතෙ ස්ම, හරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; හිතඃ, "හිත" නම්. අහාසීත් ඉති, හළේ නු යි; හිතවාන්, "හිතවත්" නම්.

e. ධ්‍යාඛ්‍යාපෲමූර්ඡිමදාම්, ධ්‍යා- ඛ්‍යා- පෲ- මූර්ජ්- මද් යන ධාතුන්ගේ; ක්තස්‍ය, ක්ත ප්‍රත්‍යයට; නත්ව අභාවඃ, නකාර බව නො වීම; වාච්‍යඃ, කිය යුතු යි.

---

* පාණිනීය 7- 4- 42. සාරස්වත සූත්‍ර පාඨයට මෑතදී ඇතුළත් වූවක් විය යුතු යි.

a. රාල්ලොපශ්ජ්වොඃ.

**b. රෙඵාදුත්තරයොශ්ජ්වොලෝපො භවති කිති තකාරෙ පරෙ. මූර්ච්ඡති * සමාසෞ= මූර්තඃ. මදී හර්ෂෙ, මාද්‍යති† සම ඉති= මත්තඃ.**

---

(මෙහි ධ්‍යා– ඛ්‍යා ධාතු දෙකින් පර තකාරයට "සරලව සංයොගාදෙරුදන්තාන්නිෂ්ඨාතස්‍ය නො වාච්‍යඃ" යන්නෙන් ද, පෘ ධාතුවෙන් පර තකාරයට "ල්වාද්‍යෘදිතශ්ච" යන්නෙන් ද, මූර්ජ් ධාතුවෙන් පර තකාරයට "රඃ" යන්නෙන් ද, මද් ධාතුවෙන් පර තකාරයට "දසනස්‍ය නො දශව" යන්නෙන් ද පැමිණෙන නකාරාදෙශය මෙයින් ප්‍රතිෂිද්ධ යි.)

ධ්‍යෙ චින්තායාම්, "ධ්‍යෙ" ධාතුව සිතීමෙහි වේ. ධ්‍යායතෙ සම, සිතන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ධ්‍යාතඃ, "ධ්‍යාත" නම්. ඛ්‍යා ප්‍රකථනෙ, "ඛ්‍යා" ධාතුව ප්‍රකාශියෙන් කීමෙහි වේ. ඛ්‍යායතෙ සම, කියන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ඛ්‍යාතඃ, "ඛ්‍යාත" නම්. පෘ පාලනෙ, "පෘ" ධාතුව රැකීමෙහි වේ. පූර්යතෙ සම, රක්නා ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; පූර්තඃ, "පූර්ත" නම්. "පොරුර්" යන සූත්‍රයෙන් 'උර්' ආදෙශ විය. "ය්වොර්ව් හසෙ" යන සූත්‍රයෙන් උකාරයට දීර්ඝ විය. මූර්ඡා මොහසමුච්ඡ්‍රායයොඃ, "මූර්ඡා" ධාතුව මූලා වීම ය– උස් වීම ය යන අර්ථ දෙක්හි වේ.

a. රාත්, රකාරයා කෙරෙන් පර වූ; ජ්වොඃ, ඡකාර– වකාර දෙකට; ලොපඃ, ලොප් වේ.

b. කිති තකාරෙ පරෙ, කිත් වූ තකාරය පර කල්හි; රෙඵාත් උත්තරයොඃ, රෙඵයා කෙරෙන් පර වූ; ජ්වොඃ, ඡ– ව දෙකට; ලොපඃ භවති, ලොප් වේ. මූර්ච්ඡති සම, මූලා වී නු යි; අසෞ, මෙතෙමේ, මූර්තඃ, "මූර්ත" නම්. ("ධූර්තඃ" යනු රෙඵයා කෙරෙන් පර වකාර ලොපයට උදාහරණ යි. "ධූර්වී හිංසායාම්" යන ධාතු යි. මේ ඡකාර– වකාර ලොපය ක්විප් ප්‍රත්‍යය, ඛ්‍ය ප්‍රත්‍යාහාරාදි ප්‍රත්‍යය, ඣම ප්‍රත්‍යාහාරාදි ප්‍රත්‍යය, හකාරය යන මොවුන් පර කල්හි වන බව පෙණේ. සිද්ධාන්ත චන්ද්‍රිකාදිය බලනු.) මදී හර්ෂෙ, "මද්" ධාතුව සතුටු වීමෙහි වේ. මාද්‍යති සම ඉති, මත් වී නු යි; මත්තඃ, "මත්ත" නම්.

---

* මූර්ච්ඡ්‍යතෙ. † මද්‍යතෙ. පොත්හි.

a. යජ දෙවපූජාසංගතිකරණදානෙෂු, යජේඃ ක්තඃ, ෂත්වම්, ෂ්ටුත්වම්, සම්ප්‍රසාරණම්, ඉජ්‍යතෙ සමාසෞ= ඉෂ්ටඃ– * ඉෂ්ටවාන්. ඩුවප් බීජතන්තුසන්තානෙ, උප්‍යතෙ සම තත්= උප්තම්. වහ ප්‍රාපණෙ, "හො ඪඃ" "තථොර්ධඃ" "ඪි ඪො ලොපො දීර්ඝශ්ච." උහ්‍යතෙ සමාසෞ= ඌඪඃ, භාරඃ. ඌඪො'නඩුහා පඩ්ගුඃ. වෙඤ් තන්තුසන්තානෙ, ඌයතෙ සමාසෞ= ඌතඃ. × ව්‍යෙඤ් සංවරණෙ, සංවීයතෙ සමාසෞ= සංවීතඃ. හ්වෙඤ් ස්පර්ධායාම්, හ්වෙඤ් ආහ්වානෙ, හ්වෙඤ් කෞටිල්‍යෙ, සම්ප්‍රසාරණං දීර්ඝඃ, ආහූයතෙ සමාසෞ=අහූතඃ.

---

a. යජ දෙවපූජා සංගතිකරණ දානෙෂු, "යජ්" ධාතුව දෙවියන් පිදීම ය- සත්ක්‍රියා ය- දීම ය යන අර්ථයන්හි වේ. යජේඃ ක්තඃ, යජ් ධාතුවෙන් පර ව ක්ත ප්‍රත්‍යය වේ. ෂත්වම්, "ඡශෂරාජාදෙඃ ෂඃ" යි ජකාරයට ෂකාර බව වේ. ෂ්ටුත්වම්, "ෂ්ටුභිඃ ෂ්ටුඃ" යි ප්‍රත්‍යයස්ථ තකාරයට ටුත්වය වේ. සම්ප්‍රසාරණම්, "යජාං– පෙකිති" යි යකාරයට සම්ප්‍රසාරණ වේ. ඉජ්‍යතෙ සම, පුදන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ඉෂ්ටඃ, "ඉෂ්ට" නම්. ඉෂ්ටවාන් "යජති සම" (=යාග කෙළේ) යන වාක්‍යයෙහි ක්තවතු ප්‍රත්‍යය වීමෙන් "ඉෂ්ටවත්" නම්. ඩුවප් බීජසන්තානෙ, "වප්" ධාතුව බිජු වැපිරීමෙහි වේ. (වකාරයට සම්ප්‍රසාරණ වේ.) උප්‍යතෙ සම, වපුරණ ලද්දේ නු යි; තත්, එය; උප්තම්, "උප්ත" නම්. වහ ප්‍රාපණෙ, "වහ්" ධාතුව පැමිණීමෙහි වේ. "හො ඪඃ" යන සූත්‍රයෙන් හකාරයට ඪකාරය වේ. "තථොර්ධඃ" යන්නෙන් ප්‍රත්‍යය තකාරයට ධකාරය වේ. (ඊට ටුත්වයෙන් ඪකාරය වේ. "ඪි ඪො ලොපො දීර්ඝශ්ච" යන්නෙන් පූර්ව ඪකාරයට ලොප් ව සම්ප්‍රසාරණයෙන් වූ උකාරයට දීර්ඝ ද වේ. උහ්‍යතෙ සම, උසුලන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ඌඪඃ, "ඌඪ" නම්. භාරඃ, බර යි. අනඩුහා, ගොණා විසින්; පඞ්ගුඃ, පිළා; ඌඪඃ, උසුලන ලද්දේ ය. වෙඤ් තන්තුසන්තානෙ, "වෙ" ධාතුව නූල් පැතිරවීමෙහි (=වීවීමෙහි) වේ. ඌයතෙ සම, වියන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ඌතඃ, "ඌත" නම්. ව්‍යෙඤ් සංවරණෙ, "ව්‍යෙ" ධාතුව සංවරණයෙහි වේ. සංවීයතෙ සම, සංවෘත වී නු යි; අසෞ, මෙතෙමේ; සංවීතඃ, "සංවීත" නම්. හෙව්ඤ් ස්පර්ධායාම්, "හෙව්" ධාතුව සමාන බව කිරීමෙහි ද; හෙව්ඤ් ආහ්වානෙ, (සකර්මක) 'හෙව්' ධාතුව කැඳවීමෙහි ද; හෙව්ඤ් කෞටිල්‍යෙ, 'හෙව්' ධාතුව කුටිල බැව්හි ද† වේ. සම්ප්‍රසාරණං දීර්ඝඃ, සම්ප්‍රසාරණ වූ දීර්ඝය (=ඌකාරය) වේ. ආහූයතෙ සම, කැඳවන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ආහූතඃ, "ආහූත" නම්.

---

*. ඉජ්‍යතෙ සම තත්= ඉෂ්ටම්- පොත්හි.

× ඌතඃ- පොත්හි. ඒ සදෙසි.

† කෞටිල්‍යාර්ථයෙහි "හ්වෘ" ධාතුව මිස "හ්වෙ" ධාතුව අප්‍රසිද්ධ ය.

a. වද ව්‍යක්තායාං වාචි, සම්ප්‍රසාරණම්, උද්‍යතෙ සමාසෙ= උදිතඃ. වච පරිභාෂණෙ, උච්‍යතෙ සමාසෙ= උක්තඃ. වස් නිවාසෙ, "වසිඝ්‍රුධේ‍යාරිට්" උෂ්‍යතෙ සම තත්= උෂිතම්.* "ඝසාදෙඃ ෂඃ" ක්‍ෂුධ බුභුක්‍ෂායාම්, ක්‍ෂුධ්‍යති සමාසෙ= ක්‍ෂුධිතඃ. ඤිෂ්වප් ශයෙ, සුපිති † සමාසෙ= සුප්තඃ. ඕව්‍රශ්චූ ඡෙදනෙ, වෙටො නිෂ්ඨායාම් ඉට් න. "සෙකාරශ්ලොශව" සම්ප්‍රසාරණම්, "ල්වාද්‍යොදිතශව" ඉති නත්වම්. "චොඃ කුඃ" ප්‍රවෘශ්ච්‍යතෙ සමාසෙ= ප්‍රවෘක්ණඃ.

b. ජනෙර්ජා නිෂ්ඨායාම්.

---

a. වද ව්‍යක්තායාං වාචි, "වද්" ධාතුව ව්‍යක්ත වචනයෙහි වේ. සම්ප්‍රසාරණම්, සම්ප්‍රසාරණ වේ. උද්‍යතෙ සමාසෙ, කියන ලද්දේ නු යි මෙතෙමේ; උදිතඃ, "උදිත" නම්. (සෙට් බැවින් ඉඩාගම විය.) වච පරිභාෂණෙ, "වච්" ධාතුව කීමෙහි වේ. උච්‍යතෙ සමාසෙ, කියන ලද්දේ නු යි මෙතෙමේ; උක්තඃ, "උක්ත" නම්. වස් නිවාසෙ, "වස්" ධාතුව විසීමෙහි වේ. "වසිඝ්‍රුධේ‍යාරිට්" යන සූත්‍රයෙන් ඉඩාගම වේ. උෂ්‍යතෙ සම, (අතීතයෙහි) විසීම නු යි; තත්, එය; උෂිතම්, "උෂිත" නම්. "ඝසාදෙඃ ෂඃ" යන සූත්‍රයෙන් සකාරයට ෂකාරය විය. ක්‍ෂුධ බුභුක්‍ෂායාම්, "ක්‍ෂුධ්" ධාතුව කනු කැමති බැව්හි වේ. ක්‍ෂුධ්‍යති සම, කනු කැමති වී නු යි; අසෞ, මෙතෙමේ; ක්‍ෂුධිතඃ, "ක්‍ෂුධිත" නම්. ඤිෂ්වප් ශයෙ, "ෂ්වප්" ධාතුව නිදීමෙහි වේ. සුපිති සම, ශයනය කෙළේ නු යි; අසෞ, මෙතෙමේ; සුප්තඃ, "සුප්ත" නම්. ඕව්‍රශ්චූ ඡෙදනෙ, "ව්‍රශ්ච්" ධාතුව සිඳීමෙහි වේ. නිෂ්ඨායාම්, නිෂ්ඨා ප්‍රත්‍යය පර කල්හි; වෙටඃ, වෙට් (=විකල්පයෙන් ඉඩාගම ඇති) ධාතුහු කෙරෙන්; ඉට් න, ඉඩාගම නො වේ. "සෙකාරශ්ලොශව" යන සූත්‍රයෙන් සකාරයට ලොප් වේ. සම්ප්‍රසාරණම්, සම්ප්‍රසාරණ (=රකායට ඍකාරය) වේ. ල්වාද්‍යොදිතශව ඉති, "ල්වාද්‍යොදිතශව" යන සූත්‍රයෙන්; නත්වම්, නකාර බව වේ. "චොඃ කුඃ" යන්නෙන් චකාරයට කකාරය වේ. ප්‍රවෘශ්ච්‍යතෙ සම, සිඳින ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ප්‍රවෘක්ණඃ, "ප්‍රවෘක්ණ" නම්. "අචකූප්වනාතරෙ'පි" යි ණත්වය ද විය.)

b. නිෂ්ඨායාම්, නිෂ්ඨා ප්‍රත්‍යය පර කල්හි; ජනෙඃ, 'ජන්' ධාතු හට; ජා, 'ජා' යනාදෙශ වේ.

---

*. ඌෂ්‍යතෙ සමාසෙ= ඌෂිතඃ, පොත්හි. ධාතුව අකම්මක හෙයින් කම්මකාරක යෙහි නො වේ.

† සුප්‍යතෙ සමාසෙ= සුප්තඃ, පොත්හි. මෙද අකම්මක ය.

a. ජනෙර්ජාතොජ්ජා ආදෙශො භවති නිෂ්ඨායාං පරතඃ. ජන ජනනෙ, ජායතෙ* සමාසෞ= ජාතඃ.

b. ඛනෙරාත්වං නිෂ්ඨායාම්. ඛන ඛනනෙ, ඛන්‍යතෙ සමාසෞ= ඛාතඃ.

## 47. පචෙ ාවඃ. (පචඃ 5- 1. වඃ 1- 1.)

c. පචෙඃ පරස්‍ය ක්තස්‍ය වො භවති නිෂ්ඨායාම්. පච්‍යතෙ සමාසෞ වා පාකක්‍රියයා නිර්වෘත්තඃ= පක්වඃ. පචති සමාසෞ= පක්වවාන්.

d. ක්ෂායො මඃ.†

---

a. නිෂ්ඨායාං පරතඃ, නිෂ්ඨා ප්‍රත්‍යය පර කල්හි; ජනෙඃ ධාතොඃ, ජන් ධාතුහට; ජා ආදෙශඃ, භවති, 'ජා' යනාදෙශ වේ. ජන ජනනෙ, "ජන්" ධාතුව ඉපදීමෙහි වේ. ජායතෙ සම, උපන්නේ නු යි; අසෞ, මෙතෙමේ; ජාතඃ, "ජාත" නම්.

b. නිෂ්ඨායාම්, නිෂ්ඨා ප්‍රත්‍යය පර කල්හි; ඛනෙඃ, ඛන් ධාතුහුගේ අන්තයට; ආත්වම්, ආකාර බව වේ. ඛන ඛනනෙ, "ඛන්" ධාතුව සෑරීමෙහි වේ. ඛන්‍යතෙ සම, සාරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; ඛාතඃ, "ඛාත" නම්.

47. වකාරාදෙශ විධි සූත්‍ර යි. "ක්තක්තවතූ" යන සූත්‍රය විඃ විඃ වශයෙන් ක්තක්තවත්වොඃ යි ද, "ක්ෂීතාං ක්තො වර්තමානෙ'පි" යන්නෙන් විඃ විඃ වශයෙන් ක්තස්‍ය යනු ද අනුවෘත්ත වේ. පචඃ, පච් ධාතුවෙන් පර වූ; ක්තක්තවත්වොඃ, ක්ත- ක්තවතු යන ප්‍රත්‍යය දෙදෙනාගේ; ක්තස්‍ය, ක්ත යන්නට; වඃ, වකාරාදෙශ වේ. (පාණිනීය සූත්‍රයත් මෙය ම යි.)

c. නිෂ්ඨායාම්, නිෂ්ඨා ප්‍රත්‍යය පර කල්හි; පචෙඃ පරස්‍ය, "පච්" ධාතුවෙන් පර වූ; ක්තස්‍ය, "ක්ත" යන්නට; වඃ භවති, වකාරය වේ. පච්‍යතෙ සම, පිසන ලද්දේ නු යි; වා, තොහොත්; පාකක්‍රියයා, පචන ක්‍රියාවෙන්; නිර්වෘත්තඃ, උපන්නේ නු යි; අසෞ, මෙතෙමේ; පක්වඃ, "පක්ව" නම්. පචති සම, පිසුවේ නු යි; අසෞ, මෙතෙමේ; පක්වවාන්, "පක්වවත්" නම්. ("චොඃ කුඃ" යි චකාරයට කකාරය විය.)

d. ක්ෂායඃ, "ක්ෂෛ" ධාතුවෙන් පර වූ ක්ත යන්නට; මඃ, මකාරය වේ.

---

* ජන්‍යතෙ- පොත්හි. ධාතුව අකර්මක හෙයින් ඒ සදෙසි.

† පාණිනීය 8-2-53.

a. ක්ෂායඃ පරස්‍ය කතස්‍ය මො භවති නිෂ්ඨායාම්. ක්ෂෛ ක්ෂයෙ, "සන්ධ්‍යක්ෂරාණාමා" ක්ෂායති ස්මාසෞ= ක්ෂාමඃ.

b. ශුෂෙඃ කඃ.†

c. ශුෂෙඃ පරස්‍ය කතස්‍ය කො භවති නිෂ්ඨායාම්. ශුෂ් ශොෂණෙ, ශුෂ්‍යති ස්මාසෞ= ශුෂ්කඃ.

## 48. ස්ඵායඃ ස්ඵීඃ. (ස්ඵායඃ 6- 1. ස්ඵීඃ 1- 1.)

d. ස්ඵායඃ ස්ඵීරාදෙශො භවති නිෂ්ඨායාං පරතඃ. ඔස්ඵායී වෘද්ධෞ, ස්ඵායතෙ ස්මාසෞ= ස්ඵීතඃ. ධෙට් පානෙ, ධියතෙ ස්ම තත්= ධීතම්. "ස්ථාමි" ගෛ ශබ්දෙ, ගියතෙ ස්ම තත්= ගීතම්. පා පානෙ, පියතෙ ස්ම තත්= පීතම්. දෙ අවඛණ්ඩනෙ, දියතෙ ස්ම තත්= දිතම්. ෂො'න්තකර්මණි, සියතෙ ස්ම තත්= සිතම්. මාඞ් මානෙ, මියතෙ ස්ම තත්= මිතම්.

---

a. නිෂ්ඨායාම්, නිෂ්ඨාප්‍රත්‍යය පර කල්හි; ක්ෂායඃ පරස්‍ය, ක්ෂෛ ධාතුවෙන් පර වූ; කතස්‍ය, කත යන්නට; මඃ භවති, මකාරා දෙශ වේ. ක්ෂෛ ක්ෂයෙ, "ක්ෂෛ" ධාතුව ක්ෂය විමෙහි වේ. "සන්ධ්‍යක්ෂරාණාමා" යන සූත්‍රයෙන් ඓකාරයට ආකාරය වේ. ක්ෂායති ස්ම, ක්ෂය වී නු යි; අසෞ, මෙතෙමේ; ක්ෂාමඃ, "ක්ෂාම" නම්.

b. ශුෂෙඃ, ශුෂ් ධාතුවෙන් පර වූ කත යන්නට; කඃ, කකාරය වේ.

c. නිෂ්ඨායාම්, නිෂ්ඨා ප්‍රත්‍යය පර කල්හි; ශුෂෙඃ පරස්‍ය, ශුෂ් ධාතුවෙන් පර වූ; කතස්‍ය, කත යන්නට; කඃ භවති, කකාරාදෙශ වේ. ශුෂ් ශොෂණෙ, "ශුෂ්" ධාතුව වියලීමෙහි වේ. ශුෂ්‍යති ස්ම, වියලුනේ නු යි; අසෞ, මෙතෙමේ; ශුෂ්කඃ, "ශුෂ්ක" නම්.

48. ස්ඵී ආදෙශවිධි සූත්‍ර යි. ස්ඵායඃ, "ස්ඵාය්" ධාතුහට; ස්ඵීඃ, ස්ඵී යනාදෙශ වේ.

d. නිෂ්ඨායාං පරතඃ, නිෂ්ඨාප්‍රත්‍යය පර කල්හි; ස්ඵායඃ, ස්ඵාය් ධාතුහට; ස්ඵීඃ ආදෙශඃ භවති, "ස්ඵී" යන ආදෙශය වේ. ඔස්ඵායී වෘද්ධෞ, "ස්ඵාය්" ධාතුව වැඩීමෙහි වේ. ස්ඵායතෙ ස්ම, වැඩුනේ නු යි; අසෞ, මෙතෙමේ; ස්ඵීතඃ, "ස්ඵීත" නම්. ධෙට්

---

† ශුෂඃ කඃ 8- 2- 51. පාණිනීය.

**a. සෙට් නිෂ්ඨායාං ක්ෂෙදලෝපො වාච්‍යඃ. චොරීතො සමාසෞ= චොරිතඃ. යාච්‍යතෙ සමාසෞ= යාචිතඃ.***

## ඉති නිෂ්ඨාධිකාර ප්‍රක්‍රියා.

---

පානෙ, "ධෙ" ධාතුව බීමෙහි වේ. ධීයතෙ සම, (අතීතයෙහි) බීම නු යි; තත්, එය; ධීතම්, "ධීත" නම්. "ඝප්‍රාමී" යන සූත්‍රයෙන් ඊකාරය විය. ගෛ ශබ්ද, "ගෛ" ධාතුව ශබ්දාර්ථයෙහි වේ. ගීයතෙ සම, ගයන ලද්දේ නු යි; තත්, එය; ගීතම්, "ගීත" නම්. පා පානෙ, "පා" ධාතුව බීමෙහි වේ. පීයතෙ සම, බොන ලද්දේ නු යි; තත්, එය; පීතම්, "පීත" නම්. දො අවඛණ්ඩනෙ, "දො" ධාතුව කැඩීමෙහි වේ. දීයතෙ සම, කඩන ලද්දේ නු යි; තත්, එය; දිතම්, "දිත" නම්. ෂො'න්තකර්මණි, "ෂො" ධාතුව අවසන් කිරීමෙහි වේ. සීයතෙ සම, අවසන් කරණ ලද්දේ නු යි; තත්, එය; සිතම්, "සිත" නම්. මාඞ් මානෙ, "මා" ධාතුව මැනීමෙහි වේ. මීයතෙ සම, මනින ලද්දේ නු යි; තත්, එය; මිතම්, "මිත" නම්. (මේ උදාහරණයන්හි ඉකාර-ඊකාරයෝ "ඝප්‍රාමී" යන්නෙන් වූහ.)

a. සෙට් නිෂ්ඨායාම්, ඉඩාගම සහිත නිෂ්ඨා ප්‍රත්‍යය පර කල්හි; ක්ෂෙදඃ, ණිදි ප්‍රත්‍යයට; ලොපඃ වාච්‍යඃ, ලොපය කිය යුතු යි. (ණ්‍යන්ත ධාතුවෙන් පර ව ක්ත- ක්තවතු ප්‍රත්‍යයන් ද ඉඩාගම ද වූ කල්හි ණිදි ප්‍රත්‍යය ලොප් වන බව මෙයින් කීහ.) චොරීතෙ සම, සොරකම් කරණ ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; චොරිතඃ, "චොරිත" නම්. යාච්‍යතෙ සම, ඉල්ලන ලද්දේ නු යි; අසෞ, මෙතෙමේ; යාචිතඃ, "යාචිත" නම්.

නිෂ්ඨාධිකාර ප්‍රක්‍රියා, නිෂ්ඨාධිකාර ප්‍රකරණය; ඉති, මෙසේ යි.

## නිෂ්ඨාධිකාර ප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාව නිමි.

---

* ක්තක්තවතු නිෂ්ඨාසංඥෞ- පොත්හි. නිරර්ථක යි.

a. අථ ක්වංසවාදි ප්‍රක්‍රියා.

## 49. ක්වසුකානෞ ණබ්වත්.

(ක්වසුකානෞ 1- 2. ණබ්වත්- නි:)

**b. ධාතොඃ ක්වසුකානෞ ප්‍රත්‍යයෞ භවතඃ, අතීතෙ කාලෙ වාච්‍යෙ සති. තෞ ච ණබ්වත් පරස්මෛපදාත්මනෙපදෙ භවතඃ. ණබාදිත්වාද් ද්විර්වචනං, න තු ණපො ණිත්ත්වාද් වෘද්ධිරිත්‍යාශයඃ. යථා ච ණප් පරස්මෛ පදෙ තථා ක්වසුඃ. යථා ආත්මනෙපදෙ එ තථා කානඃ. කකාරො ගුණවෘද්ධි ප්‍රතිෂෙධාර්ථඃ, උකාරො නුම්විධානාර්ථඃ.**

---

a. අථ, තිඝාධිකාර ප්‍රක්‍රියාවට අනතුරු ව; ක්වසවාදි ප්‍රක්‍රියා, ක්වසු ආදි ප්‍රත්‍යයාන්තයන්ගේ ප්‍රකරණය වේ.

49. ක්වසු- කාන ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. "**ධාතොඃ**" යනු අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; ක්වසුකානෞ, ක්වසු- කාන යන ප්‍රත්‍යයෝ දෙදෙන වෙත්. ණබ්වත්, (ඔහු) ණප්- එ යන ප්‍රත්‍යය දෙදෙන මෙන් වෙත්.

b. අතීතෙ කාලෙ, අතීත කාලය; වාච්‍යෙ සති, වාච්‍ය කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; ක්වසුකානෞ ප්‍රත්‍යයෞ, ක්වසු- කාන යන ප්‍රත්‍යයෝ දෙදෙන; භවතඃ, වෙත්. තෞ ච, ඒ දෙදෙන ද; ණබ්වත්, ණප්- එ යන ප්‍රත්‍යය දෙදෙන මෙන්; පරස්මෛපදාත්මනෙපදෙ භවතඃ, පරස්මෛපද- ආත්මනෙපද සංඥයෝ වෙත්. ණබාදිත්වාත්, ණබාදිය බැවින්; ද්විර්වචනම්, ද්විරුක්තිය වේ. ණපඃ, ණප් ප්‍රත්‍යය තමා; ණිත්ත්වාත්, ණිත් බැවින්; න තු වෘද්ධිඃ ඉති, වෘද්ධිය නො ම වෙයි යන; ආශයඃ, අදහස යි. (ණබාදිය බැවින් වන ද්විත්වය වන නමුත් ණිත් බැවින් වන වෘද්ධිය නො වෙයි කී තියා යි.) යථා ච, යම් සේත්; ණප්, ණප් ප්‍රත්‍යය; පරස්මෛපදෙ, පරස්මෛපදයෙහි වේ ද; තථා, එපරිද්දෙන්; ක්වසුඃ, ක්වසු ප්‍රත්‍යය (පරස්මෛපදයෙහි) වේ. යථා, යම් සේ; එ, එ ප්‍රත්‍යය; ආත්මනෙපදෙ, ආත්මනෙපදයෙහි වේ ද; තථා, එසේ ම; කානඃ, කාන ප්‍රත්‍යය (ආත්මනෙපදයෙහි වේ. මෙසේ හෙයින් පරස්මෛපදි ධාතුන් කෙරෙන් ක්වසු ප්‍රත්‍යය ද, ආත්මනෙපදි ධාතුන් කෙරෙන් කාන ප්‍රත්‍යය ද, උභයපදි ධාතුන් කෙරෙන් ක්වසු- කාන දෙක ම ද, කර්මකාරකයෙහි සියලු ම සකර්මක ධාතුන් කෙරෙන් හා භාවකාරක

**ඝ. ඩුකෘඤ් කරණෙ, චකාර ඉති= චකෘවාන්. "ඍතොං නුම්" හෙ චකෘවන්, චකෘවාංසෞ, චකෘවාංසඃ. චකෘවාංසම්, චකෘවාංසෞ. "වසොඃ උඃ" චක්‍රුෂඃ. චක්‍රුෂා. "වසාං රසෙ" චකෘවද්භ්‍යාම්, චකෘවද්භිඃ. ඉත්‍යාදි. චක්‍රෙ ඉති= චක්‍රාණඃ, ස්ත්‍රීලිඞ්ගෙ චක්‍රුෂී. නපුංසකෙ චකෘවත්, චක්‍රුෂී, චකෘවාංසි.**

---

යෙහි සියලු ම අකර්මක ධාතූන් කෙරෙන් කාන ප්‍රත්‍යය ද වන බව දත යුතු යි.) කකාරඃ, ප්‍රත්‍යයස්ථ කකාරය; ගුණවෘද්ධි ප්‍රතිෂෙධාර්ථඃ, ගුණය හා වෘද්ධිය වැළැක්වීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. උකාරඃ, උකාරය; නුම් විධානාර්ථඃ, (පුල්ලිඞ්ගයෙහි "ඍතො නුම්" යි). නුම් විධානය ප්‍රයෝජන කොට ඇත්තේ යි. (ස්ත්‍රීලිඞ්ගයෙහි "ශ්වන්ත්‍රිතඃ" යි ඊප් ප්‍රත්‍යය වීම ද එහි ප්‍රයෝජන යි.)

ඝ. "ඩුකෘඤ් කරණෙ" ධාතු යි. (මීට පෙර නොයෙක් තැන්හි ධාතූන්ගේ අර්ථ දක්වන ලද හෙයින් මෙතැන් පටන් පෙර නො කියන ලද්දවුන්ගේ පමණක් අර්ථ ලියනු ලැබේ.) චකාර ඉති, අනුන් පිණිස කොළේ නු යි; චකෘවාන්, "චකෘවස්" නම්. චකෘවාන් යනු පුල්ලිඞ්ග ප්‍රථමෛක වචන යි. "ඍතො නුම්" යන සූත්‍රයෙන් නුමාගම විය. ("න්සමමහතො'ධෞ දීර්ඝඃ ශෞ ච" යි ස්‍යාදි පස පරකල්හි දීර්ඝ වේ. ද්විත්වාදිය ලිව් ලකාරයෙහි මෙනි.) 'හෙ චකෘවන්' යනු සම්බොධන එක වචන යි. (යථොක්ත සූත්‍රයෙහි "අධෞ" යි කී හෙයින් මෙහි දීර්ඝ නො වේ.) චකෘවාංසෞ, චකෘවාංසඃ යනු ද්වි- බහු වචන යි. චකෘවාංසම්, චකෘවාංසෞ යනු ද්විතීයා- එක- ද්වි වචන යි. "වසොඃ උඃ" යන්නෙන් වකාරයට උකාරය වේ. චක්‍රුෂඃ යනු බහු වචන යි. චක්‍රුෂා යනු තෘතීයෛක වචන යි. "වසාං රසෙ" යන්නෙන් සකාරයට දකාරය වේ. චකෘවද්භ්‍යාම්, චකෘවද්භිඃ යනු ද්වි- බහු වචන යි. ඉත්‍යාදි, යනාදිය වේ. චක්‍රෙ ඉති= චක්‍රාණඃ, තමන් පිණිස කොළේ නු යි (කාන ප්‍රත්‍යය වීමෙන්) "චක්‍රාණ" යනු වේ. (අවකුප්වනානරෙ'පි" යි ණත්වය වේ. කාන ප්‍රත්‍යය ආත්මනෙපද එ යන්න වැනි බැවින් ආත්මනෙපදයෙන් විග්‍රහ දක්වූහ. දෙව ශබ්දය මෙනි. මතු ද මෙසේ දත යුතු.) ස්ත්‍රීලිඞ්ගෙ, ස්ත්‍රීලිඞ්ගයෙහි; චක්‍රුෂී, ("චකෘවස්" ශබ්දය "ශ්වන්ත්‍රිතඃ" යි ඊබන්ත වීමෙන්) ප්‍රථමෛක වචනයෙහි "චක්‍රුෂී" යනු වේ. ("චක්‍රුෂ්‍යෞ, චක්‍රුෂ්‍යඃ" යනාදි වශයෙන් ද්විවචනාදියෙහි ද "නදී" ශබ්දය මෙන් වර නැගිය යුතු.) නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහි; චකෘවත්, චක්‍රුෂී, චකෘවාංසි යනු ප්‍රථමා විභක්ති යි. (ද්විතීයාවෙහි ද එසේ යි. තෘතීයාවෙහි පටන් පුල්ලිඞ්ගයෙහි මෙනි. කාන

a. භිදිර් විදාරණෙ, බිභෙද ඉති= බිභිද්වාන්, බිභිද්වාංසො, බිභිද්වාංසඃ. බිභිද්වාංසම්, බිභිද්වාංසෞ. "වසොඃ උඃ" බිභිදුෂා. "වසාං රසෙ" බිභිද්වද්භ්‍යාම්, බිභිද්වද්භිඃ. ඉත්‍යාදි. බිභිදෙ ඉති= බිභිදානඃ. භඤ්ජෝ ආමර්දනෙ, බභඤ්ජ ඉති= බභජ්වාන්. * බභඤ්ජෙ ඉති= බභජානඃ. † ජාගෘ නිද්‍රාක්ෂයෙ, ජජාගාර ඉති= ජජාගෘවාන්. ජජාගර්වාන් ඉත්‍යපි භවති. ජාගර්තේඃ කිති ගුණො වක්තව්‍යඃ. තෙන ජජාගරුෂඃ.

---

ප්‍රත්‍යයාන්ත "චක්‍රාණ" ශබ්දය ස්ත්‍රීලිඞ්ගයෙහි ආබන්ත වීමෙන් චක්‍රාණා, චක්‍රාණෙ, චක්‍රාණාඃ යනාදි වශයෙන් ගංගා ශබ්දය මෙන් ද, නපුංසක ලිඞ්ගයෙහි චක්‍රාණම්, චක්‍රාණෙ, චක්‍රාණානි යනාදි වශයෙන් කුල ශබ්දය මෙන් ද වර නැගේ. මතු ද ක්වසු- කාන ප්‍රත්‍යයාන්ත ශබ්දයන් මෙසේ බව දත යුතු.)

a. 'භිදිර් විදාරණෙ' ධාතු යි. බිභෙද ඉති, අනුන් පිණිස බින්දේ නු යි; බිභිද්වාන්, "බිභිද්වස්" නම්. බිභිද්වාන්, බිභිද්වාංසෞ, බිභිද්වාංසඃ යනු ප්‍රථමා විභක්ති යි. බිභිද්වාංසම්, බිභිද්වාංසෞ යනු ද්විතීයා එක – ද්වි වචන යි. "වසොඃ උඃ" යන සූත්‍රයෙන් වකාරයට උකාරය වේ. බිභිදුෂඃ යනු බහු වචන යි. බිභිදුෂා යනු තෘතීයෛක වචන යි. "වසාං රසෙ" යන්නෙන් සකාරයට දකාරය වේ. බිභිද්වද්භ්‍යාම්, බිභිද්වද්භිඃ යනු ද්වි- බහු වචන යි. ඉත්‍යාදි, යනාදිය වේ. (ස්ත්‍රී= බිභිදුෂී.) බිභිදෙ ඉති= බිභිදානඃ, තමා පිණිස බින්දේ නු යි (කාන ප්‍රත්‍යය වූ කල්හි) "බිභිදාන" යනු වේ. භඤ්ජෝ ආමර්දනෙ:- බභඤ්ජ ඉති, බින්දේ නු යි; බභජ්වාන්, "බභජ්වස්" නම්. (ස්ත්‍රී= බභජුෂී.) බභඤ්ජෙ ඉති, බිඳිනු ලැබී නු යි; බභජානඃ, (කර්මයෙහි කාන ප්‍රත්‍යය වීමෙන්) "බභජාන" යනු වේ. ජාගෘ නිද්‍රාක්ෂයෙ:- ජජාගාර ඉති, නිදි මැරී නු යි; ජජාගෘවාන්, "ජජාගෘවස්" නම්. ජජාගර්වාන් ඉති අපි භවති, පක්ෂයෙක්හි ගුණ වීමෙන් "ජජාගර්වස්" නමුදු වේ. කිති, කිත් පර කල්හි; ජාගර්තේඃ, "ජාගෘ" ධාතුහට; ගුණඃ වක්තව්‍යඃ, ගුණය කිය යුතු යි. (ක්වසු- කාන දෙක පර කල්හි විකල්පයෙනි.) තෙන, එහෙයින්; ජජාගරුෂඃ, ජජාගර්වස් ශබ්දයා ගේ ද්විතීයා බහු වචනයෙහි "ජජාගරුෂඃ" කියා වේ. (ජජාගෘවස් ශබ්දයේ ද්විතීයා බහු වචනයෙහි "ජජාග්‍රුෂඃ" කියා වේ. ස්ත්‍රී= ජජාග්‍රුෂී- ජජාගරුෂී.)

---

* බභඤ්ජ්වාන්- පොත්හි. එසේ නො විය හැකි යි. නශ්ලෝපය වන බැවිනි.

† ධාතුව පරස්මෛපදි බැවින් මෙය කර්මකාරකයෙහි විය යුතු යි.

8. කෘතද්විත්වානාමේකස්වරණාමාදන්තානාං ඝසෙශ්ච * ක්වසොරිඩ් වාච්‍යඃ, නාන්‍යෙෂාම්. බභූව ඉති= බභූවාන්. ඍ ගතෞ, ආර ඉති= ආරිවාන්. පපෞ ඉති= පපිවාන්. අද් භක්ෂණෙ, ආද ඉති= ආදිවාන්. තස්ථෞ ඉති= තස්ථිවාන්. බභෞ ඉති= බභිවාන්. යයෞ ඉති= යයිවාන්. යා ප්‍රාපණෙ.

---

8. කෘතද්විත්වානාම්, කරණ ලද ද්විත්වය ඇති; එකස්වරණාම්, එකස්වර ධාතූන්ගේ ද; ආදන්තානාම, ආකාරාන්ත ධාතූන්ගේ ද; ඝසෙඃ ච, 'ඝස්' ධාතුහුගේ ද; ක්වසොඃ, ක්වසු ප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට් වාච්‍යඃ, ඉඩාගමය කිය යුතු යි. අන්‍යෙෂාම්, අන්‍ය ධාතූන්ගේ (ක්වසු ප්‍රත්‍යය සම්බන්ධ ව ඉඩාගමය;) න, නො කිය යුතු යි. (ද්විත්ව කළ පසුත් එකස්වර වන ධාතු ය- ආකාරාන්ත ධාතු ය- ඝස් ආදෙශ ය යන මොවුන් කෙරෙන් පමණක් පර වූ ක්වසු ප්‍රත්‍යය සම්බන්ධ ව ඉඩාගමය මෙයින් විහිත ය.) බභූව ඉති, වී නු යි; බභූවාන්, "බභූවස්" නම්. (ස්ත්‍රී= බභූවුෂී. 'භූ' ධාතුව එකස්වර නමුත් ද්විත්ව වූ පසු ද්විස්වර ව සිටින හෙයින් මෙහි ඉඩාගම නො වේ.) ඍ ගතෞ:- ආර ඉති, ගියේ නු යි; ආරිවාන්, "ආරිවස්" නම්. (ක්වසු ප්‍රත්‍යය වීමෙන් "ඍ + වස්" යි සිටි කල්හි පළමු කොට "ගුණොර්තිසංයොගාද්‍යොඃ" යි ඍ ධාතුහට කිත් පර නිමිත්තෙන් ගුණ ව "අර් + වස්" යි වේ. එකල්හි ද්විත්ව ව "අඅර් + වස්" යි වූ පසු සවර්ණ දීර්ඝය වීමෙන් "ආර් + වස්" යි සිටී. මෙසේ ද්විත්ව වූ පසු ද ධාතුව එකස්වර ව ම සිටි හෙයින් පූර්වොක්ත ක්‍රමයෙන් ඉඩාගම ව "ආරිවස්" යි ශබ්ද ප්‍රකෘතිය ලැබේ. විභක්ති කාර්‍ය්‍යයන් නාමකාණ්ඩයෙන් දත යුතු යි. ස්ත්‍රී= ආරුෂී.)

පපෞ ඉති, පානය කෙළේ නු යි; පපිවාන්, "පපිවස්" නම්. (ආකාරාන්ත ධාතු බැවින් ඉඩාගම විය. "ආතො'නපි" යි ආකාර ලොප් වේ. ස්ත්‍රී= පපුෂී.) අද් භක්ෂණෙ:- ආද ඉති= ආදිවාන්, කෑයේ නු යි "ආදිවස්" නම්. (එකස්වර බැවින් ඉඩාගම යි. ස්ත්‍රී= ආදුෂී.) තස්ථෞ ඉති= තස්ථිවාන්, සිටියේ නු යි "තස්ථිවස්" නම්. (ස්ත්‍රී= තස්ථුෂී. "ෂ්ඨා ගතිනිවෘත්තෞ" ධාතු යි.) බභෞ ඉති= බභිවාන්, බැබළී නු යි "බභිවස්" නම්. (ස්ත්‍රී= බභුෂී. "භා දීප්තෞ" ධාතු යි.) යයෞ ඉති= යයිවාන්, ගියේ නු යි "යයිවස්" නම්. (ස්ත්‍රී= යයුෂී.) "යා ප්‍රාපණෙ" ධාතු යි.

---

* ආදන්තානාං ච ඝසෙරෙව- පොත්හි.

**a. දරිද්‍රාතෙරනපි නිත්‍යාලොපිත්වෙනෙට්. දදරිද්‍රෞ ඉති= දදරිද්‍රිවාන්. ණබ්වුණ්සයුටො* හිත්වා දරිද්‍රාතෙරනප්‍යාලොපො වාච්‍යො ලුඞි වා. දදරිද්‍රුෂඃ. ඬුදාඤ් දානෙ, දදෞ ඉති= දදිවාන්, දදුෂඃ. ඝසෞ අදනෙ, "කුහොශ්චුඃ" "ඣපානාං ජබචපාඃ" "ගමාං ඝවරෙ" "ඛසෙ චපා ඣසානාම්" "ක්විලාත්-" ජඝාස ඉති= ජක්ෂිවාන්. වස්‍යොත්වෙ කෘතෙ ඉඩභාවඃ, ජක්ෂුෂඃ.**

**b. ගම්හන්විද්විශ්දෘශාං ක්වසොවේට්. ගම්ෟ ගතෞ, ජගාම ඉති= ජග්මිවාන්- ජගන්වාන්. "මො නො ධාතොඃ" ද්විරුක්තස්‍ය හන්තෙනහීකාරස්‍ය ඝත්වං වක්තව්‍යම්. ජඝාන ඉති=**

---

a. අනපි, අනබ් විෂයෙහි; දරිද්‍රාතෙඃ, "දරිද්‍රා" ධාතුහු තමා; නිත්‍යාලොපිත්වෙන, නිත්‍යයෙන් ආකාර ලොපය ඇති බැවින්; ඉට්, ඉඩාගම වේ. † දදරිද්‍රෞ ඉති, දුගී වී නු යි; දදරිද්‍රිවාන්, "දදරිද්‍රිවස්" නම්. අනපි, අනබ් විෂයෙහි; ණප්වුණ්සයුටඃ, ණප්- වුණ්- ස- යුට් යන ප්‍රත්‍යයන්; හිත්වා, හැර; (සෙසු ප්‍රත්‍යයන් පර කල්හි;) දරිද්‍රාතෙඃ, දරිද්‍රා ධාතුහුගේ; ආලොපඃ, ආකාර ලොපය; වාච්‍යඃ, කිය යුතු යි. ලුඞි, ලුඞ් ලකාරයෙහි; වා, විකල්පයෙන් කිය යුතු යි. දදරිද්‍රුෂඃ යනු ද්විතීයා බහු වචන යි. (ස්ත්‍රී= දදරිද්‍රුෂී.) ඬුදාඤ් දානෙ:- දදෞ ඉති= දදිවාන්, දුන්නේ නු යි "දදිවස්" නම්. දදුෂඃ යනු ද්විතීයා බහු වචන යි. (ස්ත්‍රී= දදුෂී) ඝසෞ අදනෙ, "ඝිසයොර දෙඝ්ඝෞ ලිට් තු වා" යි අද් ධාතුවට වන ලනුබන්ධ "ඝස්" ආදෙශය කැමෙහි වේ. (මේ අර්ථයෙහි ම වූ "ඝස්" ධාතුවෙක් ද වෙයි.) "කුහොශ්චුඃ" යන සූත්‍රයෙන් (ද්විත්වයෙහි) පූර්ව ඝකාරයට ඣකාරය වේ. "ඣපානාං ජබචපාඃ" යන්නෙන් ඊට ජකාරය වේ. (=ජඝස් + වස්.) "ගමාං ඝවරෙ" යන්නෙන් උපධාලොපය වේ. (=ජඝ්ස් + වස්.) "ඛසෙ චපා ඣසානාම්" යි ඝකාරයට කකාරය වේ. (=ජක්ස් + වස්.) ඝසාදෙඃ ෂඃ" යි ෂත්වය වේ. (ඉන් පසු පෙර කී නයින් ඉඩාගම වීමෙන් "ජක්ෂිවස්" යි සිද්ධ යි.) ජඝාස ඉති, කෑයේ නු යි; ජක්ෂිවාන්, "ජක්ෂිවස්" නම්. වස්‍ය උත්වෙ කෘතෙ, ක්වසු ප්‍රත්‍යයස්ථ වකාරයට උකාර බව කළ කල්හි; ඉට් අභාවඃ, ඉඩාගමයාගේ අභාවය වේ. ජක්ෂුෂඃ යනු ද්විතීයා බහු වචන යි. (ස්ත්‍රී= ජක්ෂුෂී.)

b. ගම්— දෘශාම්, ගම්- හන්- විද්- විශ්- දෘශ් යන ධාතුන්ගේ; ක්වසොඃ, ක්වසු ප්‍රත්‍යය සම්බන්ධ ව; වා ඉට්, විකල්පයෙන් ඉඩාගම වේ. (මෙහි 'විශ්' ධාතුව හා එකට හැදෑරීම හෙතු කොට ගෙණ

---

* වුණ්සයුටෙඟ- පොත්හි. අදාදිපරසෛමපදි ප්‍රක්‍රියායෙහි ද මෙය කීහ. අදහස පහද ප්‍රත්‍යුදාහරණ ද එහි දක්වන ලදී. 30 පිට බලනු.

† ආකාරාන්ත ධාතුන්ගෙන් ඉඩාගම වන හෙයින් මෙය නිරර්ථකය යි හඟිමු.

**ජඝ්නිවාන්- ජඝන්වාන්. විදඃ ලාභෙ* විවෙද ඉති= විවිදිවාන්- විවිද්වාන්. විශ් ප්‍රවෙශනෙ, විවෙශ ඉති= විවිශිවාන්- විවිශ්වාන්. දෘශිර් ප්‍රෙක්‍ෂණෙ, දදශී ඉති= දදෘශිවාන්- දදෘශ්වාන්.**

**ඞ. ඉණ් ගතෞ, ඉණො දීර්ඝතා ක්වසෞ වක්තව්‍යා. ඊයාය ඉති= ඊයිවාන්. උපෙයාය ඉති= උපෙයිවාන්. "ලොපඃ පචාං කිති-" පපාච ඉති= පෙචිවාන්.**

---

'විද්' යන්නෙන් "විදඃ ලාභෙ" යන ධාතුව ම ගත යුතු ය යනු සුබොධිනී ටීකා යි.) ගමෘ ගතෞ:- ජගාම ඉති, ගියේ නු යි; ජග්මිවාන්- ජගන්වාන්, ඉඩාගම පක්‍ෂයෙහි "ජග්මිවස්" යනු ද- විකල්ප පක්‍ෂයෙහි "ජගන්වස්" යනු ද වේ. "මො නො ධාතොඃ" යන්නෙන් අනිට් පක්‍ෂයෙහි ධාතුහුගේ මකාරයට නකාරය වේ. "ගමාං ස්වරෙ" යි උපධා ලොපය වේ. (ස්ත්‍රී= ජග්මුෂී. නකාරාදෙශයට නිමිති වූ වකාරය උකාරය වූ කල්හි "නිමිත්තාභාවෙ නෛමිත්තිකස්‍යාප්‍යභාවඃ" යන න්‍යායය ඇසුරු කොට නකාරයට ද පූර්ව ප්‍රකෘතිය වූ මකාරය ම වන හෙයින් ස්ත්‍රීලිඞ්ගයෙහි "ජග්නුෂී" යි රූපයෙක් නො ලැබේ. ජග්මිවස්- ජගන්වස් යන දෙක ම ස්ත්‍රීලිඞ්ගයෙහි "ජග්මුෂී" යනු වේ.) ද්විරුක්තස්‍ය, ද්විරුක්ත වූ; හනෙනඃ හකාරස්‍ය, 'හන්' ධාතුහුගේ හකාරයට; ඝත්වං වාච්‍යම්, ඝකාර බව කිය යුතු යි. ජඝාන ඉති, නැසී නු යි; ජඝ්නිවාන්- ජඝන්වාන්' "ජඝ්නිවස්" නම් ද- "ජඝන්වස්" නම් ද වේ. (ස්ත්‍රී= ජඝ්නුෂී.) විදඃ ලාභෙ:- විවෙද ඉති, ලැබී නු යි; විවිදිවාන්- විවිද්වාන්, "විවිදිවස්" නම් ද- "විවිද්වස්" නම් ද වේ. (ස්ත්‍රී= විවිදුෂී.) විශ් ප්‍රවෙශනෙ:- විවෙශ ඉති, පිවිසියේ නු යි; විවිශිවාන්- විවිශ්වාන්, "විවිශිවස්" නම් ද- "විවිශ්වස්" නම් ද වේ. (ස්ත්‍රී= විවිශුෂී.) දෘශිර් ප්‍රෙක්‍ෂණෙ:- දදශී ඉති, දිටී නු යි; දදෘශිවාන්- දදෘශ්වාන්, "දදෘශිවස්" නම් ද- "දදෘශ්වස්" නම් ද වේ. (ස්ත්‍රී= දදෘශුෂී. මේ සියල්ලෙහි ඉඩ් විකල්පත්වයෙන් රූප දෙක බැගිනි. එහෙත් ද්විතීයා බහු වචනයේ පටන් ස්වරාදි විභක්ති විෂයෙහි ඉට්- අනිට් දෙපක්‍ෂයෙහි ම රූපයෝ සමාන වෙති. එහෙයින් "ජගන්වස්" ශබ්දය ද යථොක්ත විභක්තීන්හි "ජග්මිවස්" ශබ්දය මෙන් ජග්මුෂඃ- ජග්මුෂා- ජග්මුෂෙ යනාදි වශයෙන් වර නැගේ. සෙස්ස ද එසේ දත යුතු.)

ඞ. ඉණ් ගතෞ:- ක්වසෞ, ක්වසු ප්‍රත්‍යය පර කල්හි; ඉණඃ, ඉණ් ධාතුහට; දීර්ඝතා වක්තව්‍යා, දීර්ඝ බව කිය යුතු යි. ඊයාය ඉති, ගියේ නු යි; ඊයිවාන්, "ඊයිවස්" නම්. (ද්විත්ව ව "ඉඉ + වස්" යි සිටි

---

* විද ඥානෙ- පොත්හි. ඒ සඳෙසි.

## 50. ශතෘශානෞ තිප්තෙවත් ක්‍රියායාම්.

(ශතෘශානෞ 1- 2. තිප්තෙවත්- නි: ක්‍රියායාම් 7- 1.)

**a. ක්‍රියාපදෙ ගම්‍යමානෙ සති ධාතොඃ ශතෘශානෞ ප්‍රත්‍යයෞ භවතඃ වර්ත්මානේ'ර්ථෙ, තෞ ච තිප්තෙවත් පරස්මෛපදාත්මනෙපදයොර්භවතඃ. "අදෙ" පචන්ති= පචන් ආසෙන.**

---

කල්හි "ඉණඃ පරස්‍ය වසොරිට් නිපාත්‍යතෙ" යි සුබොධිනියෙහි කී ලෙස ඉට් නිපාතනය කිරීමෙන් "ඉඉ + ඉවස්" යි වූ පසු "ඉණඃ ක්ඞිති ස්වරෙ යො වක්තව්‍යඃ" යි කී හෙයින් ධාතු ඉකාරයට යකාර ච පූර්ව ඉකාරයට දීර්ඝ ච "ඊයිවස්" යි සිද්ධ යි.) උපෙයාය ඉති, ළඟට ගියේ නු යි; උපෙයිවාන්, "උපෙයිවස්" නම්. (ස්ත්‍රී= ඊයුෂී- උපෙයුෂී.) "ලොපඃ පචාං කිත්‍යෙ වාස්‍ය" යන සූත්‍රයෙන් පූර්ව රූපයට ලොප හා අකාරයට එකාරය ද වේ. පපාච ඉති, පිසී නු යි; පෙචිවාන්, "පෙචිවස්" නම්. (ස්ත්‍රී= පෙචුෂී.)

50. ශතෘ- ශාන ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. **ධාතොඃ** යනු වැටේ. ක්‍රියායාම්, ක්‍රියාවක් ගම්‍යමාන කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන් ශතෘශානෞ, ශතෘ- ශාන යන ප්‍රත්‍යයෝ වෙත්. තිප්තෙවත්, (ඔහු) තිප්- තෙ යන ප්‍රත්‍යය දෙක මෙන්.

a. ක්‍රියාපදෙ ගම්‍යමානෙ සති, අන්‍ය ක්‍රියා පදයක් හැඟෙන කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; වර්තමානෙ අර්ථෙ, වර්තමානාර්ථයෙහි; ශතෘශානෞ ප්‍රත්‍යයෞ භවතඃ, ශතෘ- ශාන යන ප්‍රත්‍යයෝ දෙදෙන වෙත්. තෞ ච, ඔහු දෙදෙන ද; තිප්තෙවත්, තිප්- තෙ යන ප්‍රත්‍යය ද්වයය මෙන්; පරස්මෛපදාත්මනෙපදයොඃ භවතඃ, පරස්මෛපද- ආත්මනෙපද දෙක්හි වෙත්.

(සමානකර්තෘක වූ අපර ක්‍රියාවක් යෙදෙන කල්හි වර්තමානාර්ථයෙහි මේ ප්‍රත්‍යය ද්වය වේ. ඔවුන් තිප්- තෙ දෙක වැනි බැවින් පරස්මෛපදි ධාතූන් කෙරෙන් ශතෘ ප්‍රත්‍යය ද, ආත්මනෙපදි ධාතූන් කෙරෙන් ශාන ප්‍රත්‍යය ද, උභයපදි ධාතූන් කෙරෙන් ඒ දෙක ම ද වන බව දත යුතු යි. එසේ ම ශතෘ ප්‍රත්‍යය කර්තෘකාරකයෙහි පමණක් වේ. ශාන ප්‍රත්‍යය කර්තෘ- කර්ම- භාව යන තුනෙහි ම වේ. ප්‍රත්‍යයන්ගේ ඉත් ශකාරය "ශිති චතුර්ත්" යන සූත්‍රයෙහි ප්‍රයෝජනය පිණිස යි. එහෙයින් මේ ප්‍රත්‍යයන් පර කල්හි ද ලඞාදි සතර පර කල්හි මෙන් සියලු කාර්‍ය්‍යය වේ. ඍකාරය පුල්ලිඞ්ගයෙහි "ඍතො නුම්" යි නුමාගමය පිණිස ද, ස්ත්‍රීලිඞ්ගයෙහි "ඍන්ව්‍රීතඃ" යි ඊප් ප්‍රත්‍යය වීම පිණිස ද වේ.)

a. ඍඞ්කාරානුබන්ධස්‍ය නුමාගම එව භවති න දීඝිතා වක්තව්‍යා. පඨතීති= පඨන්. තිෂ්ඨතීති= තිෂ්ඨන්. ගායතීති= ගායන්. ගච්ඡතීති= ගච්ඡන්. පිබතීති= පිබන්.

## 51. මුගානේ'තඃ. (මුක් 1- 1. ආනෙ 7- 1. අතඃ 6- 1.)

b. අකාරස්‍ය ආනෙ පරෙ මුගාගමො භවති. පවතෙ'සෞ= පවමානඃ පිබති වා පඨති. යජ දෙව- යජතෙ'සෞ= යජමානඃ ස්තෞති. මන ඥානෙ, මන්‍යතෙ'සෞ= මන්‍යමානඃ. මනු

---

"අදෙ" යන සූත්‍රයෙන් විකරණ අකාරය ලොප් වේ. පචතීති, පිසා නු යි; පචන්, "පචත්" නම්. පචන්, පිසමින්; ආසෙත, හිඳී. (නුමාගම වූ පසු "හසෙපඃ" යනාදීන් සිලොප හා "සංයොගාන්තස්‍ය ලොපඃ" යි තකාර ලොප ද වේ. මෙහි අපර ක්‍රියාව නම් "ආසෙත" යනු යි. ස්ත්‍රීලිඞ්ගයෙහි ඊබන්ත වූ කල්හි "අප්‍යොරුනනිත්‍යම්" යි නිත්‍යයෙන් නුමාගම් වන හෙයින් "පචන්තී" යනු වේ. මතු ද මෙසේ යි.)

a. ඍකාරානුබන්ධස්‍ය, ඍකාරානුබන්ධ ශබ්දය සම්බන්ධ ව; නුමාගමඃ එව භවති, නුමාගමය ම වේ. දීඝිතා, දීඝි බව; න වක්තව්‍යා, නො කිය යුතු යි. ("ව්‍රිතො නුම්" යි නුමාගමය වෙයි. "න්සමමහතඃ-" යනාදීන් දීඝි නො වෙයි කී තියා යි.) පඨතීති හදාරා නු යි; පඨන්, "පඨත්" නම්. තිෂ්ඨතීති= තිෂ්ඨන්, සිටී නු යි "තිෂ්ඨත්" නම්. ගායතීති= ගායන්, ගයා නු යි "ගායත්" නම්. පිබතීති= පිබන්, බොන් නු යි "පිබත්" නම්.

51. මුමාගම විධි සූත්‍ර යි. ආනෙ, 'ආන' යන්න පර කල්හි; අතඃ, අකාරය සම්බන්ධ ව; මුක්, මුගාගම වේ.

b ආනෙ පරෙ, ආන යන්න පර කල්හි; අකාරස්‍ය, අකාරය සම්බන්ධ ව; මුගාගමඃ භවති, මුක් ආගම වේ. (විකරණසථ අකාරයෙන් පර ව මේ මකාරාගමය වේ.) පවතෙ, පිසා නු යි; අසෞ, මෙතෙමේ; පවමානඃ, "පවමාන" නම්. පවමානඃ, පිසමින්; පිබති, බොයි. වා, නොහොත්; පඨති, හදාරයි. (ශාන ප්‍රත්‍යයාන්තයෝ ස්ත්‍රීලිඞ්ගයෙහි ආබන්ත ව "පවමානා" යනාදි වශයෙන් වෙත්.) යජ දෙවපූජාසඞ්ගතිකරණදානෙෂු:- යජතෙ, යාග කෙරේ නු යි; අසෞ, මෙතෙමේ; යජමානඃ, "යජමාන" නම්. යජමානඃ, යාග කරමින්, ස්තෞති, ස්තුති කෙරේ. මන ඥානෙ:- මන්‍යතෙ, දනී

**අවබොධනෙ, "තනාදෙරුප්" මනුතෙ'සෞ= මන්වානඃ, පරාගච්ඡති. කරොතීති= කුර්වන් සඃ. "ඔත්‍යදුඃ" කුරුතෙ'සෞ= කුර්වාණඃ. ක්‍රියතෙ'සෞ= ක්‍රියමාණඃ.**

**a, උපසර්ගස්ථනිමිත්තාද් නකාරස්‍ය ණො වාච්‍යඃ. ප්‍රපීයතෙ'සෞ= ප්‍රපීයමාණඃ.**

## 52. ආසෙරාන ඊඃ. (ආසෙඃ 6- 1. ආනඃ 6- 1. ඊඃ 1- 1.)

**b. ආසෙර්ධාතොඃ පරස්‍ය ආන ආකාරස්‍ය ඊකාරාදෙශො භවති. ආස උපවෙශනෙ, ආස්තෙ'සෞ= ආසීනඃ.**

---

නු යි; අසෞ, මෙතෙමේ; මන්‍යමානඃ, "මන්‍යමාන" නමි. (දිවාදි යි.) මනු අවබොධනෙ:- "තනාදෙරුප්" යන්නෙන් උප් විකරණය වේ. මනුතෙ, දැන ගණී නු යි; අසෞ, මෙතෙමේ; මන්වානඃ, "මන්වාන" නමි. (ශාන ප්‍රත්‍යයට පෙරටු ව අකාරයක් නො සිටි හෙයින් මුමාගම නො වේ.) මන්වානඃ, දනිමින්; පරාගච්ඡති, පෙරලා එයි. කරොතීති, අනුන් පිණිස කෙරේ නු යි; සඃ, හෙතෙමේ; කුර්වන්, "කුර්වත්" නමි. "ඔත්‍යදුඃ" යන්නෙන් අකාරයට උකාරය වේ. කුරුතෙ'සෞ= කුර්වාණඃ, තමා පිණිස කෙරේ නු යි; මෙතෙමේ; "කුර්වාණ" නම් වේ. (එය ආත්මනෙපදය වැනි බැවින් ආත්මනෙපදයෙන් විග්‍රහ දැක්වූහ. මනු ද එසේ යි. මෙහි ණත්වය ද විය.) ක්‍රියතෙ, කරණු ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; ක්‍රියමාණඃ, "ක්‍රියමාණ" නමි. (කර්මකාරකයෙහි ශාන ප්‍රත්‍යය යි.)

a. උපසර්ගස්ථ නිමිත්තාත්, උපසර්ගයෙහි සිටි නිමිත්තෙන් පර වූ; නකාරස්‍ය, නකාරයට; ණඃ වාච්‍යඃ, ණකාරාදෙශය කිය යුතු යි. ප්‍රපීයතෙ, ප්‍රකර්ෂයෙන් බොනු ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; ප්‍රපීයමාණඃ, "ප්‍රපීයමාණ" නමි. (මෙහි 'ප්‍ර' යන උපසර්ගස්ථ රකාර නිමිත්තෙන් පර වූ නකාරයට "අට්කුප්වනානරෙ'පි" යි ණකාර විය. "පීඞ් පානෙ" ධාතු යි. නොහොත් "පා පානෙ" යන ධාතුවෙන් පර ව ශාන ප්‍රත්‍යය වූ කල්හි "යක් චතුර්ෂු" යි යක් විකරණය වේ. ඉන් පසු "දෘදෙරිඃ" යි ආකාරයට ඊකාර ව "යෙ" යි දීර්ඝ වීමෙන් සිද්ධ යි.)

52. ඊකාරාදෙශ විධි සූත්‍ර යි. ආසෙඃ, "ආස්" ධාතුවෙන් පර වූ; ආනඃ, ආන් යන්නහුගේ ආකාරයට; ඊඃ, ඊකාරයෙක් වේ. (මෙහි "ආන" යනු ලුප්තෂෂ්ඨීක ය යි බාලසරලාවෙහි කියයි.)

b. ආසෙඃ ධාතොඃ පරස්‍ය, ආස් ධාතුවෙන් පර වූ; ආනඃ ආකාරස්‍ය, ආන් යන්නහුගේ ආකාරයට; ඊකාරාදෙශඃ භවති, ඊකාරාදෙශ වේ. ආස උපවෙශනෙ:- ආස්තෙ, හිඳී නු යි; අසෞ, මෙතෙමේ; ආසීනඃ, "ආසීන" නමි.

**a.** **තුද ව්‍යථනෙ, තුදතීති= තුදන්, තුදන්තෞ, තුදන්තඃ. ස්ත්‍රීලිඞ්ගෙ, "වාදීපොඃ ශතුඃ" තුදති ඞා= තුදන්ती- තුදතී, තුදන්ත්‍යෞ- තුදත්‍යෞ, තුදන්ත්‍යඃ- තුදත්‍යඃ. නපුංසකෙ, තුදතීති= තුදත්, තුදන්තී- තුදතී, තුදන්ති. ඉත්‍යාදි.**

**b.** **භවතීති= භවන්, භවන්තෞ, භවන්තඃ. "අප්‍යයොරන්නිත්‍යම්" භවති ඞා= භවන්තී, භවන්ත්‍යෞ, භවන්ත්‍යඃ. භවති නත්= භවත්, භවන්තී, භවන්ති. පචතීති= පචන්. පචන්තී ස්ත්‍රී. නපුංසකෙ, පචති නත්= පචත්, පචන්තී, පචන්ති. දිවු-**

---

a. තුද ව්‍යථනෙ:- තුදතීති, පෙළා නු යි; තුදන්, "තුදත්" නම්. තුදන්, තුදන්තෞ, තුදන්තඃ යනු ප්‍රථමා විභක්ති යි. ස්ත්‍රීලිඞ්ගෙ, ස්ත්‍රීලිඞ්ගයෙහි "වාදීපොඃ ශතුඃ" යන සූත්‍රයෙන් විකල්පයෙන් නුමාගම වේ. තුදති, පෙළා නු යි; ඞා, ඕතොමෝ; තුදන්තී- තුදතී, නුමාගම වූ කල්හි "තුදන්තී" යනු ද, විකල්ප පක්ෂයෙහි "තුදතී" යනු ද වේ. ප්‍රථමා එක වචන යි. තුදන්ත්‍යෞ- තුදත්‍යෞ, තුදන්ත්‍යඃ- තුදත්‍යඃ යනු ද්වි- බහු වචන යි. (සෙසු විබත්වල ද මෙසේ ද්විප්‍රකාරයෙන් වරනැඟේ.) නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහි; තුදතීති, පෙළා නු යි; නත්, ඒ; තුදන්, "තුදත්" නම්. තුදත් යනු ප්‍රථමෛක වචන යි. තුදන්තී- තුදතී යනු ද්වි වචන යි. ("වාදීපොඃ ශතුඃ" යි ඊකාරය පර කල්හි ද විකල්පයෙන් නුමාගම වන හෙයින් රූප දෙකෙකි.) තුදන්ති යනු බහු වචන යි. ("නුම යමඃ" යි නිත්‍යයෙන් නුමාගම වේ. මතු උදාහරණයන්හි ද මෙසේ දත යුතු.) ඉත්‍යාදි, යනාදිය යි.

b. භවතීති, වේ නු යි; භවන්, "භවත්" නම්. (ඍකාරානුබන්ධ හෙයින් "න්සමමහතඃ" යනාදීන් දීර්ඝ නො වේ. උකාරානුබන්ධ "භවත්" ශබ්දය නම් දීර්ඝ ව "භවාන්" යි සිටී.) භවන්, භවන්තෞ, භවන්තඃ යනු ප්‍රථමා විභක්ති යි. "අප්‍යයොරන්නිත්‍යම්" යන්නෙන් ස්ත්‍රීලිඞ්ගයෙහි නිත්‍යයෙන් නුමාගම වේ. භවති, වේ නු යි; ඞා, ඕතොමෝ; භවන්තී, "භවන්තී" නමු. භවන්තී, භවන්ත්‍යෞ, භවන්ත්‍යඃ යනු ස්ත්‍රීලිඞ්ග ප්‍රථමා විභක්ති යි. භවති නත්= භවත්, වේ නු යි ඒ "භවත්" නම්. භවත්, භවන්තී, භවන්ති යනු නපුංසක ලිඞ්ගයෙහි ප්‍රථමා විභක්ති යි. පචතීති= පචන්, පිසා නු යි "පචත්" නම්. පචන්තී ස්ත්‍රී, ස්ත්‍රීතොමෝ "පචන්තී" නමු. නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහි; පචති නත්= පචත්, පිසා නු යි ඒ "පචත්" නම්. පචත්, පචන්තී, පචන්ති යනු එහි ප්‍රථමා විභක්ති යි. දිවු ක්‍රීඩා-

දීව්‍යති ඉති= දීව්‍යන්. දීව්‍යන්තී ස්ත්‍රී. නපුංසකෙ, දීව්‍යතීති තත්= දීව්‍යත්, දීව්‍යන්තී, දීව්‍යන්ති. පඨතීති= පඨන්. පඨන්තී ස්ත්‍රී. නපුංසකෙ පඨත්, පඨන්තී, පඨන්ති. හසතීති= හසන්, හසන්තී ස්ත්‍රී, හසත් නපුංසකෙ. ශ්ලිෂ්‍යතීති= ශ්ලිෂ්‍යන්, ශ්ලිෂ්‍යන්තී ස්ත්‍රී, ශ්ලිෂ්‍යත් නපුංසකෙ. ජයතීති= ජයන්, ජයන්තී ස්ත්‍රී, ජයත් නපුංසකෙ.

**a.** වාදීපොඃ ශතුරිත්‍යත්‍ර වා ශබ්දාද් ද්විරුක්තානාං ජක්ෂාදීනාංච ශතුර්නිත්‍යං නුම්ප්‍රතිෂෙධො වක්තව්‍යඃ, නපුංසකෙ ශෞ වා. “දාදෙඃ” දදාතීති= දදත්, දදතී, දදති- දදන්ති. * දධාතීති= දධත්, දධතී, දධති- දධන්ති. * ජක්ෂ භක්ෂහසනයොඃ, ජක්ෂිතීති= ජක්ෂත්, ජක්ෂතී, ජක්ෂති- ජක්ෂන්ති, කුලානි.

---

විජිගීෂාව්‍යවහාරද්‍යුතිස්තුතිමොදමදස්වප්නකාන්තිගතිෂු:- (අංක 66 පිටෙන් බලනු.) දීව්‍යති ඉති= දීව්‍යන්, ක්‍රීඩා කෙරේ නු යි “දීව්‍යත්” නම්. දීව්‍යන්තී ස්ත්‍රී, ස්ත්‍රීතොමෝ “දීව්‍යන්තී” නමු. නපුංසකෙ:- දීව්‍යති තත්= දීව්‍යත්, ක්‍රීඩා කෙරේ නු යි ඒ “දීව්‍යත්” නම්. දීව්‍යත්, දීව්‍යන්තී, දීව්‍යන්ති යනු ප්‍රථමා විභක්ති යි. පඨතීති= පඨන්, හදාරා නු යි “පඨත්” නම්. පඨන්තී ස්ත්‍රී, ස්ත්‍රීතොමෝ “පඨන්තී” නමු. නපුංසකෙ:- පඨත්, පඨන්තී, පඨන්ති යනු ප්‍රථමා විභක්ති යි. හසතීති= හසන්, සිනා සේ නු යි “හසත්” නම්. හසන්තී ස්ත්‍රී, ස්ත්‍රීතොමෝ “හසන්තී” නමු. හසත් නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහි “හසත්” යනු වේ. ශ්ලිෂ්‍යතීති= ශ්ලිෂ්‍යන්, වැළඳ ගණී නු යි “ශ්ලිෂ්‍යත්” නම්. ජයතීති= ජයන්, දිනා නු යි “ජයත්” නම්. සෙස්ස සුගම යි.

a.. වාදීපොඃ ශතුඃ ඉතී අත්‍ර, “වාදීපොඃ ශතුඃ” යන මේ සූත්‍රයෙහි; වාශබ්දාත්, වා ශබ්දයෙන්; ද්විරුක්තානාම්, ද්විරුක්ත ධාතූන්ගේ ද; ජක්ෂාදීනාං ච, ජක්ෂාදි ධාතූන්ගේ ද; ශතුඃ, ශතෘ ප්‍රත්‍යය සම්බන්ධ ව; නිත්‍යම්, නිත්‍යයෙන්; නුම් ප්‍රතිෂෙධඃ, නුමාගම ප්‍රතිෂෙධය; වක්තව්‍යඃ, කිය යුතු යි. නපුංසකෙ ශෞ, නපුංසක ලිඞ්ගයෙහි ‘ශි’ ආදෙශය පර කල්හි; වා, විකල්පයෙන් නුම් ප්‍රතිෂෙධය කිය යුතු යි. (මේ වා ශබ්දය ව්‍යවස්ථාවාචක බැවින් මෙසේ කීහ. මෙයින් මේ ධාතූන් කෙරෙන් පර ශතෘ ප්‍රත්‍යය සම්බන්ධ ව ලිඞ්ගත්‍රයෙහි ම නුමාගමය ප්‍රතිෂිද්ධ ය. ‘ශි’ විෂයෙහි පමණක් විකල්පයෙන් වේ. ද්විරුක්ත ධාතු නම් ජුහොත්‍යාදි ගණයේ ධාතු යි.

---

* මේ ශිෂ්‍යයෙහි උදාහරණ පොත්හි නො පෙණේ. එසේ ම මේ දා- ධා ධාතූන්ට උදාහරණ ජක්ෂාදියට අගින් ද යෙදී තිබේ. ඒ අධික ය.

ජාගෘ නිද්‍රාක්ෂයෙ, ජාගර්තීති= ජාග්‍රත්, ජාග්‍රතී, ජාග්‍රති- ජාග්‍රන්ති. දරිද්‍රා දුර්ගතෞ, දරිද්‍රාතෙරාලොපො වක්තව්‍යඃ. දරිද්‍රාතීති= දරිද්‍රත්, දරිද්‍රතී, දරිද්‍රති- දරිද්‍රන්ති. චකාසතීති= චකාසත්, චකාසතී, චකාසති- චකාසන්ති. ශාසතීති තත්= ශාසත්.- අනුශාසතීති තත්= අනුශාසත්. ඉත්‍යාදි.

## 53. විදෙර්වා වසුඃ. (විදෙඃ 5- 1. වා- නිː වසුඃ 1- 1.)

**b.** විදෙර්ධාතොඃ ශතෘවිෂයෙ වා වසු ප්‍රත්‍යයො භවති. වෙත්තීති= විද්වාන්- විදන්.

---

ජක්ෂාදිය නම් ජක්ෂ- ජාගෘ- දරිද්‍රා- ශාස්- දීධී- වෙවී- චකාස් යන මොහු යි. මොවුන්ට අභ්‍යස්තසංඥ ධාතු ය යි ද නමක් වෙයි. එසේ ම ද්විරුක්ත ධාතුන්ට හා ජක්ෂාදියට ද ජක්ෂිත්‍යාදිය යි කියනු ලැබේ.

"ජක්ෂි ජාගෘ දරිද්‍රා ශාස් -දීධී වෙවී චකාස් තථා,
අභ්‍යස්තසංඥස්සප්‍තෙතෙ- සාභ්‍යාසා යෙ ච ධාතවඃ"

යනුවෙන් ඒ බැව් පෙණේ. "දදෙඃ" යන්නෙන් ආකාරය ලොප් වේ. දදතීති, දේ නු යි; පුල්ලිඞ්ගයෙහි "දදත්" යනු ද, ස්ත්‍රීලිඞ්ගයෙහි "දදතී" යනු ද, නපුංසක ලිඞ්ගයෙහි (ප්‍රථමා -ද්විතීයා බහු වචන යන්හි නුම් ප්‍රතිෂෙධය විකල්ප හෙයින්) "දදති- දදන්ති" යන රූප දෙක ද වේ. (මතු උදාහරණ ද මෙසේ දත යුතු.) දධාතීති, දරා නු යි හෝ පොෂණය කෙරේ නු යි;— ජක්ෂිතීති, අනුභව කෙරේ නු යි හෝ සිනාසේ නු යි;— කුලානි, කුලයෝ යි. ජාගර්තීති, නිදි මරා නු යි;— දරිද්‍රාතෙඃ, "දරිද්‍රා" ධාතුහුගේ; ආලොපඃ වක්තව්‍යඃ, ආකාර ලොපය කිය යුතු යි. දරිද්‍රාතීති, දිළිඳු වේ නු යි;— චකාසතීති, බබලා නු යි;— ශාසතීති, අනුශාසනා කෙරේ නු යි; තත්, ඒ; ශාසත්, "ශාසත්" නම් වේ. "අනුශාසතීති තත්= අනුශාසත්" යන්න ද මෙසේ යි. (අනු- උපසර්ග පූර්වකත්වය පමණක් වෙනසි. මේ ද්විරුක්ත ධාතුන්ගෙන් හා- ජක්ෂාදියෙන් පර ශතෘ ප්‍රත්‍යයට උදාහරණ යි. ඉත්‍යාදි, යනාදිය යි.

53. වසු ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. විදෙඃ, විද් ධාතුවෙන් පර ව; වා,. විකල්පයෙන්; වසුඃ, (ශතෘ විෂයෙහි) වසු ප්‍රත්‍යය වේ.

b. විදෙඃ ධාතොඃ, විද් ධාතුහු කෙරෙන්; ශතෘවිෂයෙ, ශතෘ- ප්‍රත්‍යය විෂයෙහි; (=ශතෘ ප්‍රත්‍යය විය යුතු තැන්හි;) වා, විකල්ප යෙන්; වසු ප්‍රත්‍යයඃ භවති, වසු ප්‍රත්‍යය වේ. (සිද්ධාන්ත චන්ද්‍රිකා- දියෙහි මෙය ශතෘ ප්‍රත්‍යයට වන ආදෙශයක් ලෙස දක්වූහ. බාල සරලා කාරයෝ මේ සාරස්වත පාඨය ද එසේ ශුද්ධ කළහ. එහෙත්

**a.** **භවිෂ්‍යදර්ථෙ තිප්තෙවත් ශතෘශානෞ භවතඃ. කරිෂ්‍යන්- කරිෂ්‍යමාණඃ.***

## 54. අත්‍රභවත්තත්‍රභවච්ඡබ්දෞ පූජ්‍යාර්ථෙ.†

(අත්‍ර- පෙ- ශබ්දෞ 1-2. පූජ්‍යාර්ථෙ 7-1.)

**b.** **එතෞ පූජ්‍යාර්ථෙ නිපාත්‍යෙතෙ. අත්‍රභවන්තො භවමිශ්‍රාඃ. තත්‍රභවද්භිර්භගවත්පාදෛර්භණිතම්.**

## ඉති ක්වසවාදි ප්‍රක්‍රියා. §

---

මෙය මෙසේ ගැණීමෙහි වරදක් ඇතැයි නො හඟිමු. මේ වසු ප්‍රත්‍යයෙහි ද උකාරෙත්ත්වය නුමාගමය- ඊප් ප්‍රත්‍යය යන ප්‍රයෝජන පිණිස යි.) වෙත්තීති, දනී නු යි; විද්වාන්- විදන්, වසු ප්‍රත්‍යය වූ පක්‍ෂයෙහි "විද්වස්" නම් ද- විකල්ප පක්‍ෂයෙහි ශතෘ ප්‍රත්‍යය වීමෙන් "විදත්" නම් ද වේ. ("අපිත්තාදිර්ඞිත්" යි වසු- ශතෘ ප්‍රත්‍යයන් ද ඞිත් සංඥ වන හෙයින් ගුණ නො වේ. ස්ත්‍රීලිඞ්ගයෙහි "විදුෂී- විදතී" යනු යි.)

a. භවිෂ්‍යත් අර්ථෙ, අනාගතාර්ථයෙහි; තිප්තෙවත්, තිප්-තෙ ප්‍රත්‍යය දෙක මෙන්; ශතෘශානෞ භවතඃ, ශතෘ- ශාන යන ප්‍රත්‍යය දෙදෙන වෙත්. (අනාගතාර්ථ හෙයින් "ත්‍යාදෞ භවිෂ්‍යති ස්‍යප්" යි ශතෘ- ශාන දෙකට පෙරටු ව ස්‍යප් ප්‍රත්‍යය වේ.) කරිෂ්‍යන්- කරිෂ්‍යමාණඃ, ශතෘ ප්‍රත්‍යය වූ කල්හි "කරිෂ්‍යත්" යනු ද- ශාන ප්‍රත්‍යය වූ කල්හි "කරිෂ්‍යමාණ" යනු ද වේ. ("හන්ෘතඃ ස්‍යපඃ" යි ඉඩාගම විය. සෙසු පදසිද්ධි සුගම යි.)

54. නිපාතන විධි සූත්‍රයි. "ත්‍රාණාද්‍ය නිපාත්‍යන්තෙ වා" යි වචනවිපර්‍ය්‍යාස වශයෙන් නිපාත්‍යෙතෙ යනු අනුවෘත්ත යි. අත්‍රභවත්තත්‍රභවත් ශබ්දෞ, අත්‍රභවත්- තත්‍රභවත් ශබ්ද දෙදෙන; පූජ්‍යාර්ථෙ, පූජ්‍යාර්ථයෙහි; නිපාත්‍යෙතෙ, නිපාතනය කරණු ලැබෙත්.

b. එතෞ, මොහු; පූජ්‍යාර්ථෙ, පිදිය යුතු ය යන අර්ථයෙහ; නිපාත්‍යෙතෙ, නිපාතනය කරණු ලැබෙත්. (පිදිය යුත්තකු වාච්‍ය කල්හි අත්‍ර- තත්‍ර යන අව්‍යය ශබ්දයන් උපපද කොට ඇති "භා"

---

* මේ උදාහරණ දෙක පොත්හි නො පෙණේ.

† පොත්හි "නිපාත්‍යෙතෙ" යන්න සූත්‍රයට එකතු වී සූත්‍රවෘත්තිය බැහැර ව තිබේ.

§ පොත්හි 'ක්වසවාදි ප්‍රක්‍රියාව' පිරිසිඳිනා ලද්දේ තවත් අඟිනි.

a. අථ ශීලාර්‍ථ ප්‍රක්‍රියාඃ-

## 55. ශීලෙ තෘන්. (ශීලෙ 7-1. තෘන් 1-1.)

**b. ධාතොස්තෘන් ප්‍රත්‍යයො භවති ශීලෙ ස්වභාවේ'ර්‍ථෙ. නකාරඃ ප්‍රත්‍යයභෙදඥාපනාර්‍ථඃ.**

---

ධාතුවෙන් පර ව "භාතෙර්ඩවතුඃ" යන පාණිනීය සූත්‍රානුසාර යෙන් "ලොකාචෙෂ්ෂස්‍ය-" යි ඩවතු ප්‍රත්‍යය කිරීමෙන් "අත්‍රභවත්- තත්‍රභවත්" ශබ්ද දෙක නිපදවා ගත යුතු යි. "අත්‍රභවන්තො භට මිශ්‍රාඃ" (=පිදිය යුතු භටමිශ්‍රයෙනි;) යන්නෙන් අත්‍රභවත් ශබ්දය ද, "තත්‍රභවද්භිර්භගවත්පාදෛර්භණිතම්" (=පිදිය යුතු භගවත් පාදයන් විසින් කියන ලදී.) යන්නෙන් තත්‍රභවත් ශබ්දය ද භාෂාවෙහි ව්‍යවහෘත බව දක්වූහ. උකාරානුබන්ධ හෙයින් දීර්‍ඝ ද වීමෙන් ප්‍රථ මෛක වචනයෙහි "අත්‍රභවාන්- තත්‍රභවාන්" කියා වේ. මෙහි 'අත්‍රභවත්' ශබ්දය අභිමුඛ වූවකු කෙරෙහි ද, 'තත්‍රභවත්' ශබ්දය තදන්‍යයෙකු කෙරෙහි ද ව්‍යවහාර කරණු ලැබේ. ස්ත්‍රීලිඞ්ගයෙහි "අත්‍රභවතී- තත්‍රභවතී" යනු යි. ශතෘ ප්‍රත්‍යය නො වන හෙයින් නුමාගම නො වේ.) ඉති— ප්‍රක්‍රියා, ඛ්වස්වාදි ප්‍රකරණය මෙසේ යි.

---

## ඛ්වස්වාදි ප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාව නිමි.

---

a. අථ, අනතුරු ව; ශීලාර්‍ථ ප්‍රක්‍රියා, ශීලාර්‍ථ ප්‍රත්‍යයන් පිළිබඳ ප්‍රක්‍රියාව දක්වනු ලැබේ.

*55.* තෘන් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "**ධාතොඃ**" යනු අනුවෘත්ත යි. ශීලෙ, තච්ශීලාර්‍ථයෙහි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; තෘන්, තෘන් ප්‍රත්‍යය වේ.

b. ධාතොඃ, ධාතුහු කෙරෙන්; ශීලෙ, "ශීලෙ" යි සේ යි; ස්වභාවෙ අර්‍ථෙ, ස්වභාවාර්‍ථයෙහි; තෘන් ප්‍රත්‍යයඃ භවති, තෘන් ප්‍රත්‍යය වේ. නකාරඃ, නකාරය; ප්‍රත්‍යයභෙදඥාපනාර්‍ථඃ, ප්‍රත්‍යයභෙදය ඇඟවීම ප්‍රයෝජන කොට ඇත්තේ ය.

(මෙයින් තාච්ඡීල්‍යයෙහි තෘන් ප්‍රත්‍යය විහිත ය. ප්‍රත්‍යයෙහි ඉත් නකාරය "තෘවුණෞ" යි විහිත තෘ ප්‍රත්‍යයෙන් වෙන් කොට හැඳින ගැණීම පිණිස යි. මෙහි "ශීල" නම් ස්වභාවය යි. "**ස්වභාවතඃ ඵලනිරපෙක්ෂාප්‍රවෘත්තිඃස්තාච්ඡීලම්**" යනුවෙන්

a. කරෙතීත්‍යෙවංශීලඃ= කර්තා. විවරතීත්‍යෙවංශීලඃ= විවරීතා. නයතීත්‍යෙවංශීලඃ= නෙතා. ධර්තා. ම්‍රියතෙ ඉත්‍යෙවංශීලඃ= මර්තා. බිභර්තීත්‍යෙවංශීලඃ= භර්තා. ශයිතා. ඉත්‍යාදි.*

## 56. ඉෂ්ණුස්නුක්නු. (ඉෂ්ණුස්නුක්නු 1-1.)

ඵලාපෙක්ෂාවක් නැති ව සවභාවයෙන් ම පැවැත්ම "තච්ඡීල" නමැයි කිහ. "පරපවාදං වක්තා ඛලඃ" යන මෙහි "වක්තෘ" ශබ්දය තච්ඡීලාර්ථයෙහි නිෂ්පන්න ය. එහෙයින් පරපවාද කීම දුර්ජනයාගේ සවභාවය යනු එහි අදහස යි. තාච්ඡීල්‍යයෙහි විහිත ප්‍රත්‍යයෝ තද්ධර්ම – තත්සාධුකාර්‍ය්‍යාර්ථයන්හි ද වෙත්. "මුණ්ඩයිතාරෙ වධූමූඪාං ශ්‍රාවිෂ්ඨායනාඃ" යන මෙහි "මුණ්ඩයිතෘ" ශබ්දය තද්ධර්මාර්ථයෙහි තෘන් ප්‍රත්‍යයෙන් සිද්ධ ය. එහෙයින් ආවාහ කළ භාර්‍ය්‍යාව මුඩු කිරීම ශ්‍රාවිෂ්ඨායනයන්ගේ චාරිත්‍ර ධර්මයක් ය යනු එහි අදහස යි. "වෙදාර්ථං නිර්ණේතා මනුඃ" යන මෙහි "නිර්ණේතෘ" ශබ්දයෙහි තෘන් ප්‍රත්‍යය තත්සාධුකාරි අර්ථයෙහි ය. එහෙයින් මනුතෙමේ වෙදාර්ථනිර්ණය මනාකොට කරන්නා ය යනු එහි භාවය යි.)

a. කරෙතීති එවංශීලඃ, කෙරෙයි යන මෙබඳු සවභාවය ඇත්තේ; කර්තා, "කර්තෘ" නම්. විවරතීති එවංශීලඃ, විමසයි යන මෙබඳු සවභාවය ඇත්තේ; විවරිතා, "විවරිතෘ" නම්. (මතු මෙබඳු වාක්‍යයන්හි ද අර්ථ මෙසේ දත යුතු.) නයතීති, පමුණුවයි යන;— නෙතා, "නෙතෘ" නම්. ධර්තා, "ධ්‍රියතෙ ඉත්‍යෙවංශීලඃ" (=දරයි යන මෙබඳු සවභාවය ඇත්තේ) යන වාක්‍යයෙහි "ධර්තෘ" නම්. ම්‍රියතෙ ඉති, මැරෙයි යන;— මර්තා, "මර්තෘ" නම්. බිභර්ති ඉති, දරයි හෝ පොෂණය කෙරෙයි යන;— භර්තා, "භර්තෘ" නම්. ශයිතා, "ශෙතෙ ඉත්‍යෙවංශීලඃ" (=නිදයි;—) යන වාක්‍යයෙහි "ශයිතෘ" නම්. ඉත්‍යාදි, යනාදිය යි. (තෘන් ප්‍රත්‍යයාන්තයෝ ද ස්ත්‍රීලිඞ්ගයෙහි "නෘණ ඊප්" යි ඊබන්ත වීමෙන් කර්ත්‍රී- විවරිත්‍රී- නෙත්‍රී යනාදි වශයෙන් වෙත්.)

56. ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. "ධාතොඃ" යනු ද, "ශීලෙ තෘන්" යි ශීලෙ යනු ද අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; ශීලෙ, තච්ඡීලාර්ථයෙහි; ඉෂ්ණුස්නුක්නු, ඉෂ්ණු- ස්නු- ක්නු යන ප්‍රත්‍යයෝ වෙත්. (සමාහාර ද්වන්ද්වයෙහි එක වචන යි.)

* පොතේ හා චන්ද්‍රකීර්ති ටීකාවෙහි ද ක්වසවාදි ප්‍රක්‍රියාව මෙතැනින් පිරිසිඳිනා ලදී. එය ශොධකයන්ගේ අනවධානතාවයෙන් වූවකි.

**a. ධාතොඃ ශීලෙ ස්වභාවෙ'ථෙ ඉෂ්ණු- ස්නු- ක්නු ඉත්‍යෙතෙ ප්‍රත්‍යයා භවන්ති.**

**b. අලංකෘඤ් නිරාකෘඤ් ප්‍රජන් උත්පච් උත්පත් උත්පද් ග්‍රස් උන්මද් රුච් අපත්‍රප් වෘතු වෘධු සහ චර භූ භ්‍රාජ ඤ්‍යන්ත එභ්‍ය ඉෂ්ණුඃ. අලඞ්කරොතීත්‍යෙවංශීලඃ= අලඞ්කරිෂ්ණුඃ. නිරාකරිෂ්ණුඃ. ප්‍රජායතෙ ඉත්‍යෙවංශීලඃ= ප්‍රජනිෂ්ණුඃ. උත්පචතීත්‍යෙවංශීලඃ= උත්පචිෂ්ණුඃ. පතෘ පතනෙ, උත්පතතීත්‍යෙවංශීලඃ= උත්පතිෂ්ණුඃ. පද ගතෞ, උත්පද්‍යතෙ ඉත්‍යෙවංශීලඃ= උත්පදිෂ්ණුඃ. ග්‍රස් අදනෙ, ග්‍රසතීත්‍යෙවංශීලඃ= ග්‍රසිෂ්ණුඃ. උන්මාද්‍යතීත්‍යෙවංශීලඃ= උන්මදිෂ්ණුඃ. රුචි දීප්තෞ, රොචතීත්‍යෙවංශීලඃ= රොචිෂ්ණුඃ. ත්‍රපූෂ් ලජ්ජායාම්, අපත්‍රපතෙ * ඉත්‍යෙවංශීලඃ=අපත්‍රපිෂ්ණුඃ. වෘතුඞ් වර්තනෙ, වර්තතෙ ඉත්‍යෙවංශීලඃ= වර්තිෂ්ණුඃ. වෘධුඞ් වෘද්ධෞ, වර්ධතෙ ඉත්‍යෙවංශීලඃ= වර්ධිෂ්ණුඃ. සහතෙ † ඉත්‍යෙවංශීලඃ= සහිෂ්ණුඃ. චරතීත්‍යෙවංශීලඃ= චරිෂ්ණුඃ. භවිෂ්ණුඃ. භ්‍රාජෘ දීප්තෞ, භ්‍රාජතෙ ඉත්‍යෙවංශීලඃ= භ්‍රාජිෂ්ණුඃ.**

---

a. ධාතොඃ, ධාතුහු කෙරෙන්; ශීලෙ, "ශීලෙ" හි සේ යි; ස්වභාවෙ අථෙ, ස්වභාවාර්ථයෙහි; ඉෂ්ණුස්නුක්නු ඉති, ඉෂ්ණු- ස්නු- ක්නු යන; එතෙ ප්‍රත්‍යයාඃ, මේ ප්‍රත්‍යයෝ; භවන්ති, වෙත්. (ක්නු ප්‍රත්‍යයෙහි කයන්ත ගුණ නිෂෙධය පිණිස යි. ඉක් බිති ඒ ප්‍රත්‍යය ත්‍රයයට ස්ථාන හා උදාහරණ වෙන වෙන ම දක්වත්.)

b. අලංකෘඤ්— ඤ්‍යන්ත එභ්‍යඃ, 'අලම්'පූර්‍ව කෘ ධාතු ය, 'නිර්- ආ' පූර්‍ව කෘ ධාතු ය, 'ප්‍ර' පූර්‍ව ජන් ධාතු ය, 'උද්' පූර්‍ව පච්- පත්- පද් ධාතු ය, ග්‍රස් ධාතු ය, 'උද්' පූර්‍ව මද් ධාතු ය, රුච් ධාතු ය, 'අප' පූර්‍ව ත්‍රප් ධාතු ය, වෘත්- වෘධ්- සහ්- චර්- භූ- භ්‍රාජ් ධාතු ය, ඤ්‍යන්ත ධාතු ය යන මොවුන් කෙරෙන්; ඉෂ්ණුඃ, ඉෂ්ණු ප්‍රත්‍යය වේ. අලඞ්කරොතීති, අලඞ්කාර කෙරෙයි යන; එවංශීලඃ, මෙබඳු ස්වභාවය ඇත්තේ; අලඞ්කරිෂ්ණුඃ, "අලඞ්කරිෂ්ණු" නම්. (නිරාකරොති,වළක්වයි;—)ප්‍රජායතෙ,ප්‍රකෂීයෙන් උපදී;—උත්පචති, උසස් ලෙස පිසයි;—උත්පතති, උඩ පනියි;—උත්පද්‍යතෙ, උපදීයි;—

---

* "අපත්‍රපනි වා" යි පොත්හි. අධික ය. "ත්‍රප්" ධාතුව ආත්මනෙපදි බැවිනි.

† සහනි සහතෙ වෙත්‍යෙවංශීලඃ- පොත්හි. භ්වාදි 'සහ්' ධාතුව ආත්මනෙපදි බැවින් ඒ සදෙසි.

a. ඉෂ්ණුප්‍රත්‍යයෙ පරෙ ණ්‍යන්තානං ණිලොපාභාවො වාච්‍යඃ. කාරයතීත්‍යෙවංශීලඃ= කාරයිෂ්ණුඃ. එතෙ ඉෂ්ණු ප්‍රත්‍යයාන්තාඃ.

b. ග්ලා ජි ස්ථා භූ ම්ලා ක්ෂි පච් යජ් පරිමෘජ් එභ්‍යඃ ස්නුඃ. ග්ලෛ හර්ෂක්ෂයෙ, ග්ලායතීත්‍යෙවංශීලඃ= ග්ලාස්නුඃ· ජය තීත්‍යෙවංශීලඃ= ජිෂ්ණුඃ. භවතීත්‍යෙවංශීලඃ = භූෂ්ණුඃ. ජිස්වොඃ ස්නෞ ගුණාභාවො න ඉට්, ක්ෂෙශච තථා. තිෂ්ඨතී ත්‍යෙවංශීලඃ= ස්ථාස්නුඃ. ක්ෂි ක්ෂයෙ, ක්ෂයතීත්‍යෙවංශීලඃ= ක්ෂිෂ්ණුඃ. පචතීත්‍යෙවංශීලඃ= පක්ෂ්ණුඃ. යජතීත්‍යෙවංශීලඃ= යක්ෂ්ණුඃ. මෘජූෂ් ශුද්ධෞ, මෘජෙර්ගුණනිමිත්තෙ ප්‍රත්‍යයෙ පරෙ වෘද්ධිර්වාච්‍යා. පරිමාර්ෂ්ටීත්‍යෙවංශීලඃ= පරිමාර්ක්ෂ්ණුඃ.

---

ග්‍රසති, ගිලියි;— උන්මාද්‍යති, උමතු වෙයි;—රොචති, බබලයි;— අපත්‍ර පතෙ,ලජ්ජිත වෙයි;—වර්තතෙ, පවතියි;—වර්ධතෙ, වැඩෙයි;—සහතෙ, ඉවසයි;—චරති, හැසිරෙයි;—භවිෂ්ණුඃ, "භවති ඉත්‍යෙවංශීලඃ" යන වාක්‍යයෙහි "භවිෂ්ණු" නම්. භ්‍රාජතෙ, බබලයි;—"භ්‍රාජිෂ්ණු" නම්.

a. ඉෂ්ණු ප්‍රත්‍යයෙ පරෙ, ඉෂ්ණු ප්‍රත්‍යය පර කල්හි; ණ්‍යන්තා නාම්, ණි ප්‍රත්‍යයාන්ත ධාතූන්ගේ; ණිලොපාභාවඃ, ණි ප්‍රත්‍යයට ලොප් නො වීම; වාච්‍යඃ, කිය යුතු යි. ("ණෙඃ" යි විහිත ණිලොපය මෙයින් ප්‍රතිෂිද්ධ ය.) කාරයතීති, කරවයි යන; එවංශීලඃ, මෙබඳු ස්වභාවය ඇත්තේ; කාරයිෂ්ණුඃ, "කාරයිෂ්ණු" නම්. එතෙ, මොහු; ඉෂ්ණුප්‍රත්‍යයාන්තාඃ, ඉෂ්ණු ප්‍රත්‍යයාන්තයෝ යි.

b. ග්ලා— එභ්‍යඃ, ග්ලෛ- ජි- ස්ථා- භූ- ම්ලෛ- ක්ෂි- පච්- යජ් ධාතු ය, 'පරි' පූර්ව මෘජ් ධාතු ය යන මොවුන් කෙරෙන්; ස්නුඃ, ස්නු ප්‍රත්‍යය වේ. ග්ලායතීති, ගිලන් වෙයි යන; එවංශීලඃ, මෙබඳු ස්වභාවය ඇත්තේ; ග්ලාස්නුඃ, "ග්ලාස්නු" නම්. (ග්ලෛ- ම්ලෛ ධාතූන්ගේ ඓකාරයට "සන්ධ්‍යක්ෂරාණාමා" යි ආකාරය වේ.) ජයති, දිනයි;— භවති, වෙයි; – ස්නෞ, ස්නු ප්‍රත්‍යය පර කල්හි; ජිස්වොඃ, ජි- භූ ධාතු දෙකට; ගුණාභාවඃ, ගුණ නො වීම වේ. න ඉට්, ඉඩාගම ද නො වේ. ක්ෂෙඃ ච, ක්ෂි ධාතුහු සම්බන්ධව ද; තථා, එසේ ම (ගුණ හා ඉඩාගම නො වේ.) තිෂ්ඨති, සිටියි;— ක්ෂයති, ගෙවෙයි;— පචති, පිසයි;— ('පක්ෂ්ණු' යන මෙහි "චොඃ කුඃ" යි චකාරයට කකාර වූ පසු ෂත්ව හා ණත්ව විය.) යජති, යාග කෙරෙයි—('යක්ෂ්ණු' යන තැන්හි "චොඃ කුඃ" යි ජකාරයට ගකාර වූ පසු "ඛසෙ චපාඃ" යනාදීන් කකාර වේ. ඉන් පසු ෂත්ව- ණත්ව වේ. ගුණනිමිත්තෙ ප්‍රත්‍යයෙ පරෙ, ගුණයට නිමිති වූ ප්‍රත්‍යය පර

**a.** විෂ් ත්‍රස් ගෘධ් ධෘෂ් ක්‍ෂිප් එභ්‍යඃ ක්නුඃ. විශෟ ව්‍යාප්තෞ, වෙවෙෂ්ටි ඉත්‍යෙවංශීලඃ= විෂ්ණුඃ. ත්‍රසී උද්වෙගෙ, ත්‍රසී භයෙ, ත්‍රස්‍යතීත්‍යෙවංශීලඃ= ත්‍රස්නුඃ. ගෘධ් අභිකාඞ්ක්‍ෂායාම්, දිවාදිඃ, ගෘධ්‍යතීත්‍යෙවංශීලඃ= ගෘධ්නුඃ. ඤිධෘෂා ප්‍රාගල්භ්‍යෙ, ස්වාදිඃ, ධෘෂ්ණොතීත්‍යෙවංශීලඃ= ධෘෂ්ණුඃ. ක්‍ෂිප් ප්‍රෙරණෙ, ක්‍ෂිපතීත්‍යෙවංශීලඃ= ක්‍ෂිප්නුඃ. කකාරෙ ගුණනිෂෙධාර්ථඃ.

## 57. ෂාකොකණඃ. (ෂාකොකණඃ 1- 3.)

**b.** ධාතොඃ ශීලෙ'ර්ථෙ ෂාක- උ- උකණ් ඉත්‍යෙතෙ ප්‍රත්‍යයා භවන්ති.

**c.** ජල්ප භික්‍ෂ කුට්ට ලුණ්ට වෘඞ් එභ්‍යඃ ෂාකප්‍රත්‍යයො භවති. ජල්ප ව්‍යක්තායාං වාචි, ජල්පතීත්‍යෙවංශීලඃ= ජල්පාකඃ.

---

කල්හි; මෘජෙඃ, 'මෘජ්' ධාතුහට; වෘද්ධිඃ වාච්‍යා, වෘද්ධිය කිය යුතු යි. පරිමාර්ෂ්ටීති, පිරිමදියි යන; එවංශීලඃ, මෙබඳු සවභාවය ඇත්තේ; පරිමාර්ක්‍ෂ්ණුඃ" "පරිමාර්ක්‍ෂ්ණු" නම්. (පදසිද්ධි පෙර මෙනි. මොහු ස්නු ප්‍රත්‍යයාන්තයෝ යි.)

**a.** විෂ්— එභ්‍යඃ, විෂ්- ත්‍රස්- ගෘධ්- ධෘෂ්- ක්‍ෂිප් යන මේ ධාතුන් කෙරෙන්; ක්නුඃ, ක්නු ප්‍රත්‍යය වේ. වෙවෙෂ්ටි, පැතිරෙයි;— ත්‍රස්‍යති, බිය වෙයි;— ගෘධ්, අභිකාඞ්ක්‍ෂායාම්, "ගෘධ්" ධාතුව අභිකාංශාවෙහි වේ. දිවාදිඃ, දිවාදි ගණ යි. ගෘධ්‍යති, ගිජු වෙයි;— ස්වාදිඃ, ("ධෘෂ්" ධාතුව) ස්වාදි ගණ යි. ධෘෂ්ණොති, බුහුටි වෙයි;— ක්‍ෂිපති, මෙහෙයයි;— කකාරඃ, (ක්නු ප්‍රත්‍යයෙහි) කකාරය; ගුණනිෂෙධාර්ථඃ, ගුණය වැළැක්වීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. (මේ ක්නු ප්‍රත්‍යයාන්තයෝ යි.)

57. ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. "ධාතොඃ" යනු ද, "ශීලෙ තෘන්" යි ශීලෙ යනු ද අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; ශීලෙ, ශීලාර්ථයෙහි; ෂාකොකණඃ, ෂාක- උ- උකණ් යන ප්‍රත්‍යයෝ වෙත්.

**b.** ධාතොඃ, ධාතුහු කෙරෙන්; ශීලෙ අර්ථෙ, ශීලාර්ථයෙහි; ෂාක උ උකණ් ඉති, ෂාක- උ- උකණ් යන; එතෙ ප්‍රත්‍යයාඃ, මේ ප්‍රත්‍යයෝ; භවන්ති, වෙත්. (ෂකාරය "ෂ්විද්‍රිතඃ" හි ඊප් ප්‍රත්‍යය කිරීම පිණිස යි. ණකාරය වෘද්ධිය පිණිස යි. ඉක්බිති ඔවුන්ට සර්වාන්ත හා උදාහරණ ද වෙන වෙන ම දක්වත්.)

**c.** ජල්ප— එභ්‍යඃ, ජල්ප- භික්‍ෂ- කුට්ට- ලුණ්ට- වෘ යන මේ ධාතුන් කෙරෙන්; ෂාක ප්‍රත්‍යයඃ භවති, ෂාක ප්‍රත්‍යය වේ. ජල්පති,

භික්ෂ යාච්ඤායාම්, භික්ෂත[1] ඉත්‍යෙවංශීලඃ= භික්ෂාකඃ. කුට්ට තාඩනෙ වා ඡේදනෙ, කුට්ටයති[2] ඉත්‍යෙවංශීලඃ= කුට්ටාකඃ. ලුණ්ට චෞර්‍ය්‍යෙ, ලුණ්ටතීත්‍යෙවංශීලඃ= ලුණ්ටාකඃ. වෘඞ් සම්භක්තෞ, වෘ වරණෙ, වෘ සංවරණෙ,[3] වෘණීතෙ වා වරතීත්‍යෙවංශීලඃ වා වෘණුත ඉත්‍යෙවංශීලඃ= වරාකඃ. ෂ ඊබර්ථඃ, වරාකී.

a. සානන්තාශංස් භික්ෂ එභ්‍ය උඃ ප්‍රත්‍යයො භවති.

b. සානන්තාශංසයොශ්ච.

c. සප්‍රත්‍යයාන්තාදාඞ්පූර්වාත් ශංසු ඉච්ඡායා[4]මිත්‍යස්මාද්ධාතොශ්ච ශීලාර්ථං විනාපි උඃ ප්‍රත්‍යයො භවති. වච පරිභාෂණෙ, විවක්ෂතීති= විවක්ෂුඃ.

---

කාර්‍ය කෙරෙයි;—භික්ෂතෙ, යදියි;— කුට්ටයති, තළයි හෝ සිඳියි;— ලුණ්ටති, සොරකම් කෙරෙයි;— වෘණීතෙ වා වරති, බෙජෙයි හෝ ඉල්ලයි;— වා, නොහොත්; වෘණුතෙ, පතයි;— (ධාතුත්‍රයෙන් ම ෂාක ප්‍රත්‍යය වීමෙන් "වරාක" යි වේ.) ෂඃ ඊබර්ථ, ෂකාරය ඊප් ප්‍රත්‍යය ප්‍රයෝජන කොට ඇත්තේ යි. වරාකී, ස්ත්‍රීලිඞ්ගයෙහි "වරාකී" යනු වේ. (සෙසු උදාහරණ ද ස්ත්‍රීලිඞ්ගයෙහි ජල්පාකී-භික්ෂාකී යනාදි වශයෙනි. මොහු ෂාක ප්‍රත්‍යයාන්තයෝ යි.

a. සානන්ත— එභ්‍යඃ, ඉච්ඡාර්ථයෙහි වූ සප්‍රත්‍යයාන්ත ධාතු ය, 'ආ' පූර්ව ශංස් ධාතු ය, භික්ෂ ධාතු ය යන මොවුන් කෙරෙන්; උඃ ප්‍රත්‍යයඃ භවති, උ ප්‍රත්‍යය වේ.

b. සානන්තාශංසයොඃ ච, සප්‍රත්‍යයාන්ත ධාතු ය– 'ආ' පූර්ව ශංස් ධාතු ය යන දෙක සම්බන්ධ ව ශීලාර්ථයෙන් තොර ව ද උ ප්‍රත්‍යය වේ.

c. සප්‍රත්‍යයාන්තාත්, සප්‍රත්‍යයාන්ත ධාතුහු කෙරෙන් ද; ආඞ්පූර්වාත්, 'ආඞ්' උපසර්ගය පූර්ව කොට ඇති; ශංසු ඉච්ඡායාම් ඉති අස්මාත් ධාතොඃ ච, "ශංසු ඉච්ඡායාම්" යන මේ ධාතුහු කෙරෙන්

---

1. භික්ෂති- පොත්හි. ආත්මනෙපදී යි.
2. කුට්ටති- පොත්හි. අදන්ත චුරාදි යි.
3. වර නිවාරණෙ- පොත්හි. එබඳු ධාතුවක් අදෘෂ්ට ය. 'වරාක' ශබ්දයෙහි විග්‍රහ වාක්‍යය ද පොත්හි ව්‍යාකූල ය.

4 පොත්හි "ශංසු ස්තුතෞ" යි පෙණේ. එහෙත් "ආඞඃ ශංසු ඉච්ඡායාමය මෙව ගෘහ්‍යතෙ. න තු ශංසු ස්තුතෞ. ආඞා සහ නිර්දෙශාත්" යි සුබොධිනියෙහි ද, "ආඞඃ ශංසි ඉච්ඡායාමිත්‍යස්‍ය ග්‍රහණම්, න ශංසෙඃ ස්තුත්‍යර්ථස්‍ය" යි රූපාවතාරයෙහි ද කී හෙයින් ඒ සෑදිසි.

5

**5. “ඉච්ඡායාමාත්මනඃ සඃ” “සෙ දීඝඃ” * “ස්‍යෘත ඉර්” ද්විත්වම්, “ය්වොර්ව් හසෙ” “කුහොශ්චුඃ” චිකීෂීතීත්‍යෙවංශිලඃ= චිකිර්ෂුඃ. ජිඝෘක්ෂතීත්‍යෙවංශිලඃ= ජිඝෘක්ෂුඃ. ආඞ්පූර්වඃ ශංසු ඉච්ඡායාම්, ශංස් කථනෙ, ආශංසත † ඉත්‍යෙවංශිලඃ= ආශංසුඃ. භික්ෂත ඉත්‍යෙවංශිලඃ= භික්ෂුඃ. පිපාසතීත්‍යෙවංශිලඃ= පිපාසුඃ. තිතීෂීතීත්‍යෙවංශිලඃ= තිතිර්ෂුඃ.**

---

ද; ශීලාර්ථං විනා අපි, ශීලාර්ථයක් නැති ව ද; උඃ ප්‍රත්‍යයඃ භවති, උ ප්‍රත්‍යය වේ. වච පරිභාෂණෙ:- විවක්ෂතීති, කියනු කැමති වේනු යි; විවක්ෂුඃ, “විවක්ෂු” නම්. (“ආශංසත ඉති= ආශංසුඃ” යනු “ශංස්” ධාතුවට උදහරණ යි. ‘ආ’ පූර්ව වූ කල්හි ඉච්ඡාර්ථ “ශංස්” ධාතුව ම ගණු ලැබේ. මේ දෙතැන්හි ශීලාර්ථයෙන් තොර ව උ ප්‍රත්‍යය විය.)

5. “ඉච්ඡායාමාත්මනඃ සඃ” යන සූත්‍රයෙන් “කෘ” ධාතුහු කෙරෙන් ස ප්‍රත්‍යය වේ. “සෙ දීඝඃ” යන්නෙන් ධාතුහට දීඝ වේ. “ස්‍යෘත ඉර්” යන්නෙන් ඉර් ආදෙශ වේ. ද්විත්වම්, (ඉන් පසු) ද්විත්ව වේ. “ය්වොර්ව් හසෙ” යන්නෙන් දීඝ වේ. “කුහොශ්චුඃ” යන්නෙන් පූර්ව කකාරයට චකාරය වේ. (“ක්විලාත්” යනාදීන් ෂත්වය වේ. එකල්හි “චිකීෂ්” යි සිටී. ඉන් පර ව ශීලාර්ථයෙහි උප්‍රත්‍යය ව “චිකිර්ෂු” යි වේ. 160 පිට ද බලනු.)චිකීෂීති, කරණු කැමති වෙයි;— ජිඝෘක්ෂති, ගණු කැමති වෙයි;— (‘ඉච්ඡායාමාත්මනඃ සඃ’= ග්‍රහ් + ස, ‘ද්විශ්ච’=ග්‍රග්‍රහ් + ස, ‘පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ’= ගග්‍රහ් + ස, ‘කුහොශ්චුඃ’= ජග්‍රහ් + ස, ‘යඃ සෙ’= ජිග්‍රහ් + ස, ‘ග්‍රහාං ඞිති ච’= ජිගෘහ් + ස, ‘හො ඪඃ’= ජිගෘඪ් + ස, ‘ආදිජබානාං ඣභාන්තස්‍ය ඣභාඃ ස්ධ්වොඃ’= ජිඝෘඪ් + ස, ‘ෂඪොඃ කඃ සෙ’= ජිඝෘක් + ස, ‘ක්විලාත් ෂඃ සඃ කෘතස්‍ය’= ජිඝෘක් + ෂ, ‘කෂසංයොගෙ ක්‍ෂඃ’= “ජිඝෘක්ෂ” යි මෙසේ සාන්ත ‘ජිඝෘක්ෂ’ ධාතුව නිපන් කල්හි ඉන් පර ව මේ උප්‍රත්‍යය වීමෙන් “ජිඝෘක්ෂු” යි වේ.) ආඞ්පූර්වඃ ශංසු ඉච්ඡායාම්, ‘ආඞ්’ පූර්ව කොට ඇති “ශංස්” ධාතුව කැමති වීමෙහි වේ. “ශංස්” කථනෙ, “ශංස්” ධාතුව කීමෙහි ද වේ. ආශංසතෙ, කැමති වෙයි;— භික්ෂතෙ, සිඟයි;— පිපාසති, බොනු කැමති වෙයි;— තිතීෂීති, තරණය කරන්නට කැමති වෙයි;— (සාන්ත ධාතුන්ගේ පදසිද්ධි සාන්තප්‍රක්‍රියායෙන් දත යුතු.)

---

* පොත්හි මෙතැන්හි “පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ” යි පෙණේ.

†. ආශංසති- පොත්හි. ‘ආ’ පූර්ව “ශංස්” ධාතුව ආත්මනෙපදි වෙයි. ධාතුරූපාදර්ශය බලනු.

**a.** ලෂ පත භික්ෂ පද ස්ථා භූ වෘෂ හන් කම් ගම් ශෘ එභ්‍යඃ උකඤ් ප්‍රත්‍යයො භවති. ඤිත්ත්වාද් වෘද්ධිඃ. ලෂ කාන්තෞ, ලෂතීත්‍යෙවංශීලඃ= ලාෂුකඃ. පතතීත්‍යෙවංශීලඃ= පාතුකඃ. භික්ෂ යාච්ඤායාම්, භික්ෂතෙ* ඉත්‍යෙවංශීලඃ= භික්ෂුකඃ. පද ගතෞ, පද්‍යතෙ * ඉත්‍යෙවංශීලඃ= පාදුකඃ. තිෂ්ඨතීත්‍යෙවංශීලඃ=ස්ථායුකඃ. භවතීත්‍යෙවංශීලඃ, වා භවිතුං ශීලමස්‍යාස්තීති= භාවුකඃ. වෘෂ වෘෂ්ටෞ, වෘෂ සෙචනෙ, වර්ෂතීත්‍යෙවංශීලඃ= වර්ෂුකඃ. හන්තීත්‍යෙවංශීලඃ= ඝාතුකඃ. කමු කාන්තෞ, කාමයතෙ ඉත්‍යෙවංශීලඃ, වා කාමයිතුං † ශීලමස්‍යාස්තීති= කාමුකඃ. ගම්ලෘ ගතෞ, ගච්ඡතීත්‍යෙවංශීලඃ= ගාමුකඃ. ශෘ‡ හිංසායාම්, ශෘණාතීත්‍යෙවංශීලඃ= ශාරුකඃ.

**b,** ශෘවන්ද්‍යොරාරුඃ.§

**c.** ශෘවන්ද්‍යොර්ධාත්වොරාරුඃ ප්‍රත්‍යයො භවති. ශරාරුඃ, වන්දාරුඃ.

---

a. ලෂ — එභ්‍යඃ, ලෂ- පත- භික්ෂ- පද- ස්ථා- භූ- වෘෂ- හන්- කම්- ගම්- ශෘ යන මේ ධාතූන් කෙරෙන්; උකඤ් ප්‍රත්‍යයඃ භවති, උකඤ් ප්‍රත්‍යය වේ. ඤිත්ත්වාත්, ප්‍රත්‍යය ඤිත් බැවින්; වෘද්ධිඃ, ධාතුහට වෘද්ධි වේ. ලෂති, කැමති වෙයි;— පතති, වැටෙයි;— භික්ෂතෙ, සිඟයි;— පද්‍යතෙ, ගමන් කෙරෙයි;— තිෂ්ඨති, සිටියි;— ("ආතො යුක්" යි යුගාගමයෙන් "ස්ථායුක" යි වේ.) භවති ඉති එවංශීලඃ, වෙයි යන මෙබඳු සවභාවය ඇත්තේ; වා, නොහොත්; භවිතුම්, වන්නට; ශීලම්, සවභාවය; අස්‍ය අස්තීති, මොහුට ඇත්තේ නු යි; භාවුකඃ, "භාවුක" නම්. (මෙසේ ද සියලු තැන්හි විග්‍රහය වේ.) වර්ෂති, වසියි හෝ ඉසියි;— ("උපධායා ලඝොඃ" යි ගුණ විය.) හන්ති, නසයි;— ("හනො ඝත්" යි 'ඝත්' ආදෙශ යි.) කාමයතෙ, කැමති වෙයි;— වා, නොහොත්; කාමයිතුම්, කැමති වන්නට; ශීලම්, සවභාවය; අස්‍ය අස්තීති, මොහුට ඇත්තේ නු යි; කාමුකඃ, "කාමුක" නම්. ගච්ඡති, යෙයි;— ශෘණාති, හිංසා කෙරෙයි;— "ශාරුක" නම්

b. ශෘවන්ද්‍යොඃ, ශෘ- වදි ධාතු දෙක සම්බන්ධ ව; ආරුඃ, ආරු ප්‍රත්‍යය වේ.

c. ශෘවන්ද්‍යොඃ ධාත්වොඃ, "ශෘ හිංසායාම්- වදි අභිවාදන ස්තුත්‍යොඃ" යන ධාතු දෙදෙනාගේ (ශීලාර්ථයෙහි;) ආරුඃ ප්‍රත්‍යයඃ භවති, ආරු ප්‍රත්‍යය වේ. ශරාරුඃ, "ශෘණාතීත්‍යෙවංශීලඃ" යන

---

* භික්ෂති. පද්‍යති- පොත්හි. ආත්මනෙපදී බැවින් සදෙසි.

† කාමිතුම්- පොත්හි. ‡ ශෘ හිංසායාම්- පොත්හි.

§ පාණිනීය 3- 2- 173.

**a. ස්පෘහි ගෘහි පති ශීඞ් එභ්‍ය ආලුඡ්වාච්‍යඃ. ස්පෘහ ඊප්සායාම්, ඊප්සා ඉච්ඡා, ගෘහ ග්‍රහණෙ, පත ඓශ්වර්‍යෙ, ත්‍රයශ්චුරාදයො'දන්තාඃ. ආලෞ ණිලොපාභාවො වාච්‍යඃ. ස්පෘහයතීත්‍යෙවංශීලඃ= ස්පෘහයාලුඃ. ගෘහයතීත්‍යෙවංශීලඃ= ගෘහයාලුඃ. පතයතීත්‍යෙවංශීලඃ= පතයාලුඃ. ශීඞ් ස්වප්නෙ, ශෙතෙ ඉත්‍යෙවංශීලඃ= ශයාලුඃ.**

---

වාක්‍යයෙහි "ශරාරු" නමි. (ධාතුහට ගුණ වේ.) වන්දාරුඃ, "වන්දත ඉත්‍යෙවංශීලඃ" යන වාක්‍යයෙහි "වන්දාරු" නමි. ("ඉදිතො නුම්" යි නුමාගම යි. "ශරාරුඝාතුකො හිංස්‍රො- වන්දාරුරභිවාදකඃ" යනු අමරකොෂ යි.)

a. සපෘහි— එභ්‍යඃ, සපෘහ- ගෘහ- පත- ශී යන මේ ධාතූන් කෙරෙන්; ආලුඃ වාච්‍යඃ, ආලු ප්‍රත්‍යය කිය යුතු යි. සපෘහ ඊප්සායාම්, "සපෘහ" ධාතුව ඉච්ඡාපියෙහි වේ. ඊප්සා ඉච්ඡා, 'ඊප්සා' නම් කැමති වීම යි. ගෘහ ග්‍රහණෙ, "ගෘහ" ධාතුව ගැණීමෙහි වේ. පත ඓශ්වර්‍යෙ, "පත" ධාතුව අධිපති බැව්හි වේ. ත්‍රයඃ, මේ තුන් ධාතුහු; අදන්තාඃ චුරාදයඃ, අකාරාන්ත චුරාදි ධාතුහු ය. (එහෙයින් අල්ලොපය තමා ස්ථානිවත් බැවින් ගුණ- වෘද්ධි නො වේ.) ආලෞ, ආලු ප්‍රත්‍යය පර කල්හි; ණිලොපාභාවඃ, ("ණෙඃ" යි වන) ණි ප්‍රත්‍යයලොපයාගේ අභාවය; වාච්‍යඃ, කිය යුතු යි. සපෘහයති, කැමති වෙයි;— ගෘහයති, ගණියි;— පතයති, අධිපති වෙයි;— ශෙතෙ, ශයනය කෙරෙයි;— "ශයාලු" නමි.

(මෙසේ ම "දයඞ් දානෙ, 'නි' පූර්‍ව ද්‍රා කුත්සායාම්, 'තත්' පූර්‍ව ද්‍රා කුත්සායාම්, නොහොත් තද්‍රි අවසාදෙ මොහෙ ච, (=සෞත්‍ර)'ශ්‍රත්' පූර්‍ව ඩුධාඤ් ධාරණපොෂණයොඃ" යන ධාතූන් කෙරෙන් ආලු ප්‍රත්‍යය වීමෙන් "දයාලු- නිද්‍රාලු- තන්ද්‍රාලු- ශ්‍රද්ධාලු"යි නිෂ්පන්නයහ. තත්පූර්‍ව ද්‍රා පක්ෂයෙහි 'තන්ද්‍රාලු' යන තැන්හි නකාරය නිපාතන යෙන් වේ. "කෘපාං ලාති, ස්පඞ්ගං ලාති" යන වාක්‍යයන්හි කෘපා- සපඞ්ගා ශබ්දපූර්‍ව 'ලා' ධාතුහු කෙරෙන් ඖණාදික කු ප්‍රත්‍යය වීමෙන් "කෘපාලු- සපඞ්ගාලු" යි සිද්ධ යි. මේ සියල්ල තද්ධිතයෙහි දයා- නිද්‍රා- තන්ද්‍රා- ශ්‍රද්ධා- කෘපා- සපඞ්ගා ශබ්දයන් කෙරෙන් "ශ්‍රද්ධාදෙර්ලුඃ" යි අන්‍යාචාර්‍යයෙහි ලු ප්‍රත්‍යය කිරීමෙන් ද නිපදවන ලදී. මෙසේ සාධනොපාය බාහුල්‍යය ශබ්දව්‍යුත්පත්තියෙහි සුකර බව පිණිස වේ.)

a. නමාදෙරඃ.

b. නම් කපි ස්මිඞ් නඤ්පූර්වො ජස් කම් හිංස් දිප් එභ්‍යො රඃ ප්‍රත්‍යයො භවති ශීලෙ'ර්ථෙ. ණමු ප්‍රහ්වත්වෙ ශබ්දෙ ච, නමතීත්‍යෙවංශීලඃ= නම්‍රඃ. කපි චලනෙ, කම්පත* ඉත්‍යෙවංශීලඃ= කම්ප්‍රඃ. ස්මිඞ් ඊෂද්ධසනෙ, ස්මයත ඉත්‍යෙවංශීලඃ=ස්මෙරඃ. ජසු මොක්ෂණෙ, ජසු ගතිනිවෘත්තෞ, දිවාදිඃ. න ජස්‍යතීත්‍යෙවංශීලම්= අජස්‍රම්. කාමයතෙ ඉත්‍යෙවංශීලඃ= කම්‍රඃ. හිසි හිංසායාම්, හිනස්තීත්‍යෙවංශීලඃ= හිංස්‍රඃ. දිපි දීප්තෞ, දීප්‍යතෙ ඉත්‍යෙවංශීලඃ= දීප්‍රඃ.

## 58. ඝසාදෙඃ ක්මරඃ. (ඝසාදෙඃ 5- 1. ක්මරඃ 1- 1.)

c. ඝස් සෘ අද් එභ්‍යඃ ක්මරඃ ප්‍රත්‍යයො භවති ශීලෙ'ර්ථෙ. ඝසෘ අදනෙ, ඝසතීත්‍යෙවංශීලඃ= ඝස්මරඃ. සෘ ගතෞ, සෘ සරණෙ, සෘ හිංසායාම්, සරතීත්‍යෙවංශීලඃ= සෘමරඃ. අද් භක්ෂණෙ, අත්තීත්‍යෙවංශීලඃ= අද්මරඃ.

---

a. නමාදෙඃ, නම් ආදි ධාතූහු කෙරෙන්; රඃ, (ශීලාර්ථයෙහි) ර ප්‍රත්‍යය වේ.

b. නම්— එභ්‍යඃ, නම්- කප්- ස්මි- 'නඤ්' නිපාතපූර්ව ජස්- කම්- හිංස්- දීප් යන මොවුන් කෙරෙන්; ශීලෙ අර්ථෙ, ශීලාර්ථයෙහි; රඃ ප්‍රත්‍යයඃ භවති, ර ප්‍රත්‍යය වේ. ණමු ප්‍රහ්වත්වෙ ශබ්දෙ ච, ණොපදෙශ "නම්" ධාතුව නැමීමෙහි ද ශබ්දයෙහි ද වේ. නමති නැමෙයි;— කම්පතෙ, සැලෙයි;— (ඉදිත් බැවින් නුමාගම යි.) ස්මයතෙ, සිනා සෙයි;— (ධාතුහට ගුණ විය.) න ජස්‍යති, නො මිදෙයි හෝ නො නවතියි;— කාමයතෙ, කැමති වෙයි;— හිනස්ති, හිංසා කෙරෙයි;— දීප්‍යතෙ, බබලයි;— "දීප්‍ර" නම්·

58. ක්මර ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතොඃ- ශීලෙ යනු අනුවෘත්ත යි. ඝසාදෙඃ ධාතොඃ, ඝස් ආදි ධාතූහු කෙරෙන්; ශීලෙ, ශීලාර්ථයෙහි; ක්මරඃ, ක්මර ප්‍රත්‍යය වේ.

c. ඝස්— එභ්‍යඃ, ඝස්- සෘ- අද් යන මොවුන් කෙරෙන්; ශීලෙ අර්ථෙ, ශීලාර්ථයෙහි; ක්මර ප්‍රත්‍යයඃ භවති, ක්මරඃ ප්‍රත්‍යය වේ. (කාතන්ත්‍ර ගුණප්‍රතිෂෙධය පිණිස යි.) ඝසති, කයි;— සරති ගමන් කෙරෙයි, හැසිරෙයි හෝ හිංසා කෙරෙයි;— අත්ති, අනුභව කෙරෙයි;— "අද්මර" නම්.

---

* කම්පති- පොත්හි. ආත්මනෙපදී යි.

## 59. ඡිදිභිදිවිදෙඃ කුරඃ. (ඡිදිභිදිවිදෙඃ 5- 1. කුරඃ 1- 1.)

**a. ඡිදි භිදි විදි එභ්‍යඃ කුරඃ වාච්‍යඃ ශීලෙ'ථෙ. ඡිදිර් ද්වෛධීකරණෙ, ඡිනත්ත්‍යෙවංශීලඃ= ඡිදුරඃ. භිනත්ත්‍යෙ වංශීලඃ= භිදුරඃ. විද් ඥානෙ, වෙත්ත්‍යෙවංශීලඃ= විදුරඃ.**

## 60. භාසාදෙර්ඝුරඃ. (භාසාදෙඃ 5- 1. ඝුරඃ 1- 1.)

**b. භාස භඤ්ජ මිද් එභ්‍යො ඝුරඃ ප්‍රත්‍යයො භවති ශීලෙ 'ථෙ. ඝකාරෙ ඝිත්කාර්‍ය්‍යාර්‍ථඃ. භාසෘ දීප්තෞ, භාසතෙ ඉත්‍යෙවංශීලඃ= භාසුරඃ.**

## 61. චජෝඃ කගෞ ඝිති.

(චජෝඃ 6- 2. කගෞ 1- 2. ඝිති 7- 1.)

---

59. කුර ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **ධාතොඃ**- ශීලෙ යනු අනුවෘත්ත යි. ඡිදිභිදිවිදෙඃ ධාතොඃ, ඡිද්- භිද්- විද් යන ධාතු කෙරෙන්; ශීලෙ, ශීලාර්‍ථයෙහි; කුරඃ, කුර ප්‍රත්‍යය වේ. ('ඡිදිභිදිවිදෙඃ'= සමාහාර ද්වන්ද්වයෙහි එක වචන යි.)

a ඡිදි භිදි විදි එභ්‍යඃ, ඡිද්- භිද්- විද් යන මොවුන් කෙරෙන්; ශීලෙ අර්‍ථෙ, ශීලාර්‍ථයෙහි; කුරඃ වාච්‍යඃ, කුර ප්‍රත්‍යය කිය යුතු යි. (කයන්ත ගුණප්‍රතිෂෙධය පිණිස යි.) ඡිනත්ති, සිඳියි;— ("ඡිදුර" යන මෙහි කුර ප්‍රත්‍යය කර්‍මකර්ත්‍රෘ විෂයෙහි ය යි සමහරු කියත්. එහෙත් "ප්‍රියතමාය වපුර්ගුරුමත්සර - ච්ඡිදුරයාදුරයා චිත්තමධගතාඃ" යන මාඝ පාඨයෙන් එය ව්‍යර්‍ථ වේ.) භිනත්ති, බිඳියි;— වෙත්ති, දනියි;— "විදුර" නම්.

60. ඝුර ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **ධාතොඃ**- ශීලෙ යනු අනුවෘත්ත යි. භාසාදෙඃ ධාතොඃ, භාස් ආදි ධාතුහු කෙරෙන්; ශීලෙ, ශීලාර්‍ථයෙහි; ඝුරඃ ඝුර ප්‍රත්‍යය වේ.

b. භාස—එභ්‍යඃ, භාස්- භඤ්ජ්- මිද් යන මොවුන් කෙරෙන්; ශීලෙ අර්‍ථෙ, ශීලාර්‍ථයෙහි; ඝුරඃ ප්‍රත්‍යයඃ භවති, ඝුර ප්‍රත්‍යය වේ. ඝකාරඃ, ඝකාරය; ඝිත්කාර්‍ය්‍යාර්‍ථඃ, ඝිත්කාර්‍ය්‍යය ප්‍රයෝජන කොට ඇත්තේ ය. (ඝිත්කාර්‍ය්‍යය නම් අනන්තර සූත්‍රයෙන් විධීයමාන කාර්‍ය්‍යය යි.) භාසතෙ, බබලයි;— "භාසුර" නම්.

61. ආදෙශ විධි සූත්‍ර යි. ඝිති, ඝයන්ත ඉත් කොට ඇති ප්‍රත්‍යය පර කල්හි; චජෝඃ, චකාර- ජකාර දෙකට; කගෞ, කකාර- ගකාරයෝ වෙත්.

**a ධාතොශ්චකාරජකාරයොඃ කකාරගකාරෞ භවතඃ සිති ප්‍රත්‍යයෙ පරෙ. භඤ්ජා ආමද්දනෙ, භඤ්ජතීත්‍යෙවංශීලඃ= භඞ්ගුරඃ. ඤිමිද ස්නෙහනෙ, මෙද්‍යතෙ ඉත්‍යෙවංශීලඃ= මෙදුරඃ.**

## 62. යඩ ඌකඃ. (යඩඃ 5-1. ඌකඃ 1-1.)

**b. යජ් ජප් දංශ් වද් එභ්‍යො යඩ්ප්‍රත්‍යයාන්තෙභ්‍යෙ ඌකඃ ප්‍රත්‍යයො භවති ශීලෙ'ථෙ. යඩො ලුක්. තත්සන්නියොගෙන ධාතොර්ද්විර්වචනම්. යජ දෙවපූජාසඞ්ගතිකරණදානෙසු. අතිශයෙන යජතීති වා යායජ්‍යතෙ ඉත්‍යෙවංශීලඃ= යායජූකඃ. ජප ව්‍යක්තායං වාචි, "ඤමජපාං නුක්" ජඤ්ජප්‍යතෙ ඉත්‍යෙවං ශීලඃ=ජඤ්ජපූකඃ. දංශ් දශනෙ, දන්දශූකඃ. වාවද්‍යතෙ ඉත්‍යෙවං ශීලඃ= වාවදූකඃ.**

---

a. සිති ප්‍රත්‍යයෙ පරෙ, සිත් වූ ප්‍රත්‍යය පර කල්හි; ධාතොඃ, ධාතුහුගේ; චකාර ජකාරයොඃ, චකාර- ජකාර දෙකට; කකාර ගකාරෞ, කකාර- ගකාර දෙදෙන; භවතඃ, වෙත්. භඤ්ජති, බිඳියි;— "භඞ්ගුර" නම්. මෙද්‍යතෙ, ප්‍රෙම කෙරෙයි තොහොත් තෙත් කෙරෙයි;— "මෙදුර" නම්.

62. ඌක ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතොඃ-ශීලෙ යනු අනුවෘත්ත යි. යඩඃ ධාතොඃ, යඩ් ප්‍රත්‍යයාන්ත ධාතුහු කෙරෙන්; ශීලෙ, ශීලාඊයෙහි; ඌකඃ, ඌක ප්‍රත්‍යය වේ.

b. යඩ්ප්‍රත්‍යයාන්තෙභ්‍යඃ, යඩ් ප්‍රත්‍යය අන්ත කොට ඇති; යජ්— එභ්‍යඃ, යජ්- ජප්- දංශ්- වද් යන මොවුන් කෙරෙන්; ශීලෙ අථෙ, ශීලාඊයෙහි; ඌකඃ ප්‍රත්‍යයඃ භවති, ඌක ප්‍රත්‍යය වේ. යඩඃ, යඩ් ප්‍රත්‍යයට; ලුක්, ලුක් වේ. (මේ ලුක් වීම "වාන්‍යත්‍ර" යන සූත්‍ර බලයෙනි. එයින් ඌක ප්‍රත්‍යය සංයොගයක් නැති තන්හි විකල්ප යෙන් යඩ් ප්‍රත්‍යයට ලුක් වේ ය යි කී හෙයින් ඌක ප්‍රත්‍යය සංයොගය ඇති තැන්හි නිත්‍යයෙන් ම ලුක් වන බව හඟවයි.) තත් සන්නියොගෙන, ඒ ඌක ප්‍රත්‍යය හා එක් ව යෙදීමෙන්; ධාතොඃ, ධාතුහට; ද්විර්වචනම්, ද්විරුක්තිය වේ. (මේ ද්විත්වය ද "අතිශයෙ භසාදෙඃසිඞ් ද්විශ්ච" යන සූත්‍රයෙනි. යඩ් ප්‍රත්‍යය ලුග් වුව ද "ප්‍රත්‍යයලොපෙ ප්‍රත්‍යය ලක්ෂණම්" යන න්‍යායය ඇසුරු කොට ඒ නිමිති කොට ඇති ද්විත්වාදිය වේ මැයි.) අතිශයෙන යජතීති එවංශීලඃ, අතිශයින් යාග කෙරෙයි යන මෙබඳු සවභාවය ඇත්තේ; යායජූකඃ, "යායජූක" නම්. යායජ්‍යතෙ ඉති වා,

**a. ජාගතේරූකො වාච්‍යඃ. ජාගර්තීත්‍යෙවංශිලඃ= ජාගරූකඃ.**

**b. ඉණ්නශ්ජිසෘගමිභ්‍යඃ ක්වරප් වාච්‍යඃ. ඉණ් ගතෞ, "හ්‍රස්වස්‍ය පිති-" එතීත්‍යෙවංශිලඃ= ඉත්වරඃ. ණශ් අදර්ශනෙ, නශ්‍යතීත්‍යෙවංශිලඃ= නශ්වරඃ. ජයතීත්‍යෙවංශිලඃ= ජිත්වරඃ. සරතීත්‍යෙවංශිල= සෘත්වරඃ.**

**c. ගත්වරශ්ච නිපාත්‍යතෙ ශිලෙ'ර්ථෙ. ගච්ඡතීත්‍යෙවංශිලඃ= ගත්වරඃ.**

---

"යායජ්‍යතෙ ඉත්‍යෙවංශීලඃ" කියා යඞන්තයෙන් හෝ වාක්‍යය වේ. ("ආතඃ" යි ද්විත්වයෙහි පූර්ව අකාරයට ආකාරය විය.) "ඤමජපාං-නුක්" යන සූත්‍රයෙන් පූර්වරූපය සම්බන්ධ ව නුමාගම වේ. ජඤ්ජප්‍යතෙ, අතිශයින් කියයි (=ජප කෙරෙයි);— "ජඤ්ජපූක" නම්. දන්දශූකඃ, "අතිශයෙන දශති, දන්දශ්‍යතෙ වෙත්‍යෙවංශීලඃ" (=අතිශයින් ඩසියි;—) යන වාක්‍යයෙහි "දන්දශූක" නම්. (මේ උදාහරණ දෙක්හි නුමාගමයේ නකාරයට "නශ්චාපදාන්ත ඣලෙ" යි අනුස්වාර ව "යමා යපෙ'ස්‍ය" යි වර්ගාන්තාදේශ වේ. "දන්දශූක" යන මෙහි 'දන්ශ්' ධාතුහුගේ නකාරයට "නො ලොපඃ" යි ලොප් වේ. ධාතුනිර්දේශයෙහි වූ "දංශ්" යන්නෙහි අනුස්වාරය ලාක්ෂණිකය.) වාවද්‍යතෙ, අතිශයින් කථා කෙරෙයි;— "වාවදූක" නම්.

a. ජාගතේඃ, ජාගෘ ධාතුහු කෙරෙන්; ඌකඃ වාච්‍යඃ, ඌක ප්‍රත්‍යය කිය යුතු යි. ජාගර්ති ඉති එවංශීලඃ= ජාගරූකඃ, නිදි මරයි යන මෙබඳු ස්වභාවය ඇත්තේ "ජාගරූක" නම්. (ඍකාරයට ගුණ විය.)

b. ඉණ්— ගමිභ්‍යඃ, ඉණ්- නශ්- ජි- සෘ- ගම් යන ධාතූන් කෙරෙන්; ක්වරප් වාච්‍යඃ, (ශීලාර්ථයෙහි) ක්වරප් ප්‍රත්‍යය කිය යුතු යි. (කයන්ත ගුණප්‍රතිෂේධය පිණිස ද, පයන්ත තුගාගමය පිණිස ද වේ. සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි මේ ප්‍රත්‍යය "ක්වරට්ප්" යි ටකාරානුබන්ධ ද කරණ ලදී. එයින් ස්ත්‍රීලිඞ්ගයෙහි ඊප් ප්‍රත්‍යය වන බව අඟවයි.) "හ්‍රස්වස්‍ය පිති කෘති තුක්" යි තුගාගම වේ. එති, එයි;— "ඉත්වර" නම්. නශ්‍යති, නසී;— "නශ්වර" නම්. ජයති, දිනයි;— "ජිත්වර" නම්. සරති, හැසිරෙයි;— "සෘත්වර" නම්. (ස්ත්‍රීලිඞ්ගයෙහි "ඉත්වරී-නශ්වරී" යනාදි වශයෙනි.)

c. ගත්වරඃ, ගත්වර ශබ්දය; ශීලෙ අර්ථෙ, ශීලාර්ථයෙහි; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ. ගච්ඡතීත්‍යෙවංශීලඃ= ගත්වරඃ

a. භියඃ ක්‍රුක්‍රුකෞ වක්තව්‍යෞ. බිභෙතීත්‍යෙවංශීලඃ= භීරුඃ- භීරුකඃ.

b. ඉෂෙරුශ්ඡශ්ච.

c. ඉෂෙරුඃ ප්‍රත්‍යයො භවති ඡාන්තාදෙශශ්ච. ඉච්ඡතීති= ඉච්ඡුඃ.

d. වරඃ.

e. ස්ථා ඊශ් භාස් පිස් කසාදිභ්‍යො වරඃ ප්‍රත්‍යයො භවති ශීලෙ'ර්ථෙ. තිෂ්ඨතීත්‍යෙවංශීලඃ= ස්ථාවරඃ. ඊශ් ඓශ්චර්‍ය්‍යෙ, ඊෂ්ටෙ ඉත්‍යෙවංශීලඃ= ඊශ්වරඃ. භාසෘ දීප්තෞ, භාසතෙ ඉත්‍යෙවංශීලඃ=භාස්වරඃ. පිසෘ ගතෞ, පෙසති * ත්‍යෙවංශීලඃ= පෙස්වරඃ. කස් ගතෞ, කසතීත්‍යෙවංශීලඃ= කස්වරඃ.

---

ගමන් කෙරෙයි යන මෙබඳු ස්වභාවය ඇත්තේ "ගත්වර" නම්. (පෙර කී සේ ක්වරප් ප්‍රත්‍යය කොට "ගම්" ධාතුහුගේ අන්තලොපය නිපාතනයෙන් කළ කල්හි තුගාගම වේ.)

a. භියඃ, භී ධාතුහු කෙරෙන්; ක්‍රුක්‍රුකෞ වක්තව්‍යෞ, ක්‍රු- ක්‍රුක යන ප්‍රත්‍යය දෙක කිය යුතු යි. බිභෙති ඉති, බිය වෙයි යන; එවංශීලඃ, මෙබඳු ස්වභාවය ඇත්තේ; භීරුඃ- භීරුකඃ, ක්‍රු ප්‍රත්‍යය වීමෙන් "භීරු" නම් ද, ක්‍රුක ප්‍රත්‍යය වීමෙන් "භීරුක" නම් ද වේ. (කිත් බැවින් ගුණ නො වේ. "භියඃ ක්‍රුක්‍රුකක්ලුකාඃ" යනු සිද්ධාන්ත චන්ද්‍රිකා සූත්‍රය යි. එයින් "ක්ලුක" ප්‍රත්‍යයක් ද විහිත ය. "භීලුක" යනු ඒ ප්‍රත්‍යයෙන් සිද්ධ ය.)

b. ඉෂෙඃ, ඉෂ් ධාතුහු කෙරෙන්; උඃ, (ශීලාර්ථයෙහි) උ ප්‍රත්‍යය වේ. ඡඃ ච, අන්තයට ඡකාරාදෙශ ද වේ.

c. ඉෂෙඃ, ඉෂ් ධාතුහු කෙරෙන්; උඃ ප්‍රත්‍යයඃ භවති, උ ප්‍රත්‍යය වේ. ඡාන්තාදෙශඃ ච, ධාත්වන්තයට ඡකාරාදෙශ ද වේ. ඉච්ඡතීති= ඉච්ඡුඃ, කැමති වේ නු යි "ඉච්ඡු" නම්. (ඡකාරාදෙශ වූ පසු "ඡඃ" යි ද්විත්ව ව "ඛසෙ චපාඃ" යනාදීන් පූර්ව ඡකාරයට චකාර වේ.)

d. වරඃ, ස්ථා ආදි ධාතූන් කෙරෙන් ශීලාර්ථයෙහි වර ප්‍රත්‍යය වේ.

e. ස්ථා— කසාදිභ්‍යඃ, ස්ථා- ඊශ්- භාස්- පිස්-කස් ආදි ධාතූන් කෙරෙන්; ශීලෙ අර්ථෙ, ශීලාර්ථයෙහි; වරඃ ප්‍රත්‍යයඃ භවති, වර

---

* පිසති- පොත්හි.

## 63. ආදෘතඃ කිර්ද්විශ්ච භූතෙ.

(ආදෘතඃ 5- 1. කිඃ 1- 1. ද්විඃ- නිඃ ච- නිඃ භූතෙ 7- 1.)

a. ආකාරාන්තාදෘකාරාන්තාද්ධාතොර්ජනිනමිගමිභ්‍යශ්ච ශීලෙ'ර්ථෙ භූතකාලෙ කිඃ ප්‍රත්‍යයො භවති. ණබාදිවද්ධාතොශ්ච ද්විර්වචනං භවති. "ආතො'නපි."

11. රාමඃ සොමං පපිඃ ශෞණ්ඩෙ- දදිඃ ගාශ්චක්‍රිරද්භුතම්,
යාජකාන් වව්‍රිරාජහ්‍රිඃ- පෞණ්ඩරීකෙ මහාද්විජාන්.

---

ප්‍රත්‍යය වේ. තිෂ්ඨති, සිටියි;— "ස්ථාවර" නමි. ඊෂ්ටෙ, අධිපති වෙයි;—"ඊශ්වර" නමි. භාසතෙ, බබලයි;—"භාස්වර" නමි. පෙසති, ගමන් කෙරෙයි;— "පෙස්වර" නමි. කසති, යෙයි;— කස්වර" නමි.

63. කි ප්‍රත්‍යය හා ද්විත්ව විධි සූත්‍ර යි. ධාතොඃ- ශීලෙ යනු අනුවෘත්ත යි. ආදෘතඃ ධාතොඃ, ආකාරාන්ත- ඍකාරාන්ත ධාතූහු කෙරෙන්, ශීලෙ, ශීලාර්ථයෙහි; භූතෙ; අතීත කාලයෙහි; කිඃ, කි ප්‍රත්‍යය වේ. ද්විඃ ච ධාතුව ද්විරුක්ත ද වේ.

a. ආකාරාන්තාත්, ආකාරාන්ත වූ ද; ඍකාරාන්තාත්, ඍකාරාන්ත වූ ද; ධාතොඃ, ධාතූහු කෙරෙන් ද; ජනිනමිගමිභ්‍යඃ ච, ජන්- නම්- ගම් යන ධාතූන් කෙරෙන් ද; ශීලෙ අර්ථෙ, ශීලාර්ථයෙහි; භූතකාලෙ, අතීත කාලයෙහි; කිඃ ප්‍රත්‍යයඃ භවති, කිප්‍රත්‍යය වේ. ණබාදිවත්, ණබාදිය පර කල්හි මෙන්; ධාතොඃ, ධාතූහුගේ; ද්විර්වචනං ච භවති, ද්විරුක්තිය ද වේ. (සෙසු ශීලාර්ථ ප්‍රත්‍යයන් කාලත්‍රයෙහි ම වන නමුත් මේ කි ප්‍රත්‍යය අතීතාර්ථයෙහි පමණක් වේ. එසේ ම ලිට් ලකාරයෙහි මෙන් ධාතුහට ද්විත්ව ද, "ලොපඃ පචාං කිත්‍යෙ චාස්‍ය" යි පචාදියට එත්ව- පූර්වලොප ද වෙත්. ප්‍රත්‍යය කිත් බැවින් ගුණ නො වේ.) "ආතො'නපි" යන සූත්‍රයෙන් ධාතූහුගේ ආකාරයට ලොප් වේ.

11. රාමඃ, රාමතෙමේ; පෞණ්ඩරීකෙ යඥෙ, "පෞණ්ඩරීක" නම් යාගයෙහි; සොමම්, සොම රසය; පපිඃ, පානය කොළේ ය. ගාඃ, දෙනුන්; දදිඃ, දුන්නේ ය. අද්භුතම්, ආශ්චර්‍ය්‍ය දෙය; චක්‍රිඃ, කොළේ ය. යාජකාන්; යාග කරුවන්; වව්‍රිඃ, වරණය කොළේ ය. මහාද්විජාන්, මහ බමුණන්; ආජහ්‍රිඃ, කැඳවා ගෙණ ආයේ ය.

**12. තදා ජඤ්ඤිර්මහාශවයඃ-නෙමින්‍ඃපගණෝ'පි තම්,**
**බ්‍රාහමණානාං ශ්‍රැතිවිදං-ගණො ජග්මිර්ධනං මුදා.**

## ඉති කෘදන්ත ප්‍රක්‍රියායං ශීලාර්‍ථ ප්‍රක්‍රියා.

---

12. තදා, එකල්හි; මහාශවයඃම්, මහ පුදුමයක්; ජඤ්ඤිඃ, වූයේ ය. නෘපගණඃ අපි, රජ සමූහයා ද; තම්, ඔහු; නෙමිඃ, වැන්දේ ය. ශ්‍රැතිවිදම්, වෙදය දන්නා වූ; බ්‍රාහමණානාම් ගණඃ, බ්‍රාහමණ සමූහයා; මුදා, සතුටින්; ධනම්, ධනයට; ජග්මිඃ, පැමිණියේ ය හෙවත් ධනය ලැබී ය.

(මේ ශ්ලොක දෙක්හි "පපිඃ- දදිඃ" යනු "පා- දා" යන ආකාරාන්ත ධාතූන් කෙරෙන් ද, "චක්‍රිඃ- වව්‍රිඃ- ආජග්‍රිඃ" යනු "කෘ- වෘ- 'ආ' පූර්ව හෘ" යන ඍකාරාන්ත ධාතූන් කෙරෙන් ද, 'ජඤ්ඤිඃ- නෙමිඃ- ජග්මිඃ" යනු "ජන්- නම්- ගම්" ධාතූන් කෙරෙන් ද කි ප්‍රත්‍යය වීමෙන් සිද්ධ "පපි- දදි" ආදි නාමයන්ගේ ප්‍රථමෛක වචන යි. "පපෞ ඉත්‍යෙවංශීලඃ= පපිඃ, චකාර ඉත්‍යෙවංශීලඃ= චක්‍රිඃ, ජඥෙ ඉත්‍යෙවංශීලඃ= ජඤ්ඤිඃ" යනාදි වශයෙන් විග්‍රහය දත යුතු යි. "පපි" යනාදියෙහි පූර්ව ආකාරයට "හ්‍රස්වඃ" යි හ්‍රස්ව වේ. "චක්‍රි" යනාදියෙහි පූර්ව ඍකාරයට "රඃ" යි අකාරය වේ. ජඤ්ඤි- ජග්මි යන දෙක්හි "ගමාං ස්වරෙ" යි උපධාලොපය වේ. 'නෙමි' යන්නට එත්ව- පූර්වලොප වේ.

මෙසේ ම "සාසහ්‍ය- වාවහ්‍ය- චාචල්‍ය- පාපත්‍ය" යන යඩන්ත ධාතූන් කෙරෙන් ද කි ප්‍රත්‍යය වීමෙන් "සාසහි- වාවහි- චාචලි- පාපති" යි සිද්ධ යි. "සාසහ්‍යාඤ්චක්‍රෙ ඉත්‍යෙවංශීලඃ= සාසහිඃ" යනාදි වශයෙන් එහි විග්‍රහය දත යුතු. කි ප්‍රත්‍යය වූ පසු "අතපි ච හසාත්" යි යඩ් ප්‍රත්‍යය ලොප් වේ.

"ශඞ්ඛ තෛලෙ තථා මාංසෙ- වෛද්‍යෙ ජ්‍යෞතිෂිකෙ ද්විජේ,
යාත්‍රායාං පථි නිද්‍රායාං- මහච්ඡබ්දො න දීයතෙ."

යනුවෙන් දක්වෙන ප්‍රතිෂෙධයට විරුද්ධ වන හෙයින් පූර්වොක්ත ප්‍රථම ශ්ලොකයෙහි "මහාද්විජාන්" යන්නෙන් "මහා බ්‍රාහමණයන්" යන අර්ථය නො ව "මහත් වූ බ්‍රාහමණ- ක්‍ෂත්‍රිය- වෛශ්‍යයන්" යන අර්ථය ගත යුතු ය යනු බාලසරලා මත යි. ශඞ්ඛ- තෛල- මාංස- වෛද්‍ය- දෛවඥ- ද්විජ- යාත්‍රා- පථ- නිද්‍රා යන ශබ්දයන් හා "මහත්" ශබ්දය යෙදීමෙන් මහත් ය යන අර්ථය නො ව විරුද්ධාර්ථයක් වාච්‍ය වේ. ඒ එසේ මැයි:- 'මහාශඞ්ඛ' ශබ්දයෙන් මහත්

**a. අථෝණාදයො නිරූප්‍යන්තෙ:-**

**63 සදෛණාදයඃ** (සදා- නි: උණාදයඃ 1-3.)

**b. සර්වස්මින් කාලෙ උණාදයඃ ප්‍රත්‍යයා භවන්ති.**

**c. කෘ වා පා ජි මි ස්වදි සාධි අශූඞ් එභ්‍ය උණ් ප්‍රත්‍යයො භවති. ණකාරො වෘද්ධ්‍යර්ථඃ. කරොතීති= කාරුඃ- කාරුකඃ. වා ගතිගන්ධනයොඃ, "ආතො යුක්" වාතීති= වායුඃ. පා පානෙ,**

---

හක්ගෙඩිය යන අර්ථය නො ව මිනී හිස් කබල යන අර්ථය ගෙණ දෙයි. එසේ ම 'මහාතෛල' ශබ්දයෙන් වසාතෙල ද, 'මහාමාංස' ශබ්දයෙන් මිනීමස් ද, 'මහාවෛද්‍ය- මහාදෛවඥ' ශබ්ද දෙකින් යමයා ද, 'මහාද්විජ' ශබ්දයෙන් වසලයා ද, 'මහායාත්‍රා- මහාපථ- මහානිද්‍රා' ශබ්දවලින් මරණය ද වාච්‍ය වේ. එහෙයින් මේ ශබ්දයන් හා මොවුන්ට පර්‍යායය ශබ්දයන් සමග "මහත්" ශබ්දය නො යෙදිය යුතු යි.)

කෘදන්තප්‍රක්‍රියායාම්, කෘදන්ත ප්‍රකරණයෙහි; ශීලාර්ථප්‍රක්‍රියා, ශීලාර්ථ ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි.

## ශීලාර්ථප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාව නිමි.

---

a. අථ, ඉක්බිති; උණාදයඃ, උණාදීහු; නිරූප්‍යන්තෙ, දක්වනු ලැබෙත්. (උණාදීන්ගේ ශාස්ත්‍රක්‍රමය ප්‍රක්‍රියාන්තයෙහි විස්තර වන්නේ ය.)

63. ප්‍රත්‍යය විධි සූත්‍ර යි. ධාතොඃ යනු අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; සදා, සියලු කල්හි; උණාදයඃ, උණ් ආදි ප්‍රත්‍යයෝ වෙත්.

b. සර්වස්මින් කාලෙ, සියලු කාලයෙහි; උණාදයඃ ප්‍රත්‍යයාඃ භවන්ති, උණ් ආදි ප්‍රත්‍යයෝ වෙත්. (මෙයින් 'උණ්- තුන්- මුක්- මණින්' ආදි ප්‍රත්‍යයෝ විහිතයහ. ඔව්හු ධාතූන් කෙරෙන් කාල විශෙෂයක් හෝ කාරක විශෙෂයක් නො සලකා සියලු කාලයෙහිත් සියලු කාරක විෂයෙහිත් වෙති. සියලු ම උණාදි ප්‍රත්‍යයෝ එසේ ය. ඉක්බිති ඔවුන්ට ස්ථාන හා උදාහරණ වෙන වෙන ම දක්වත්.)

c. කෘ වා— එභ්‍යඃ, කෘ- වා- පා- ජි- මි- ස්වද්- සාධ්- අශ් යන මේ ධාතූන් කෙරෙන්; උණ් ප්‍රත්‍යයඃ භවති, උණ් ප්‍රත්‍යය වේ. ණකාරඃ, ණකාරය; වෘද්ධි අර්ථඃ, වෘද්ධිය ප්‍රයෝජන කොට ඇත්තේ ය. කරොතීති, කෙරේ නු යි; කාරුඃ, "කාරු" නම්. (ශිල්පියා හෝ

පිබන්ත්‍යනෙන තෛලාදිකමිති= පායුඃ. පා රක්ෂණෙ,*පාතීති= පායුඃ. ජයති අනෙනෙති= ජායුඃ. ඩුමිඤ් ප්‍රක්ෂෙපණෙ, මි ක්ෂෞපිල්‍යෙ, මිනොතීති= මායුඃ. ස්වදි ආස්වාදනෙ, ස්වද්‍යතෙ ඉති= ස්වාදුඃ. සාධ්නොතීති=† සාධුඃ. අශ්නුතෙ‡ ඉති= ආශුඃ.

---

කරන්නා යි. ශිල්පාර්ථයෙහි කාරු ශබ්දය "යොගරූඪ" ය. අනික් අර්ථයෙහි කාරු ශබ්දය "යොගමාත්‍ර" ය හෙවත් ධාත්වර්ථයෙහි යෙදීම් මාත්‍රයෙකි. එසේ යොගමාත්‍ර වාචක කල්හි ඒ හා ධාත්වර්ථයට සුදුසු කාරකයන්ගේ යෙදීම වෙයි. ඒ එසේ මැයි. භට්ටිකාව්‍යයෙහි:-

"රඝවස්‍ය තතඃ කාර්‍ය්‍යං- කාරුර්වානරපුඞ්ගවඃ,
සර්වවානරසෙනානාං- මාශ්වාගමනමාදිශත්." §

යන පද්‍යයෙහි කාරු ශබ්දය හා "කාර්‍ය්‍යම්" යන කර්මකාරකය යෙදුනේ ය. රූඪි ශබ්ද දෙකොටසෙකි. (1) සමහර රූඪි ශබ්ද කෙනෙක් ස්වකීය අවයවාර්ථයෙන් තොර ව යම් යම් වස්තූන් විෂයෙහි ප්‍රසිද්ධ වෙත්. එනම්:- "තෛලපා" ආදි ශබ්දයෝ ය. "තෛලං පිබති" යන වාක්‍යයෙහි "තෛලපා" යි සිද්ධ ය. තෛල ශබ්දයාගේ "තෙල්" යන අර්ථය ද, පා ශබ්දයාගේ "බීම" යන අර්ථය ද මෙහි අවයවාර්ථ යි. මේ අවයවාර්ථ අනු ව "තෛලපා" ශබ්දයෙන් තෙල් බොන්නා ය යන අර්ථය ලැබේ. එහෙත් මෙය තෙල් බොන් නෙකු කෙරෙහි නො ව තෙල් නො බොන සතෙකු කෙරෙහි ශිෂ්ටලොක ව්‍යවහාරයෙහි ප්‍රසිද්ධ ය. 'තෛලපා' නම් කැර පොත්තා යි.

(2) තවත් සමහර රූඪි ශබ්දයෙක් ස්වකීය අවයවාර්ථ අනුගත ව එක් වස්තුයෙක්හි ම ප්‍රසිද්ධ වෙයි. එනම් "මයූර" ආදි ශබ්දයෝ යි. "මහ්‍යාං රෞති" යන වාක්‍යයෙහි නිපන් 'මයූර' ශබ්දයෙන් මහී- රු යන ස්වකීය අවයවයන්ගේ අර්ථ අනු ව පොළොවෙහි හඬන්නා ය යන අර්ථය ලැබේ. එකල්හි පොළොවෙහි සිට හඬන සියල්ලන්ට ම "මයූර" ය යි කිය හැකි වුව ද, පොළොවෙහි සිටා හඬන එක ම සතෙකු කෙරෙහි පමණක් "මයූර" ශබ්දය ශිෂ්ටා ලොකයා විසින් ව්‍යවහාර කරණු ලැබේ. මෙසේ රූඪි ශබ්දයෝ ද්විප්‍රකාර වෙත්. ස්වකීය අවයවාර්ථයන්ගෙන් නො තොර ව පවත්නා කාරක- පාචක ආදීහු අන්වර්ථ ශබ්දයෝ යි.)

---

* පොත්හි අබු යි. † සාධ්‍යතීති- පොත්හි. ‡ අශ්නොතීති- පොත්හි.

§ ඉක්බිති රඝු පුත්‍ර (රාම) යාගේ කාර්‍ය්‍ය කරන්නා වූ වානරාධිපති (සුග්‍රීව) තෙමේ සියලු වානර සේනාවන්ගේ ශීඝ්‍රාගමනය විධාන කෙළේ ය.

**a. සි තනි ගමි මසි සචි අවි හි ධා ක්‍රුශි ඒභ්‍යස්තුන් ප්‍රත්‍යයො භවති. ෂිඤ් බන්ධනෙ, සිනොතීති= සෙතුඃ. තනොතීති= තන්තුඃ. ගච්ඡතීති= ගන්තුඃ. මසී පරිණාමෙ රක්ෂණෙ ච, මස්‍යතීති= මස්තුඃ. ෂච සම්බන්ධෙ, සචතීති= සක්තුඃ. අව රක්ෂණෙ, අවතෙර්වකාරස්‍ය උකාරඃ. අවතීති= ඔතුඃ. හි ගතෞ වෘද්ධෞ ච, හිනොතීති= හෙතුඃ. දධාතීති= ධාතුඃ. ක්‍රුශ ආහ්**

---

කාරුකඃ, "ෂාකොකාණඃ" යි උකණ් ප්‍රත්‍යය වීමෙන් "කාරුක" නම් ද වේ. වා ගතිගන්ධනයොඃ:- වාතීති= වායුඃ, හමා නු යි සුළඟ තෙමේ "වායු" නම්. පා පානෙ:- අනෙන, මේ කරණ කොට ගෙණ; තෛලාදිකම්, තෙල් ආදිය; (=ඖෂධ;) පිබතීති, බෝ නු යි; පායුඃ, අපානවාතස්ථානය (=ගුදය) තෙමේ "පායු" නම්. පා රක්ෂණේ:- පාතීති= පායුඃ, රකී නු යි රකින්නා ද "පායු" නම්. අනෙන, මේ කරණ කොට ගෙණ; ජයති ඉති, (රෝගයන්) දිනා නු යි; ජායුඃ, ඖෂධය "ජායු" නම්. ඩුමිඤ් ප්‍රක්ෂෙපණෙ, මි කෞටිල්‍යෙ:- මිනොතීති= මායුඃ, (ශරීරයෙහි උණුසුම) බහා නු යි හෝ වක් ව යේ නු යි වාතය "මායු" නම්. ස්වදි ආස්වාදනෙ, "ස්වද්" ධාතුව රස විඳ ගැන්මෙහි වේ. ස්වද්‍යතෙ ඉති= ස්වාදුඃ, රස විඳ ගණු ලැබේ නු යි මධුර රසය තෙමේ "ස්වාදු" නම්. සාධ්නොතීති= සාධුඃ, (පර කාය්‍ය්‍ය) සිදු කෙරේ නු යි යහපත් වූයේ "සාධු" නම්. අශ්නුතෙ ඉති= ආශුඃ, පැතිරේ නු යි වී හෝ ශීඝ්‍ර වූයේ "ආශු" නම්.

a. සි තනි— ඒභ්‍යඃ, සි- තන්- ගම්- මස්- සච්- අව්- හි- ධා- ක්‍රුශ් යන මොවුන් කෙරෙන්; තුන් ප්‍රත්‍යයඃ භවති, තුන් ප්‍රත්‍යය වේ. (නකාරය ප්‍රත්‍යයභෙද ඥාපනය පිණිස යි.) ෂිඤ් බන්ධනෙ:- සිනොති * ඉති= සෙතුඃ, බඳී නු යි මියර "සෙතු" නම්. තනොතීති= තන්තුඃ, පැතිරේ නු යි හූ තෙමේ "තන්තු" නම්. ගච්ඡතීති= ගන්තුඃ, යේ නු යි යන්නා "ගන්තු" නම්. (මකාරයට අනුස්වාර හා වර්ගාන්තාදෙශ යි.) මසී පරිණාමෙ රක්ෂණෙ ච, "මස්" ධාතුව පෙරලීමෙහි හා රැකීමෙහි ද වේ. මස්‍යතීති= මස්තුඃ, පෙරළේ නු යි හෝ රකී නු යි දධිමණ්ඩය (=දීපෙරලි දිය) "මස්තු" නම්. ෂච සම්බන්ධෙ, ෂොපදෙශ "ෂච්" ධාතුව මොනවට බැඳීමෙහි වේ. සචතීති= සක්තුඃ, මොනවට බැඳේ නු යි අත්සුණු "සක්තු" නම්. ("චොඃ කුඃ" යි කකාර විය.) අව රක්ෂණෙ:- අවතෙඃ වකාරස්‍ය උකාරඃ, "අව්" ධාතුහුගේ වකාරයට උකාරය වේ. (ඉන් පසු "උ ඔ" යි ඔකාරය වේ.) අවතීති= ඔතුඃ, (දඩයම් පිණිස) රකී නු යි බළලා "ඔතු" නම්. හි ගතෞ වෘද්ධෞ ච:- හිනොතීති= හෙතුඃ, යේ නු යි හෝ වැඩේ නු යි කාරණය

---

* ක්‍රීසාරකයෙහි නම් වඩා යෙදේ.

**චානෙ, ක්‍රුශ රෝදනෙ ච, ක්‍රුශ ආක්‍රොශෙ, "ජශෂරජාදෙඃ ෂඃ" "ෂ්ටුභිඃ ෂ්ටුඃ" ක්‍රොශතීති= ක්‍රොෂ්ටා. අව රක්‍ෂණෙ පාලනෙ ච, කිත්ත්වාත් සම්ප්‍රසාරණමුකාරඃ.**

**a. අවතෙර්මුක්.**

**b. අවතෙර්ධාතොර්මුක් ප්‍රත්‍යයො භවති. අවතීති= ඔම්, ඔමෞ, ඔමඃ.**

**c. අතිබෘහිභ්‍යාං මනිණ්. අත සාතත්‍යගමනෙ, සතතම් අතතීති= ආතමා, වා අතති අඛිලජන්මාන්තර්නිවාසිත්වෙන සුඛදුඃඛානිකර්මාණි පශ්‍යතීති= ආත්මා. බෘහි වෘද්ධෞ.**

---

"හෙතු" නම්. දධාතීති= ධාතුඃ, දරා නු යි "ධාතු" නම්. (ධාතු ශබ්ද යෙන් බොහෝ දේ ව්‍යවහෘත වේ. ඒ ශබ්දකොෂවලින් දත යුතු.*) ක්‍රුශ ආහ්වානෙ, ක්‍රුශ රොදනෙ, ක්‍රුශ ආක්‍රොශෙ ච:- "ජශෂරජා දෙඃ ෂඃ" යන්නෙන් ශකාරයට ෂකාර වේ. "ෂ්ටුභිඃ ෂ්ටුඃ" යන් නෙන් ප්‍රත්‍යය තකාරයට ටකාර වේ. ක්‍රොශතීති= ක්‍රොෂ්ටා, කැඳව යි, හඬයි හෝ ආක්‍රොශ කෙරේ නු යි සිවලා "ක්‍රොෂ්ටු" නම්. (තෘවත් භාවයෙන් ප්‍රථමෛක වචනයෙහි "ක්‍රොෂ්ටා" යි වේ. අව රක්‍ෂණෙ පාලනෙ ච:- කිත්ත්වාත් සම්ප්‍රසාරණම් උකාරඃ, (මතු දැක්වෙන මුක් ප්‍රත්‍යය) කිත් බැවින් වකාරයට සම්ප්‍රසාරණ උකා රය වේ.

a. අවතෙඃ, "අව්" ධාතුහු කෙරෙන්; මුක්, මුක් ප්‍රත්‍යය වේ.

b. අවතෙඃ ධාතොඃ, අව් ධාතුහු කෙරෙන්; මුක් ප්‍රත්‍යයඃ භවති, මුක් ප්‍රත්‍යය වේ. (උකාරය උච්චාරණය පිණිස යි.) අවතීති= ඔම්, රකී නු යි හෝ පාලනය කෙරේ නු යි බ්‍රහ්මයා "ඔම්" නම්. ඔම්, ඔමෞ, ඔමඃ යනු ප්‍රථමා විභක්ති යි.

c. අතිබෘහිභ්‍යාම්, අත් - බෘහ් ධාතු දෙකින් පර ව; මනිණ්, මනිණ් ප්‍රත්‍යය වේ. (ඉකාරය උච්චාරණයට ද, ණකාරය වෘද්ධියට ද වේ.) අත සාතත්‍යගමනෙ, "අත්" ධාතුව නිරන්තරයෙන් යෑමෙහි වේ. සතතම් අතතීති= ආතමා, නිරන්තරයෙන් ගමන්

---

* " -ධාතුර්නා ඉන්ද්‍රියෙෂු ච,
ශබ්දයොනිමීහාභූත- තද්ගුණෙෂු රසාදිෂු,
මනඃශිලාදෞ ශ්ලෙෂ්මාදෞ- විශෙෂාද් ගෛරිකෙ 'සති ච". මෙදිනීකොෂ.

"ශ්ලෙෂ්මාදිරසලොහාදි- මහාභූතානි තද්ගුණාඃ,
ඉන්ද්‍රියාණ්‍යශ්මවිකෘතිඃ- ශබ්දයොනිශ්ච ධාතවඃ." අමරකොෂ.

**a. මන්‍යුපධායා සඃ රඃ.**

**b. මනිණ්ප්‍රත්‍යයෙ පරෙ උපධායා සඃකාරස්‍ය රෙඵො භවති. බෘංහතිති= බ්‍රහ්මා.**

**c. සෘධෘපද්‍ෙ මඃ. සෘ ක්‍ෂරණෙ දීප්‍යනෙ ච, සරතීති වා ස්‍රියතෙ ඉති= ඝර්මඃ. ධෘ ධාරණෙ, ධරතීති වා ධ්‍රියතෙ'සෞ=ධර්මඃ. පද ගතෞ, පද්‍යතෙ තත්= පද්මම්.**

**d. සෘ සතු සු හෘ හු මෘ ක්‍ෂි ක්‍ෂු භා මා යා වා ජක්‍ෂ රෙ නී ශෞ්‍යඞ් එතෙභ්‍යා මඃ ප්‍රත්‍යයො භවති. සෘ ගතෞ, සෘච්ජතීති=**

---

කෙරේ නු යි ඉතමේ "ආත්මන්" නම්. වා, නොහොත්; 'අතති' සියේ යි; අඛිලජන අන්තර් නිවාසිත්වෙන, සියලු ජනයන්ගේ ඇතුළත වසන බැවින්; සුකෘත දුෂ්කෘත කර්මාණි, කුශලාකුශල කර්මයන්; පශ්‍යතීති, දකී නු යි; ආත්මා, පරමාත්මය* "ආත්මන්" නම්. බෘහි වෘද්ධෞ, "බෘහ්" ධාතුව වැඩීමෙහි වේ.

a. මනි, 'මන්' යන්න පර කල්හි; උපධායාඃ සෘ, උපධා සංඥ සෘකාරයට; රඃ, රකාරය වේ. ("මන්" යනු මනිණ් ප්‍රත්‍යයේ ඉත් වර්ණයන් හැර සිටි කොටස යි.)

b. මනිණ්ප්‍රත්‍යයෙ පරෙ, මනිණ් ප්‍රත්‍යය පර කල්හි; උපධායාඃ සෘකාරස්‍ය, උපධා සෘකාරයට, රෙඵඃ භවති, රකාරය වේ. බෘංහතීති= බ්‍රහ්මා, වැඩේ නු යි හෝ වඩා නු යි බ්‍රහ්මතෙමේ "බ්‍රහ්මන්" නම්.

c. සෘධෘපදඃ, සෘ- ධෘ- පද් ධාතූන් කෙරෙන්; මඃ, ම ප්‍රත්‍යය වේ. සෘ ක්‍ෂරණෙ දීප්‍යනෙ ච "සෘ" ධාතුව වැගිරීමෙහි ද බැබලීමෙහි ද වේ. සරතීති, වගුරුවා නු යි හෝ බබලා නු යි; වා, නොහොත්; ස්‍රියතෙ ඉති, වැගිරේ නු යි; ඝර්මඃ, ග්‍රීෂ්මය, අව්ව හෝ ඛහදිය, "ඝර්ම" නම්. ධෘ ධාරණෙ:- ධරතීති වා, දරා නු යි හෝ; ධ්‍රියතෙ ඉති, දරණු ලැබේ නු යි; අසෞ, මේ පුණ්‍යාදිය; ධර්මඃ, "ධර්ම"†නම්. පද ගතෞ:- පද්‍යතෙ තත්= පද්මම්, (උඩට) යේ නු යි එය "පද්ම" නම්. (පියුම් ආදිය‡ යි.)

d. සෘ සතු— එභ්‍යඃ, සෘ- සතු- සු- හෘ-හු- මෘ-ක්‍ෂි-ක්‍ෂු-භා-මා- යා- වා- ජක්‍ෂ්- රෙ- නී- ශෞ්‍ය යන මොවුන් කෙරෙන්; මඃ

---

* මේ මිථ්‍යාමත වශයෙනි.

† "ධර්මෝ'ස්ත්‍රී පුණ්‍ය ආචාරෙ- ස්වභාවයමයොරුනෙ,
අහිංසොපනිෂත්න්‍යායෙ- නා ධනුර්මසොමපෙ." මෙදිනී:

‡ "පද්මො'ස්ත්‍රී පද්මකෙව්‍යූහ-නිධිසඞ්ඛ්‍යාන්තරෙ 'ම්බුජෙ." මෙදිනී:

**-අමීඃ, නෙත්‍රරෝගඃ. සෙනෞතීති= සෙනාමඃ. ෂූඞ් ප්‍රසවෙ, සූතෙ ‘සෞ= සොමඃ. හමීඃ. ජුහොතීති= හොමඃ. ම්‍රියත ඉති= මමීඃ. ක්ෂි නිවාසගත්‍යොඃ, ක්ෂයතීති= ක්ෂෙමම්. ටුක්ෂු ශබ්දෙ, ක්ෂෞතීති= ක්ෂෞමඃ. භාතීති= භාමඃ. මාමඃ. යාතීති= යාමඃ. වාතීති= වාමඃ. ජක්ෂ භක්ෂහසනයොඃ, ජක්ෂ්මඃ. රාගතීති= රාමඃ. නෙමඃ. ශ්‍යෛඞ් දීප්තෞ, ශ්‍යායත ඉති= ශ්‍යාමඃ.**

---

ප්‍රත්‍යයඃ භවති, ම ප්‍රත්‍යය වේ. ඍ ගතෞ:- ඍච්ඡතීති= අමීඃ, යේ නු යි “අමී” නම්. නෙත්‍රරෝගඃ, ඇස් ලෙඩකි. (ඉතා පැරණි නගර ග්‍රාමාදිය හා යායුතු දෙසද මෙයින් ව්‍යවහෘත ය. විග්‍රහය යෙදෙන සේ යොදා ගත යුතු යි.) සෙනෞතීති= සෙනාමඃ, සතුති කෙරේ නු යි සමූහය “සෙනාම” නම්. ෂූඞ් ප්‍රසවෙ:- සූතෙ අසෞ= සොමඃ, ප්‍රසව කෙරේ නු යි මෙතෙමේ “සොම” නම්. (චන්‍ද්‍රාදීහු* යි.) හමීඃ, (හර තීති= හරී නු යි;) “හමී” නම්. (හමී ශබ්දයක් කොෂයන්හි නො පෙණේ. හෘ ධාතුවෙන් පර මනින් ප්‍රත්‍යයෙන් නිපන් නපුංසක ලිඞ්ගික “හමින්” ශබ්දයක් නම් තිබේ. එහි ප්‍රථමෛක වචනය “හමී” යනු යි. “හරති ග්ලානිමිති= හමී” යනු එහි වාක්‍යය යි. ජෘම්භණය හෙවත් මැලි හැරීම “හමින්,, නම්. විමසිය යුතු යි.) ජුහොතීති= හොමඃ, යාග ද්‍රව්‍ය බහා නු යි දෙවියන් උදෙසා යාග ද්‍රව්‍ය ගින්නට දැමීම “හොම” නම්. ම්‍රියතෙ ඉති= මමීඃ, මැරේ නු යි මරු තැන් “මමී” නම්. (විමසිය යුතු යි. ‘මමීන්’ ශබ්දයක් නම් පැණේ. එහි ලා විග්‍රහය කාරණ කාරකයෙන් ගත යුතු යි. මේ කොට සෙහි වාක්‍ය බෙහෙවින් අර්ථයට සුදුසු නො වේ. එහෙත් පොතේ පැණෙන සේ ගෙණ අර්ථ ලියමු.)

ක්ෂි නිවාසගත්‍යොඃ, “ක්ෂි” ධාතුව විසීම ය- ගමන ය යන අර්ථ දෙක්හි වේ. ක්ෂයතීති= ක්ෂෙමම්, වෙසේ නු යි හෝ යේ නු යි මිදීම “ක්ෂෙම” නම්. ටුක්ෂු ශබ්දෙ:- ක්ෂෞතීති= ක්ෂෞමඃ, ශබ්ද කෙරේ නු යි අටල්ල හෝ හණ ගස “ක්ෂෞම” නම්. භාතීති= භාමඃ, බබලා නු යි ක්‍රොධය හෝ දීප්තිය “භාම” නම්. මාමඃ, (මාතීති= ප්‍රමාණ කෙරේ නු යි;) “මාම” නම්. මෙද කොෂ යන්හි නො පෙණේ. එහෙත් “මාමක= පුං: මාම + ස්වාර්ථෙ කන්, මාතුලඃ” යි මාම ශබ්දයෙන් පර ව ස්වාර්ථයෙහි කන් ප්‍රත්‍යය වීමෙන් නිපන් “මාමක” ශබ්දය මාතුලාර්ථ ය යි මෙදිනී කොෂයෙහි කී හෙයින් මාම ශබ්දය ද එම අර්ථ විය යුතු යි, එසේ නම් සිංහලට තත්සම ය. මේ අර්ථයෙහි “මාම” ශබ්දය පඤ්චතන්ත්‍රයෙහි

---

* “ – සොමසතුෂිතාදිබිතෙෂු,
“වානරෙ ච කුබෙරෙ ච-පිතෘදෙවෙ සමීරණෙ,
වසුප්‍රභෙදෙ කර්පූර-නීරෙ සොමලතෞෂධෞ.” මෙදිනී:

**a. භීධ්වොර්මක්. බිභෙත්‍යස්මාදිති= භීමඃ. ධූයතෙ'සෞ= ධූමඃ.**

**b. ධ්වාදෙරුලික්.**

**c. ධ්වාදෙර්ධාතොරුලික් ප්‍රත්‍යයො භවති. ධූනොති වා ධූයතෙ'සෞ= ධූලිඃ. අගිලගිරගි ගත්‍යර්ථාඃ, ඉදිතඃ, අඞ්ගතෙ සා= අඞ්ගුලිඃ.**

---

පැණෙයි. යාතීති= යාමඃ, යේ නු යි සත්පෑ හමාරකින් පරිමිත කාලය "යාම" නම්. වාතීති= වාමඃ, යේ නු යි හෝ හමා නු යි ධනාදිය * "වාම" නම්. ජක්ෂ භක්ෂහසනයොඃ:- ජක්ෂ්මඃ, (ජක්ෂිතීති= කා නු යි;) ක්ෂය රොගය "ජක්ෂ්ම" නම්. රායතීති=රාමඃ, ශබ්ද කෙරේ නු යි දශරථ පුත්‍රතෙමේ "රාම" නම් ("සංඛ්‍යක්ෂරාණාමා" යි ආකාර වේ.) නෙමඃ, (නයතීති= පමුණුවා නු යි;) කාලාදිය † "නෙම" නම්. ශ්‍යෛඞ් දීප්‍යෞඃ:- ශ්‍යායතෙ ඉති= ශ්‍යාමඃ, බබලා නු යි හරිද්වර්ණාදිය ‡ "ශ්‍යාම" නම්.

a. භීධ්වොඃ, භී- ධූ ධාතු දෙක සම්බන්ධ ව; වා, විකල්පයෙන්; මක්, මක් ප්‍රත්‍යය වේ. අස්මාත්, මොහු කෙරෙන්; බිභෙති ඉති, බිය වේ නු යි; භීමඃ, රකුසා "භීම" ද නම්. ධූයතෙ, කම්පිත කරණු ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; ධූමඃ, "ධූම" නම්. (දුම යි.)

b. ධ්වාදෙඃ, ධූ ආදි ධාතුහු කෙරෙන්; උලික්, උලික් ප්‍රත්‍යය වේ.

c. ධ්වාදෙඃ ධාතොඃ, ධූ ආදි ධාතුහු කෙරෙන්; උලික් ප්‍රත්‍යයඃ භවති, උලික් ප්‍රත්‍යය වේ. (කයන්ත ගුණප්‍රතිෂෙධය පිණිස යි.) ධූනොති වා, කම්පිත කෙරෙයි හෝ; ධූයතෙ, කම්පිත කරණු ලැබේ නු යි; අසෞ, මේ රජස්තෙමේ; ධූලිඃ, "ධූලි" නම්. අගිලගිරගි ගත්‍යර්ථාඃ, අගි- ලගි- රගි- යන ධාතුහු ගමනාර්ථ ඇත්තෝ ය. ඉදිතඃ, ඉකාරය ඉත් කොට ඇත්තාහ. අඞ්ගතෙ, ගමන් කෙරේ නු යි; අසෞ, මෝතොමෝ; අඞ්ගුලිඃ, "අඞ්ගුලි" නමු. (ඇඟිලි යි.)

---

* "වාමං ධනෙ පුංසි හරෙ- කාමදෙවෙ පයොධරෙ,
වල්ගුප්‍රතීපසව්‍යෙෂු-ත්‍රිෂු නාර්‍ය්‍යාං ස්ත්‍රියාමථ,
වාමී ශෘගාලී වඩවා- සභිකාවලභීෂු ච." මෙදිනී:

† "නෙමඃ කාලෙ'වධෞ ගතෞ- ප්‍රාකාරෙ කෛතවෙ'පි ච." මෙදිනී:

‡ "ත්‍රිෂු ශ්‍යාමෞ හරිතකෘෂ්ණෞ- ශ්‍යාමා ස්‍යාච්ඡාරිකා නිශා." අමරඃ

§ "භිමො'මීලවෙතසෙ ඝොරෙ- ශම්භෞ මධ්‍යමපාණ්ඩවෙ." මෙදිනී:

**a. භවිෂ්‍යදර්ථෙ ණිනිඃ. ආගමිෂ්‍යතීති= ආගාමී. භවිෂ්‍යතීති= භාවී.**

**b. ශසාදෙඃ කරණෙ ත්‍රඃ.**

**c. ශසාදේර්ධාතොඃ කරණෙ'ර්ථෙ ත්‍රඃ ප්‍රත්‍යයො භවති.* ශස් හිංසායාම්, ශසති වා ශස්‍යතෙ අනෙනෙති= ශස්ත්‍රම්. ශාස අනුශිෂ්ටෞ, ශිෂ්‍යතෙ අනෙනෙති= ශාස්ත්‍රම්. අසු ක්ෂෙපණෙ, අස්‍යතෙ අනෙනෙති= අස්ත්‍රම්. පා පානෙ, පියතෙ අනෙනෙති= පාත්‍රම්. නියතෙ අනෙනෙති= නෙත්‍රම්. දාප් ලවනෙ, දියතෙ අනෙනෙති= දාත්‍රම්.**

**d. යුවචභාගිභ්‍යො නිඃ.**

---

a. භවිෂ්‍යත් අර්ථෙ, අනාගතාර්ථයෙහි; ණිනිඃ, ණිනි ප්‍රත්‍යය වේ. (ණකාර- ඉකාර ඉත් ය. ණිත් බැවින් වෘද්ධි වේ.) ආගමිෂ්‍යතීති, එන්නේ නු යි; ආගාමී, අනාගතය "ආගාමින්" නම්. භවිෂ්‍යතීති, වන්නේ නු යි; භාවී, මතු වන්නේ "භාවින්" නම්. (දණ්ඩින් ශබ්දය මෙනි.)

b. ශසාදෙඃ, ශස් ආදිහු කෙරෙන්; කරණෙ, කරණාර්ථයෙහි; ත්‍රඃ, ත්‍ර ප්‍රත්‍යය වේ.

c. ශසාදෙඃ ධාතොඃ, ශස් ආදි ධාතුහු කෙරෙන්; කරණෙ අර්ථෙ, කරණාර්ථයෙහි; ත්‍රඃ ප්‍රත්‍යයඃ භවති, ත්‍ර ප්‍රත්‍යය වේ. (පොත්හි "ත්‍රක්" යි කිත් සේ පෙණේ. එසේ වුවහොත් "නෙත්‍රම්" යන තැන්හි ගුණ නො විය හැකි ය.) ශස් හිංසායාම්:- ශසති වා, හිංසා කෙරෙයි හෝ; අනෙන, මේ කරණ කොට ගෙණ; ශස්‍යතෙ ඉති, හිංසා කරණු ලැබේ නු යි; ශස්ත්‍රම්, ආයුධය "ශස්ත්‍ර" නම්. ශාස අනුශිෂ්ටෞ:- අනෙන, මෙයින්; ශිෂ්‍යතෙ ඉති, අනුශාසනා කරණු ලැබේ නු යි; ශාස්ත්‍රම්, විද්‍යාව "ශාස්ත්‍ර" නම්. අසු ක්ෂෙපණෙ:- අනෙන, මෙයින්; අස්‍යතෙ ඉති, දමා ගසනු ලැබේ නු යි; අස්ත්‍රම්, ආයුධය "අස්ත්‍ර" නම්. පා පානෙ:- අනෙන, මෙයින්; පීයතෙ, බොනු ලැබේ නු යි; පාත්‍රම්, භාජනය "පාත්‍ර" නම්. අනෙන, මෙයින්; නීයතෙ ඉති, පමුණුවනු ලැබේ නු යි; නෙත්‍රම්, ඇස "නෙත්‍ර" නම්. දාප් ලවනෙ:- අනෙන, මෙයින්; දීයතෙ ඉති, සිදිනු ලැබේ නු යි; දාත්‍රම්, දෑකැත්ත "දාත්‍ර" නම්.

d. යුවචභාගිභ්‍යඃ, යු- වච්- අග් යන ධාතුන් කෙරෙන්; නිඃ, නි ප්‍රත්‍යය වේ.

---

* සර්වධාතුභ්‍යස්ත්‍රමනොඥ- පොත්හි, ඒ නිරර්ථක ය.

**a. එභ්‍යෝ ධාතුභ්‍යෝ නිඃ ප්‍රත්‍යයො භවති. යු මිශ්‍රණෙ, යෞතීති= යොනිඃ. වහතීති= වහ්නිඃ. අඞ්ගතෙ'සෞ= අග්නිඃ.**

**b. ඉදිවදිශකිරුදිභ්‍යො රඃ.**

**c. එභ්‍යො රඃ ප්‍රත්‍යයො භවති. ඉදි- වදි ආහ්ලාදනෙ දීප්තෞ ච, ඉන්දතෙ'සෞ= ඉන්ද්‍රඃ. චන්දතෙ'සෞ= චන්ද්‍රඃ. ශක්නොතීති= ශක්‍රඃ. රොදිතීති= රුද්‍රඃ.**

**d. පුෂ්පාදෙරඃ.**

**e. පුෂ්පාදෙර්ධාතොරඃ ප්‍රත්‍යයො භවති. පුෂ්ප විකසනෙ, පුෂ්පති තත්= පුෂ්පම්. ඵල නිෂ්පත්තෞ, ඵලති තත්= ඵලම්. මූල ව්‍යාප්තෞ, මූලති තත්= මූලම්.**

---

a. එභ්‍යඃ ධාතුභ්‍යඃ, මේ (පූර්වෝක්ත) ධාතූන් කෙරෙන්; නිඃ ප්‍රත්‍යයඃ භවති, නි ප්‍රත්‍යය වේ. යු මිශ්‍රණෙ:- යෞතීති= යොනිඃ, මිශ්‍ර කෙරේ නු යි; කාරණය හෝ ස්ත්‍රීචිහ්නය "යොනි" නම්. වහතීති= වහ්නිඃ, පමුණුවා නු යි ගින්න "වහ්නි" නම්. අඞ්ගතෙ, උඩට නගී නු යි; අසෞ, මේ (ගින්න) තෙමේ; අග්නිඃ, "අග්නි" නම්.

b. ඉදිවදිශකිරුදිභ්‍යඃ, ඉද්- වද්- ශක්- රුද් ධාතූන් කෙරෙන්; රඃ, ර ප්‍රත්‍යය වේ. (මුල් දෙක ඉදිත් ය. සෙසු දෙක්හි ඉකාරය ධාතු නිර්දේශයෙහි ඉක් ප්‍රත්‍යයට අයත් ය.)

c. එභ්‍යඃ, මේ යථෝක්ත ධාතූන් කෙරෙන්; රඃ ප්‍රත්‍යයඃ භවති, ර ප්‍රත්‍යය වේ. ඉදි- වදි ආහ්ලාදනෙ දීප්තෞ ච, "ඉද්- වද්" ධාතු දෙක සතුටු කිරීමෙහි ද, බැබලීමෙහි ද වේ. ඉන්දතෙ, සතුටු කෙරේ නු යි හෝ බබලා නු යි; අසෞ, මෙතෙමේ; ඉන්ද්‍රඃ, "ඉන්ද්‍ර" නම්. (ශක්‍රාදීහු * යි.) චන්දතෙ අසෞ= චන්ද්‍රඃ, "චන්ද්‍ර" නම්. (සඳ යි. අපි මුල් වාක්‍යයෙහි මෙනි. මේ දෙක්හි "ඉදිතො නුම්" යි නුමාගම යි.) ශක්නොතීති= ශක්‍රඃ, හැකි වේ නු යි දෙව්රජ "ශක්‍ර†" නම්. රොදිතීති‡= රුද්‍රඃ, හඬා නු යි ශිවතෙමේ "රුද්‍ර" නම්.

d. පුෂ්පාදෙඃ, පුෂ්පාදීහු කෙරෙන්; අඃ, අ ප්‍රත්‍යය වේ.

e. පුෂ්පාදෙඃ ධාතොඃ, පුෂ්ප ආදි ධාතූහු කෙරෙන්; අඃ ප්‍රත්‍යයඃ භවති, අ ප්‍රත්‍යය වේ. පුෂ්ප විකසනෙ, "පුෂ්ප්" ධාතුව

---

* "ඉන්ද්‍රඃ ශචීපතාවන්ත- රාත්මන්‍යාදිත්‍යයොගයොඃ." විශ්වකොෂ.

† "ශක්‍රඃ පුමාන් දෙවරාජෙ- කුටජාර්ජුනභූරුහොඃ." මෙදිනී:

‡ රොදයතීති (=හඬවා නු යි)- සි: ච:

**a. රස සාමථ්‍යෙ, උ ප්‍රත්‍යයඃ, රසතෙ ශාසත්‍රාණාං ශත්‍රූණාඤ්ච අන්තං ගච්ඡති ප්‍රාප්නොතීති= රජ්ජුඃ.**

**b. ගමෙර්ඩෝඃ.**

**c. ගමෙර්ධාතොර්ඩෝඃ ප්‍රත්‍යයො භවති. ගච්ඡතීති= ගෞඃ.**

**d. ග්ලානුදිභ්‍යාං ඩෞඃ. ග්ලායතීති= ග්ලෞඃ. නුදතීති= නෞඃ, නුද ප්‍රේරණෙ.**

---

පුබුදු වීමෙහි වේ. පුෂ්පති තත්= පුෂ්පම්, පිපේ නු යි එය (=මල) "පුෂ්ප" නම්. ඵල නිෂ්පත්තෞ, "ඵල්" ධාතුව නිපදවීමෙහි වේ. ඵලති තත්= ඵලම්, නිපදී නු යි එය (=ගෙඩිය) "ඵල" නම්. මූල ව්‍යාපෙනෞ, "මූල්" ධාතුව පැතිරීමෙහි වේ. මූලති තත්= මූලම්, පැතිරේ නු යි එය (=මූල) "මූල" නම්.

a. රස සාමථ්‍යෙ, "රස්" ධාතුව සමර්ථ බැව්හි වේ. උ ප්‍රත්‍යයඃ, ඔහු කෙරෙන් උ ප්‍රත්‍යය වේ. 'රසතෙ' යි සේ යි; ශාසත්‍රාණාම්, ශාසත්‍රයන්ගේ ද; ශත්‍රූණාං ච, සතුරන්ගේ ද; අන්තම්, කෙළවරට; ගච්ඡති, යෙයි; ප්‍රාප්නොතීති, පැමිණේ නු යි; රජ්ජුඃ, "රජ්ජු" නම්. (එනම් රජ තෙමේ යි.)

b. ගමෙඃ, ගම් ධාතුහු කෙරෙන්; ඩෝඃ, ඩො ප්‍රත්‍යය වේ.

c. ගමෙඃ ධාතොඃ, ගම් ධාතුහු කෙරෙන්; ඩෝඃ ප්‍රත්‍යයඃ භවති, ඩො ප්‍රත්‍යය වේ. (ඩිත් බැවින් විසංඥ ලොපය වේ.) ගච්ඡතීති= ගෞඃ, යේ නු යි ගෙරිතෙමේ "ගො *" නම්. (ප්‍ර: එක වචනයෙහි "ඔරෞ" යි ඖකාරාදෙශ යි. "ඩෞඃ" යනු ද එසේ සිද්ධ ය.)

d. ග්ලානුදිභ්‍යාම්, ග්ලෙ- නුද් ධාතු දෙකින්; "ඩෞඃ, ඩෞ ප්‍රත්‍යය වේ. ග්ලායතීති= ග්ලෞඃ, ගිලන් වේ නු යි චන්ද්‍රයා "ග්ලෞ" නම්. නුදතීති= නෞඃ, මෙහෙයා නු යි යාත්‍රාව "නෞ" නමු. නුද ප්‍රේරණෙ, "නුද්" ධාතුව මෙහෙයීමෙහි ය.

---

* "ගෞර්නා දිත්‍යෙ බලීවර්දෙ- කිරණක්‍රතුභෙදයොඃ,
ස්ත්‍රී තු ස්‍යාද්දිශි භාරත්‍යාං- භූමෞ ච සුරභාවපි,
නෘස්ත්‍රියොඃ ස්වර්ග වජ්‍රාම්බු- රශ්මිදෘග්බාණලොමසු." කොශව:

**a, ශෛවය- සෛන්‍ය ශබ්දසඞ්ඛ්‍යානයොඃ, ස්ත්‍යායතෙර්ඩ්‍රට්. ඩිත්ත්වාට්ටිලොපඃ. "සංයොගාන්තස්‍ය ලොපඃ" විත්ත්වාදීප්, ස්ත්‍යායති සමූහං කාරෙති සා= ස්ත්‍රී. ලක්‍ෂ දර්ශනාඞ්කනයොඃ,**

**b. ලක්‍ෂතෙරී මුට් ච.**

**c. ලක්‍ෂතෙර්ධාතොරීඃ ප්‍රත්‍යයො භවති, තස්‍ය ඊප්‍රත්‍යයස්‍ය මුඩාගමශ්ච. ලක්‍ෂ්‍යතෙ පුමාන් අනයා සා= ලක්‍ෂ්මීඃ.**

## 64. රාජාදෙඃ කන්. (රජාදෙඃ 5- 1. කන් 1- 1.)

**d. රජාදෙර්ධාතොඃ කන් ප්‍රත්‍යයො භවති. රජ් ධන්ව යු ද්‍රු ප්‍රතිදිව් වෘෂ් තක්‍ෂ් දශ් පච් ෂප් අශූඩ් නු මහ එතෙ රජාදයඃ.**

---

a. ශෛවය- සෛන්‍ය ශබ්දසඞ්ඛ්‍යාතයොඃ, "ශෛවය- සෛන්‍ය" ධාතු දෙක ශබ්දය- සමූහය යන අර්‍ථ දෙක්හි වේ. ස්ත්‍යායතෙඃ, සෛන්‍ය ධාතුහු කෙරෙන්; ඩ්‍රට්, ඩ්‍රට් ප්‍රත්‍යය වේ. ඩිත්ත්වාත්, ඩිත් බැවින්; ටිලොපඃ, ටිසංඥ ලොපය වේ. "සංයොගාන්තස්‍ය ලොපඃ" යන සූත්‍රයෙන් ධාතුහුගේ යකාරයට ලොප් වේ. ටිත්ත්වාත්, ටකාරය ඉත් කොට ඇති බැවින්; ඊප්, "ෂ්ට්ව්‍රිතඃ" යි ඊප් ප්‍රත්‍යය වේ. 'ස්ත්‍යායති' යි සේ යි; සමූහං කාරෙති, රැස් කෙරේ නු යි; සා, ඕතොමෝ; ස්ත්‍රී, "ස්ත්‍රී" නමූ. ලක්‍ෂ දර්ශනාඞ්කනයොඃ, "ලක්‍ෂ්" ධාතුව දැකීම ය- ලකුණු කිරීම ය යන අර්‍ථ දෙක්හි වේ.

b. ලක්‍ෂතෙඃ, ලක්‍ෂ් ධාතුහු කෙරෙන්; ඊ, ඊ ප්‍රත්‍යය වේ. මුට් ච, මුඩාගම ද වේ.

c ලක්‍ෂතෙඃ ධාතොඃ, "ලක්‍ෂ්" ධාතුහු කෙරෙන්; ඊඃ ප්‍රත්‍යයඃ භවති, ඊ ප්‍රත්‍යය වේ. තස්‍ය ඊප්‍රත්‍යයස්‍ය, ඒ ඊ ප්‍රත්‍යය සම්බන්ධ ව; මුට් ආගමඃ ච, මුට් ආගම ද වේ. (උකාරය උච්චාරණාර්‍ථ යි. ටිත් බැවින් ඊකාරයට පෙරටු ව මකාරය ආගම වේ.) අනයා, මැ කරණ කොට ගෙණ; පුමාන්, පුරුෂ තෙමේ; ලක්‍ෂ්‍යතෙ, බලනු ලැබේ නු යි හෝ ලකුණු කරණු ලැබේ නු යි; සා, ඕතොමෝ; ලක්‍ෂ්මීඃ, "ලක්‍ෂ්මී" නමූ. (සිරිකත හෙවත් ශොභාව යි. අනීබන්ත හෙයින් සිලොපය නො වේ.)

64. කන් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. රජාදෙඃ, රජාදි ගණයා කෙරෙන්; කන්, කන් ප්‍රත්‍යය වේ.

d. රජාදෙඃ ධාතොඃ, රජ් ආදි ධාතුහු කෙරෙන්; කන් ප්‍රත්‍යයඃ භවති, කන් ප්‍රත්‍යය වේ. (කිත් බැවින් ගුණ නො වේ.) රජ්— මහ එතෙ, රජ්- ධන්ව්- යු- ද්‍රු- 'ප්‍රති' පූර්‍ව දිව්- වෘෂ්- තක්‍ෂ්- දශ්- පච්- ෂප්- අශ්- නු- මහ් යන මොහු; රජාදයඃ, රජා දීහු නම් වෙත්.

a. රාජෘ දීප්තෞ, රාජතෙ 'සෞ= රාජා. ධන්ව ගතෞ, ධන්වතීති= ධන්වා. යු මිශ්‍රණෙ, යෞතීති= යුවා. ද්‍රු ගතෞ, ද්‍රෞතීති= ද්‍රුවා. ප්‍රතිදීව්‍යතීති= ප්‍රතිදිවා.* වෘෂු වෘද්ධෞ, වෘෂීතීති= වෘෂා. තක්ෂූ තනූකරණෙ, තක්ෂ්ණෝතීති= තක්ෂා. දශනතීති= දශ. "ජස්ශසෝර්ලුක්" පචි විස්තාරෙ, පචි සංඛ්‍යානෙ, ඉදිත්, පඤ්චයතීති= පඤ්ච. ෂප් සම්බන්ධෙ, ෂප් ගණනෙ, අශූඞ් ව්‍යාප්තෞ, ෂපේරශෙඃ කිති තුග් වක්තව්‍යඃ. සපතීති තෙ= සප්ත. අශ්නුවතෙ ඉති= අෂ්ට. ණු ස්තුතෞ, අස්‍ය

---

a. රාජෘ දීප්තෞ:- රාජතෙ, බබලා නු යි; අසෞ, මෙතෙමේ; රාජා, "රාජන්" නම්. ධන්ව ගතෞ:- ධන්වතීති= ධන්වා, ගමන් කෙරේ නු යි දුන්න "ධන්වන්" †නම්. සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි "ධවි ගතෞ" ධන්වයති ශරානීති= ධන්වා" (=ඊතල යවා නු යි "ධන්වන්" නම්.) යි දක්වූහ. එය ප්‍රශස්ත ය යි හැගේ. යු මිශ්‍රණෙ:- යෞතීති= යුවා, මිශ්‍ර කෙරේ නු යි තරුණතෙමේ "යුවන්" නම්. ද්‍රු ගතෞ:- ද්‍රෞතීති= ද්‍රුවා, යේ නු යි හිරු "ද්‍රුවන්" නම්. (මේ දෙතැන්හි "නුධාතොඃ" යි 'උව්' ආදෙශ යි.) ප්‍රතිදීව්‍යතීති= ප්‍රතිදිවා, මෙහි ක්‍රීඩා කෙරේ නු යි දවාල "ප්‍රතිදිවන්" නම්. වෘෂු වෘද්ධෞ:- වෂීතීති= වෘෂා, වැඩේ නු යි ශක්‍රයා "වෘෂන්" නම්. තක්ෂූ තනූකරණෙ, "තක්ෂ්" ධාතුව තුනී කිරීමෙහි (=සෑසීමෙහි) වේ. තක්ෂ්ණෝතීති= තක්ෂා, සසී නු යි වඩුවා "තක්ෂන්" නම්. දශනතීති= දශ, ඩසිත් නු යි දහය "දශන්" නම්. "ජස්ශසෝර්ලුක්" යන සූත්‍රයෙන් ජස්- ශස් දෙකට ලුක් වේ. පචි විස්තාරෙ, පචි සංඛ්‍යානෙ, 'පචි' ධාතුව විස්තර කිරීමෙහි ද සංඛ්‍යානයෙහි ද වේ. ඉදිත්, ඉකාරය ඉත් කොට ඇත්තේ ය. පඤ්චයතීති= පඤ්ච, විස්තර කෙරෙත් නු යි හෝ ගණන් කෙරෙත් නු යි පස "පඤ්චන්" නම්. (නුමාගම ව ඊට අනුස්වාර ව වර්ගාන්තාදෙශ වේ.) ෂප් සම්බන්ධෙ, ෂප් ගණනෙ, අශූඞ් ව්‍යාප්තෞ:- කිති, කිත් ප්‍රත්‍යය පර කල්හි; ශපෙඃ අශෙඃ, ශප්- අශ් ධාතු දෙක සම්බන්ධ ව; තුක් වක්තව්‍යඃ, තුගාගමය කිය යුතු යි. සපනතීති තෙ= සප්ත, සම්බන්ධ කෙරෙත් නු යි හෝ ගණන් කෙරෙත් නු යි ඔහු (=හත) "සප්තන්" නමු. අශ්නුවතෙ ඉති= අෂ්ට, පැතිරෙත් නු යි අට "අෂ්ටන්" නම්. (තුගාගම වූ පසු "ඣශෂ" යනාදීන් ශකාරයට ෂකාර ව තකාරයට

---

* "ප්‍රතිදීව්‍යන්‍යස්මින්නිති= ප්‍රතිදිවා" සි: ච:

† "ධන්වා තු මරුදෙශෙ නා- ක්ලීබෙ චාපෙ ශරේ'පි ච." මෙදිනී:

ගුණඃ, නුවන්ති තෙ= නව. මහ පූජායාම්, අස්‍ය සානනාදෙශො වුගාගමශ්ච නිපාත්‍යතෙ ක්‍යන් ප්‍රත්‍යයෙ පරෙ, මහ්‍යතෙ ඉති= මඝවා. ඉති රාජාදයඃ.

a. ඉසමන්ත්‍රාසුසඃ * සර්වධාතුභ්‍යඃ.

b. සර්වධාතුභ්‍යා ඉස් මන් ත්‍ර අස් උස් ඉත්‍යෙතෙ ප්‍රත්‍යයා භවන්ති.

c. අර්චිරුචිශුචිහුසෘපිඡාදිඡෘදිභ්‍ය ඉස් ප්‍රත්‍යයො භවති. අර්චිරුචි දීප්තෞ, අර්චතිති= අර්චිඃ. ගුණඃ, රොචිඃ. ශොචිඃ. හූයතෙ ඉති= හවිඃ. සර්පිඃ. ඡාදෙර්ඉසමන්ත්‍රසන්ක්විප්සු හ්‍රස්වො වාච්‍යඃ. ඡද සංවරණෙ, චුරාදිඃ. ඡාදයතිති= ඡදිඃ. උච්ඡෘදිර් දීප්තිදෙවනයොඃ, ඡෘනත්තිති=ඡර්දිඃ.

---

වූත්වය වේ.) ණු ස්තුතෞ:- අස්‍ය ගුණඃ, මේ 'නු' ධාතුහට ගුණ වේ.. (ඉන් පසු අවාදෙශ වේ.) නුවන්ති තෙ නව, ස්තුති කෙරෙත් නු යි. ඔහු (=නවය) "නවන්" නමු. (මේ සඞ්ඛ්‍යා ශබ්දයෝ බහු වචනාන්ත යහ.) මහ පූජායාම්:- ක්‍යන් ප්‍රත්‍යයෙ පරෙ, ක්‍යන් ප්‍රත්‍යය පර කල්හි; අස්‍ය, මේ මහ් ධාතුහු සම්බන්ධි ව; සානනාදෙශඃ, අන්තයට ඝකාරාදෙශයෙක් ද; වුගාගමඃ ච, වුක් ආගමයෙක් ද; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ. (හයන්තට ඝයන්තක් ව ඉන් පර වකාරාගමයෙක් වෙයි කී නියා යි.) මහ්‍යතෙ ඉති= මඝවා, පුදනු ලැබේ නු යි ශක්‍රතෙමේ "මඝවන්" නම්. රාජාදයඃ, රාජාදීහු; ඉති මෙසේ යි.

a. සර්වධාතුභ්‍යඃ, සියලු ධාතූන් කෙරෙන්; ඉසමනත්‍රාසුසඃ, ඉස්- මන්- ත්‍ර- අස්- උස් යන ප්‍රත්‍යයෝ වෙත්.

b. සර්වධාතුභ්‍යඃ, සියලු ධාතූන් කෙරෙන්; ඉස්— උස් ඉති, ඉස්- මන්- ත්‍ර- අස්- උස් යන; එතෙ ප්‍රත්‍යයාඃ භවන්ති, මේ ප්‍රත්‍යයෝ වෙත්. (මෙයින් සාමාන්‍යයෙන් මේ ප්‍රත්‍යයන් දක්වූහ. ඉක්බිති ඔවුන්ට සාධන ද උදාහරණ ද පිළිවෙළින් දක්වත්. ඒ ප්‍රත්‍යය පරිපාටිය පොත්හි විපර්‍යස්ත ව තිබේ.)

c. අර්චි— ඡෘදිභ්‍යඃ, අර්චි- රුචි- ශුචි- හු- සෘප්- ඡද්‍යන්ත ඡාදි- ඡෘද් යන ධාතූන් කෙරෙන්; ඉස් ප්‍රත්‍යයඃ භවති, ඉස් ප්‍රත්‍යය වේ. අර්චිරුචි දීප්තෞ:- අර්චතිති= අර්චිඃ, බබලා නු යි ගින්න හෝ රශ්මිය "අර්චිස්" නම්. (අර්චිඃ, අර්චිෂී, අර්චිංෂි යනාදි වශයෙන් වරනැගේ.) ගුණඃ, (මතු උදාහරණයන්හි) ගුණ වේ. රොචිඃ, (රොචත ඉති= බබලා නු යි;) ප්‍රභාව "රොචිස්" නම්. ශොචිඃ, (ශුච්‍ය තීති= පිරිසිදු වේ නු යි;) ශොභාව "ශොචිස්" නම්. හූයතෙ ඉති= හවිඃ, පුදනු ලැබේ නු යි යාග ද්‍රව්‍යය "හවිස්" නම්. සර්පිඃ, (සර්පතීති=

---

* ඉසමන්ත්‍රාසුසඃ- පොත්හි.

**a. සබ්බධාතුභ්‍යස්ත්‍රමනෞ. ක්‍රියතෙ තත්= කම්, වෘඤ් ආච්ඡාදනෙ, වෘණොතිති= වම්. මම්. දුම. සම්.ඡාදයතිති= ඡද්ම.**

**b, තනු විස්තාරෙ, තනොති තත්= තන්ත්‍රම්. මන ඥානෙ, මන්‍යතෙ ඉති= මන්ත්‍රඃ. යම උපරමෙ, යච්ඡතිති= යන්ත්‍රම්. ඡාදි සංවරණෙ, ණ්‍යන්තඃ, ඡාදයතිති= ඡත්ත්‍රම්.**

---

යේ නු යි;) ගිතෙල් "සර්පිස්" නම්. ඉසමනත්‍රසඤ්ඤිප්සු, ඉස්- මන්- ත්‍ර- සඤ්- ඤිප් යන ප්‍රත්‍යයන් පර කල්හි; ඡාදෙඃ, චුරාදි ණ්‍යන්ත "ඡාදි" ධාතුහට; හ්‍රස්වඃ වාච්‍යඃ, හ්‍රස්වය කිය යුතු යි. ඡද සංවරණෙ, "ඡද්" ධාතුව වැසීමෙහි වේ. චුරාදිඃ, චුරාදි ගණයට අයත් ය. (මේ 'ඡද්' ධාතුහු කෙරෙන් චුරාදි ණිප්‍රත්‍යය ව වෘද්ධි වූ පසු "ඡාදි" යි වේ. ඊට හ්‍රස්ව වන බව මුලින් කීහ. "ණෙඃ" යි ණිලොපය ද වේ.) ඡාදයතීති= ඡදිඃ, වසා නු යි පියස්ස "ඡදිස්" නම්. උච්ඡෘදිර් දීප්ති දෙවනයොඃ:- ඡෘනත්තීති= ඡර්දිඃ, බබලා නු යි හෝ ක්‍රීඩා කෙරේ නු යි තේජස හෝ වමනය "ඡර්දිස්" නම්. (මේ ඉස් ප්‍රත්‍යයාන්තයෝ යි.)

a. සර්වධාතුභ්‍යඃ, සියලු ධාතුන් කෙරෙන්; ත්‍රමනෞ, ත්‍ර- මන් යන ප්‍රත්‍යය දෙදෙන වෙත්. (මෙයින් මේ ප්‍රත්‍යය දෙකට විශෙෂ ස්ථාන නො ලැබෙන බවත්, සාමාන්‍යයෙන් සෙසු ප්‍රත්‍යයන් වන ඇතැම් ධාතුන් කෙරෙන් ම මේ ප්‍රත්‍යය දෙක ද වන බවත් හැගේ. "මන් ධාතොඃ, ධාතොස්ත්‍රඃ" යන සිද්ධාන්ත චන්ද්‍රිකා සූත්‍ර දෙකින් ද ඒ බව ඔප්පු වේ.) ක්‍රියතෙ තත්= කම්, කරණු ලැබේ නු යි එය (=කර්මය) "කර්මන්" නම්. (කර්ම, කර්මණි, කර්මාණි යනාදීන් වර නැගේ.) වෘඤ් ආච්ඡාදනෙ:- වෘණොතීති= වර්ම්, වසා නු යි සැට්ටය "වර්මන්" නම්. මර්ම, (ම්‍රියතෙ 'නෙනෙති= මෙයින් මැරේ නු යි;) මරු තැන "මර්මන්" නම්. දෘම, (දීයතෙ ඉති= කඩනු ලැබේ නු යි;) දම්වැල "දෘමන් නම්. ("දෙ අවඛණ්ඩනෙ" ධාතු යි.) ශර්ම, (ශරතීති= වැගිරේ නු යි;) ඩහදිය "ශර්මන්" නම්. (ශර්මන් ශබ්දයක් කොෂයන්හි නො පෙණේ.) ඡාදයතීති= ඡද්ම, වසා නු යි (=සඟවා නු යි) වඤ්චාව "ඡද්මන්" නම්. (මේ මන් ප්‍රත්‍යයාන්තයෝ යි.)

b. තනු විස්තාරෙ:- තනොති තත්= තන්ත්‍රම්, පතුරුවා නු.යි එය (=සිද්ධාන්තාදිය) "තන්ත්‍ර" නම්. මන ඥානෙ, මන්‍යතෙ ඉති= මන්ත්‍රඃ, දැන ගණු ලැබේ නු යි රහස හෝ වෙද කොටස් "මන්ත්‍ර" නම්. යම උපරමෙ:- යච්ඡතීති= යන්ත්‍රම්, වළකී නු යි කෘත්‍යසාධක උපකරණාදිය "යන්ත්‍ර" නම්. (ධාතුස්ථ මකාරයට "නශ්චාපදාන්තස්‍යඣලි" සි අනුස්වාර ව වර්ගාන්තාදෙශ වේ.) ඡාදි සංවරණෙ:- ණ්‍යන්තඃ, (මෙය චුරාදී) ණිප්‍රත්‍යය අන්ත කොට ඇත්තේ ය. ඡාදයතීති= ඡත්ත්‍රම්, වසා නු යි කුඩය "ඡත්ත්‍ර" නම්. ("ණෙඃ" යි ණි ලොපය වේ. "ඛසෙ චපාඃ" යනාදීන් ධාත්වන්ත දකාරයට තකාර වේ. "ඡාදෙරිස්මන්" යනාදීන් ධාතුහට හ්‍රස්ව වේ. මේ ත්‍ර ප්‍රත්‍යයාන්තයෝ යි.)

**a. වචාදෙරස්.***

**b. වචාදෙර්ධාතොරස් ප්‍රත්‍යයො භවති, වා සර්වධාතුභ්‍යො'ස් ප්‍රත්‍යයඃ. උච්‍යතෙ ඉති= වචඃ. මහ්‍යතෙ ඉති= මහඃ. පීඞ පානෙ, පීයතෙ තත්- පයඃ.**

**c. පිබතෙරයි.**

**d. පිබතෙර්ධාතොරස් ප්‍රත්‍යයො භවති ඉකාරාන්තාදෙශශ්ච. පීයතෙ ඉති= පයඃ. තිජ නිශානෙ ක්‍ෂමායාඤ්ච, තිතික්‍ෂත ඉති= තෙජඃ. තප්‍යතෙ ඉති= තපඃ. රඤ්ජ රාගෙ, අසි නලොපො වාච්‍යඃ. රජ්‍යතෙ තත්= රජඃ. රක්‍ෂ හිංසායාම්, රක්‍ෂතීති=රක්‍ෂඃ.**

---

a. වචාදෙඃ, වච් ආදිහු කෙරෙන්; අස්, අස් ප්‍රත්‍යය වේ.

b. වචාදෙඃ ධාතොඃ, වච් ආදි ධාතුහු කෙරෙන්; අස් ප්‍රත්‍යයඃ භවති, අස් ප්‍රත්‍යය වේ. වා, නොහොත්; සර්වධාතුභ්‍යඃ, සියලු ධාතූන් කෙරෙන්; අස් ප්‍රත්‍යයඃ, අස් ප්‍රත්‍යය වේ. උච්‍යතෙ ඉති= වචඃ, කියනු ලැබේ නු යි වචනය "වචස්" නම්. මහ්‍යතෙ ඉති= මහඃ, පුදනු ලැබේ නු යි තෙජස "මහස්" නම්. පීඞ පානෙ:- පීයතෙ තත්= පයඃ, බොනු ලැබේ නු යි එය (=කිරි හෝ ජලය) "පයස්" නම්. (ගුණ හා අයාදෙශ යි.)

c. පිබතෙඃ, පා ධාතුහු කෙරෙන්; අස්, අස් ප්‍රත්‍යය වේ. ඉ, අන්තයට ඉකාරාදෙශ ද වේ.

d. පිබතෙඃ ධාතොඃ, පා ධාතුහු කෙරෙන්; අස් ප්‍රත්‍යයඃ භවති, අස් ප්‍රත්‍යය වේ. ඉකාරාන්තාදෙශඃ ච, ධාතුහුගේ අන්තයට ඉකාරාදෙශ ද වේ. පීයතෙ ඉති= පයඃ, බොනු ලැබේ නු යි "පයස්" නම්. (මෙසේ සමානාර්ථ පී- පා ධාතු දෙකින් ම 'පයස්' ශබ්දය නිපදවනු ලැබේ.) තිජ නිශානෙ ක්‍ෂමායාං ච, 'තිජ්' ධාතුව තියුණු කිරීමෙහි ද ඉවසීමෙහි ද වේ. තිතික්‍ෂත ඉති= තෙජඃ, තියුණු කෙරේ නු යි හෝ ඉවසා නු යි දීප්තිය "තෙජස්" නම්. තප්‍යතෙ ඉති= තපඃ, තවනු ලැබේ නු යි ව්‍රතය "තපස්" නම්. රඤ්ජ රාගෙ:- අසි, අස් ප්‍රත්‍යය පර කල්හි; නලොපඃ වාච්‍යඃ, රඤ්ජ් ධාතුහුගේ නකාර ලොපය කිය යුතු යි. රජ්‍යතෙ තත්= රජඃ, ඇලේ නු යි එය (=ධූලි) "රජස්" නම්. රක්‍ෂ හිංසායාම්:- රක්‍ෂතීති= රක්‍ෂඃ, හිංසා කෙරේ නු යි රකුසා "රක්‍ෂස්" නම්. (මේ අස් ප්‍රත්‍යයාන්තයෝ යි.)

---

* සූත්‍රපාඨයට මැනදී ඇතුළත් වුවක් විය යුතු යි.

a. ධනාර්තිචක්ෂිඞ්පෘවපිතපිජනියජිභ්‍ය උස් ප්‍රත්‍යයො භවති. ධන ශබ්දෙ, ධනතීති= ධනුඃ. ඍ ගතෞ, ගුණඃ, අරුඃ. චක්ෂිඞ් ව්‍යක්තායාං වාචි, චෂ්ටෙ ඉති= චක්ෂුඃ. පිපර්තීති= පරුඃ. වපතීති= වපුඃ, තපතීති= තපුඃ. ජායතෙ ඉති= ජනුඃ. යජතීති= යජුඃ.

b. අවතෘසතෘඤ්තන්ත්‍රිකණ්ඨිභ්‍ය ඊඃ. අවතීති= අවීඃ. තරතීති= තරීඃ. සතෘඤ් ආච්ඡාදනෙ, සතෘණොතීති= සතරීඃ. තන්ත්‍රි ධාරණෙ, තන්ත්‍රයති වා තන්ත්‍රයතෙ සා= තන්ත්‍රීඃ. කණ්ඨ අවධාරණෙ, කණ්ඨයතීති= කණ්ඨීඃ.

---

a. ධනාර්ති — යජිභ්‍යඃ, ධන- ඍ- චක්ෂ්- පෘ- වප්- තප් -ජන්- යජ් යන ධාතූන් කෙරෙන්; උස් ප්‍රත්‍යයඃ භවති, උස් ප්‍රත්‍යය වේ. ධන ශබ්දෙ:- ධනතීති= ධනුඃ, ශබ්ද කෙරේ නු යි දුන්න "ධනුස්" නම්. ඍ ගතෞ:- ගුණඃ, ගුණ වේ. අරුඃ, (ඉයර්තීති= ගමන් කෙරේ නු යි;) වණය "අරුස්" නම්. චක්ෂිඞ් ව්‍යක්තායාං වාචි:- චෂ්ටෙ ඉති= චක්ෂුඃ, ප්‍රකාශ කෙරේ නු යි ඇස "චක්ෂුස්" නම්. පිපර්තීති= පරුඃ, පාලනය කෙරේ නු යි හෝ පූරවා නු යි ගැටය හෝ පුරුක "පරුස්" නම්. වපතීති= වපුඃ, වපුරා නු යි ශරීරය "වපුස්" නම්. තපතීති= තපුඃ, තවා නු යි හිරු හෝ ගින්න "තපුස්" නම්. ජායතෙ ඉති= ජනුඃ, උපදී නු යි උත්පත්තිය "ජනුස්" නම්. යජතීති= යජුඃ, යාග කෙරේ නු යි වෙදය "යජුස්" නම්. (මේ උස් ප්‍රත්‍යයාන්තයෝ යි.)

b. අවතෘ — කණ්ඨිභ්‍යඃ, අව්- තෘ- සතෘ- චුරාදි ණ්‍යන්ත තන්ත්‍රි- කණ්ඨි යන ධාතූන් කෙරෙන්; ඊඃ, ඊ ප්‍රත්‍යය වේ. අවතීති= අවීඃ, රකී නු යි ඔසප් වූ ස්ත්‍රිය "අවී" නමු. තරතීති= තරීඃ, පිහිනා නු යි නැව "තරී" නමු. සතෘඤ් ආච්ඡාදනෙ:- සතෘණොතීති= සතරීඃ, වසා නු යි දුම "සතරී" නම්. තන්ත්‍රි ධාරණෙ:-* තන්ත්‍රයති, (කුටුම්බය) දරා නු යි; සා, ඕ තොමෝ (=වීණාවේ තත;) තන්ත්‍රීඃ, "තන්ත්‍රී" නමු. තන්ත්‍රයතෙ වා, "තන්ත්‍රයතෙ" කියා ආත්මනෙපදයෙන් හෝ විග්‍රහය වේ. කණ්ඨ අවධාරණෙ:- කණ්ඨයතීති= කණ්ඨීඃ, පිරිසිඳී නු යි අසුන්ගේ ගෙල වෙළුන රැහැන හෝ බෝල කඩල "කණ්ඨී" නමු. (මේ දෙතැන්හි "සෙඃ" යි ස්‍යාදිලොපය වේ. මේ ඊ ප්‍රත්‍යයාන්තයෝ ස්ත්‍රීලිඞ්ගිකයහ. අනීබන්ත හෙයින් සිලොපය නො වේ. ස්වරාන්ත ස්ත්‍රීලිඞ්ග ප්‍රක්‍රියායෙහි "අවී ලක්ෂ්මී තරී තන්ත්‍රී" යනාදි ශ්ලොකයෙහි "සප්තානාමෙව ශබ්දනාම්" යි කී නමුත් ඒ හතට අයත් නුවූ මේ සතරී- කණ්ඨී ශබ්දයන්ගේ ද සිලොපය නො වන බව පෙණේ.)

---

* තන්ත්‍රි කුටුම්බධාරණෙ- සුබොධිනී.

## 65. සෞකර්‍යෙ කෙලිමඃ. (සෞකය්‍යෙ 7- 1. කෙලිමඃ 1-1.)

**a. සුඛෙන භිද්‍යතෙ තත්= භිදෙලිමං, වා භෙත්තුං සුකරං= භිදෙලිමං, කිං කාෂ්ඨම්. සුඛෙන පච්‍යතෙන ඉති= පචෙලිමාඃ, ආඪක්‍යඃ, වා පක්තුං සුකරාඃ= පචෙලිමාඃ, කෙ තණ්ඩුලාඃ.**

65. කෙලිම ප්‍රත්‍යය විධි සූත්‍ර යි. ධාතොඃ යනු අනුවෘත්තයි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; සෞකර්‍යෙ, සුකර භාවයෙහි; කෙලිමඃ, කෙලිම ප්‍රත්‍යය වේ. (මෙයින් තත්තද්ධාතුජ ක්‍රියාව කරන්නට පහසු ය යන අර්‍ථයෙහි ධාතූන් කෙරෙන් කෙලිම ප්‍රත්‍යය විහිත ය. ඒ කිත් බැවින් ධාතුහට ගුණ නො වේ.)

a. සුඛෙන භිද්‍යතෙ, සුව සේ බිඳිනු ලැබේ නු යි; තත්, එය; භිදෙලිමම්, "භිදෙලිම" නම්. වා, නොහොත්; භෙත්තුම්; බිඳින්නට; සුකරම්, පහසු ය යන අර්‍ථයෙහි; භිදෙලිමම්, "භිදෙලිම" නම්. කිම්, කුමක් ද යත්? කාෂ්ඨම්, දර ය. සුඛෙන පච්‍යතෙන ඉති; සුව සේ පිසනු ලැබේ නු යි; පචෙලිමාඃ, "පචෙලිම" නමු. ආඪක්‍යඃ, 'ශමී' නම් ධාන්‍ය විශෙෂයෝ යි; වා, නොහොත්; පක්තුං සුකරාඃ, පිසන්නට සුකරයහ යන අර්‍ථයෙහි; පචෙලිමාඃ, "පචෙලිම" නම් වෙත්. කෙ; කවරහු ද යත්? තණ්ඩුලාඃ, සහල් ය. (මෙහි මේ කෙලිම ප්‍රත්‍යය කර්‍මාර්‍ථයෙහි ය. එපමණක් නො ව කර්‍මකර්‍තෘ විෂයෙහි ද මෙය වන බව පෙණේ. **"පච්‍යතෙන ස්වයමෙව= පචෙලිමාඃ, මාෂාඃ. ස්වය මෙව භිද්‍යතෙන= භිදෙලිමාඃ, භූමයඃ. ස්වයමෙව ඡිද්‍යතෙන= ඡිදෙලිමානි, කාෂ්ඨානි"*** යනු ඊට උදාහරණ යි.)

(මේ කෙලිම ප්‍රත්‍යය හා "භවිෂ්‍යදර්‍ථෙ ණිනිඃ" යන්නෙන් විහිත ණිනි ප්‍රත්‍යය ද උණාදියට අයත් නො වන බව සැලකිය යුතු යි. එයින් නිෂ්පන්න නාමයන් සංඥාවාචක නො ව ක්‍රියා වාචක බැවිනි. ණිනි ප්‍රත්‍යය වීමෙන් නිපන් "ආගාමින්- භාවින්" ආදිය ද, කෙලිම ප්‍රත්‍යය වීමෙන් නිපන් "භිදෙලිම- පචෙලිම" ආදිය ද යම් කිසි වස්තූන් කෙරෙහි ව්‍යවහෘත වන නම් නො ව එයින් වාච්‍ය ධාත්වර්‍ථයෙන් යුත් කවර වස්තුවකට වුව ද විශෙෂණ කොට "ආගාමී මාසඃ, ආගාමිනී රාත්‍රිඃ, ආගාමි දිනම්, පචෙලිමා මාෂාඃ, පචෙලිමා ආඪක්‍යඃ, පචෙලිමානි ඵලානි" යනාදි වශයෙන් යෙදිය හැකි ක්‍රියාවාචක නාමයෝ ය.)

(තව ද, "අව් - මහ්" ආදි ධාතූන් කෙරෙන් ඉෂච් ප්‍රත්‍යය කොට "අවිෂ- මහිෂ" ආදි නාමයෝ ද, "මද්- මුද්- මදි- තිමි- මිහ්- ඡිද්- රුචි- බධි- ශුෂ්" ආදියෙන් කිර ප්‍රත්‍යය කොට "මදිර-

* රූපාවතාර 248 පිට.

**13. සංඥාසු ධාතුරූපාණි- ප්‍රත්‍යයාශ්ච තතඃ පරෙ,**
**කාර්‍ය්‍යාද්විද්‍යාදනුබන්ධ- මෙතච්ඡාස්ත්‍රමුණාදිෂු.**

---

ඛදිර- මන්දිර- තිමිර- මිහිර- ශිදිර- රුචිර- බධිර- ශුෂිර" යනාදි නාමයෝ ද, "භා" ධාතුවෙන් ඩවතු ප්‍රත්‍යය කොට යුෂ්මදර්ථ "භවත්" ශබ්දය ද, "සෘ- හෘ- යුෂ්" ආදියෙන් ඉකාරානුබන්ධ ඉති ප්‍රත්‍යය කොට "සරිත්- හරිත්- යොෂිත්" ආදිය ද, "මෘ- ගෘ" ආදියෙන් උති ප්‍රත්‍යය කොට "මරුත්- ගරුත්" ආදිය ද, "කම්- ජෘ" ආදියෙන් අඨ ප්‍රත්‍යය කොට "කමඨ- ජරඨ" ආදිය ද, "වෘෂ්- ශබ්- පල්- සෘ- තෘ- මුස්" ආදියෙන් කල ප්‍රත්‍යය කොට "වෘෂල- ශබල- පලල- සරල- තරල- මුසල" ආදිය ද, "දම්- රම්- බන්- මන්" ආදියෙන් ඩ ප්‍රත්‍යය කොට "දණ්ඩ- රණ්ඩ- බණ්ඩ- මණ්ඩ" ආදිය ද, "තම්- විඩ්- මෘන්- විශ්- කුල්- කප්- පල්" ආදියෙන් කාල ප්‍රත්‍යය කොට "තමාල- විඩාල- මෘණාල- විශාල- කුලාල- කපාල- පලාල" යනාදිය ද, "පත්- තෘ- ලූ" ආදියෙන් අඞ්ග ප්‍රත්‍යය කොට "පතඞ්ග- තරඞ්ග- ලවඞ්ග" යනාදිය ද, "යුෂ්- අස්" දෙකින් මදික් ප්‍රත්‍යය කොට "යුෂ්මද්- අස්මද්" දෙක ද, "ඍ- සෘ- තෘ- අශ්- ධම්- අව්- රජ්" ආදියෙන් අනි ප්‍රත්‍යය කොට "අරණි සරණි- තරණි- අශනි- ධමනි- අවනි- රජනි" යනාදිය ද, "මන්- ජන්- දස්- ආදියෙන් යු ප්‍රත්‍යය කොට "මන්‍යු- ජන්‍යු- දස්‍යු" යනාදිය ද, "කු- පූ- හෘ" යනාදියෙන් ඉ ප්‍රත්‍යය කොට "කවි- පවි- හරි" යනාදිය ද නිපදවනු ලැබෙත්. මෙසේ ධාතුන් කෙරෙන් අනෙකප්‍රකාර ඖණාදික ප්‍රත්‍යයන් යෙදීමෙන් භාෂාවෙහි ව්‍යවහාර ප්‍රාප්ත සියලු ම සංඥා ශබ්දයෝ නිපදවා ගත යුතු වෙත්. මේ සාරස්වත ව්‍යාකරණයෙහි උණාදි ප්‍රක්‍රියාව අති සංක්ෂිප්ත ය. සිද්ධාන්ත චන්ද්‍රිකාකාරයෝ මේ පිළිබඳ අතිශය ප්‍රශස්ත වූත්, සවිස්තර වූත් දීර්ඝ අනුශාසනයක් කළහ. එහෙයින් මේ උණාදි ප්‍රක්‍රියාවෙහි විස්තර කැමති වන්නෝ සිද්ධාන්ත චන්ද්‍රිකාව බලත්වා.)

13 සංඥාසු, සංඥාවන් කිව මනා කල්හි; ධාතුරූපාණි, ධාතු රූපයෝ ද; තතඃ පරෙ, ඉන් පර ව; ප්‍රත්‍යයාඃ ච, ප්‍රත්‍යයෝ ද වෙත්. කාර්‍ය්‍යාත්, කාර්‍ය්‍ය වශයෙන්; අනුබන්ධම්, අනුබන්ධය; විද්‍යාත්, දන්නේ ය. උණාදිෂු, උණාදීන් කෙරෙහි; එතත් ශාස්ත්‍රම්, මේ ශාස්ත්‍රය යි.

(ධාතු- ප්‍රත්‍යය දක්වීමෙන් ඖණාදික නාමයන්ගේ පරිසමාප්තියක් නො කට හැකි හෙයින් ඔවුන්ගේ සාධනොපාය වූ උණාදි ශාස්ත්‍රය මෙයින් නිර්දිෂ්ට ය. යම් කිසි සංඥා නාමයක්

**14. උණාදයො 'පරිමිතා- යෙෂු සඞ්ඛ්‍යා න ගම්‍යතෙ,**
**ප්‍රයොගමනුසෘත්‍යාද්ධා- ප්‍රයොක්තව්‍යාස්තතස්තතඃ.**

## ඉති කෘදන්ත උණාදි ප්‍රක්‍රියා.

---

නිපදවිය යුතු කල්හි ඒ නාමයට රූපයෙන් හා අර්ථයෙන් ද අනුකූල වූ ධාතුරූපයක් ගෙණ ඒ ධාතු රූපයට කළ යුතු ගුණ- වෘද්ධි- ලොප- ආදෙශ- ආගමාදි කාර්‍ය්‍යයක් වේ නම් ඊට සලකුණු වූ අනුබන්ධ වර්ණයන්ගෙන් ද යුක්ත වූ නාමය සිද්ධ කර ගැණීමට යොග්‍ය වූ ප්‍රත්‍යයක් යථොක්ත ධාතුවෙන් පර ව යොදනු ලැබේ. ඉන් පසු ඒ අනුබන්ධයන් නිමිති කොට ඇති කාර්‍ය්‍ය කිරීමෙන් යථෙප්සිත සංඥානාමය ලැබේ. පත්නීවාචක "හායීා" ශබ්දය නිපදවිය යුතු කල්හි ඊට අනුකූල වූ 'හෘ' ධාතුව ගෙණ, වෘද්ධි කළ යුතු හෙයින් ඊට නිමිති වූ ණකාරය අනුබන්ධ කොට "යණ්" යි ප්‍රත්‍යය යොදනු ලැබේ. අනතුරු ව වෘද්ධි හා ස්ත්‍රීලිඞ්ග බැවින් ආප් ප්‍රත්‍යය ද කිරීමෙන් "හායීා" යි වේ. යකාර ද්විත්වයෙන් "හාය්‍යීා"යි ද වේ. මෙසේ මේ උණාදීන්ගේ ශාස්ත්‍රක්‍රමය අනු ව අනෙකවිධ ඖණාදික නාමයන්ගේ ව්‍යුත්පත්තිය දත යුතු යි.)

14. යෙෂු, යම් ප්‍රත්‍යය කෙනෙකුන් කෙරෙහි; සඞ්ඛ්‍යා, ගණනක්; න ගම්‍යතෙ, නො හැඟේ ද; උණාදයඃ, ඒ උණාදීහු; අපරිමිතාඃ, අප්‍රමාණයහ. ප්‍රයොගම් අනුසෘත්‍ය, ප්‍රයොග අනුගමනය කොට; අද්ධා, යාථාර්ථ්‍ය වශයෙන් (=අර්ථයට සුදුසු පරිද්දෙන්;) තතඃ තතඃ, ඒ ඒ ධාතූන් කෙරෙන්; ප්‍රයොක්තව්‍යාඃ, (උණාදීහු) යෙදිය යුත්තාහ.

(උණාදි ප්‍රත්‍යයන්ගේ කෙළවරක් නැති බවත්, ප්‍රයොගානුසාරයෙන් ඒ ඒ ධාතූන් කෙරෙන් ඒ ඒ ප්‍රත්‍යයන් යෙදිය යුතු බවත් මෙසින් කීහ. ධාතූන් කෙරෙන් උණාදි ප්‍රත්‍යයන් යෙදීමෙන් නිපදවනු ලබන නාම **සංඥා වාචක නාම** බව ද, සෙසු ප්‍රත්‍යයන් යෙදීමෙන් නිපදවනු ලබන නාම **ක්‍රියා වාචක නාම** බව ද දත යුතු යි. මේ කෘත්- උණාදි දෙකොටසෙහි අන්‍යොන්‍ය වෙනස යි.)

කෘදන්ත, කෘදන්ත ප්‍රකරණයෙහි; උණාදි ප්‍රක්‍රියා, උණාදි ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි, නොහොත් නිමි.

---

## උණාදිප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාව සමාප්ත යි.

---

a. අථ භාවාධිකාර ප්‍රක්‍රියා:-

## 66. තුං තදත්‍ථායං භවිෂ්‍යති.

(තුම් 1- 1. තදත්‍ථායාම් 7-1. භවිෂ්‍යති 7-1.)

**b. ධාතොර්භවිෂ්‍යති කාලෙ තුම්ප්‍රත්‍යයො භවති තදත්‍ථායාං ක්‍රියායාං ප්‍රයුජ්‍යමානායාම්.**

---

a. අථ, ඉක්බිති; භාවාධිකාර ප්‍රක්‍රියා, භාවාධිකාර ප්‍රකරණය දක්වනු ලැබේ. (ධාතූන් කෙරෙන් භාවයෙහි (=ක්‍රියාත්‍ථයෙහි) වන ප්‍රත්‍යයන් පිළිබඳ අධිකාරය කියනු ලැබෙයි යේ යි.)

66. තුම් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. ධාතොඃ යනු ද, "ශත්‍ෘශානෞ තිඞන්තවත් ක්‍රියායාම්" යි ක්‍රියායාම් යනුද අනුවෘත්ත යි. තදත්‍ථායාං ක්‍රියායාම්, එය (=තුමන්තය) ප්‍රයොජන කොට ඇති අපර ක්‍රියාවක් විද්‍යමාන කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; භවිෂ්‍යති, අනාගත යෙහි; තුම්, තුම් ප්‍රත්‍යය වේ.

b. තදත්‍ථායාං ක්‍රියායාම්, ඒ තුමන්ත ක්‍රියාව ප්‍රයොජන කොට ඇති අපර ක්‍රියාවක්; ප්‍රයුජ්‍යමානායාම්, යොදනු ලබන කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; භවිෂ්‍යති කාලෙ, අනාගත කාලයෙහි; තුම් ප්‍රත්‍යයඃ භවති, තුම් ප්‍රත්‍යය වේ.

(මෙයින් ධාතූන් කෙරෙන් තාදත්‍ථ්‍යයෙහි තුම් ප්‍රත්‍යය විහිත ය. "සා ක්‍රියා අත්‍ථඃ ප්‍රයොජනං යස්‍යාඃ සා = තදත්‍ථා, තස්‍යාම්= තදත්‍ථායාම්" යනු විග්‍රහ හෙයින් ඒ (තුමන්ත) ක්‍රියාව ප්‍රයොජන කොට පවත්නා අපර ක්‍රියාවක් යෙදෙන කල්හි හෝ හැඟෙන කල්හි මේ තුම් ප්‍රත්‍යය වේ. "භොක්තුං ව්‍රජති දෙවදත්තඃ" (=දෙව්දත් තෙමේ අනුභව කරන්නට යයි) යි කී කල්හි "ව්‍රජති" යන ක්‍රියාවේ ප්‍රයොජනය "භොක්තුම්" යන්නෙන් දැක්වෙන අනාගතකාලික භොජනය යි. එහෙයින් මෙහි "ව්‍රජති" යනු තදත්‍ථ ක්‍රියාව යි. ඒ ක්‍රියා යොගයෙහි "භුජ්" ධාතුහු කෙරෙන් තුම් ප්‍රත්‍යය විය. අනාගතයෙහි වන භොජනය ප්‍රයොජන කොට ඇති දෙවදත්තගේ ගමන ය යන අදහස යි. තුමන්තයෝ අව්‍යයෝ ය. සමහරු මෙය 'තුමුන්' ප්‍රත්‍යය යි ද කියත්.)

**a.** භුජ් පාලනාභ්‍යවහාරයොඃ, භොක්ෂ්‍යතීති= භොක්තුං-ව්‍රජති. පඨිෂ්‍යතීති= පඨිතුම් ඊෂෙට. ස්තොෂ්‍යතීති= ස්තොතුම් ඊහතෙ. ස්ථාතුම් ඊහතෙ.

**b.** තුමර්ථෙ වුණ් වක්තව්‍යඃ. ද්‍රක්ෂ්‍යතීති= ද්‍රෂ්ටුම්, කෘෂ්ණං-ද්‍රෂ්ටුං ව්‍රජති= කෘෂ්ණං දර්ශකො ව්‍රජති.

**c.** කාලසමයවෙලාසු තුම්. භොක්තුං කාලඃ. අධ්‍යෙෂ්‍ය-තීති= අධ්‍යෙතුං සමයඃ. ස්තොෂ්‍යතීති= ස්තොතුං වෙලා.

## 67. ඝඤ් භාවෙ. (ඝඤ් 1-1. භාවෙ 7-1.)

---

a. භුජ පාලනාභ්‍යවහාරයොඃ:- භොක්ෂ්‍යතීති= භොක්තුම්, අනුභව කරන්නේ නු යි "භොක්තුම්" යනු වේ. භොක්තුම්, අනුභව කරන්නට; ව්‍රජති, යෙයි. පඨිෂ්‍යතීති= පඨිතුම්, හදාරන්නේ නු යි "පඨිතුම්" යනු වේ. පඨිතුම්, හදාරන්නට; ඊෂෙට, කැමති වෙයි. ස්තොෂ්‍යතීති= ස්තොතුම්, ස්තුති කරන්නේ නු යි "ස්තොතුම්" යනු වේ. ස්තොතුම්, ස්තුති කරන්නට; ඊහතෙ, උත්සාහ කෙරෙයි හෝ කැමති වෙයි. (ස්ථාස්‍යතීති=සිටින්නේ නු යි;) ස්ථාතුම්, සිටින්නට; ඊහතෙ, කැමති වෙයි.

b. තුමර්ථෙ, තුම් ප්‍රත්‍යයාගේ අර්ථයෙහි; වුණ් වක්තව්‍යඃ, වුණ් ප්‍රත්‍යය ද කිය යුතු යි. (ණිත් බැවින් වෘද්ධි වේ. "යුවොරනාකෞ" යි "වු" යන්නට "අක" ආදෙශ වේ.) ද්‍රක්ෂ්‍යතීති= ද්‍රෂ්ටුම්, දකින්නේ ය යන අර්ථයෙහි "ද්‍රෂ්ටුම්" යනු වේ. "කෘෂ්ණං ද්‍රෂ්ටුං ව්‍රජති" (=විෂ්ණු දකින්ට යෙයි) යනු "කෘෂ්ණං දර්ශකො ව්‍රජති" යනු ද වේ. (දෘශ් ධාතුහු කෙරෙන් තුමර්ථයෙහි වුණ් ප්‍රත්‍යය යි.)

c. කාලසමයවෙලාසු, කාල- සමය- වෙලා යන ශබ්දයන් යොදනු ලබන කල්හි ද; තුම්, තුම් ප්‍රත්‍යය වේ. (මෙහි "කාලාර්ථෙෂු" යි නො කියා පර්‍ය්‍යාය ශබ්දයන්ගේ ගැණීම ක්‍ෂණ මුහූර්තාදි අන්‍ය-පර්‍ය්‍යාය ශබ්දයන්ගේ යොගයෙහි තුම් ප්‍රත්‍යය නො වනු පිණිස යි.) "භොක්තුං කාලඃ" (=අනුභව කරන්නට කාලය යි.) යනු කාල-ශබ්දයොගයෙහි තුම් ප්‍රත්‍යයට උදාහරණ යි. අධ්‍යෙෂ්‍යතීති= අධ්‍යෙතුම්, හදාරන්නේ නු යි "අධ්‍යෙතුම්" යනු වේ. "අධ්‍යෙතුං සමයඃ" (=හදාරන්නට සමය යි.) යනු සමය ශබ්දයොගයෙහි තුම් ප්‍රත්‍යය යි. "ස්තොතුං වෙලා" (=ස්තුති කරන්නට වේලාව යි.) යනු වෙලා-ශබ්දයොගයෙහි තුම් ප්‍රත්‍යය යි.

67. ඝඤ් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. ධාතොඃ යනු වැටේ. ධාතොඃ, ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි; ඝඤ්, ඝඤ් ප්‍රත්‍යය වේ.

**a. ධාතොභාවෙ ඝඤ් ප්‍රත්‍යයො භවති. "චජොඃ කගෞ ඝිති."**

**b. පච්‍යතෙ තත්= පචනං- පාකඃ. ත්‍යජ් වයොහානෞ, ත්‍යජ්‍යතෙ තත්= ත්‍යජනං- ත්‍යාගඃ. භජ්‍යතෙ තත්= භජනං- භාගඃ. ඉජ්‍යතෙ තත්= යජනං- යාගඃ. විභජ්‍යතෙ තත්= විභජනං- විභාගඃ. යුජිර් යොගෙ, අනුප්‍රයුජ්‍යතෙ'සෞ= අනු ප්‍රයොගඃ. අනූච්‍යතෙ තත්= අනුවචනං- අනුවාකඃ. ඉණ් ගතෞ, [නන්‍ද්‍යාදිත්වාද්‍යුඃ. තතො 'නාදෙශඃ. ගුණඃ, වෘද්ධිඃ.*] අයනං- ආයඃ. භූයතෙ තත්= භවනං- භාවඃ. "ආතො යුක්" දීයතෙ තත්= දානං- දායඃ. පානං- පායඃ.**

---

a. ධාතොඃ, ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි; ඝඤ් ප්‍රත්‍යයඃ භවති, ඝඤ් ප්‍රත්‍යය වේ. "චජොඃ කගෞ ඝිති" යන සූත්‍රයෙන් ධාත්වන්ත චකාර- ජකාරයන්ට කකාර- ගකාරයෝ වෙත්. (ඤිත් බැවින් වෘද්ධි ද වේ. මේ කෘදන්තයෙහි භාවය නම් සිද්ධරූප† ධාත්වර්ථ මාත්‍රය යි. අඛ්‍යාත: 220 පිට බලනු. ඒ වනාහි ද්‍රව්‍ය ස්වරූප හෙයින් ලිඞ්ග- සඞ්ඛ්‍යා- විභක්තීන් භජනය කෙරේ.)

b. පච්‍යතෙ, පැසීම නු යි; තත්, එය; පචනම්, යු ප්‍රත්‍යය වීමෙන් "පචන" නම් වේ. පාකඃ, ඝඤ් ප්‍රත්‍යය වීමෙන් "පාක" නම් වේ. (මතු උදාහරණ ද එසේ දත යුතු ය.) ත්‍යජවයොහානෞ:- ත්‍යජ්‍යතෙ, හැරීම නු යි; තත්, ඒ; ත්‍යජනම්, "ත්‍යජන" නම් ද; ත්‍යාගඃ, "ත්‍යාග" නම් ද වේ. භජ්‍යතෙ, සෙවනය කිරීම නු යි; තත්, එය; භජනම්, "භජන" නම් ද; භාගඃ, "භාග" නම් ද වේ. ඉජ්‍යතෙ, යාග කිරීම නු යි; තත්, එය; යජනම්, "යජන" නම් ද; යාගඃ, "යාග" නම් ද වේ. විභජ්‍යතෙ, බෙදීම නු යි; තත්, එය; විභජනම්, "විභජන" නම් ද; විභාගඃ, "විභාග" නම් ද වේ. යුජිර් යොගෙ:- අනුප්‍රයුජ්‍යතෙ, අනුව යෙදීම නු යි; අසෞ, මෙතෙමේ; අනු ප්‍රයොගඃ, "අනුප්‍රයොග" නමි. අනු උච්‍යතෙ, අනුව කීම නු යි; තත්, එය; අනුවචනම්, "අනුවචන" නම් ද; අනුවාකඃ, "අනුවාක" නම් ද වේ. ඉණ් ගතෞ:- [නන්‍දාදිත්වාත්, නන්‍දාදිය බැවින්; යුඃ, යු ප්‍රත්‍යය වේ. තතඃ, ඉන් පසු; අනාදෙශඃ, "අන" ආදෙශ වේ. ගුණඃ, යු ප්‍රත්‍යය විෂයෙහි ගුණ වේ. වෘද්ධිඃ, ඝඤ් ප්‍රත්‍යය විෂයෙහි වෘද්ධි වේ.] (ඊයතෙ= යෑම නු යි; තත්, ඒ;) අයනම්- ආයඃ, "අයන" නම් ද "ආය" නම් ද වේ. භූයතෙ, වීම නු යි; තත්, එය; භවනම්,

---

* මේ [ ] වරහන් තුළ කොටස වැඩි සේ පෙණේ.

† "ක්‍රියායාඃ සාධ්‍යතාවස්ථා-සිද්ධාවස්ථා ච කීර්තිතා,
සිද්ධතාං ද්‍රව්‍යමිවජහාති- තත්‍රෛවෙවජහාති ඝඤ්විධිම්." තත්ත්වදීපිකා.

**a. භාවෙ කරණෙ'පි ඝඤි රඤ්ජෙර්නලොපො වාච්‍යඃ. රජ්‍යතෙ අනෙනෙති රඤ්ජනං වා= රාගඃ. භාවෙ කිම්? රජ්‍යතෙ 'ස්මින්නිති= රඞ්ගඃ. රභ රාභස්‍යෙ, රභලභොඃ ස්වරෙ ඝාද්‍යපෞ විනා නුම් වාච්‍යඃ. ආරම්භඃ. අඤ්චු ගතිපූජනයොඃ, පරිතඃ අඤ්චතීති= පර්‍ය්‍යඞ්කඃ.**

## 68. සංඥායාමකර්තරි ච. (සංඥායාම්7-1.අකර්තරි7-1.ච-නි:)

**b. ධාතොඃ කර්තෘවර්ජිතෙ කාරකෙ භාවෙ කර්මණි ච ඝඤ් ප්‍රත්‍යයො භවති සංඥායාං විෂයෙ.**

---

"භවන" නම් ද; භාවඃ, "භාව" නම් ද වේ. "ආතො යුක්" යන්නෙන් යුගාගම වේ. දීයතෙ, දීම නු යි; තත්, එය; දානම්, "දාන" නම් ද; දායඃ, "දාය" නම් ද වේ. පීයතෙ, බීම නු යි; තත්, ඒ; පානම්, "පාන" නම් ද; පායඃ, "පාය" නම් ද වේ.

a. භාවෙ කරණෙ අපි, භාවයෙහි ද කරණාර්ථයෙහි ද වූ; ඝඤි, ඝඤ් ප්‍රත්‍යය පර කල්හි; රඤ්ජෙඃ, රන්ජ් ධාතුහුගේ; නලොපඃ, නකාර ලොපය; වාච්‍යඃ, කිය යුතු යි. අනෙන, මේ කරණ කොට ගෙණ; රජ්‍යතෙ ඉති, රඳවනු ලැබේ නු යි හෝ; රඤ්ජනං වා, රැඳීම හෝ; රාගඃ, "රාග" නම්. භාවෙ කිම්, භාවෙ යනු කිම? "රජ්‍යතෙ අස්මින් ඉති= රඞ්ගඃ" (=මෙහි ඇලේ නු යි "රඞ්ග" නම්.) යන තැන්හි නකාර ලොපය නො වනු පිණිස යි. (එහි ආධාරයෙහි ඝඤ් ප්‍රත්‍යය යි.) රභ රාභස්‍යෙ, රභලභොඃ -පෙ- වාච්‍යඃ, 148 පිට බලනු. ආරම්භඃ, (ආරභ්‍යතෙ= ඇරඹීම නු යි) "ආරම්භ" නම්. අඤ්චු- පරිතඃ අඤ්චතීති, හාත්පසින් යේ නු යි; පර්‍ය්‍යඞ්කඃ, පලඟ "පර්‍ය්‍යඞ්ක" නම්. (කර්තෘ කාරකයෙහි ඝඤ් ප්‍රත්‍යය යි. කර්තෘ කාරකයෙහි ඝඤ් ප්‍රත්‍යය නො වන බව අනන්තර සූත්‍රයෙන් දක්වූව ද ඇතැම් තැන්හි සංඥාවක් වාච්‍ය කල්හි කර්තෘකාරකයෙහිත් වන බව මෙයින් හැඟේ.)

68. ඝඤ් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතොඃ- ඝඤ් භාවෙ යන සූත්‍ර අනුවෘත්ත යි. සංඥායාම්, සංඥාවක් වාච්‍ය කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; අකර්තරි, කර්තෘ වර්ජිත කාරකයෙහි ද; භාවෙ ච, භාවයෙහි ද; ඝඤ්, ඝඤ් ප්‍රත්‍යය වේ.

b. සංඥායාං විෂයෙ, සංඥා විෂයෙහි; කර්තෘවර්ජිතෙ කාරකෙ, කර්තෘකාරකය තොර කොට ඇති සෙසු කාරකයෙහි ද;

**ඝ. කාර්‍යං කාර්‍යං ප්‍රති ආහ්‍රියතෙ ඉති= ප්‍රත්‍යාහාරඃ. දීයතෙ අස්මින් ඉති= දායඃ.* පීයතෙ අස්මින් ඉති = පායඃ. වික්‍රියතෙ අනෙන ඉති= විකාරඃ. මෘජූෂ් ශුද්ධෞ, ආපාමෘජ්‍යතෙ අනෙනෙති= අපාමාර්ගඃ. ලිඛ ආලෙඛනෙ, ලිඛ්‍යතෙ'ස්මින්නිති= ලෙඛඃ. ආචර්‍යතෙ'ස්මින්නිති= ආචාරඃ. උපාධීයතෙ'ස්මාදිති= උපාධ්‍යායඃ.**

---

භාවෙ, භාවයෙහි ද; කර්‍මණි ච, කර්‍ම කාරකයෙහි ද; ධාතොඃ, ධාතුහු කෙරෙන්; ඝඤ් ප්‍රත්‍යයඃ භවති, ඝඤ් ප්‍රත්‍යය වේ. ("සංඥායාමසංඥායාඤ්ච" යි සංඥාවාචක නො වන කල්හිත් මේ ප්‍රත්‍යය වන බව සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි කීහ.)

ඝ. කාර්‍යං කාර්‍යං ප්‍රති, කටයුත්තක් පසා; ආහ්‍රියතෙ ඉති, ගණු ලැබේ නු යි; ප්‍රත්‍යාහාරඃ, "ප්‍රත්‍යාහාර" නම්. ව්‍යාකරණ සංඥාවකි. අස්මින්, මෙහි; දීයතෙ ඉති, දෙනු ලැබේ නු යි; දායඃ, දානස්ථානය "දාය" නම්. අස්මින්, මෙහි; පීයතෙ ඉති, බොනු ලැබේ නු යි; පායඃ, "පාය" නම්. (ලිඳ විය යුතු යි. පුල්ලිඞ්ග 'පාය' ශබ්දයක් කොෂයන්හි නැත. පානීයාර්ථයෙහි පවත්නා "පාය්‍ය" ශබ්දයට සමාන 'පාය' ශබ්දයෙක් වෛද්‍යක ශබ්ද සින්ධුවෙහි පෙණේ. එය නපුංසක ලිඞ්ගික ය.) අනෙන, මේ කාරණ කොට ගෙණ; වික්‍රියතෙ ඉති, වෙනස් කරණු ලැබේ නු යි; විකාරඃ, විකෘත ස්වභාවය "විකාර" නම්. මෘජූෂ්— අනෙන, මෙයින්; අපාමෘජ්‍යතෙ ඉති, පිරිසිදු කරණු ලැබේ නු යි; අපාමාර්ගඃ, සැබෝ ගස "අපාමාර්ග" නම්. ලිඛ— අස්මින්, මෙහි; ලිඛ්‍යතෙ ඉති, ලියනු ලැබේ නු යි; ලෙඛඃ, පත්‍රය "ලෙඛ" නම්. අස්මින්, මෙහි; ආචර්‍යතෙ, හැසිරීම වේ නු යි; ආචාරඃ, චරිතය "ආචාර" නම්. අස්මාත්, මොහු කෙරෙන්; උප අධීයතෙ ඉති, ලඟ හදරණු ලැබේ නු යි; උපාධ්‍යායඃ, ඇදුරු තෙමේ "උපාධ්‍යාය" නම්. (ෂට් කාරකයෙහි වූ ඝඤ් ප්‍රත්‍යයට උදාහරණ මෙසේ යි:-

| | | |
|---|---|---|
| 1 | කර්‍මකාරකයෙහි : | කාර්‍යං කාර්‍යං ප්‍රති ආහ්‍රියතෙ ඉති= ප්‍රත්‍යාහාරඃ. |
| 2 | කර්තෘ „ : | පරිතඃ අඤ්චතීති= පර්‍යඞ්කඃ. |
| 3 | කරණ „ : | වික්‍රියතෙ අනෙනෙති= විකාරඃ. |
| 4 | සම්ප්‍රදාන „ : | දීයතෙ අස්මෛ ඉති= දායඃ. |
| 5 | අවධි „ : | උපාධීයතෙ 'ස්මාදිති= උපාධ්‍යායඃ. |
| 6 | ආධාර „ : | ලිඛ්‍යතෙ 'ස්මින්නිති= ලෙඛඃ.) |

---

* දීයතෙ'ස්මෛ= දායඃ, සි: ව: දුවැද්ද ද "දාය" නම්. එකල්හි මේ විග්‍රහ නො යෙදේ. "පර්‍යඞ්ක" ශබ්දයෙහි ද කර්තෘකාරක විග්‍රහය නො යෙදේ ය යි හඟිමු.

## 69. ස්වරාදඃ. (ස්වරාත් 5- 1. අඃ 1- 1.)

**a, ඉ-උ-ඍවර්ණාන්තෙභ්‍යඃ ධාතුභ්‍යඃ අඃ ප්‍රත්‍යයො භවති භාවාදෞ. සඤ්ඥ‍ාපවාදඃ.**

**b. සඤ්චීයතෙ'සෞ= සඤ්චයඃ. චයනං- චයඃ. ජීයතෙ ඉති= ජයඃ. නීයතෙ තත්= නයනං නයඃ. උන්නීයතෙ ඉති= උන්නයඃ. නූයතෙ තත්= නවනං- නවඃ. ලවනං- ලවඃ. ස්තූයතෙ තත්= ස්තවනං- ස්තවඃ. කෘෘ වික්ෂෙපෙ, කිරීයතෙ ඉති= කරඃ. ගරඃ.* නෘ වික්ෂෙපෙ, න්රියතෙ වික්ෂිප්‍යතෙ කාමාදිභිරිති= නරඃ. ෂිඤ් බන්ධනෙ, විශෙෂෙණ සීයතෙ බධ්‍යතෙ අනෙනෙති= විෂයඃ.**

---

69. අ ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතොඃ යනු ද, "සඤ් භාවෙ" යි භාවෙ යනු ද, "සංඥායාමකර්තරි ච" යි අකර්තරි යනු ද අනුවෘත්ත යි. ස්වරාත් ධාතොඃ, ස්වරාන්ත ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි ද; අකර්තරි, කර්තෘවර්ජිත කාරකයෙහි ද; අඃ, අ ප්‍රත්‍යය වේ.

a. ඉ- උ- ඍවර්ණාන්තෙභ්‍යඃ ධාතුභ්‍යඃ, ඉවර්ණාන්ත- උවර්ණාන්ත- ඍවර්ණාන්ත ධාතූන් කෙරෙන්; භාවාදෞ, භාව කාරකාදි යෙහි; අඃ ප්‍රත්‍යයඃ භවති, අ ප්‍රත්‍යය වේ. සඤඃ අපවාදඃ, සඤ් ප්‍රත්‍යයාගේ වැළැක්ම වේ. (සූත්‍රයෙහි "ස්වරාත්" යි සාමාන්‍යයෙන් කී නමුත් අවර්ණාන්ත ධාතූන් කෙරෙන් හා "සන්ධ්‍යක්ෂරාණාමා" යි ආකාරාන්ත වීමෙන් අවර්ණාන්ත ගණයට ම ගැණෙන හෙයින් සන්ධ්‍යක්ෂරාන්ත ධාතූන් කෙරෙන් ද මේ අප්‍රත්‍යය නො වන බව හැඟේ. එහෙයින් සෙසු ස්වරාන්ත ධාතූන් කෙරෙන් වන බව දක්වනුවස් සූත්‍රවෘත්තියෙහි "ඉ- උ- ඍවර්ණාන්තෙභ්‍යඃ" යි කීහ.)

b. සඤ්චීයතෙ, රැස් කරණු ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; (=රාශිය;) සඤ්චයඃ, "සඤ්චය" නමි. (චීයතෙ තත්= රැස් කිරීම නු යි එය;) චයනං- චයඃ, "චයන" නම් ද, "චය" නම් ද වේ. ජීයතෙ ඉති= ජයඃ, දිනී ම නු යි "ජය" නමි. නීයතෙ, පැමිණවීම නු යි; තත්, එය; නයනං- නයඃ "නයන" නම් ද, "නය" නම් ද වේ. උන්නීයතෙ ඉති= උන්නයඃ, උඩට පැමිණවීම නු යි "උන්නය" නමි. නූයතෙ, පැසසීම නු යි; තත්, එය; නවනං- නවඃ, "නවන" නම් ද, "නව" නම් ද වේ. (ලූයතෙ තත්= සිඳීම නු යි එය;) ලවනං- ලවඃ, "ලවන" නම් ද, "ලව" නම් ද වේ. ස්තූයතෙ, ස්තුති කිරීම නු යි; තත්, එය; ස්තවනං- ස්තවඃ, "ස්තවන" නම් ද, "ස්තව" නම් ද වේ. කෘෘ—

---

* ක්‍රියතෙ කාසීමනෙනෙති= කරඃ. ගිරත්‍යනෙනෙති= ගරඃ, සි: ච:

## 70. මදාම්.* (මදාම් 6- 3.)

**a. මදාදීනාම් අඃ ප්‍රත්‍යයො භවති භාවාදෞ කර්තෘවර්ජිතෙ.**

**b. මදී හර්ෂෙ, මද්‍යතෙ තත්= මදනං-- මදඃ. ප්‍රමද්‍යතෙ අනෙනෙති= ප්‍රමදඃ. ප්‍රමාද්‍යති†පුරුෂො'නයා සා= ප්‍රමදා. පණ්‍යතෙ තත්= පණනං-- පණඃ. ශමු- දමු උපශමෙ, ශම්‍යතෙ'සෞ= ශමඃ. දමනං-- දමඃ. ශ්‍රම ඛෙදෙ, ශ්‍රම්‍යතෙ ඉති= ශ්‍රමඃ. භ්‍රමඃ.**

---

කීර්‍ය්‍යතෙ ඉති= කරඃ, විසුරුවනු ලැබේ නු යි අත හෝ රශ්මිය "කර" නම්. ගරඃ, (ගීර්‍ය්‍යතෙ ඉති= වමාරණු ලැබේ නු යි;) විෂ "ගර" නම්. තෘඃ— කාමාදිභිඃ, කාමාදීන් විසින්; 'තීර්‍ය්‍යතෙ' යි සේ යි; වික්ෂිප්‍යතෙ, විසුරුවනු ලැබේ නු යි; තරඃ, මිතිසා "තර" නම්. ෂිඤ්— අනෙන, මේ කරණ කොට ගෙණ; විශෙෂෙණ, වෙසෙසින්; 'සීයතෙ' යි සේ යි; බධ්‍යතෙ ඉති, බඳිනු ලැබේ නු යි; විෂයඃ, පස්කම් "විෂය" නම්. (මේ උදාහරණයන්හි ධාතුහට ගුණ විය.)

70. අ ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. භාවෙ- අකර්තරි යනු ද, "ඝවරුදඃ" යි අඃ යනු ද අනුවෘත්ත යි. මදාම්, මද් ආදි ධාතූන් සම්බන්ධ ව; භාවෙ, භාවයෙහි ද; අකර්තරි, කර්තෘවර්ජිත කාරකයෙහි ද; අඃ, අ ප්‍රත්‍යය වේ.

a. මදාදීනාම්, මද් ආදි ධාතූන් සම්බන්ධ ව; කර්තෘවර්ජිතෙ භාවාදෞ, කර්තෘ කාරකය තොර කොට ඇති භාව ආදියෙහි; අඃ ප්‍රත්‍යයඃ භවති, අ ප්‍රත්‍යය වේ. (බාහුලක වශයෙන් ඝඤ් ප්‍රත්‍යය ද වේ.)

b. මදී— මද්‍යතෙ, සතුටු වීම නු යි; තත්, එය; මදනම්, "මදන" නම් ද; මදඃ, "මද" නම් ද වේ. අනෙන, මේ කරණ කොට ගෙණ; ප්‍රමද්‍යතෙ ඉති, ප්‍රකර්ෂයෙන් මත් වීම නු යි; ප්‍රමදඃ, සතුට "ප්‍රමද" නම්. අනයා, මෑ කරණ කොට ගෙණ; පුරුෂඃ, පුරුෂ තෙමේ; ප්‍රමාද්‍යති, ප්‍රකර්ෂයෙන් මත් වේ නු යි; සා, ඕතොමෝ (=උතුම් ස්ත්‍රිය;) ප්‍රමදා, "ප්‍රමදා" නමු. පණ්‍යතෙ, විකිණීම නු යි; තත්, එය; පණනං- පණඃ, "පණන" නම් ද, "පණ" නම් ද වේ. ශමු- දමු— ශම්‍යතෙ, සන්සිඳීම නු යි; අසෞ, මෙතෙමේ; ශමඃ, "ශම" නම්. දමනං- දමඃ, (දම්‍යතෙ තත්= හික්මීම නු යි එය;) "දමන" නම් ද, "දම" නම් ද වේ. ශ්‍රම— ශ්‍රම්‍යතෙ ඉති= ශ්‍රමඃ,

---

* මදාම:- පොත්හි. † ප්‍රමද්‍යතෙ- පොත්හි.

**යමු උපරමෙ, යම්‍යතෙ ඉති= යමඃ. දිව්‍යති විශ්වමනෙනෙති= දෙවඃ. ජඞ්ගම්‍යතෙ'සෞ= ජඞ්ගමඃ. හිසි හිංසායාම්, හිංසෙර්වර්ණ විපර්යයශ්ච, * චකාරාදඃ ප්‍රත්‍යයඃ. හිනස්තීති= සිංහඃ.**

**a. මූර්තෞ ඝනඃ. †**

**b. මූර්තෞ කාඨින්‍යෙ පරිච්ඡෙදෙ'ර්ථෙ චාභිධෙයෙ හන්තෙරඃ ප්‍රත්‍යයො භවති භාවාදෞ, හන්තෙර්ඝනාදෙශශ්ච. දධිකාඨින්‍යං හන්‍යතෙ ඉති= දධිඝනඃ. පරිච්ඡින්නං සෛන්ධවං හන්‍යතෙ ඉති= සෛන්ධවඝනඃ. හනො වධාදෙශශ්චාප්‍රත්‍යයඃ, හන්‍යතෙ ඉති= වධඃ.**

---

විඩාපත් වීම නු යි "ශ්‍රම" නම්. භ්‍රමඃ, (භ්‍රම්‍යතෙ ඉති= කරකැවීම නු යි;) "භ්‍රම" නම්. යමු— යම්‍යතෙ ඉති= යමඃ, සංවරණය කිරීම නු යි "යම" ‡ නම්. අනෙන, මේ කරණ කොට ගෙණ; විශ්වම්, සියල්ල; දීව්‍යති ඉති, දිනනු කැමති වේ නු යි; දෙවඃ, "දෙව" නම්. ජඞ්ගම්‍යතෙ, අතිශයින් හෝ නැවත නැවත ගමන් කෙරේ නු යි; අසෞ, මෙතෙමේ; ජඞ්ගමඃ, "ජඞ්ගම" නම්. (යඞන්ත 'ගම්' ධාතු යි. යඞ් ප්‍රත්‍යයට ලොප් විය.) හිසි— හිංසෙඃ, හිංස් ධාතුහුගේ; වර්ණ විපර්යයඃ ච, වර්ණ විපර්යාසය ද වේ. චකාරයත්, "වර්ණවිපර්යයශ්ච" යන මෙහි ච ශබ්දයෙන්; අඃ ප්‍රත්‍යයඃ, අ ප්‍රත්‍යය වේ. හිනස්තීති= සිංහඃ, හිංසා කෙරේ නු යි "සිංහ" නම්. (මේ 'ජඞ්ගම– සිංහ' දෙක කර්තෘකාරකයෙහි ය.)

a. මූර්තෞ, මූර්ත්‍යර්ථයෙහි (හන් ධාතුහු කෙරෙන් අ ප්‍රත්‍යය වේ.) ඝනඃ, ඝන ආදෙශ ද වේ.

b. 'මූර්තෞ' යි සේ යි; කාඨින්‍යෙ අර්ථෙ, කාඨින්‍ය භාවාර්ථයක් ද; පරිච්ඡෙදෙ අර්ථෙ ච, පරිච්ඡෙදාර්ථයක් ද; අභිධෙයෙ, කිය යුතු කල්හි; හන්තෙඃ, හන් ධාතුහු කෙරෙන්; භාවාදෞ, භාව ආදියෙහි; අඃ ප්‍රත්‍යයඃ භවති, අ ප්‍රත්‍යය වේ. හන්තෙඃ, හන් ධාතුහට; ඝනාදෙශඃ ච, 'ඝන' ආදෙශ ද වේ. (මෙහි ආදෙශය "ඝන්" යනු යි. අකාරය ඉත් ය. 'මූර්ති' නම් තද බව යි. 'පරිච්ඡෙද' නම් පිරිසිඳීම යි.) දධිකාඨින්‍යම්, දධි කාඨින්‍යය; හන්‍යතෙ ඉති, නසනු ලැබේ නු යි;

---

* සිංහෙ වර්ණවිපර්යයශ්ච- පොත්හි.

† පාණිනිය 3- 3- 77. මෙය මෑතක දී සාරස්වත සූත්‍රපාඨයට ඇතුළත් වූවක් විය යුතු යි.

‡ "අහිංසා සත්‍යවචනං- බ්‍රහ්මචර්‍ය්‍යමකල්කතා,
අස්තෙයමිති පඤ්චෛතෙ- යමාඛ්‍යානි ව්‍රතානි චෙත්."

## 71 ට්විතො'ථුඃ. (ට්විතඃ 5-1. අථුඃ 1-1.)

**a. ට්විතො ධාතොරථුඃ ප්‍රත්‍යයො භවති භාවාදෞ.**

**b. ටුවෙපෘ කම්පනෙ, වෙප්‍යතෙ අනෙනෙති= වෙපථුඃ. ටුනදි සමෘද්ධෞ, නන්ද්‍යතෙ අනෙනෙති= නන්දථුඃ. ටුවප් බීජ සන්තානෙ, උප්‍යතෙ ඉති=වපථුඃ. ටුක්ෂෙපෘ ක්ෂෙපණෙ, ක්ෂෙප්‍යතෙ අනෙනෙති= ක්ෂෙපථුඃ. ටුඔශ්විඉර් ගතිවෘද්ධ්‍යොඃ, ශ්වයථුඃ. ටුක්ෂු ශබ්දෙ, ක්ෂූයතෙ ඉති= ක්ෂවථුඃ. ටුවම් උද්ගිරණෙ, වමථුඃ.**

---

දධිඝ්නඃ, හන්තව්‍ය (=පොඩි කළ යුතු) තද දී "දධිඝ්න" නම්. හන්‍යතෙ ඉති, නසනු ලැබේ නු යි; (= වෙන් කරණු ලැබේ නු යි;) පරිච්ඡින්නං සෛන්ධවම්, පිරිසිඳින ලද සිඳුලුණු කැටය; සෛන්ධවඝ්නඃ, "සෛන්ධවඝ්න" නම්. හනඃ, 'හන්' ධාතුහට; වධාදෙශඃ, "වධ" ආදෙශය ද; අප්‍රත්‍යයඃ ච, අ ප්‍රත්‍යය ද වේ. හන්‍යතෙ ඉති, නැසීම නු යි; වධඃ, "වධ" නම්.

71. අථු ප්‍රත්‍යය විධි සූත්‍ර යි. පෙර සේ **ධාතොඃ**- භාවෙ- අකර්තරි යනු අනුවෘත්ත යි. ට්විතඃ ධාතොඃ, ටු යන්න ඉත් කොට ඇති ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි ද; අකර්තරි, කර්තෘවර්ජිත කාරකයෙහි ද; අථුඃ, අථු ප්‍රත්‍යය වේ.

a. ට්විතඃ ධාතොඃ, ටු යන්න ඉත් කොට ඇති ධාතුහු කෙරෙන්; භාවාදෞ, භාවකාරකාදියෙහි; අථුඃ ප්‍රත්‍යයඃ භවති, අථු ප්‍රත්‍යය වේ. ("භාවාදෞ" යි සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි ද කී නමුත් මේ ප්‍රත්‍යය භාවයෙහි ම වේ ය යි සුබොධිනී ටීකාකාරයෝ කියත්.)

b. ටුවෙපෘ— අනෙන, මෙයින්; වෙප්‍යතෙ ඉති, කම්පා වීම නු යි; වෙපථුඃ, "වෙපථු" නම්. ටුනදි—අනෙන, මෙයින්; නන්ද්‍යතෙ ඉති, සතුටු වීම නු යි; නන්දථුඃ, "නන්දථු" නම්. ටුවප්— උප්‍යතෙ ඉති= වපථුඃ, වැපිරීම නු යි "වපථු" නම්. ටුක්ෂෙපෘ— ක්ෂෙප්‍යතෙ අනෙන ඉති= ක්ෂෙපථුඃ, මෙයින් විසුරුවීම නු යි "ක්ෂෙපථු" නම්. ටුඔශ්විඉර්— ශ්වයථුඃ, (ශූයතෙ ඉති= වැඩීම හෙවත් ඉදිමීම නු යි;) "ශ්වයථු" නම්. ටුක්ෂු—ක්ෂූයතෙ ඉති= ක්ෂවථුඃ, කිවිසීම නු යි "ක්ෂවථු" නම්. ටුවම්— වමථුඃ, (වම්‍යතෙ ඉති=වැමෑරීම නු යි;) "වමථු" නම්.

## 72. ඩ්විතස්ත්‍රිමක් තත්කෘතෙ. *

(ඩ්විතඃ 5-1. ත්‍රිමක් 1-1. තත්කෘතෙ 7-1.)

**a. ඩ්විතො ධාතොස්ත්‍රිමක් ප්‍රත්‍යයො භවති තෙන ධාත්වර්ථෙන කෘතෙ'ර්ථෙ වාච්‍යෙ සති.**

**b. ක්‍රියයා නිර්වෘත්තඃ= කෘත්‍රිමඃ, ඝටඃ. සමහාරෙණ සම්භෘතං වා නිර්වෘත්තං= සම්භෘත්‍රිමම්, යුද්ධම්. පාකෙන නිර්වෘත්තම්= පක්ත්‍රිමම්, ඵලම්. යාචනෙන නිර්වෘත්තං= යාචිත්‍රිමම්, කිම්? විප්‍රධනම්.**

## 73. නඩ්කී. (නඩ්කී 1-2.)

---

72. ත්‍රිමක් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **ධාතොඃ** යනු අනුවෘත්ත යි. ඩ්විතඃ ධාතොඃ, ඩු යන්න ඉත් කොට ඇති ධාතූහු කෙරෙන්; තත්කෘතෙ, එයින් කරණ ලද ය යන අර්ථයෙහි; ත්‍රිමක්, ත්‍රිමක් ප්‍රත්‍යය වේ.

a. ඩ්විතඃ ධාතොඃ, ඩුකාරානුබන්ධ ධාතූහු කෙරෙන්; තෙන ධාත්වර්ථෙන; ඒ ධාත්වර්ථයෙන්; කෘතෙ අර්ථෙ වාච්‍යෙ සති, කරණ ලද ය යන අර්ථය වාච්‍ය කල්හි; ත්‍රිමක් ප්‍රත්‍යයඃ භවති, ත්‍රිමක් ප්‍රත්‍යය වේ. (කිත් බැවින් ධාතුහට ගුණ නො වේ.)

b. ක්‍රියයා නිර්වෘත්තඃ= කෘත්‍රිමඃ, කිරීමෙන් නිපන්නේ "කෘත්‍රිම" නම්. ඝටඃ, කළය යි. සමහාරෙණ, සමූහයෙන්; සමභෘතං වා, රැස් කරණ ලද්දේ හෝ; නිර්වෘත්තම්, නිපන්නේ; සමභෘත්‍රිමම්, "සමභෘත්‍රිම" නම්. යුද්ධම්, යුද්ධය යි. පාකෙන නිර්වෘත්තං= පක්ත්‍රිමම්, පැසීමෙන් නිපන්නේ "පක්ත්‍රිම" නම්. ඵලම්, ගෙඩිය යි. ("චොඃ කුඃ" යි චයන්තට කයන්ත විය.) යාචනෙන නිර්වෘත්තං= යාචිත්‍රිමම්, යැදීමෙන් නිපන්නේ "යාචිත්‍රිම" නම්. කිම්, කුමක් ද? විප්‍රධනම්, බමුණාගේ වස්තුව යි. ("කෘතඃ" යි ඉඩාගම වේ. "වාපෙන නිර්වෘත්තං= උප්ත්‍රිමම්" යනාදියෙහි "යජාං -පෙ- කිති" යි සම්ප්‍රසාරණ වේ.)

73. නඩ්- කි ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. පෙර සේ **ධාතොඃ- භාවෙ- අකර්තරි** යනු අනුවෘත්ත යි. ධාතොඃ, ධාතූහු කෙරෙන්; භාවෙ, භාවයෙහි ද; අකර්තරි, කර්තෘ වර්ජිත කාරකයෙහි ද; නඩ්කී, නඩ්- කි යන ප්‍රත්‍යය ද්වය වේ.

---

* ඩ්විතස්ත්‍රිමක්- පොත්හි.

**a. ධාතොර්නඞ්කී ඉත්‍යෙතෞ ප්‍රත්‍යයෞ භවතඃ භාවාදෞ.**

**b. යජ යාච් යත් විච්ඡ ප්‍රච්ඡ රක්ෂ ස්වප් එභ්‍යො නඞ් ප්‍රත්‍යයො භවති. "ස්තොඃ ශ්චුගිඃ ශ්චුඃ" අසම්ප්‍රසාරණම්. ඉජ්‍යතෙ අනෙනෙති= යඥඃ. යාච්‍යතෙ සා= යාච්ඤා. යතී ප්‍රයත්නෙ, යත්‍යතෙ තත්= යත්නං- යත්නඃ.**

**c. ඡඃ ශෙන. ***

**d. ඡකාරස්‍ය ශකාරාදෙශො භවති නප්‍රත්‍යයෙ පරෙ භාවාදෞ. ශකාරාදෙශඃ සම්ප්‍රසාරණබාධාර්ථඃ. විච්ඡ ගතෞ, විච්ඡ්‍යතෙ ඉති= විශ්නඃ. ප්‍රච්ඡ ඥීප්සායාම්, පෘච්ඡ්‍යතෙ'සෞ= ප්‍රශ්නඃ. රක්ෂ්‍යතෙ'සෞ= රක්ෂ්ණඃ. සුප්‍යතෙ ඉති= ස්වප්නඃ.**

---

a. ධාතොඃ, ධාතුහු කෙරෙන්; භාවාදෞ, භාව කාරකාදියෙහි; නඞ්කී ඉත්‍යෙතෞ ප්‍රත්‍යයෞ, නඞ්- කි යන මේ ප්‍රත්‍යයෝ දෙදෙනා; භවතඃ, වෙත්. (ඞකාර- කකාර දෙක ඉත් ය. එහෙයින් ගුණ නො වේ. මෙසේ සාමාන්‍යයෙන් විධාන කොට ඉක්බිති ඒ ප්‍රත්‍යය දෙකට වෙන වෙන ම ස්ථාන හා උදාහරණ දක්වත්.)

b යජ—එභ්‍යඃ, යජ්- යාච්- යත්- විච්ඡ්- ප්‍රච්ඡ්- රක්ෂ්- ස්වප් යන මොවුන් කෙරෙන්; නඞ් ප්‍රත්‍යයඃ භවති, නඞ් ප්‍රත්‍යය වේ. "ස්තොඃ ශ්චුභිඃ ශ්චුඃ" යන්නෙන් නකාරයට ඤකාරය වේ. ("ජ්ඤෝර්ඥඃ" යි ඥයන්න වේ.) අසම්ප්‍රසාරණම්, සම්ප්‍රසාරණ නො වේ. අනෙන, මේ කාරණ කොට ගෙණ; ඉජ්‍යතෙ ඉති, යාග කරණු ලැබේ නු යි; යඥඃ, "යඥ" නම්. යාච්‍යතෙ, යැදීම නු යි; සා, ඕතොමෝ; යාච්ඤා, "යාච්ඤා" නම්. (නඞ් ප්‍රත්‍යයාන්තයන් පුල්ලිඞ්ග වුව ද "යාච්ඤා" ශබ්දය ස්වභාවයෙන් ම ස්ත්‍රීලිඞ්ගික ය.) යතී— යත්‍යතෙ, උත්සාහ කිරීම නු යි; තත්, එය; යත්නම්, "යත්න" නම් ද; යත්නඃ, "යත්න" නම් ද වේ.

c. නෙ, න ප්‍රත්‍යය පර කල්හි; ඡඃ, ඡකාරයට; ශ්, ශකාරය වේ.

d. භාවාදෞ, භාවාදියෙහි වූ; නප්‍රත්‍යයෙ පරෙ, න ප්‍රත්‍යය පර කල්හි; ඡකාරස්‍ය, ඡකාරයට; ශකාරාදෙශඃ භවති, ශකාරාදෙශ වේ. ශකාරාදෙශඃ, (මේ) ශකාරාදෙශය; සම්ප්‍රසාරණබාධාර්ථඃ, සම්ප්‍ර

---

* පෙර කෘදන්ත ප්‍රක්‍රියායෙහි "ඡ්වොඃ ශඨෞ වාවෙශෞ ක්නි ඣි ඣලෙ පරෙ 'නුනාසිකෙ ක්වෞ ච" යන්නෙන් මේ ආදෙශය ද විහිත හෙයින් මෙය නිරර්ථක ය යි හැඟේ. 301 පිට බලනු.

a. උපසර්ගකර්මාධාරෙෂු දධොඃ කිඃ.

b. උපසර්ගෙ කර්මණ්‍යුපපදෙ ආධාරෙ ච දධොඃ කිඃ ප්‍රත්‍යයො භවති. අන්තර්ධීයතෙ ඉති= අන්තර්ධිඃ. ආධීයතෙ තත්= ආධානම්- ආධිඃ. ආදීයතෙ තත්= ආදානම්- ආදිඃ. "ආතො 'නපි" ඉත්‍යාකාරලොපඃ. විධීයතෙ තත්= විධානං- විධිඃ. සන්ධීයතෙ තත්= සන්ධානං- සන්ධිඃ.

---

සාරණය වැලැක්වීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. (මෙයින් 'විඡ්– ප්‍රඡ්' ධාතු දෙකේ ඡකාරයට ශකාරය වේ. විච්ඡි—විච්ඡ්‍යතෙ ඉති, පිවිසීම නු යි; විශනඃ, "විශන" නම්. ප්‍රච්ඡ— පෘච්ඡ්‍යතෙ, විචාරීම නු යි; අසෙඖ, මෙතෙමේ; ප්‍රශනඃ, "ප්‍රශන" නම්. රක්‍ෂ්‍යතෙ, රැකීම නු යි; අසෙඖ, මෙතෙමේ; රක්‍ෂ්ණඃ, "රක්‍ෂ්ණ" නම්. සුප්‍යතෙ ඉති, නිඳීම නු යි; සවප්නඃ, "සවප්න" නම්. (මේ නඞ් ප්‍රත්‍යයට උදාහරණ යි.)

a. උපසර්ගකර්මාධාරෙෂු, උපසර්ග– කර්ම– ආධාරයන් උපපද ව ඇති කල්හි; දධොඃ, දා- ධා ධාතු සම්බන්ධ ව; කිඃ, කි ප්‍රත්‍යය වේ.

b. උපසර්ගෙ, උපසර්ගයක් ද; කර්මණි, කර්මයක් ද; ආධාරෙ ච, ආධාරයක් ද; උපපදෙ, උපපද ව ඇති කල්හි; දධොඃ, දා- ධා ධාතු දෙක සම්බන්ධ ව; කිඃ ප්‍රත්‍යයඃ භවති, කි ප්‍රත්‍යය වේ. ("උපසර්ගෙ ඝොඃ කිඃ– කර්මණ්‍යධිකරණෙ ච" යන පාණිනීය සූත්‍ර දෙක එක යොග කිරීමෙන් මෙය හදළ බව පෙණේ. උපසර්ගොපපද කල්හි භාවාර්ථයෙහි ද, කර්මොපපද කල්හි ආධාරාර්ථයෙහි ද 'දා– ධා' ධාතූන් කෙරෙන් කි ප්‍රත්‍යය වන බව ඒ සූත්‍ර දෙකින් දක්වත්. එබැවින් මෙහි ද එසේ ගැණීම යුක්තතර ය. ආධාරොපපද කල්හි කි ප්‍රත්‍යය වූ බවට මෙහි උදාහරණ ද නො දක්වේ.)

අන්තර්ධීයතෙ ඉති= අන්තර්ධිඃ, අතුරුදන් වීම නු යි "අන්තර්ධි" නම්. (මේ "අන්තර්" යන්න ද උපසර්ග සඞ්ඛ්‍යාවට ම ගැණේ.) ආධීයතෙ, දැරීම නු යි; තත්, එය; ආධානම්, "ආධාන" නම් ද; ආධිඃ, "අධි" නම් ද වේ. ආදීයතෙ, ගැණීම නු යි; තත්, එය; ආදානම්, "ආදාන" නම් ද; ආදිඃ, "ආදි" නම් ද වේ. ආතො'නපි ඉති ආකාර ලොපඃ, "ආතො'නපි" යන සූත්‍රයෙන් ආකාරයට ලොප් වේ. විධීය තෙ, මෙහෙයීම නු යි; තත්, එය; විධානම්, "විධාන" නම් ද; විධිඃ, "විධි" නම් ද වේ. සන්ධීයතෙ, ගැළපීම නු යි; තත්, එය, සන්ධානම්, "සන්ධාන" නම් ද; සන්ධිඃ, "සන්ධි" නම් ද වේ.

a. උදකස්ස.

b. උදකශබ්දස්ස උදදෙසො හවති අධිකරණෙ. උදකං ධීයතෙ'ස්මින්නිති=උදධිඃ, පයොධිඃ. අම්භොනිධීයතෙ යත්‍ර සඃ= අම්භොනිධිඃ.

## 74. යුට් ච. * (යුට් 1-1. ච- නි:)

c. ධාතොභාවෙ යුට් ප්‍රත්‍යයො හවති. "යුවොරනාකො" ඥායතෙ තත්= ඥානම්. ක්‍රියතෙ තත්= කරණම්. දිව්‍යතෙ තත්= දෙවනම්. දීයතෙ තත්=දානම්. භූෂ අලඞ්කාරෙ, භූෂ්‍යතෙ තත්= භූෂණම්. හ්‍රියතෙ තත්= හරණම්. භූයතෙ තත්= භවනම්. උහ්‍යතෙ තත්= වහනම්. භාෂ ව්‍යක්තායාං වාචි,

---

a. උදකස්ස, උදක ශබ්දයට "උද" යනාදෙශ වේ.

b. අධිකරණෙ, ආධාරයක් වාච්‍ය කල්හි; උදකශබ්දස්ස, උදක ශබ්දයට; උදදෙශඃ හවති, 'උද' යනාදෙශ වේ. අස්මින්, මෙහි; උදකං ධීයතෙ ඉති, ජලය දරණු ලැබේ නු යි; උදධිඃ, "උදධි" නම්. පයොධිඃ, (පයො ධීයතෙ'ස්මින්නිති= මෙහි ජලය දරණු ලැබේ නු යි;) "පයොධි" නම්. යත්‍ර, යම් තැනෙක; අම්භඃ, ජලය; නිධීයතෙ, නිශ්ශෙෂයෙන් දරණු ලැබේ ද; සඃ, හෙතෙමේ; අම්භොනිධිඃ, "අම්භොනිධි" නම්. (මේ තුණ ම සමුද්‍රපර්‍යාය නාමයෝ යි. මෙතෙක් කි ප්‍රත්‍යයට උදහරණ යි.)

74. යුට් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. ධාතොඃ යනු ද, "ඝඤ් භාවෙ" යි භාවෙ යනු ද වැටේ. ධාතොඃ, ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි; යුට් ච, යුට් ප්‍රත්‍යය ද වේ.

c. ධාතොඃ, ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි; යුට් ප්‍රත්‍යයඃ හවති, යුට් ප්‍රත්‍යය වේ. (සූත්‍රයෙහි චශබ්දයෙන් ණ්‍යුණ් ප්‍රත්‍යය ද වේ ය යි සුබොධිනියෙහි කීහ. ටකාරය ස්ත්‍රීලිඞ්ගයෙහි ඊප් ප්‍රත්‍යය වනු පිණිස යි. එහෙත් හුදු භාවයෙහි වූ යුට් ප්‍රත්‍යයාන්තයෝ බොහෝ සෙයින් නපුංසක ලිඞ්ගිකයහ.) "යුවොරනාකො" යන සූත්‍රයෙන් 'යු' හට 'අන' ආදෙශ වේ. ඥායතෙ තත්= ඥානම්, දැනීම නු යි එය "ඥාන" නම්. ක්‍රියතෙ තත්= කරණම්, කිරීම නු යි එය "කරණ" නම්. දිව්‍යතෙ තත්= දෙවනම්, ක්‍රීඩා කිරීම නු යි එය "දෙවන නම්." දීයතෙ තත්= දානම්, දීම නු යි එය "දාන" නම්.

---

* භාවෙ යුට්- පොත්හි.

භාෂ්‍යතෙ තත්= භාෂණම්. දූෂ වෛකෘත්‍යෙ, දූෂ්‍යතෙ තත්= දූෂණම්. ගීයතෙ තත්= ගානම්. පීයතෙ තත්= පානම්. මීයතෙ තත්= මානම්.

## 75 උදඃ ස්ථාස්තම්භොඃ. * (උදඃ 5–1. ස්ථාස්තම්භොඃ 6–2.)

a. උදුපසර්ගාත් පරයොඃ ස්ථාස්තම්භයොඃ සකාරස්‍ය ලොපො භවති. උත්ථීයතෙ තත්= උත්ථානම්. ස්තම්භ රොධනෙ, උත්තභ්‍යතෙ †තත්= උත්තම්භනම්.

## 76. සාධනාධාරයොශ්ච. ‡ (සාධනාධාරයොඃ 7–2. ච–නි:)

---

භූෂ— භූෂ්‍යතෙ තත්= භූෂණම්, සැරසීම නු යි එය "භූෂණ" නම්. හ්‍රියතෙ තත්= හරණම්, හැරීම නු යි එය "හරණ" නම්. හූයතෙ තත්= හවනම්, යාග කිරීම නු යි එය "හවන" නම්. උහ්‍යතෙ තත්= වහනම්, ඉසිලීම නු යි එය "වහන" නම්. භාෂ— භාෂ්‍යතෙ තත්= භාෂණම්, කථා කිරීම නු යි එය "භාෂණ" නම්. දූෂ— දූෂ්‍යතෙ තත්= දූෂණම්, දුෂ්ට වීම නු යි එය "දූෂණ" නම්. (උපධාවට දීර්ඝ වේ.) ගීයතෙ තත්= ගානම්, ගැයීම නු යි එය "ගාන" නම්. පීයතෙ තත්= පානම්, බීම නු යි එය "පාන" නම්. මීයතෙ තත්= මානම්, මිනීම නු යි එය "මාන" නම්. ("ක්‍රියතෙ තත්= කාරණම්" යනු යුණ් ප්‍රත්‍යයට උදාහරණ යි.)

75. සකාරලොප විධි සූත්‍ර යි. "උරසඃ සලොපශ්ච" යි සලොපඃ යනු වැටේ. උදඃ, 'උද්' උපසර්ගයෙන් පර වූ; ස්ථාස්තම්භොඃ, ස්ථා- ස්තන්භ් ධාතු දෙදෙනාගේ; සලොපඃ, සකාරලොපය වේ.

a. උද් උපසර්ගාත් පරයොඃ, "උද්" යන උපසර්ගයා කෙරෙන් පර වූ; ස්ථාස්තම්භයොඃ, ස්ථා- ස්තන්භ් යන ධාතු දෙදෙනාගේ; සකාරස්‍ය, සකාරයට; ලොපඃ භවති, ලොප් වේ. උත්ථීයතෙ, නැඟී සිටීම නු යි; තත්, එය; උත්ථානම්, "උත්ථාන" නම්. ස්තම්භ— උත්තභ්‍යතෙ, උඩුකුරු ව තද වීම නු යි; තත්, එය; උත්තම්භනම්, "උත්තම්භන" නම්.

76. යුට් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "යුට් ච" යි යුට් යනු අනුවෘත්ත වේ. සාධනාධාරයොඃ ච, කරණ- ආධාර දෙක්හි ද; යුට්, යුට් ප්‍රත්‍යය වේ.

---

* සලොපශ්ච- යනු පොත්හි අධික යි. "උදඃ ස්ථාදෙඃ" සූත්‍රපාඨඃ "උදඃ ස්ථාස්තම්භොඃ පූර්වස්‍ය" පාඨඃ.

† උත්තම්භ්‍යතෙ- පොත්හි. තලොපය වන හෙයින් ඒ සදොෂ යි.

‡ සාධනාධාරයොර්යුට්- පොත්හි.

**a. සාධනෙ ආධාරෙ චාත්‍ථෙ යුට් ප්‍රත්‍යයො භවති. පච්‍ය තෙ අනෙනෙති= පවනඃ, අග්නිඃ. පච්‍යතෙ'ස්‍යාං ස්ථාල්‍යාං සා= පචනී, ස්ථාලී.**

## 77. ඊෂද්දුඃසුෂු ඛල්‍යු. (ඊෂද්දුඃසුෂු 7-3. ඛල්‍යු 1-2.)

**b. ඊෂදාදිෂු ප්‍රයුජ්‍යමානෙෂු ඛල්‍යු ඉත්‍යෙතෞ ප්‍රත්‍යයෞ භවතඃ භාවාදෞ. ලකාරඃ ප්‍රත්‍යයභෙදඥාපනාර්‍ථඃ. ඛකාරො ගුණවිධානාර්‍ථඃ, මුමාගමාර්‍ථශ්ච. ඊෂත්සු අකෘච්ඡ්‍රාර්‍ථෙ, දුඃ කෘච්ඡ්‍රාර්‍ථඃ.**

---

a. සාධනෙ ආධාරෙ ච අර්‍ථෙ, කරණාර්‍ථයෙහි ද ආධාරාර්‍ථයෙහි ද; යුට් ප්‍රත්‍යයඃ භවති, යුට් ප්‍රත්‍යය වේ. අනෙන, මේ කරණ කොට ගෙණ; පච්‍යතෙ ඉති, පිසනු ලැබේ නු යි; පවනඃ, "පවන" නම්. අග්නිඃ, ගින්න යි. (කරණයෙහි යි.) අස්‍යාං ස්ථාල්‍යාම්, මේ සැළියෙහි; පච්‍යතෙ ඉති, පිසනු ලැබේ නු යි; සා, ඕතොමෝ; පචනී, "පචනී" නමු. ස්ථාලී, සැළිය යි. (ආධාරයෙහි යි.)

77 ඛල්- යු ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "ඝඤ් භාවෙ" යි භාවෙ යනු ද, "සංඥායාමකර්‍තරි ච" යි අකර්‍තරි යනු ද අනුවෘත්ත යි. ඊෂද්දුඃසුෂු- ඊෂත්- දුඃ- සු යන මොවුන් උපපද ව ඇති කල්හි; භාවෙ, භාවයෙහි ද; අකර්‍තරි, කර්‍තෘවර්ජිත කාරකයෙහි ද; ඛල්‍යු, ඛල්- යු යන ප්‍රත්‍යය ද්වය වේ.

b. ඊෂදාදිෂු ප්‍රයුජ්‍යමානෙෂු, ඊෂත් යනාදි උපපදයන් යොදනු ලබන කල්හි; භාවාදෞ, භාව ආදියෙහි; ඛල්‍යු ඉත්‍යෙතෞ ප්‍රත්‍යයෞ, ඛල්- යු යන මේ ප්‍රත්‍යයෝ දෙදෙන; භවතඃ, වෙත්. ලකාරඃ, ඛල් ප්‍රත්‍යයේ ලකාරය; ප්‍රත්‍යයභෙද ඥාපනාර්‍ථඃ, ප්‍රත්‍යය භෙදය හැඟවීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. ("ඉඛඛ්" යි විහිත ඛ ප්‍රත්‍යයෙන් වෙන් කොට හැඳින ගන්නා පිණිස ය කී නියා යි.) ඛකාරඃ, ඛකාරය; ගුණ විධානාර්‍ථඃ, ගුණ විධානය ප්‍රයොජන කොට ඇත්තේ ද; මුමාගමාර්‍ථඃ ච, ("ඛිති පදස්‍ය" යි විහිත) මුමාගමය ප්‍රයොජන කොට ඇත්තේ ද වේ. ඊෂත්සු, ඊෂත්- සු යන අව්‍යයෝ; අකෘච්ඡ්‍රාර්‍ථෙ, පහසු ය යන අර්‍ථ ඇත්තාහ. දුඃ කෘච්ඡ්‍රාර්‍ථඃ, දුස් (=දුර්) යන අව්‍යය දුක අර්‍ථ කොට ඇත්තේ ය.

**බ. ඊෂදනායාසෙන භූයතෙ ඉති= ඊෂද්භවඃ. දුර්භවඃ. සුභවඃ. ඊෂදනායාසෙන ක්‍රියතෙ ඉති= ඊෂත්කරඃ ප්‍රපඤ්චො හරිණා. දුඃඛෙන ක්‍රියතෙ ඉති= දුෂ්කරඃ. සුඛෙන ක්‍රියතෙ'සෞ= සුකරඃ. ඊෂදාඪ්‍යඃ ක්‍රියතෙ ඉති*= ඊෂදාඪ්‍යඞ්කරඃ. දුරාඪ්‍යඞ්කරඃ. ආඪ්‍යඞ්කරශ්චෛත්‍රො භවතා. ඊෂත් පීයතෙ'සෞ= ඊෂත්පානඃ සොමො භවතා. දුෂ්පානඃ. සුපානඃ. යුධි සම්ප්‍රහාරෙ, දුඃඛෙන යොද්ධුං†**

---

බ. ඊෂත් අනායාසෙන භූයතෙ ඉති, 'ඊෂත්' යි සේ යි, නිරායාසයෙන් වීම නු යි; ඊෂද්භවඃ, "ඊෂද්භව" නමි. දුර්භවඃ, (දුඃඛෙන භූයතෙ= දුක සේ වීම නු යි;) "දුර්භව" නමි. සුභවඃ, (සුඛෙන භූයතෙ= සුව සේ වීම නු යි;) "සුභව" නමි. ඊෂත්, සුව සේ; අනායාසෙන, නිරායාසයෙන්; ක්‍රියතෙ ඉති, කරණු ලැබේ නු යි; ඊෂත්කරඃ, "ඊෂත්කර" නමි. හරිණා, විෂ්ණුහු විසින්; ප්‍රපඤ්චඃ, විස්තරය; ඊෂත්කරඃ, මදක් කට හැකි යි. දුඃඛෙන ක්‍රියතෙ ඉති, දුක සේ කරණු ලැබේ නු යි; දුෂ්කරඃ, "දුෂ්කර" නමි. සුඛෙන ක්‍රියතෙ, සුව සේ කරණු ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; සුකරඃ, "සුකර" නමි. ඊෂත්, මදක්; ආඪ්‍යඃ ක්‍රියතෙ ඉති, සමෘද්ධයෙක් කරණු ලැබේ නු යි; ඊෂදාඪ්‍යඞ්කරඃ, "ඊෂදාඪ්‍යඞ්කර" නමි. දුරාඪ්‍යඞ්කරඃ, (දුඃඛෙනාඪ්‍යඃ ක්‍රියතෙ 'නෙනෙති= දුක සේ සමෘද්ධ කරණු ලැබේ නු යි;) "දුරාඪ්‍යඞ්කර" නමි. මේ දෙතැන්හි මුමාගම යි. 'ආඪ්‍ය' ශබ්දය අව්‍යය නො වන හෙයිනි.) භවතා, භවත්හු විසින්; චෛත්‍රඃ, චෛත්‍ර තෙමේ; ආඪ්‍යඞ්කරඃ, සමෘද්ධයෙක් කට හැකි යි. ඊෂත් පීයතෙ, මදක් බොනු ලැබේ නු යි; අසෞ, මෙතෙමේ; ඊෂත්පානඃ, "ඊෂත්පාන" නමි. භවතා, භවත්හු විසින්; සොමඃ, සොම රසය; ඊෂත්පානඃ, මදක් බිය හැකි යි. දුෂ්පානඃ, (දුඃඛෙන පීයතෙ ඉති= දුක සේ බොනු ලැබේ නු යි;) "දුෂ්පාන" නමි. සුපානඃ, (සුඛෙන පීයතෙ ඉති= සුව සේ බොනු ලැබේ නු යි;) "සුපාන" නමි. යුධි— දුඃඛෙන යොද්ධුං ශක්‍යඃ, දුක සේ යුද්ධ කරන්නට හැක්කේ; දුර්යොධනඃ, "දුර්යොධන" නමි. සුඛෙන යොද්ධුං ශක්‍යඃ, සුව සේ පහර දෙන්නට හැක්කේ; සුයොධනඃ, "සුයොධන" නමි. ඊෂත්ශාසනඃ, 'ඊෂදනායාසෙන ශාසිතුං ශක්‍යඃ' (=පහසුවෙන් අනුශාසනා කරන්ට

---

* ක්‍රියතෙ'නෙනෙති- පොත්හි. ඒ නො යෙදේ.

† යොධයිතුම්- පොත්හි. දුඃඛෙන යුධ්‍යතෙ'ස්මාදිති= දුර්යොධනඃ- සි: ච: 'සුයොධන' නම් ද, 'දුර්යොධන' නම් ද එක ම පුද්ගලයෙකි. "සුඛෙන යුධ්‍යතෙ" (=සුව සේ පහර දෙයි) යන වාක්‍යයෙහි කර්තෘකාරකයෙහි 'සුයොධන' ශබ්දය ද, "දුඃඛෙන යුධ්‍යතෙ" (=දුක සේ පහර දෙනු ලැබෙයි) යන වාක්‍යයෙහි කර්මකාරකයෙහි 'දුර්යොධන' ශබ්දය ද නිෂ්පන්න යි.

ශක්‍යඃ = දුශ්ශෝධනඃ. සුඛෙන ශෝද්ධුං ශක්‍යඃ= සුශෝධනඃ. ඊෂත්ශාසනඃ. දුඃඛෙන ශාසිතුං* ශක්‍යඃ= දුඃශාසනඃ. සුශාසනඃ.

## ඉති කෘදන්ත භාවාධිකාර ප්‍රක්‍රියා.

---

**ක. අථ කෘත්‍ය ප්‍රක්‍රියාඃ-තව්‍යාදීනාං කෘත්‍යසංඥා පාණිනීයානාම්. තව්‍යාදිර්භාවකර්මණෝරේව.**

---

හැක්කේ) යන වාක්‍යයෙහි "ඊෂත්ශාසන" නම්. දුඃඛෙන ශාසිතුං ශක්‍යඃ, දුක සේ අනුශාසනා කරන්නට හැක්කේ; දුඃශාසනඃ, "දුඃශාසන" නම්. සුශාසනඃ, 'සුඛෙන ශාසිතුං ශක්‍යඃ' (=සුව සේ අනුශාසනා කරන්නට හැක්කේ) යන වාක්‍යයෙහි "සුශාසන" නම්.

කෘදන්ත, කෘදන්ත ප්‍රකරණයෙහි; භාවාධිකාර ප්‍රක්‍රියා, භාවාධිකාර ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි. (මේ පරිච්ඡේදය භාවාධිකාර නම් වුව ද මෙහි ප්‍රත්‍යයෝ මුඛ්‍ය වශයෙන් භාවයෙහිත්, අමුඛ්‍ය වශයෙන් කර්මාදි කාරකයන්හිත් විහිතයහ.)

---

## භාවාධිකාර ප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාව නිමි.

---

ක. අථ, ඉක්බිති; කෘත්‍යප්‍රක්‍රියා, කෘත්‍ය සංඥ ප්‍රත්‍යයන් පිළිබඳ ප්‍රක්‍රියාව දක්වනු ලැබේ. තව්‍යාදීනාම්, තව්‍ය ආදි ප්‍රත්‍යයන්ගේ; කෘත්‍යසංඥා, 'කෘත්‍ය' යන සංඥා තොමෝ; පාණිනීයානාම්, පාණිනීය ආචාර්‍ය්‍යවරයන්ගේ යි. (මේ තව්‍ය- අනීය- ය- ක්‍යණ්- ක්‍යප් යන ප්‍රත්‍යය පසට "කෘත්‍ය" යන සංඥාව පාණිනීයයන් විසින් විහිත ය යි කී නියා යි. භාව- කර්ම දෙක්හි ක්‍යප් ප්‍රත්‍යය වීමෙන් "කෘත්‍ය" යන්න නිපදුනාක් මෙන් මේ ප්‍රත්‍යය පස ම භාව- කර්ම දෙක්හි වන හෙයින් ඔවුන්ට බහුව්‍රීහි- තත්පුරුෂ යනාදි සංඥාවන් මෙන් 'කෘත්‍ය' සංඥාව කළහ යි සැලකිය යුතු යි.) තව්‍යාදීඃ, තව්‍යාදිය; භාවකර්මණෝඃ එව, භාව- කර්ම දෙක්හි ම වේ.

---

* ශාසයිතුං- පොත්හි. දුඃඛෙන ශිෂ්‍යතෙ ඉති = දුඃශාසනඃ- සි: ච:

## 78. තව්‍යානීයෞ. (තව්‍යානීයෞ 1-2.)

**a. ධාතොස්තව්‍යානීයෞ ප්‍රත්‍යයෞ භවතඃ භාවාදෞ. එධ වෘද්ධෞ, එධ්‍යතෙ වා එධිතුමර්හම්= එධිතව්‍යම්- එධනීයම්,* ත්වයා. භාවස්‍යෛකත්වාදෙකවචනං නපුංසකත්වඤ්ච. භූයතෙ වා භවිතුමර්හං= භවිතව්‍යම්- භවනීයම්. ක්‍රියතෙ වා කර්තුමර්හං= කර්තව්‍යම්- කරණීයම්. ආස්‍යතෙ වා ආසිතුමර්හං= ආසිතව්‍යම්- ආසනීයම්. කර්තව්‍යඃ කරණීයො වා ධර්මස්ත්වයා. යා ප්‍රාපණෙ, ප්‍රයාතුමර්හං= ප්‍රයාතව්‍යම්- ප්‍රයාණීයම්. "ඒටො ග්‍රහාම්"**

---

78. ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. "ධාතොඃ" "භාවකර්මණොඃ" යන සූත්‍ර අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; භාවකර්මණොඃ, භාව- කර්ම දෙක්හි; තව්‍යානීයෞ, තව්‍ය- අනීය යන ප්‍රත්‍යය දෙදෙන වෙත්.

a. ධාතොඃ, ධාතුහු කෙරෙන්; භාවාදෞ, භාව කාරකාදීයෙහි; තව්‍යානීයෞ ප්‍රත්‍යයෞ, තව්‍ය- අනීය යන ප්‍රත්‍යය දෙදෙන; භවතඃ, වෙත්. (මෙහි "භාවාදෞ" යන්නෙන් භාව- කර්ම දෙක පමණක් ගැණේ. මේ සූත්‍රයෙන් සාමාන්‍යයෙන් සියලු ධාතූන් කෙරෙන් ම මේ තව්‍ය- අනීය ප්‍රත්‍යය දෙක විහිත ය.) එධ— එධ්‍යතෙ වා, වැඩීම හෝ; එධිතුමර්හම්, වැඩෙන්නට සුදුසු නු යි; එධිතව්‍යම්- එධනීයම්, "එධිතව්‍ය" නම් ද- "එධනීය" නම් ද වේ. ("කෘතඃ" යි ඉඩාගම යි.) ත්වයා, තා විසින්; එධිතව්‍යම්, වැඩෙන්නට සුදුසු යි; 'එධනීයම්' යනු ද එම අර්ථ යි. භාවස්‍ය, භාවය තමා; එකත්වාත්, එකක් බැවින්; එකවචනම්, එකවචන වේ. නපුංසකත්වං ච, නපුංසක ලිඞ්ග බව ද වේ. (එහෙයින් "යුවාභ්‍යාම් එධිතව්‍යම්- එධනීයම්, යුෂ්මාභිඃ එධිතව්‍යම්- එධනීයම්" කියා ද නොවෙනස් ව යෙදේ. කර්මකාරක කෘත්‍ය ප්‍රත්‍යයාන්තයෝ ලිඞ්ගත්‍රයෙහි ද වචනත්‍රයෙහි ද වෙත්.) භූයතෙ වා, වීම හෝ; භවිතුම් අර්හම්, වන්නට සුදුසු නු යි හෝ; භවිතව්‍යම්- භවනීයම්, "භවිතව්‍ය" නම් ද- "භවනීය" නම් ද වේ. ක්‍රියතෙ වා, කිරීම හෝ, කර්තුම් අර්හම්, කරන්නට සුදුසු නු යි හෝ; කර්තව්‍යම්- කරණීයම්, "කර්තව්‍ය" නම් ද- "කරණීය" නම් ද වේ. (කර්මය අවිවක්‍ෂිත කල්හි භාවයෙහි වේ.) ආස්‍යතෙ වා, හිඳීම හෝ; ආසිතුම් අර්හම්, හිඳින්නට සුදුසු නු යි හෝ; ආසිතව්‍යම්- ආසනීයම්, "ආසිතව්‍ය" නම් ද- "ආසනීය" නම් ද වේ. ත්වයා, තා විසින්; ධර්මඃ, ධර්මය තෙමේ; කර්තව්‍යඃ, කටයුතු යි. කරණීයඃ වා, "කරණීයො ධර්මස්ත්වයා" කියා හෝ වේ. (එම අර්ථ යි. කර්මකාරකයෙහි යි.) යා— ප්‍රයාතුම් අර්හම්, යන්නට

---

* ධනම්- පොත්හි, භාවය හෙයින් සදෙසි.

**ගෘහ්‍යතෙ තත්= ග්‍රහිතව්‍යම්- ග්‍රහණීයම්. වෘඬ සම්භක්තෞ, ව්‍රියතෙ වා වරිතුං යොග්‍යං තත්= වරිතව්‍යම්- වරීතව්‍යම්- වරණීයම්. වෘඤ් වරණෙ, ව්‍රියතෙ තත්= වරිතව්‍යම්-වරීතව්‍යම්- වරණීයම්.**

## 79. ස්වරාද්‍යඃ. (ස්වරාත් 5-1. යඃ 1-1.)

**a. ස්වරාන්තාද්ධාතොර්‍යඃ ප්‍රත්‍යයො භවති භාවාදෞ. චීයතෙ වා චෙතුමර්හං = චෙයම්. නෙයම්. ජෙයම්. භීයතෙ තත්= හෙයම්.**

---

සුදුසු නු යි; ප්‍රයාතව්‍යම්- ප්‍රයාණීයම්, "ප්‍රයාතව්‍ය" නම් ද- "ප්‍රයාණීය" නම් ද වේ. "ඊටො ග්‍රහාම්" යන්නෙන් ඊකාරය වේ. ගෘහ්‍යතෙ, ගන්නා ලැබේ නු යි; තත්, එය; ග්‍රහීතව්‍යම්- ග්‍රහණීයම්, "ග්‍රහීතව්‍ය" නම් ද- "ග්‍රහණීය" නම් ද වේ. වෘඬ—ව්‍රියතෙ වා, භජනය කරණු ලැබේ නු යි හෝ; වරිතුං යොග්‍යම්, භජනය කරන්නට සුදුසු නු යි හෝ; තත්, එය; වරිතව්‍යං— වරණීයම්, "වරිතව්‍ය" නම් ද- "වරීතව්‍ය" නම් ද- "වරණීය" නම් ද වේ. වෘඤ්— ව්‍රියතෙ, රුස්සනු ලැබේ නු යි; තත්, එය; වරි— වරණීයම්, "වරිතව්‍ය" නම් ද- "වරීතව්‍ය" නම් ද- "වරණීය" නම් ද වේ. (රූපයෙන් සමාන වුව ද අර්ථයෙන් වෙනසි.)

79. ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. **ධාතොඃ- භාවකාර්‍යයොඃ** යනු අනුවෘත්ත යි. ස්වරාත් ධාතොඃ, ස්වරාන්ත ධාතුහු කෙරෙන්; භාවකාර්‍යයොඃ, භාව- කර්‍ම දෙක්හි; යඃ, ය ප්‍රත්‍යය වේ.

a. ස්වරාන්තාත් ධාතොඃ, ස්වරාන්ත ධාතුහු කෙරෙන්; භාවාදෞ, භාව ආදියෙහි; යඃ ප්‍රත්‍යයඃ භවති, ය ප්‍රත්‍යය වේ. (මතු "ඍහසාද් ඝ්‍යණ්" යි ඍවර්ණාන්ත ධාතුන් කෙරෙන් ඝ්‍යණ් ප්‍රත්‍යය විධීයමාන හෙයින් සෙසු ස්වරාන්ත ධාතුන් කෙරෙන් මේ යප්‍රත්‍යය වේ ය යි හැඟේ.) චීයතෙ වා, රැස් කරණු ලැබේ නු යි හෝ; චෙතුම් අර්හම්, රැස් කරන්නට සුදුසු නු යි හෝ; චෙයම්, "චෙය" නම්. නෙයම්, "නීයතෙ වා නෙතුමර්හම්" යන වාක්‍යයෙහි "නෙය" වේ. ජෙයම්, "ජීයතෙ වා ජෙතුමර්හම්" යන වාක්‍යයෙහි "ජෙය" නම්. භීයතෙ තත්= හෙයම්, බිය වීම (හෝ බිය වන්නට සුදුසු) නු යි එය "හෙය" නම්.

**ඞ, අසරූපො'පවාදඃ ප්‍රත්‍යයො'ස්ත්‍රියාං වා බාධකඃ, සරූපස්තු නිත්‍යම්. චීයතෙ වා චෙතුමර්හං= චෙතව්‍යම්- චයනීයම්. චිකීර්ෂිතෙ වා චිකීර්ෂිතුමර්හං= චිකීර්ෂ්‍යම්. දාතුමිච්ඡතීති=දිත්සති, දිත්සෙ‍්‍යතෙ වා දිත්සිතුමර්හං= දිත්ස්‍යම්.**

---

ඞ. අස්ත්‍රියාම්, ස්ත්‍රීවර්ජිත ලිඞ්ග විෂයෙහි; අසරූපඃ අපවාදඃ ප්‍රත්‍යයඃ, අසමාන රූප වූ අපවාද ප්‍රත්‍යය; වා බාධකඃ, විකල්පයෙන් වළක්වන්නේ වේ. සරූපඃ තු, සමාන රූප වූ අපවාද ප්‍රත්‍යය වනාහි, නිත්‍යම්, නිත්‍යයෙන් වළක්වන්නේ වේ.

("වා'සරූපො'ස්ත්‍රියාම්" යන පාණිනීය සූත්‍රානුසාරයෙන් මේ කීහ. විශෙෂ විධියෙන් සාමාන්‍ය විධිය ද, පර විධියෙන් පූර්ව විධිය ද බොහෝ සෙයින් වළකින බව "සාමාන්‍යශාස්ත්‍රතො නූනම්" යනාදීන් පෙර කියන ලදී. මෙහි "තව්‍යානීයෞ" යනු සාමාන්‍ය විධිය යි. "ඍවරුද්‍ධ්‍යඃ" යනු විශෙෂ විධිය යි. එසේ ම ඒ දෙක පූර්ව-පර විධි ද වේ. එහෙයින් පූර්වෝක්ත ද්විප්‍රකාරයෙන් ම "ඍවරුද්‍ධ්‍යඃ" යන්නෙන් "තව්‍යානීයෞ" යන්න වැළකිය හැකි ය. එහෙත් ප්‍රත්‍යය අසරූප නම් හෙවත් සාමාන්‍ය ප්‍රත්‍යය හා රූපයෙන් සමාන නො වේ නම් වළකින්නේ විකල්පයෙනි. සරූප නම් නිත්‍යයෙන් ම වළකී. මෙහි අපවාද ප්‍රත්‍යය "ය" යන්න යි. එය තව්‍ය- අනීය යන සමාන්‍ය ප්‍රත්‍යයන් හා සරූප නො වන හෙයින් ප්‍රතිෂෙධය විකල්පයෙනි. එහෙයින් ය ප්‍රත්‍යයට විෂය වන තැන්හි විකල්පයෙන් තව්‍ය- අනීය යන ප්‍රත්‍යයන් වීමෙන් "චෙතව්‍යම්- චයනීයම්" යනාදි වශයෙන් ද වේ. ඝ්‍යණ්- ක්‍යප් ආදිය විෂයෙහිත් එසේ යි. මේ සරූපත්වය හා අසරූපත්වය ගැණෙන්නේ ඉත් අකුරු හැර සිටි කල්හි ය. එහෙයින් ය- ඝ්‍යණ්- ක්‍යප් යන මොහු සරූපයෝ යි. ඔවුනතර විශෙෂ ප්‍රත්‍යයෙන් සාමාන්‍ය ප්‍රත්‍යය නිත්‍යයෙන් වළකී. එසේ ම මේ වෛකල්පික ප්‍රතිෂෙධය මතු දැක්වෙන ස්ත්‍ර්‍යධිකාරයෙහි විහිත ප්‍රත්‍යයන් විෂයෙහි නො වේ. "අස්ත්‍රියාම්" යනුවෙන් ඒ බැව් දැක්වූහ. එහි අසරූප වුවත් විශෙෂ ප්‍රත්‍යයෙන් සාමාන්‍ය ප්‍රත්‍යය නිත්‍යයෙන් ම වළකී.)

"චීයතෙ වා චෙතුමර්හම්" යන වාක්‍යයෙහි; චෙතව්‍යම්- චයනීයම්, "චෙතව්‍ය" කියා ද- "චයනීය" කියා ද වේ. (මෙසේ ම "නෙතව්‍යම්- නයනීයම්, ජෙතව්‍යම්- ජයනීයම්, හෙතව්‍යම්- හයනීයම්" යනාදි වශයෙන් විකල්පයෙන් තව්‍ය- අනීය ප්‍රත්‍යය දෙක ද වේ.) චිකීර්ෂිතෙ වා, කරන්නට කැමති වනු ලැබේ නු යි හෝ;-

**a. ක්ෂය්‍යජය්‍යෞ ච ශක්‍යාර්ථේ නිපාත්‍යේතෙ. ක්ෂෙතුං ශක්‍යං= ක්ෂය්‍යම්. ජේතුං ශක්‍යං= ජය්‍යම්. අන්‍යත්‍ර ක්ෂෙයං පාපම්, ජේයං මනඃ. ක්ෂය්‍යජය්‍යෞ චෙති චකාරාදජර්‍ය්‍යමිති නිපාත්‍යතෙ. න ජීර්‍ය්‍යතීත්‍යජර්‍ය්‍යම්, සඞ්ගතම්.**

## 80. ඉච්චාතඃ.* (ඉත් 1-1. ච-නි: ආතඃ 5-1.)

---

චිකීර්ෂිතුම් අර්හම්, කරණු කැමති වන්නට සුදුසු නු සි; චිකීර්ෂ්‍යම්, "චිකීර්ෂ්‍ය" නම්. දාතුමිච්ඡතීති= දිත්සති, දෙන්නට කැමති වෙයි යන අර්ථයෙහි "දිත්සති" යනු වේ. දිත්ස්‍යතෙ වා, දෙන්නට කැමති වනු ලැබේ නු සි හෝ; දිත්සිතුම් අර්හම්, දෙනු කැමති වන්නට සුදුසු නු සි; දිත්ස්‍යම්, "දිත්ස්‍ය" නම්.

a. ක්ෂය්‍යජය්‍යෞ ච, ක්ෂය්‍ය- ජය්‍ය යන ශබ්ද දෙදෙන ද; ශක්‍යාර්ථේ, හැකි ය යන අර්ථයෙහි; නිපාත්‍යේතෙ, නිපාතනය කරණු ලැබෙත්. ක්ෂෙතුං ශක්‍යම්, ක්ෂය කරන්නට හැක්කේ; ක්ෂය්‍යම්, "ක්ෂය්‍ය" නම්. ජේතුං ශක්‍යම්, දිනන්නට හැක්කේ; ජය්‍යම්, "ජය්‍ය" නම්. ('ක්ෂි- ජි' ධාතු දෙකට ගුණ හා නිපාතනයෙන් අයාදෙශ සි.) අන්‍යත්‍ර, සෙසු තැන්හි (=ශක්‍යාර්ථයෙන් පිටත් තැන්හි) 'ක්ෂෙයං පාපම්' (=පව ක්ෂය කළ යුතු ය;) 'ජේයං මනඃ' (=සිත දිනිය යුතු ය;) සි "ක්ෂය්‍ය- ජය්‍ය" කියා නො ච "ක්ෂෙය- ජේය" කියා වේ. ක්ෂය්‍යජය්‍යෞ චෙති චකාරාත්, "ක්ෂය්‍යජය්‍යෞ ච" යන මෙහි 'ච' ශබ්දයෙන්; අජර්‍ය්‍යම් ඉති, "අජර්‍ය්‍ය" යනු; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ. න ජීර්‍ය්‍යතීති, නො දිරා නු සි; අජර්‍ය්‍යම්, "අජර්‍ය්‍ය" නම්. සඞ්ගතම්, සුහෘද් බව සි. ("සෘහසාද් ක්‍යණ්" සි වළකින බැවින් "ජෘ" ධාතුවෙන් පර ව නිපාතනයෙන් ය ප්‍රත්‍යය වේ.)

80. ය ප්‍රත්‍යය හා ඉකාරාදෙශ විධි සූත්‍ර සි. ධාතොඃ- භාව කාර්මයොඃ යනු ද, "ස්වරාද්‍යඃ" සි යඃ යනු ද අනුවෘත්ත සි. ආතඃ ධාතොඃ, ආකාරාන්ත ධාතුහු කෙරෙන්; භාවකාර්මයොඃ, භාව- කර්ම දෙක්හි; යඃ, ය ප්‍රත්‍යය වේ. ඉත් ච, (ආකාරයට) ඉකාරය ද වේ.

---

* "ඊ චාතඃ" සි සූත්‍රපාඨයෙහි හා සිද්ධාන්ත චන්ද්‍රිකාදියෙහිත් පෙණේ. එහෙත් "හ්‍රස්ව එව සුපාඨඃ" සි තත්ත්වදීපිකාවෙහි කීහ. පාණිනීය සූත්‍රය "ඊද්‍යති" යනු සි. එයින් ඊකාරාදෙශය පමණක් විහිත ය.

**a. ආකාරාන්තාද්ධාතෝඊඃ ප්‍රත්‍යයො භවති, ආකාරස්‍ය ච ඉකාරාදෙශඃ. දීයතෙ වා දාතුමර්හං= දෙයම්. ඥාතුං යොග්‍යං= ඥෙයම්. ගීයතෙ තත්= ගෙයම්. ග්ලෙයම්. පාතුමර්හං= පෙයම්. ධීයතෙ තත්= ධෙයම්.**

## 81. පුශකාත්. (පුශකාත් 5-1.)

**b. අකාරෝපධාත් පවර්ගාන්තාත් ශකාදෙශච යඃ ප්‍රත්‍යයො භවති භාවාදෞ. ශප් උපාලම්භෙ ආක්‍රොශෙ ච, ශප්‍යතෙ ඉති= ශප්‍යම්. ජප්තුං යොග්‍යං= ජප්‍යම්. ඩුලභෂ් ප්‍රාප්තෞ, ලබ්ධුං යොග්‍යං= ලභ්‍යම්. යභ් මෛථුනෙ, යබ්ධුං ශක්‍යං= යභ්‍යම්.* සර්වූපධාත් පක්ෂෙ න ස්‍යාණ්.**

---

a. ආකාරාන්තාත් ධාතොඃ, ආකාරාන්ත ධාතුහු කෙරෙන්; යඃ ප්‍රත්‍යයඃ භවති, ය ප්‍රත්‍යය වේ. ආකාරස්‍ය, ආකාරයට; ඉකාරාදෙශඃ ච, ඉකාරාදෙශ ද වේ. දීයතෙ වා, දෙනු ලැබේ නු යි හෝ, දාතුම් අර්හම්, දෙන්නට සුදුසු නු යි; දෙයම්, "දෙය" නම්. ඥාතුං යොග්‍යම්, දැන ගන්නට සුදුසු නු යි; ඥෙයම්, "ඥෙය" නම්. ගීයතෙ තත්= ගෙයම්, ගයනු ලැබේ නු යි එය "ගෙය" නම්. ග්ලෙයම්, (ග්ලායතෙ ඉති= ගිලන් වීම නු යි;) "ග්ලෙය" නම්. ("ගෛ- ග්ලෛ" ධාතු දෙක "සන්ධ්‍යක්ෂරාණාමා" යි ආකාරාන්ත වේ.) පාතුම් අර්හම්, බොන්නට සුදුසු නු යි; පෙයම්, "පෙය" නම්. ධීයතෙ තත්= ධෙයම්, දරණු ලැබේ නු යි එය "ධෙය" නම්.

81. ය ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතොඃ- භාවකාර්යයොඃ- යඃ යනු අනුවෘත්ත වේ. පුශකාත් ධාතොඃ, පවර්ගාන්ත ධාතු ය- ශකාදි ධාතු ය යන මෙයින් පර ව; භාවකාර්යයොඃ, භාව- කර්ම දෙක්හි; යඃ, ය ප්‍රත්‍යය වේ.

b. අකාරෝපධාත්, අකාරය උපධා කොට ඇති; පවර්ගාන්තාත්, පවර්ගාන්ත ධාතුහු කෙරෙන් ද; ශකාදෙඃ, ශක් ආදි ධාතු ගණයා කෙරෙන් ද; භාවාදෞ, භාව ආදියෙහි; යඃ ප්‍රත්‍යයඃ භවති, ය ප්‍රත්‍යය වේ. (සූත්‍රයට "අදුපධාත්" යි අනුවෘත්ත නො වතුදු "පොරදුපධාත්" යන පාණිනීය සූත්‍රානුසාරයෙන් සූත්‍රවෘත්තියට "අකාරෝපධාත්" යි ගන්නා ලදී.) ශප්— ශප්‍යතෙ ඉති= ශප්‍යම්, නින්දා කිරීම හෝ බැණීම නු යි "ශප්‍ය" නම්. ජප්තුම් යොග්‍යම්, කියන්නට සුදුසු නු යි; ජප්‍යම්, "ජප්‍ය" නම්. ඩුලභෂ්— ලබ්ධුං යොග්‍යම්, ලබන්නට සුදුසු නු යි; ලභ්‍යම්, "ලභ්‍ය" නම්. යභ්—

---

* පොත්හි මේ උදාහරණ දෙක ශකාදිය අගට වැටී තිබේ.

**a ශක් සහ් ගද් මද් චර් යම් තක් ශම් චත් යත් පත් ජන් හන් ශල් රුච් එතෙ ශකාදයඃ.**

**b. ශක් සාමර්ථ්‍යෙ, ශක්‍යතෙ තත්= ශක්‍යම්. ෂහ මර්ෂණෙ, සොඪුං ශක්‍යං=සහ්‍යම්, සහ්‍යතෙ වා සොඪුමර්හං=සහ්‍යම්. ගද්‍යතෙ වා ගදිතුමර්හං= ගද්‍යම්. මද්‍යතෙ වා මදිතුමර්හං= මද්‍යම්. චරිතුමර්හං= චර්‍ය්‍යම්. යම්‍යම්. තක් හසනෙ, තක්‍යතෙ වා තකිතුමර්හං= තක්‍යම්. ශසු හිංසායාම්, ශසිතුමර්හං= ශස්‍යම්. චතෙ මානෙ, චතෙ කාමෙනෙතෘ, චත්‍යතෙ ඉති= චත්‍යම්. යත්‍යම්. පත්‍යම්. ජන්‍යම්. හනො වධාදෙශො යෙ. හන්‍යතෙ වා හන්තුමර්හං= වධ්‍යම්. ශල් ශොභායාම්, ශල්‍යම්. රොචිතුං ශක්‍යං= රුච්‍යම්.**

---

යබ්ධුං ශක්‍යම්, මෙවුන්දමට හැක්කේ; යභ්‍යම්, "යභ්‍ය" නම්. සරූපත්තාත්, සමාන රූප බැවින්; පක්ඛෙ, පක්ෂයෙක්හි; න ඝ්‍යණ්, "ඝෘහසාදී ඝ්‍යණ්" යි ඝ්‍යණ් ප්‍රත්‍යය නො වේ. (ය– ඝ්‍යණ් දෙක සරූප හෙයින් ඝ්‍යණ් යන සාමාන්‍ය ප්‍රත්‍යය නිත්‍යයෙන් වළකී.) එහෙත් තව්‍ය– අනීය ප්‍රත්‍යයන් අසරූප හෙයින් ඔවුන් විකල්පයෙන් වීමෙන් "ශපතව්‍ය– ශපනීය, ජපිතව්‍ය– ජපනීය" නම් ද වේ. මේ පවර්ගාන්ත ධාතුන්ට උදාහරණ යි.)

a. ශක් සහ්— එතෙ, ශක්– සහ්– ගද්– මද්– චර්– යම්– තක්– ශස්– චත්– යත්– පත්– ජන්– හන්– ශල්– රුච් යන මොහු (15); ශකාදයඃ, ශකාදි ධාතූහු යි.

b. ශක්— ශක්‍යතෙ තත්, හැකි වීම නු යි එය; ශක්‍යම්, "ශක්‍ය" නම්. ෂහ— සොඪුං ශක්‍යම්, ඉවසන්නට හැක්කේ; සහ්‍යම්, "සහ්‍ය" නම්. (ශක්‍යාර්ථයෙහි යි.) සහ්‍යතෙ වා, ඉවසනු ලැබේ නු යි හෝ; සොඪුම් අර්හම්, ඉවසන්නට සුදුසු නු යි; සහ්‍යම්, "සහ්‍ය" නම්. ගද්‍යතෙ වා, කියනු ලැබේ නු යි හෝ; ගදිතුම් අර්හම්, කියන්නට සුදුසු නු යි; ගද්‍යම්, "ගද්‍ය" නම්. මද්‍යතෙ වා, මත් වීම හෝ; මදිතුම් අර්හම්, මත් වන්නට සුදුසු නු යි; මද්‍යම්, "මද්‍ය" නම්. චරිතුම් අර්හම්, හැසිරෙන්නට සුදුසු නු යි; චර්‍ය්‍යම්, "චර්‍ය්‍ය" නම්. යම්‍යම්, (යන්තුමර්හම්= වෙන් වන්නට සුදුසු නු යි,) "යම්‍ය" නම්. තක් හසනෙ, "තක්" ධාතුව සිනා සීමෙහි වේ. තක්‍යතෙ වා, සිනාසීම හෝ; තකිතුම් අර්හම්, සිනා සෙන්නට සුදුසු නු යි; තක්‍යම්, "තක්‍ය" නම්. ශසු— ශසිතුම් අර්හම්, පෙළන්නට සුදුසු නු යි; ශස්‍යම්, "ශස්‍ය" නම්. චතෙ මානෙ– චතෙ කාමෙනෙතෘ, එකාරානුබන්ධ "චත්" ධාතුව මැනීමෙහි ද– කැමති බැව්හි ද වේ. චත්‍යතෙ ඉති= චත්‍යම්, මැනීම හෝ කැමති වීම නු යි "චත්‍ය" නම්. (එකාරානුබන්ධත්වය "ග්‍යන්තක්ෂණශ්වසිජාගෘණිශ්‍යෙදිතාම්" යන

## 82 ඍෘහසාද් ඝ්‍යණ්. (ඍෘහසාත් 5-1. ඝ්‍යණ් 1-1.)

**a. ඍෘවර්ණාන්තාද්ධසාන්තාච්ච ධාතොඝ්‍යණ් ප්‍රත්‍යයො භවති භාවාදෞ. ඝකාරෙ සිත්කාර්‍ය්‍යාර්ථඃ, ණකාරෙ වෘද්ධ්‍යර්ථඃ.**

**b. ක්‍රියතෙ වා කර්තුමර්හං= කාර්‍ය්‍යම්. වෘඤ් වරණෙ, ව්‍රියතෙ තත්= වාර්‍ය්‍යම්. ධාර්‍ය්‍යම්. චාර්‍ය්‍යම්. හස් හසනෙ, හාස්‍යම්. හ්‍රියතෙ තත්= හාර්‍ය්‍යම්. "හනො ඝත්" හන්‍යතෙ තත්= ඝාත්‍යම්. "චජොඃ කගෞ සිති" පක්තුං යොග්‍යං= පාක්‍යම්.**

---

සූත්‍රයෙන් වෘද්ධිප්‍රතිෂෙධය පිණිස යි.) යත්‍යම්, (යත්‍යතෙ ඉති= උත්සාහ කිරීම නු යි;) "යත්‍ය" නම්. පත්‍යම්, (පත්‍යතෙ ඉති= වැටීම නු යි;) "පත්‍ය" නම්. ජත්‍යම්, (ජත්‍යතෙ ඉති= ඉපදීම නු යි;) "ජත්‍ය" නම්. යෙ, ය ප්‍රත්‍යය පර කල්හි; හනඃ, හන් ධාතුහට; වධාදෙශඃ, "වධ" ආදෙශය වේ. හන්‍යතෙ වා, නසනු ලැබේ නු යි හෝ; හන්තුම් අර්හම්, නසන්නට සුදුසු නු යි; වධ්‍යම්, "වධ්‍ය" නම්. ශල්— ශල්‍යම්, (ශල්‍යතෙ ඉති= හෙබීම නු යි;) "ශල්‍ය" නම්. රොචිතුං ශක්‍යම්, රුචි කරන්නට හැක්කේ; රුච්‍යම්, "රුච්‍ය" නම්.

82. ඝ්‍යණ් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතොඃ- භාවකාර්‍ය්‍යයොඃ යනු වැටේ. ඍෘහසාත් ධාතොඃ, ඍෘවර්ණාන්ත- හස ප්‍රත්‍යාහාරාන්ත ධාතුහු කෙරෙන්; භාවකාර්‍ය්‍යයොඃ, භාව- කර්ම දෙක්හි; ඝ්‍යණ්, ඝ්‍යණ් ප්‍රත්‍යය වේ.

a. ඍෘවර්ණාන්තාත්, ඍෘවර්ණාන්ත වූ ද; හසාන්තාත් ච, හස ප්‍රත්‍යාහාර වර්ණාන්ත වූ ද; ධාතොඃ, ධාතුහු කෙරෙන්; භාවාදෞ, භාව ආදියෙහි; ඝ්‍යණ් ප්‍රත්‍යයඃ භවති, ඝ්‍යණ් ප්‍රත්‍යය වේ. ඝකාරඃ, ඝකාරය; සිත්කාර්‍ය්‍යාර්ථඃ, සිත් කාර්‍ය්‍යය (="චජොඃ කගෞ සිති" යි විහිත කාර්‍ය්‍යය) ප්‍රයොජන කොට ඇත්තේ යි. ණකාරඃ, ණකාරය; වෘද්ධි අර්ථඃ, වෘද්ධිය ප්‍රයොජන කොට ඇත්තේ යි. (අසරූප හෙයින් තව්‍ය- අනීය දෙක ද වේ.)

b. ක්‍රියතෙ වා, කරණු ලැබේ නු යි හෝ; කර්තුමර්හම්, කරන්නට සුදුසු නු යි; කාර්‍ය්‍යම්, "කාර්‍ය්‍ය" නම්. වෘඤ්— ව්‍රියතෙ තත්, රැස්සනු ලැබේ නු යි එය; වාර්‍ය්‍යම්, "වාර්‍ය්‍ය" නම්. ධාර්‍ය්‍යම්, (ධ්‍රියතෙ ඉති= දරණු ලැබේ නු යි;) "ධාර්‍ය්‍ය" නම්. චාර්‍ය්‍යම්, (චර්‍ය්‍යතෙ ඉති= හැසිරීම නු යි;) "චාර්‍ය්‍ය" නම්. හස්— හාස්‍යම්, (හස්‍යතෙ ඉති=

**a. යජ් යාච් වච් රුච් ප්‍රවච් අර්ච් ත්‍යජ් පූජ් ගර්ජ් භුජාං ඝ්‍යණ්හි කුත්වාභාවඃ. ඉජ්‍යතෙ තත්= යාජ්‍යම්, යාච්‍යතෙ තත්= යාච්‍යම්. වච පරිභාෂණෙ, වචෙඃ ශබ්දසංඥායාං කුත්වං වාච්‍යම්. තෙන වාක්‍යම්, අන්‍යත්‍ර වාච්‍යම්. රුච්‍යතෙ තත්= රෙච්‍යම්. ප්‍රවාච්‍යම්. අර්ච්‍යම්. ත්‍යාජ්‍යම්. පූජ්‍යම්. ගර්ජ ශබ්දෙ, ගර්ජ්‍යතෙ තත්= ගර්ජ්‍යම්. භුජ්‍යතෙ තත්= භොජ්‍යම්. බාධ හිංසායාම්, බාධිතුං යොග්‍යං= බාධ්‍යම්. භජිතුං යොග්‍යං= භාජ්‍යම්.**

---

සිනාසීම නු යි;) "හාස්‍ය" නම්. හ්‍රියතෙ තත්= හාර්‍යම්, හරිණු ලැබේ නු යි එය "හාර්‍ය" නම්. "හනො ඝත්" යන්නෙන් 'ඝත්' ආදෙශ වේ. හන්‍යතෙ තත්= ඝාත්‍යම්, නසනු ලැබේ නු යි එය "ඝාත්‍ය" නම්. "චජොඃ කගෞ ඝිති" යන සූත්‍රයෙන් චයන්නට කයන්න වේ. පක්තුං යොග්‍යම්, පිසන්නට සුදුසු නු යි; පාක්‍යම්, "පාක්‍ය" නම්.

a. ඝ්‍යණ්හි, ඝ්‍යණ් ප්‍රත්‍යය පර කල්හි; යජ්— භුජාම්, යජ්- යාච්- වච්- රුච්- 'ප්‍ර' පූර්ව වච්- අර්ච්- ත්‍යජ්- පූජ්- ගර්ජ්- භුජ් යන මේ ධාතුන්ගේ; කුත්වාභාවඃ, කවර්ග බව නො වීම වේ. ("චජොඃ කගෞ ඝිති" යි විහිත කාර්‍යය නො වෙයි කී නියා යි.) ඉජ්‍යතෙ තත්, පුදනු ලැබේ නු යි එය; යාජ්‍යම්, "යාජ්‍ය" නම්. යාච්‍යතෙ තත්= යාච්‍යම්, යදිනු ලැබේ නු යි එය "යාච්‍ය" නම්. වච— ශබ්ද සංඥායාම්, ශබ්ද සංඥාව වාච්‍ය කල්හි; වචෙඃ, වච් ධාතුහට; කුත්වං වාච්‍යම්, කවර්ග බව කිය යුතු යි. තෙන, එහෙයින්; වාක්‍යම්, (උච්‍යතෙ ඉති= කියනු ලැබේ නු යි;) "වාක්‍ය" නම්. අන්‍යත්‍ර, ශබ්ද සංඥායෙන් අන් තැන්හි; වාච්‍යම්, (වක්තුමර්හම්= කියන්නට සුදුසු නු යි;) කකාර නො ව "වාච්‍ය" යනු වේ. රුච්‍යතෙ තත්, රුචි කිරීම නු යි එය; රෙච්‍යම්, "රෙච්‍ය" නම්. ප්‍රවාච්‍යම්, (ප්‍රොච්‍යතෙ ඉති= ප්‍රකර්ෂයෙන් කියනු ලැබේ නු යි;) "ප්‍රවාච්‍ය" නම්. අර්ච්‍යම්, (අර්ච්‍යතෙ ඉති= පුදනු ලැබේ නු යි;) "අර්ච්‍ය" නම්. ("ඍච ස්තුතෞ" යන ධාතුවෙන් ද මෙසේ ම ලැබේ.) ත්‍යාජ්‍යම්, (ත්‍යජ්‍යතෙ ඉති= හරිණු ලැබේ නු යි;) "ත්‍යාජ්‍ය" නම්. පූජ්‍යම්, (පූජ්‍යතෙ ඉති= පුදනු ලැබේ නු යි;) "පූජ්‍ය" නම්. ගර්ජ— ගර්ජ්‍යතෙ තත්, ගිගිරීම නු යි එය; ගර්ජ්‍යම්, "ගර්ජ්‍ය" නම්. භුජ්‍යතෙ තත්= භොජ්‍යම්, වළඳනු ලැබේ නු යි එය "භොජ්‍ය" නම්. බාධ— බාධිතුං යොග්‍යම්, පෙළන්නට සුදුසු නු යි; බාධ්‍යම්, "බාධ්‍ය" නම්. භජිතුං යොග්‍යම්, බෙදන්නට සුදුසු නු යි; භාජ්‍යම්, "භාජ්‍ය" නම්. (කුත්වය වූ කල්හි "භාග්‍ය" යනු වේ. සෙවනය කරන්නට සුදුසු නු යි පිණ "භාග්‍ය" නම්.)

## 83. ඕරාවශ්‍යකෙ. * (ඕඃ 5- 1. ආවශ්‍යකෙ 7- 1.)

**a. උවර්ණාන්තාද්ධාතොරාවශ්‍යකෙ'ර්ථෙ ඝ්‍යණ් ප්‍රත්‍යයො භවති.**

## 84. ඔදෞතොර්යඃ † ස්වරවත්.

(ඔදෞතොඃ 6- 2. යඃ 1- 1. ස්වරවත්- නිඃ)

**b. ධාතොරොකාරෞකාරයොර්නිමිත්තං වා සම්බන්ධී යඃ ප්‍රත්‍යයඃ ස්වරවත් ස්‍යාත්. සමාසෙ අවශ්‍යමාදීනාමන්තලොපමිච්ඡන්ති ශාබ්දිකාඃ:-**

**14. ලුම්පෙදවශ්‍යමඃ කෘත්‍යෙ- තුං කාමමනසොරපි,**
**සමො වා හිතතතයො- ර්මාංසස්‍ය පචි යුඩ්ඝඤොඃ.**

---

83. ඝ්‍යණ් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. **ධාතොඃ** යනු ද, "ඍහසාද් ඝ්‍යණ්" යි ඝ්‍යණ් යනු ද වැටේ. ඕඃ, උවර්ණාන්ත ධාතුහු කෙරෙන්; ආවශ්‍යකෙ, ආවශ්‍යකාර්ථයෙහි; ඝ්‍යණ්, ඝ්‍යණ් ප්‍රත්‍යය වේ.

a. උවර්ණාන්තාත්, උවර්ණාන්ත වූ; ධාතොඃ, ධාතුහු කෙරෙන්; ආවශ්‍යකෙ අර්ථෙ, අවශ්‍යයෙන් විය යුතු ය යන අර්ථයෙහි; ඝ්‍යණ් ප්‍රත්‍යයඃ භවති, ඝ්‍යණ් ප්‍රත්‍යය වේ. (හෙද භාව- කර්ම දෙක්හි මැයි.)

84. අතිදෙශ සූත්‍ර යි. ඔදෞතොඃ, ඔකාර- ඖකාර දෙක සම්බන්ධ වූ; යඃ ප්‍රත්‍යයඃ, ය ප්‍රත්‍යය; ස්වරවත්, ස්වරයක් මෙනි.

b. ධාතොඃ, ධාතුහුගේ; ඔකාරෞකාරයොඃ, ඔකාර- ඖකාර දෙකට; නිමිත්තං වා, නිමිති වූ හෝ; සම්බන්ධී, ඔවුන් හා සම්බන්ධය ඇත්තා වූ; යඃ ප්‍රත්‍යයඃ, ය ප්‍රත්‍යය; ස්වරවත් ස්‍යාත්, ස්වරයක් මෙන් වන්නේ ය. (ධාතුස්වරය ඔකාරය හෝ ඖකාරය වීමට නිමිති වන යප්‍රත්‍යය ස්වරයක් මෙන් සැලකිය යුතු ය යනු මෙහි අදහස යි. එකල්හි "ඔ අව්" "ඖ ආව්" යන සූත්‍රවලින් විහිතකාර්‍ය්‍ය වේ.) සමාසෙ, සමාසයෙහි; අවශ්‍යමාදීනාම්, "අවශ්‍යම්" යනාදීන්ගේ; අන්තලොපම්, අන්තලොපය; ශාබ්දිකාඃ, ව්‍යාකරණඥයෝ; ඉච්ඡන්ති, කැමති වෙත්.

14. කෘත්‍යෙ, කෘත්‍ය ප්‍රත්‍යයා පර කල්හි; අවශ්‍යමඃ, "අවශ්‍යම්" යන අව්‍යය ශබ්දයාගේ අන්තය; ලුම්පෙත්, ලොප් කරන්නේ ය. කාමමනසොඃ, කාම- මනස් ශබ්ද ද්වය පර කල්හි; තුම් අපි, 'තුම්' ප්‍රත්‍යයාගේ අන්තය ද; (ලොප් කරන්නේ ය.)

---

* ඔරාවශ්‍යකෙ ඝ්‍යණ්- පොත්හි. :† යඃ ප්‍රත්‍යයඃ- පොත්හි. ස්වරසන්ධිප්‍රක්‍රියායෙහි ද "ක්වචිත් ස්වරවද්‍යකාරඃ" යි මෙය කීහ.

**a. ලූඤ් ඡේදනෙ, ලූයතෙ වා ලවිතුං යොග්‍යඃ= ලාව්‍යඃ, අවශ්‍යං ලාව්‍යඃ= අවශ්‍යලාව්‍යඃ, භොක්තුං කාමො යස්‍ය සඃ= භොක්තුකාමඃ. ශ්‍රොතුං මනො යස්‍ය සඃ= ශ්‍රොතුමනාඃ. සම්‍යක් ප්‍රකාරෙණ හිතං= සහිතම්- සංහිතම්. සතතම්- සංතතම්. මාංසස්‍ය පචනං= මාංස්පචනම්. යුඞ්ඝඤොඃ පචි පරෙ මාංසස්‍යා කාරො වා ලුප්‍යතෙ. මාංසස්‍ය පචනං= මාංසපචනම්. මාංසස්‍ය පාකඃ= මාංස්පාකඃ- මාංසපාකඃ.**

---

හිතතතයොඃ, හිත- තත ශබ්ද ද්වය පර කල්හි; සමඃ, 'සම්' උපසර්ගයාගේ අන්තය; වා, විකල්ප යෙන් (ලොප් කරන්නේ ය.) පචි, පච් ධාතුව පර කල්හි; යුඞ්ඝඤොඃ, යුට්- ඝඤ් ප්‍රත්‍යය දෙක (ඉන් පර ව) ඇති කල්හි; මාංසස්‍ය, 'මාංස' ශබ්දයාගේ අන්තය (ලොප් කරන්නේ ය.)

a. ලූඤ්— ලූයතෙ වා, සිඳිනු ලැබේ නුයි හෝ; ලවිතුං යොග්‍යඃ, සිඳින්නට සුදුසු වූයේ; ලාව්‍යඃ, "ලාව්‍ය" නම්. අවශ්‍යං ලාව්‍යඃ, අවශ්‍යයෙන් සිඳිය යුත්තේ; අවශ්‍යලාව්‍යඃ, "අවශ්‍යලාව්‍ය" නම්. භොක්තුම්, අනුභව කරන්නට; කාමඃ, ඉච්ඡාව; යස්‍ය, යමෙකුගේ ද; සඃ, හෙතෙමේ; භොක්තුකාමඃ, "භොක්තුකාම" නම්. ශ්‍රොතුම්, අසන්නට; මනඃ, සිත; යස්‍ය, යමෙකුගේ ද; සඃ, හෙතෙමේ; ශ්‍රොතුමනාඃ, "ශ්‍රොතුමනස්" නම්. සම්‍යක් ප්‍රකාරෙණ, යහපත් අයුරින්; හිතම්, පිහිටියේ; සහිතම්- සංහිතම්, ලොප පක්‍ෂයෙහි "සහිත" නම් ද, විකල්ප පක්‍ෂයෙහි "සංහිත" නම් ද වේ. සතතම්- සංතතම්, (සම්‍යක් ප්‍රකාරෙණ තතම්= යහපත් අයුරින් පතළේ;) පෙර සේ ම "සතත" නම් ද, "සංතත" නම් ද වේ. මාංසස්‍ය පචනම්, මාංසය පිසීම; මාංස් පචනම්, "මාංස්පචන" නම්. පචි පරෙ, පච් ධාතුව පර කල්හි; යුඞ්ඝඤොඃ, යුට්- ඝඤ් ප්‍රත්‍යය දෙක ඉන් පර ව ඇති කල්හි; (යුට්- ඝඤ් ප්‍රත්‍යයාන්ත පච් ධාතුව පර කල්හි ය යි සේ යි.) මාංසස්‍ය, මාංස ශබ්දයාගේ; අකාරඃ, අකාරය, වා, විකල්පයෙන් ලුප්‍යතෙ, ලොප් කරණු ලැබේ. (ලොපය වෛකල්පික බව පූර්වෝක්ත ශ්ලොකයෙන් නො දක්වූ හෙයින් මේ කීහ.) මාංසස්‍ය පචනම්, මාංසය පිසීම; මාංසපචනම්. විකල්ප පක්‍ෂයෙහි "මාංසපචන" නම්. (යුට් ප්‍රත්‍යය විෂයෙහි යි.) මාංසස්‍ය පාකඃ, මස් පිසීම; මාංස්පාකඃ- මාංසපාකඃ, ලොප පක්‍ෂයෙහි "මාංස්පාක" නම් ද, විකල්ප පක්‍ෂයෙහි "මාංසපාක" නම් ද වේ. (ඝඤ් ප්‍රත්‍යය විෂයෙහි යි.)

## 85. සෘදුපධාත් ක්‍යප්. (සෘදුපධාත් 5- 1. ක්‍යප් 1- 1.)

**a. සෘකාරෝපධාද්ධාතොඃ ක්‍යප් ප්‍රත්‍යයො භවති භාවකාර්‍යයොඃ· කෘතී ඡෙදනෙ, කර්තිතුමර්හං= කෘත්‍යම්. නිතරාං කර්තිතුං යොග්‍යං= නිකෘත්‍යම්. වෘද්ධ්‍යම්. වෘත්‍යතෙ තත්= වෘත්‍යම්.**

**b, කෘපිචෘතොරානී ක්‍යප්. කෘපූ සාමර්ථ්‍යෙ, "කෘපො රො ලඃ" කල්ප්‍යම්. චෘත දීප්‍යතෞ, චර්ත්‍යම්. මෘජො වා ක්‍යප්, මෘජ්‍යම්- මාර්ග්‍යම්.**

---

85. ක්‍යප් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතොඃ- භාවකාර්‍යයොඃ යනු වැටේ. සෘදුපධාත් ධාතොඃ, සෘකාරය උපධා කොට ඇති ධාතුහු කෙරෙන්; භාවකාර්‍යයොඃ, භාව- කම් දෙක්හි; ක්‍යප්, ක්‍යප් ප්‍රත්‍යය වේ.

a. සෘකාරොපධාත් ධාතොඃ, සෘකාරය උපධාසංඥ කොට ඇති ධාතුහු කෙරෙන්; භාවකාර්‍යයොඃ, භාව- කම් දෙක්හි; ක්‍යප් ප්‍රත්‍යයඃ භවති, ක්‍යප් ප්‍රත්‍යය වේ. (කයන්න ගුණ ප්‍රතිෂෙධයට ද, පයන්න තුගාගමයට ද වේ. අසරූප බැවින් තව්‍යානීයයෝ ද වෙත්.) කෘතී— කතිතුම් අර්හම්, කපන්නට සුදුසු නු යි; කෘත්‍යම්, "කෘත්‍ය" නම්. නිතරාං කර්තිතුං යොග්‍යම්, අතිශයින් කපන්නට සුදුසු නු යි; නිකෘත්‍යම්, "නිකෘත්‍ය" නම්. වෘද්ධ්‍යම්, (වර්ධිතුං යොග්‍යම්= වැඩෙන්නට සුදුසු නු යි;) "වෘද්ධ්‍ය" නම්. වෘත්‍යතෙ, පැවැත්ම නු යි; තත්, එය; වෘත්‍යම්, "වෘත්‍ය" නම්.

b. කෘපිචෘතොඃ, කෘප්- චෘත් ධාතු දෙක සම්බන්ධ ව; න ක්‍යප්, ක්‍යප් ප්‍රත්‍යය නො වේ. (එහෙයින් ඝ්‍යණ් ප්‍රත්‍යය වේ.) කෘපූ- "කෘපො රො ලඃ" යන්නෙන් රකාරයට ලකාරය වේ. කල්ප්‍යම්,(කල්පිතුමර්හම්=සමත් වන්නට සුදුසු නු යි;) "කල්ප්‍ය" නම්. චෘත —— චර්ත්‍යම්, (චර්තිතුමර්හම් = බබලන්නට සුදුසු නු යි;) "චර්ත්‍ය" නම්. මෘජඃ, මෘජ් ධාතුහු කෙරෙන්; වා ක්‍යප්, විකල්පයෙන් ක්‍යප් ප්‍රත්‍යය වේ. මෘජ්‍යම්- මාර්ග්‍යම්, (මාර්ෂ්ටුමර්හම්= පිරිසිදු කරන්නට සුදුසු නු යි;) ක්‍යප් ප්‍රත්‍යය වූ කල්හි "මෘජ්‍ය" නම් ද, විකල්ප පක්‍ෂයෙහි ඝ්‍යණ් ප්‍රත්‍යය ව "මාර්ග්‍ය" නම් ද වේ.

## 86. හ්‍රස්වාච්ච. * (හ්‍රස්වාත් 5-1. ච-නි:)

**a. හ්‍රස්වාන්තාද්ධාතෝර්භාවෙ කාර්‍යෙ ච ක්‍යප් ප්‍රත්‍යයො භවති. තස්‍ය ග්‍රහණෙ තදන්තස්‍ය ග්‍රහණම්. ක්‍රියතෙ තත්= කෘත්‍යම්.**

**b. කෘඤ: ක්‍යපි වා රිඞ් වක්තව්‍ය: තුගභාවශ්ච. කෘත්‍යා= ක්‍රියා. ඞිද්ගෙනකාක්ෂරෝ'ප්‍යාදෙශස්තදන්තස්‍යෛව වක්තව්‍ය:. ගුප්ගුහො: ක්‍යප්. ගොප්තුං යොග්‍යං= ගුප්‍යම්. ගූහිතුං යොග්‍යං= ගුහ්‍යම්.**

**c. වදෙ: ක්‍යප් භාවාදෞ.†**

---

86. ක්‍යප් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතො:- භාවකාර්‍යයො:- ක්‍යප් යනු අනුවෘත්ත යි. හ්‍රස්වාත් ධාතො: ච, හ්‍රස්ව ස්වරාන්ත ධාතුහු කෙරෙන් ද; භාවකාර්‍යයො:, භාව- කර්‍ම දෙක්හි; ක්‍යප්, ක්‍යප් ප්‍රත්‍යය වේ.

a. හ්‍රස්වාන්තාත් ධාතො:, හ්‍රස්ව ස්වරාන්ත ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි ද; කාර්‍යෙ ච, කර්‍මයෙහි ද; ක්‍යප් ප්‍රත්‍යය: භවති, ක්‍යප් ප්‍රත්‍යය වේ. තස්‍ය ග්‍රහණෙ, ඒ හ්‍රස්වය ගැණීමෙහි; තදන්තස්‍ය ග්‍රහණම්, එය අන්ත කොට ඇත්තහු ගැණීම වේ. ක්‍රියතෙ තත්= කෘත්‍යම්, කරණු ලැබේ නු යි එය "කෘත්‍ය" නම්.

b. ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි; කෘඤ:, කෘඤ් ධාතුහට; වා, විකල්පයෙන්; රිඞ් වක්තව්‍ය:, රිඞාදෙශය කිය යුතු යි. තුගභාව: ච, (එකල්හි) තුක් ආගමය නො වීම ද වේ. කෘත්‍යා, කට යුත්තී; ක්‍රියා, "ක්‍රියා" නමූ. ඞිත්, ඞකාරය ඉත් කොට ඇත්තා වූ ද; අනෙකාක්ෂර: අපි, බොහෝ අකුරු ඇත්තා වූ ද; ආදෙශ:, ආදෙශය; තදන්තස්‍ය එව, ඒ ආදෙශිහුගේ අන්තයට ම (වේ ය යි;) වක්තව්‍ය:, කිය යුතු යි. (රිඞාදෙශය ඞිත් බැවින් කෘ ධාතුහුගේ අන්තයට වන බව දැක්වීමට මේ කීහ.) ගුප්ගුහො:, ගුප්- ගුහ් යන ධාතු දෙක සම්බන්ධ ව; ක්‍යප්, ක්‍යප් ප්‍රත්‍යය වේ. ගොප්තුං යොග්‍යම්, රකින්නට සුදුසු නු යි; ගුප්‍යම්, "ගුප්‍ය" නම්. ගූහිතුං යොග්‍යම්, සඟවන්නට සුදුසු නු යි; ගුහ්‍යම්, "ගුහ්‍ය" නම්.

c. වදෙ:, වද් ධාතුහු කෙරෙන්; භාවාදෞ, භාව ආදියෙහි; ක්‍යප්, ක්‍යප් ප්‍රත්‍යය වේ.

---

* හ්‍රස්වාච්ච ක්‍යප්- පොත්හි. † වදස්සුපි ක්‍යප් ච- පාණිනීය 3. 1. 601.

**a. වදෙඃ ධාතොඃ ක්‍යප් ප්‍රත්‍යයො භවති භාවාදෞ. මෘෂා උද්‍යතෙ ඉති= මෘෂොද්‍යම්. බ්‍රහ්මණා උද්‍යතෙ යා කථා සා= බ්‍රහ්මොද්‍යා. ග්‍රහෙඃ ක්‍යප්. අර්ජුනගෘහ්‍යා, සෙනා.**

**b. භුවො භාවෙ ක්‍යප්.***

**c. නාම්නි උපපදෙ භුවො භාවෙ ක්‍යප් ප්‍රත්‍යයො භවති. බ්‍රහ්මණො භාවඃ= බ්‍රහ්මභූයං ගතඃ. බ්‍රහ්මණා භූයතෙ තත්= බ්‍රහ්මභූයං ගතඃ. නාම්නි කිම්? භවිතව්‍යං= භව්‍යම්.**

**d. ඉණ් ස්තු වෘ දෘ භෘ ශාස් ජුෂ් ඛන් එභ්‍යඃ ක්‍යබ් වාච්‍යඃ, තුක්. ඊයතෙ ඉති= ඉත්‍යඃ. ස්තුත්‍යඃ. වෘත්‍යඃ. දෘඞ ආදරෙ,**

---

a. වදෙඃ ධාතොඃ, වද් ධාතුහු කෙරෙන්; භාවාදෞ, භාවාදි යෙහි; ක්‍යප් ප්‍රත්‍යයඃ භවති, ක්‍යප් ප්‍රත්‍යය වේ. (නාමයක් උප පද ව ඇති අනුපසර්ගී ධාතුහු කෙරෙන් ම මෙය වේ.) මෘෂා උද්‍යතෙ ඉති, බොරු කීම නු යි; මෘෂොද්‍යම්, "මෘෂොද්‍ය" නම්. යා කථා, යම් කථාවක්; බ්‍රහ්මණා, බඹුහු විසින්; උද්‍යතෙ, කියනු ලැබේ ද; සා, ඕ තොමෝ; බ්‍රහ්මොද්‍යා, "බ්‍රහ්මොද්‍යා" නමු. ග්‍රහෙඃ, ග්‍රහ් ධාතුහු කෙරෙන්; ක්‍යප්, ක්‍යප් ප්‍රත්‍යය වේ. අර්ජුනගෘහ්‍යා, (අර්ජුනෙන ගෘහ්‍යතෙ ඉති= අර්ජුනයා විසින් ගණු ලැබේ නු යි;) "අර්ජුන ගෘහ්‍යා" නමු. සෙනා, සෙනාව යි.

b. භුවඃ, භූ ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි; ක්‍යප්, ක්‍යප් ප්‍රත්‍යය වේ.

c. නාම්නි උපපදෙ, නාමයක් උපපද ව ඇති කල්හි; භුවඃ, භූ ධාතුහු කෙරෙන්; භාවෙ, භාවයෙහි; ක්‍යප් ප්‍රත්‍යයඃ භවති, ක්‍යප් ප්‍රත්‍යය වේ. (මෙද අනුපසර්ගී කල්හි මැයි.) බ්‍රහ්මණඃ, බ්‍රහ්මයාගේ; භාවඃ, භා වය; බ්‍රහ්මභූයම්, "බ්‍රහ්මභූය" නම්. බ්‍රහ්මභූයම්, බ්‍රහ්ම බවට; ගතඃ, ගියේ යි. බ්‍රහ්මණා භූයතෙ, බඹුහු විසින් වීම නු යි; තත්, එය; බ්‍රහ්මභූයම්, "බ්‍රහ්මභූය" නම්. බ්‍රහ්මභූයම්, බ්‍රහ්මයා වීමට; ගතඃ, ගියේ යි. නාම්නි කිම්, 'නාම්නි' යනු කිම? 'භවිතව්‍යං භව්‍යම්' (=විය යුත්ත "භව්‍ය" නම්) යන මෙහි නාමයක් උපපද ව නැති හෙයින් ක්‍යප් ප්‍රත්‍යය නො වනු පිණිස යි. (එහි "ස්වරුද්‍යඃ" යි ය ප්‍රත්‍යය යි.)

d. ඉණ්— එභ්‍යඃ, ඉණ්- ස්තු- වෘ- දෘ- භෘ- ශාස්- ජුෂ්- ඛන් යන මේ ධාතූන් කෙරෙන්; ක්‍යප් වාච්‍යඃ, ක්‍යප් ප්‍රත්‍යය කිය යුතු යි. තුක්, "හ්‍රස්වස්‍ය පිති කෘති තුක්" යි තුගාගම වේ. ඊයතෙ ඉති, යනු ලැබේ නු යි; ඉත්‍යඃ, "ඉත්‍ය" නම්. ස්තුත්‍යඃ,( ස්තූයතෙ ඉති= ස්තුති

---

* භුවො භාවෙ- පාණිනීය 3. 1. 107.

**දෘත්‍යඃ. භෘත්‍යඃ. "ශාසඃ" ශිෂ්‍යඃ. ජුෂ් ප්‍රීතිසෙවනයොඃ, ජුෂ්‍යඃ. ඛන ඉත්වං ක්‍යපි වාච්‍යම්. ඛන්‍යතෙ ඉති= ඛෙයම්.**

**a. භිද්‍යොද්ධ්‍යෞ නදෙ නිපාත්‍යෙතෙ.* භිනත්ති කූලමිති= භිද්‍යඃ. උජ්ඣ උත්සර්ගෙ, උජ්ඣති ජලමිති= උද්ධ්‍යඃ, නදඃ. නදෙ කිම්? භෙත්තා, උජ්ඣිතා.**

**b. කෘවෘෂෝර්වා ක්‍යප්. ක්‍රියතෙ තත්= කෘත්‍යම්. කර්තුං යොග්‍යං= කාර්‍ය්‍යම්. වෘෂ් වෘෂෙටෟ, වෘෂ්‍යම්– වර්ෂ්‍යම්.**

---

කරණු ලැබේ නු යි;) "සත්‍ය" නම්. වෘත්‍යඃ, (ව්‍රියතෙ ඉති= රුස්සනු ලැබේ නු යි;) "වෘත්‍ය" නම්. (මෙහි "වෘඤ් වරණෙ" යන ධාතුව ගත යුතු යි. "වෘඞ් සම්භක්තෞ" යන්නෙන් පර ව ඍ්‍යණ් ප්‍රත්‍යය මැයි.) දෘඞ්— දෘත්‍යඃ, (ද්‍රියතෙ ඉති= ආදරය කරණු ලැබේ නු යි;) "දෘත්‍ය" නම්. භෘත්‍යඃ, (භ්‍රියතෙ ඉති= පොෂණය කරණු ලැබේ නු යි;) "භෘත්‍ය" නම්. "ශාසඃ" යන සූත්‍රයෙන් ආකාරයට ඉකාරය වේ. ("ඍසාදෙඃ ෂඃ" යි ෂකාර වේ.) ශිෂ්‍යඃ, (ශිෂ්‍යතෙ ඉති= අනුශාසනා කරණු ලැබේ නු යි;) "ශිෂ්‍ය" නම්. ජුෂ්— ජුෂ්‍යඃ, (ජුෂ්‍යතෙ ඉති= සෙවුනා ලැබේ නු යි;) "ජුෂ්‍ය" නම්. ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි; ඛනඃ, ඛන් ධාතුහුගේ අන්තයට; ඉත්වං වාච්‍යම්, ඉකාර බව කිය යුතු යි. ඛන්‍යතෙ ඉති, කනිනු ලැබේ නු යි; ඛෙයම්, "ඛෙය" නම්.

a. භිද්‍යොද්ධ්‍යෞ, භිද්‍ය– උද්ධ්‍ය ශබ්ද දෙදෙන; නදෙ, නදෘව යෙහි; නිපාත්‍යෙතෙ, නිපාතනය කරණු ලැබෙත්. කූලම්, ඉවුර; භිනත්ති ඉති, බිඳී නු යි; භිද්‍යඃ, "භිද්‍ය" නම්. උජ්ඣ උත්සර්ගෙ, "උජ්ඣ" ධාතුව හැරීමෙහි වේ. ජලම්, ජලය; උජ්ඣති, හරී නු යි; උද්ධ්‍යඃ, "උද්ධ්‍ය" නම්. නදඃ, ඔය යි. (කර්තෘකාරකයෙහි ක්‍යප් ප්‍රත්‍යය හා ඣකාරයට ධකාරය ද නිපාතනයෙන් වේ.) නදෙ කිම්, 'නදෙ' යනු කිම? 'භෙත්තා– උජ්ඣිතා' යනාදි තැන්හි නදෘව නො වන හෙයින් ක්‍යප් ප්‍රත්‍යය නො වනු පිණිස යි.

b. කෘවෘෂෝඃ, කෘ– වෘෂ් ධාතු දෙක සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ක්‍යප්, ක්‍යප් ප්‍රත්‍යය වේ. ("හ්‍රස්වාච්ච– ඍදුපධාත් ක්‍යප්" යන සූත්‍ර දෙකින් විහිත කාර්‍ය්‍ය මෙයින් විකල්ප කළහ.) ක්‍රියතෙ, කරණු ලැබේ නු යි; තත්, එය; කෘත්‍යම්, "කෘත්‍ය" නම්. කර්තුං යොග්‍යම්, කරන්නට සුදුසු නු යි; කාර්‍ය්‍යම්, "කාර්‍ය්‍ය" නම්. (විකල්ප හෙයින් මෙහි ඍ්‍යණ් ප්‍රත්‍යය යි.) වෘෂ— වෘෂ්‍යම්– වර්ෂ්‍යම්, (වෘෂ්‍යතෙ ඉති= තෙත් කරණු ලැබේ නු යි;) ක්‍යප් ප්‍රත්‍යය වීමෙන් "වෘෂ්‍ය" නම් ද ඍ්‍යණ් ප්‍රත්‍යය වීමෙන් "වර්ෂ්‍ය" නම් ද වේ.

---

* භිද්‍යෝද්ධ්‍යෞ නදෙ– පාණිනීය. 3. 1. 115.

**a. එතෙ භාවකර්මණොර්විහිතාස්තව්‍යාදයස්තෙ'ර්හවිධෙය ච වක්තව්‍යාඃ. ‘‘රාගෙරු ඛඩෙස දෘශාම්’’ දර්ශනාර්හො ද්‍රෂ්ටව්‍යඃ. ද්‍රෂ්ටුං අර්හඃ= දර්ශනීයඃ- දෘශ්‍යඃ. ඉඩ් අධ්‍යයනෙ, ස්වාධ්‍යායො'ධ්‍යෙතව්‍යඃ. ස්වාධ්‍යායො නාම වෙදඃ. ශ්‍රු ශ්‍රවණෙ, ශ්‍රවණාර්හඃ= ශ්‍රොතව්‍යඃ. ශ්‍රොතුං යොග්‍යං= ශ්‍රවණීයම්. මාන පූජායාම්, මානිතුං යොග්‍යො මානිතව්‍යඃ- මානනීයඃ. ධ්‍යෛ චින්තායාම්, ධ්‍යානාර්හො ධ්‍යාතව්‍යඃ. ධ්‍යාතුං යොග්‍යො ධ්‍යානීයඃ. මන ඥානෙ, මනනාර්හො මන්තව්‍යඃ. මන්තුං යොග්‍යො මනනීයඃ.**

**b. සප්‍රත්‍යයාන්තාදපි එතෙ ප්‍රත්‍යයා භවන්ති. නිතරාං ධ්‍යාතුමෙෂ්ටව්‍යො නිදිධ්‍යාසිතව්‍යඃ. භවිතුමෙෂ්ටව්‍යො බුභූෂිතව්‍යඃ- බුභූෂණීයඃ.**

---

a. එතෙ තව්‍යාදයඃ, මේ තව්‍යාදි ප්‍රත්‍යයෝ; භාවකර්මයෝඃ, භාව- කර්ම දෙක්හි; විහිතාඃ, කරණ ලදහ. තෙ, ඔව්හු; අර්හවිධෙය ච, සුදුසු ය- කර්තෘව්‍යපදෙශ ය යන මෙහි ද; වක්තව්‍යාඃ, කිය යුත්තාහ. “රුරෙ ඛෂෙ දෘශාම්” යන්නෙන් ඍකාරයට රකාර වේ. (“ඡශෂ” යනාදීන් ෂත්වය හා “ෂ්ටුභිඃ ෂ්ටුඃ” යි ටුත්වය ද වේ. දර්ශනාර්හඃ, දැකීමට සුදුසු වූයේ; ද්‍රෂ්ටව්‍යඃ, “ද්‍රෂ්ටව්‍ය” නම්. ද්‍රෂ්ටුම් අර්හඃ, දක්නට සුදුසු නු යි; දර්ශනීයඃ- දෘශ්‍යඃ, අනීය- ක්‍යප් ප්‍රත්‍යයන් වීමෙන් “දර්ශනීය” නම් ද, “දෘශ්‍ය” නම් ද වේ. ඉඩ්— ස්වාධ්‍යායඃ, වෙදය; අධ්‍යෙතව්‍යඃ, හදාළ යුතු යි. ස්වාධ්‍යායො නාම වෙදඃ, “ස්වාධ්‍යාය” නම් වෙදය යි. ශ්‍රු— ශ්‍රවණාර්හඃ, ඇසීමට සුදුසු වූයේ; ශ්‍රොතව්‍යඃ, “ශ්‍රොතව්‍ය” නම්. ශ්‍රොතුං යොග්‍යම්, අසන්නට සුදුසු නු යි; ශ්‍රවණීයම්, ශ්‍රවණීය” නම්. මාන— මානිතුං යොග්‍යඃ, පුදන්නට සුදුසු වූයේ; මානිතව්‍යඃ- මානනීයඃ, “මානිතව්‍ය” නම් ද, “මානනීය” නම් ද, (“මාන්‍ය” නම් ද) වේ. ධ්‍යෛ— ධ්‍යානාර්හඃ, සිතීමට සුදුසු වූයේ; ධ්‍යාතව්‍යඃ, “ධ්‍යාතව්‍ය නම්. ධ්‍යාතුං යොග්‍යඃ, සිතන්නට සුදුසු නු යි; ධ්‍යානීයඃ, “ධ්‍යානීය” නම්. මන— මනනාර්හඃ, දැන ගැණීමට සුදුසු වූයේ; මන්තව්‍යඃ, “මන්තව්‍ය” නම්. මන්තුං යොග්‍යඃ, දැන ගන්නට සුදුසු නු යි; මනනීයඃ, “මනනීය” නම්.

b. සප්‍රත්‍යයාන්තාත් අපි, සප්‍රත්‍යයාන්ත ධාතුහු කෙරෙන් ද; එතෙ ප්‍රත්‍යයාඃ, මේ ප්‍රත්‍යයෝ; භවන්ති, වෙත්. නිතරාම්, අතිශයින්; ධ්‍යාතුම් එෂ්ටව්‍යඃ, සිතන්නට කැමති විය යුත්තේ; නිදිධ්‍යාසිතව්‍යඃ, “නිදිධ්‍යාසිතව්‍ය” නම්. භවිතුං එෂ්ටව්‍යඃ, වන්නට කැමති විය යුත්තේ; බුභූෂිතව්‍යඃ- බුභූෂණීයඃ, “බුභූෂිතව්‍ය” නම් ද, “බුභූෂණීය” නම් ද වේ. (සාන්ත “නිදිධ්‍යාස- බුභූෂ” ධාතූන් කෙරෙන් තව්‍ය- අනීය ප්‍රත්‍යයන් හා ඉඩාගම යි.)

**15. කෘත්‍යාඃ පඤ්ච සමාඛ්‍යාතා–ඝ්‍යණ්ක්‍යපෞ භාවකර්මණොඃ, තව්‍යානීයෞ ස්වරාද්‍යශ්ච– ශබ්දශාස්ත්‍රවිචක්ෂණෛඃ.**

## ඉති කෘත්‍ය ප්‍රක්‍රියා

---

**a. අථ ස්ත්‍ර්‍යධිකාරඃ.**

## 87. ස්ත්‍රියාං යජාං භාවෙ.*

(ස්ත්‍රියාම් 7-1. යජාම් 6-3. භාවෙ 7-1.)

**b. යජාදෙර්ධාතොඃ ස්ත්‍රියාං භාවෙ ක්‍යප් ප්‍රත්‍යයො භවති.**

---

15. භාවකර්මණොඃ, භාව- කර්ම දෙක්හි; ඝ්‍යණ්ක්‍යපෞ, ඝ්‍යණ්- ක්‍යප් දෙක ද; තව්‍යානීයෞ, තව්‍ය- අනීය දෙක ද; "ස්වරාද්‍යඃ ච, "ස්වරාද්‍යඃ" යි ස්වරාන්ත ධාතුහු කෙරෙන් වන ය ප්‍රත්‍යය ද යන; කෘත්‍යාඃ පඤ්ච, කෘත්‍ය සංඥ ප්‍රත්‍යයෝ පස් දෙනෙක්; ශබ්ද ශාස්ත්‍ර විචක්ෂණෛඃ, ශබ්දශාස්ත්‍රයෙහි දක්‍ෂයන් විසින්; සමාඛ්‍යාතාඃ, ප්‍රකාශ කරණ ලදහ. (කෙලිම ප්‍රත්‍යය ද කෘත්‍ය සඞ්ඛ්‍යාවට ගැණෙන බව ශබ්දකෞමුදියෙහි පෙණේ.)

කෘත්‍ය ප්‍රක්‍රියා, කෘත්‍ය සංඥ ප්‍රත්‍යයන් පිළිබඳ අධිකාරය; ඉති, මෙසේ යි.

## කෘත්‍යප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාව නිමි.

---

a. අථ, ඉක්බිති; ස්ත්‍ර්‍යධිකාරඃ, ස්ත්‍ර්‍යධිකාරය හෙවත් ස්ත්‍ර්‍යර්ථයෙහි විහිත ප්‍රත්‍යයන් පිළිබඳ අධිකාරය දක්වනු ලැබේ. (මේ පරිච්ඡේදයෙහි විධීයමාන ප්‍රත්‍යයන් අන්ත කොට ඇති නාමයෝ බොහෝ සෙයින් ස්ත්‍රීලිඞ්ගික වෙති.)

87. ක්‍යප් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "ධාතොඃ" යනු විභක්ති–වචන විපර්‍ය්‍යාස වශයෙන් ධාතුනාම් කියා ද, "කෘදුපධාත් ක්‍යප්" යි ක්‍යප් යනු ද වැටේ. යජාං ධාතුනාම්, යජාදි ධාතූන් සම්බන්ධ ව; ස්ත්‍රියාම්, ස්ත්‍ර්‍යර්ථයෙහි; භාවෙ, භාවයෙහි; ක්‍යප්, ක්‍යප් ප්‍රත්‍යය වේ.

b. යජාදෙඃ ධාතොඃ, යජ් ආදී ධාතුහු කෙරෙන් ස්ත්‍රියාම්, ස්ත්‍රී ලිඞ්ගයෙහි; භාවෙ, භාවයෙහි; ක්‍යප් ප්‍රත්‍යයඃ භවති, ක්‍යප් ප්‍රත්‍යය වේ. (සූත්‍රයෙහි "යජාම්" යන බහු වචනය ආද්‍යර්ථ යි.)

---

* ක්‍යප්- පොත්හි.

**a. යජ් ව්‍රජ් සමජ් නිෂද් නිපත් මන් නම් විද් ෂුඤ් ශීඞ් භෘඤ් ඉණ් කෘඤ් ඉෂු පරිසෘ පරිචර අටාට්‍ය ආස් චර් ජාගෘ හන් එතෙ යජාදයඃ.**

**b. කිත්ත්වාත් සම්ප්‍රසාරණම්. ඉජ්‍යතෙ සා=ඉජ්‍යා, ස්ත්‍රීත්වාදාප්. ව්‍රජ්‍යතෙ සා= ව්‍රජ්‍යා. ප්‍රකර්ෂේණ ව්‍රජ්‍යතෙ අස්‍යාමිති= ප්‍රව්‍රජ්‍යා. අජ ගතෞ ක්ෂෙපණෙ ච, සමජ්‍යතෙ සා= සමජ්‍යා, ශිබිකා. ෂද් විශරණගත්‍යවසාදනෙෂු, නිෂද්‍යතෙ සා= නිෂද්‍යා. නිපත්‍යා. මන ඥානෙ, මන්‍යතෙ සා=මන්‍යා. නම්‍යා. විද්‍යතෙ සා= විද්‍යා. සුත්‍යා. ශීඞො'යඞ් ක්ඞිති ශෙ ය වක්තව්‍යඃ. ශය්‍යා. භෘත්‍යා. ඊයතෙ සා= ඉත්‍යා. කෘත්‍යා. කෘඤො යක් වා වාච්‍යඃ. "අයකි"**

---

a. යජ්—හන් එතෙ, යජ්- ව්‍රජ්- 'සම්' පූර්ව අජ්- 'නි' පූර්ව ෂද්- පත්- මන්- නම්- විද්- ෂු- ශී- භෘ- ඉ- කෘ- ඉෂ්- 'පරි' පූර්ව සෘ- චර්- යඞන්ත අටාට්‍ය- ආස්- චර්- ජාගෘ- හන් යන මොහු (21); යජාදයඃ; යජාදීහු නම් වෙත්. ("යජාං යවරණාං ය්වෘතඃ සම්ප්‍රසාරණං කිති" යන සූත්‍රයට අයත් 'යජාදිය' මීට වෙනස් ය. එහි ධාතු එකොළොසකි. පොතේ 134 පිට බලනු.)

b. කිත්ත්වාත්, ප්‍රත්‍යය කිත් බැවින්; සම්ප්‍රසාරණම්, ධාතුහට සම්ප්‍රසාරණ වේ. ඉජ්‍යතෙ, යාග කිරීම තු යි; සා, ඕ තොමෝ; ඉජ්‍යා, "ඉජ්‍යා" නමු. ස්ත්‍රීත්වාත්, ස්ත්‍රීලිඞ්ගික බැවින්; ආප්, "ආබතඃ ස්ත්‍රියාම්" යි ආප් ප්‍රත්‍යය වේ. ව්‍රජ්‍යතෙ, යෑම තු යි; සා, ඕ තොමෝ; ව්‍රජ්‍යා, "ව්‍රජ්‍යා" නමු. අස්‍යාම්, මෙහි; ප්‍රකර්ෂේණ, ප්‍රකර්ෂයෙන්; ව්‍රජ්‍යතෙ ඉති, යෑම තු යි; ප්‍රව්‍රජ්‍යා, "ප්‍රව්‍රජ්‍යා" නමු. අජ— සමජ්‍යතෙ,[1] ගමන් කිරීම තු යි; සා, ඕ තොමෝ; සමජ්‍යා, "සමජ්‍යා" නමු. ශිබිකා, සිවි ගෙය යි. (භාවයෙහි පමණක් නම් ශිවිකාව ය- සභාව ය යන අර්ථ නො ලැබේ. එබැවින් මේ ක්‍යප් ප්‍රත්‍යය කරණාධාර කාරකයන්හි ද වන බව සිතිය යුතු යි.) ෂද් විශරණගත්‍යවසාදනෙෂු, 'ෂද්' ධාතුව හිංසා- ගමන- අසමත් බව යන අර්ථයන්හි වේ. නිෂද්‍යතෙ සා= නිෂද්‍යා,[2] හිඳීම තු යි ඕ "නිෂද්‍යා" නමු. නිපත්‍යා, (නිපත්‍යතෙ ඉති=[3] වැටීම තු යි;) "නිපත්‍යා නමු. මන— මන්‍යතෙ සා= මන්‍යා,[4] දැනුම තු යි ඕ "මන්‍යා" නමු. නම්‍යා, (නම්‍යතෙ සා= නැමීම තු යි ඕ) "නම්‍යා" නමු. විද්‍යතෙ සා= විද්‍යා,[5] දැනීම තු යි

---

1 සමජන්ත්‍යස්‍යාමිති = සමජ්‍යා, සභා- සුබොධිනී.

2 නිෂීදන්ත්‍යස්‍යාමිති= නිෂද්‍යා, ආපණඃ- සුබොධිනී.

3 නිපතන්ත්‍යස්‍යාමිති= නිපත්‍යා, පිච්ඡිලා භූමිඃ- සුබොධිනී

4 මන්‍යතෙ'නයෙති=මන්‍යා, ගලපාර්ශ්ව නාඩී- සුබොධිනී.

5 විදන්ත්‍යනයෙති= විද්‍යා- සුබොධිනී.

ක්‍රියතෙ සා= ක්‍රියා. ඉෂෙශ්ඡානන්තාදෙශො යලොපශ්ච. ඉෂ්‍යතෙ සා= ඉච්ඡා. සරතෙර්ගුණඃ. පරිසර්‍යා. පරිචර්‍යා. අටාට්‍යා. ආස්‍යා. චර්‍යා. ජාගතෙර්ගුණඃ, ජාගර්‍යා. 1

a. හන්තෙස්තඃ.

b. හන්තෙර්නකාරස්‍ය තකාරාදෙශො භවති ක්‍යපි සඤ්ඥායාම්. හන්‍යතෙ සා=හත්‍යා. බ්‍රහ්මණො හනනං= බ්‍රහ්මහත්‍යා.

---

ඕ "විද්‍යා" නමු. (=විද් ඥානෙ.) සුත්‍යා, (සූයතෙ 2 සා= නෑම නු යි ඕ) "සුත්‍යා" නමු. (තුගාගම යි.) ක්ඞිති යෙ, කිත්- ඞිත් වූ යකාරය පර කල්හි; ශීඞඃ, ශීඞ් ධාතුහට; අයඞ් වක්තව්‍යඃ, අයඞ් ආදෙශය කිය යුතු යි. (මෙය පෙර ද කීහ. 189 පිට බලනු.) ශය්‍යා, (ශීයතෙ සා 3 = නිදීම නු යි ඕ) "ශය්‍යා" නමු. භෘත්‍යා, (භ්‍රියතෙ සා= දැරීම හෝ පොෂණය නු යි ඕ) "භෘත්‍යා" නමු. ඊයතෙ සා= ඉත්‍යා, 4 යෑම නු යි ඕ "ඉත්‍යා" නමු. කෘත්‍යා, (ක්‍රියතෙ සා= කිරීම නු යි ඕ;) "කෘත්‍යා" නමු. කෘඤඃ, කෘඤ් ධාතුහු කෙරෙන්; වා, විකල්පයෙන්; යක් වාච්‍යඃ, යක් ප්‍රත්‍යය කිය යුතු යි. "අයඞ්" යන සූත්‍රයෙන් රිඞාදෙශ වේ. ක්‍රියතෙ සා= ක්‍රියා, කිරීම නු යි ඕ තොමෝ "ක්‍රියා" නමු. (මෙය කෘත්‍ය ප්‍රක්‍රියායෙහි ක්‍යප් ප්‍රත්‍යයෙන්ද නිපදවූහ. 425 පිට බලනු.) ඉෂෙඃ, ඉෂ් ධාතුහු; සම්බන්ධි ච; ඡානන්තාදෙශඃ, අන්තයට ඡකාරාදෙශ ද; යලොපඃ ච, ප්‍රත්‍යයස්ථ යකාරලොපය ද වේ. ඉෂ්‍යතෙ සා= ඉච්ඡා, කැමති වීම නු යි ඕ "ඉච්ඡා" නමු. සරතෙඃ, සෘ ධාතුහට; ගුණඃ, ගුණ වේ. පරිසර්‍යා, (පරිසරණම්= හැසිරීම;) "පරිසර්‍යා" නම් වේ. පරිචර්‍යා, (පරිචරණම්= සෙවය කිරීම;) "පරිචර්‍යා" නම් වේ. අටාට්‍යා, (අතිශයෙන අටනම්= අතිශයින් ගමන් කිරීම;) "අටාට්‍යා" නම් වේ. ("අතපි ච හසාත්" යි යඞ් ප්‍රත්‍යයාගේ යකාරයට ද- "යතඃ" යි අකාරයට ද ලොප් වේ.) ආස්‍යා, (ආස්‍යතෙ ඉති= හිඳීම නු යි;) "ආස්‍යා" නම් වේ. චර්‍යා, (චරණම්= හැසිරීම;) "චර්‍යා" නම් වේ. ජාගතෙඃ, ජාගෘ ධාතුහට; ගුණඃ, ගුණ වේ. ජාගර්‍යා, (ජාගරණම්= නිදි මැරීම;) "ජාගර්‍යා" නම් වේ.

a. හන්තෙඃ, හන් ධාතුහුගේ අන්තයට; තඃ, තකාරය වේ.

b. සඤ්ඥායාම්, සංඥාර්ථයෙහි වූ; ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි; හන්තෙඃ, හන් ධාතුහුගේ; නකාරස්‍ය, නකාරයට; තකාරාදෙශඃ

---

1 හන්තෙස්තකාරාන්තාදෙශො සංඥායාමපි- පොත්හි. එය වැඩි යි.

2 සුවන්ති සොමො'ත්‍රෙති=-සුත්‍යා 'භිෂවො දිවසඃ, තත්ත්වදීපිකා.

3 ශය්‍යතෙ'ස්‍යාං= ශය්‍යා= ඛට්වාදිඃ - තත්ත්වදීපිකා

4 ඊයතෙ'නයෙති= ඉත්‍යා, ශිබිකා- සුබොධිනී.

## 88. ක්තිඃ. * (ක්තිඃ 1-1.)

**a. ධාතොඃ ස්ත්‍රියාං භාවෙ ක්තිඃ ප්‍රත්‍යයො භවති.**

**b. ක්‍රියතෙ සා= කෘතිඃ. බුධ්‍යතෙ සා= බුද්ධිඃ. ස්මෘ චින්තායාම්, ස්මර්‍ය්‍යතෙ සා= ස්මෘතිඃ. පච්‍යතෙ සා= පක්තිඃ. පචි විස්තාරෙ, පඤ්ච්‍යතෙ, තත්= පඤ්චනං- පඞ්ක්තිඃ. සම්ප්‍රසාරණම්, උහ්‍යතෙ සා= ඌඪිඃ. සංවිද්‍යතෙ සා= සංවිත්තිඃ. "ශමාං දීඝඃ"† ශම්‍යතෙ සා= ශාන්තිඃ. දම්‍යතෙ සා= දාන්තිඃ. භ්‍රමු චලනෙ, භ්‍රම්‍යතෙ සා= භ්‍රාන්තිඃ. ගම්‍යතෙ සා= ගතිඃ. හන්‍යතෙ සා=**

---

හවති, තකාරාදෙශ වේ. හන්‍යතෙ, සා= හත්‍යා, නැසීම නු යි ඕ තොමෝ "හත්‍යා" නමු. බ්‍රහ්මණො හනනම්,‡ බ්‍රහ්මයා නැසීම; බ්‍රහ්මහත්‍යා, "බ්‍රහ්මහත්‍යා" නම් වේ.

88. ක්ති ප්‍රත්‍යය විධි සූත්‍ර යි. **ධාතොඃ** යනු ද, "ස්ත්‍රියාම් යජාං භාවෙ" යි **ස්ත්‍රියාම්- භාවෙ** යනු ද අනුවෘත්ත යි. ධාතොඃ, ධාතූහු කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීලිඞ්ගයෙහි; භාවෙ, භාවයෙහි; ක්තිඃ, ක්ති ප්‍රත්‍යය වේ.

a. ධාතොඃ, ධාතූහු කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීලිඞ්ගයෙහි; භාවෙ, භාවයෙහි; ක්තිඃ ප්‍රත්‍යයඃ භවති, ක්ති ප්‍රත්‍යය වේ. (සාමාන්‍ය විධානයක් හෙයින් විශෙෂ සූත්‍රවලට විෂය නො වන සියලු ධාතූන් කෙරෙන් ම වේ. කිත් බැවින් ධාතුහට ගුණ නො වේ.)

b. ක්‍රියතෙ, කිරීම නු යි; සා, ඕ තොමෝ; කෘතිඃ, "කෘති" නමු. බුධ්‍යතෙ සා= බුද්ධිඃ, අවබොධ කිරීම නු යි ඕ "බුද්ධි" නමු. ("තථොර්ධඃ" යි තකාරයට ධකාර ව "ඣබෙ ජබාඃ" යි පූර්‍ව ධකාරයට දකාර වේ.) ස්මෘ— ස්මර්‍ය්‍යතෙ සා= ස්මෘතිඃ, සිහි කිරීම නු යි ඕ "ස්මෘති" නමු. පච්‍යතෙ සා= පක්තිඃ, පිසීම නු යි ඕ "පක්ති" නමු. ("චොඃ කුඃ" යි චයන්තට කයන්ත වේ.) පචි— පඤ්ච්‍යතෙ, පතුරුවාලීම නු යි; තත්, එය; පඤ්චනම්, "පඤ්චන" නම් ද, පඞ්ක්තිඃ, "පඞ්ක්ති" නම් ද වේ. ("ඉදිතො නුම්" යි නුමාගම ව ඊට "නශ්චාපදාන්තෙ ඣලෙ" යි අනුස්වාර ව "යමා යපෙ'ස්‍ය" වර්ගාන්තාදෙශ වේ.) සම්ප්‍රසාරණම්, සම්ප්‍රසාරණ වේ. උහ්‍යතෙ සා= ඌඪිඃ, ඉසිලීම නු යි ඕ "ඌඪි" නමු. ("වහඃ කෘතෙ කොත්‍ව" යනාදි ශ්ලොකයෙහි ඌඪි ශබ්දයාගේ සිද්ධිය දක්වන ලදී. 207 පිට බලනු.)

---

* ස්ත්‍රියාං භාවෙ ක්තිඃ- පොත්හි.

† පොත්හි සූත්‍ර- වෘත්ති දෙකක් පෙණේ. මෙය පෙර දෙපලක කියන ලද්දක් බැවින් ඒ වැඩි යි. තුන් වන කාණ්ඩයේ 627 පිට හා සතර වන කාණ්ඩයේ 74 පිට බලනු.

‡ බ්‍රහ්ම හත්‍යතෙ ඉති- පොත්හි. 'හන්‍යතෙ' යන්නට 'බ්‍රහ්ම' යනු කුමක් වේ ද?

භතිඃ. අනුභූයතෙ තත්= අනුභවනං- අනුභූතිඃ. විශිෂ්ටා භූතිඃ= විභූතිඃ. ප්‍රභූතිඃ. භවනං= භූතිඃ. ශුධ ශෞචෙ, ශොධනං= ශුද්ධිඃ.

## 89. ඊශ්ශීඩොර්වරකෙතෘයාර්නෙඩ් *ගුණශ්ච.

(ඊශ්ශිඩොඃ 6-2. වරකෙත්‍යාඃ 7-2. න-නිඃ ඉට් 1-1. ගුණඃ 1-1. ච. නිඃ)

a. ඊශ්ශීඩොර්වරකතිප්‍රත්‍යයෞ ස්තො වරප්‍රත්‍යයස්‍ය ච ඉඩ් න. ශීඩො ගුණො'පි න භවති. ඊශෙට'සෞ= ඊශ්වරඃ. සංශය්‍යතෙ තත්= සංශයනං- සංශිතිඃ.

---

සංවිද්‍යතෙ සා= සංවිත්තිඃ, දැනීම නු යි ඕ "සංවිත්ති" නමු. "ශමාං දීඝීඃ" යන්නෙන් දීඝ වේ. ශම්‍යතෙ සා= ශාන්තිඃ, සන්සිඳීම නු යි ඕ "ශාන්ති" නමු. දම්‍යතෙ සා= දාන්තිඃ, දමනය කිරීම නු යි ඕ "දාන්ති" නමු. භ්‍රමු— භ්‍රම්‍යතෙ සා= භ්‍රාන්තිඃ, කරකැවීම නු යි ඕ "භ්‍රාන්ති" නමු.(මකාරයට අනුස්වාර භා වර්ගාන්තාදෙශ යි.) ගම්‍යතෙ සා= ගතිඃ, යෑම නු යි ඕ "ගති" නමු. හන්‍යතෙ සා=හතිඃ, නැසීම නු යි ඕ "හති" නමු. (ලොපස්තවනුදාත්ත තනාම්" යි ධාත්වන්ත ලොපය වේ.) අනුභූයතෙ, අනුභව කිරීම නු යි; තත්, එය; අනුභව නම්, "අනුභවන" නම් ද; අනුභූතිඃ, "අනුභූති" නම් ද වේ. විශිෂ්ටා භූතිඃ, විශිෂ්ට වූ වීම; විභූතිඃ, "විභූති" නම්. ප්‍රභූතිඃ, (ප්‍රකෘෂ්ටා භූතිඃ= උසසාමිවත් වූ වීම;) "ප්‍රභූති" නම්. භවනං- භූතිඃ, වීම "භූති" නම්. ශුධ— ශොධනං ශුද්ධිඃ, පිරිසිදු වීම "ශුද්ධි" නම්. (රූප සිද්ධිය 'බුද්ධි' යන්නෙහි මෙනි.)

89. ඉට්- ගුණ ප්‍රතිෂෙධ විධි සූත්‍ර යි. ඊශ්ශිඩොඃ, ඊශ්- ශීඩ් ධාතු දෙක සම්බන්ධ ව; වරකෙත්‍යාඃ, වර- කති යන ප්‍රත්‍යය දෙක පර කල්හි; ඉට්, ඉඩාගමය ද; ගුණඃ ච, ගුණය ද; න, නොවේ.

a. ඊශ්ශීඩොඃ, ඊශ්- ශීඩ් ධාතු ද්වය සම්බන්ධ ව; වරකති ප්‍රත්‍යයෞ, වර- කති ප්‍රත්‍යය දෙදෙන; ස්තඃ, වෙත්. වරප්‍රත්‍යයස්‍ය ච, වර ප්‍රත්‍යය සම්බන්ධ ව ද; ඉට් න, ඉඩාගම නො වේ. ශීඩඃ, ශීඩ් ධාතුහට; ගුණඃ අපි න භවති, ගුණ ද නො වේ. (වර ප්‍රත්‍යය පර කල්හි ඊශ් ධාතුවෙන් පර ව ඉඩාගම ය ද, කති ප්‍රත්‍යය කිත් වුවත් "ශීඩඃ සර්වත්‍ර" යි වන ගුණය ද මෙයින් ප්‍රතිෂිද්ධ ය.) ඊශෙට, අධිපති වේ නු යි; අසෞ, මේ තෙමේ; ඊශ්වරඃ, "ඊශ්වර" නම්. (ශිලාවී ප්‍රක්‍රියාවෙහි ද මෙය දක්වූහ. 375 පිට බලනු.) සංශය්‍යතෙ, සැක කිරීම නු යි; තත්, එය; සංශයනම්, "සංශයන" නම් ද; සංශීතිඃ, "සංශීති" නම් ද වේ.

---

* වරකති ප්‍රත්‍යයෞ- පොත්හි.

**a. ශ්‍රී ශනෞ, ශ්‍රීයතෙ ඉති= ශ්‍රීතිඃ. ජාගරණං= ජාගෘතිඃ. නිගෘහ්‍යතෙ සා= නිගෘහිතිඃ. කුච සංකොචනෙ, කුච සම්පර්චන කෞටිල්‍යප්‍රතිෂ්ටම්භවිලෙඛනෙෂු, තුදාදිඃ. නිකුචිතිඃ. නිපඨිතිඃ. ස්නිහ් ආසකන්දනෙ, උපස්නිහිතිඃ. නිපතිතිඃ. විශෙෂෙණ ධ්‍රියතෙ සා= විධෘතිඃ.**

**b. ග්ලාම්ලාජ්‍යාහාක්ත්වරිභ්‍යඃ ක්තාරථෙ නිඃ ප්‍රත්‍යයො භවති. ග්ලායතෙ සා= ග්ලානිඃ. ම්ලානිඃ. ජ්‍යානිඃ. හානිඃ. ඤිත්වරා සම්භ්‍රමෙ, ත්වරතෙර්වස්‍ය උත්වං වාච්‍යම්. ත්වර්‍යතෙ සා= තූර්ණිඃ.**

---

a. ශ්‍රී— ශ්‍රීයතෙ ඉති= ශ්‍රීතිඃ, ලජ්ජිත වීම නු යි "ශ්‍රීති" නමි. ජාගරණම්, නිදි මැරීම; ජාගෘතිඃ, "ජාගෘති" නමි. නිගෘහ්‍යතෙ, නිග්‍රහ කිරීම නු යි; සා, ඕ තොමෝ; නිගෘහීතිඃ, "නිගෘහීති" නමි. ("ග්‍රහාං ඞිති ච" යි සම්ප්‍රසාරණ හා "ඊටො ග්‍රහාම්" යි ඉඩාගමයට දීඝී යි.) කුච සංකොචනෙ, 'කුච්' ධාතුව හැකිලීමෙහි වේ. කුච— විලෙඛනෙෂු, 'කුච්' ධාතුව සම්බන්ධ ය– කුටිල බව ය– කට යුතු වැළැක්වීම ය– ඉරි ඇඳීම ය යන අර්ථයන්හි ද වේ. තුදාදිඃ, තෞදාදික ය. නිකුචිතිඃ, (නිකුච්‍යතෙ ඉති= නිරන්තරයෙන් හැකිලීම නු යි;) "නිකුචිති" නමි. නිපඨිතිඃ, (නිපඨ්‍යතෙ ඉති= නිතර හැදෑරීම නු යි;) "නිපඨිති" නමි. ස්නිහ් ආසකන්දනෙ, 'ස්නිහ්' ධාතුව පැනීමෙහි වේ. උපස්නිහිතිඃ, (උපස්නිහ්‍යතෙ ඉති= පැනීම * නු යි;) "උපස්නිහිති" නමි. නිපතිතිඃ, (නිපත්‍යතෙ ඉති= වැටීම නු යි;) "නිපතිති" නමි. විශෙෂෙණ ධ්‍රියතෙ, වෙසෙසින් දැරීම නු යි; සා, ඕ තොමෝ; විධෘතිඃ, "විධෘති" නමි.

b ග්ලාම්ලාජ්‍යාහාක්ත්වරිභ්‍යඃ, ග්ලෛ– ම්ලෛ– ජ්‍යා– හා– ත්වර් ධාතූන් කෙරෙන්; ක්තඃ අර්ථෙ, ක්ති ප්‍රත්‍යයාගේ අර්ථයෙහි; (=ක්ති ප්‍රත්‍යය විය යුතු තැන්හි;) නිඃ ප්‍රත්‍යයඃ භවති, නි ප්‍රත්‍යය වේ. ග්ලායතෙ, ගිලන් වීම නු යි; සා, ඕ තොමෝ; ග්ලානිඃ, "ග්ලානි" නමි. ම්ලානිඃ, (ම්ලායතෙ සා= මැලවීම නු යි ඕ) "ම්ලානි" නමි. ("සන්ධ්‍යක්ෂරාණාමා" යි ආකාර වේ.) ජ්‍යානිඃ, (ජ්‍යායතෙ සා=වයස් පිරිහීම නු යි ඕ) "ජ්‍යානි" නමි. හානිඃ, (හීයතෙ සා=පිරිහීම නු යි ඕ) "හානි" නමි. ඤිත්වරා සම්භ්‍රමෙ, ඤි– ආ අනුබන්ධ "ත්වර්" ධාතුව වේගයෙහි වේ. ත්වරතෙඃ, ත්වර් ධාතුහුගේ; වස්‍ය, වකාරයට; උත්වං වාච්‍යම්, උකාර බව කිය යුතු යි. ත්වර්‍යතෙ, ඉක්මන් වීම නු යි; සා, ඕ තොමෝ; තූර්ණිඃ, "තූර්ණි" නමි ("ය්වොර්ව් හසෙ" යි දීඝී හා "ෂ්‍රැනෝ ණො'නනෙන" යි ණත්වය ද වේ.)

---

* මීමාංසා යි.

**a. ෲල්වාදිභ්‍යශ්ච ක්ත්‍යර්ථෙ නිඃ ප්‍රත්‍යයො භවති. "ෲත ඉර්" කීර්‍යතෙ සා= කීර්ණිඃ. ලූනිඃ. ධූනිඃ. පූර්ණිඃ. සම්පදාදෙඃ ක්විබ් වා වාච්‍යඃ. සම්පත්- සම්පත්තිඃ.**

**b. කර්තරි ක්තිශ්ච සංඥායාම්.**

**c. කර්ත්‍රර්ථෙ ධාතොඃ ක්තිඃ ප්‍රත්‍යයො භවති සංඥායාං විෂයෙ. ඩුකෘඤ් කරණෙ, ප්‍රකුරුතෙ සා= ප්‍රකෘතිඃ. ධෘඤ් ධාරණෙ, විපූර්වඃ, විශෙෂෙණ ධරතීති= විධෘතිඃ.**

## 90. ෂිද්භිදාමඞ්. (ෂිද්භිදම් 6-3. අඞ් 1-1.)

---

a. ෲල්වාදිභ්‍යඃ ච, ෲ- ලූ ආදි ධාතූන් කෙරෙන් ද; ක්ත්‍යර්ථෙ, ක්ති ප්‍රත්‍යයාගේ අර්ථයෙහි; නිඃ ප්‍රත්‍යයඃ භවති, නි ප්‍රත්‍යය වේ. "ෲත ඉර්" යන්නෙන් ෲකාරයට ඉර් ආදෙශ වේ. කීර්‍යතෙ, විසුරුවීම නු යි; සා, ඕ තොමෝ; කීර්ණිඃ, "කීර්ණි" නමු. ලූනිඃ, (ලූයතෙ සා= සිඳීම නු යි ඕ) "ලූනි" නමු. ධූනිඃ, (ධූයතෙ සා= කම්පිත වීම නු යි ඕ) "ධූනි" නමු. පූර්ණිඃ, (පූර්‍යතෙ සා=පිරීම නු යි ඕ) "පූර්ණි" නමු. ("පොරුර්" යි 'උර්' ආදෙශ ච දීර්‍ඝ වේ.) සම්පදාදෙඃ, 'සම්' පූර්ව පදාදි ධාතූහු කෙරෙන්; වා, විකල්පයෙන්; ක්විප් වාච්‍යඃ, ක්විප් ප්‍රත්‍යය කිය යුතු යි. සම්පත්- සම්පත්තිඃ, (සම්පද්‍යතෙ=සැපයීම නු යි;) ක්විප් ප්‍රත්‍යය වූ කල්හි "සම්පද්" නම් ද- ක්ති ප්‍රත්‍යය වූ කල්හි "සම්පත්ති" නම් ද වේ.

b. සංඥායාම්, සංඥාවක් වාච්‍ය කල්හි; කර්තරි, කර්තෘකාරකයෙහි; ක්තිඃ ච, ක්ති ප්‍රත්‍යය ද වේ.

c. සංඥායාං විෂයෙ, සංඥා විෂයෙහි; ධාතොඃ, ධාතූහු කෙරෙන්; කර්ත්‍රර්ථෙ, කර්තෘකාරකයෙහි; ක්තිඃ ප්‍රත්‍යයඃ භවති, ක්ති ප්‍රත්‍යය වේ. ඩුකෘඤ්— ප්‍රකුරුතෙ, ප්‍රකර්ෂයෙන් කෙරේ නු යි; සා, ඕ තොමෝ; ප්‍රකෘතිඃ, "ප්‍රකෘති" නමු. ධෘඤ්— විපූර්වඃ, 'වි' උපසර්ගය පූර්ව කොට ඇත්තේ ය. විශෙෂෙණ ධරතීති, වෙසෙසින් දරා නු යි; විධෘතිඃ, "විධෘති" නමු.

90. අඞ් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. "ධාතොඃ" යනු විභක්ති- වචන විපරිණාම වශයෙන් ධාතූනාම් කියා ද, "ස්ත්‍රියාං යජාං භාවෙ" යි ස්ත්‍රියාම්- භාවෙ යනු ද, "සංඥායාමකර්තරි ච" යි අකර්තරි යනු ද අනුවෘත්ත යි. ෂිද්භිදාං ධාතූනාම්, ෂකාර ඉත් කොට ඇති ධාතූය- භිද් ආදි ධාතු ය යන මොවුන් සම්බන්ධ ච; ස්ත්‍රියාම්, ස්ත්‍රීලිඞ්ගයෙහි; භාවෙ, භාවයෙහි ද; අකර්තරි, කර්තෘවර්ජිත කාරකයෙහි ද; අඞ්, අඞ් ප්‍රත්‍යය වේ.

**a.** ෂිතො ධාතොර්භිදාදෙශච ස්ත්‍රියාමඞ් ප්‍රත්‍යයො භවති භාවාදෞ. පච්‍යතෙ සා= පචා. මෘජ්‍යතෙ සා= මෘජා.

**b.** ජෘෂ්ඉර් වයොහානෞ. ජරාදෞ ඞනුබන්ධරහිතඃ අඃ ප්‍රත්‍යයො භවති. ජීර්‍ය්‍යතෙනයා සා= ජරා. ඉෂු ඉච්ඡායාමිති නිර්දේශාජ්ඥාපකාදිච්ඡා ඉත්‍යාදි නිපාත්‍යතෙ. ඉච්ඡා. ඉෂාදෙරඞපි යුච්. එෂණමිති= එෂණා. භිද්‍යතෙ අනයා සා= භිදා. ඡිද්‍යතෙ'නයා සා= ඡිදා. ක්ෂිපා. ගුහූ සංවරණෙ, ගුහා. මෙධෘ හිංසායාම්, මෙධෘ වධමෙධාසඞගමෙෂු. මෙධ්‍යතෙ ඉති= මෙධා. කෘපා. පීඩ බාධායාම්, පීඩා. බාධ පීඩායාම්, බාධා. ක්ෂපා, රාත්‍රිඃ.

---

a. ෂිතඃ ධාතොඃ, ෂිත් ධාතුහු කෙරෙන් ද; භිදාදෙඃ ච, භිදාදි ධාතුහු කෙරෙන් ද; ස්ත්‍රියාම්, ස්ත්‍රීලිඞ්ගයෙහි; භාවාදෞ, භාවාදි යෙහි; අඞ් ප්‍රත්‍යයඃ භවති, අඞ් ප්‍රත්‍යය වේ. (ඞකාරය ගුණප්‍රතිෂෙධය පිණිස යි.) පච්‍යතෙ සා= පචා, පිසීම නු යි ඕ "පචා" නම්. මෘජ්‍යතෙ සා= මෘජා, පිරිසිදු කිරීම නු යි ඕ "මෘජා" නම්.

**b.** ජෘෂ්— ජරාදෞ, ජරා ශබ්දාදි විෂයෙහි; ඞනුබන්ධ රහිතඃ, අනුබන්ධ ඞකාර රහිත වූ; අඃ ප්‍රත්‍යයඃ භවති, අ ප්‍රත්‍යය වේ. (එහෙයින් ගුණ වේ.) අනයා, මෑ කරණ කොට ගෙණ; ජීර්‍ය්‍යති, දිරා නු යි; සා, ඕ තොමෝ; ජරා, "ජරා" නම්. ඉෂු ඉච්ඡායාම් ඉති නිර්දේශාත්, "ඉෂු ඉච්ඡායාම්" කියා දක්වීම; ඥාපකාත්, ඥාපක හෙයින්; ඉච්ඡා ඉත්‍යාදි, "ඉච්ඡා" යනාදිය; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ. ("ඉච්ඡායාම්" යන නිර්දේශය ම ඉෂ් ධාතුවෙන් "ඉච්ඡා" කියා සිද්ධ වන බව අඟවන හෙයින් එය නිපාතනය කළ යුතු ය යි කී නියා යි.) ඉච්ඡා, (ඉෂ්‍යතෙ සා= කැමති වීම නු යි ඕ) "ඉච්ඡා" නම්. (නිපාතනයෙන් අඞ් ප්‍රත්‍යය ද, ෂකාරයට ඡකාර ද, "ඡඃ" යි ද්විත්වය ද, "ධසෙ චපාඃ–" යි පූර්වයට චකාර ද වේ.) ඉෂාදෙඃ, ඉෂ් ආදි ධාතුහු කෙරෙන්; අඞපි, අඞ් ප්‍රත්‍යයාගේ අර්ථයෙහි; යුච්, යුච් ප්‍රත්‍යය ද වේ. එෂණම් ඉති, කැමති වීම නු යි; එෂණා, "එෂණා" නම්. භිද්‍යතෙ අනයා සා= භිදා, මෑ කරණ කොට ගෙණ බිඳේ නු යි ඕ තොමෝ "භිදා" නම්. අනයා, මෑ කරණ කොට ගෙණ; ඡිද්‍යතෙ ඉති, සිඳේ නු යි; සා, ඕ තොමෝ; ඡිදා, "ඡිදා" නම්. ක්ෂිපා, (ක්ෂිප්‍යතෙ ඉති= මෙහෙයීම නු යි;) "ක්ෂිපා" නම්. ගුහූ— ගුහා, (ගුහන්ත්‍යස්‍යාමිති=මෙහි සඟවා නු යි;) "ගුහා" නම්. මෙධෘ හිංසායාමිති වූ "මෙධ්" ධාතුව හිංසාර්ථයෙහි වේ. මෙධෘ වධමෙධාසඞ්ගමෙෂු, 'මෙධ්' ධාතුව පෙළීම- බුද්ධිය- එකතු වීම යන අර්ථයන්හි ද වේ. මෙධ්‍යතෙ ඉති= මෙධා, දැනීම නු යි "මෙධා" නම්. කෘපා, (කෘප්‍යතෙ-

## 91. ගුරොහීසාත්. (ගුරොඃ 5-1. හසාත් 5-1.)

**a. ගුරුමතො හසානතාදධාතොඃ සත්‍රියාමඞ ප්‍රත්‍යයො භවති භාවාදෞ. න ක්තිඃ.**

**b. ඊහ චෙෂ්ටායාම්. ඊහ්‍යතෙ සා= ඊහා. ඌහ්‍යතෙ සා= ඌහා. ඊක්ෂ දර්‍ශනාඞ්කනයොඃ, ඊක්ෂ්‍යතෙ තන්= ඊක්ෂණං- ඊක්ෂා. එධ්‍යතෙ සා= එධා. ගුරොඃ කිම්? භක්තිඃ. හසාත් කිම්? නීතිඃ. ලිඛ්- රිඛ් ලෙඛනෙ, ලිඛ්‍යතෙ තල්ලෙඛනං- ලෙඛා. රිඛ්‍යතෙ තද්‍රෙඛනං- රෙඛා. ගුධ පරිවෙෂ්ටනෙ, ගුධ්‍යතෙ ඉති= ගොධා. ධෙට් පානෙ, සුෂ්ඨු ධීයතෙ ඉති= සුධා. ධුධාඤ් ධාරණ පොෂණයොඃ, ශ්‍රද්ධියතෙ සා= ශ්‍රද්ධා.**

---

සා= කරුණා කිරීම නු යි ඕ) "කෘපා" නමු. ("ක්‍රප කෘපායාම්" ධාතු යි. සම්ප්‍රසාරණ වේ.) පීඩ— පීඩා, (පීඩ්‍යතෙ සා= පෙළීම නු යි ඕ) "පීඩා" නමු. බාධ— බාධා, (බාධ්‍යතෙ සා= පෙළීම නු යි ඕ) "බාධා" නමු. ක්ෂපා, (ක්ෂප්‍යතෙ සා= මෙහෙයීම නු යි ඕ) "ක්ෂපා" නමු. රාත්‍රිඃ, රාත්‍රිය යි. (රාත්‍රිවාචක වන කල්හි "ක්ෂපයති චෙෂ්ටා මිති" යි වාක්‍ය ගත යුතු.)

91. අඞ ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. **ධාතොඃ- අඞ- සත්‍රියාම්- භාවෙ** යනු අනුවෘත්ත යි. ගුරොඃ, දීර්ඝස්වර වූ; හසාත් ධාතොඃ, ව්‍යඤ්ජනාන්ත ධාතුහු කෙරෙන්; සත්‍රියාම්, සත්‍රීලිඞ්ගයෙහි; භාවෙ, භාව යෙහි; අඞ, අඞ ප්‍රත්‍යය වේ.

a. ගුරුමතඃ, ගුර්වක්ෂරයක් ඇති; හසන්තාත් ධාතොඃ, හස ප්‍රත්‍යාහාරාන්ත ධාතුහු කෙරෙන්; සත්‍රියාම්, සත්‍රීලිඞ්ගයෙහි; භාවාදෞ, භාව ආදියෙහි; අඞ ප්‍රත්‍යයඃ භවති, අඞ ප්‍රත්‍යය වේ. න ක්තිඃ, ක්ති ප්‍රත්‍යය නො වේ.

b. ඊහ— ඊහ්‍යතෙ සා= ඊහා, උත්සාහ කිරීම නු යි ඕ "ඊහා" නමු ඌහ්‍යතෙ සා= ඌහා, සිහිවිලි සිතීම නු යි ඕ "ඌහා" නමු. **ඊක්ෂ**— ඊක්ෂ්‍යතෙ, දැකීම නු යි; තත්, එය; ඊක්ෂණම්, "ඊක්ෂණ" නම් ද; ඊක්ෂා, "ඊක්ෂා" නම් ද වේ. එධ්‍යතෙ සා= එධා, වැඩීම නු යි ඕ "එධා" නමු. ගුරොඃ කිම්, 'ගුරොඃ' යනු කිම? භක්තිඃ, "භක්ති" යනාදි තැන්හි ගුරුමත් ධාතු නො වන හෙයින් අඞ ප්‍රත්‍යය නො වනු පිණිස යි. හසාත් කිම්, 'හසාත්' යනු කිම? නීතිඃ, "නීති" යනාදි තැන්හි ස්වරාන්ත ධාතු හෙයින් අඞ ප්‍රත්‍යය නො වනු පිණිස යි. (ගුරුමත් බව ය- හසාන්ත බව ය යන ලක්ෂණ දෙක ම ඇති කල්හි අඞ ප්‍රත්‍යය වේ. (ලිඛ්- රිඛ්— ලිඛ්‍යතෙ, ලිවීම නු යි; තත්,

**a. ක්තිරාපාදිභ්‍යඃ. ආප්තිඃ. දීප්‍යතෙ සා= දීප්තිඃ. රාධ්‍යතෙ සා= රාද්ධිඃ. ප්‍රශාස්තිඃ.**

## 92. ප්‍රත්‍යයාන්තාත්. (ප්‍රත්‍යයාන්තාත් 5-1.)

**b. ප්‍රත්‍යයාන්තාද්ධාතොඃ ස්ත්‍රියාමඞ් ප්‍රත්‍යයො භවති භාවාදෞ. චිකිෂ්‍යතෙ සා= චිකිෂා. ආත්මනඃ කර්තුමිච්ඡා= චිකීෂා. ආත්මනඃ පුත්‍රෙච්ඡා වා පුත්‍රීයතෙ සා= පුත්‍රීයා. අශිතුමිච්ඡා= අශනායා. ලොලූයතෙ සා= ලොලූයා. අටාට්‍යා. කණ්ඩූඤ් ගාත්‍රවිඝර්ෂණෙ, කණ්ඩූයතෙ සා= කණ්ඩූයා. මුමූර්ෂණං= මුමූර්ෂා.**

---

එය; ලෙඛනම්, "ලෙඛන" නම් ද; ලෙඛා, "ලෙඛා" නම් ද වේ. රිඛ්‍යතෙ, ලිවීම නු සි; තත්, ඒ; රෙඛනම්, "රෙඛන" නම් ද; රෙඛා, "රෙඛා" නම් ද වේ. ගුද පරිවෙෂ්ටනෙ, 'ගුඩ්' ධාතුව වෙළීමෙහි වේ. ගුඩ්‍යතෙ ඉති, වෙළනු ලැබේ නු සි; ගොඩා, (දුනුදිය වැදීම වළකනු සඳහා ප්‍රකොෂ්ඨයෙහි බඳිනු ලබන සම) "ගොඩා" නම්. (මේ අර්ථයට කරණයෙන් ද, 'ගොයා' යන අර්ථයට නම් කර්තෘකාරකයෙන් ද වාක්‍ය ගත යුතු.) ඛෙට්— සුෂ්ඨු ඛිඨයතෙ ඉති, මොනවට බොනු ලැබේ නු සි; සුධා, "සුධා" නමු. ඩුධාඤ්— ශ්‍රද්ධීයතෙ, ඇදහීම නු සි; සා, ඕ තොමෝ; ශ්‍රද්ධා, "ශ්‍රද්ධා" නමු.

a. ආපාදිභ්‍යඃ, ආප් යනාදි ධාතුන් කෙරෙන්; ක්තිඃ, ක්ති ප්‍රත්‍යය වේ. ආප්තිඃ, (ආප්‍යතෙ සා= පැමිණීම නු සි ඕ) "ආප්ති" නමු. දීප්‍යතෙ සා= දීප්තිඃ, බැබලීම නු සි ඕ "දීප්ති" නමු. රාධ්‍යතෙ සා= රාද්ධිඃ, සිදුවීම නු සි ඕ "රාද්ධි" නමු. ප්‍රශාස්තිඃ, (ප්‍රශිෂ්‍යතෙ සා= ප්‍රකර්ෂයෙන් අනුශාසනා කිරීම නු සි ඕ) "ප්‍රශාස්ති" නමු. (මේ ආප්- දීප්- රාධ්- ශාස් ධාතුන් ගුරුමත්- හසාන්ත වුව ද ඔවුන් කෙරෙන් ක්ති ප්‍රත්‍යය විය.)

92. අඞ් ප්‍රත්‍යයවිධි සූත්‍ර සි. පෙර මෙන් ධාතොඃ- අඞ්- ස්ත්‍රියාම්- භාවෙ යනු අනුවෘත්ත සි. ප්‍රත්‍යයාන්තාත් ධාතොඃ, ප්‍රත්‍යයාන්ත ධාතුහු කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීලිඞ්ගයෙහි; භාවෙ, භාවයෙහි; අඞ්, අඞ් ප්‍රත්‍යය වේ.

b. ප්‍රත්‍යයාන්තාත් ධාතොඃ, 'ස' ආදි ප්‍රත්‍යයාන්ත ධාතුහු කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීලිඞ්ගයෙහි; භාවාදෞ, භාව ආදියෙහි; අඞ් ප්‍රත්‍යයඃ භවති, අඞ් ප්‍රත්‍යය වේ. (ස- යඞ්- අනාය ආදි ප්‍රත්‍යයාන්තයන් කෙරෙන් අඞ් ප්‍රත්‍යය මෙයින් විහිත ය.) චිකිෂ්‍යතෙ, කරණු කැමති වීම නු සි; සා, ඕ තොමෝ; චිකීෂා, "චිකීෂා" නමු. (නොහොත්,) ආත්මනඃ, තමාගේ; කර්තුම් ඉච්ඡා, කරන්නට කැමති

# 93. ඉක්ශ්තිපෞ ධාතුනිර්දේශෙ.

(ඉක්ශ්තිපෞ 1-2. ධාතුනිර්දේශෙ 7-1.)

**a. ධාතුනිර්දේශෙ වාච්‍යෙ සති ඉක්ශ්තිපෞ ප්‍රත්‍යයෞ භවතඃ. ශකාරඃ ශිති චතුර්ථිත් කාර්‍යාර්ථඃ. පච් ඉත්‍යයං ධාතුඃ= පචිඃ. ශ්‍රයතිඃ. පචතිඃ. භවතිඃ.**

**b. ණ්‍යන්ත ආස් ශ්‍රන්ථ් අර්ච් ශ්‍රන්ථ් ඝට විද වදි ඉෂිභ්‍යඃ ස්ත්‍රියාං යුර්වාච්‍යඃ. ඩුකාඤ් කරණෙ, "යුවෝරනාකෞ" කාරණා.**

---

චීම; චිකිෂා, "චිකිෂා" නමි. ආත්මනඃ, තමාගේ; පුත්‍රෙච්ඡා, පුත්‍රෙච්ඡාව; වා, නොහොත්; පුත්‍රියතෙ, පුතෙකු කැමති වීම නු යි; සා, ඕ තොමෝ; පුත්‍රියා, "පුත්‍රියා" නමි. අශිතුම් ඉච්ඡා, අනුභව කරන්නට කැමති වීම; අශනායා, "අශනායා" නමි. ලොලූයතෙ සා= ලොලූයා, අතිශයින් සිඳීම නු යි ඕ "ලොලූයා" නමි. අටාට්‍යා, (අටාට්‍යතෙ සා= අතිශයින් ඇවිදීම නු යි ඕ) "අටාට්‍යා" නමි. කණ්ඩූඤ්— කණ්ඩූයතෙ සා= කණ්ඩූයා, කැසීම නු යි ඕ "කණ්ඩූයා" නමි. මුමූෂිණං= මුමූෂා, මැරෙන්නට කැමති වීම "මුමූෂා" නමි. (ප්‍රත්‍යයාන්ත ධාතුන්ගේ රූපසිද්ධි සාන්ත- යඩන්තාදි ඒ ඒ ප්‍රක්‍රියා වලින් දත යුතු.)

93. ඉක්- ශ්තිප් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතුනිර්දේශෙ, ධාතු නිර්දේශයෙහි; ඉක්ශ්තිපෞ, ඉක්- ශ්තිප් යන ප්‍රත්‍යයෝ වෙත්.

a. ධාතුනිර්දේශෙ වාච්‍යෙ සති, ධාතුනිර්දේශය වාච්‍ය කල්හි; (=ධාතුවක් දැක්විය යුතු කල්හි;) ඉක්ශ්තිපෞ ප්‍රත්‍යයෞ, ඉක්- ශ්තිප් යන ප්‍රත්‍යයෝ දෙදෙන; භවතඃ, වෙත්. ශකාරඃ, ශකාරය; ශිති චතුර්ථීත්කාර්‍යාර්ථඃ, "ශිති චතුර්ථීත්" යන සූත්‍රයෙන් විහිත කාර්‍යය ප්‍රයෝජන කොට ඇත්තේ ය. (කකාරය ගුණප්‍රතිෂෙධය පිණිස යි.) පච් ඉති අයං ධාතුඃ, 'පච්' යන මේ ධාතුව; පචිඃ, "පචි" නමි. (ගමි- මනි- රමි- යමි- ඉෂි යනාදිය ද එසේ යි.) ශ්‍රයතිඃ, (ශ්‍රි ඉත්‍යයං ධාතුඃ= 'ශ්‍රි' යන මේ ධාතුව;) "ශ්‍රයති" නමි. පචතිඃ, (පච් ඉත්‍යයං ධාතුඃ= 'පච්' යන මේ ධාතුව) "පචති" නමි. භවතිඃ, (භූ ඉත්‍යයං ධාතුඃ= 'භූ' යන මේ ධාතුව;) "භවති" නමි. (කාරෙති- ස්‍රවති- ශෘණොති- ද්‍රවති- ප්ලවති- සූති- සූයති යනාදිය ද එසේ යි. ලඩාදි සතරෙහි මෙන් සියලු කාර්‍ය වේ.)

b. ණ්‍යන්ත ආස්— ඉෂිභ්‍යඃ, ණ්‍යන්ත ධාතු ය- ආස්- ශ්‍රන්ථ්- අර්ච්- ශ්‍රන්ථ් ඝට- විද්- වද් - ඉෂ් ධාතු ය යන මොවුන් කෙරෙන්; ස්ත්‍රියාම්, ස්ත්‍රීලිඞ්ගයෙහි; යුඃ වාච්‍යඃ, යු ප්‍රත්‍යය කිය යුතු යි.

ආසනා. උපාසනමිති= උපාසනා. අර්ච යාච්ඤාප්‍රකාශනයෝඃ, අර්චනා. ග්‍රන්ථ සන්දර්භේ, ග්‍රථ්‍යතෙ තද්ග්‍රන්ථනමිති= ග්‍රන්ථනා. ශ්‍රථි ශෛථිල්‍යෙ, ශ්‍රන්ථනා. ඝටනමිති= ඝටනා. විද්‍යතෙ වෙදනමිති= වෙදනා. වන්ද්‍යතෙ සා= වන්දනා. එෂණමිති= එෂණා.

a, ඉඤ් අජාදිභ්‍යඃ අජ ගතෞ, ආජිඃ. අත සාතත්‍ය ගමනෙ, ආතිඃ.

b. ඉක් කෘෂ්‍යාදිභ්‍යඃ. කෘෂ්‍යතෙ සා= කෘෂිඃ. ගිරිඃ. කිරිඃ.

---

ඩුකෘඤ්— "යුවෝරනාකෞ" යන්නෙන් 'අන' ආදෙශ වේ. කාරණා, (කාර්‍යතෙ ඉති= කරවීම නු යි;) "කාරණා" නමි. ආසනා, (ආස්‍යතෙ ඉති= හිඳීම නු යි;) "ආසනා" නමි. උපාසනම් ඉති, ළඟ හිඳීම නු යි; උපාසනා, "උපාසනා" නමි. අර්ච යාච්ඤාප්‍රකාශන යෝඃ, 'අර්ච' ධාතුව ඉල්ලීම- ප්‍රකාශ කිරීම යන අර්ථ දෙක්හි වේ. අර්චනා, (අර්ච්‍යතෙ ඉති= ඉල්ලීම නු යි;) "අර්චනා" නමි. ග්‍රන්ථ සන්දර්භේ, * 'ග්‍රන්ථ' ධාතුව රචනා කිරීමෙහි වේ. ග්‍රථ්‍යතෙ ඉති, ගෙතීම නු යි; තත්, එය; ග්‍රන්ථනම්, "ග්‍රන්ථන" නම් ද; ග්‍රන්ථනා, "ග්‍රන්ථනා" නම් ද වේ. ශ්‍රථි ශෛථිල්‍යෙ, "ශ්‍රථ්" ධාතුව ලිහිල් බැව්හි වේ. ශ්‍රන්ථනා, (ශ්‍රථ්‍යතෙ ඉති= ලිහිල් වීම නු යි;) "ශ්‍රන්ථනා" නමි. (ඉදිත් බැවින් නුමාගම යි.) ඝටනම් ඉති= ඝටනා, ගැටීම නු යි "ඝටනා" නමි. විද්‍යතෙ ඉති, විඳීම නු යි; වෙදනම්, විඳීම; වෙදනා, "වෙදනා" නමි. (මෙහි "විදෘ ලාභෙ" යන ධාතුව පමණක් ගැණේ.) වන්ද්‍යතෙ, වැඳීම නු යි; සා, ඕ තොමෝ; වන්දනා, "වන්දනා" නමි. (මෙහි ද නුමාගම යි.) එෂණම් ඉති=එෂණා, සෙවීම නු යි "එෂණා" නමි.

a. අජාදිභ්‍යඃ, අජාදි ධාතූන් කෙරෙන්; ඉඤ්, ඉඤ් ප්‍රත්‍යය වේ. (ඤිත් බැවින් වෘද්ධි වේ.) අජ— ආජිඃ, (අජන්ත්‍යස්‍යාමිති= මෙහි යෙත් නු යි;) යුද්ධය "ආජි" නමි. අත සාතත්‍යගමනෙ, 'අත්' ධාතුව නිරන්තර ගමනෙහි වේ. ආතිඃ, අතතීති= නිතර යේ නු යි;) කොක්නා ලිහිණියා "ආති" (=පුංලිඞ්ග:) නමි.

b. කෘෂ්‍යාදිභ්‍යඃ, කෘෂ් ආදි ධාතූන් කෙරෙන්; ඉක්, ඉක් ප්‍රත්‍යය වේ. (කිත් බැවින් ධාතුහට ගුණ නො වීම මෙහි වෙනස යි.) කෘෂ්‍යතෙ, සෑම නු යි; සා ඕ තොමෝ; කෘෂිඃ, "කෘෂි" නමි. ගිරිඃ, (ගිලතීති=ගිලේනු යි;) "ගිරි" නමි. (='ගෘ නිගරණෙ' ධාතු යි. "ඍෘත ඉර්" යි "ඉර්" ආදෙශ යි.) කිරිඃ, (කිරතීති= විසුරුවා නු යි;) ඌරු හෝ මෙසය "කිරි" (පුං:) නමි.

---

* "ගුඞාඋස්‍ය ප්‍රකාශශව- සාරෙසාභිඃ ශ්‍රෙෂ්ඨතා තථා,
නානාඅර්චත්ත්වං වෙදත්වං- සන්දර්භඃ කථ්‍යතෙ බුධෛඃ."

**a. සර්වධාතුභ්‍ය ඉඃ. කවිඃ. රවිඃ.**

## ඉති ස්ත්‍ර්‍යධිකාර ප්‍රක්‍රියා.

---

**b. අථ ක්ත්වාදයඃ ප්‍රත්‍යයාඃ:-**

## 94. පූර්වකාලෙ ක්ත්වා. (පූර්වකාලෙ 7-1. ක්ත්වා 1-1.)

---

a. සර්වධාතුභ්‍යඃ, සියලු ධාතූන් කෙරෙන්; ඉඃ, ඉ ප්‍රත්‍යය වේ. (කිත්- ඞිත් නො වන හෙයින් ධාතුහට ගුණ වීම මෙහි වෙනස යි.) කවිඃ, (කවතෙ ඉති= ශබ්ද කෙරේ නු යි;) කටකලියාව "කවි" නම් වේ. (පුල්ලිඞ්ග 'කවි' ශබ්දය පණ්ඩිතාදි අර්ථ වාචක ය.) රවිඃ, (රෞතීති= ශබ්ද කෙරේ නු යි;) හිරු "රවි" (පුං:) නමි. (චන්ද්‍රකීර්ති ටීකාකාරයෝ මේ කොටස උණාදියෙහි දක්වූහ. ඒ වඩා යොග්‍ය ය යි හඟිමු.)

ස්ත්‍ර්‍යධිකාර ප්‍රක්‍රියා, ස්ත්‍ර්‍යර්ථයෙහි විහිත ප්‍රත්‍යයන් පිළිබඳ ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි. (මේ ප්‍රක්‍රියායෙහි ද ප්‍රත්‍යයන් මුඛ්‍ය වශයෙන් භාවාර්ථයෙහි විහිත වුව ද ඔවුන්ගෙන් නිෂ්පන්න නාමයන් බොහෝ සේ ස්ත්‍රීලිඞ්ගයෙහි ම පවත්නා හෙයින් මෙය භාවාධිකාර ප්‍රක්‍රියායෙන් වෙන් කොට "ස්ත්‍ර්‍යධිකාර" නමින් වෙන ම ප්‍රක්‍රියාවක් කළ බව සැලකිය හැකි යි. එහෙත් ඇතැම් නාමයෝ තදන්‍ය ලිඞ්ග ද භජනය කෙරෙත්. මෙහි ම උදාහෘත 'ආති- කිරි- රවි' ශබ්ද පුංලිඞ්ගික ය. ලිඞ්ගත්‍රයයෙහි ම ව්‍යවහෘත වන 'කවි' ශබ්දයෙක් ද වෙයි. ධාතු නිර්දේශයෙහි වූ ඉක්- ශ්තිප් ප්‍රත්‍යයාන්තයන් පුංලිඞ්ගික බවට **"නාමිශචතුණ්ඩො හනිරෙව පඤ්චමො ගම්සන්‍ෂණ්ඨඃ— පචිං වචිං විචිරිචිරඤ්ජිපෘච්ඡතීන්."** යනාදි අනිට් කාරිකා ශ්ලොකයෝ ම සාක්‍ෂ්‍යයහ.)

## ස්ත්‍ර්‍යධිකාරප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාව නිමි.

---

b. අථ, අනතුරු ව; ක්ත්වාදයඃ ප්‍රත්‍යයාඃ, ක්ත්වාදි ප්‍රත්‍යයෝ දක්වනු ලැබෙත්.

94. ක්ත්වා ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. "ධාතොඃ" යි අනුවෘත්ත යි, පූර්වකාලෙ, පූර්වකාලාර්ථයෙහි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; ක්ත්වා, ක්ත්වා ප්‍රත්‍යය වේ.

**a. ධාතොඃ ක්ත්වාප්‍රත්‍යයො භවති පූර්වකාලෙ සමානකර්තෘකෙ ධාතෞ ප්‍රයුජ්‍යමානෙ. දෙවදත්තඃ ස්නාත්වා භුඞ්ක්තෙ- භුක්ත්වා ව්‍රජති.**

**b. න ක්ත්වා සෙට්.***

---

a. සමානකර්තෘකෙ ධාතෞ, සමානකර්තෘක ධාතුවක්; ප්‍රයුජ්‍යමානෙ, යොදනු ලබන කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; පූර්වකාලෙ, පූර්ව කාලාර්ථයෙහි; ක්ත්වා ප්‍රත්‍යයඃ භවති, ක්ත්වා ප්‍රත්‍යය වේ. දෙවදත්තඃ, දෙව්දත් තෙමේ; ස්නාත්වා, නා; භුඞ්ක්තෙ, අනුභව කෙරේ. භුක්ත්වා, අනුභව කොට, ව්‍රජති යෙයි.

(මෙයින් පූර්වක්‍රියා විෂයෙහි ක්ත්වා ප්‍රත්‍යය විහිත ය. සමානකර්තෘක වූ අපර ක්‍රියාවක් ඇති කල්හි හෙවත් එක ම කර්තෘ කෙනෙකුන් විසින් කරණ ක්‍රියා කිපයක් එක ම වාක්‍යයක යෙදෙන කල්හි පළමු කොට කරණ ක්‍රියාව වාචක ධාතුහු කෙරෙන් ක්ත්වා ප්‍රත්‍යය වේ. කිත් බැවින් ගුණ නොවේ. තුමන්තයන් මෙන් ම ක්ත්වා ප්‍රත්‍යයාන්තයෝ ද අව්‍යයෝ ය. එහෙයින් ඔහු 'නෛපාතික ක්‍රියා' යන නාමයෙන් ද හඳුන්වනු ලබත්. **දෙවදත්තඃ ස්නාත්වා භුඞ්ක්තෙ** යන මෙහි ස්නාන- භොජන සඞ්ඛ්‍යාත ක්‍රියා දෙක්හි ම කර්තෘ දෙවදත්ත තෙමේ යි. එහෙයින් සමානකර්තෘක ය. ඒ දෙකින් ස්නාන ක්‍රියාව පූර්වකාලීන ය. භොජන ක්‍රියාව අපරකාලීන ය. එසේ හෙයින් පූර්වකාලීන ක්‍රියාව වාචී "ස්නා" ධාතුහු කෙරෙන් ක්ත්වා ප්‍රත්‍යය ව "ස්නාත්වා" යි වේ. මතු උදාහරණ ද එසේ දතයුතු. එක් වාක්‍යයක පූර්වක්‍රියා සමූහයක් වුවත් යෙදිය හැකි ය.

"ගත්වා ස්නාත්වා ච දධ්‍යන්නං- භුක්ත්වා පීත්වාම්බු ශීතලම්,
වටෙ ශයිත්වා ක්‍රීඩිත්වා- යාතො මත්‍යුතපෙ සුඛී."

යනු ඊට උදාහරණ යි. **භුක්තවති බ්‍රාහ්මණෙ ශූද්‍රෝ යාති** යන මෙහි "භුක්තවති- යාති" යන භොජන- ගමන ක්‍රියා ද්වයය භින්නකර්තෘක බැවින් ක්ත්වා ප්‍රත්‍යය නො වේ. **'දෙවදත්තො ව්‍රජති ජල්පති ච'** යි කී කල්හි ව්‍රජන- ජල්පන ක්‍රියා ද්වයය ම එකකාලීන හෙයින් ක්ත්වා ප්‍රත්‍යය නො වේ.)

b. සෙට් ක්ත්වා, ඉඩාගම සහිත ක්ත්වා ප්‍රත්‍යය; න, කිත් නො වේ.

---

* පාණිනිය 1-2-18.

**a. සෙට් ක්ත්වා කිත්ත භවති. වර්තිත්වා, ශයිත්වා, සෙට් කිම්? භූත්වා.* කෘත්වා.**

**b. රලො ව්‍යුපධාද්ධලාදෙඃ සංශ්ච.†**

**c. උශ්ච ඉශ්ච වි, තෞ උපධෙ යස්‍ය තස්මාද්ධලාදෙ රලන්තාත් පරෞ ක්ත්වාසනෞ සෙටෞ වා කිතෞ ස්තඃ. විද**

---

a. සෙට් ක්ත්වා, ඉට් සහිත ක්ත්වා ප්‍රත්‍යය තෙමේ; කිත් න භවති, කිත් සංඥ නො වේ. 'වර්තිත්වා' (=පැවතී) 'ශයිත්වා' (නිද) යනු උදාහරණ යි. මේ දෙතැන්හි "ස්‍යතඃ" යි ඉඩාගම වූ බැවින් ක්ත්වා ප්‍රත්‍යය කිත් නො විමෙන් ධාතුහට ගුණ විය.) සෙට් කිම්, 'සෙට්' යනු කිම? 'භූත්වා' (=වී) 'කෘත්වා' (=කොට) යනාදී ඉඩාගම රහිත තැන්හි කිත් බව නො වළක්වනු පිණිස යි. (එහෙයින් එබඳු තැන්හි ගුණ නො වේ.)

b. ව්‍යුපධාත්, උකාර- ඉකාර උපධා කොට ඇති; හලාදෙඃ, හල් ප්‍රත්‍යාහාර වර්ණ ආදි කොට ඇති; රලඃ, රල් ප්‍රත්‍යාහාරාන්ත ධාතුහු කෙරෙන් පර වූ; සන් ච, (සෙට් ක්ත්වා ප්‍රත්‍යය ද,) සන් ප්‍රත්‍යය ද; (විකල්පයෙන් කිත් වෙති.)

c. උඃ ච, උකාරය ද; ඉඃ ච, ඉකාරය ද, වි, "වි" නමු. තෞ, ඒ උ- ඉ දෙදෙන; උපධෙ, උපධා සංඥ වූවෝ; යස්‍ය, යම් ධාතුවක් හුගේ ද; තස්මාත්, ඒ; හලාදෙඃ, හල් ප්‍රත්‍යාහාර වර්ණ ආදි කොට ඇති; රලන්තාත්, රල් ප්‍රත්‍යාහාර වර්ණ අන්ත කොට ඇති ධාතුහු කෙරෙන්; පරෞ, පර වූ; සෙටෞ, ඉඩාගම් සහිත වූ; ක්ත්වාසනෞ, 'ක්ත්වා- සන්' ප්‍රත්‍යය දෙදෙන; වා, විකල්පයෙන්; කිතෞ ස්තඃ, 'කිත්' නම් වෙත්. (මේ පාණිනීය හල්- රල් ප්‍රත්‍යාහාරයෝ මෙහි හස- රස ප්‍රත්‍යාහාරයෝ යි. සන් ප්‍රත්‍යය නම් ඉච්ඡාර්‍ථ ස ප්‍රත්‍යය යි. එහෙයින් උකාර- ඉකාරයන් උපධා කොට ඇති ව්‍යඤ්ජනාදි රස ප්‍රත්‍යාහාරාන්ත ධාතුන් කෙරෙන් පර සෙට් වූ ක්ත්වා- ස ප්‍රත්‍යය ද්වය විකල්පයෙන් කිත් වන බව මෙයින් දැක්වූහ. විද—

---

* භවිත්වා-පොත්හි. "ක්තිතඃ" යි ඉට් ප්‍රතිෂිද්ධ බැවින් ගුණ විය නො හැකි ය. එහෙයින් "භූත්වා" යි විය යුතු.

† පාණිනීය 1-2-26.

ඥානෙ, විදිත්වා- වෙදිත්වා. ලිඛිත්වා- ලෙඛිත්වා.† ද්‍යුතිත්වා- ද්‍යෝතිත්වා.† ව්‍යුපධාත් කිම්? වර්තිත්වා. රලඃ කිම්? සෙවිත්වා- හලාදෙඃ කිම්? එෂිත්වා. සෙට් කිම්? භුක්ත්වා.

**a. මෘඩ මෘද් ගුධ ගුහ් කුෂ් ක්ලිශ් වද් වස් මුෂ් ග්‍රහිභ්‍යඃ සෙට් කිද් භවති. මෘඩ සුඛනෙ, මෘඩිත්වා. මෘද ක්ෂොදෙ, මෘදිත්වා. ගුධ රොචනෙ, ගුධ රොෂෙ, ගුධිත්වා. ගුහ රොගෙ, ගුහූ සංවරණෙ, ගුහිත්වා. කුෂ නිෂ්කෂෙ, කුෂිත්වා. ක්ලිශ් විබාධෙ, ක්ලිශිත්වා. වද ව්‍යක්තායාං වාචි, උදිත්වා. වස් නිවාසෙ, උෂිත්වා. මුෂිත්වා. ගෘහීත්වා.**

---

විදිත්වා- වෙදිත්වා, (=දැන) ලිඛිත්වා- ලෙඛිත්වා, (=ලියා) ද්‍යුතිත්වා- ද්‍යෝතිත්වා (=බබලා) යනු ක්ත්වා ප්‍රත්‍යය විකල්පයෙන් කිත් වන බවට උදාහරණ යි. ("ලිලිඛිෂති- ලිලෙඛිෂති, දිද්‍යුතිෂතෙ- දිද්‍යෝතිෂතෙ" යනු සප්‍රත්‍යය විකල්පයෙන් කිත් වන බවට උදාහරණ යි. කිත් නො වන පක්ෂයෙහි ගුණ වේ.) ව්‍යුපධාත් කිම්, 'ව්‍යුපධාත්' යනු කිම? 'වර්තිත්වා' යනාදි උ- ඉ උපධා රහිත තැන්හි නිත්‍යයෙන් කිත් නො වනු පිණිස යි. රලඃ කිම්, 'රලඃ' යනු කිම? 'සෙවිත්වා' යනාදි රස ප්‍රත්‍යාහාරාන්ත නො වන තැන්හි නිත්‍යයෙන් කිත් නො වනු පිණිස යි. හලාදෙඃ කිම්, 'හලාදෙඃ' යනු කිම? 'එෂිත්වා' යනාදි හස ප්‍රත්‍යාහාරාදි නො වන තැන්හි නිත්‍යයෙන් කිත් නො වනු පිණිස යි. සෙට් කිම්, 'සෙට්' යනු කිම? 'භුක්ත්වා' යනාදි ඉඩාගම රහිත තැන්හි නිත්‍යයෙන් කිත් වනු පිණිස යි. (ව්‍යුපධා බව- හසාදි බව- රසාන්ත බව- සෙට් බව යන ලකුණු සතර ම ඇති කල්හි විකල්පයෙන් කිත් වේ.)

a. මෘඩ්— ග්‍රහිභ්‍යඃ, මෘඩ්- මෘද්- ගුධ්- ගුහ්- කුෂ්- ක්ලිශ්— වද්- වස්- මුෂ්- ග්‍රහ් යන මොවුන් කෙරෙන් පර වූ; සෙට්, ඉට් සහිත ක්ත්වා ප්‍රත්‍යය තෙමේ; කිත් භවති, (නිත්‍යයෙන්) කිත් වේ. මෘඩ සුඛනෙ, 'මෘඩ්' ධාතුව සැප සම්පාදනයෙහි වේ. මෘඩිත්වා, සැප කොට; මෘද ක්ෂොදෙ, "මෘද්" ධාතුව සුණු කිරීමෙහි වේ. මෘදිත්වා, සුණු කොට; ගුධ රොචනෙ, "ගුධ්" ධාතුව රුචි කිරීමෙහි වේ, ගුධ රොෂෙ, 'ගුධ්' ධාතුව කිපීමෙහි ද වේ. ගුධිත්වා, රුචි කොට නොහොත් කිපී; ගුහ රොගෙ, "ගුහ්" ධාතුව රිදීමෙහි වේ. ගුහූ සංවරණෙ, ඌකාරානුබන්ධ "ගුහ්" ධාතුව වැසීමෙහි වේ. ගුහිත්වා, රිද්ද නොහොත් සඟවා; කුෂ නිෂ්කෂෙ, "කුෂ්" ධාතුව ඉරි ඇදීමෙහි වේ. කුෂිත්වා, ඉරි ඇද; ක්ලිශ් විබාධෙ, "ක්ලිශ්"

---

† පොත්හි නො පෙණේ.

**a. නොපධාත්ථඵාන්තාද් වා කිත්.***

**b. නකාරොපධාත් ථඵාන්තාද්ධාතොඃ සෙට් ක්ත්වා වා කිද් භවති. ග්‍රන්ථ සන්දර්භෙ, "නො ලොපඃ" ග්‍රථිත්වා- ග්‍රන්ථිත්වා. ගුම්ඵ ග්‍රන්ථනෙ, ගුඵිත්වා- ගුම්ඵිත්වා, ඉත්‍යාදි.**

## 95. අලංඛල්වොඃ ප්‍රතිෂෙධෙ ක්ත්වා.

(අලංඛල්වොඃ 7-2. ප්‍රතිෂෙධෙ 7-1. ක්ත්වා 1-1.)

**c. ප්‍රතිෂෙධාර්ථයොරලංඛලුශබ්දයොඃ පූර්වපදයොඃ සතොඃ පූර්වකාලං විනාපි ක්ත්වා ප්‍රත්‍යයො භවති. අත්‍රාලංඛලුශබ්දෞ**

---

ධාතුව පෙළීමෙහි වේ. කලිශිත්වා, පෙළා; වද— උදිත්වා, කියා; වස්— උෂිත්වා, වැස; (සම්ප්‍රසාරණ යි.) මූෂිත්වා, සොරකම් කොට; ගෘහිත්වා, ගෙණ; (සම්ප්‍රසාරණ හා "ඊටො ග්‍රහාම්" යි ඊකාරාදෙශ යි. සෙට් වුව ද ක්ත්වා ප්‍රත්‍යය කිත් බැවින් මේ උදාහරණයන්හි ධාතුහට ගුණ නො වී ය.)

a. නොපධාත්, නකාරය උපධා කොට ඇති; ථඵාන්තාත්, ථ- ඵ අන්ත කොට ඇති ධාතුහු කෙරෙන් පර වූ සෙට් ක්ත්වා ප්‍රත්‍යය; වා කිත්, විකල්පයෙන් කිත් වේ.

b. නකාරොපධාත්, නකාරොපධ වූ; ථඵාන්තාත් ධාතොඃ, ථඵාන්ත ධාතුහු කෙරෙන් පර; සෙට් ක්ත්වා, ඉට් සහිත ක්ත්වා ප්‍රත්‍යය තෙමේ; වා කිත් භවති, විකල්පයෙන් කිත් වේ. ග්‍රන්ථ සන්දර්භෙ, "ග්‍රන්ථ්" ධාතුව රචනයෙහි වේ. "නො ලොපඃ" යන සූත්‍රයෙන් කිත් පක්ෂයෙහි උපධා නකාරයට ලොප් වේ. ග්‍රථිත්වා- ග්‍රන්ථිත්වා, (=රචනා කොට,) කිත් පක්ෂයෙහි "ග්‍රථිත්වා" යනු ද, විකල්ප පක්ෂයෙහි "ග්‍රන්ථිත්වා" යනු ද වේ. ගුම්ඵ ග්‍රන්ථනෙ, "ගුන්ඵ්" ධාතුව ගෙතීමෙහි වේ. ගුඵිත්වා- ගුම්ඵිත්වා, (=ගොතා,) පෙර සේ ම "ගුඵිත්වා" යනු ද, "ගුම්ඵිත්වා" යනු ද වේ. ('ගුම්ඵ' යන මෙහි මකාරය ලාක්ෂණික ය.) ඉත්‍යාදි, යනාදිය යි.

95. ක්ත්වා ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. **ධාතොඃ** යනු අනුවෘත්ත යි. ප්‍රතිෂෙධෙ, නිෂෙධාර්ථයෙහි වූ; අලංඛල්වොඃ, අලම්- ඛලු යන නිපාත දෙක උපපද ව ඇති කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; ක්ත්වා, ක්ත්වා ප්‍රත්‍යය වේ.

c. ප්‍රතිෂෙධාර්ථයොඃ, ප්‍රතිෂෙධාර්ථ වූ; අලංඛලු ශබ්දයොඃ, අලම්- ඛලු ශබ්ද දෙක; පූර්වපදයොඃ සතොඃ, පූර්වපද ව ඇති කල්හි;

---

* නොපධාත්ථඵාන්තාද් වා- පාණිනීය 1-2-23.

**නිෂෙධාර්ථෙ, තයොරුපපදත්වාත්. අලං භුක්ත්වා න භොක්තව්‍යම්, භොජනං මා කුරු ඉත්‍යර්ථः. බලු භුක්ත්වා න භොක්තව්‍යම්.**

## 96. උදිතඃ ක්ත්වා වෙට්. (උදිතඃ 5-1. ක්ත්වා 1-1. වෙට් 1-1.)

**a. උදිතො ධාතොඃ පරස්‍ය ක්ත්වාප්‍රත්‍යයස්‍ය වා ඉඩාගමො භවති. එෂිත්වා- ඉෂ්ට්වා. භ්‍රමු චලනෙ, භ්‍රමිත්වා- භ්‍රාන්ත්වා. "අදෙ ජග්ධඃ" ජග්ධ්වා.**

---

පූර්වකාලං විනා අපි, පූර්ව කාලාර්ථයක් නැති ව ද; ක්ත්වා ප්‍රත්‍යයඃ භවති, ක්ත්වා ප්‍රත්‍යය වේ. අත්‍ර, මෙහි; අලංබලු ශබ්දෙ, 'අලම්-බලු' ශබ්ද දෙදෙන; නිෂෙධාර්ථෙ, වැළැක්වීම අර්ථ කොට ඇත්තාහ. තයොඃ, ඒ දෙක; උපපදත්වාත්, උපපද බැවිනි. 'අලං භුක්ත්වා' යනු 'අලම්' නිපාත යොගයෙහි ක්ත්වා ප්‍රත්‍යයට උදාහරණ යි. 'න භොක්තව්‍යම්' (=නො වැළඳිය යුතු යි;) යනු එහි තේරුම යි. භොජනං මා කුරු ඉති, අනුභව නො කරව යන; අර්ථඃ, අර්ථ යි. 'බලු භුක්ත්වා' යනු 'බලු' නිපාත යොගයෙහි ක්ත්වා ප්‍රත්‍යයට උදාහරණ යි. 'න භොක්තව්‍යම්' (නො වැළඳිය යුතු යි;) යනු එහි අර්ථය යි.

96. පරිභාෂා සූත්‍ර යි. උදිතඃ, උකාරය ඉත් කොට ඇති ධාතුහු කෙරෙන් පර වූ; ක්ත්වා, ක්ත්වා ප්‍රත්‍යය තෙමේ; වෙට්, වෙට් (=වෛකල්පික ඉඩාගම ඇත්තේ) වේ.

a. උදිතඃ ධාතොඃ පරස්‍ය, උකාරානුබන්ධ ධාතුහු කෙරෙන් පර වූ; ක්ත්වා ප්‍රත්‍යයස්‍ය, ක්ත්වා ප්‍රත්‍යය සම්බන්ධ ව; වා ඉඩාගමඃ භවති, විකල්පයෙන් ඉඩාගම වේ. එෂිත්වා- ඉෂ්ට්වා, (කැමති ව;) සෙට් පක්ෂයෙහි "සාතඃ" යි ඉඩාගම ව ගුණ වීමෙන් "එෂිත්වා" කියා ද, අනිට් පක්ෂයෙහි ටුත්වය වීමෙන් "ඉෂ්ට්වා" කියා ද වේ. ("ඉෂු ඉච්ඡායාම්" ධාතු යි.) භ්‍රමු චලනෙ, 'භ්‍රම්' ධාතුව සැලීමෙහි වේ. භ්‍රමිත්වා- භ්‍රාන්ත්වා, (=කරකැවී;) සෙට් පක්ෂයෙහි "භ්‍රමිත්වා" කියා ද, අනිට් පක්ෂයෙහි "ශමාං දීර්ඝඃ" යි දීර්ඝ ව මකාරයට අනුස්වාර හා වර්ගාන්තා දෙශ වීමෙන් "භ්‍රාන්ත්වා" කියා ද වේ. "අදෙ ජග්ධඃ" යන සූත්‍රයෙන් 'අද්' ධාතුහට 'ජග්ධ' ආදෙශ වේ. (මෙහි උකාරය උච්චාරණාර්ථ යි.) ජග්ධ්වා, අනුභව කොට යන අර්ථයෙහි "ජග්ධ්වා" යනු වේ. (ජග්ධ ආදෙශ ව "ජඝ් + ත්වා" යි සිටි කල්හි "තථොර්ධඃ" යි තකාරයට ධකාර ව "ඣබෙ ජබාඃ" යි ඝකාරයට ගකාර වේ.)

## 97. සමාසෙ ක්‍යප්. (සමාසෙ 7-1. ක්‍යප් 1-1.)

**a. සමාසෙ සති පූර්වකාලෙ ක්‍යප් ප්‍රත්‍යයො භවති තත්කර්තෘකෙ ධාතෞ ප්‍රයුජ්‍යමානෙ.**

**b. "හ්‍රස්වස්‍ය පිති කෘති තුක්" ඩුභෘඤ් ධාරණපොෂණයොඃ. සම්භෘත්වා කරෙතීති= සම්භෘත්‍ය කරෙති. ණමු ප්‍රහ්වත්වෙ ශබ්දෙ ච, ප්‍රකර්ෂෙණ කායවාඞ්මනොභිර්නත්වා ඉති= ප්‍රණම්‍ය. අනඤ්පූර්ව ඉත්‍යෙව, අකෘත්වා ජල්පති, අකෘත්වා ගච්ඡති.**

**17. අජිත්වා ශාත්‍රවාන් සර්වානකෘත්වා විමලං යශඃ.**
**අදත්වා විත්තමර්ථිභ්‍යඃ කථං ජීවන්ති භූභෘතඃ.**

---

97. ක්‍යප් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. **ධාතොඃ** යනු ද; "පූර්වකාලෙ ක්ත්වා" යි **පූර්වකාලෙ** යනු ද අනුවෘත්ත වේ. සමාසෙ, සමාසය ඇති කල්හි; පූර්වකාලෙ, පූර්ව කාලාර්ථයෙහි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; **ක්‍යප්**, ක්‍යප් ප්‍රත්‍යය වේ.

a. සමාසෙ සති, සමාසය; ඇති කල්හි; තත්කර්තෘකෙ ධාතෞ ප්‍රයුජ්‍යමානෙ, සමානකර්තෘක වූ ධාතුවක් යොදනු ලබන කල්හි; පූර්වකාලෙ, පූර්වකාලාර්ථයෙහි; ක්‍යප් ප්‍රත්‍යයඃ භවති, ක්‍යප් ප්‍රත්‍යය වේ. (නඤ් නිපාතය හැර සෙසු පදයක් ධාතුවට පෙරටුව සමාස ව සිටි කල්හි ක්ත්වා ප්‍රත්‍යය වෙනුවට ක්‍යප් ප්‍රත්‍යය වෙයි කි නියා යි. කයත්ත ගුණ ප්‍රතිෂෙධය පිණිස ද, පයත්ත තුගාගමය පිණිස ද වේ.)

b. "හ්‍රස්වස්‍ය පිති කෘති තුක්" යන සූත්‍රයෙන් තුගාගම වේ. ඩුභෘඤ්— සම්භෘත්වා කරෙතීති= සම්භෘත්‍ය කරෙති, රැස් කොට කෙරෙයි යන අර්ථයෙහි "සම්භෘත්‍ය කරෙති" යනු වේ. ණමු— ප්‍රකර්ෂෙණ, උත්කර්ෂයෙන්; කායවාඞ්මනොභිඃ, කාය-- වාක්- මනස් යන මෙයින්; නත්වා ඉති, නැමී යන අර්ථයෙහි; ප්‍රණම්‍ය, "ප්‍රණම්‍ය" යනු වේ. අනඤ්පූර්වඃ ඉති, 'නඤ්' නිපාතය පෙරටු කොට ඇත්තේ ක්‍යබන්ත නො වේ ය යි; එකෙ, සමහරු කියත්. (මෙහි "එකෙ" යි කී නමුත් 'නඤ්' පූර්ව කල්හිත් ක්‍යප් ප්‍රත්‍යය වේ ය යි තමන්වත් කියන බවට උදාහරණ නො දැක්වූහ.) අකෘත්වා ජල්පති, නො කොට කථා කෙරෙයි; අකෘත්වා ගච්ඡති, නො කොට යෙයි. (මෙහි පෙරටු වූයේ නඤ් නිපාතය හෙයින් ක්‍යප් ප්‍රත්‍යය නො ව ක්ත්වා ප්‍රත්‍යය ම විය.)

17. **සර්වාන් ශාත්‍රවාන්**, සියලු සතුරන්; **අජිත්වා**, නො දිනා; විමලං යශඃ, නිර්මල කීර්තිය; **අකෘත්වා**, (පතළ) නො කොට;

## 98. ක්‍යපි ඤේර්ගුණශ්ච.

(ක්‍යපි 7-1. ඤේඃ 6-1. ගුණඃ 1-1. ච-නි:)

**a. ක්‍යපි ලඝුපූර්වස්‍ය ඤේරයාදේශෝ'පි වාච්‍යඃ.**

**b. පරිණමයිත්වා ඉති= පරිණමය්‍ය බුද්ධිමතා. විගමය්‍ය. විගණය්‍ය. අලඝුපූර්වස්‍ය න, තේන ඤේර්ලෝපෝ වාච්‍යඃ. ප්‍රතාර්‍ය. සම්ප්‍රධාරයිත්වා ඉති= සම්ප්‍රධාර්‍ය. විචාර්‍ය කරෝති. ආපෟ ව්‍යාප්තෞ, ආප්නෝතේර්වා, ප්‍රාපය්‍ය- ප්‍රාප්‍ය.**

---

අර්පිභ්‍යඃ, යදියන්ට; විත්තං අදත්වා, ධනය නො දී; භූභෘතඃ, රජ වරු; කථං ජීවන්ති, කෙසේ ජීවත් වෙද්ද? (මෙහි අජිත්වා- අභාත්වා- අදත්වා යන පූර්ව ක්‍රියා ද 'නඤ්' නිපාත පූර්ව බැවින් ක්ත්වා ප්‍රත්‍යයෙන් ම සිද්ධයහ. "ස්වධනං ත්‍යජ්‍ය ගච්ඡති"- "සඛ්‍යා වධූං ගෘහ්‍ය කරෙණ ගාඪම්" යනාදි උදහරණ දක්වමින්, අව්‍යය පූර්වත්වයක් නැති ව ද සමහර තැන්හි ක්‍යප් ප්‍රත්‍යය වේ ය යි ආචාර්‍ය ජෞමරයෝ කීහ. එහෙත් ව්‍යාකරණඥයන් එය පිළිගත් බවක් නො පෙණේ.)

98. ගුණ විධි සූත්‍ර යි. ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි, ඤේඃ, ඤි ප්‍රත්‍යයට; ගුණඃ ච, ගුණ ද වේ.

a. ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි; ලඝුපූර්වස්‍ය, ලඝු වර්ණයක් පූර්ව කොට ඇති; ඤේඃ, ඤි ප්‍රත්‍යයට; අයාදේශඃ අපි, (ගුණ වූ පසු) 'අය්' ආදේශය ද; වාච්‍යඃ, කිය යුතු යි. (ලඝුවක් පෙරටු කොට ඇති ඤි ප්‍රත්‍යයට මේ සූත්‍රයෙන් ගුණ වේ. ඉන් පසු "ක්වචිත් ස්වරවද්‍යකාරඃ" යි කී හෙයින් යකාරය ස්වරයක් මෙන් සලකා "එ අය්" යි අයාදේශ ද කරණු ලැබේ.)

b. පරිණමයිත්වා ඉති= පරිණමය්‍ය, 'පරිණමයිත්වා' යි කිය යුතු තන්හි "පරිණමය්‍ය" යනු වේ. පරිණමය්‍ය, පිරිණමා; බුද්ධිමතා, වලදයි. විගමය්‍ය, 'විගමයිත්වා' යි කිය යුතු තන්හි "විගමය්‍ය" (=පහ කොට) යනු වේ. විගණය්‍ය, 'විගණයිත්වා' යි කිය යුතු තන්හි "විගණය්‍ය" (=නො සලකා) යනු වේ. අලඝුපූර්වස්‍ය, ලඝු පූර්ව නුවූ ඤි ප්‍රත්‍යයාන්තයට; න, ගුණ නො වේ. තේන, එහෙයින්; ඤේඃ, ඤි ප්‍රත්‍යයට; ලෝපඃ වාච්‍යඃ, ලෝපය කිය යුතු යි. ප්‍රතාර්‍ය, 'ප්‍රතාරයිත්වා' යි කිය යුතු තන්හි "ප්‍රතාර්‍ය" (=රවටා) යනු වේ. (ඤ්‍යන්ත "තෘඃ ප්ලවනතරණයෝඃ" ධාතු යි. ලඝු පූර්ව නො වන හෙයින් ඤිලෝප යි.) සම්ප්‍රධාරයිත්වා ඉති, 'සම්ප්‍රධාරයිත්වා' යන වාක්‍යයෙහි; සම්ප්‍රධාර්‍ය, "සම්ප්‍රධාර්‍ය" (=මොනවට සලකා) යනු

**a. දදීනං ක්‍යපි ඉත්වාභාවො වාච්‍යඃ. ක්‍යපි ස්ථාමීති ඊකාරො න භවති. දෙ අවඛණ්ඩනෙ, ප්‍රදය, ප්‍රසාය, ප්‍රමාය, ප්‍රහාය, ප්‍රස්ථාය. උප සමීපෙ ස්ථිත්වා ඉති= උපස්ථාය. පිබතෙර්වා, ප්‍රපාය– ප්‍රපීය.**

**b. “ලොපස්ත්වනුදාත්ත තනාම්” ඤමස්‍ය ක්‍යපි වා ලොපඃ. ප්‍රකර්ෂේණ නත්වා ඉති= ප්‍රණම්‍ය– ප්‍රණත්‍ය. ආසමන්තාද් ග්‍රාමෙ ආගම්‍ය– ආගත්‍ය.**

---

වේ. විචාය්‍ය, ‘විචාරයිත්වා’ යි කිය යුතු තන්හි “විචාය්‍ය” යනු වේ. විචාය්‍ය කාරෙති, විමසා කෙරෙයි. ආපෘ ව්‍යාප්තෞ, ඍනුබන්ධ “ආප්” ධාතුව පැතිරීමෙහි වේ. ආප්නොතෙඃ, ආප් ධාතුහු කෙරෙන් පර ණිච් ප්‍රත්‍යයට; වා, විකල්පයෙන් ගුණ වේ. ප්‍රාපය්‍ය– ප්‍රාප්‍ය, ‘ප්‍රාපයිත්වා’ යි කිය යුතු තන්හි ගුණ වූ පක්ෂයෙහි අයාදෙශ ව “ප්‍රාපය්‍ය” යනු ද, විකල්ප පක්ෂයෙහි ණිලොපයෙන් “ප්‍රාප්‍ය” යනු ද වේ. (‘පමුණුවා යන අර්ථ යි.)

a. ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි; දදීනාම්, දා ආදි ධාතූන්ට; ඉත්වාභාවඃ, ඉවර්ණ බව නො වීම; වාච්‍යඃ, කිය යුතු යි. ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි; ස්ථාමී ඉති, “ස්ථාමී” යන සූත්‍රයෙන්; ඊකාරඃ, ඊකාරය; න භවති, නො වේ. (මූල් වාක්‍යයෙන් කියන ලද්ද මෙයින් පැහැදිලි කළහ. “ඉත්වාභාවඃ” යි කී හෙයින් ඊකාරය පමණක් නො ව එයින් ම විහිත ඉකාරය ද ප්‍රතිෂිද්ධ ය.) දෙ අවඛණ්ඩනෙ, “දෙ” ධාතුව කැඩීමෙහි වේ. ‘ප්‍රදය’ (=කඩා නොහොත් දී) ‘ප්‍රසාය’ (ආසක්ත ව) ‘ප්‍රමාය’ (=ප්‍රමාණ කොට) ‘ප්‍රහාය’ (=හැර) ‘ප්‍රස්ථාය’ (පිටත් ව) යනු ඉකාර– ඊකාර නො වන බවට උදාහරණ යි. ‘උප’ යි සේ යි; සමීපෙ, ලඟ; ස්ථිත්වා ඉති, ‘සිට’ යන අර්ථයෙහි; උපස්ථාය, “උපස්ථාය” යනු වේ. පිබතෙඃ, පා ධාතුහට; වා, විකල්පයෙන් (“ස්ථාමී” යන්නෙන්) ඊකාරය වේ. ප්‍රපාය– ප්‍රපීය, (=බී) ඊකාර ප්‍රතිෂිද්ධ පක්ෂයෙහි “ප්‍රපාය” යනු ද, ඊකාරාදෙශ පක්ෂයෙහි “ප්‍රපීය” යනු ද වේ.

b. ක්‍යපි, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි; ලොපඃ— තනාම්, “ලොපස්ත්වනුදාත්ත තනාම්” යන සූත්‍රයෙන්; ඤමස්‍ය, ඤම ප්‍රත්‍යාහාරයට; වා, විකල්පයෙන්; ලොපඃ, ලොප් වේ. (යථොක්ත සූත්‍රයෙන් විහිත ක්ත්වාර්ථීය ක්‍යබ් විෂයෙහි වෛකල්පික බව මෙයින් කීහ.) ප්‍රකර්ෂේණ නත්වා ඉති, ප්‍රකර්ෂයෙන් වැඳ යන අර්ථයෙහි; ප්‍රණම්‍ය– ප්‍රණත්‍ය, විකල්ප පක්ෂයෙහි “ප්‍රණම්‍ය” යනු ද, මකාරලොප පක්ෂයෙහි තුගාගම ව “ප්‍රණත්‍ය” යනු ද වේ. ආසමන්තාත්, හාත්පසින්;

a. **විප්‍රවීසඃ දධාතෙඃ කරොතෙරර්‍ථෙ කයප්. විධාය.**

99. **තත්කාලෙ'පි.*** (තත්කාලෙ 7-1. අපි- නිඃ)

**b. තත්කාලෙ'පි කයප් දෘශ්‍යතෙ. නෙත්‍රෙ නිමිල්‍ය හසති. මිල සම්මිලනෙ, මිල සඞ්ගමෙ, උභයපදී. අක්ෂිණී සම්මිලිත්වා ඉති= අක්ෂිණී සම්මිල්‍ය හසති. චක්ෂුෂී සම්මිල්‍ය හසති. මුඛං ව්‍යාදත්වා ඉති= මුඛං ව්‍යාදය ස්වපිති.**

---

ග්‍රාමෙ, ගමෙහි; ආගම්‍ය, අවුත්; ආගත්‍ය යනු ද එම අර්‍ථ යි. ('ආගත්වා' යි කිය යුතු තන්හි "ආගම්‍ය" කියා ද, මකාරලොප හා තුගාගමයෙන් "ආගත්‍ය" කියා ද වේ.)

a. විප්‍රවීසඃ දධාතෙඃ, 'වි'උපසර්‍ගය පෙරටු කොට ඇති 'ධා' ධාතුව සම්බන්ධ ව; (=ධා ධාතුහු කෙරෙන්;) කරොතෙඃ අර්‍ථෙ, කෘ ධාතුහුගේ අර්‍ථයෙහි හෙවත් කිරීම් අර්‍ථයෙහි; කයප්, කයප් ප්‍රත්‍යය වේ. 'විධාය' යනු උදාහරණ යි. 'කොට' යන අර්‍ථ යි.†

99. කයප් ප්‍රත්‍යයවිධි සූත්‍ර යි. ධාතොඃ යනු ද, "සෘදුපධාත් කයප්" යි කයප් යනු ද අනුවෘත්ත යි. තත්කාලෙ අපි, තත්කාලාර්‍ථයෙහි ද; ධාතොඃ, ධාතුහු කෙරෙන්; කයප්, කයප් ප්‍රත්‍යය වේ.

b. තත්කාලෙ අපි, තත් කාලාර්‍ථයෙහි ද; කයප් දෘශ්‍යතෙ, කයප් ප්‍රත්‍යය දක්නා ලැබේ. (මෙහි **තත්කාල** නම් සමානකර්‍තෘක අපර ක්‍රියාවේ කාලය යි. එහෙයින් ක්‍රියා දවයය ම එකකාලීන කල් හිත් කයප් ප්‍රත්‍යය වන බව මෙයින් කීහ.) නෙත්‍රෙ නිමිල්‍ය, දෑස පියාගෙණ; හසති, සිනා සෙයි. (නිමීලන- හසන යන ක්‍රියා දෙක ම එක් අවස්ථාවෙක්හි කෙරෙණ හෙයින් එකකාලීන ය. එසේ වුව ද "නිමිල්‍ය" යි කයප් ප්‍රත්‍යය වී ය. මතු උදාහරණ ද මෙසේ යි. සිංහල ව්‍යාකරණ විෂයෙහි ද මෙසේ ම යෙදේ. එහි "මිශ්‍රක්‍රියාර්‍ථ පූර්‍වක්‍රියා" යන නාමයෙන් අඳුන්වනු ලැබේ.) මිල සම්මීලනෙ, "මිල" ධාතුව මොනවට වැසීමෙහි වේ. (පරස්මෛපදී යි.) මිල සඞ්ගමෙ, "මිල" ධාතුව එකතු වීමෙහි වේ. උභයපදී, උභයපදී යි. අක්ෂිණී සම්මිලිත්වා ඉති, 'අක්ෂිණී සම්මිලිත්වා' යන වාක්‍යයෙහි; "අක්ෂිණී සම්මිල්‍ය" යනු වේ. අක්ෂිණී සම්මිල්‍ය, දෑස පියාගෙණ; හසති, සිනා සෙයි. "චක්ෂුෂී සම්මිල්‍ය හසති" යනු ද එම අර්‍ථ යි. මුඛං

---

* පොත්හි නො පෙණේ.

† "විප්‍රවෙ ධා කරොත්‍යර්ථෙ-අභිප්‍රවිසන්‍ තු භාෂණෙ,
න්‍යාසම්ප්‍රවෙ ඝථායොගං-න්‍යාසාරොපණසඞ්ඛිෂු."

## 100. පෞනඃපුන්‍යෙ ණම් පදං ද්විශ්ච.

(පෞනඃපුන්‍යෙ 7-1. ණම් 1-1. පදම් 1-1. ද්විඃ- ච, නිඃ)

**a. සමානකත්තෘකෙසු ධාතුසු ප්‍රයුජ්‍යමානෙසු පුබ්බකාලෙ පෞනඃපුන්‍යාථෙ ධාතොණම් ප්‍රත්‍යයො හවති, ණමන්තස්‍ය පදස්‍ය ද්විබ්බචනං ච භවති.**

---

ව්‍යාදත්වා ඉති, 'මුඛං ව්‍යාදත්වා' යන වක්‍යයෙහි; "මුඛං ව්‍යාදාය" යනු වේ. මුඛං ව්‍යාදාය, කට ඇරගෙණ; සවපිති, නිදයි. ("උදරං **පූරයිත්වා** භුඤ්ජති" යනාදි වශයෙන් ක්ත්වා ප්‍රත්‍යය ද තත්කාලාර්ථයෙහි වන බව පෙණේ. 'බඩ පුරා අනුභව කෙරෙයි' යනු එහි (අර්ථ යි.)

('කණ්ඨසෘත්‍ය, වශෙඝෘත්‍ය, මධ්‍යෙසෘත්‍ය, උරසිසෘත්‍ය, මනසිසෘත්‍ය, හස්තෙසෘත්‍ය' යනාදි වශයෙන් නාමපූර්වපද සමාස යෙහි ද ක්‍යප් ප්‍රත්‍යය වේ. මෙහි "අලුක් සමාස" යි විභක්ති ලොපය නො වේ. සමහර තැනෙක සමානකර්තෘක ක්‍රියාව අධ්‍යාහාය්‍යී ද වේ. **අප්‍රාප්‍ය නදිං පර්ව්වතඃ** යනු ඊට උදාහරණ යි. මෙහි **ස්ථිතඃ** යන ක්‍රියාව අධ්‍යාහාය්‍යී යි. තව ද, **ස්නාත්වා සුටමූත්‍රප ඤෙත** යන මෙහි "ස්නාත්වා" යනු ද, **මත්ප්‍රසූතිමනාරාධ්‍ය- ප්‍රජෙති ත්වාං ශශාප සා** යන මෙහි "අනාරාධ්‍ය" යනු ද භින්න කර්තෘක ය යි ඇතැමෙකුට සිතිය හැකි වුවත් "ස්නාත්වා ස්ථිතස්‍ය- අනාරාධ්‍ය ස්ථිතස්‍ය" යි **ස්ථිතස්‍ය** යන ක්‍රියාහුගේ අධ්‍යාහාය්‍යීත්ව යෙන් එහි දු එක කර්තෘකත්වය ලැබේ මැයි.)

100. ණම් ප්‍රත්‍යය හා ද්විත්ව විධි සූත්‍ර යි. **පුබ්බකාලෙ-ධාතොඃ** යනු අනුවෘත්ත වේ. පුබ්බකාලෙ, පූර්වකාලාර්ථයෙහි වූ; ධාතොඃ, ධාතුහු කෙරෙන්; පෞනඃපුන්‍යෙ, ආභීක්ෂ්ණ්‍යයෙහි හෙවත් නැවත නැවත කිරීම් අර්ථයෙහි; ණම්, ණම් ප්‍රත්‍යය වේ. පදම්, ණමන්ත පදය; ද්විඃ ච, ද්විරුක්ත ද වේ.

a. සමානකත්තෘකෙසු ධාතුසු, සමානකර්තෘක ධාතූන්; ප්‍රයුජ්‍යමානෙසු, යොදනු ලබන කල්හි; පුබ්බකාලෙ, පූර්වකාලාර්ථයෙහි පවත්නා වූ; ධාතොඃ, ධාතුහු කෙරෙන්; පෞනඃපුන්‍යෙ, ආභීක්ෂ්ණ්‍යාර්ථයෙහි (=නෛරන්තය්‍යාර්ථයෙහි); ණම් ප්‍රත්‍යයඃ භවති, ණම් ප්‍රත්‍යය වේ. ණමන්තස්‍ය පදස්‍ය, ණම් ප්‍රත්‍යයාන්ත පදයට; ද්විබ්බචනං ච භවති, ද්විත්ව ද වේ. (ප්‍රත්‍යයස්ථ ණකාරය වෘද්ධිය

**a. "ආතො යුක්" පීත්වා පීත්වා ඉති= පායං පායං ගච්ඡති. ආදරෙ වීප්සායාං ද්විර්භාවඃ.* භුක්ත්වා භුක්ත්වා ඉති= භොජං භොජං ව්‍රජති. ස්මෘත්වා ස්මෘත්වා ඉති= ස්මාරං ස්මාරං නමති ශිවම්.**

## 101. කථමාදිෂු ස්වාර්ථෙ කෘඤො ණම්.

(කථමාදිෂු 7-3. ස්වාර්ථෙ 7-1. කෘඤඃ 5-1. ණම් 1-1.)

---

පිණිස යි. සූත්‍රයෙහි ච ශබ්දයෙන් ක්ත්වා ප්‍රත්‍යය ද වේ. ඒ ක්ත්වා ප්‍රත්‍යයාන්තය ද ද්විරුක්ත වේ. මේ වනාහි සිංහල ව්‍යාකරණයෙහි දැක්වෙන මිශ්‍රාර්ථයෙහි පූර්වක්‍රියා ද්විත්වය බව පෙනේ.)

a. "ආතො යුක්" යන සූත්‍රයෙන් යුගාගම වේ. පීත්වා පීත්වා ඉති, 'පීත්වා පීත්වා' යන වාක්‍යයෙහි "පායං පායම්" යනු වේ. පායං පායම්, බිබී (=බොමින්); ගච්ඡති, යෙයි. ආදරෙ, ආදරාර්ථයෙහි ද; වීප්සායාම්, වීප්සාර්ථයෙහි ද; ද්විර්භාවඃ, ද්විත්වය වේ. (මේ සූත්‍රයෙන් විහිත ද්විත්වය ඒ අර්ථ දෙක්හි ය යි කී නියා යි.) භුක්ත්වා භුක්ත්වා ඉති, 'භුක්ත්වා භුක්ත්වා' යන වාක්‍යයෙහි "භොජං භොජම්" යනු වේ. භොජං භොජම්, වළඳ වළඳා (=වළඳමින්); ව්‍රජති, යයි. ස්මෘත්වා ස්මෘත්වා ඉති, 'ස්මෘත්වා ස්මෘත්වා, යන වාක්‍යයෙහි "ස්මාරං ස්මාරම්" යනු වේ. ස්මාරං ස්මාරම්, සිහි කර කර (=සිහි කරමින්); ශිවම්, මෙහෙසුරු; නමති, වඳියි. (ක්ත්වා ප්‍රත්‍යය ද වන හෙයින් "පීත්වා පීත්වා ගච්ඡති, භුක්ත්වා භුක්ත්වා ව්‍රජති, ස්මෘත්වා ස්මෘත්වා නමති ශිවම්" යනාදි වශයෙන් ද යෙදේ.

"**ඊක්ෂමීක්ෂං** තදා බාලා **රොදං රොදං** වමූමනු,
**ආයමායං** නිවෘත්තායා ජීවෙදෙකාකිනී කථම්."
"නලින්‍යා ඉව තන්වඞ්ගයාස්තස්‍යාඃ පද්මමිවානනම්,
මයා මධුව්‍රතෙනෙව **පායං පාය**මරම්‍යත."

මෙසේ මොහු භාෂාවෙහි ව්‍යවහාරප්‍රාප්ත බව දත යුතු යි. මේ 'ණම්' ප්‍රත්‍යයාන්තයෝ අව්‍යයෝ ය.)

101. ණම් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. කථම් ආදිෂු, 'කථම්' යනාදිය පෙරටු ව යෙදෙන කල්හි; කෘඤඃ, කෘඤ් ධාතුහු කෙරෙන්; ස්වාර්ථෙ, ස්වාර්ථයෙහි; ණම්, ණම් ප්‍රත්‍යය වේ.

---

* "නිත්‍යවීප්සයොඃ" යනු පාණිනීය සූත්‍ර යි. 'නිත්‍යාර්ථ, (=ආභීක්ෂ්ණ්‍ය,) වීප්සාර්ථ දෙක්හි මේ ද්විත්වය වේ' යනු එහි අදහස යි.

**a. කථම් ඉත්ථම් අන්‍යථා එවම් එතෙෂු ප්‍රයුජ්‍යමානෙෂු ස්වාර්ථෙ කෘඤඃ ණම් ප්‍රත්‍යයො භවති. කථංකාරම්, ඉත්ථංකාරම්, අන්‍යථාකාරම්, එවංකාරං පඨති. එවං පඨතීත්‍යර්ථඃ.**

**b. සමූලාකෘතජීවෙෂු හන්කෘඤ්ග්‍රහාං ණං වාච්‍යඃ ස්වාර්ථෙ, තෙෂාමනුප්‍රයොගශ්ච. සමූලඝාතං හන්ති. අකෘතකාරං කරොති. ජීවං ගෘහිත්වා ඉති= ජීවග්‍රාහං ගෘහ්ණාති, ඉත්‍යාදි.**

---

a. කථම් —එතෙෂු, 'කථම්- ඉත්ථම්- අන්‍යථා- එවම්' යන මොවුන්; ප්‍රයුජ්‍යමානෙෂු, යොදනු ලබන කල්හි; කෘඤඃ, කෘඤ් ධාතුහු කෙරෙන්; ස්වාර්ථෙ, ස්වාර්ථයෙහි; ණම් ප්‍රත්‍යයඃ භවති, ණම් ප්‍රත්‍යය වේ. "කථංකාරම්" යනාදිය පිළිවෙළින් උදාහරණ යි. ("කථමෙව= කථංකාරම්, ඉත්ථමෙව= ඉත්ථංකාරම්, අන්‍යථෛව= අන්‍යථාකාරම්, එවමෙව= එවංකාරම්" යි වාක්‍ය ගත යුතු යි.) කථංකාරම්, කෙසේ; ඉත්ථංකාරම්, මෙසේ; අන්‍යථාකාරම්, අන් පරිද්දෙකින්; එවංකාරම්; මෙසේ; පඨති, හදාරයි. ('පඨති' යනු එකක් පසා සම්බන්ධ කරණු.) එවං පඨති ඉති, ("එවංකාරං පඨති" යන්නෙහි) මෙසේ හදාරයි යනු; අර්ථඃ, අර්ථ යි. ('කථම්' යනාදි නිපාතයන් කෙරෙන් කෘ ධාතුව හා ඉන් පර ව ණම් ප්‍රත්‍යය යි. වෘද්ධ්‍යාදිය වීමෙන් 'කථංකාරම්' යනාදි වශයෙන් වේ. ප්‍රත්‍යය වූයේ ස්වාර්ථයෙහි බැවින් 'කථම්' යනු ද- 'කථංකාරම්' යනු ද එකාර්ථ යි. සෙස්ස ද මෙසේ දත යුතු.)

b. සමූලාකෘතජීවෙෂු, සමූල- අකෘත- ජීව ශබ්දයන් උපපද ව ඇති කල්හි; හන්කෘඤ්ග්‍රහාම්, හන්- කෘඤ්- ග්‍රහ් ධාතුන් සම්බන්ධ ව; ස්වාර්ථෙ, ස්වාර්ථයෙහි; ණම් වාච්‍යඃ, ණම් ප්‍රත්‍යය කිය යුතු යි. තෙෂාම්, ඒ හන්- කෘඤ්- ග්‍රහ් ධාතුන්ගේ; අනුප්‍රයොගඃ ච, අනුප්‍රයොගය ද කට යුතු යි (කර්ම වශයෙන් සිටි සමූල- අකෘත- ජීව ශබ්දයන් කෙරෙන් පිළිවෙළින් හන්- කෘඤ්- ග්‍රහ් ධාතුන් යෙදී ඉන් පර ව ණම් ප්‍රත්‍යය වේ. ඉන් පර ව ද ඒ ඒ ධාතුන්ගෙන් ම සිද්ධ ක්‍රියාවක් යෙදේ.) සමූලඝාතං හන්ති, 'සමූලං හන්ති' යන වාක්‍යයෙහි "සමූලඝාතං හන්ති" යනු වේ. (සහමුලින් නසයි යන අර්ථ යි. කර්ම වූ සමූල ශබ්දොපපද හන් ධතුහු කෙරෙන් ණම් ප්‍රත්‍යය වූ පසු "හනො ඝත්" යි ඝත් ආදෙශ ව වෘද්ධ්‍යාදිය වීමෙන් "සමූලඝාතම්" යි වේ. "හන්ති" යි 'හන්' ධාතුවෙන් ම සිද්ධ ක්‍රියාවක් අනුප්‍රයොග කළහ. ප්‍රත්‍යය ස්වාර්ථයෙහි බැවින් 'සමූලං හන්ති' යන්නෙහි ද, 'සමූලඝාතං හන්ති' යන්නෙහි ද අර්

විශෙෂයෙක් නො වේ. මතු උදාහරණ ද මෙසේ දත යුතු.) අකෘතකාරං කරොති, 'අකෘතං කරොති' යන වාක්‍යයෙහි "අකෘතකාරං කරොති" (=නො කරණ ලද්දක් කෙරෙයි) යනු වේ. ජීවං ගෘහීත්වා ඉති, 'ජීවත් වන්නහු ගෙණ' යන අර්ථයෙහි; ජීවග්‍රාහම්, "ජීවග්‍රාහම්" යනු වේ. ජීවග්‍රාහං ගෘහ්ණාති, දිවි සහිත ව ගණී. ("ජීවං ගෘහ්ණාති" යි ද මෙහි වාක්‍ය ගත හැකි ය.) ඉත්‍යාදි, යනාදිය යි.

(තව ද, පහත සඳහන් ධාතූන් කෙරෙන් ද ණම් ප්‍රත්‍යය වන බව දත යුතු යි. ඔවුන්ට උදාහරණ ඒ ඒ තැන්හි ම දක්වනු ලැබේ.

කර්මොපපද 'දෘශ්- විද්' ධාතූන් කෙරෙන් සාකල්‍යාර්ථයෙහි:- (1) **කන්‍යාදර්ශං** වරයති සර්වාඃ. (2) **බ්‍රාහ්මණවෙදං** භොජයති.

යාවත් ශබ්දොපපද 'විද්- ජීව්' ධාතූන් කෙරෙන්:- (1) **යාවද්වෙදං** භුඞ්ක්තෙ. (2) **යාවජ්ජීවමධීතෙ.**

කර්ම වූ චර්මන්- උදර ශබ්දොපපද 'පූර්' ධාතුහු කෙරෙන්:- (1) **චර්මපූරං** ස්තෘණාති. (2)**උදරපූරං** භුඞ්ක්තෙ.

නිමූල- සමූල ශබ්දොපපද 'කෂ්' ධාතුහු කෙරෙන්:- (1) **නිමූලකාෂං** කෂති. (2) **සමූලකාෂං** කෂති.

කර්ම වූ ශුෂ්ක- චූර්ණ- රූක්ෂ ශබ්දොපපද 'පිෂ්' ධාතුහු කෙරෙන්:- (1) **ශුෂ්කපෙෂං** පිනෂ්ටි. (2) **චූර්ණපෙෂම්.** (3) **රූක්ෂපෙෂම්.**

කරණොපපද 'හන්' ධාතුහු කෙරෙන්:- **පාදඝාතං** හන්ති.

ස්නෙහනාර්ථ කරණොපපද 'පිෂ්' ධාතුහු කෙරෙන්:- **උදපෙෂං** පිනෂ්ටි.

හස්තාර්ථ කරණොපපද 'වෘත්- ග්‍රහ්' ධාතූන් කෙරෙන්:- (1) **හස්තවර්තං** වර්තයන්ති. (2) **කරග්‍රාහං** ගෘහ්ණාති.

ධනාර්ථ කරණොපපද 'පුෂ්' ධාතුහු කෙරෙන්:- **ධනපොෂං** පුෂ්ණාති.

ආධාරොපපද 'බන්ධ්' ධාතුහු කෙරෙන්:-**චක්‍රබන්ධං** බධ්නාති.

සංඥා ශබ්දොපපද 'බධ්' ධාතුහු කෙරෙන්:- **ක්‍රෞඤ්චබන්ධං** බද්ධඃ.

**a. වණ්ණාත් කාරඃ.**

**b. වණ්ණමාත්‍රාත් කාරඃ ප්‍රත්‍යයො භවති. ක ඉති වණ්ණඃ= කකාරඃ. ච ඉති වණ්ණෝ චකාරඃ. අ ඉති වණ්ණඃ= අකාරඃ. ටකාරඃ, පකාරඃ, තකාරඃ. වණ්ණසමුදායාදපි කාරො දෘශ්‍යතෙ. අහංකාරඃ, ඛංකාරඃ, ඉත්‍යාදි.**

---

කර්තෘ වූ ජීව- පුරුෂ ශබ්දෝපපද 'නශ්- වහ්' ධාතූන් කෙරෙන්:- (1) **ජීවනාශං** නශ්‍යති. (2) **පුරුෂවාහං** වහති.

කර්තෘ වූ ඌර්ධ්වී ශබ්දෝපපද 'ශුෂ්- පූර්' ධාතූන් කෙරෙන්:- (1) **ඌර්ධ්වශොෂං** ශුෂ්‍යති. (2) **ඌර්ධ්වපූරං** පූයර්තෙ.

තෘතීයාන්තොපපද හිංසාර්ථ ධාතූන් කෙරෙන්:- **දණ්ඩොප ඝාතං** ගාඃ කාලයති.

තෘතීයා - සප්තමී උපපද 'උප' පූර්ව 'පීඩ්- රුධ්- කෘෂ්' ධාතූන් කෙරෙන්:- (1) **පාර්ශ්වොපපීඩං** ශෙතෙ. (2) **ව්‍රජොපරොධං** ගාඃ ස්ථාපයති. (3) **පාණ්‍යුපකර්ෂං** ධානාඃ සඞ්ගෘහ්ණාති.

ද්විතීයාන්ත නාමන් ශබ්දෝපපද 'ආපූර්ව දිශ්- ග්‍රහ්' ධාතූන් කෙරෙන්:- (1) **නාමාදෙශමාචෂ්ටෙ.** (2) **නාමග්‍රාහං කථයති.**

මේ ආදි වශයෙන් ණම් ප්‍රත්‍යය බොහෝ තැන්හි වන බව පෙණේ. මේ අතිසංක්ෂිප්තයෙකි. විස්තර කැමැත්තවුන් විසින් සිද්ධාන්ත චන්ද්‍රිකාදිය බැලිය යුතු යි.)

a. වර්ණාත්, වර්ණයා කෙරෙන්; කාරඃ, කාර ප්‍රත්‍යය වේ.

b. වර්ණමාත්‍රාත්, වර්ණමාත්‍රයා කෙරෙන්; කාරඃ ප්‍රත්‍යයඃ භවති, කාර ප්‍රත්‍යය වේ. (මෙයින් වර්ණ නිර්දේශයෙහි අක්ෂරයා කෙරෙන් කාර ප්‍රත්‍යය විහිත ය. "කරණං= කාරඃ, අ ඉති කාරඃ= අකාරඃ" යනාදි නයින් සිද්ධ කළ හැකි හෙයින් මේ වාර්තිකය ව්‍යර්ථ ය යනු ලඝුභාෂ්‍ය මතය යි.) කඃ ඉති වර්ණඃ, 'ක' යන මේ වර්ණය; කකාරඃ, "කකාර" නම්. චඃ ඉති වර්ණඃ, 'ච' යන මෙ වර්ණය (= අකුර); චකාරඃ, "චකාර" නම්. අඃ ඉති වර්ණඃ, 'අ' යන මේ වර්ණය; අකාරඃ, "අකාර" නම්. ටකාරඃ, 'ට ඉති වර්ණඃ' (='ට' යන මේ අකුර) යන වාක්‍යයෙහි "ටකාර" නම්. පකාරඃ, 'ප ඉති වර්ණඃ' (='ප' යන මේ අකුර) යන වාක්‍යයෙහි "පකාර" නම්. 'තකාරඃ' 'ත ඉති වර්ණඃ' (='ත' යන මේ අකුර) යන වාක්‍යයෙහි "තකාර" නම්. **වර්ණසමුදායාත් අපි, වර්ණ සමූහයක්**

a, රාදිඓො වා. ර ඉති වර්ණඃ= රෛඃ- රකාරඃ.

18. රකාරාදීනි නාමානි- ශ්‍රුත්වා තත්‍රාස රාවණඃ,
රත්නානි ච රමණ්‍යශ්ච-සන්ත්‍රාසං ජනයන්ති මෙ.

19. රකාරාදීනි නාමානි- ශෘණ්වතො මම පාර්වති,
මනඃ ප්‍රසන්නතාමෙති- රාමනාමාභිශඞ්කයා.

---

කෙරෙන් ද; කාරඃ, කාර ප්‍රත්‍යය; දෘශ්‍යතෙ, දක්නා ලැබේ. අහංකාරඃ, 'අහම් ඉති ශබ්දඃ' (='අහම්' යන ශබ්දය) යන වාක්‍යයෙහි "අහංකාර" නම්. (මෙහි වර්ණ ත්‍රයයකින් පර ව කාර ප්‍රත්‍යය යි.) ඔංකාරඃ, ඔම් ඉති ශබ්දඃ, (='ඔම්' යන ශබ්දය) යන වාක්‍යයෙහි) "ඔංකාර" නම්. (මෙහි වර්ණ අවයවයකින් පර ව කාර ප්‍රත්‍යය යි. මෙය වර්ණ නිර්දේශයෙහි විහිත හෙයින් 'අඃ කෘෂ්ණඃ' (='අ' නම් කෘෂ්ණ යි.) 'ඉඃ කාමඃ' (='ඉ' නම් කාමය යි.) 'කො බ්‍රහ්මා' (='ක' නම් බ්‍රහ්ම යි.) 'ඛමාකාසම්' (='ඛ' නම් අහස යි.) යනාදි තැන්හි නො වේ.) ඉත්‍යාදි, යනාදිය යි.

a. රාත්, 'ර' යන වර්ණයා කෙරෙන්; වා, විකල්පයෙන්; ඉඵඃ, ඉඵ ප්‍රත්‍යය වේ. (වර්ණනිර්දේශයෙහි මැයි. විකල්ප පක්ෂයෙහි කාර ප්‍රත්‍යය වේ.) ර ඉති වර්ණඃ, 'ර' යන මේ වර්ණය; රෛඃ- රකාරඃ, "රෛ" නම් ද- "රකාර" නම් ද වේ. (ඉඵ ප්‍රත්‍යය වූ කල්හි "අ ඉ ඵ" යි සන්ධි වේ.)

18. රාවණඃ, රාවණ තෙමේ, රකාරාදීනි නාමානි, රකාරාදි (=රකාරය මුල් කොට ඇති) නාමයන්; ශ්‍රුත්වා, අසා; රත්නානි ච, රත්නයෝ ද; රමණ්‍යඃ ච, රමණීහු ද; මෙ, මට; සන්ත්‍රාසං ජනයන්ති, බිය උපදවත් ය යි; තත්‍රාස, තැති ගත්තේ වූ. (රකාරය මුලට ඇති නමක් කියන්නට වත් කෙණෙහි මේ කියන්නට යන්නේ "රාම" යන්න ය යි සිතා රාවණ තෙමේ බියපත් වෙයි. එහෙයින් රත්න- රමණීහු ද ඔහුට භයජනක වූහ.)

19. පාර්වති, එම්බා පාර්වතිය! රකාරාදීනි නාමානි, රකාරය ආදි කොට ඇති නාමයන්; ශෘණ්වතඃ, අසන්නා වූ; මම, මාගේ; මනඃ, සිත; රාමනාමාභිශඞ්කයා, රාමයාගේ නම ය යන සැකයෙන්; ප්‍රසන්නතාම්, නිර්මල බවට; එති, පැමිණෙයි. ('ර' යන්නෙන් පර ව කාර ප්‍රත්‍යය වීමෙන් "රකාර" කියා ද භාෂාවෙහි ව්‍යවහාර ප්‍රාප්ත බව මේ ශ්ලෝක දෙකින් දැක්වූහ.)

## 102. ලොකාච්ඡෙෂස්‍ය සිද්ධිර්යථා මාතරාදෙඃ.

(ලොකාත් 5-1. ශෙෂස්‍ය 6-1. සිද්ධිඃ 1-1. යථා- නි: මාතරාදෙඃ 6-1.)

**a. අස්‍ය සාරස්වතව්‍යාකරණස්‍ය යෙ ශෙෂප්‍රයොගාස්තෙෂාං ලොකාත් අන්‍යව්‍යාකරණාත් සිද්ධිර්භවති, යථා මාතරාදෙඃ. ඉත්‍යාදිප්‍රයොගානුසාරෙණ බොද්ධව්‍යම්.**

---

102. අතිදෙශ සූත්‍ර යි. ශෙෂස්‍ය, ශෙෂයාගේ; සිද්ධිඃ, කාර්‍ය්‍ය සිද්ධිය; ලොකාත්, ලොකයා කෙරෙන් හෙවත් අන්‍ය ව්‍යාකරණයෙන් වේ. යථා මාතරාදෙඃ, 'මාතර' ශබ්දාදිය පිළිබඳ සිද්ධිය යම් සේ ද, එමෙනි.

a. අස්‍ය සාරස්වත ව්‍යාකරණස්‍ය, මේ සාරස්වත ව්‍යාකරණයාගේ, යෙ ශෙෂප්‍රයොගාඃ, යම් අවශිෂ්ට ප්‍රයොගයෝ වෙද්ද; තෙෂාම්, ඔවුන්ගේ; සිද්ධිඃ, නිෂ්පත්තිය; ලොකාත්, ලොකයා කෙරෙන්; (එනම්:) අන්‍යව්‍යාකරණාත්, අන්‍ය ව්‍යාකරණයෙන්; භවති, වේ. යථා මාතරාදෙඃ, මාතර ශබ්දාදියේ සිද්ධිය යම් සේ ද, එමෙනි. ඉත්‍යාදි ප්‍රයොගානුසාරෙණ, යනාදි ප්‍රයොගානුසාරයෙන්; බොද්ධව්‍යම්, (තො කී සියල්ල) අවබොධ කාට යුතු යි.

(ධාතූන් අනන්ත බව පෙර කියන ලදී. ධාතූන් අනන්ත හෙයින් ඔවුන්ගෙන් උපදින කෘදන්තයෝ ද අනන්ත ම ය. එහෙයින් ශබ්දයෝ සර්වථාභාවයෙන් ව්‍යුත්පාදනය නො කට හැක්කාහ. එපමණක් නො ව මේ සාරස්වතය ද සංක්ෂිප්ත ව්‍යාකරණයෙකි. මෙසේ හෙයින් මේ ව්‍යාකරණයෙහි නො කියන ලද යම් යම් ශිෂ්ට ප්‍රයොගයෝ වෙත් නම් ඒ සියල්ල පණ්ඩිත ලොකයාගේ ප්‍රයොගානුසාරයෙන් හා අන්‍ය ව්‍යාකරණයන්ගෙන් දත යුතු වෙයි. "මාතා ච පිතා ච" යන වාක්‍යය "මාතරපිතරෞ" කියා සමාස වේ. මෙහි 'මාතෘ' ශබ්දය 'මාතර' කියා වීමට උක්ත ව්‍යාකරණ විධිවලින් පිහිටක් නැත. එහෙයින් එය නිපාතනයෙන් සිද්ධ ය යි සලකනු ලැබේ. සියලු අනුක්ත ප්‍රයොගයන් එසේ දත යුතු බව මේ සූත්‍රයෙන් ඉගැන්වූහ. තව ද, ආදි- මධ්‍ය- අවසානයන්හි මඞ්ගලාචරණය ශිෂ්ට සම්ප්‍රදායය හෙයින් මෙහි 'සිද්ධි' ශබ්දය මඞ්ගල වාචකත්වයෙන් ප්‍රයුක්ත බව ද, එයින් අධ්‍යෙතෘන් (=හදාරන්නවුන්)ගේ කාර්‍ය්‍යසිද්ධිය වන බව ද කියත්.)

**20.** **ස්වරූපාන්තෝ'නුභූත්‍යාදිඃ– ශබ්දෝ'භූද්‍යත්‍ර සාර්ථකඃ,**
**ස මස්කරී ශුභාං චක්‍රේ– ප්‍රක්‍රියාං චතුරෝචිතාම්.**

**21.** **අවතාද්වො හයග්‍රීවඃ– කමලාවර ඊශ්වරඃ,**
**සුරාසුරනරාකාර– මධුපාපීතපත්කජඃ.**

---

20. ස්වරූපාන්තඃ, 'ස්වරූප' යන්න අන්ත කොට ඇති; අනුභූත්‍යාදිඃ, 'අනුභූති' යන්න ආදි කොට ඇති; ශබ්දඃ, ('අනුභූති ස්වරූප' යන) ශබ්දය තෙමේ; යත්‍ර, යමෙකු කෙරෙහි; සාර්ථකඃ අභූත්, අර්ථ සහිත වී ද; සඃ මස්කරී, ඒ පරිව්‍රාජක තෙමේ; චතුරෝචිතාම්, පණ්ඩිතයන්ට සුදුසු වූ; ප්‍රක්‍රියාම්, ( සාරස්වත) ප්‍රක්‍රියාව; ශුභාං චක්‍රේ, සෘජු කෙළේ ය හෙවත් සරල කෙළේ ය.

(ග්‍රන්ථකර්තෘපාදයෝ මෙයින් ස්වනාම සඥගීතය කළහ. අනුභූති **ස්වරූප** යන නාමය තමන් කෙරෙහි අර්ථ සහිතය යි හෙවත් අන්වර්ථ ය යි දක්වීමෙන් ස්වකීය පාණ්ඩිත්‍යය ප්‍රකට කෙරෙත්. අනුභූති නම්: i ප්‍රත්‍යක්ෂ, ii අනුමිති, iii උපමිති, iv ශබ්දබොධ යන චතුර්විධ ඥනය යි. අනුභූති සඞ්ඛ්‍යාත මේ චතුර්විධ ඥනය ස්වරූප කොට ඇත්තේ "අනුභූතිස්වරූප" නම්. හුදු ඥන පිණ්ඩයෙකි. **මස්කරින්** නම්: තාපස විශෙෂයෙකි. "මස්කරො ඥනං ගතිර්වාස්‍යාස්ත්‍යසෞ මස්කරී"= මස්කර සඞ්ඛ්‍යාත ඥනය හෝ ගමන මොහුට ඇත්තේ නු යි "මස්කරින්" නම්. අස්ත්‍යර්ථයෙහි ඉනි ප්‍රත්‍යය යි. නොහොත් "මා කර්තුං, කර්ම නිෂෙද්ධුං ශීලමස්‍යෙති මස්කරී."= කර්ම වළක්වන්නට ස්වභාවය මොහුට ඇත්තේ නු යි "මස්කරින්" නම්. 'මා' නිපාත පූර්ව කෘ ධාතුහු කෙරෙන් තාච්ඡීල්‍යයෙහි ඉනි ප්‍රත්‍යය යි. මේ මෙහි නිරුක්ති යි. "මස්කරො වංශ දණ්ඩො'ස්ත්‍යස්‍යෙති= මස්කරී, සන්‍යාසිකඃ" යි බාලසරලාකාරයෝ කීහ. පරිව්‍රාජකයෙකු වූ මේ අනුභූතිස්වරූපාචාර්යයන්ට **පරම හංස පරිව්‍රාජකාචාර්ය** යන ගෞරවොපාධියක් ද වෙයි. ශුභාං චක්‍රේ යනුවෙන් සාරස්වත ප්‍රක්‍රියාව ස්වයංකෘත නො වන බවත්, සරස්වතීදත්ත නාතිවිස්තර වූ චතුරොචිත ඒ ප්‍රක්‍රියාව (ව්‍යාකරණය =සූත්‍රපාඨය) වෘත්ති– උදාහරණ ගැළපීමෙන් තමන් විසින් ආබුද්ධිකොවිත සේ සෘජු හෙවත් සරල කළ බවත් හඟවයි.)

21. කමලාවරඃ, ශ්‍රී දෙවියගේ ස්වාමි වූ; ඊශ්වරඃ, සියල්ලන්ට අධිපති වූ; සුරාසුරනරාකාරමධුපාපීතපත්කජඃ, දිව්‍ය– අසුර– මනුෂ්‍ය නමැති මීමැස්සන් විසින් පානය කරණ ලද පාපියුම් ඇති; හයග්‍රීවඃ, විෂ්ණු තෙමේ; වඃ, තොප; අවතාත්, (සර්වොපද්‍රව නිවාරණයෙන්) රකීවා.

ඉති ශ්‍රීමත් පරමහංස පරිව්‍රාජකාචාර්‍ය්‍යානුභූතිස්වරූපාචාර්‍ය්‍ය විරචිතායාං සාරස්වතප්‍රක්‍රියායාං ක්ත්වාදිප්‍රත්‍යයප්‍රක්‍රියා

ස මා ප්තා.

---

## සමාප්තා චෙයං තෘතීයා වෘත්තිඃ.

---

(මෙයින් මේ ව්‍යාකරණය හදරණ ශිෂ්‍යයන්ට ආශිර්වාද කළහ. හයග්‍රීව නම් විෂ්ණුහුගේ සුවිසි අවතාරවලින් එකෙකි.

"වෙදාන් යුගාන්තෙ තමසා තිරස්කෘතාන්
රසාතලාද්‍යො නෘතුරඞ්ගවිග්‍රහඃ,
ප්‍රත්‍යාදදෙ වෛ කවයේ'භියාචතෙ
තස්මෙ නමස්තෙ විතථෙ හිතාය."

යන භගවත් පුරාණෝක්තියෙන් ඒ බැව් පැණේ. අශ්ව මුඛයක් හා පුරුෂ ශරීරයක් ඇති හෙයින් එනම් වේ. 'කමලා' නම් ශ්‍රී දෙවිය යි. ඇගේ ස්වාමියා කමලාවර නමි. ("කමලායා වරඃ= කමලාවරඃ.") විෂ්ණු යි. ඊශ්වර ශබ්දය මෙහි ශිවවාචක නො ව විෂ්ණුවාචක ය. විෂ්ණු සම්බන්ධ කෘෂ්ට ය යි වෛෂ්ණවයන්ගේ පිළිගැණීම හෙයිනි. කඤ්ජ නම් පියුම යි. ("කෙ ජලෙ ජාතං= කඤ්ජම්"= දියෙහි හටගත් හෙයින් "කඤ්ජ" නමි.) විෂ්ණුපාදය පද්මත්වයෙන් ද, සුරාසුර මනුෂ්‍යයන් භෘඞ්ගත්වයෙන් ද රූපිත කිරීමෙන් සියලු සුරාසුරනරයන් විෂ්ණුහුගේ දෙපා ලඟ වැඳ වැටෙන බව ඇඟවූහ. චන්ද්‍රකිර්ති- බාලසරලා ටීකා කාරයෝ මෙහි "කමලාවර" යන්න වෙනුවට "කමලාකර" යන පාඨාන්තරයක් ගෙණ විස්තර කළහ.)

ඉති, මෙසේ; ශ්‍රීමත්පරම —පෙ— විරචිතායාම්, ශ්‍රීමත් පරම හංස පරිව්‍රාජකාචාර්‍ය්‍ය නම් වූ අනුභූතිස්වරූපාචාර්‍ය්‍යවරයන් විසින් ප්‍රණීත වූ; සාරස්වතප්‍රක්‍රියායාම්, සාරස්වත ප්‍රක්‍රියාවෙහි; ක්ත්වාදි ප්‍රත්‍යය ප්‍රක්‍රියා, ක්ත්වාදි ප්‍රත්‍යයන් පිළිබඳ ප්‍රක්‍රියා තොමෝ; සමාප්තා, නිමියා ය.

ඉයං තෘතීයා වෘත්තිඃ ච, මේ තෙවන වෘත්තිය ද; සමාප්තා, නිමි.

## සාරස්වතප්‍රක්‍රියා ව්‍යාඛ්‍යාව සමාප්ත යි.

---

## සාරස්වත සන්නය නිමි.

---

# උපග්‍රන්ථය.

## ලිඞ්ගානුශාසනය.

ලිඞ්ගභජනය ද ශබ්දධර්මයක් බැවින් ශබ්දව්‍යුත්පාදනොපායය සමග ම ව්‍යුත්පාද්‍යමාන ශබ්දයන්ගේ ලිඞ්ගභෙදය ද අවශ්‍යයෙන් දත යුතු වෙයි. මේ සාරස්වත ව්‍යාකරණයෙහි එසේ ලිඞ්ගානුශාසන යක් නො කරණ ලද බැවින් භාෂාතත්ත්ව පරීක්ෂණයෙන් බාහුල්‍ය වෘත්තිය අනු ව සාරස්වතීය **සමාස- තද්ධිත- කෘදන්තයන්** පිළිබඳ ව අප විසින් සම්පාදිත වූ ලිඞ්ගානුශාසනයක් මේ උපග්‍රන්ථයෙන් ආධුනිකයන් අතට පමුණුවනු ලැබේ.

## සමාස ලිඞ්ගානුශාසනය.

### 1, අව්‍යයීභාව.

ෂට් සමාසයන් අතුරෙන් අව්‍යයීභාව සමාසය නපුංසක ලිඞ්ගික ය. පූර්ව වූ අව්‍යය පදයක් සමග පූර්වපදාර්ථප්‍රධාන භාවයෙන් සමාස වන මේ සමාසය පූර්ව පදයාගේ ලිඞ්ගය ලැබිය යුතු ය. එහෙත් පූර්වපදය අව්‍යයක් බැවින් ද, සමස්ත පදයත් අව්‍යය තත්ත්වයට පැමිණෙන බැවින් ද අලිඞ්ග ය යි කිය යුතු වුවත් අකාරාන්ත අව්‍යයීභාව සමාස නාමයන් පමණක් සමහර විබත්වල වරනැගෙන හෙයින් අව්‍යයීභාව සමාසය නපුංසක ලිඞ්ගික ය යි කියන ලදී. එහෙයින් සමස්‍යමාන පරපදය කවර ලිඞ්ගික වුව ද සමස්ත පදය නපුංසකලිඞ්ග ම වේ උදාහරණ මෙසේ යි:-

| | වාක්‍ය | | සමස්ත පද |
|---|---|---|---|
| පුංලිඞ්ග:- | කුම්භස්‍ය සමීපම් | = | උපකුම්භම් |
| ස්ත්‍රීලිඞ්ග:- | භික්ෂාණාං සමෘද්ධිඃ | = | සුභික්ෂම් |
| නපුංසක ලිඞ්ග:- | රූපස්‍ය යොග්‍යම් | = | අනුරූපම් |

### 2, තත්පුරුෂ.

පෙරටු ව සිටි ද්විතීයා ආදි විභක්ත්‍යන්ත නාමයක් හා සමාස වන තත්පුරුෂ සමාසය පරපදාර්ථප්‍රධාන බැවින් පරපදයෙහි ලිඞ්ගය භජනය කෙරෙයි. එහෙයින් පූර්වපදය කවර ලිඞ්ගයකට අයත්

වුව ද සමස්‍යමාන පරපදය පුංලිඞ්ග නම් සමස්ත පදයත් පුංලිඞ්ග ද, ස්ත්‍රීලිඞ්ග නම් ස්ත්‍රීලිඞ්ග ද, නපුංසකලිඞ්ග නම් නපුංසක ලිඞ්ග ද වේ.

| | වාක්‍ය. | සමස්ත පද |
|---|---|---|
| පුං: | රාඥඃ පුරුෂඃ | = රාජපුරුෂඃ |
| ස්ත්‍රී: | භූතෙෂු දයා | = භූතදයා |
| නපුං: | ආම්‍රාණාං වනම් | = ආම්‍රවණම් |

මේ සාමාන්‍ය විධිය යි. එහෙත් ඇතැම් තැන්හි 'පිශාච' ශබ්දාදිය ස්ත්‍රීලිඞ්ග 'සභා' ශබ්දාදිය හා සමාස වූ කල්හි විකල්පයෙන් නපුංසකලිඞ්ග වන බව ද පෙණේ. "පිශාචානාං සභා= පිශාචසභම්– පිශාචසභා, ගෘහස්‍ය ස්ථූණා= ගෘහස්ථූණම්– ගෘහස්ථූණා, ශශස්‍ය ඌර්ණා= ශශෝර්ණම්– ශශෝර්ණා" යනු ඊට උදාහරණ යි.

## 3, ද්වන්ද්ව.

දෙවැදෑරුම් වූ ද්වන්ද්ව සමාසය දෙපරිද්දකින් ලිඟු ලබයි. තුල්‍යබල ශබ්දයන්ගේ සමාසය හෙයින් ද්වන්ද්ව සමාසය උභය පදාර්ථප්‍රධාන වුවත් **ඉතරෙතරයොග** ද්වන්ද්වය පර පදයෙහි ලිඞ්ගය ගණී. **සමාහාර** ද්වන්ද්වය ඒ උභය පදයෙහි ම ලිඞ්ගයන් නො ගෙණ නපුංසක ලිඞ්ගය භජනය කෙරේ. නපුංසකත්වය සමාහාරයෙහි ලක්ෂණයෙකි. **"සමාහාරඃ ස විශෙෂයො යශ්චෛකත්වං නපුංසකම්"** යනුවෙන් ඒ බැව් හැඟේ. ඉතරෙතරයොග ද්වන්ද්වයට උදාහරණ:–

| | වාක්‍ය | සමස්ත පද |
|---|---|---|
| පුං: | අර්ථශ්ච ධර්මශ්ච | = අර්ථධර්මෞ |
| ස්ත්‍රී: | පූර්වා ච උත්තරා ච | = පූර්වෝත්තරෙ |
| නපුං: | දධි ච ඝෘතඤ්ච | = දධිඝෘතෙ |

සමාහාර ද්වන්ද්වයට උදාහරණ:–

| | වාක්‍ය | සමස්ත පද |
|---|---|---|
| පුං: | පාණිශ්ච පාදශ්ච | = පාණිපාදම් |
| ස්ත්‍රී: | පූර්වා ච අපරා ච | = පූර්වාපරම් |
| නපුං: | ගීතඤ්ච වාදිත්‍රඤ්ච | = ගීතවාදිත්‍රම් |

## 4, ද්විගු.

**විශෙෂණත්වයෙන්** පෙරටු ව සිටි **සඞ්ඛ්‍යා** ශබ්දයක් හා සමාස වන ද්විගු සමාසය පරපදාර්ථප්‍රධාන හෙයින් පරපදයෙහි ලිඞ්ගය

ලැබිය යුතු වුව ද සමාහාරාර්ථ බැවින් සමස්‍යමාන පද කවරලිඞ්ග යන් භජනය කළත් සමස්ත පදය නපුංසක ලිඞ්ගය ගණී.

| | වාක්‍ය | සමස්ත පද |
|---|---|---|
| පුං: | පඤ්චානාං ගවාං සමාහාරඃ | = පඤ්චගු |
| ස්ත්‍රී: | තිසෘණාං රාත්‍රීණාං ,, | = ත්‍රිරාත්‍රම් |
| නපුං: | ත්‍රයාණාං භුවනානාං ,, | = ත්‍රිභුවනම් |

සාමාන්‍ය විධිය මෙසේ වී නමුත් අකාරාන්ත ද්විගු සමාස නාමය ඇතැම් විට ස්ත්‍රීලිඞ්ග ද වෙයි. "ත්‍රයාණාං ලොකානාං සමාහාරඃ= ත්‍රිලොකී, දශානාං ග්‍රාමාණාං සමාහාරඃ= දශග්‍රාමී" යනාදිය ඊට උදාහරණ යි. මෙසේ ද්විගු සමාසය නපුංසක ලිඞ්ගික ද, ස්ත්‍රීලිඞ්ගික ද වේ.

## 5, බහුව්‍රීහි.

ප්‍රථමා ආදි විභක්ත්‍යන්ත අන්‍ය පදයන්ගේ අර්ථයෙහි සමාස වන බහුව්‍රීහි සමාසය අන්‍යපදාර්ථප්‍රධාන බැවින් සමස්‍යමාන කිසි ම පදයක ලිඞ්ගය නො ගෙණ යම් පදාර්ථයක සමාසය වේ නම් ඒ අන්‍ය පදයාගේ ලිඞ්ගය ගණියි. එහෙයින් අන්‍යපදය පුංලිඞ්ග නම් බහුව්‍රීහි සමස්ත පදයත් පුංලිඞ්ග ද, ස්ත්‍රීලිඞ්ග නම් ස්ත්‍රීලිඞ්ග ද, නපුංසක ලිඞ්ග නම් නපුංසකලිඞ්ග ද වේ.

| | වාක්‍ය | සමස්ත පද | අන්‍ය පද |
|---|---|---|---|
| පුං: | දශ බලානි යස්‍ය සඃ | = දශබලඃ | =භගවාන් |
| ස්ත්‍රී: | බහවො රාජානො යස්‍යාං සා | = බහුරාජා | =නගරී |
| නපුං: | සූපො ගන්ධො'ලෙපො යස්මින් තත් | = සූපගන්ධි | =භොජනම් |

## 6, කර්මධාරය.

විශෙෂණ- විශෙෂ්‍ය පද දෙකක්හුගේ සමාසය වූ කර්මධාරය සමාසය ද පරපදාර්ථප්‍රධාන බැවින් පරපදයෙහි ලිඞ්ගය ලබයි. එහෙයින් සමස්‍යමාන පරපදය යම් ලිඞ්ගයෙක්හි නම් සමස්ත පදය ද ඒ ලිඞ්ගයෙන් ම සිටී.

| | වාක්‍ය | සමස්ත පද |
|---|---|---|
| පුං: | මහාංශ්චාසෞ පුරුෂශ්ච | = මහාපුරුෂඃ |
| ස්ත්‍රී: | රක්තා චාසෞ ලතා ච | = රක්තලතා |
| නපුං: | නීලඤ්ච තදුත්පලඤ්ච | = නීලොත්පලම් |

මෙසේ අව්‍යයීභාව සමාසය නපුංසක ලිඞ්ගය ද, ද්විගු සමාසය ස්ත්‍රී- නපුංසක ලිඞ්ග දෙක ද, සෙසු සමාස පූර්වොක්ත පරිද්දෙන් ලිඞ්ගත්‍රයය ම ද භජනය කෙරෙත්.

# තද්ධිත ලිඞ්ගානුශාසනය.

නාම- ප්‍රත්‍යය සඞ්කලනයෙන් නිපදවනු ලබන තද්ධිත නාමයෝ බොහෝ සෙයින් වාච්‍යලිඞ්ගයහ. එහෙයින් පුරුෂ පදාර්ථයක් වාච්‍ය කල්හි පුංලිඞ්ග ද, ස්ත්‍රී පදාර්ථයක් වාච්‍ය කල්හි ස්ත්‍රීලිඞ්ග ද, තදුභයමුක්ත පදාර්ථයක් වාච්‍ය කල්හි නපුංසකලිඞ්ග ද වෙති. **එහෙත් අපත්‍යාර්ථයෙහි වූ ඉඤ්- ඓරණ්** යන දෙක ද, භාවාර්ථයෙහි වූ **ඉමන්** ප්‍රත්‍යය ද, අල්පාර්ථයෙහි වූ **ර** ප්‍රත්‍යය ද පුංලිඞ්ගයෙහි පමණක් වන බව පෙණේ. එසේ ම භාවාර්ථයෙහි වූ **තා** ප්‍රත්‍යය හා සමූහාර්ථයෙහි වූ **තා- ය- ඉනි- ත්‍ර- කාඩ්‍යච්** යන ප්‍රත්‍යයයෝ හුදු ස්ත්‍රීලිඞ්ගයෙහි වෙත්. ස්වාර්ථයෙහි වූ **ධෙය** ප්‍රත්‍යය හා භාවාර්ථයෙහි වූ **ත්ව- යණ්** ප්‍රත්‍යය දෙක ද, සමූහාර්ථයෙහි වූ **ක- ණ්‍ය- යණ්- ඉක- අණ්** යන ප්‍රත්‍යයෝ ද හුදු නපුංසක ලිඞ්ගයෙහි වෙති. **ඩාමහච්** ප්‍රත්‍යය පුං- ස්ත්‍රී ලිඞ්ග දෙක්හි වේ. **වත්- ආම්- ධා- ධ්‍යමුඤ්- කෘත්වසුච්- සු- ශස්** යන ප්‍රත්‍යයන් අන්ත කොට ඇති තද්ධිතයෝ අව්‍යයයෝ ය. සෙසු ප්‍රත්‍යයන් ලිඞ්ගත්‍රයෙහි ම වන හෙයින් ඔවුන් අන්ත කොට ඇති නාමයෝ ලිඞ්ගත්‍රයට ම සාධාරණ වෙත්. හුදු ඒ ඒ ලිඞ්ගයන්හි වන ප්‍රත්‍යයන් අන්ත කොට ඇති නාමයෝ ඒ ඒ ලිඞ්ගයන්හි පමණක් ව්‍යවහෘත වෙත්. ඉක්බිති උදාහරණ දක්වනු ලැබේ.

## පුංලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | | උදාහරණ. |
|---|---|---|
| ඉඤ්* | (=අපත්‍ය) | දාශරථිඃ |
| ඓරණ් | ,, | වාටකෛරඃ |
| ඉමන් | (=භාවෙ) | මහිමා |
| ර | (=අල්පාර්ථෙ) | කුටීරඃ |

## ස්ත්‍රීලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය | | උදාහරණ |
|---|---|---|
| ත | (=භාවෙ) | බ්‍රාහ්මණතා |
| තා | (=සමූහෙ) | ජනතා |
| ය | ,, | පාශ්‍යා |
| ඉනි | ,, | බලිනී |
| ත්‍ර | ,, | ගොත්‍රා |
| කාඩ්‍යච් | ,, | රථකාඩ්‍යා |

* පොත්හි "වෛයාසකි" යන්න ව්‍යාසාදේඃ කිඃ" යි කී ප්‍රත්‍යයකින් නිෂ්පන්න බව දක්වේ. එහෙත් එය ද "සුධාතුරකඞ් ච" යි ඉඤ් ප්‍රත්‍යයෙන් හා අකඞාදේශයෙන් සිද්ධ ය.

## නපුංසකලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | | උදාහරණ. |
|---|---|---|
| ධෙය | (=ස්වාර්ථෙ) | නාමධෙයම් |
| ත්‍ව | (=භාවෙ) | බ්‍රාහ්මණත්වම් |
| යණ් | ,, | සෞමනස්‍යම් |
| ක | (=සමූහෙ) | ධෛනුකම් |
| ණ්‍ය | ,, | ගාර්ණික්‍යම් |
| යණ් | ,, | කෞදාරීම් |
| ඉක | ,, | කෞදාරිකම් |
| අණ් | ,, | හෛක්ෂම් |

## පුං-ස්ත්‍රීලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | පුං: | ස්ත්‍රී: |
|---|---|---|
| ඩාමහච් | පිතාමහඃ | පිතාමහී |

## ත්‍රිලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | | පුං: | ස්ත්‍රී: | නපුංසක: |
|---|---|---|---|---|
| අණ් | (=අපත්‍යෙ) | වෛදෙහඃ | වෛදෙහී | වෛදෙහම් |
| ණ්‍ය | ,, | ගාර්ග්‍යඃ | ගාර්ගී | ගාර්ග්‍යම් |
| ආයනණ් | ,, | චාන්ද්‍රායණඃ | චාන්ද්‍රායණී | චාන්ද්‍රායණම් |
| එයණ් | ,, | ආත්‍රෙයඃ | ආත්‍රෙයී | ආත්‍රෙයම් |
| ඉණෙය | ,, | කාල්‍යාණිනෙයඃ | කාල්‍යාණිනෙයී | කාල්‍යාණිනෙයම් |
| ණ්‍ය | ,, | පෛතෘෂ්වස්‍රීයඃ | පෛතෘෂ්වස්‍රීයා | පෛතෘෂ්වස්‍රීයම් |
| ක | (=භවාද්‍යර්ථෙ) | කාණ්ටකඃ | කාණ්ටිකා | කාණ්ටකම් |
| ඊන | ,, | ග්‍රාමීණඃ | ග්‍රාමීණා | ග්‍රාමීණම් |
| ඉය | ,, | ක්‍ෂත්‍රියඃ | ක්‍ෂත්‍රියා | ක්‍ෂත්‍රියම් |
| ඉක | ,, | වෛදිකඃ | වෛදිකී | වෛදිකම් |
| ත්‍ය | ,, | තත්‍රත්‍යඃ | තත්‍රත්‍යා | තත්‍රත්‍යම් |
| තන | ,, | අද්‍යතනඃ | අද්‍යතනී | අද්‍යතනම් |
| තන | ,, | චිරතනඃ | චිරතනා | චිරතනම් |
| අකච් | (=ස්වාර්ථෙ) | සර්වකඃ | සර්විකා | සර්වකම් |
| ය | (=සාධ්වාද්‍යර්ථෙ) | සභ්‍යඃ | සභ්‍යා | සභ්‍යම් |
| මතු | (=අස්ත්‍යර්ථෙ) | ගොමාන් | ගොමතී | ගොමත් |
| ඉත | ,, | ඵලිතඃ | ඵලිතා | ඵලිතම් |

| ප්‍රත්‍යය. | | පුං: | ස්ත්‍රී: | නපුංසක: |
|---|---|---|---|---|
| ඉන් | (=අස්ත්‍යර්ථෙ) | ඵලී | ඵලිනී | ඵලි |
| ඌල | ,, | වාතූලඃ | වාතූලා | වාතූලම් |
| කින් | ,, | අතිසාරකී | අතිසාරකිණී | අතිසාරකි |
| යුස්* | ,, | අහංයුඃ | අහංයුඃ | අහංයු |
| ව | ,, | කේශවඃ | කේශවා | කේශවම් |
| භ | ,, | කම්භඃ | කම්භා | කම්භම් |
| ති | ,, | කන්තිඃ | කන්තිඃ | කන්ති |
| තු | ,, | කන්තුඃ | කන්තුඃ | කන්තු |
| ත | ,, | කන්තඃ | කන්තා | කන්තම් |
| යස්* | ,, | කංයඃ | කංයා | කංයම් |
| ශ | ,, | ලෝමශඃ | ලෝමශා | ලෝමශම් |
| න | ,, | පාමනඃ | පාමනා | පාමනම් |
| ඉලච් | ,, (=ඉල) | පිච්ඡිලඃ | පිච්ඡිලා | පිච්ඡිලම් |
| වලච් | ,, | කෘෂීවලඃ | කෘෂීවලා | කෘෂීවලම් |
| ආරකච් | ,, | වෘන්දාරකඃ | වෘන්දාරිකා | වෘන්දාරකම් |
| ර | ,, | මුඛරඃ | මුඛරා | මුඛරම් |
| ල | ,, | චූඩාලඃ | චූඩාලා | චූඩාලම් |
| අ | ,, | වෛජයන්තඃ | වෛජයන්තී | වෛජ යන්තම් |
| ඉක | ,, | මායිකඃ | මායිකා | මායිකම් |
| වතු | ,, | භගවාන් | භගවතී | භගවත් |
| උර | ,, | දන්තුරඃ | දන්තුරා | දන්තුරම් |
| ලු | ,, | ශ්‍රද්ධාලුඃ | ශ්‍රද්ධාලූඃ– ශ්‍රද්ධාලුඃ | ශ්‍රද්ධාලු |
| වින් | ,, | යශස්වී | යශස්විනී | යශස්වි |
| ග්මිනි | ,, | වාග්මී | වාග්මිනී | වාග්මි |
| ආල | ,, | වාචාලඃ | වාචාලා | වාචාලම් |
| ආට | ,, | වාචාටඃ | වාචාටා | වාචාටම් |
| ආකිනිච් | (=අසහායෙ) | ඒකාකී | ඒකාකිනී | ඒකාකි |
| කල්ප | (=ඊෂදූනෙ) | සර්වඥකල්පඃ | සර්වඥකල්පා | සර්වඥකල්පම් |
| දේශ්‍ය | ,, | පටුදේශ්‍යඃ | පටුදේශ්‍යා | පටුදේශ්‍යම් |
| දේශීය | ,, | කවිදේශීයඃ | කවිදේශීයා | කවිදේශීයම් |
| රූප | (=ප්‍රශංසායාම්) | වෛයාකරණරූපඃ | වෛයාකරණරූපා | වෛයාකරණරූපම් |
| පාශ | (=කුත්සායාම්) | වෛයාකරණපාශඃ | වෛයාකරණපාශා | වෛයාකරණපාශම් |

* මේ "ස්" යන්න ඉත් ය.

| ප්‍රත්‍යය. | පුං: | ස්ත්‍රී: | නපුංසක: |
|---|---|---|---|
| චරට් (=භූතපූර්වේ) | භූතචරඃ | භූතචරී | භූතචරම් |
| මයට් (=ප්‍රාචුර්‍ය්‍යාදෞ) | වාඞ්මයඃ | වාඞ්මයී | වාඞ්මයම් |
| ඉත (=ජාතාර්ථේ) | ක්‍ෂුධිතඃ | ක්‍ෂුධිතා | ක්‍ෂුධිතම් |
| තර (=ප්‍රකර්ෂේ) | පටුතරඃ | පටුතරා | පටුතරම් |
| තම ,, | පටුතමඃ | පටුතමා | පටුතමම් |
| ඊයසු ,, | ලඝීයාන් | ලඝීයසී | ලඝීයඃ |
| ඉෂ්ඨ ,, | ලඝිෂ්ඨඃ | ලඝිෂ්ඨා | ලඝිෂ්ඨම් |
| දඝ්නට් (=ප්‍රමාණේ) | ජානුදඝ්නඃ | ජානුදඝ්නී | ජානුදඝ්නම් |
| ද්වයසට් ,, | ශිරෝද්වයසඃ | ශිරොද්වයසී | ශිරොද්වයසම් |
| මාත්‍රට් ,, | පුරුෂමාත්‍රඃ | පුරුෂමාත්‍රී | පුරුෂ මාත්‍රම් |
| ඩතර (=නිර්ධාරණේ) | කතරඃ | කතරා | කතරම් |
| ඩතම ,, | කතමඃ | කතමා | කතමම් |
| තීය (=සඞ්ඛ්‍යාපූරණේ) | ද්විතීයඃ | ද්විතීයා | ද්විතීයම් |
| ථට් ,, | ෂෂ්ඨඃ | ෂෂ්ඨී | ෂෂ්ඨම් |
| මට් ,, | පඤ්චමඃ | පඤ්චමී | පඤ්චමම් |
| ඩට් ,, | ඒකාදශඃ | ඒකාදශී | ඒකාදශම් |
| තමට් ,, | ශතතමඃ | ශතතමී | ශතතමම් |
| ථ ,, | කතිථඃ | කතිථී | කතිථම් |
| තයට් ,, | ද්විතයඃ | ද්විතයී | ද්විතයම් |
| අයට් ,, | ද්වයඃ | ද්වයී | ද්වයම් |
| නඤ් (=භවේ) | ස්ත්‍රෛණඃ | ස්ත්‍රෛණී | ස්ත්‍රෛණම් |
| ස්නඤ් ,, | පෞංස්නඃ | පෞංස්නී | පෞංස්නම් |
| ඩති (=සඞ්ඛ්‍යා) | කති | කති | කති |

## අලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | | උදාහරණ. |
|---|---|---|
| වත් | (=තුල්‍යෙ) | චන්ද්‍රවත් |
| ආම් | (=ප්‍රකර්ෂේ) | කිංතරාම්<br>උච්චෛස්තමාම්<br>පචතිතරාම් |
| ධා | (=ප්‍රකාරෙ) | ඒකධා |
| ධ්‍යමුඤ් | ,, | ඓකධ්‍යම් |
| කෘත්වසුච් | (=ආවෘත්තෞ) | පඤ්චකෘත්වඃ |
| සු | ,, | ත්‍රිඃ |
| ශස් | ,, | බහුශඃ |

# කෘදන්ත ලිඞ්ගානුශාසනය.

ධාතු- ප්‍රත්‍යය සඞ්කලනයෙන් ව්‍යුත්පාද්‍යමාන කෘදන්තයෝ ද අභිධෙයලිඞ්ග වෙත්. එහෙයින් පුරුෂ පදාර්ථයක් වාච්‍ය කල්හි පුංලිඞ්ග ද, ස්ත්‍රී පදාර්ථයක් වාච්‍ය කල්හි ස්ත්‍රීලිඞ්ග ද, තදුභය මුක්ත පදාර්ථයක් වාච්‍ය කල්හි නපුංසකලිඞ්ග ද වෙති. එහෙත් **තෘ- ඝඤ්- අථු-** ('යාවදථු' ශබ්දය හැර) **නඞ්- කි- මනිණ්- ඉක්- ශ්තිප්- ඝාර- ඉළු-** යන ප්‍රත්‍යයන් හා භාවයෙහි වන අ ප්‍රත්‍යය අන්ත කොට ඇති නාමයෝ හුදු පුංලිඞ්ගයෙහි ද; **ඌලික්- ඊ** ප්‍රත්‍යය දෙක හා ස්ත්‍ර්‍යධිකාර ප්‍රක්‍රියාවෙහි වූ **ක්‍යප්-ක්ති-නි-අඞ්-ඉඤ්** යන ප්‍රත්‍යයන් අන්ත කොට ඇති නාමයෝ හුදු ස්ත්‍රීලිඞ්ගයෙහි ද; භාවයෙහි වන **ක්ත- ල්‍යුට්** ප්‍රත්‍යය දෙක ය, "පුෂ්පාදෙරඃ" යි විහිත අ ප්‍රත්‍යය ය, **ත්‍රක්- මන්- අස්-උස්** යන සතරය යන ප්‍රත්‍යයන් අන්ත කොට ඇත්තෝ හුදු නපුංසක ලිඞ්ගයෙහි ද; **ඉ- නි- ඩො- ඩෞ-** යන ප්‍රත්‍යයන් අන්ත කොට ඇත්තෝ පුං- ස්ත්‍රී ලිඞ්ග දෙක්හි ද; **මුක්- ම - ත්‍ර-** යන ප්‍රත්‍යයන් අන්ත කොට ඇත්තෝ පුං- නපුංසක ලිඞ්ග දෙක්හි ද; **ඉස්** ප්‍රත්‍යය අන්ත කොට ඇත්තෝ ස්ත්‍රී- නපුංසක ලිඞ්ග දෙක්හි ද බොහෝ සෙයින් ව්‍යවහෘත වෙත්. **එවි- තුම්-ක්ත්වා- ණම්** යන ප්‍රත්‍යයන් හා ක්ත්වා ප්‍රත්‍යයාගේ අර්ථයෙහි වන **ක්‍යප්** ප්‍රත්‍යය ද අන්ත කොට ඇත්තෝ ලිඞ්ගත්‍රයයෙන් ම තොර වූවෝ ය, හෙවත් අව්‍යයයෝ ය. සෙසු ප්‍රත්‍යයන් සියලු ලිඞ්ගයන්ට ම සාධාරණ හෙයින් ඔවුන් අන්ත කොට ඇති නාමයෝ ලිඞ්ගත්‍රයය ම භජනය කෙරෙත්. ඖණාදික ප්‍රත්‍ය යන්ගේ අර්ථාපෙක්ෂාව ගෞණ හෙයින් ඔවුන් පිළිබඳ ලිඞ්ගනියමය ඇතැම් විට වෙනස් විය හැකි ය. භාෂාවේ ජේකව්‍යවහාරය ම බලා දත යුතු ය. ඉක්බිති උදාහරණ දක්වනු ලැබේ.

## පුංලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | | උදාහරණ. |
|---|---|---|
| තෘ | | නන්තෘඃ |
| ඝඤ් | | ත්‍යාගඃ |
| අථු | | වෙපථුඃ |
| නඞ් | | යඥඃ |
| කි | (=සංඥායාං දධොඃ-) | උදධිඃ |
| මනිණ් | | ආත්මා-බ්‍රහ්මා |
| ඉක් | | පචිඃ |
| ශ්තිප් | | පචතිඃ |
| ඝාර | | අකාරඃ |
| ඉළු | | රෙළුඃ |
| අ | (=සවරුදඃ, මදම්) | වයඃ |

## ස්ත්‍රීලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | උදාහරණ. |
|---|---|
| උලික් | ධූලී-ධූලිඃ |
| ඊ | ලක්ෂ්මීඃ, අවීඃ |
| ක්‍යප් (=ස්ත්‍රියාං යජාම්-) | ඉජ්‍යා |
| ක්ති | කෘතිඃ |
| නි (=ක්ත්‍යචෙ) | ග්ලානිඃ |
| අඞ් | මෘජා |
| ඉක්ද් | ආජිඃ |

## නපුංසකලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | උදාහරණ. |
|---|---|
| ක්ත (=භාවයෙහි) | ස්නාතම් (තව යා) |
| ල්‍යුට් ( „ ) | ඥතම් |
| ත්‍රක් | ශස්ත්‍රම් |
| අ (=පුෂ්පාදෙරඃ) | පුෂ්පම් |
| මන් | වර්ම, බ්‍රහම |
| අස් | වචඃ |
| උස් | චක්ෂුඃ |

## පුං-ස්ත්‍රීලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | පුං: | ස්ත්‍රී: |
|---|---|---|
| ඉ | ශකෘතකරිඃ | ශකෘතකරී |
| නි | යොනිඃ | යොනී- යොනිඃ |
| ඩො | ගෞඃ | ගෞඃ |
| ඩෞ | ග්ලෞඃ | නෞඃ |

## පුං-නපුංසකලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | පුං: | නපුංසක: |
|---|---|---|
| මුක් | ඔම් | ඔම් |
| ම | ධර්මඃ | ධර්මම් |
| ත්‍ර | මන්ත්‍රඃ | යන්ත්‍රම් |

## ස්ත්‍රී-නපුංසකලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | ස්ත්‍රී: | නපුං: |
|---|---|---|
| ඉස් | අර්චිඃ, ඡර්දිඃ | අර්චිඃ, හවිඃ |

## ත්‍රිලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | පුං: | ස්ත්‍රී: | නපුංසක: |
|---|---|---|---|
| තෘ | කර්තා | කර්ත්‍රී | කර්තෘ |
| වුණ් | පාචකඃ | පාචිකා | පාචකම් |
| ක | කාමදුහඃ | කාමදුහා | කාමදුහම් |
| අ (=පචිතාදි-) | චරඃ | චරා | චරම් |
| ල්‍යු | නන්දනඃ | නන්දනී | නන්දනම් |
| ණිනි | ග්‍රාහී | ග්‍රාහිණී | ග්‍රාහි |
| ශ | උද්ධමඃ | උද්ධමා | උද්ධමම් |
| ණ | ජ්වාලඃ | ජ්වාලා | ජ්වාලම් |
| අණ් | කුම්භකාරඃ | කුම්භකාරී | කුම්භකාරම් |
| ඩ | ද්විජඃ | ද්විජා | ද්විජම් |
| අ (=අචො) | අස්ථිහරඃ | අස්ථිහරා | අස්ථිහරම් |
| ට | කුරුචරඃ | කුරුචරී | කුරුචරම් |
| ඛ | ප්‍රියංවදඃ | ප්‍රියංවදා | ප්‍රියංවදම් |
| ඛි | උදරම්භරිඃ | උදරම්භරිඃ | උදරම්භරි |
| ඛශ් | ජනමේජයඃ | ජනමේජයා | ජනමේජයම් |
| ඛ්‍යුන් | ආඪ්‍යඞ්කරණඃ | ආඪ්‍යඞ්කරණී | ආඪ්‍යං කරණම් |
| ටක් (=ජායාපත්‍යොඃ-) | ජායාඝ්නඃ | ජායාඝ්නී | ජායාඝ්නම් |
| විත් | අධිභාක් / අධිභාග් | අධිභාක් / අධිභාග් | අධිභාක් / අධිභාග් |
| මනිප් | සුදෘමා | සුදෘම්නී | සුදෘම |
| ඞ්වනිප් | සුගීවා | සුගීවරී | සුගීව |
| වනිප් | අවාවා | අවාවරී | අවාව |
| ක්විප් | සෝමපාඃ | සෝමපාඃ | සෝමපම් |
| ටක් (=දෘශෙෂ්ටක්-) | තාදෘශඃ | තාදෘශී | තාදෘශම් |
| සක් | තාදෘක්ෂඃ | තාදෘක්ෂා | තාදෘක්ෂම් |
| ණිනි (=ණිනිරතීතෙ) | අග්නිෂ්ටොම යාජී | අග්නිෂ්ටොම යාජිනී | අග්නිෂ්ටොම යාජී |
| ක්ත | කෘතඃ | කෘතා | කෘතම් |
| ක්තවතු | කෘතවාන් | කෘතවතී | කෘතවත් |
| ක්වසු | චකෘවාන් | චක්‍රුෂී | චකෘවත් |
| කාන | චක්‍රාණඃ | චක්‍රාණා | චක්‍රාණම් |
| ශතෘ | පචන් | පචන්තී | පචත් |
| ශාන | පචමානඃ | පචමානා | පචමානම් |
| වසු | විද්වාන් | විදුෂී | විද්වත් |

| ප්‍රත්‍යය. | පුං: | ස්ත්‍රී: | නපුංසක: |
|---|---|---|---|
| ඉෂ්ණු | අලඞ්කරිෂ්ණුඃ | අලඞ්කරිෂ්ණුඃ | අලඞ්කරිෂ්ණු |
| ස්නු | ස්ථාස්නුඃ | ස්ථාස්නුඃ | ස්ථාස්නු |
| ක්නු | ගෘධ්නුඃ | ගෘධ්නුඃ | ගෘධ්නු |
| ෂාක | වරාකඃ | වරාකී | වරාකම් |
| උ | ආශංසුඃ | ආශංසුඃ | ආශංසු |
| උකඤ් | ලාෂුකඃ | ලාෂුකී | ලාෂුකම් |
| ආරු | වන්දාරුඃ | වන්දාරුඃ | වන්දාරු |
| ආලු | ශයාලුඃ | ශයාලුඃ | ශයාලු |
| ර * | නම්‍රඃ | නම්‍රා | නම්‍රම් |
| ක්මර | අද්මරඃ | අද්මරා | අද්මරම් |
| කුර | භිදුරඃ | භිදුරා | භිදුරම් |
| ඝුර | භඞ්ගුරඃ | භඞ්ගුරා | භඞ්ගුරම් |
| ඌක | ජඤ්ජපූකඃ | ජඤ්ජපූකා | ජඤ්ජපූකම් |
| ක්වරප් | ඉත්වරඃ | ඉත්වරා | ඉත්වරම් |
| ක්‍රු | භීරුඃ | භීරුඃ | භීරු |
| ක්‍රුක | භීරුකඃ | භීරුකා | භීරුකම් |
| වර | ස්ථාවරඃ | ස්ථාවරා | ස්ථාවරම් |
| කි (=ආදෘතඃ-) | ජග්මිඃ | ජග්මිඃ | ජග්මි |
| උණ් | කාරුඃ | කාරුඃ | කාරු |
| මක් | භීමඃ | භීමා | භීමම් |
| කන් | දශ | දශ | දශ |
| කෙලිම | භිදෙලිමඃ | භිදෙලිමා | භිදෙලිමම් |
| ත්‍රිමක් | කෘත්‍රිමඃ | කෘත්‍රිමා | කෘත්‍රිමම් |
| යුච් | පචනඃ | පචනී | පචනම් |
| ඛල් | දුෂ්කරඃ | දුෂ්කරා | දුෂ්කරම් |
| තව්‍ය | කර්තව්‍යඃ | කර්තව්‍යා | කර්තව්‍යම් |
| අනීය | කරණීයඃ | කරණීයා | කරණීයම් |
| ය | දෙයඃ | දෙයා | දෙයම් |
| ණ්‍යත් | කාර්යඃ | කාර්යා | කාර්යම් |
| ක්‍යප් | කෘත්‍යඃ | කෘත්‍යා | කෘත්‍යම් |

## අලිඞ්ග ප්‍රත්‍යයයෝ.

| ප්‍රත්‍යය. | උදාහරණ. |
|---|---|
| ච්වි | කෘෂ්ණී (කරොති) |
| තුම් | භොක්තුම් |
| ක්ත්වා | භුක්ත්වා |
| ක්‍යප් (=ක්ත්වාවේ) | ප්‍රණම්‍ය |
| ණම් | පායං පායං (ගච්ඡති) |

---

## ධාතුස්ථ ඉත්සංඥ වර්ණයෝ.

---

ධාතුරූප දැක්වීමෙහි දී උපුරුවනු ලබන හුදු ධාතුස්වරූපයෙන් අධික වූ පදසිද්ධියෙහි දී හැර දමනු ලබන ඒ ඒ ඉත් අකුරු ධාතුන්ගේ යම් යම් විශෙෂවිභාග හඟවනු සඳහා ම යොදන ලදී. එබැවින් ඒ ඉත් අකුරු හා ඔවුන්ගේ ප්‍රයෝජන වෙන් වශයෙන් දැන ගැණීමෙන් ධාතුන් පිළිබඳ එක්තරා හැඳින ගැණීමෙක් ද වෙයි. සමහර ඉත් අකුරුවල ප්‍රයෝජන ආඛ්‍යාත ව්‍යාඛ්‍යානයෙහි තන්හි තන්හි දක්වන ලද නමුත් ඒ සියල්ල මෙහි සඞ්ග්‍රහ කොට දක්වනු ලැබේ.

පාණිනීය ධාතුපාඨයෙහි උදාත්තෙත් සංඥ ධාතු **පරස්මෛපදී** ද, අනුදාත්තෙත් සංඥ ධාතු **ආත්මනෙපදී** ද, ස්වරිතෙත් සංඥ ධාතු **උභයපදී** ද වෙත්. උදාත්ත-අනුදාත්ත-ස්වරිත වර්ණයන්ගේ උච්චාරණ භෙදයක් ලක්දිව නූගන්වනු ලැබේ. ඒ උදාත්තෙත්-අනුදාත්තෙත්-ස්වරිතෙත් සංඥ ධාතූහු පාණිනීය ධාතුපාඨයෙන් ම දත යුත්තාහු ය.

**අ** = පච් – ඝට් – චර් – ප්‍රජ් යනාදි හලන්ත ධාතූහු පච – ඝට – චර – ප්‍රවජ යනාදි වශයෙන් අකාරාන්ත කොට උච්චාරණය කරණු ලැබෙත්. එසේ අකාරය ඉත් කිරීමෙන් උච්චාරණ සෞකර්‍ය්‍යය විනා අන්‍ය විශෙෂ ප්‍රයොජනයක් ඇති බවක් නො පෙණේ.

ආ = "ආදීදිතඃ" යන සූත්‍රයෙන් විහිත ක්ත- ක්තවතු ප්‍රත්‍යයන් පිළිබඳ ව ඉඩාගම ප්‍රතිෂේධය පිණිස යි. "ඤිමිදා = මින්නඃ- මින්නවාන්, ඤිධෘෂා = ධෘෂ්ටඃ - ධෘෂ්ටවාන්" යනාදිය උදාහරණ යි. එහෙත් භාවයෙහි හා කර්තෘකාරකයෙහි වූ නිෂ්ඨා ප්‍රත්‍යයන් පිළිබඳ ව මේ ඉට් ප්‍රතිෂේධය වෛකල්පික හෙයින් 'මෙදිතම් - ප්‍රමෙදිතඃ' යනාදි වශයෙන් ද ලැබේ.

ඉ = "ඉදිතො නුම්" යන්නෙන් විහිත නුමාගමය පිණිස යි. එහෙයින් 'කුපි - වදි' යනාදි ඉකාරානුබන්ධ ධාතූන්ගේ අන්ත්‍ය ස්වරයා කෙරෙන් නකාරාගම වීමෙන් "කුම්පති - වන්දතෙ" යනාදීන් ආඛ්‍යාතයෙහි ද, "කුම්පකඃ- වන්දතා" යනාදීන් කෘදන්තයෙහි ද ලැබේ.

ඊ = නිෂ්ඨා ප්‍රත්‍යයන් සම්බන්ධ ව ඉඩාගම ප්‍රතිෂේධය පිණිස යි. "ආදීදිතඃ" යනු තත්සාධක සූත්‍රය යි. "මදී= මත්තඃ, ඔවිජී = විග්නඃ, දීපී= දීප්තඃ" යනාදිය උදාහරණ යි.

උ = "උදිතඃ ක්ත්වා වෙට්" යන්නෙන් ක්ත්වා ප්‍රත්‍යය පිළිබඳ ව ඉඩාගමය විකල්ප කරණු පිණිස යි. "ඉෂු= එෂිත්වා - ඉෂ්ට්වා, භ්‍රමු = භ්‍රමිත්වා - භ්‍රාන්ත්වා, දිවු = දෙවිත්වා - ද්‍යූත්වා" යනාදිය උදාහරණ යි.

ඌ = "ඌදිතො වා" යි විකල්පයෙන් ඉඩාගම කරණු පිණිස යි. මෙහි ප්‍රත්‍යය විශෙෂයෙක් නැත. ඉඩාගමයට නිමිති ඇති සියලු තැන්හි ම විකල්පයෙන් ඉඩාගම වේ. "ෂිධූ= සෙධිෂ්‍යති -සෙත්ස්‍යති, සෙධිතා-සෙද්ධා, ගුපූ= ගොපිෂ්‍යති-ගොප්ස්‍යති, ගොපිතා-ගොප්තා" යනාදි වශයෙනි.

ඍ = "අඞි ලශෙෂ හ්‍රස්ව උපධායාඃ" යි විහිත අඞිකායයී සඞ්ඛ්‍යාත හ්‍රස්වය නො වනු පිණිස යි. "න ඍතඃ" යන්නෙන් ඒ ප්‍රතිෂිද්ධ ය. එහෙයින් "ඪෞකෘ= අඩුඪෞකත්, ට්‍රයාවෘ=අයයාවත්, වෙපෘ=අවිවෙපත්" යනාදි වශයෙන් වේ. හ්‍රස්වය වුව හොත් "ලඝොර්දීර්ඝඃ" යි පූර්වයට දීර්ඝ වීමෙන් "අඩුඪුකත්, අයායවත්, අවීවිපත්" යි විය යුතු නමුත් ඍත් බැවින් එසේ නො වේ.

ඏ = "ලිත්පුෂාදෙර්ඩඃ" යන සූත්‍රයෙන් ලුඞ් පරස්මෛපදයෙහි සි ප්‍රත්‍යයස්ථානයෙහි ඩ ප්‍රත්‍යය කරණු පිණිස යි. "ගමඏ= අගමත්- අගමතාම්- අගමන්, විදඏ= අවිදත්, ලුපඏ= අලුපත්, මුචඏ = අමුචත්" යනාදිය උදාහරණ යි.

එ = "හ්ම්‍යන්තක්‍ෂණශ්වසිජාගෘණිශ්වෙදිතාං සෙට් සෙඉ නා වෘද්ධිඃ" යි කී හෙයින් ඉඩාගම සහිත සි ප්‍රත්‍යය පර කල්හි වෘද්ධි නො වනු පිණිස යි. "කටෙ= අකටීත් – අකටිෂ්ටාම් – අකටිෂුඃ, චතෙ=" අචතීත් – අචතිෂ්ටාම් – අචතිෂුඃ" යනාදි වශයෙනි. එදිත් බැවින් මෙහි "අත උපධායාඃ" යි විහිත වෘද්ධිය ද, "හසාදෙලීස්වකාරෙපධස්‍ය වා වෘද්ධිඃ" යි විහිත වෛකල්පික වෘද්ධිය ද නො වේ.

ඔ = "ල්වාද්‍යෝදිතශ්ච" යන්නෙන් ක්ත-ක්තවතු ප්‍රත්‍යයන්ගේ තකාරයට නකාරය වනු පිණිස යි. "භඤ්ජො= භග්නඃ– භග්නවාන්, ඔවිජී= විග්නඃ-විග්නවාන්" යනාදි වශයෙනි.

ක් = කිත් වූ ධාතූන් සම්බන්ධ ව විශෙෂ කාය්‍ර්‍යයක් අවිහිත බැවින් ඒ ධාතුභෙදය පිණිස ය යි හැගේ. එහෙයින් 'ඉක්' යන මෙහි කයන්ත 'ඉණ්-ඉඞ්' ධාතු දෙකින් ද, 'ඔහාක්' යන මෙහි කයන්ත 'ඔහාඞ්' ධාතුවෙන් ද වෙන් කොට හැඳින ගැණීම පිණිස ය යි කිය හැකි ය.

ඞ් = "ආදනුදාත්තඞිතඃ" යි කී හෙයින් ආත්මනෙපදි බව හඟවනු පිණිස යි. එබැවින් "වෘධුඞ් = වර්ධතෙ – වර්ධෙතෙ – වර්ධන්තෙ, දයඞ් = දයතෙ – දයෙතෙ – දයන්තෙ" යනාදි වශයෙන් ඞකාරය ඉත් කොට ඇති ධාතු ආත්මනෙපදයෙහි පමණක් වරනැඟිය යුතු යි.

ඤ් = "ඤිත්ස්වරිතෙත උභෙ" යනුවෙන් උභයපදි බව හඟවනු පිණිස යි. එහෙයින් "කෘඤ්= කරොති- කුරුතෙ, චිඤ්= චිනොති- චිනුතෙ, ෂුඤ්= සුනොති-සුනුවීති; සුනුතෙ- සුනුවීතෙ" යනාදි වශයෙන් ඤිත් වූ ධාතුහු පරස්මෛපද- ආත්මනෙපද දෙක්හි ම වර නැඟෙත්.

ට් = "දෙවට්- නදට් ඉති ටකාරානුබන්ධත්වාදීප්" යි කී හෙයින් ධාතුසඵ ඉත් වූ ටකාරය ද තද්ධාතුනිෂ්පන්න කෘදන්ත නාමයන් කෙරෙන් ස්ත්‍රීලිඞ්ගයෙහි "ෂ්ට්ඩ්ත්‍රිතඃ" යි ඊප් ප්‍රත්‍යය වනු පිණිස ය යි හැගේ. "දෙවට්= දෙවී, නදට්= නදී, ධෙට්= ස්තනන්ධයී" යනාදි වශයෙනි.

ණ් = මෙය ද ධාතු භෙදය හඟවනු පිණිස ය. 'ඉණ්' යන්නෙහි ණකාරය 'ඉඞ්-ඉක්' යන ධාතු දෙකින් ද, 'දුණ්' යන්නෙහි ණකාරය 'දුඤ්' යන ධාතුවෙන් ද වෙන් කොට හඳුන් වයි. සෙසු තැන්හි ද එසේ යි.

ප් = "දදෙඃ පෙ, දදෙරොඃ, දදෙඃ, දදෙරිඃ, සථාමී, දෙදන්ති" යනාදි සූත්‍රවලින් කී කාර්‍ය්‍ය නොවනු පිණිස යි. එහෙයින් "දප්, දෙප්" යනාදි පයන්ත ඉත් කොට ඇති ධාතූන් සම්බන්ධ ව යථොක්ත සූත්‍රවලින් විහිත කාර්‍ය්‍යයෝ නොවෙත්. "දධා ස්වදප්" යනු පිත් බැව්හි ප්‍රයෝජන දක්වෙන පාණිනීය සූත්‍රය යි.

ෂ් = "ෂිද්භිදමඞ්" යන සූත්‍රයෙන් ස්ත්‍රීලිඞ්ගයෙහි අඞ් ප්‍රත්‍යය කරණු පිණිස යි. "ජෘෂ්= ජරා, මෘජූෂ්= මෘජා, ඩුපචෂ්= පචා, ක්‍ෂමූෂ්= ක්‍ෂමා" යනාදිය උදහරණ යි.

ඉර් = "ඉරිතො වා" යන්නෙන් ලුඞ් පරස්මෛපදයෙහි සි ප්‍රත්‍යයස්ථානයෙහි විකල්පයෙන් ඞ ප්‍රත්‍යය වන බව හඟවනු පිණිස යි. එහෙයින් ඉරිත් ධාතූහු ලුඞ් පරස්මෛපදයෙහි දෙවිදියකින් වරනැගෙත්. "ච්‍යුතිර්= අච්‍යුතත්– අච්‍යොෂීත්, රුධිර්= අරුධත්– අරෞත්සීත්, ජෘෂ්ඉර් = අජරත් – අජාරීත්" යනාදි වශයෙනි.

ඤි = "ඤීතාං ක්තඃ වර්‍ත්තමානෙ'පි" යි වර්‍ත්තමානාර්ථයෙහි ක්ත ප්‍රත්‍යය කරණු සඳහා යි. "ඤිමිදා= මින්නඃ, ඤිෂ්විදා= ස්විත්නඃ, ඤිධෘෂා= ධෘෂ්ටඃ, ඤිත්වරා= තූර්‍ණීම්" යනාදි වශයෙන් උදහරණ දත යුතු යි.

ටු = "ට්විතො 'ථුඃ'" යන සූත්‍රයෙන් භාවයෙහි විහිත 'අථු' ප්‍රත්‍යය වනු පිණිස යි. "ටුවම්= වමථුඃ, ටුවෙපෘ= වෙපථුඃ, ටුඔශ්විඉර්= ශවයථුඃ, ටුනදි= නන්දථුඃ" යනාදි වශයෙනි.

ඩු = "ඩ්විතස්ත්‍රිමක් තත්කෘතෙ" යන්නෙන් තත්කෘතාර්ථයෙහි ත්‍රිමක් ප්‍රත්‍යය කරණු පිණිස යි. "ඩුකෘඤ්= කෘත්‍රිමම්, ඩුභෘඤ් = සම්භෘත්‍රිමම්, ඩුදාඤ්= දත්‍රිමම්, ඩුපචෂ්= පක්ත්‍රිමම්" යනාදිය උදහරණ යි.

සාරස්වත ව්‍යාකරණයට ඇතුළත් ධාතූන්ගේ ඉත්සංඥ අකුරු මෙපමණක් බව පෙණේ.

---

## උපශ්‍රාය්‍ය නිමි.

---

# සූත්‍ර සූචි.

(කලු අඞ්කවලින් 1, 2, 3 කාණ්ඩවල පිටු ද, සෙසු අඞ්කවලින් 4, 5 කාණ්ඩවල පිටු ද දත යුතු යි. මුල් කාණ්ඩවල පෘෂ්ඨාඞ්ක පශ්චිම මුද්‍රණානුසාරයෙනි.)


| සූත්‍ර | පිටු. |
|---|---|
| **අ.** | |
| අ ඉ උ ඍ ඏ සමානාඃ | **3** |
| අ ඉ එ | **38** |
| අඉකෞ ච මහතෞ | **503** |
| අඞි ලඝෞ හ්‍රස්ව උපධායාඃ | **643** |
| අචෙර්දීඝීශ්ච | **212** |
| අචාස්ථ්නාං ශසාදෞ | **164** |
| අටෞ | 269 |
| අත ඉකද්නාෂෙඃ | **470** |
| අත උපධායාඃ | **543** |
| අතඃ | **98** |
| අතඃ | **536** |
| අතිශයෙ හසාදෙසීඞ් දවිශච | 173 |
| අතො'න්‍යුඃ | **70** |
| අතො'ම් | **158** |
| අතො'මතතඃ | **408** |
| අත්‍රහචතානත්‍රහචවඡබෙදෞ පූජ්‍යාථෙ | 361 |
| අත්වසොඃ සෞ | **220** |
| අදසො'මූ | 308 |
| අදෘදෙර්ලුක් | 1 |
| අදෙ | **528** |
| අදෙ ජසුඃ | 330 |
| අද්නි | **88** |
| අද්‍රෑදෘදෙරව් | 3 |
| අන උස් | 50 |
| අන වෛෂසොඃ | **202** |
| *අනඩුහශ්ච | **174** |
| අනද්‍යතනෙ'තීතෙ දිජ් –පෙ–මහි | **537** |
| අනපි ච හසාත් | 175 |
| අනිටො'නාම්වතඃ | **571** |
| †අනෙන ගොරුම් | 137 |
| අන්‍යත්‍යස්වරාදිෂටිඃ | **17** |
| අන්‍යත්‍යාත් පූර්ව උපධා | **18** |
| අන්‍යස්‍ය දක් | **481** |
| අන්‍යාථෙ | **440** |
| අන්‍යොකෙන ප්‍රථමා | **385** |
| අන් ස්වරෙ | **421** |
| අපත්‍ය'ණ් | **467** |
| අපිත්තාදිර්ඞිත් | **526** |
| අපි රඤ්ජ්දංශෂඤ්ජ ෂ්වඤ්ජාම් | **623** |
| අප් කතීරි | **525** |
| අප්‍රයොරුතානිත්‍යම් | **305** |
| අබාදෘවී පිති ත්සම් | **44** |
| අභූතතද්භාවෙ කෘභ්වස්ති යොගෙ නාම්නශ්විඃ | 289 |
| අමාදෞ තත්පුරුෂඃ | **413** |
| අම්බාදීනාං ධෞ හ්‍රස්වඃ | **141** |
| අම්ශසොරස්‍ය | **86** |
| අයකි | 120 |
| අරෙදෙ නාමිනො ගුණඃ | **16** |
| අර් පඤ්චසු | **127** |
| අලංඛල්වොඃ ප්‍රතිෂෙධෙ ක්ත්වා | 445 |


* සන්තයෙහි නැත. "සාචනඩුහඃ" යන්නට මුලින් තිබිය යුතු යි. "පඤ්චසචනඩුහඃ" යි ද පාඨ යි.

† සූත්‍රපාඨයෙහි නො පෙනේ.

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **අ.** | |
| අලුක් කචිත් | 459 |
| අල්ලොපඃ ස්වරෙ'මිව යුක්තාවජ්ජසාදෙෂු | 165 |
| අවකුප්වන්තරෙ'පි | 96 |
| අවර්ජා නාමිනඃ | 10 |
| අවිභක්ති නාම | 82 |
| අව්‍යයීභාවාත් | 406 |
| අශෙරනායො වා | 170 |
| අෂ්ටනො ඩෙෂු වා | 199 |
| අසම්භවෙ පුංසඃ කක් සෙෂු | 227 |
| අසත්‍යත්‍රෞ මතුඃ | 497 |
| *අසෙනරිට් | 22 |
| අහ්නඃ සඃ | 253 |
| අහ්නො රො'රාත්‍රිෂු | 70 |
| **ආ.** | |
| ආඩො ඩෙ 'නාස්‍ය විහරණෙ | 212 |
| ආඩො යමහනඃ | 214 |
| ආචාර උපමානාත් | 209 |
| ආතඃ | 176 |
| ආතො ණබ් ඩෙෂු | 609 |
| ආතො'නොනා'දන්තඃ | 552 |
| ආතො ධාතොර්ලොපඃ | 107 |
| ආතො'නපි | 610 |
| ආතො මනිප්ක්වනිබ් වනිපඃ | 294 |
| ආතො යුක් | 226 |
| ආදනුදාත්තඩිතඃ | 519 |
| ආදබෙ ලොපශ් | 71 |
| ආදෘප ඊඃ | 531 |
| ආදිජබානාං ඣභාන්තස්‍ය ඣභාඃ ස්ධ්වොඃ | 174 |
| ආදිස්වරස්‍ය ඤ්ණිති ච වෘද්ධිඃ | 468 |
| ආදීදිතඃ | 326 |

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **ආ.** | |
| ආදෘතඃ කිර්ද්විශ්ච හුතෙ | 376 |
| ආදෙශච ඩත්ඩෙ | 461 |
| ආදෙඃ ෂණඃ සනඃ | 563 |
| ආද් භුවි කම්ණි | 220 |
| ආපඃ | 139 |
| ආප්තොතෙරීඃ | 169 |
| ආබතඃ ස්ත්‍රියාම් | 295 |
| ආහ්වො ණීදෙෂු | 541 |
| ආමන්ත්‍රණෙ ච | 329 |
| ආමන්ත්‍රණෙ සිර්ධිඃ | 93 |
| ආමෙෂු | 267 |
| ආම්ඩෙඃ | 124 |
| ආම්ශසි | 137 |
| ආම්ස්හෙෂු | 268 |
| ආයඃ | 595 |
| ආරෙ ඕෂු වෘද්ධිඃ | 17 |
| ආශිෂි යාත් - පෙ - සීමහි | 545 |
| ආශීඃප්‍රේරණයොඃ තුප්-පෙ-ආමහෙප් | 535 |
| ආ සජීදෙඃ | 306 |
| ආසෙරුත ඊඃ | 357 |
| ආසෙෂු | 149 |
| **ඉ.** | |
| ඉක්ශ්තිපෙෂු ධාතුනිර්දේශෙ | 439 |
| ඉඛබ් | 272 |
| ඉච්චාතඃ | 417 |
| ඉච්ඡායාමාත්මනඃ සඃ | 158 |
| ඉතො'ත් පඤ්චසු | 193 |
| ඉදමො'යං පුංසි | 201 |
| ඉදිතො නුම් | 562 |
| ඉදුභ්‍යාම් | 147 |
| †ඉතාං ශෙෂ සේෂ | 195 |
| ඉන්ද්‍රාදෙරුනීප් | 308 |
| ඉට ඊට් | 557 |


* අසම්භවෙ කක් සෙෂු- සූත්‍ර පාඨ.

† ඉතාම්- සූත්‍රපාඨ.

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **ඉ.** | |
| ඉණ් තත්‍යකතීරි | 223 |
| ඉයං ස්වරෙ | 25 |
| ඉයං ස්ත්‍රියාම් | 246 |
| ඉරිතො වා | 559 |
| ඉසෙස | 166 |
| ඉෂ්ණුස්තුක්තු | 363 |
| **ඊ.** | |
| ඊටො ග්‍රහාම් | 623 |
| ඊෂද්දුඃසුෂු ඛල්‍ය | 411 |
| ඊමෞ | 159 |
| ඊෂා හෞ | 56 |
| ඊශ්ශීඩොඊරකෙතාං මනීඩ් ගුණශ්ච | 433 |
| ඊ හසෙ | 123 |
| **උ.** | |
| උ ඔ | 41 |
| උත ඌඃ | 322 |
| උද්ශ්චරසත්‍යාගෙ | 215 |
| උදඃ ස්ථාස්තම්භොඃ | 410 |
| උදිතඃ ක්ත්වා වෙට් | 446 |
| උද්විභ්‍යාං තපඃ | 214 |
| උපධායා ලඝොඃ | 555 |
| උභයෙ ස්වරාඃ | 10 |
| උරසඃ සලොපශ්ච | 217 |
| උ රසෙ | 241 |
| උ වම් | 31 |
| උශනසාම් | 234 |
| උස්‍යාලොපඃ | 613 |
| ඌඃ | 656 |
| ඌදිතො වා | 570 |
| **ඍ.** | |
| ඍ අර් | 41 |
| ඍ උරණ් | 469 |
| ඍඩෙ | 115 |
| ඍතාං ද්වන්ද්වෙ | 462 |
| ඍතො ඩ උඃ | 116 |
| ඍතො රිඞ් | 186 |
| ඍතෞ සමානො වා | 57 |
| ඍදුපධාත් ක්‍යප් | 424 |
| ඍප්‍රොඃ | 52 |
| ඍ ර ඉමති | 496 |
| ඍ රම් | 32 |
| ඍහසාද් ඝ්‍යණ් | 420 |
| ඍෟත ඉර් | 623 |
| **ඏ.** | |
| ඏ අල් | 43 |
| ඏ ලම් | 32 |
| **එ.** | |
| එ අය් | 32 |
| එ ඓ ඔ ඖ සන්ධ්‍යක්ෂරාණි | 9 |
| එ ඓ ඓ | 44 |
| එ ඔ ජසි | 110 |
| එකාචො දිගුද්වන්ද්වෞ | 429 |
| එජාං ඛශ් | 278 |
| එ ටාඩෙයාඃ | 268 |
| එදෙතො'තඃ | 37 |
| එරි බහුචො | 237 |
| එස්භි බහුචෙ | 89 |
| ඓ ආය් | 35 |
| ඓච්ච මත්වාදෙඃ | 318 |
| ඓ සඛ්‍යුඃ | 114 |
| **ඔ.** | |
| ඔ අව් | 32 |
| ඔ ඖ ඖ | 45 |
| ඔදෞතොඞීඃ ස්වරවත් | 422 |
| ඔරෞ | 136 |

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **ඔ.** | |
| ඔරෞ | 12 |
| ඔරාවශ්‍යකෙ | 422 |
| ඔජිා ගෙඃ | 83 |
| ඔර්ව්මොඃ | 82 |
| ඔෂොාතොාජේෟ සමාසෙ | **45** |
| ඔසි | **90** |
| ඖ ආව් | **35** |
| ඖ නිපාතඃ | **48** |
| ඖයූ | **110** |
| * ඖඃ | **139** |
| **ක.** | |
| කර්මාදිෂු සර්වෙ කෘත්‍යෙ ණම් | 452 |
| කර්තරි පඤ්ච | **524** |
| කර්තුරීප්සි | 208 |
| කර්තෘකර්මයොරකෘත්‍යෙ කෘති ෂෂ්ඨී | **371** |
| කර්මධාරයස්තුල්‍යාර්ථෙ | **450** |
| කර්මව්‍යතිහාරෙ'න්‍යත්‍ර හිංසාදෙඃ | 217 |
| කාප්‍යතඃ | **297** |
| කාරකාත් ක්‍රියායුක්තෙ | **482** |
| කාලාධ්වනොර්ව්‍යාප්තෞ | **14** |
| කාලෙ'ණ් | 265 |
| කාසාදිප්‍රත්‍යයාදම් කෘඤ්භූපරඃ | **579** |
| කිතඃ | 324 |
| කිමිදමඃ කිශ්ඊශෞ | 307 |
| කුප්වොඃ ×ක×පෞ වා | **68** |
| කුහොශ්චුඃ | **562** |
| කෘත්‍යෙ යෙ | 104 |
| කෘතඃ | 245 |
| කෘත් කර්තරි ච | 242 |
| කෘපො රො ලඃ | **651** |
| කෙනෙයෙකාඃ | **483** |
| කොඃ කද්දිඃ | **454** |
| ක්ඞිත්‍යඞ්‍යූසි | **527** |
| කෘත කෘතවතූ | 316 |
| කතිඃ | 432 |
| කෘත්‍ය වා | 321 |
| ක්‍යපි ඤෙර්ගුණශ්ච | 448 |
| ක්‍රාදෙණීාදෙඃ | **542** |
| ක්‍රීඩො'නුසම්පරිභ්‍යශ්ච | **213** |
| ක්වචිද්ර් | **41** |
| ක්වචිද් ඨයොඃ | **478** |
| ක්වචිත්නාම්නො'බෙ ලොපශ් | **77** |
| ක්වසූකානෞ ණබෙවත් | 349 |
| ක්විප් | 299 |
| ක්විප්ක්වනිබ්ඞාඃ | 312 |
| ක්විලාත් ෂඃ සඃ කෘතස්‍ය | 92 |
| **ඛ** | |
| †ඛපෙ වා | **74** |
| ඛසෙ චපා ඣසානාම් | **62** |
| ඛිති පදස්‍ය | 272 |
| ඛ්‍යුට් කරණෙ | 283 |
| **ග.** | |
| ගමාං ජඃ | **599** |
| ගමාං සචරෙ | **600** |
| ගත්‍යර්ථාදකර්මකාච්ච කර්තරි කෘතඃ | 318 |
| ගුණඃ | **526** |
| ගුබිභ්‍යඃ | **625** |
| ගුරොහිසාත් | 437 |
| ගොඃ | **446** |
| ග්‍රහාං ඕති ච | **662** |

* “ඖරී” යි ද පාඨ යි. † “රෙඵ ප්‍රකෘතිකස්‍ය” යනු අධිකයි.

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **ඝ.** | |
| ඝඤ් භාවෙ | 398 |
| ඝසාදෙඃ ක්මරඃ | 371 |
| ඝසාදෙඃ ෂඃ | 631 |
| **ඞ.** | |
| ඞස්ස්‍ය | 90 |
| ඞස්‍ය | 112 |
| ඞසිභ්‍යසොඃ ශ්තුඃ | 270 |
| ඞසිරත් | 90 |
| ඞිතාං යට් | 140 |
| ඞිතාමට් | 150 |
| ඞිති | 111 |
| ඞිත්‍යදුඃ | 103 |
| ඞි ස්මින් | 98 |
| ඞෙරක් | 89 |
| ඞෙරෞ ඞිත් | 112 |
| ඞෞ | 128 |
| ඞණ්නො හ්‍රස්වාද් ද්විඃ ස්වරෙ | 61 |
| **ච.** | |
| චජොඃ කගෞ ඝිති | 372 |
| චතුරශ්චලොපඃ | 481 |
| චතුරම් ශෞ ච | 185 |
| චපා අබෙ ජබාඃ | 52 |
| චපාච්ඡඃ ශඃ | 53 |
| චරඵලොරුච්චාස්‍ය | 182 |
| චාදිභිශ්ච | 285 |
| චාදිර්නිපාතඃ | 286 |
| චාණේවී අවන්ද්වඃ | 422 |
| චුරාදෙඃ | 133 |
| චොඃ කුඃ | 211 |
| ච්වෞ දීර්ඝඃ | 290 |
| **ඡ.** | |
| ‿ඡන්දසි | 66 |
| ඡශෂරාජාදෙඃ ෂඃ | 206 |
| ඡඃ | 62 |
| ඡිදිභිදිවිදෙඃ කුරඃ | 372 |

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **ජ.** | |
| ජනිවධ්‍යානී වෘද්ධිඃ | 12 |
| ජශ්ශසොඃ ශිඃ | 159 |
| ජශ්ශසොර්ලුක් | 198 |
| ජසි | 95 |
| ජහ්‍යාධිශාධි | 10 |
| ජාතෙරයොපධාත් | 311 |
| ජ්වලාදෙනීඃ | 264 |
| **ඥ.** | |
| ඥජනොර්ජා | 77 |
| ඥශ්‍රුස්මෘදෘශාං සනන්තානාම් | 217 |
| ඥීතාං ක්තො වර්තමානෙ'පි | 326 |
| **ඣ.** | |
| ඣපානං ජබචපාඃ | 541 |
| ඣබෙ ජබාඃ | 27 |
| ඣසාත් | 572 |
| ඣසාද්ධිහෙඃ | 2 |
| **ඤ.** | |
| ඤමජපාං තුක් | 179 |
| ඤමෙ ඤමා වා | 53 |
| ඤිත්ස්වරිතෙත උභෙ | 519 |
| ඤිර්ඞිත් කාරණෙ | 204 |
| ඤෙරඞ් දව්ශච | 642 |
| ඤෙඃ | 642 |
| **ට.** | |
| ටාඞතාඃ | 447 |
| ටාදෞවුක්තපුංස්කං පුංවද්වා | 168 |
| ටා නාස්ත්‍රියාම් | 111 |
| ටෙන | 87 |
| ටොරනන්‍යාත් | 59 |
| ටෞසොරෙ | 140 |
| ට්විතො'ථුඃ | 405 |
| **ඩ.** | |
| ඩතෙශ්ච | 119 |
| ඩිති ටෙඃ | 112 |
| ඩිණඃ | 223 |
| ඩිවිතස්ත්‍රිමක් තත්කෘතෙ | 406 |

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **ඩ** | |
| ඩි ඝො ලොපො දීඝශ්ච | **607** |
| **ණ.** | |
| ණබාදෙභ්‍ය පූජිස්‍ය | **629** |
| ණාදිඃ කිත් | **540** |
| ණිතො වා | **479** |
| ණිත් පෙ | **573** |
| ණිනිරතීතෙ | 310 |
| ණ්‍යායනණෙයණිණිකා ගගී නඩාත්‍රිසත්‍රීපිතෘෂ්වස්‍රාදෙඃ | **472** |
| **ත.** | |
| තතකාලෙ'පි | 450 |
| තථොර්ධඃ | **571** |
| තනාදෙරුප් | 100 |
| තනොතෙජා | 228 |
| තරතමෙයස්විෂ්ඨාඃ ප්‍රකර්ෂෙ | **516** |
| තව මම ඩසා | **270** |
| තව්‍යානීයෞ | 414 |
| තසෙට් | 46 |
| තස්මාත් සි – පෙ – සුප් | **83** |
| තිරශ්චාදයඃ | **214** |
| තුදදෙරඃ | 107 |
| තුභ්‍යං මහ්‍යං ඩයා | **269** |
| තුං තදර්ථායාං භවිෂ්‍යති | 397 |
| තෘචුණෞ | 243 |
| තොර්ලි ලඃ | **58** |
| ත්‍යතනෞ | **485** |
| ත්‍යදාදෙෂ්ටෙරඃ ස්‍යාදෞ | **118** |
| ත්‍යාදෞ භවිෂ්‍යති ස්‍යප් | **548** |
| ත්‍රාණාද්‍යා නිපාත්‍යන්තෙ වා | 336 |
| ත්‍රිචතුරොඃ ස්ත්‍රියාං තිසෘ චතසෘවත් | **242** |
| ත්‍රෙරයඞ් | **119** |
| ත්වමමදෙකතෙ | **267** |
| **ත.** | |
| ත්වමහං සිනා | **266** |
| ත්වාමාමා | 280 |
| **ථ.** | |
| ථො තුට් | **194** |
| **ද.** | |
| දරිද්‍රාතෙරිදලොපශ්ච ඣකි | 30 |
| * දස්‍ය මඃ | **201–236** |
| දස්තස්‍ය තො දශ්ච | 327 |
| දඃ සඃ | 20 |
| දාදෙසීඃ | **176** |
| දාදෙරිඃ | 187 |
| දාදෙරෙඃ | **611** |
| දාදෙඃ | 60 |
| දාදෙඃ පෙ | **551** |
| දික්සංඛ්‍ය සංඥායාම් | **463** |
| දිප | 32 |
| දිබාදවට් | **538** |
| දිව ඖ | **241** |
| දිවාදෙසීඃ | 66 |
| දිශාම් | **249** |
| දිස්‍යොහීසාත් | 8 |
| දූරාදාහවානෙ ච ටෙඃ ප්ලුතඃ | **51** |
| දෘශාදෙඃ පශ්‍යාදිඃ | **614** |
| දෘශාදෙඃ ශඃ | 264 |
| දෘශෙෂ්ටක්සකෞ වොපමානෙ කාසෙ | 305 |
| දෙවතෙදමජ්ඣෙ | **477** |
| දෙ දන්ති | 339 |
| දෙෂ්ණාං රඃ | **224** |
| † ද්‍රුහාදෙජා | **179** |
| ද්විශ්ච | **540** |
| ද්‍යොසෙතෞ | 55 |
| ද්‍යොඃ | 50 |
| ද්‍යොඃ ස්වරෙ'පි පිති තොපධායාඃ | 64 |


* එක ම සූත්‍රයෙකි.

† ද්‍රුහාං වා– සූත්‍ර පාඨ.

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **ධ.** | |
| ධාතොර්නාමිනඃ | 581 |
| ධාතොඃ | 518 |
| ධාතොඃ ප්‍රේරණෙ | 141 |
| ධාවම් | 176 |
| * ධිරීඃ | 139 |
| ධෙරර් | 128 |
| ධෞ | 553 |
| ධෞ හ්‍රස්වඃ | 111 |
| ධෙව ච සෙර්ලොපඃ | 150 |
| **න.** | |
| නඞ්කි | 406 |
| නඤ්දි | 418 |
| නදෘදෙඃ | 306 |
| නපුංසකස්‍ය | 163 |
| නපුංසකාත් ස්‍යමොර්ලුක් | 164 |
| නමසො'ස්‍ය | 21 |
| නමඃ | 96 |
| න රිතඃ | 153 |
| නව පම් | 521 |
| න ශාත් | 57 |
| නශ්වාපදෘනෙන ඞසෙ | 63 |
| න ෂි | 59 |
| න සන්ධ්‍යශ්චෞර්යුවි ච | 513 |
| නහො ධඃ | 240 |
| නඃ සක් ජනෙ | 59 |
| නා | 420 |
| නා ක්‍රයාදෙඃ | 123 |
| නාතඃ | 123 |
| නාදෞ | 281 |
| නානපෙක්‍ෂාජීඃ | 647 |
| නානිටි සෙ | 626 |
| නාමි | 91 |
| නාමිනඃ ස්වරෙ | 164 |
| නාමිනො රඃ | 73 |
| නාමිනො'චතුර්ණාං ධො ඪඃ | 544 |
| **න.** | |
| නාමී | 46 |
| නාම්නශ්ච කෘතා සමාසඃ | 452 |
| නාම්නි ච | 266 |
| නාම්නි ච යුෂ්මදි වාස්මදි ච භාගෙඃ | 523 |
| නාම්නො නො ලොපශධෞ | 187 |
| නාම්නො ය ඊ වාස්‍ය | 200 |
| නාම්න්‍යුපධාත් කඃ | 250 |
| නිජාං ගුණඃ | 63 |
| නිවිශාදෙඃ | 211 |
| නුගශාම් | 578 |
| නුඩාමඃ | 91 |
| නුධාතොඃ | 587 |
| නුමයමඃ | 160 |
| නූපඃ | 82 |
| නෞකස්වරාදනුදෘත්නාත් | 588 |
| නොපධායාඃ | 160 |
| නො ලොපඃ | 561 |
| නො වා | 448 |
| න්‍රුණ ඊප් | 300 |
| න්සම්මහතො'ධෞ දීර්ඝඃ ශෞ ච | 218 |
| **ප.** | |
| පචිනන්දිග්‍රහාදෙරයුණිනි | 253 |
| පචො වඃ | 346 |
| පතන්‍යාදයඃ | 319 |
| පථාං ටෙඃ | 149 |
| පදං නික් | 185 |
| පරතො'න්‍යත් | 520 |
| පරාණ්‍යාත් | 521 |
| පරොක්ෂෙ ණප්– පෙ– මහෙ | 539 |
| පුංවද්වා | 440 |
| පුංසො'සුඩි | 226 |
| පුශකාත් | 418 |


* "ඩිරීඃ" සි ද පාඨ සි.

| සූත්‍ර. | පිටු. |
| --- | --- |
| **ප.** | |
| පූර්වකාලෙ ක්ත්වා | 441 |
| පූර්වස්‍ය ක්ඞිති ඛසෙ ධඃ | 62 |
| පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ | 558 |
| පූර්වෝ'ව්‍යයෙ'ව්‍යයීභාවඃ | 404 |
| පෘජ්වාදෙරඃ | 205 |
| පොරුර් | 53 |
| පෞනඃපුන්‍යෙ ණම් පදං ද්විශ්ච | 451 |
| ප්‍යායඃ පී | 334 |
| ප්‍රත්‍යයාන්තාත් | 438 |
| ප්‍රාදිරුපසර්ගඃ | 292 |
| ප්‍රාදෙශ්ච තථා තෞ සුනමාම් | 568 |
| ප්ලුතඃ | 50 |
| ප්වාදෙර්හ්‍රස්වඃ | 127 |
| **බ.** | |
| බහුව්‍රීහිරන්‍යාර්ථෙ | 431 |
| බහොරිලොපො භූ ච බහොඃ | 487 |
| බ්භ්‍යඃ | 88 |
| බ්‍රුව ආහශ්ච පඤ්චානාම් | 45 |
| **භ.** | |
| භජාං විණ් | 287 |
| භාවෙ තව්‍යණඃ | 490 |
| භාසාදෙර්ඩුරඃ | 372 |
| භිදපාම් | 247 |
| භිස් භිස් | 203 |
| භුවො වුක් | 542 |
| භූතෙ සිඃ | 550 |
| භඃඣං ලුකි | 58 |
| භොසඃ | 73 |
| භොසඃ | 330 |
| භ්‍යස් ශ්භ්‍යම් | 269 |
| භ්වාදිඃ | 518 |

| සූත්‍ර. | පිටු. |
| --- | --- |
| **ම.** | |
| මදෘම් | 403 |
| මාඞ් | 236 |
| මාන්තොපධාද්වත්විතෞ | 503 |
| මාසස්‍යාල්ලොපො වා | 105 |
| මිතාං හ්‍රස්වඃ | 137 |
| මූගාන්තෝ'තඃ | 356 |
| මුවාදෙර්මූම් | 111 |
| මෙටඃ | 554 |
| මොනුස්වාරඃ | 63 |
| **ය.** | |
| යක් චතුර්ෂු | 219 |
| යඞ උෟකඃ | 373 |
| යඞී | 174 |
| යජාං යවරාණාං ය්වෘතඃ සම්ප්‍රසාරණං කිති | 630 |
| යතඃ | 566 |
| යටො'ච්ච | 143 |
| යලොපශ්ච | 484 |
| යස්‍ය ලොපඃ | 301 |
| යඃ සෙ | 640 |
| යා | 533 |
| යාදෘදෞ | 616 |
| යාමියම් | 534 |
| යුට් ච | 409 |
| යුවාවෞ ද්විවචනෙ | 266 |
| යුවොරනාකෞ | 248 |
| යුෂ්මදස්මදොඃ -පෙ- වස්නසෞ | 277 |
| යුස ඉට් | 533 |
| යූනස්තිඃ | 323 |
| යූයං වයං ජසා | 267 |
| යෙ | 594 |
| යෙය්‍යාඃ | 68 |
| යෙව ද්විතෙව | 47 |
| යොඩීතොරියුවෞ සවරෙ | 120 |
| යොර්ලොපශ් වා පදන්තෙ | 35 |
| යොර්වි හසෙ | 244 |
| යොවෞ වා | 122 |

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **ර.** | |
| රඃ | **74** |
| රඃ | **581** |
| රඃ | 321 |
| රඃ සඞ්ඛ්‍යායාඃ | **185** |
| රුජාදෙඃ කත් | 388 |
| රාතො ඤෙඃ පුක් | 138 |
| රුන්ධුපො දවිඃ | **29** |
| රාරො ඛසෙ දෘශාම් | **604** |
| රිලොපො දීඝශ්ච | **75** |
| රිගෘදුපධස්‍ය | 183 |
| රුදෘදෙශ්වතුණ්ණං භවසාදෙඃ | 25 |
| රුධාදෙනීම් | 92 |
| ෛරස්හි | **136** |
| **ල.** | |
| ලඝොර්දීඝීඃ | **643** |
| ලිඞ්ගාථෙ ප්‍රථමා | **325** |
| ලිත්පුෂාදෙර්ඞඃ | **601** |
| ලුකි සති පිතඃ ත්සෙමා වෙට් | 192 |
| ලුක් බහුතෙච ඛචිත් | **472** |
| ලොකාවෙඤ්ඡස්‍ය සිද්ධිස්ථා මාතරුදෙඃ | 457 |
| ලොපඃ | 78 |
| ලොපස්තිතුදෘතත තනාම් | 9 |
| ලොපඃ පචාං කිතේ‍ය චාස්‍ය | 575 |
| ලොහිතාදෙර්ඞිමන් | **495** |
| ල්ඩාද්‍යෙදිතශ්ච | 332 |
| **ව.** | |
| වත්තුලෝ‍ය | **489** |
| වර්තමානෙ තිප්– පෙ– මහෙ | **522** |
| වසාං රසෙ | **175** |
| වසොර් උඃ | **230** |
| වා ටාඞේ‍යාඃ | **408** |
| වාදීපොඃ ශතුඃ | **306** |
| වාත්‍යත්‍ර | 191 |
| වාම්‍යා | **241** |
| වාම් ශසි | **153** |
| වාවසානෙ | **162** |
| වාසු | **199** |
| වාභො වෞ ශසාදෞ ස්වරෙ | **181** |
| විදෙජා වසුඃ | 360 |
| විදෙෘ තවාතාං තිබාදීනාං ණබාදිනීවකො වා | 19 |
| විධිසම්භාවනයොසීාත් –පෙ– ඊමහි | **532** |
| විපරාභ්‍යාං ජෙඃ | 211 |
| විනාසහනමසෘතෙ නිර්ධාරණස්වාම්‍යාදිභිශ්ච | **361** |
| විභක්ත්‍යන්තං පදම් | **81** |
| විසර්ජනීයස්‍ය සඃ | **67** |
| වුඃ සෙ | 159 |
| වෙඩේ‍යාඃ | **166** |
| වෙතෙතරතො රුච් | 38 |
| ශ්වයුවඃ | **154** |
| වෙඃ | 287 |
| වො'ව්‍යස්වරෙ | **468** |
| වෞශ්‍රීණාත් | **321** |
| විමොරු | **528** |
| ව්‍යවපරිභ්‍යඃ ක්‍රීඤඃ | 216 |
| ව්‍රිතො නුම් | **218** |
| **ශ.** | |
| ශතෘශානෞ තිපෙතවත් ක්‍රියායාම් | 355 |
| ශදෙඃ ශත් | 146 |
| ශප උපාලමෙහ | 216 |
| * ශමාං දීඝඃ | **627-74** |
| † ශෂසෙ වා | **67** |
| ශසාත් බපාඃ | **560** |
| ශසි | **86** |
| ශාසෙඃ | 31 |


* එක ම සූත්‍රයෙකි. † ශසෙ වා– සූත්‍රපාඨ.

සූත්‍ර. — පිටු.

ශ.

ශිති චතුජීත් 262
ශීඩඃ සජීත්‍ර 37
ශීලෙ තෘන් 362
ශුචඃ ශු ද්‍රෙ 267
ශෙ චග්වා 60
ශෙෂාඃ කාශෙ –පෙ–
ආධාරභාවයොඃ 331
ශ්ච්‍යතාශාදෙඃ 162
ශ්‍රුවඃ ශෘ 90
ශචසතනෙ තා –පෙ–
තාසමහෙ 547
ශවාදෙඃ 190

ෂ.

ෂඨොඃ කඃ සෙ 605
ෂාසොකාණඃ 366
ෂිද්භිදෘමඞ් 435
ෂො ඩඃ 206
ෂ්‍ටුභිඃ ෂ්‍ටුඃ 57
ෂ්ට්‍රිතඃ 304
ෂණඃ 199
ෂ්‍රැනෞ ණො'තනෙත 96

ස.

සඛිපත්‍යොරික් 115
සඞ්ඛ්‍යාපූර්වො ද්විගුඃ 429
සද්‍රෙණාදයඃ 378
සද්‍ය ආදිඃ කාලෙ 291
ස ධාතුඃ 595
ස නපුංසකම් 405
සන්ධ්‍යක්ෂරාණාමා 609
සපරොක්ෂයොජේර්ගිඃ 603
සමවප්‍රොපවිභ්‍යඃ සථඃ 213
සමසනෘතීයායුක්තාවච 215

සූත්‍ර. — පිටු.

ස.

සමානාද්‍යෙධලෝපො
ධාතොඃ 93
සමාසශචාඤයෙ නාම්නාම් 399
සමාසප්‍රත්‍යයයොඃ 405
සමාසෙ ක්‍යප් 447
සමාහාරෙ'ත ඊප් ද්විගුඃ 429
සමොගමාදිභ්‍යඃ 211
සවර්ණේ දීර්ඝඃ සහ 37
සජීදෙඃ සමච් 97
සසෙතා'නපි 632
සස්වරාදිර් ද්විරද්විඃ 540
සහාදෙඃ සාදිඃ 453
සහිවහොරොදවර්ණස්‍ය 654
සහෙඃ ෂඃ සාඞ් 184
සංකාරොතෙර්භූෂණෙ සුට් 105
සංඥායාමකතීරි ච 400
සංයොගාන්තස්‍ය ලොපඃ 175
සාධනාධාරයොශ්ච 410
සාම්කාම් 270
සාවතාඩ්භඃ 174
සිපි වා 32
සිසතාසිස්‍යපාමිට් 546
සි සඃ 21
සිස්‍යොඃ 652
සුඩාමඃ 98
සෙ දීර්ඝඃ 160
සෙරු 127
සෙරෞ 236
සෙර්ඩාදෙඃ 113
සෙඃ 526
සෛෂාද්ධසෙ 75
සො නඃ පුංසඃ 86
සෞකාශේ කෙලිමඃ 394
සෞ සඃ 236
සෞකාරාද්ද්‍යෙශ්ච 228

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **ස.** | |
| සනඃ | 209 |
| සතුරර් | 129 |
| සෙනාඃ ශ්චුභිඃ ශ්චුඃ | 55 |
| ස්ත්‍රීභ්‍රුවොඃ | 153 |
| ස්ත්‍රියාං යජාං භාවෙ | 429 |
| ස්ත්‍රියාං යොඃ | 148 |
| ස්ථාමි | 295 |
| ස්ඵායඃ ස්ඵීඃ | 347 |
| ස්හ්‍යඃ | 202 |
| ස්‍යප් ක්‍රියාතික්‍රමෙ | 549 |
| ස්‍යාවිදඃ | 557 |
| ස්‍රොර්විසර්ගඃ | 84 |
| ස්වරුතොනා වා | 340 |
| ස්වරුදඃ | 402 |
| ස්වරුදෙඃ | 579 |
| ස්වරුදෙඃ පරඃ | 47 |
| ස්වරුද්‍යඃ | 415 |
| ස්වරෙ යත්වං වා | 72 |
| ස්වාඞ්ගාදී වා | 314 |
| ස්වාදෙර්නුඃ | 82 |
| ස්වාපෙ'පි | 487 |

| සූත්‍ර. | පිටු. |
|---|---|
| **හ.** | |
| හල්පෙෂනඃපුත්‍යයොඃ -පෙ- නිපාත්‍යතෙ | 236 |
| හනඃතඃ ස්‍යපඃ | 601 |
| හතො ඝත් | 145 |
| හතො ඝෙන | 196 |
| හබෙ | 71 |
| හයවරල-පෙ-ආද්‍යන්තා භ්‍යාම් | 11 |
| හශෂාන්තාත් සක් | 606 |
| හසාද්‍යන හෞ | 128 |
| හසා ව්‍යඤ්ජනානි | 13 |
| හසෙපඃ සෙලෝපඃ | 105 |
| හසෙ'හීහසඃ | 26 |
| හො ඛහාඃ | 54 |
| හො ඪඃ | 179 |
| හ්‍රස්වදීර්ඝප්ලුතභෙදඃ සවර්ණාඃ | 6 |
| හ්‍රස්වස්‍ය පිති කෘති තුක් | 297 |
| හ්‍රස්වඃ | 541 |
| හ්‍රස්වාචච | 425 |
| * හ්‍රස්වාඞ්ඩසෙ | 648 |
| හ්‍රස්වො වා | 298 |
| හ්වාදෙර්ද්විශ්ච | 49 |


* "ලොපෙ හ්‍රස්වාඞ්ඩසෙ" යි ද පාඨ යි,

# ධාතු සූචි.

(මෙහි කළු අඞකවලින් තුන් වන කාණ්ඩයේ පිටු ද, සෙසු අඞකවලින් 4-5 කාණ්ඩවල පිටු ද දැක්වේ. ධාතූන් අකාරාදී පිළිවෙළින් සොදන ලද බැවින් ඇතැම් ධාතූන්ගේ මුලින් යෙදෙන ඉත් අකුරු අත් හළ බව ද සැලකිය යුතු යි.)


| ධාතු. | පිටු. |
|---|---|
| **අ.** | |
| අගි | 384, 386. |
| අඞ්ක | 141. |
| අඞ්ග | 141. |
| අජ | **586**, 282, 430, 440. |
| අඤ්චු | **583**, **659**, 400. |
| අඤ්ජූ | 98, 164. |
| අට | 178, 318, 431, 438. |
| අත | 381, 440. |
| අද | 1, 164, 330, 352, 371, 446. |
| අන | 27, 255, 297, |
| අන්ධ | 141. |
| අය | **664**. |
| අර්ච | 138, 329, 390, 421. |
| අර්ථ | 140' 440. |
| අර්දි | **577**, 258. |
| අව | 380, 381, 393. |
| අශ | 132, 170, 178, 438. |
| අශූඩ | 91, 164, 379, 389. |
| අස් | 21, 290. |
| අසු | 76, 385. |
| **ආ.** | |
| ආජ | **584**. |
| ආපෘ | 169, 273, 438, 448. |
| ආස් | 36 259, 319, 357' 414, 431, 440. |
| **ඉ.** | |
| ඉක් | 18. |
| ඉඩ | 38, 151, 166, 323, 398 401, 428. |
| ඉණ | 17, 298, 323, 354, 374, 399, 426, 430. |
| **ඉ.** | |
| ඉදි | **578**, 386. |
| ඉඞ්ගි | 98. |
| ඉෂ් | 70. |
| ඉෂු | **601**, 119, 246, 329, 375, 431, 436, 440, 444, 446. |
| **ඊ.** | |
| ඊක්ෂ | **636**, 437. |
| ඊඩ | 35. |
| ඊශ් | 36, 375, 433. |
| ඊහ | **645**, 437. |
| **උ.** | |
| උබ | **583**. |
| උජ්ඣ | 427. |
| උඤ්ඡි | 337. |
| උෂ් | **607**. |
| **ඌ.** | |
| ඌන | 140. |
| ඌර්ණුඤ් | 47, 178. |
| ඌහ | **437**. |
| **ඍ.** | |
| ඍ | **615**, 57, 146, 164, 179, 212, 230, 352, 382, 393. |
| ඍච්ඡ | 212. |
| ඍජ | **637**. |
| ඍත | **664**. |
| **එ.** | |
| එජ | 279 |
| එධ | **635**, 246, 414, 437. |

| ධාතු. | පිටු. |
|---|---|
| **ඔ.** | |
| ඔණෘ | 298. |
| **ක.** | |
| කටෙ | **594** |
| කණ | 181. |
| කණ්ඨ | 393. |
| කණ්ඩූඤ් | 438. |
| කඨ | 139. |
| කපි | 371. |
| කමු | **641**, 369, 371. |
| කාශෘ | **645**. |
| කෂ් | 274. |
| කස | 186, 375. |
| කාසෘ | **645**. |
| කිත | **625**. |
| කු | 189, 441. |
| කුච | 434. |
| කුට | 114. |
| කුට්ට | 367. |
| කුපි | **562**. |
| කුෂ් | 131, 444. |
| කෘඤ් | 103, 143, 160, 187, 195, 225, 244, 257, 261, 270, 271, 273, 274, 275, 283, 290, 297, 300, 303, 312, 313, 314, 317, 338, 350, 357, 361, 363, 364, 368, 376, 378, 391, 401, 406, 409, 412, 414, 416, 420, 425, 427, 430, 432, 435, 438, 439, 447, 453. |
| කෘතී | 113, 424. |
| කෘපූ | **651**, 150, 184, 424. |
| කෘවි | 90. |
| කෘෂ් | **604**, 110, 258, 440, |
| කෲ | 115, 16?, 252, 311, 402, 435, 440. |
| කෲඤ් | 127, 331. |
| කෲත | 138. |
| කෛ | **611**. |
| ක්නසු | 154. |
| ක්නූයී | 152. |
| ක්‍රදි | 258. |
| ක්‍රන්ද | 258. |
| ක්‍රප | 436. |
| ක්‍රම | 256. |
| ක්‍රමු | **598**. |
| ක්‍රීඤ් | 122, 151, 216. |
| ක්‍රීඩ | 213. |
| ක්‍රුශ | 380. |
| ක්ලිශ් | 444. |
| ක්වථ | 265. |
| ක්ෂණු | 101. |
| ක්ෂප | 436. |
| ක්ෂමූෂ් | 255. |
| ක්ෂි | **594**, 335, 365, 383, 417. |
| ක්ෂිණු | 101. |
| ක්ෂිප | 109, 250, 366, 436. |
| ක්ෂු | 16, 383, 405. |
| ක්ෂුධ | 345. |
| ක්ෂෝපෘ | 405. |
| ක්ෂෝභ | 347. |
| ක්ෂ්ණු | 16. |
| ක්ෂ්මායී | 152. |
| ක්ෂ්විද | 328. |
| **ඛ.** | |
| ඛද | **572**. |
| ඛන | **655**, 250, 315, 346, 427. |
| ඛිද් | 120. |
| ඛාද | 7, 342. |

ධාතු. පිටු.

ග.

ගණ 139, 448.
ගද **574**, 419.
ගමු **600**, 166, 180, 196, 211, 267, 268, 276, 305, 312, 315, 316, 318, 323, 353, 356, 369, 374, 377, 380 385. 387, 404, 432, 448, 449,
ගජ 421.
ගාඩ **646**.
ගුධ 437, 444.
ගුප **640**.
ගුපූ **595**, 246, 425.
ගුමු 445.
ගුහ 444.
ගුහු **657**, 425, 436, 444.
ගෘධ 336.
ගෘහ 370.
ගෘෘ 116, 163, 252, 331, 402, 440.
ගෙ **611**, 187, 296, 299 315, 347, 356, 410, 418.
ග්‍රන්ථ 440, 445.
ග්‍රස් 364.
ග්‍රහ 128, 163, 183, 228, 253, 259, 271. 273, 368, 415, 426, 434, 444, 453.
ග්ලෛ 609, 156, 335, 365, 387, 434.

ඝ.

ඝට **644**, 154, 194, 249, 440.
ඝසු 353, 371
ඝෘ 382, 391.
ඝෘෂ 225.
ඝ්‍රා **619**, 188, 263 336.

ධාතු. පිටු.

ච.

චකාසෘ 33, 360.
චක්ෂිඩ 33, 393.
චතෙ 419.
චදි 386.
චර 182, 215, 254, 255, 261, 263, 269, 364, 401, 419, 420, 431, 448.
චල 182, 254.
චායෘ 189.
චිඤ් 85, 137, 160, 226, 300, 313, 402, 415, 416.
චිතී **555**, 135.
චුර 133, 348.
චෘත 424.
චෘතී 114.
ච්‍යුතිර් **557**.

ඡ.

ඡද 390, 391.
ඡිදිර් 250, 372 436.
ඡුප 119.
ඡෘදිර් 94, 390.
ඡෝ 69, 147, 260.

ජ.

ජක්ෂ 28, 359, 383.
ජත 316.
ජනී 77, 154, 249, 266, 298, 314, 320, 364, 377, 393, 419.
ජප 181, 271, 373, 418.
ජභ 181.
ජල්ප 258, 271, 366.
ජසු 371.
ජාගෘ 28, 351, 360, 374, 431, 434.
ජි **603**, 151, 160, 211, 278, 359, 365, 374, 379, 402, 415, 417.

ධාතු. පිටු.

ජ.

ජු 144, 301.
ජුෂ් 427.
ජෘම්භ් 67, 154, 320, 331, 417, 436.
ජ්‍යා 130, 333, 434.
ජ්වල 156. 258, 264.

ඥ.

ඥප 137, 173.
ඥා 130, 155, 172, 217, 329, 409, 418.

ඩ.

ඩිඩ **648,** 333.
ඩෞකෘ 153, 190.

ණ.

ණද **577**, 255.
ණම **599**, 232, 371, 377, 430, 447, 448, 449.
ණශ් **570**, 75, 257, 374
ණහ 80, 302.
ණිසෂ **582.**
ණිජිර් 62.
ණිදි **582.**
ණිඤ්ද් 235, 261, 363, 383, 385, 402, 415.
ණු 16, 246, 325, 389, 402.

ත.

තක් 419.
තඤ්චු 389.
තනු 99, 170, 181, 229, 303, 380, 391,
තන්ත්‍රි 393.
තප් **597,** 214, 258, 264, 277, 278, 282, 392, 393.

ධාතු. පිටු.

ත.

තායඩ 79.
තිජ් **639**, 392.
තු 14, 260.
තුද 107, 251, 281, 358.
තෘදිර් 94.
තෘප් **570**, 71, 258.
තෲ **622,** 159, 277, 368, 393, 448.
තෞකෘ 190.
ත්‍යජ් 399, 421.
ත්‍රපූෂ් **639,** 364.
ත්‍රසී 366.
ත්‍රුට් 114.
ත්‍රෛඩ **648,** 335.
ත්වර **653,** 434.
ත්විෂ් **660,**

ද.

දද **585, 637.**
දමි 74, 155, 258, 259, 278, 318, 403, 432.
දම්භ 171.
දය **644,** 182.
දරිද්‍රා 29, 153, 170, 249, 353, 360.
දහ් **608,** 181.
දංශ **624,** 181, 186 373, 389,
දෘශ් 60, 146, 198, 213, 226, 249, 263, 295, 296, 339, 353, 359, 376, 399, 401, 408, 416, 418, 450.
දෘණ් **620,** 167, 187, 296, 339.
දෘත **658,**
දෘප් 72, 199, 385.
දෘසෘ 260.
දිවු 66, 255, 359, 389, 404, 409.

ධාතු. පිටු.

දු.

දිශ 109, 300.
දිහ් 42.
දීඞ 334.
දීපි 78, 371, 438.
දු 15.
දුෂ 154, 257, 410.
දුහ 41, 232, 251.
දූඞ 333.
දෘඞ 121, 163, 426.
දෘප් **571,** 72, 258.
දෘශිර් **614,** 212, 217, 228, 255, 263, 281, 298, 300, 306, 314, 354, 398, 428.
දෲ 277.
දෙඞ **647,** 339.
දෛඞ **648**
දෛප් **612,** 199, 249.
දො 69, 187, 296, 340, 347, 391, 449,
ද්‍යු 389,
ද්‍යුතඞ **649.** 305, 322, 444.
ද්‍රා 6, 335.
ද්‍රු 145, 266.
ද්‍රුහ් 571,
ද්විෂ 40, 251.

ධ.

ධන 393.
ධබ 389.
ධාඤ් 61, 146, 167. 187, 198, 226, 263, 296, 342, 359, 380, 408, 418, 437.
ධිවි 89.
ධීඞ 333.
ධුඤ් **570,** 87, 128, 149, 384, 435.

ධාතු. පිටු

ධ.

ධූප් **597.**
ධෘ 382.
ධෘඞ 121, 164.
ධෘඤ් 252, 269, 278, 363, 420, 434, 435, 448,
ධෘෂා 328, 366.
ධෙට් **613,** 198, 263, 279, 296, 299, 347, 437.
ධ්මා **619,** 188, 263, 280,
ධ්‍යෛ 304, 342, 428.
ධ්වන 254.
ධ්වංසු 185,

න

නදි 256, 405.
නුද 323, 335, 387.
නෘ 402.
නෘතී 67, 183, 250.

ප

පචෂ් **659,** 143, 161, 177, 193 228, 243, 248, 253, 282, 346 354, 355, 356, 358, 364, 365, 394, 399, 406, 411, 420, 423, 436, 439.
පචි 389, 432,
පඨ 177, 248, 356, 398, 434,
පණ **641,** 403.
පත 370.
පත්‍ෲ **627,** 167, 186, 254, 265, 312, 364, 369, 419, 430, 434
පථ 265,
පයි 264,
පද් 79, 167, 185, 361, 369 382, 435,
පශ් 181,

| ධාතු. | පිටු. |
|---|---|
| **ප.** | |
| පා | **618,** 7, 147, 148, 161, 187, 263, 266 296, 299, 300, 347, 352, 356, 357' 368, 376, 378, 385, 392, 399, 401, 410, 412, 418, 449, 452. |
| පිශ | 120, |
| පිසෘ | 375 |
| පිඩ | 357, 359, 392, |
| පීඩ | 135, 436. |
| පුථි | **562** |
| පුෂ් | 70, 129. |
| පුෂප | 386, |
| පූඩ | 324, |
| පූජ | 328, 330, 421. |
| පූඤ් | 27, 248, 259. |
| පූරී | 78. |
| පෘ | 54, 331. |
| පෘඩ | 121. |
| පෘථ | 136. |
| පෘෘ | 52, 162, 331, 342, 393, 435. |
| ප්‍යායිඩ | 80, 334. |
| ප්‍රචඡ | 117, 163, 184, 212, 288, 300, 407. |
| ප්‍රථ | **136,** |
| ප්‍රිඤ් | 124, 148, 252. |
| ප්‍රැඩ | 301. |
| ප්ලුඩ | 255. |
| ප්සා | 4, |
| **ඵ.** | |
| ඵණ | **629.** |
| ඵල | **602,** 182 386, |
| **බ.** | |
| බධ | **640.** |
| බන්ධ | 131. |
| බාධ | 421, 436. |
| බුධ | 79, 328, 432. |
| බෘහි | 381. |
| බ්‍රැඤ් | 44, 252. |
| බිලී | 151. |
| **භ.** | |
| භජ | **658,** 181, 287, 399. |
| භඤ්ජා | 97, 229, 351, 373. |
| භා | 7, 352, 361, 383. |
| භාෂ | 409. |
| භාසෘ | 260, 372, 375. |
| භික්ෂ | 367, 368, 369, |
| භිදිර් | 232, 251, 351, 372, 394, 427, 436. |
| භී | 51, 156, 257, 375, 384, 415. |
| භුජ | 170, 194, 219, 310, 398, 421 442, 446, 452. |
| භුජෝ | 333. |
| භූ | **524 – 554,** 143, 158, 174, 192, 222, 246, 248, 261, 276, 290, 325, 352, 358, 364, 365, 399, 412, 414, 426, 428, 433, 439, |
| භූෂ | 409. |
| භෘඤ් | 59, 244, 255, 256, 276, 277, 363, 406, 427, 430, 447. |
| භ්‍රමු | **627,** 180, 403, 432, 446, |
| භ්‍රස්ජ | 108, |
| භ්‍රෑශු | 185. |
| භ්‍රාජෘ | 364. |

| ධාතු. | පිටු. |
|---|---|
| **ම.** | |
| මන්ති | 260. |
| මථ | 265. |
| මපි | **562**. |
| මද්ද | 256, 282, 350, 343, 364, 403, 419, |
| මන | 272, 328, 356, 391, 428, 430. |
| මනු | 106, 279, 356 |
| මන්ථ | **561,** 131. |
| මද්දි | 258, 260. |
| මච | 182. |
| මසී | 380. |
| මස්ජෝ | 118. |
| මහ | 390, 392. |
| මා | 5, 187, 383, 410, 449. |
| මාඩි | 59, 168, 347. |
| මාන | **640,** 428. |
| මි | 379. |
| මිඤ්ද | 124, 168, 379. |
| මිදෘ | 75, 327, 373. |
| මිල | 110, |
| මිහ | **607.** |
| මීඩ | 334 |
| මීල | 450. |
| මූච්ඡ | 111. |
| මූෂ්‍රා | 342. |
| මුෂ | 129, 163, 323, 444. |
| මුහ | **570,** 72, 176. |
| මූඩ | 144. |
| මූත්‍ර | 177. |
| මූල | 386. |
| මෘඩ | 120, 162, 244, 363, 383, 391, 438, 444. |
| මෘජූෂ් | 23, 150, 365, 401, 424, 436. |
| මෘද | 260, **444.** |
| මෘදු | 260. |
| මෘශ් | 118. |
| මෘෂ | 322 |
| මෙඩ | 168 |
| මෙධෘ | 436. |
| ම්නා | **620.** |
| මේල | 609, 335, 365 434. |
| **ය.** | |
| යජ | **660.** 310, 314, 344, 356, 365, 373, 393, 399, 407, 421, 430. |
| යතී | 407, 419. |
| යභ් | 418. |
| යම | **599,** 180, 214, 277, 391, 404, 419. |
| යා | 6, 352, 383, 414. |
| යාචෘ | 153, 248, 261, 406, 407, 421. |
| යු | 12, 144, 160, 246, 248, 385, 389. |
| යුජිර් | 399. |
| යුධ | 257, 314, 412. |
| **ර.** | |
| රක්ෂ | 260, 293, 407. |
| රස | 387. |
| රසි | 384. |
| රඤ්ජ | **623,** 154, 250, 392, 400. |
| රදී | **575.** |
| රධ | **570.** |
| රභ | 148, 167, 400. |
| රමු | **653,** 256, 278. |
| රු | 6. |
| රාජෘ | **655**, 304, 389. |

| ධාතු. | පිටු. |
| --- | --- |
| **ර.** | |
| රුධ | 69, 168, 257, 261, 438. |
| රිබි | 437. |
| රිෂ් | 246. |
| රිඩ | 150, 333. |
| රු | 14, 144, 246, 257, 261, 441. |
| රුඩ | **646.** |
| රුච | 257, 302, 364, 390, 419, 421. |
| රුජෝ | 281. |
| රුදිර් | 25, 162, 323, 386. |
| රුධිර් | 92, 261. |
| රුෂ් | **606**, 247. |
| රුහ | 150, 320. |
| රෛ | **611**, 383. |
| **ල.** | |
| ලක්ෂ | 388. |
| ලසි | 384. |
| ලහෂ් | 148, 168, 418. |
| ලෂ | 369. |
| ලජ්ජ | 122. |
| ලා | 6, 152. |
| ලිඛ | 401, 437, 444. |
| ලිප් | 112. |
| ලිශ් | 119. |
| ලිහ් | 42, 176, 282. |
| ලී | 131. |
| ලීඩ | 152, 334. |
| ලුණ්ට | 367. |
| ලුපි | **562.** |
| ලුපෟ | 112, 179. |
| ලුභ | 113, 246. |
| ලුඤ්ච් | 144, 232, 248, 259, **333**, 402, 423, 435, 438. |
| **ව.** | |
| වච | 24, 253, 300, 345, 367, 392, 399, 421. |

| ධාතු. | පිටු. |
| --- | --- |
| **ව.** | |
| වජ | **585.** |
| වඤ්චු | 186 196. |
| වද | **633**, 194, 254, 261, 271, 274, 345, 373, 426, 444. |
| වදි | 369, 440. |
| වනු | 106. |
| වප් | **661**, 253, 260, 344, 393, 405. |
| වම | **628**, 318, 405. |
| වශ | 8, 184. |
| වස | **629**, 36, 260, 319, 345, 444. |
| වහ | **661**, 247, 271, 281, 288, 304, 344, 386, 409, 432. |
| වා | 6, 337, 378, 383. |
| වාම | 256. |
| වාසෘ | 256. |
| විච්ඡ | 119, 407. |
| විජිර් | 65. |
| විජ | 122. |
| විද් | 19, 163, 176, 212, 251, 253. 338, 339, 360, 372, 430, 432, 443, |
| විදිර් | 336. |
| විදෟ | 112, 263, 354, 440. |
| විධ | 114. |
| විශ් | 118, 354. |
| විෂෟ | 65, 366. |
| වී | 367. |
| වෘඩ | 132, 162, 367, 415. |
| වෘක්ෂ | 86, 278, 325, 367, 376. 391, 415, 420, 426. |
| වෘතුඩ | **649**, 150, 183, 195, 302, 364, 424, 443. |
| වෘධුඩ | **650**, 257, 364, 424, |
| වෘෂ | 302, 369, 427. |

| ධාතු. | පිටු. |
|---|---|
| **ව.** | |
| වෘෂු | 389. |
| වෙඤ් | **662**, 148, 344. |
| වෙපෘ | 405. |
| ව්‍යථ | **652**, 154. |
| ව්‍යධ | 70, 302. |
| ව්‍යය | **659.** |
| ව්‍යෙඤ් | **663**, 148, 344. |
| ව්‍රජ | **586**, 178, 430. |
| ව්‍රණ | 255. |
| ව්‍රශ්චූ | 115, 184, 345. |
| ව්‍රීඩ | 334. |
| **ශ.** | |
| ශකෲ | 89, 167, 386, 419. |
| ශදෲ | **617**, 145. |
| ශප | 216, 418. |
| ශම් | 74, 155, 229, 258, 289, 318, 403, 419, 432. |
| ශල් | 419. |
| ශසු | **585**, 368, 385. |
| ශාන | **658**, |
| ශාස් | 31, 153, 360, 385, 413. |
| ශිෂෲ | 95. |
| ශීඞ | 37, 189, 225, 266, 270. 319, 324, 363, 370, 430, 433, 443, |
| ශීල | 329. |
| ශුච | 390. |
| ශුධ | 433. |
| ශුභ | 251, 257. |
| ශුෂ් | 347. |
| ශෘධුඞ | **650**, |
| ශෘ | 130, 297, 369. |
| ශො | 68, 147, 260. |
| ශ්චුතිර් | **559.** |
| ශ්‍යෛඞ | 383. |
| ශ්‍රපි | 440. |
| ශ්‍රම | 403. |
| ශ්‍රිඤ් | **659**, 301, 319, 325, 439. |
| ශ්‍රු | 90, 145, 212, 217, 248. 260, 428. |
| ශ්ලිෂ් | 71, 319, 359, |
| ශ්වස් | 27. |
| ශ්විඉර් | **633**, 325, 405. |
| **ෂ.** | |
| ෂච | 380. |
| ෂඤ්ජ | **625** |
| ෂණු | 102. |
| ෂදෲ | **618**, 179, 430. |
| ෂප් | 389. |
| ෂහ | **653**, 247, 256, 258, 259, 265, 277, 278, 287, 364, 419. |
| ෂිවෲ | 112. |
| ෂිඤ් | 380, 402. |
| ෂිධු | **563.** |
| ෂිධූ | **570**, 246. |
| ෂිවු | 67, 255. |
| ෂුඤ් | **570**, 81, 299, 313, 314, 430, |
| ෂුර | 251. |
| ෂූඞ | **570**, 36, 245, 299, 333, 383. |
| ෂූද | 259. |
| ෂෙවෘ | **645**, 255, 444. |
| ෂො | 69, 147, 187, 296, 347, 449. |
| ෂ්ටුඤ් | 43. 245, 300, 301, 314, 383, 398, 402, 426. |

| ධාතු. | පිටු. |
| --- | --- |
| **ෂ.** | |
| ෂෛට්‍ය | **611**, 388, |
| ෂ්ඨා | **619**, 146, 187, 213, 226, 260, 266, 295, 296, 316 318, 319, 352, 356, 365, 369, 375, 398, 410, 349. |
| ෂ්ණා | 7, 156, 316, 442. |
| ෂ්ණු | 17, 232. |
| ෂ්ණුහ් | **570.** |
| ෂ්වප් | 27, 345, 407. |
| ෂ්වෂ්ක | **637.** |
| ෂ්වඤ්ජ් | **638** |
| ෂ්විද | 328. |
| **ස.** | |
| සඞ්ග්‍රාමඞ | 140. |
| සාධ | 69, 257, 379. |
| සූච | 177. |
| සූත්‍ර | 177. |
| සූදී | 259. |
| සෘ | **616**, 270, 371, 374, 431. |
| සෘජ් | 117. |
| සෘප්‍ | 255. |
| ස්කන්දිර් | **621**, 186. |
| ස්කම්භු | 126. |
| ස්කුන්ද් | 125. |
| ස්කුම්භු | 126 |
| ස්තම්භු | 126. |
| ස්තුම්භු | 126, 410. |
| ස්තෘඤ්ද් | 85. |
| ස්තෲඤ්ද් | 393. |
| ස්ත්‍යෛ | 388. |
| ස්නිහ් | **570**, 434. |
| ස්පෘශ් | 116 |
| **ස.** | |
| ස්පෘහ | 370 |
| ස්ඵායී | 156, 347. |
| ස්මිඞ | 149, 164, 371 |
| ස්මෘ | 217, 230, 432, 452. |
| ස්‍යන්ද | **651.** |
| ස්‍රංසු | 185 |
| ස්‍රු | 145. |
| ස්වදී | 379. |
| ස්වන | **629.** |
| ස්වෘ | **570**, 212, 245. |
| **හ.** | |
| හන් | 8, 145, 165, 188, 197, 199, 214, 227, 249, 254, 263, 284, 311, 313, 353, 369, 404, 419, 420, 431, 432, 434, 453. |
| හස | 359, 420. |
| හාක් | 55, 187, 197 282, 296, 299. 333, 342, 449, |
| හාඞ | 58. |
| හි | 88, 335, 380. |
| හිසි | 96, 371, 404. |
| හු | 49, 176, 350, 383, 390, 409. |
| හුඞා | **584.** |
| හෘෂ් | **656**, 817, 244, 261, 269, 273, 376, 383, 401, 409, 420. |
| හ්‍රි | 52, 151, 336, 434. |
| හ්ලාද | 328. |
| හ්වෘ | **621.** |
| හෙවඩ | **663**, 148, 344. |

# ගණ සූචි.

(කලු අඬකවලින් තුන් වන කාණ්ඩයේ පිටු ද, සෙසු අඬකවලින් 4 - 5 කාණ්ඩවල පිටු ද දැක්වේ.)


| | ගණ. | පිටු. |
|---|---|---|
| 1 | කාසාදිය | **580.** |
| 2 | කෘෂාදිය | **605.** |
| 3 | ගඳුදිය | **574.** |
| 4 | ගමාදිය | 212. |
| 5 | ග්‍රහාදිය | **630.** |
| 6 | ජක්‍ෂාදිය | 360. |
| 7 | (ජක්‍ෂිත්‍යාදිය) | **360.** |
| 8 | ජපාදිය | 180. |
| 9 | තනාදිය | 10. |
| 10 | දුහාදිය | 232. |
| 11 | දෘශාදිය | **614.** |
| 12 | ත්‍යාදිය | 232. |
| 13 | පචාදිය | **576.** |
| 14 | පඳුදිය | 77. |
| 15 | ඵණාදිය | **628.** |
| 16 | මූචාදිය | 111. |
| 17 | යජාදිය (1.) | **631.** |
| 18 | යජාදිය (2.) | 430. |
| 19 | රධාදිය | **570.** |
| 20 | රුජාදිය | 388. |
| 21 | රුඳුදිය | 26. |
| 22 | ලවාදිය | 332. |
| 23 | වෘතාදිය | **650.** |
| 24 | ශකාදිය | **419.** |
| 25 | ශමාදිය | **627,** 75. |

# අනුක්‍රමණිකා.

## 1, 2, 3. කාණ්ඩ.


| විෂය. | | | පිටු. | විෂය. | | | පිටු. |
|---|---|---|---|---|---|---|---|
| සංඥා | | ප්‍රක්‍රියා | 1 | අව්‍යය | | ප්‍රක්‍රියා | 286 |
| ස්වර | සන්ධි | „ | 23 | ස්ත්‍රීප්‍රත්‍යය | | „ | 295 |
| ප්‍රකෘතිභාව | „ | „ | 46 | කාරක | | „ | 324 |
| ව්‍යඤ්ජන | „ | „ | 52 | අව්‍යයීභාව සමාස | | „ | 399 |
| විසර්ග | „ | „ | 67 | තත්පුරුෂ | „ | „ | 413 |
| ස්වරාන්ත | පුංලිඞ්ග | „ | 81 | ද්වන්ද්ව | „ | „ | 422 |
| „ | ස්ත්‍රීලිඞ්ග | „ | 139 | ද්විගු | „ | „ | 429 |
| „ | නපුංසක: | „ | 158 | බහුව්‍රීහි | „ | „ | 431 |
| හසාන්ත | පුංලිඞ්ග | „ | 174 | කර්මධාරය | „ | „ | 449 |
| „ | ස්ත්‍රීලිඞ්ග | „ | 240 | තද්ධිත | | „ | 467 |
| „ | නපුංසක: | „ | 252 | භ්වාදි පරස්මෛපදි | | „ | 517 |
| යුෂ්මදස්මද් | | „ | 265 | භ්වාද්‍යාත්මනෙපදි | | „ | 635 |
| ආදේශ විශේෂ | | „ | 277 | භ්වාද්‍යුභයපදි | | „ | 655 |


## 5. කාණ්ඩය. *


| විෂය. | | පිටු. |
|---|---|---|
| කෘදන්ත | ප්‍රක්‍රියා | 241 |
| නිෂ්ඨාධිකාර | „ | 316 |
| ඛස්වාදි | „ | 349 |
| ශීලාදී | „ | 362 |
| උණාදි | „ | 378 |
| භාවාධිකාර | „ | 397 |
| කෘත්‍ය | „ | 413 |
| ස්ත්‍ර්‍යධිකාර | „ | 429 |
| ක්ත්වාදි | „ | 441 |


## උපග්‍රන්ථය.


| | | |
|---|---|---|
| සමාස ලිඞ්ගානුශාසනය | | 461 |
| තද්ධිත | „ | 464 |
| කෘදන්ත | „ | 468 |
| ධාතුස්ථ ඉත්සංඥ වර්ණයෝ | | 472 |

---

| | |
|---|---|
| සූත්‍ර සූචි | 476 |
| ධාතු සූචි | 487 |
| ගණ සූචි | 497 |


---

4, කාණ්ඩයෙහි අනුක්‍රමණිකාව එහි ම ඇත.

# ව්‍යාඛ්‍යාතෘ නාම සන්දර්ශනම්.

---

1. ශ්‍රී ලඞ්කාභුවි සර්වත්‍ර ධර්මශාස්ත්‍රමහොදයඃ,
යතඃ ප්‍රාදුරභූනෙමාහතමොහත්‍යාගිනොදයඃ.

2. තස්‍ය විද්‍යොදයාඛ්‍යස්‍ය මහතඃ ශාස්ත්‍රසද්මනඃ,
ප්‍රතිෂ්ඨාපයිතා යො'ස්‍ය චාධිපත්‍යං චිරං දධෞ.

3. විදුෂ්මතී ච ලඞ්කායං කෘතා යෙන විද් මුදා,
ස ච විද්‍යාලයො යෙන ප්‍රාපිතඃ සාර්වභෞමතාම්.

4. ශ්‍රී ලඞ්කාගගනොද්භූතවිධුතුල්‍යස්‍ය යස්‍ය ච,
දිශඃ ශුභ්‍රායිතාඃ ශුභ්‍රයශොභිඃ කෞමුදීනිභෛඃ.

5. විදුෂාමග්‍රගණ්‍යස්‍ය තස්‍ය සද්ගුණශාලිනඃ,
යතීශ්වරධුරීණස්‍ය ශුද්ධශීලස්‍ය ධීමතඃ.

6. බොධිසත්ත්වසමානස්‍ය පිටකත්‍රයධාරිණඃ,
ශ්‍රී සුමඞ්ගල සංඝස්‍ය වාගීශත්වමුපෙයුෂඃ.

7. ශ්‍රී ඥානෙශ්වර නාම්නශ්ච කවීනාං චක්‍රවර්තිනඃ,
සකාශාල්ලබ්ධවිද්‍යෙන සදුපායානුවර්තිනා.

8. "ඛහවෙ"ති සුවිඛ්‍යාතග්‍රාමජෙන මනස්විනා,
දෙශදෙශාන්තරව්‍යාප්තයශසා මුනිසූනුනා.

9. ශ්‍රී රත්නසාර සංඝෙන මානනීයෙන මානිතෛඃ,
ගුරුණා මෙ ධර්මශාස්ත්‍රවිෂයෙ ගුරුණා භුවි.

10. අනුභූතිස්වරූපාඛ්‍යාචාර්යවර්යස්‍ය සංස්කෘතෙඃ,
සාරස්වත ප්‍රක්‍රියායා ව්‍යාඛ්‍යා සාරාර්ථචන්ද්‍රිකා.

11. හ්වාදෙගීණස්‍යාසමාප්ති කෘතා කාණ්ඩත්‍රයාත්මිකා,
විවෘතාශෙෂගූඪාර්ථා ප්‍රශංසාපාත්‍රතාමිතා.

12. තෙන චාන්‍යසුධීභිශ්ච සම්‍යග් ව්‍යාපාරිතො මුදා
අද්‍ය විද්‍යෝදයාධීශො යතීශඃ කවිතල්ලජඃ.

13. යස්‍යාඞ්ඝ්‍රිරජසා ශීර්ෂං පරිපූතමභූන්මම,
සො'යමස්මද්ගුරුඃ සාධුවත්සලඃ ශීලවාන් ගුණී.

14. සුලබ්ධවිද්‍යඃ ශ්‍රී ධර්මරත්න නාම්නො යතීශ්වරාත්,
සාධොඃ ශ්‍රී සුමනසතිෂ්‍ය ස්වාමිනඃ ශිෂ්‍යතාමිතඃ.

15. "බද්දෙගම" ග්‍රාමජශ්‍රී ප්‍රියරත්න සමාහ්වයඃ,
ගුණශ්‍රෙෂ්ඨීණිහිලෝකෙශ්මීනොග්‍යා මාන්‍යකුලොද්භවඃ.

16. අෂ්ටාදිගණතශ්චිත්‍රාං ද්විතීයාං වෘත්තිමාශ්‍රිතාම්,
එකාර සරලාං ව්‍යාඛ්‍යාං පූජීනාම්නෛව භූෂිතාම්.

17. කෘතෞ තත්‍ර මදුද්‍යොගප්‍රහෘෂ්ටස්‍ය ගුරොර්මම,
අනුඥං ප්‍රතිලභ්‍යෛව පුනරුද්‍යොගමාප්තවාන්.

18. සුමඞ්ගල සමාඛ්‍යාත මමෙව ග්‍රාමජන්මිනා.
ප්‍රව්‍රාජිතො යතීන්ද්‍රෙණ තස්මින් ස්වර්ගීමුපෙයුෂි.

19. යථොක්ත යතිනාථෙන ප්‍රියරත්නෙන ධීමතා,
සුතප්‍රෙම්ණාථ යඃ සම්‍යග් වෛදුෂ්‍යං ප්‍රාපිතො මුදා.

20. තෙන විද්‍යොදයඛ්‍යාත මහාවිද්‍යාලයෙ'ධුනා,
උපාචාර්‍ය්‍යෙ ධුරීණෙන සුධියාමනුකාරිණා.

21. ජාතෙන "හැගොඩ" ග්‍රාමෙ කුලෙ ග්‍රාමණිනි ශ්‍රුතෙ,
මයා ධර්මෙන්ද්‍ර සංඥෙන භික්ෂුණා සුබුද්ධයෙ.

22. කෘදන්තප්‍රක්‍රියා ව්‍යාඛ්‍යා කෘතා චෙයං සවිස්තරා,
සඞ්කලය්‍යොපග්‍රන්ථෙන පරිනිෂ්ඨාපිතා මුදා.

23. සෞගතෙ වත්සරෙ බාණ වස්වබ්ධිනයනෛර්මිතෙ,
සුදි නෙත්‍රතිථෞ මාසි තපසීනස්‍ය වාසරෙ.

24. නිර්විඝ්නතඃ සමාප්තෙයං ව්‍යාඛ්‍යා සාරණී චන්ද්‍රිකා,
ප්‍රබොධයන්ති සච්ඡිෂ්‍යාබ්ජ ගත්‍යස්මින් විරාජතු.

25. ශ්‍රීමද්‍රත්නත්‍රයං වන්දෙ වන්දිතං වන්දිනෛර්මුදා,
තන්නාමාමවතු සර්වත්‍ර සර්වදං මම සර්වදා.

— ශම්. —

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු